# විශේෂාභිධර්ම භාවනාව



සම්පාදනය

**කම්මට්ඨානාචාර්ය අතිපූජ්‍ය නාඋයනේ අරියධම්ම ස්වාමීන් වහන්සේ**

ධර්ම දානය

**රාජ්‍ය සේවා බෞද්ධ සංගමය**

2549

2005

# විශේෂාභිධර්ම භාවනාව

සම්පාදනය :
**පූජ්‍ය නාඋයනේ අරියධම්ම ස්වාමීන් වහන්සේ**

ධර්මදානය :
**රාජ්‍ය සේවා බෞද්ධ සංගමය**

**2549**
**2005**

# අභිධර්ම භාවනාව අංක 1

| ඡේදය | පේලිය | වරද | නිවරද |
|---|---|---|---|
| 2 | 1 | වුත්තහි | මුත්තාහි |
| 3 | 2 | 89 | (89) |
| | | 121 | (121) |
| 4 | 1 | 54 | (54) |
| | | 15 | (15) |
| 2 | | 12 | (12) |
| | | 8 | (8) |
| | | විස්තරයෙන් | විස්තාරයෙන් |
| 3 | | 40 | (40) |
| 5 | 3 | දෙසමුල | දෝසමුල |
| 9 | 5 | විඤ්ඤ | විඤ්ඤණ |
| 6 | | විඤ්ඤ | විඤ්ඤණ |
| 10 | 4 | ජිව්හා ශ්ඤණ | ජිව්හා විඤ්ඤණ |
| 13 | 4 | 59 | (59) |
| 5 | | 91 | (91) |
| 14 | 3 | සිත් | සිත |
| 9 | 1 | සිත | සිත් |
| 20 | 4 | චතුර්ථද | චතුර්ථ |
| 24 | 1 | ආකාසානඤ්චායතනව | ආකාසානඤ්චායතන |
| 25 | 2 | අකිඤ්චඤ්ඤයතනය | ආකිඤ්චඤ්ඤයතන |
| | | කුශල | කුසල |
| 28 | 1 | ලෝකෝතතර | ලෝකෝත්තර |
| 30 | 2 | ජත්තං සේව | චත්තිං සේව |
| 33 | 2 | මාර්ග සත් | මාර්ගසිත් |
| | | සම තිස්ස | සම විස්ස |
| 4 | | ප්‍රථම ධාන්‍යය | ප්‍රථම ධ්‍යාන |
| 6 | | සුඛෙකාග්‍රතා | සුඛෛකාග්‍රතා |
| 10 | | විත්තයද | විත්තය |
| 35 | 2 | ආරූත් පඤ්චාපි | ආරූප්පඤ්චාපි |
| 38 | 4 | සත් | සිත් |
| 39 | 3 | 89, 121 | (89) (121) |
| 4 | | 54 15 | (54) (15) |
| 5 | | 12 8 | ( 12) (8) |
| 6 | | අකුශල් 12, 21, 36 | අකුසල් (12) (21) (36) |
| 7 | | 20, 37 කුශල් | (20) (37) කුසල් |
| 8 | | 52 | (52) |
| 9 | | 59, 91, 30 | (59) (91) (30) |
| 10 | | 81, 8 | (81) (8) |
| 11 | | 40 | (40) |
| 40 | 2 | විඤ්ඤණා | විඤ්ඤණ |
| 4 | | ජිම හා විඤ්ඤාණා | ජිව්හා විඤ්ඤාණ |
| 5 | | විඤිඤණ ඤණධාතුවය | විඤාඤණ ධාතුවය |

| | | | |
|---|---|---|---|
| 6 | | සසැතැවක් | සසැත්තැවක් |
| 6 | | 76 | (76) |
| 7 | | 108 | (108) |
| 8 | | 81 | (81) |

<u>අභිධර්ම පාඩම අංක 01 ත්‍රිලක්‍ෂණ විදර්ශනාව</u>

| | | | |
|---|---|---|---|
| 1 | 1 | භූතා රූප | භූත රූප |
| 4 | 3 | සත්‍ය | සත්‍යය |
| 5 | 2 | සත්‍ය | සත්‍යය |
| 6 | 1 | නිසිසරන | නිස්සරණ |
| 2 | | සත්‍ය වන්නේය | සත්‍ය නම් වන්නේය |
| 7 | 2 | ආධිපතෙ‍‍්‍යාර්ථයෙන් | ආධිපතෙය්‍යාර්ථයෙන් |
| 8 | 1 | කුශලානිසංස | කුසලානිසංස |

<u>පද විවරණය</u>

| | | | |
|---|---|---|---|
| 2 | 1 | පිළිවෙත් | පිළිවෙලින් |
| 7 | 1 | අරමුනු | අරමුණු |
| 10 | 3 | අකුශල | අකුසල |
| 11 | 2 | අනවද්‍යාර්ථයෙන් | අනවද්‍යාර්ථයෙන් ද |
| 14 | 2 | සුබ | සුභ |
| 17 | 1 | කොනක | නොකන |
| 1 | | අස්වයාට | අශ්වයාට |
| 18 | 2 | උදෙ‍්‍යාගයෙන්ම | උද්‍යෝගයෙන්ම |
| 19 | 2 | සසංකාරික | සසංඛාරික |
| 23 | 2 | උද්දච්චය | උද්ධච්චය |

## අභිධර්ම භාවනාව අංක 2

| ඡේදය | පේලිය | වරද | නිවරද |
|---|---|---|---|
| 1 | 1 | වුත්ථුතා | වත්ථුකා |
| 2 | 3 | පඤ්ඤන්දය | පඤ්ඤින්ද්‍රිය |
| 3 | 2 | සඤ්ඤවය | සඤ්ඤාවය |
| 5 | 1 | උද්දච්චය | උද්ධච්චය |
| 8 | 3 | අබබෝධ | අවබෝධ |
| 9 | 3 | කෙලෙසද | කෙළෙසද |
| 11 | 2 | සම්ප්‍රයුත්ත | සම්ප්‍රයුක්ත |
| 12 | 2 | විචික්චිඡා | විචිකිච්ඡා |
| 13 | 2 | සොළොස්වූ | සොළොසක්වූ |
| | 3 | කායවිඤ්ඤද්ණ | කායවිඤ්ඤාණ |
| | 3 | උපෙක්‍ෂ | උපෙක්‍ෂා |
| 15 | 3 | අවෙද | අටද |
| | 4 | යුගලයද | යුගලය |
| | 5 | දෙළසහිද | දොළසද |
| | 5 | පඤ්ඤන්ද්‍රය | පඤ්ඤින්ද්‍රිය |

| | | | |
|---|---|---|---|
| | 6 | මහා කුසල සිත් | මහා කුශල මහා ක්‍රියා මහා විපාක ඤාණ සම්ප්‍රයුක්ත සිත් දොලොස් දනාද මහග්ගත ලෝකෝත්තර |
| | 6 | සිත් | සත් |
| 16 | 1 | ජයට්ඨි | ජසට්ඨී |
| 17 | 2 | පඤ්ඤ්ණස | පුඤ්ඤෙද්‍ය |
| | 1 | කතා | ගතා |
| 19 | 2 | ද්විදසා | ද්වාදසා |
| | 3 | විචිකිච්චාව | විචිකිච්ඡාව |
| 20 | 3 | පස්විස | පස්විසි |
| | 4 | අපපමඤ්ඤණ | අප්පමඤ්ඤ |
| 21 | 1 | චත්තාලීය | චත්තාලීස |
| 22 | 1 | මච්ජෙර | මච්චෙර |
| | 3 | මච්ජරිය | මච්ඡරිය |
| 24 | 5 | ලෝකෝතත්ර | ලෝකෝත්තර |
| 25 | 3 | සතිය | සතිය |
| | 5 | සුතිසක් | සුතිසකි |
| | 5 | තෙසිතකි | තෙතිසකි |
| 26 | 1 | තිසොච | තිංසාච |
| | 1 | චතුන්තිංස | චතුත්තිංස |
| 28 | 1 | ද්වියධ්‍යානික | ද්විතියධ්‍යාන්ක |
| | 2 | චතුර්ධ්‍යානික | චතුර්ථධ්‍යානික |

## අභිධර්ම භාවනාව අංක 2

| | | | |
|---|---|---|---|
| 29 | 1 | තෙත්තිංච | තෙත්තිංචස |
| | 1 | ද්විතිතිංස | ද්වත්තිංස |
| 30 | 1 | මහ කුශල | මහා කුශල |
| 32 | 5 | සංග්‍රහ | සංග්‍රහය |
| 33 | 1 | ජත්තිංසකං | ඡත්තිංසකං |
| 38 | 3 | දොසචතුස්කයද | දොසචතුෂ්කයද |
| 39 | 1 | චන්දයද | ඡන්දයද |
| 40 | 3 | එක් විසිසයය | එක් විස්සය |
| | 4 | දෙවිස්සයය් | දෙවිස්සය |
| | 4 | සංග්‍රහ | සංග්‍රහය |
| 41 | 2 | කුසලා | කුසල |
| 43 | 2 | සන්තිරණය | සන්තීරණ |
| 44 | 2 | චික්තුප්පාදෙය | චිතතුප්පාදෙසු |
| | 3 | චිතිතෝත්තිපාදයන්හි | චිත්තෝත්පාදයන්හි |
| 45 | 3 | සතරක්ද | සතක්ද |

### ත්‍රිලක්‍ෂණ විදර්ශනාව

| | | | |
|---|---|---|---|
| 6 | 1 | අසංඛාරික | අසංඛත |
| | 2 | නිරෝධ | නිරෝධ |
| 7 | 2 | නියාත | නියාක |

## පද විවරණය

| | | | |
|---|---|---|---|
| 2 | 1 | සිතක් | සිතත් |
| 4 | 1 | වස්තු රූපයක් | වස්තුරූපයක් |
| 5 | 5 | සත් දෙන | සත්දෙන |
| 9 | 4 | මෙත්තා අදොස | මෙත්තා - අදොස |
| | 4 | උපේක්ඛා | උපෙක්ඛාක- තත්‍රමජ්ඣත්තුපෙක්ඛා |
| | 6 | දෙන | දෙක |
| 10 | 1 | උද්දච්ච | උද්ධච්ච |
| 12 | 1 | මච්ජරිය | මච්ඡරිය |
| | 2 | මච්චරිය | මච්ඡරිය |
| 14 | 1 | ශුද්ධා | ශ්‍රද්ධා |
| 16 | 2 | තමා තමාට | තම තමාට |

# අභිධර්ම භාවනාව අංක 3

| ඡේදය | පේළිය | වරද | නිවරද |
|---|---|---|---|
| 2 | 4 | සංග්‍රහ | සංග්‍රහය |
| 3 | 2 | අරමුණ රස | අරමුණු රස |
| 4 | 3 | අරමුණු | අරමුණු රස |
| 5 | 1 | කෙසෙද | කෙසේ ද |
| 8 | 4 | උපෙක්සා | උපේක්ෂා |
| 9 | 4 | ද්විසට්ය | ද්වාසට්ඨී |
| 19 | 2 | අතරහි | අතරෙහි |
| | 4 | සංතීරණය | සංතීරණ |
| 20 | 1 | ආවර්ජනා | ආවර්ජන |
| 22 | 1 | අකුත් | එකුත් |
| 22 | 2 | යුගලය ද | යුගලය |
| 22 | 2 | සන්තීරණය | සන්තීරණ |
| 23 | 2 | ශ්‍රමණ | ශ්‍රවණ |

## ත්‍රිලක්ෂණ විදර්ශනාව

| | | | |
|---|---|---|---|
| 5 | 1 | පළබෝධාර්ථයෙන් | පළිබෝධාර්ථයෙන් |

## පද විවරණය

| | | | |
|---|---|---|---|
| 2 | 1 | සුඛ වේදනා | සුඛ වේදනාව |
| | 2 | විඤ්ඤුණය | විඤ්ඤාණය |
| 8 | 1 | සිත් | සිත |
| 11 | 1 | ආවර්ජනා | ආවර්ජන |

## අභිධර්ම භාවනාව - අංක - 04

| | | | |
|---|---|---|---|
| 1 | 3 | චක්ඹු ද්වාරය | චක්ෂු ද්වාරය |
| | 3 | සෝත ද්වාර | ශ්‍රෝත ද්වාරය |
| 2 | 1 | චක්බු | චක්ෂු |
| 2 | 3 | එම | එම |
| 3 | 2 | කර්මයත් | කර්මයෙන් |
| 3 | 3 | සෝත සෝතද්වාරය | ශ්‍රෝත - ශ්‍රෝතද්වාරය |
| 4 | 1 | ඝාණ | ඝ්‍රාණ |
| | 3 | එම | එම |
| | 3 | ඝාණ ද්වාරය | ඝ්‍රාණ ද්වාරය |
| 8 | 1 | චක්බු | චක්ෂු |
| | 2 | සම්පටිජන | සම්පටිච්ඡන |
| 9 | 1 | සොත්‍රද්වාරයෙහි | ශ්‍රෝතද්වාරයෙහි |
| | 2 | විඤ්ඥණ | විඤ්ඤාණ |
| | 3 | එම | එම |
| 15 | 2 | ඡද්වාරික | ඡද්වාරික |
| | 3 | ඡත්තිංසති | ඡත්තිංසති |
| | 4 | පඤ්ඤධා | පඤ්චධා |
| | 6 | ද්වාරික | ද්වර |
| | 7 | සදදෙනෙක් | දස දෙනෙක් |
| 16 | 3 | ඔවුහු | ඔවුහු නම් |
| 17 | 2 | ඡක්බුද්වාරික | චක්ෂුද්වාරික |
| | 3 | අරමුනු | අරමුණු |
| 20 | 1 | චක්බු | චක්ෂු |
| 22 | 1 | යුගලයද | යුගලය |
| | 2 | ඝාණ විඤානා | ඝ්‍රාණ විඥාන |
| 23 | 2 | අරමුනු | අරමුණු |
| 24 | 2 | එම | එම |
| 24 | 3 | කුසල් | කුශල් |
| 28 | 1 | චක්බු | චක්ෂු |
| | 2 | එම | එම |
| 29 | 1 | ලැබෙන්නාහි | ලැබෙන්නාහී |
| 32 | 2 | ආශ්‍රියතවද | ආශ්‍රිතවද |
| | 3 | වොකාර | වෝකාර |
| 33 | 7 | තෙතාලිසක් | තෙසාලිසක් |

<u>ත්‍රිලක්ෂණ විදර්ශනාව</u>

| | | | |
|---|---|---|---|
| 7 | 2 | නියයාත හේතු | නියයාන හේතු |
| | 2 | සතත්‍ය | සත්‍යය |

<u>පද විවරණය</u>

| | | | |
|---|---|---|---|
| 3 | 2 | අර්ථ | අර්ථය |
| 4 | 1 | භංග | භවංග |
| 5 | 1 | උත්පාදතිති | උත්පාදයීති |
| 7 | 1 | විඤඤාණඤ්වායතනය | විඤ්ඤානඤ්චායතනය |

| | | | |
|---|---|---|---|
| 7 | 2 | ධානඍාන | ධ්‍යාන |
| | 3 | නේවසඤ්ඥාසඤ්ඤායතන | නේවසඤ්ඤානාසඤ්ඤායතන |
| 10 | 1 | පස | පසම |

**අභිධර්ම භාවනා - අංක 05**

| | | | |
|---|---|---|---|
| 2 | 2 | අපාතගත | ආපාතගත |
| 3 | 1 | පරිදිය | පරිදි |
| | 2 | විඤ්ඤාණය | විඤ්ඤාණය |
| 4 | 2 | චක්බුද්වාර | චක්‍ෂුද්වාර |
| | 4 | | ජිව්හා විඤ්ඤාණ වීථිය |
| | 5 | ආපාගත | ආපාතගත |
| 6 | 1 | ඊතික්ෂණය | ඨිතික්ෂණය |
| 7 | 1 | අරමුණු අතුරෙන් | අරමුණුපස අතුරෙන් |
| 10 | 3 | දිවයයි | දිවයි |
| 11 | 2 | පඤ්දද්වාරාවර්ජනය | පඤ්චද්වාරාවර්ජනය |
| 12 | 1 | නෙසෑහෙන | නොසෑහෙන |
| 14 | 1 | චිත්ක්ෂණ | චිත්තක්ෂණ |
| | 2 | චක්බුද්වාරයට | චක්ෂු ද්වාරයට |
| 15 | 2 | සයක් පසළොසක්ද | සයක්ද පසළොසක් |
| | 3 | ජිව්හද්වාර | ජිව්හාද්වාර |
| 18 | 4 | පතින | පතිත |
| 19 | 2 | චත්තාලි විභාවයේ | චත්තාලීස විභාවයේ |
| | 6 | විස්තර වශයෙන් ද | විස්තර වශයෙන් |
| 21 | 2 | අර්පණවෝම | අර්පණාවෝම |
| | 4 | ජවයන්ට | ජවනයන්ට |
| 22 | 3 | පුබුජ්ජනාන | පුථුජ්ජනාන |
| | 5 | ඤාන සම්ප්‍රයුක්ත | ඥානසම්ප්‍රයුක්ත |
| | 6 | එම | එම. |
| | 7 | එම | එම |
| | 9 | අර්පනා | අර්පණා |
| 22 | 12 | ක්ෂීණ ශ්‍රවයන්ට | ක්ෂීණාශ්‍රවයන්හට |
| 23 | 1 | දෙතිස | දෙතිස නම් |
| 24 | 1 | ජවයන්යෙන් | ජවනයෙන් |
| | 1 | අර්පණ | අර්පනා |
| | 4 | එම | එම |
| 25 | 1 | විථීයන්හිදී | විථීන්හිදී |
| | 1 | | |
| 26 | 2 | උපෙක්ඛා | උපෙක්ෂා |
| 27 | 4 | උපෙක්සා | උපෙක්ෂා |
| | 5 | සන්තිරණය | සන්තිරණ |
| | 6 | එම | එම |
| 28 | 2 | මහත්තෙව | මහන්තේව |
| | 3 | සත්ත්වයන්ට | සත්ත්වයන්හට |
| 33 | 1 | අහේතුකු | අහේතුක |

| | | | |
|---|---|---|---|
| - | 2 | ඔහුනට | ඔවුනට |
| | 3 | ඥන | ඥාන |
| 35 | 3 | පෘථ්ශ්ජනයන්ටහට | පෘථග්ජනයන්හට |
| 36 | 3 | වහන්සේලාට | වහන්සේට |
| | 4 | සිත්ද | සිත් සතද |
| | 6 | විකිච්චා | විචිකිච්ඡා |
| | 3 | අහේතුක සිත් දාහතද | අහේතුක සිත් දහසයත්ද |
| 37 | 3 | භූමියෙහිද | භූමියෙහි |

<u>ත්‍රිලක්ෂණ විදර්ශනාව</u>

| | | | |
|---|---|---|---|
| 1 | 1 | මේ රූප | මේ නාම රූප |
| 2 | 1 | ඇතිවීම් නැතිවීම | ඇතිවීම් නැතිවීම |
| 5 | 2 | සහන්නාගත | සමන්නාගත |
| 7 | 1 | වැඩි යුතුවු | වැඩිය යුතුවු |

<u>පද විවරණය</u>

| | | | |
|---|---|---|---|
| 3 | 1 | අරමුණත් ගෙන | අරමුණක් ගෙන |
| | | 2542 බක් 1999 අප්‍රියෙල් | 2542 පොසොන් 1999 ජූනි 02 |

## අභිධම්ම භාවනා පාඩම 06

## සෝදු පත්‍රය

| ඡේදය | පේළිය | වරද | නිවරද |
|---|---|---|---|
| 1 | 2 | අතිමහත්තාරම්මණ | අතිමහන්තාරම්මණ |
| | | මහත්තාරම්මණ | මහන්තාරම්මණ |
| 2 | 1 | අතිමහත්තාරම්මණ | අතිමහන්තාරම්මණ |
| 2 | 2 | අතිමහත්තාරම්මණ | අතිමහන්තාරම්මණ |
| 3 | 1 | චක්ෂු විඥනය | චක්ෂුර්විඥානය |
| 3 | 3 | අතිමහත්තාරම්මණ | අතිමහන්තාරම්මණ |
| 5 | 2 | අතිමහත්තාරම්මණ | අතිමහන්තාරම්මණ |
| 5 | 2 | මහත්තාරම්මණ | මහන්තාරම්මණ |
| 6 | 1 | අතිමහත්තාරම්මණ | අතිමහන්තාරම්මණ |
| 7 | 2 | අරමුණු | අරමුණ |
| 10 | 1 | චක්ඛු | චක්ෂු |
| 10 | 2 | සතලොසකට | සතලොසකට |
| 12 | 8 | විඤ්ඤාණයට | විඤ්ඤාණයට |
| 14 | 1 | අතවැසියා | අතවැසියාසේ |
| 17 | 7 | ජනවය | ජවනය |
| 21 | 1 | කෘතයා | කෘත්‍යය |
| 25 | 1 | ධර්මය | ධර්ම |
| 27 | 6 | නැතියි | නැතැයි |

### තිලක්ෂණ විදර්ශනාව

| | | | |
|---|---|---|---|
| 1 | 1 | ද්වාර | ද්වාරාරම්මණ |
| 5 | 1 | පිලිබෝධාර්තයෙන් | පලිබෝධාර්ථයෙන් |
| 7 | 2 | ආධිපයාාර්ථයෙන් | ආධිපතෙයාාර්ථයෙන් |
| 7 | 2 | නියාාත | නියාාන |

### පද විවරණය

| | | | |
|---|---|---|---|
| 3 | 2 | පස | පස් සුභයි |
| 4 | 2 | ශුබයි | සුභයි |
| 4 | 2 | යනාදිය | යනාදි |
| 5 | 1 | තීරනය | තීරණය |

## පාඩම් අංක 07

| අංකය | පේළිය | වරද | නිවරද |
|---|---|---|---|
| 1 | 1 | චිත්තිවීථි | චිත්තවීථි |
| 4 | 2 | විථියන්හි | වීථීන්හි |
| 5 | 2 | ගොතභූය | ගෝත්‍රභූය |
| 6 | 1 | අතිමහත්තාරම්මණ | අතිමහන්තාරම්මණ |
| 9 | 1 | භවංංගුච්ඡේද | භවංගුච්ඡේද |
| 11 | 3 | මහත්තාරම්මණ | මහන්තාරම්මණ |
| 11 | 9 | මහත්තාරම්මණ | මහන්තාරම්මණ |
| 12 | 1 | මහත්තාරම්මණ | මහන්තාරම්මණ |
| 12 | 5 | භවංක්ෂණය | භංගක්ෂණය |
| 12 | 7 | මහත්තාරම්මණ | මහන්තාරම්මණ |
| 15 | 1 | වොත්තපනයෙන් | වොත්ථපනයෙන් |
| 20 | 1 | චිත්තක්ෂන | චිත්තක්ෂණ |
| 25 | 6 | පසළොසස | පසළොස |
| 26 | 1 | අවිභූතාරම්මවීථි | අවිභූතාරම්මණවීථි |
| 35 | 3 | ප්‍රඥත්තිය | ප්‍රඥප්තිය |
| 36 | 3 | ලැබෙනනුයේ | ලැබෙනුයේ |
| 37 | 5 | මනෝද්වාරවර්ජන | මනෝද්වාරාවර්ජන |

### ත්‍රිලක්ෂණ විදර්ශනාව

| | | | |
|---|---|---|---|
| 3 | 1 | නැමති | කැමති |
| 4 | 1 | අනාත්මක | අනාත්ම |
| 5 | 2 | පලිබෝදාර්තයෙන් | පලිබෝධාර්ථයෙන් |
| 6 | 2 | ඒකානන්යෙන් | ඒකාන්තයෙන් |

## පාඩම් අංක 08

| අංකය | පේළිය | වරද | නිවරද |
|---|---|---|---|
| 5 | 4 | මනෝද්වාරිරාවර්ජණ | ම-මනෝද්වාරාවර්ජන |
| 12 | 2 | ප්‍රත්‍යාවේක්ෂා | ප්‍රත්‍යවේක්ෂා |
| 12 | 4 | ප්‍රත්‍යාවේක්ෂා | ප්‍රත්‍යවේක්ෂා |
| 12 | 6 | ප්‍රත්‍යාවේක්ෂා | ප්‍රත්‍යවේක්ෂා |
| 14 | 3 | ඤාන | ඤාණ |
| 19 | 4 | පෙරසේම | පෙරසේමය |
| 19 | 4 | ජවනයය | ජවනය |

<u>ත්‍රිලක්ෂණ විදර්ශනාව</u>

| | | | |
|---|---|---|---|
| 5 | 1 | පළිබෝදාර්තයෙන් | පළිබෝධාර්ථයෙන් |

<u>පද විවරණය</u>

| | | | |
|---|---|---|---|
| 4 | 1 | ප්‍රත්‍යාවේක්ෂණ | ප්‍රත්‍යවේක්ෂණ |

## පාඩම් අංක 09

| | | | |
|---|---|---|---|
| 10 | 1 | අතිමහත්තාරම්මණ | අතිමහන්තාරම්මණ සෑත ද්වාරික වීථිය 1 |
| 28 | 3 | ප්‍රාඥායනට | ප්‍රාඥයනට |
| 30 | 1 | විර්ශනා | විදර්ශනා |

<u>ත්‍රිලක්ෂණ විදර්ශනාව</u>

| | | | |
|---|---|---|---|
| 4 | 1 | අනාත්මක | අනාත්ම |
| 5 | 2 | පිළිබෝධාර්තයෙන් | පළිබෝධාර්ථයෙන් |

<u>පද විවරණය</u>

| | | | |
|---|---|---|---|
| 4 | 1 | මෙන් | මෙත් |
| 5 | 1 | පිහිටනා | පිහිටන |

## පාඩම් අංක 10

| | | | |
|---|---|---|---|
| 29 | 3 | විඤ්ඤාණඤ්වායතනය | විඤ්ඤාණඤ්වායතන |
| 31 | 9 | නුවන | නුවණ |

<u>ත්‍රිලක්ෂණ විදර්ශනාව</u>

| | | | |
|---|---|---|---|
| 4 | 1 | අනාත්මක | අනාත්ම |
| 4 | 2 | විමරිනාමාර්ථයෙන් | විපරිනාමාර්ථයෙන් |
| 5 | 1 | ආයුහණ | ආයුහන |

| | | | |
|---|---|---|---|
| 18 | 1 | අප්පමානාභ | අප්පමාණාභ |
| 22 | 1 | සුභකින්හක | සුභකිණ්හක |

## අභිධර්ම භාවනාව අංක 11

| ඡේදය | පේලිය | වරද | නිවරද |
|---|---|---|---|
| 4 | 5 | චතුරථධ්‍යාන විපාකයද..... ...... පඤ්චක නයෙහි | චතුර්ථධ්‍යාන විපාකයද තෘතීය ධ්‍යාන භූමියෙහි ප්‍රතිසන්ධි - භවංග - චුති වශයෙන් ලැබෙන්නේය. චතුෂ්ක නයෙහි චතුර්ථ ධ්‍යාන විපාකයද පඤ්චක |

## අභිධර්ම භාවනාව අංක 12

| | | | |
|---|---|---|---|
| 1 | 2 | චිත්තා | චිත්ත |
| 6 | 4 | නිෂ්ඨන්න | නිෂ්පන්න |
| 35 | 3 | නිහඳන් | නිදහන් |
| 35 | 10 | හේතුව කොට ඇත්තේය (යන තැනට නිවරද පේලියේ දක්වා ඇති කොටස එක්විය යුතුය.) | හේතුකොට ඇත්තේය. ශ්‍රෝත ප්‍රසාද රූපයද, සෝතායතන - සෝත ධාතු - සොතින්ද්‍රියලෝක සොතද්වාර - පණ්ඩර - ඛෙත්ත - වත්ථු - ඔරිමතීර - සුනා‍ය ග්‍රාම යනුවෙන්ද හඳුන්වනු ලැබෙන්නේය. |
| 39 | 1 | වැදගැනීම | වැදගැනීමට |
| | 7 | විඤ්ජ්දාණස්ස | විඤ්ඤාණස්ස |
| 41 | 1 | වනාහ | වනාහි |

## අභිධර්ම භාවනා අංක 13

| ඡේදය | පේලිය | වරද | නිවරද |
|---|---|---|---|
| 2 | 6 | පදට්ඨානං | පදට්ඨානං |
| 17 | 2 | කලායක | කලාපයක |
| | 4 | ප්‍රතිසන්දි | ප්‍රතිසන්ධි |
| 27 | 6 | ලක්ඛණං | ලක්ඛණ |
| | 4 | යෝගාවචරයෙන් | යෝගාවචරයෙක් |
| 31 | 6 | අනුප්පබන්ධනා | අනුප්පබන්ධන |

## අභිධර්ම භාවනා අංක 17

| | | | |
|---|---|---|---|
| 15 | 7 | සංග්‍රහ | සංග්‍රහය |

## අභිධර්ම භාවනා - අංක 18

| | | | |
|---|---|---|---|
| 11 | 8 | වනාහ | වන්නේය |
| 16 | 3 | පච්චුපට්ටානා | පච්චුපට්ඨානා |
| 19 | 5 | 33- 34 - | 33- 34 = 34 |
| | 6 | 31 - 32 - 33 | 31- 32 = 32 |
| | 7 | 30 - 31 - 32 | 30 - 31 = 31 |

ත්‍රි ලක්ෂණ විදර්ශනාව

| | | | |
|---|---|---|---|
| 4 | 1 | අනාත්ම වූ......... | අනාත්ම වූ චිත්ත චෛතසික භූතරූප උපාදා රූප යන මේ නාම රූප |

## අභිධර්ම පාඩම අංක 21

| ඡේදය | පේළිය | වරද | නිවරද |
|---|---|---|---|
| 4 | 8 | අප්‍රණ්‍යාභිසංස්කාරයන්හට | අපුණ්‍යාභිසංස්කාරයන්හට |
| 18 | 6 | සම්පස්සාදි | සම්ඵස්සාදි |

## අභිධර්ම පාඩම - අංක 22

| | | | |
|---|---|---|---|
| 21 | 3 | පිහිවන්නේය. | පිහිටන්නේය |

## අභිධර්ම පාඩම - අංක 23

| | | | |
|---|---|---|---|
| 17 | 6 | අට | අඩ |
| 18 | 5 | වඩන්නකු | වඩන්නකු |
| | 8 | සුබ | සුඛ |
| 24 | 1 | මුඤ්ඤිතුකම්‍යතා | මුඤ්චිතුකම්‍යතා |

## අභිධර්ම පාඩම - අංක 24

| | | | |
|---|---|---|---|
| 3 | 5 | ප්‍රණිධියෙක් | ප්‍රණිධියෙන් |
| 12 | 2 | ක්ෂීණශ්‍ර | ක්ෂීණාශ්‍රව |

## අභිධර්ම භාවනාව අංක 14

| | | | |
|---|---|---|---|
| 3 | 1 | මමයි | මමය |
| 4 | 2 | විඤ්ඤානාදී | විඤ්ඤාණාදී |
| 5 | 4 | රූපයද | රූපද |
| | 5 | පැහැදිලි | පැහැදිලි |
| 9 | 4 | ඉන්ද්‍රිය | ඉන්ද්‍රිය |

## අභිර්ධම භාවනා අංක 15

| ඡේදය | පේළිය | වරද | නිවරද |
|---|---|---|---|
| 12 | 1 | සන්තිති | සන්තති |

කර්ම සමුට්ඨාන රූප කලාප 9 හි, අංක 1 පේලියේ කලාපය, කලාප වියයු චිත්ත සමුට්ඨාන රූප කලාප 6 හි අංක 12 පේලියේ කම්මනඤ්ඤතා යන්න කම්මඤ්ඤතා වියයුතුයි.

පරිපූර්ණායතන ගර්භ සෙය්‍යක සත්ත්වයන්ට එකොළොස්වැනි සතියේදී චක්ඛු - සෝත - ඝාන - ජිව්හා - කලාපයන් එකම ක්ෂණයේදී ලැබෙන ආකාරයද - ඕජඨරණ කාලයේ සිට ආහාර සමුට්ඨාන රූපයන්ගේ පහළවීමද දක්වෙන රූප සටහන

<u>මනෝද්වාරික චිත්ත වීථියක් අනුසාරයෙනි</u>

| සිත් පෙළ | | හ | තී | න | ද | ම | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | රං | රං | හ | හ | හ | හ | හ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ආහාර ප්‍රත්‍ය උතුජ | උ: | | | | | | | | | | | | | | | | | | | |
| රූප කලාප | ඨී: | | | | | | | | | | | | | | | | | | | |
| වර්ධනය | භං | 0 | 2 | 5 | 8 | 11 | 14 | 17 | 20 | 23 | 26 | 29 | 32 | 35 | 38 | 41 | 44 | 47 | 50 | 51 |

ඉහත සඳහන් මනෝද්වාරික චිත්ත වීථියෙහි, ආහාර ප්‍රත්‍ය උතුජ රූප කල වර්ධන ඡේදයෙහි භංග පේලියෙහි අංක මෙසේ නිදොස් විය යුතුයි.

| | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කර්ම ප්‍රත්‍ය ආහාරජ | උ: | 0 | 3 | 24 | 45 | 66 | 87 | 108 | 129 | 150 | 171 | 192 | 213 | 234 | 255 | 276 | 297 | 318 | 339 | 357 |
| රූප | ඨී: | 0 | 10 | 31 | 52 | 73 | 94 | 115 | 136 | 157 | 178 | 199 | 220 | 241 | 261 | 283 | 304 | 325 | 346 | 357 |
| කලාපවර්ධනය | භං: | 0 | 17 | 38 | 59 | 80 | 101 | 122 | 143 | 164 | 185 | 206 | 227 | 448 | 669 | 290 | 311 | 332 | 353 | 357 |

ආහාර ප්‍රත්‍ය උතුජ රූප කලාප වර්ධනයට අනතුරුව සඳහන්විය යුත්තේ කර්ම ප්‍රත්‍ය ආහාරජ රූප කලාප වර්ධනයයි. මේ කොටස සටහන් වී නොමැත. මෙයද ඇතුළත් කර ගන්න.

## අභිධර්ම භාවනා - අංක 16

| ඡේදය | පේළිය | වරද | නිවරද |
|---|---|---|---|
| 4 | 5 | විචිකිච්චානුසය | විචිකිච්ඡානුසය |
| 10 | 3 | විචිකිච්චා | විචිකිච්ඡා |
| 11 | 3 | පත්වුවද | පත්වූද |
| 19 | 2 | කායිණ්ද්‍රිය | කායින්ද්‍රිය |

# පෙරවදන

ඉරු සඳු දෙදෙනා විවෘත වුවෝම බබලති, මාණික්‍ය රත්නය ඔප දමුවේම බබලයි, සුවර්ණය උණුකොට පෙරන ලද්දේම දිලිසෙයි. රජවරු සූසැට අබරණ පැළඳි කල්හිම බබලති. සම්බුද්ධ දේශිත ශ්‍රී සද්ධර්ම රත්නය ද විවෘත වූයේම බබලන්නේ වේ. වසර දෙදහස් තුන්සියය තෙක් ඈත අතීතයේ සිරිලක්දිව බෞද්ධයෝ බුද්ධ ධර්මය මගින් බුද්ධිමත් වූ බැවින් බුද්ධ ධර්මයේ හරය වන අභිධර්මය උගෙන භාවිතා කිරීමෙන් බුදු සසුන බැබලවූහ. එහෙයින් ම ධ්‍යාන මාර්ගඵලාධිගමයන් සමග ගිහි පැවිදි අපමණ ජනතාවක් බුදුසසුනේ දියුණුවට පත්වූහ.

ඉකුත් වූ විසිවෙනි ශතවර්ෂය තුළදී නැවතත් ශ්‍රී ලංකාවේ ගිහි පැවිදි විශාල පිරිසක් අභිධර්මය හදාරා අභිධර්ම පන්ති මගින් සහ අභිධර්මය අලලා ලියා පලකළ දහම් පොත් පත් මගින් අභිධර්මය විවෘත කරමින් බුදු දහම බැබලවූහ. විසිඑක්වෙනි ශත වර්ෂය උදාවෙත්ම අභිධර්මය ගැන විවිධ මත පැන නගිද්දී බුද්ධිමත් බෞද්ධ අබෞද්ධ බොහෝ දෙනෙක් ඉමහත් උද්‍යෝගයෙන් අභිධර්මය හැදෑරීමටත් භාවිතයටත් බලවත් ඡන්දයෙන් ඉදිරිපත් වී සිටිති.

කොළඹ රාජ්‍යසේවා බෞද්ධ සංගමය මගින් 1948 ජුනි 06 දින සිට පැවැත්වෙන මාසික භාවනා පන්ති ත්‍රෛමාසික සීලභාවනා පන්ති මාධ්‍යයෙන් සමථ විදර්ශනා භාවනා පාඩම් සියල්ල සපුරා ඉන් අනතුරුව අභිධර්මය ගැන පාඩම් මාලාවක් පටන් ගන්නා ලද්දේත් අභිධම්මය කෙරෙහි ඇත්තාවූ බලවත් කුශලච්ඡන්දයෙනි.

ධම්මසංඝණී ප්‍රකරණයෙහි ත්‍රික ද්වික මාතෘකා පාඩම් මාලා සියල්ල දහම්පොත් දෙකකින්ම නිමකොට විශේෂාභිධර්ම භාවනා නමින් පාඩම් පන්ති 24 ක් පවත්වන ලදී. පුරා දෙවසරක් තිස්සේ පාඩම් පන්ති විසි හතරක දී නිම වූ එම පාඩම් පෙළ, පූජනීය අනුරුද්ධාචාර්යයන් වහන්සේගේ අභිධර්මාර්ථ සංග්‍රහය ගුරුපොත කොටගෙන පවත්වන ලදී. මාසික පාඩම් පත්‍රිකා වශයෙන් සැපයුණු පාඩම් පෙළ රාජ්‍යසේවා බෞද්ධ සංගමයේ උපභාණ්ඩාගාරිකාව වූ පින්වත් නන්දා වැලිකල මහාත්මනීන්ගේ සහ පින්වත් සෝමා රණසිංහ මහාත්මනීන්ගේ ද ඉමහත් ශ්‍රද්ධාවෙන් හා උත්සාහයෙන් බොහෝ පරිත්‍යාගශීලී සාධූන්ගෙන් ද සහායෙන් මාසයක් පාසා මුද්‍රණය කරවන ලද්දේ රාජ්‍යසේවා බෞද්ධ සංගමයට අනුග්‍රහයක් වශයෙන් හා ධර්මදාන ශීර්ෂයෙනි.

මාසයක් පාසා පන්තියට සහභාගී වූ සැමට පාඩම් පත්‍රිකා පිරිනමන ලදුව අවශේෂ පත්‍රිකා සියල්ල දහම් පොතක් වශයෙන් මෙසේ සංස්කරණය කොට පිරිනැමීම විශේෂ ධර්මදානයකි. ප්‍රථම මුද්‍රිත ධර්ම පත්‍රිකාවන් සඳහා ශුද්ධි පත්‍රයක් ද සපයා ඇති බැවින් අර්ථාවබෝධය පහසු වනු ඇත.

මේ සඳහා ධනය ශ්‍රමය කාලය කැපකළ පින්වත් නන්දා වැලිකල මහාත්මනීන්ටත් පින්වත් සෝමා රණසිංහ මහාත්මනීන්ටත් ශුද්ධි පත්‍රය සකස්කර දීමෙන් සහාය දැක්වූ සමරා රණවීර මහත්මනීන්ටත් සහභාගි වූ පරිත්‍යාගශීලී සැමටත් විශේෂයෙන් රාජ්‍යසේවා බෞද්ධ සංගමයේ සැමටත් ආයුරාරෝග්‍යාදි සැපතත් ධර්ම ඥානයත් භාවනා ඥානයත් මුදුන්පත් වේවා. සම්‍යක් සංකල්පනා සියල්ල සමෘද්ධ වේවා. ශාන්ති ලක්ෂණ නිර්වාණ ධාතුව සුවසේ සාක්ෂාත් වේවා.

''චිරං තිට්ඨතු ලොකස්මිං - සම්මා සම්බුද්ධ සාසනං''

මෙයට,
මෙතැනි,
නායනේ අරියධම්ම ස්ථවිර
නාඋයන අරණ්‍ය සේනාසනය
පන්සියගම

## අපෙන් වචනයක්

රාජ්‍ය සේවා බෞද්ධ සංගමයේ අනුග්‍රහයෙන් අති පූජ්‍ය නාඋයනේ අරියධම්ම නාහිමිපානන්ගේ ප්‍රධානත්වයෙන්, 1984 ජූනි මස 06 වෙනි දින ආරම්භ වී දස වසරකටත් අධික කාලයක් නොකඩවා මාසිකව කොළඹ මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේදී පැවැත්වෙන භාවනා පාඩම් පෙල, උගත් සිල්වත් බෞද්ධ ජනතාව අතර අතිශයින් ජනප්‍රිය වී ඇත.

මසක් පාසා භාවනා වැඩ සටහනේදී බෙදා දුන් පාඩම්, පත්‍රිකා එකතුව මෙලෙස පොතක් ලෙස නිර්මාණය කොට බෙදා හැරීමට නන්දා වැලිකල මහත්මිය දක්වූ උනන්දුව හා උද්යෝගය රාජ්‍ය සේවා බෞද්ධ සංගමයේ වත්මන් සභාපතිනිය ලෙස ඉමහත් ප්‍රශංසාවෙන් සඳහන් කරමි. එමෙන්ම මේ අවස්ථාවේදී මෙම දහම් පොතට මාගේ පණිවුඩයක් නිකුත් කරන්නට ලැබීම මහත් සතුටක් මෙන්ම මා ලැබූ භාග්‍යයක් ලෙස සලකමි.

අතිපූජ්‍ය නාඋයනේ අරියධම්ම මාහිමිපානන් මාස්පතා මෙම භාවනා වැඩසටහන මෙහෙයවමින්, සහභාගිවන උවසු උවැසියන්ගේ ධර්මඥාණය වැඩිදියුණු කිරීමට කරන්නා වූ ඉමහත් සේවය උන්වහන්සේ ප්‍රාර්ථනා කරන මතු බුදුබව ලබාගැනීමට හේතුවේවා!

අතිපූජ්‍ය නාඋයනේ අරියධම්ම ස්වාමීන් වහන්සේ සමඟ භාවනා වැඩසටහනට වඩිමින් එම කටයුතුවලට සහායවීම මෙන්ම, උන්වහන්සේ නොපැමිණෙන දිනයන්හි භාවනා පන්තිය මෙහෙයවීමෙන්, විශාල මෙහෙයක් ඉටුකරන පොල්ගස්ඕවිට, දික්හේන භාවනා මධ්‍යස්ථානයේ වැඩ වසන කම්මට්ඨානාචාර්ය දාස්වත්තේ සුමනශීල ස්වාමීන් වහන්සේගෙන් ඉටුවන ඉමහත් සේවයද මෙහිලා සඳහන් කරන්නේ ගෞරව භක්තියෙනි. දාස්වත්තේ සුමනශීල ස්වාමීන් වහන්සේට ද මෙපින් බලෙන් නිර්වාණාවබෝධය පහසු වේවා!

නන්දා වැලිකල මහත්මියටද මෙම ධර්මදානය මතු නිර්වාණාවබෝධය පිණිසම හේතුවේවා!

එසේම මෙම භාවනා පන්තියට සහභාගිවෙමින්, සියළු සංවිධාන කටයුතුවලට තමාගේ උපරිම දායකත්වය පිරිනමන සංගමයේ ප්‍රධාන ලේකම් විජයානන්ද ආබෟ මහතා සහ භාණ්ඩාගාරික කේ.ඒ. නන්දසේන මහතාද කෘතඥතාපූර්වකව සිහිකරන අතර, එම දෙපලට මෙම පුණ්‍ය කර්මයේ ආනිශංසයෙන් නිර්වාණාවබෝධය ලැබේවායි ! යි පතමි.

මෙම භාවනා පන්තිය මාසිකව පැවැත්වීම මෙන්ම, වසරකට තුන්වතාවක් පුරා දිනක් පැවැත්වෙන ශීල භාවනා වැඩ සටහනට තමන්ගේ දායකත්වය ලබාදෙමින්, නොකඩවා පසුගිය වසර දහයකට අධික කාලයක් මෙම භාවනා වැඩ සටහන මෙන්ම ශීල භාවනා වැඩ සටහන පවත්වාගෙන යාමට රාජ්‍ය සේවා බෞද්ධ සංගමයේ විධායක කමිටු සාමාජික සාමජිකාවන්ගෙන් මට ලැබුණ නොමසුරු සහයෝගයද කෘතඥතා පූර්වකව සිහිකරමි.

එමෙන්ම මෙම වැඩසටහන්වලට සහභාගිවන ස්වාමීන් වහන්සේලාට දානමානාදිය සැපයීම හා ප්‍රවාහන පහසුකම් සැපයීමෙන් හා ශීලභාවනා දිනයන්හි සිල් සමාදන්වන උවසු උවැසියන්ට උදේ- දහවල් දානය හා ගිලන්පස පිරිනැමීමෙන් මෙම වැඩ සටහන නොකඩවා පවත්වාගෙන යාමට දායකවන සියළු දෙනාට මාගේ අවංක ස්තුතිය පිරිනමන අතර මෙපින් බලෙන් මතු නිර්වාණාවබෝධය පහසුවේවා! යි ප්‍රාර්ථනා කරමි.

වෛද්‍ය රානි ප්‍රනාන්දු,
සභාපතිනිය,
රාජ්‍ය සේවා බෞද්ධ සංගමය

නියෝජ්‍ය අධ්‍යක්ෂ,
ශ්‍රී ලංකා ජාතික රෝහල,
කොළඹ.

අපගේ ගුරුදේව කම්මට්ඨානාචාර්ය අති පූජ්‍ය නාඋයනේ අරියධම්ම ස්වාමීන්වහන්සේ ගේ හා ගරු සුමණසීල ස්වාමීන්වහන්සේගේ උතුම් වූ ශාසනික ප්‍රාර්ථනයන් ඉෂ්ට සිද්ධ වීමටත් පරලෝ සැපත් මාගේ දෙමාපියන් වහන්සේලාට, නැදිමයිල් දෙදෙනා වහන්සේලාට හා ඥාති හිතමිත්‍රාදීන්ට නිවන් සුව පිණිසත් මාගේ ධර්ම ඥාණය හා භාවනා ඥානය දියුණු වී නිවන් සුව පිණිස මෙම විශේෂාභිධර්ම පාඩම් පෙල පොතක් වශයෙන් සකසා ස්වාමීන් වන්සේලාගේ ප්‍රයෝජනය සඳහා පූජා කළෙමි. පූජා වේවා.

නන්දා වැලිකල

# අභිධර්ම භාවනා පාඩම අංක 01

## අති පූජ්‍ය නා උයනේ අරිය ධම්ම නාහිමිපාණන් වහන්සේ විසින්

අභිධර්මාර්ථ සංග්‍රහය චිත්ත සංග්‍රහ විභාගය.

නමෝ තස්ස භගවතො අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!

1. **සම්මා සම්බුද්ධ මතුලං - සසද්ධම්ම ගණුත්තමං**
**අභිවාදිය භාසිස්සං - අභිධම්මත්ථ සංගහං**

ශ්‍රී සද්ධම්ම රත්නය ද ගණෝත්තම ආර්ය මහාසංඝරත්නය ද සහිත තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධ සර්වඥ රාජෝත්තමයාණන් වහන්සේට ගෞරවාදර භක්ති ප්‍රණාමයෙන් වැඳ නමස්කාර කොට අභිධර්මාර්ථ සංග්‍රහය දේශනා කරන්නෙමි.

2. **තත්ථ වුත්තාභි ධම්මත්ථා - චතුධා පරමත්ථතෝ**
**චිත්තං චේතසිකං රූපං - නිබ්බාන මිති සබ්බථා**

සර්වඥ දේශිත ඒ අභිධර්ම පිටකයෙහි අභිධර්මාර්ථයෝ පරමාර්ථ වශයෙන් චිත්තය - චෛතසිකය -රූපය නිර්වාණ යයි සතර වැදෑරුම් වන්නාහ.

3. චිත්තය චෛතසිකය රූපය නිර්වාණය යන සතර පරමාර්ථ අතුරෙන් චිත්තය වනාහි සංක්ෂේපයෙන් 89 එකුන් අනූ වැදෑරුම් වන්නේය. විස්තර වශයෙන් 121 එක්සිය විසිඑක් වැදෑරුම් වන්නේය. එය ද කාමාවචරය රූපාවචරය අරූපාවචරය ලෝකෝත්තර යයි සිවු වැදෑරුම් වන්නේය.

4. කාමාවචර සිත් සිවු පණසක් 54 ද රූපාවචර සිත් 15 පසළොසක් ද අරූපාවචර සිත් දොළසක් 12 ද ලෝකෝත්තර සිත් සංක්ෂේපයෙන් අටක් 8 ද විස්තරයෙන් සම සතළිසක් 40 ද වන්නාහ.

5. කාමාවචර චිත්තයද වනාහි දොළොස් අකුසල චිත්තය, අටළොස් අහේතුක චිත්තය, සුවිසි කාමසෝභන චිත්තයැයි සිවුපණස් වැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් අකුසල චිත්තය, ලෝභමූල සිත් අටදෙනෙක් ද දෙසමූල සිත් දෙකක් ද මෝහමූල සිත් දෙකක් දැයි දොළොස් වැදෑරුම් වන්නේය.

6. ලෝභමූල අකුසල් සිත අටවැදෑරුම් වන්නේ කෙසේද යත්, සෝමනස්ස සහගත දිට්ඨිගත සම්ප්‍රයුක්ත අසංඛාරික එක් සිතකි. එසේම සෝමනස්ස සහගත දිට්ඨිගත සම්ප්‍රයුක්ත සසංඛාරික එක් සිතකි. සෝමනස්ස සහගත දිට්ඨිගත විප්‍රයුක්ත අසංඛාරික එක් සිතකි. සෝමනස්ස සහගත දිට්ඨිගත විප්‍රයුක්ත සසංඛාරික එක් සිතකි. 2. උපේක්ඛා සහගත දිට්ඨිගත සම්ප්‍රයුක්ත අසංඛාරික එක් සිතකි. උපෙක්ඛා සහගත දිට්ඨිගත සම්ප්‍රයුක්ත සසංඛාරික එක් සිතකි. උපේක්ඛා සහගත දිට්ඨිගත විප්‍රයුක්ත අසංකාරික එක් සිතකි. උපේක්ඛා සහගත දිට්ඨිගත විප්‍රයුක්ත සසංඛාරික එක් සිතකැයි මෙසේ අට වැදෑරුම් වන්නේය.

7. දෝසමූල අකුසල් සිත දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්, දෝමනස්ස සහගත පටිඝසම්ප්‍රයුක්ත අසංඛාරික එක් සිතකි. දෝමනස්ස සහගත පටිඝ සම්ප්‍රයුක්ත සසංකාරික එක් සිතකැයි මෙසේ දෙවැදෑරුම් වන්නේය. මෝහමූල අකුසල් සිත දෙවැදෑරුම් වන්නේ කෙසේද යත්, උපෙක්ඛා සහගත උද්ධච්ච සම්ප්‍රයුක්ත එක් සිතකි. උපෙක්ඛා සහගත විචිකිච්ඡා සම්ප්‍රයුක්ත එක් සිතකැයි මෙසේ දෙවැදෑරුම් වන්නේය.

8. **අට්ඨධා ලෝබමූලානි - දෝසමූලානි ච ද්විධා**
**දෝස මූලානි චද්වෙති - ද්වාදසා කුසලා සියුං**

ලෝභමූල සිත් අටක් ද දෝසමූල සිත් දෙකක්ද මෝහ මූල සිත් දෙකක් දැයි අකුසල් සිත් දෙළසක් වන්නාහ.

9. අහේතුක සිත් අටළොස ද වනාහි අකුසල විපාක සිත් සතකි. අහේතුක කුසල විපාක සිත් අටකි. අහේතුක ක්‍රියා සිත් තුනකැයි අටළොස් වැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් අකුසල විපාක සිත සත් වැදෑරුම් වන්නේ කෙසේද යත්, උපෙක්ඛා සහගත චක්ඛු විඤ්ඤාණ සිතය, උපෙක්ඛා සහගත සෝත විඤ්ඤාණ සිතය, උපෙක්ඛා සහගත ඝානවිඤ්ඤාණ සිතය, උපෙක්ඛා සහගත ජිව්හා විඤ්ඤාන සිතය, දුක්ඛ සහගත කාය විඤ්ඤ සිතය උපෙක්ඛා සහගත සම්පටිච්ඡන සිතය, උපෙක්ඛා සහගත සන්තීරණ සිතයයි මෙසේ සත් වැදෑරුම් වන්නේය.

10. අහේතුක කුසල විපාක සිත අටවැදෑරුම් වන්නේ කෙසේද යත්, කුසලවිපාක උපෙක්ඛා සහගත චක්ඛු විඤ්ඤණ සිතය, කුසල විපාක උපෙක්ඛා සහගත සෝත විඤ්ඤණ සිතය, කුසලවිපාක උපෙක්ඛා සහගත ඝාන විඤ්ඤණ සිතය, කුසල විපාක උපෙක්ඛා සහගත ජිව්හාඤ්ඤණ සිතය, කුසලවිපාක සුඛ සහගත කාය විඤ්ඤණ සිතය, කුසල විපාක උපෙක්ඛා සහගත සම්පටිච්ඡන සිතය, කුසල විපාක සෝමනස්ස සහගත සන්තීරණ සිතය, කුසල් විපාක උපෙක්ඛා සහගත සන්තීරණ සිතයයි මෙසේ අට වැදෑරුම් වන්නේය.

11. අහේතුක ක්‍රියා සිත තුන් වැදෑරුම් වන්නේ කෙසේද යත්, උපෙක්ඛා සහගත පඤ්චද්වාරාවර්ජන ක්‍රියා චිත්තය, උපෙක්ඛා සහගත මනෝද්වාරාවර්ජන ක්‍රියා චිත්තය, සෝමනස්ස සහගත හසිතෝත්පාද ක්‍රියා චිත්තය දැයි මෙසේ තුන් වැදෑරුම් වන්නේය.

12. **සත්තා කුසල පාකානි - පුඤ්ඤපාකානි අට්ඨධා**
**ක්‍රියා චිත්තානි තීණීති - අට්ඨාරස අහේතුකා.**

අකුසල විපාක සිත් සතකි., කුසල අහේතුක විපාක සිත් අටකි, ක්‍රියා සිත් තුනකැයි අහේතුක සිත් අටළොසක් වන්නාහ.

13. **පාපාහේතුක මුත්තානි - සෝභනානීති වුච්චරේ**
**එකූන සට්ඨී චිත්තානි - අථේක නවුතීපි වා.**

අකුසල් සිත් දෙළසය, අහේතුක සිත් අටළොසය යන සමතිසක් වූ චිත්තයෝ අසෝභන සිත් නම් වන්නාහ. ඔවුන්ගෙන් වෙන් වූ ඉතිරි සිත් එකුන් සැට 59 දෙනා ද සවිස්තර සිත් එක් අනූ 91 දෙනා ද සෝභන සිත් නම් වන්නාහ.

14. කාමාවචර සෝභන චිත්තය ද වනාහි, මහා කුසල් සිත් අට දෙනය, මහා විපාක සිත් අට දෙනය, මහා ක්‍රියා සිත් අට දෙන යයි සුවිසි වැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් මහා කුසල් සිත්, අට වැදෑරුම් වන්නේ කෙසේද යත්, සෝමනස්ස සහගත ඤාණ සම්ප්‍රයුක්ත අසංඛාරික එක් සිත කි. සෝමනස්ස සහගත ඤාණ සම්ප්‍රයුක්ත සසංඛාරික එක් සිතකි. සෝමනස්ස සහගත ඤාණ විප්‍රයුක්ත අසංඛාරික එක් සිතකි. සෝමනස්ස සහගත ඤාණ විප්‍රයුක්ත සසංඛාරික එක් සිතකි. උපෙක්ඛා සහගත ඤාණ සම්ප්‍රයුක්ත අසංඛාරික එක් සිතකි. උපෙක්ඛා සහගත ඤාණ සම්ප්‍රයුක්ත සසංකාරික එක් සිතකි. උපෙක්ඛා සහගත ඤාණ විප්‍රයුක්ත අසංකාරික එක් සිතකි.උපෙක්ඛා සහගත ඤාණ විප්‍රයුක්ත සසංකාරික එක් සිතකැයි මෙසේ මහා කුසල සිත අට වැදෑරුම් වන්නේය.

15. කාමාවචර සෝභන මහා විපාක සිත අට වැදෑරුම් වන්නේ කෙසේද යත්, සෝමනස්ස සහගත ඤාණසම්ප්‍රයුක්ත අසංඛාරික මහා විපාක එක් සිතකි, සෝමනස්ස සහගත ඤාණ සම්ප්‍රයුක්ත සසංකාරික මහා විපාක එක් සිතකි. සෝමනස්ස සහගත ඤාණ විප්‍රයුක්ත අසංකාරික මහා විපාක එක් සිතකි, සෝමනස්ස සහගත ඤාණ විප්‍රයුක්ත සසංකාරික මහා විපාක එක් සිතකි, උපෙක්ඛා සහගත ඤාණ සම්ප්‍රයුක්ත අසංකාරික මහා විපාක එක් සිතකි,. උපෙක්ඛා සහගත ඤාණ සම්ප්‍රයුක්ත සසංඛාරික මහා විපාක එක් සිතකි. උපෙක්ඛා සහගත ඤාණ විප්‍රයුක්ත අසංඛාරික මහා විපාක එක් සිතකි. උපෙක්ඛා සහගත ඤාණ විප්‍රයුක්ත සසංඛාරික මහා විපාක එක් සිතකැයි මෙසේ මහා විපාක සිත අට වැදෑරුම් වන්නේය.

16. කාමාවචර සෝභන මහා ක්‍රියා සිත අටවැදෑරුම් වන්නේ කෙසේද යත්, සෝමනස්ස සහගත ඤාණ සම්ප්‍රයුක්ත අසංඛාරික මහා ක්‍රියා එක් සිතකි. සෝමනස්ස සහගත ඤාණ සම්ප්‍රයුක්ත සසංඛාරික මහා ක්‍රියා එක් සිතකි. සෝමනස්ස සහගත ඤාණ විප්‍රයුක්ත අසංඛාරික මහා ක්‍රියා එක් සිතකි. සෝමනස්ස සහගත ඤාණ විප්‍රයුක්ත සසංඛාරික මහා ක්‍රියා එක් සිතකි. උපෙක්ඛා සහගත ඤාණ සම්ප්‍රයුක්ත අසංඛාරික මහා ක්‍රියා එක් සිතකි. උපෙක්ඛා සහගත ඤාණ සම්ප්‍රයුක්ත සසංඛාරික මහා ක්‍රියා එක් සිතකි. උපෙක්ඛා සහගත ඤාණ විප්‍රයුක්ත අසංඛාරික මහා ක්‍රියා එක් සිතකි. උපෙක්ඛා සහගත ඤාණ විප්‍රයුක්ත සසංඛාරික මහා ක්‍රියා එක් සිතකැයි මෙසේ මහා ක්‍රියා සිත අට වැදෑරුම් වන්නේය.

17. **වේදනා ඤාණ සංඛාර - භේදේන චතු වීසති**
**සහේතු කාමාවචර - පුඤ්ඤපාක ක්‍රියා මතා**

සහේතුක කාමාවචර කුසල - විපාක - ක්‍රියා චිත්තයෝ වේදනා භේදයෙන් ද ඤාණ සම්ප්‍රයුක්ත භේදයෙන් ද සංඛාර භේදයෙන් ද සූවිස්සක් වන්නාහ.

18. **කාමේ තේවීස පාකානි - පුඤ්ඤ පුඤ්ඤනි වීසති**
**ඒකාදස ක්‍රියා චේති - චතු පඤ්ඤස සබ්බථා**

කාමාවචර විපාක සිත් තෙවිස්සකි. කුසල - අකුසල සිත් සමවිස්සකි, ක්‍රියා සිත් එකොළසකැයි සියල්ල පූපණසක් වන්නාහ.

19. රූපාවචර සිත ද වනාහි කුසල් සිත් පසෙකි, විපාක සිත් පසෙකි, ක්‍රියා සිත පසෙකැයි පසළොස් වැදෑරුම් වන්නේය, රූපාවචර කුසල් සිත පස් වැදෑරුම් වන්නේ කෙසේද යත්, විතර්ක විචාර ප්‍රීති සුඛෛකාග්‍රතා සහිත ප්‍රථම ධ්‍යාන කුසල චිත්තය, විචාර ප්‍රීති සුඛෛකාග්‍රතා සහිත ද්විතිය ධ්‍යාන කුසල චිත්තය, ප්‍රීති සුඛෛකාග්‍රතා සහිත තෘතිය ධ්‍යාන කුසල චිත්තය, සුඛෛකාග්‍රතා සහිත චතුර්ථ ධ්‍යාන කුසල චිත්තය, උපෙක්ඛා ඒකාග්‍රතා සහිත පඤ්චම ධ්‍යාන කුසල චිත්තයැයි රූපාවචර කුසල් සිත මෙසේ පස් වැදෑරුම් වන්නේය.

20. රූපාවචර විපාක සිත පස්වැදෑරුම් වන්නේ කෙසේද යත්, විතර්ක විචාර ප්‍රීති සුඛෛකාග්‍රතා සහිත ප්‍රථමධ්‍යාන විපාක චිත්තය, විචාර ප්‍රීති සුඛෛකාග්‍රතා සහිත ද්විතිය ධ්‍යාන විපාක චිත්තය, ප්‍රීතී සුඛෛකාග්‍රතා සහිත තෘතිය ධ්‍යාන විපාක චිත්තය, සුඛෛකාග්‍රතා සහිත චතුර්ථද ධ්‍යාන විපාක චිත්තය, උපෙක්ඛා ඒකාග්‍රතා සහිත පඤ්චම ධ්‍යාන විපාක චිත්ත යැයි රූපාවචර විපාක චිත්තය මෙසේ පස් වැදෑරුම් වන්නේය.

21. රූපාවචර ක්‍රියා චිත්තය පස්වැදෑරුම් වන්නේ කෙසේද යත්, විතර්ක විචාර ප්‍රීති සුඛෛකාග්‍රතා සහිත ප්‍රථම ධ්‍යාන ක්‍රියා චිත්තය, විචාර ප්‍රීති සුඛෛකාග්‍රතා සහිත ද්විතිය ධ්‍යාන ක්‍රියා චිත්තය, ප්‍රීති සුඛෛකාග්‍රතා සහිත තෘතිය ධ්‍යාන ක්‍රියා චිත්තය, සුඛෛකාග්‍රතා

සහිත චතුර්ථද ධ්‍යාන ක්‍රියා චිත්තය උපෙක්ඛා ඒකාග්‍රතා සහිත පඤ්චම ධ්‍යාන ක්‍රියා චිත්ත යැයි රූපාවචර ක්‍රියා චිත්තය මෙසේ පස් වැදෑරුම් වන්නේය.

22. **පඤ්චධා ඣාන භේදේන - රූපාවචර මානසං**
**පුඤ්ඤ පාක ක්‍රියා භේද - තං පඤ්ච දසධා භවේ.**

ධ්‍යාන භේදයෙන් පස්වැදෑරුම් වූ රූපාවචර චිත්තය වනාහි, කුසල විපාක ක්‍රියා භේදයෙන් පසළොස් වැදෑරුම් වන්නේය.

23. අරූපාවචර චිත්තය ද කුසල් සිත් සතරකි, විපාක සිත් සතරකි ක්‍රියා සිත් සතරකැයි දෙළොස් වැදෑරුම් වන්නේය. අරූපාවචර කුසල චිත්තය සතර වැදෑරුම් වන්නේ කෙසේ ද යත්, ආකාසානඤ්චායතන කුසල චිත්තය, විඤ්ඤාණඤ්චායතන කුසල චිත්තය, ආකිඤ්චඤ්ඤායතන කුසල චිත්තය, නේවසඤ්ඤානාසඤ්ඤායතනන කුසල චිත්තයැයි මෙසේ සිවුවැදෑරුම් වන්නේය.

24. අරූපාවචර විපාක චිත්තය සිවුවැදෑරුම් වන්නේ කෙසේද යත්, ආකාසානඤ්චායතනය විපාක චිත්තය, විඤ්ඤාණඤ්චායතන විපාක චිත්තය, ආකිඤ්චඤ්ඤායතන විපාක චිත්තය, නේවසඤ්ඤානාසඤ්ඤායතන විපාක චිත්තය යැයි මෙසේ සිවු වැදෑරුම් වන්නේය.

25. අරූපාවචර, ක්‍රියා චිත්තය සිවුවැදරුම් වන්නේ කෙසේද යත්, ආකාසානඤ්චායතන ක්‍රියා චිත්තය, විඤ්ඤාණඤ්චායතන ක්‍රියා චිත්තය ආකිඤ්චඤ්ඤායතනය ක්‍රියා චිත්තය, නේවසඤ්ඤානාසඤ්ඤායතන ක්‍රියා චිත්තයැයි මෙසේ සිවු වැදෑරුම් වන්නේය.

26. **ආලම්බණ ප්පභේදේන - චතුධාරුප්ප මානසං**
**පුඤ්ඤ පාක ක්‍රියා භේදා - පුන ද්වාදසධා ඨිතං**

ආරාම්මණ ප්‍රභේදයෙන් සතරාකාරවූ අරූපාවචර චිත්තය වනාහි කුශල - විපාක - ක්‍රියා භේදයෙන් නැවත දෙළොස් ආකාරයෙන් සිටියේය.

27. ලෝකෝත්තර චිත්තය වනාහි කුසල් සිත් සතරය ඵලසිත් සතරයැයි සංක්ෂෙපයෙන් අට වැදෑරුම් වන්නේය, ලෝකෝත්තර කුසල චිත්තය සතර වැදෑරුම් වන්නේ කෙසේද යත්, සෝතාපත්ති මාර්ග චිත්තය, සකදගාමී මාර්ග චිත්තය, අනාගාමී මාර්ග චිත්තය, අර්හත්ත මාර්ග චිත්ත යැයි මෙසේ සතර වැදෑරුම් වන්නේය.

28. ලෝකා්තතර ඵල චිත්තය සතර වැදෑරුම්ං වන්නේ කෙසේද යත්, සෝතාපත්ති ඵල චිත්තය, සකදගාමී ඵල චිත්තය, අනාගාමී ඵල චිත්තය, අරහත්ත ඵල චිත්තයැයි මෙසේ සතර වැදෑරුම් වන්නේය.

29. **චතුමග්ග ප්පභේදේන - චතුධා කුසලං තථා**
**පාකං තස්ස ඵලත්තාති - අට්ඨධා නුත්තරං මතං**

සතර මාර්ග ප්‍රභේදයෙන් ලෝකෝත්තර කුසල් සිත් සතරක්ද මාර්ග කුසලයාගේම ඵලය බැවින් ඵල සිත් සතරක් දැයි මෙසේ ලෝකෝත්තර සිත් අටකැයි දන්නා ලදහ.

30. **ද්වාදසා කුසලානේවං - කුසලානේක වීසති**
**ඡත්තිංසේව විපාකානි - ක්‍රියා චිත්තානි වීසති**

මෙසේ අකුසල සිත් දෙළසකි. කුසල සිත් එක් විස්සකි, විපාක සිත් සතිසකි, ක්‍රියා සිත් සම විස්සද වෙති.

31. **චතුපඤ්ඤසධා කාමෙ - රූපෙ පණ්ණරසීරයෙ**
**චිත්තානි ද්වාදසා රුප්පේ - අට්ඨධා නුත්තරේ තථා**

කාමාවචර භූමියෙහි සිත් සිවු පණසෙකි, රූපාවචර භූමියෙහි පසළොසකි, අරූපාවචර භූමියෙහි සිත් දෙළසකි, එසේම ලෝකෝත්තර භූමියෙහි අට වැදෑරුම් ද වන්නේය.

32. **ඉත්ථ මේකූන නවුතිප් - පභේදං පන මානසං**
**ඒකවීස සතං වාථ - විභජන්ති විචක්ඛණා**

මෙසේ ප්‍රභේද වශයෙන් එකුන් අනූවක් වූ චිත්තය, අභිධර්මයෙහි විචක්ෂණ බුද්ධිමත් ආචාර්යවරු එකසිය විසි එකක් කොට බෙද දක්වන්නාහ.

33. සංක්ෂේපයෙන් අටවැදෑරුම් වූ ලෝකෝත්තර චිත්තය වනාහි ධ්‍යානාංග සම්ප්‍රයෝග වශයෙන් මාර්ගසත් සමවිස්සක්ය ඵලසිත් සමතිස්සකැයි සම සතලිස් වැදෑරුම් වන්නේය. ලෝකෝත්තර මාර්ග සිත සමවිසි වැදෑරුම් වන්නේ කෙසේද යත්, විතර්ක විචාර ප්‍රීති සුඛෛකාග්‍රතා සහිත ප්‍රථමධ්‍යාන සෝතාපත්ති මාර්ග චිත්තය, විචාර ප්‍රීති සුඛෛකාග්‍රතා සහිත ද්විතිය ධ්‍යාන සෝතාපත්ති මාර්ග චිත්තය, ප්‍රීති සුඛෛකාග්‍රතා සහිත තෘතිය ධ්‍යාන සෝතාපත්ති මාර්ග චිත්තය, සුඛෛකාග්‍රතා සහිත චතුර්ථධ්‍යාන සෝතාපත්ති මාර්ග චිත්තය, උපෙක්ඛා ඒකාග්‍රතා සහිත පඤ්චම ධ්‍යාන සෝතාපත්ති මාර්ග චිත්තයැයි සෝතාපත්ති මාර්ග චිත්තය පස් වැදෑරුම් වන්නේය. එසේම සකදාගාමී මාර්ග අනාගාමී මාර්ග - අර්හත් මාර්ග චිත්තය ද පස් වැදෑරුම් වන්නේය. මෙසේ ලෝකෝත්තර මාර්ග චිත්තය ද සමවිසි වැදෑරුම් වන්නේය. ලෝකෝත්තර ඵල චිත්තයද මෙසේම සමවිසි වැදෑරුම් වන්නේය. එසේ හෙයින් සවිස්තර වශයෙන් ලෝකෝත්තර චිත්තය මෙසේ සම සතලිස් වැදෑරුම් වන්නේය

34. **ඣානංග යෝග භේදේන - කත්වේකෙකන්තු පඤ්ච ධා**
**වුච්චතා නුත්තරං චිත්තං - චත්තාලීස විධන්ති ච.**

ධ්‍යානාංග සම්ප්‍රයුක්ත භේදයෙන් එක එක මාර්ග ඵල සිතත් පසක් පසක් බැගින් කොට ගත් කල්හි ලෝකෝත්තර චිත්තය සම සතලිසක් යයි කියනු ලැබේ.

35. **යථා ච රූපාවචරං - ගය්හතා නුත්තරං තථා**
**පඨමාදි ඣාන භේදේ - ආරුප්පඤ්චාපි පඤ්චමේ**

36. රූපාවචර චිත්තය ප්‍රථමධ්‍යානාදි භේදයෙහි ගන්නා සේ ලෝකෝත්තර චිත්තය ද ප්‍රථම ධ්‍යානාදි භේදයෙන් ගනු ලැබේ. අරූපාවචර චිත්තය ද පඤ්චම ධ්‍යානයෙහි ලා ගනු ලැබේ.

37. **ඒකාදස විධං තස්මා - පඨමාදික මීරිතං**
**ඣාන මේකේක මන්තේතු - තේවීසති විධං භවේ**

එසේ හෙයින් ප්‍රථම ධ්‍යානාදි එක එක ධ්‍යානයක් එකොළොස් වැදෑරුම් වන්නේය. අන්තිම වූ පඤ්චම ධ්‍යානයෙහි වනාහි තෙවිසි වැදෑරුම් වන්නේය.

38. **සත්තතිංස විධං පුඤ්ඤං - ද්වපඤ්ඤස විධං තථා**
**පාක මිච්චාහු චිත්තානි - ඒක වීස සතං බුධා**

මෙසේ කුසල චිත්තය සත්තිස් වැදෑරුම් වන්නේය. විපාක චිත්තය දෙපණස් වැදෑරුම් වන්නේයැයි සියලු සත් එකසිය එක් විස්සකැයි ආචාර්ය වරයෝ ප්‍රකාශ කළහ.

39. අනන්තාපරිමාණ ලෝක ධාතුන්හි අනන්තාපරිමාණ සත්ව සන්තානයන්හි පහළ වන්නා වූ සියලු චිත්තයන් සම්පිණ්ඩනය කොටගත් කල්හි මෙසේ සංක්ෂේපයෙන් එකුන් අනූවක් 89 ද, විස්තාර වශයෙන් එකසිය විසි එකක් 121 ද වන්නාහ.

භූමි වශයෙන් කාමාවචර සිත් සූපණසක් 54 ද, රූපාවචර සිත් පසළොසක් 15 ද, අරූපාවචර සිත් දොළසක් 12 ද, ලෝකෝත්තර සිත් අටක් 8 ද, වන්නාහ. ජාති වශයෙන් අකුශල් සිත් දොළසක් 12 ද, කුශල් සිත් එක් විස්සක් 21 ද, විපාක සිත් සතිසක් 36 ද, ක්‍රියා සිත් විස්සක් 20 ද, විස්තර වශයෙන් කුශල් සිත් සත්තිසක් 37 ද, විපාක සිත් දෙපණසක් ද, 52 වන්නාහ. සෝභන අසෝභන වශයෙන් සෝභන සිත් එකුන් සැටක් 59 ද, එක් අනුවක්ද 91 අසෝභන සිත් සමතිසක් 30 ද වන්නාහ. නැවත ලෞකික ලෝකෝත්තර වශයෙන් ලෞකික සිත් එක් අසූවක් 81 ද, ලෝකෝත්තර සිත් අටක් 8 හෝ සමසතලිසක් 40 ද, වන්නාහ.

40. එකුන් අනුවක් වූද එකසිය විසිඑකක් වූද සියලු චිත්තය ස්කන්ධ වශයෙන් විඤ්ඤාණස්කන්ධයකි, ආයතන වශයෙන් මනායතනයකි. ධාතු වශයෙන් සතකි. ධාතු වශයෙන් සත් වැදෑරුම් වන්නේ කෙසේද යත්, චක්ඛු විඤ්ඤාණ දෙසිත චක්ඛු විඤ්ඤාණ ධාතුවය, ඝාන විඤ්ඤාණ දෙසිත් ඝාන විඤ්ඤාණධාතුවය, ජිව්හා විඤ්ඤාන දෙසිත ජිව්හා විඤ්ඤාණ ධාතුවය, කාය විඤ්ඤාණ දෙසිත කාය විඤ්ඤාණ ඤාණ ධාතුවය, පඤ්චද්වාරා වර්ජන චිත්තය හා සම්පටිච්ඡන දෙසිත මනෝ ධාතුවය, අවශේෂ සසැතෑවක් 76 වූ ද එකසිය අටක් 108 වූ චිත්තය මනෝ විඤ්ඤාණ ධාතුවය, මෙසේ ධාතුවශයෙන් සත් වැදෑරුම් වන්නේය. ආර්ය සත්‍ය වශයෙන් වනාහි ලෞකික සිත් එක් අසූව 81 දුක්ඛ සත්‍ය නම් වන්නේය, ලෝකෝත්තර සිත් අට දෙන හෝ සතලිස සත්‍ය විනිර්මුක්ත නම් වන්නේය.

චිත්ත සංග්‍රහ විභාගය සමාප්තයි.

**ත්‍රිලක්ෂණ විදර්ශනාව.**

1. චිත්ත සංග්‍රහ විභාග අභිධර්ම භාවනාවේදී පහළ වූ චිත්ත චෛතසික භූතාරූප උපාදරූප යන නාම රූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්මයෝ ක්‍ෂණයක් ක්‍ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝය.

2. ඇතිවීම නැතිවීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝ ය.

3. තම තමන් කැමති ලෙස නොපැවැති බැවින් අනාත්මයෝ ය.

4. මෙසේ අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ චිත්ත චෛතසික භූතරූප උපාද රූප යන මේ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය පීළන - සංඛත- සන්තාප - විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍ය නම් වන්නේය.

5. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්වභව තෘෂ්ණාව, ආයූහන නිදන සංයෝග පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍ය නම් වන්නේය.

6. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව නිස්සරන විවේක අසංඛත අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍ය වන්නේය.

7. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතු වූ ආර්ය අෂ්ටාංගික මාර්ගය නියාන හේතු දස්සන ආධිපතෙය්‍යාර්ථයෙන් සමන්නා ගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍ය නම් වන්නේය.

8. මාගේ භාවනාමය කුශලානිසංස ධර්මය මෙම චතුරාර්ය සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිසම හේතු වේවා, වාසනා වේවා.

සාධු, සාධු, සාධු.

## පදවිවරණය.

1. අභිධර්මාර්ථ සංග්‍රහය - අභිධර්ම පිටක සප්තප්‍රකරණයේ පැතිරී තිබෙන පරමාර්ථ ධර්ම සියල්ල එකතු කොට චිත්ත සංග්‍රහය චෛතසික සංග්‍රහය යනාදි පිළිවෙත් පරිච්ඡේද නවයකට සංග්‍රහ කරමින් ශ්‍රී ලංකාවේ මූලසෝම විහාරාධිවාසී අනුරුද්ධාචාර්යයන් වහන්සේ විසින් සම්පාදිත වූ සාරගර්භ අභිධර්ම ග්‍රන්ථයයි.

2. චිත්ත - අරමුණු සිතන බැවින්ද, විසිතුරු දේ නිපදවන බැවින්ද, තමන්ම විසිතුරු බැවින්ද, කර්මයන් විසින් ක්ලේශයන් විසින් නිපදවන ලද බැවින්ද, ස්ව සන්තානය රකින බැවින්ද, ස්ව සන්තානය වඩන බැවින්ද, විසිතුරු ලෙස අරමුණු ගන්නා බැවින්ද චිත්තය නම් වේ.

3. චෛතසික - චිත්ත සන්තානයෙහි සිතක් පාසා එකට යෙදෙන සිත හා එකවර උපදින එකවර නිරොධ වන - එකම අරමුණක් ගන්නා, සිත හා එකම වස්තුවක උපදින අරූපී - ධර්ම සමූහය චෛතසික නම් වේ.

4. රූප - ශීතල - උණුසුම - බඩගින්න - පිපාසය - අව්ව - වැස්ස - සුළඟ සතුන් දෂ්ට කිරීම - වස විස ශරීරගත වීම - සොම්නස - දොම්නස ආදි ඒ ඒ අවස්ථාවන්හි වෙනස්වන සුළු පඨවි ආදි ස්වභාව සමූහය රූප නම් වේ.

5. නිබ්බාන - එකොළොස් ගිනි නිවුණ තැන බැවින්ද, තෘෂ්ණාවට යා ගත නොහැකි තෘෂ්ණාවෙන් අරමුණු කළ නොහැකි, අසංඛත ධාතුව නිබ්බාණ නම් වේ.

6. කාමාවචර - කාම තෘෂ්ණාව හැසිරෙන තැන් බැවින්ද, කාම තෘෂ්ණාවට ගොදුරුවන - අරමුණුවන බැවින්ද, එකොළොස් කාම භූමියෙහි බහුලව උපදින බැවින් ද කාමාවචර නම් වේ.

7. රූපාවචර - රූප තෘෂ්ණාව හැසිරෙන තැන් බැවින්ද, රූප තෘෂ්ණාවට ගොදුරු වන අරමුනු වන බැවින්ද, සොළොස් රූප භූමියෙහි බහුලව ලැබෙන බැවින්ද රූපාවචර නම් වේ.

8. අරූපාවචර - අරූප තෘෂ්ණාව හැසිරෙන තැන් බැවින්ද, අරූප තෘෂ්ණාවට ගොදුරු වන - අරමුණු වන බැවින්ද, සතරක් වූ අරූප භූමියෙහි බහුලව ලැබෙන බැවින්ද අරූපාවචර නම් වේ.

9. ලෝකෝත්තර - කාම රූප අරූප ත්‍රිවිධ ලෝකයෙන් එතර වූද එතරවන්නාවූද මාර්ග ඵල නිර්වාණ ධර්ම ලෝකෝත්තර නම් වේ.

10. අකුසල - සිත කය රෝගාතුර බවට පමුණුවන අනාරෝග්‍ය අර්ථයෙන් ද වැරදි සහිත බැවින් සාවද්‍ය අර්ථයෙන්ද, අනිටු විපාක ගෙන දෙන බැවින්ද, අකොසල්ල නම් වූ අනුවණ කමින් හටගන්නා වූද චිත්ත චෛතසික සමූහය අකුශල නම් වේ.

11. කුසල - සිත කය නිරෝගී බවට පමුණුවන ආරෝග්‍යාර්ථයෙන්ද, නිවැරදි බව ඇති කරන අනවද්‍යාර්ථයෙන්ද, ඉෂ්ට විපාක ගෙන දෙන බැවින්ද නුවණින් රැස් කෙරෙන බැවින් කෝසල්ල සම්භූතාර්ථයෙන් ද කුස සංඛ්‍යාත අකුසල් නසන බැවින්ද කුසල නම් වේ.

12. අහේතුක - ලෝභ - ද්වේෂ - මෝහ යන අකුසල හේතුවක් නැත්තා වූ ද අලෝභ - අද්වේෂ - අමෝහ යන කුසල අව්‍යාකෘත හේතුවක් හෝ සමග නොයෙදුනා වූ ද සිත් අටළොස අහේතුක නම් වෙති.

13. කාමසෝභන - සෝභන සිත් පණස් නවය අතුරෙන් කාමභූමියට අයත් වූ සිත් විසිහතර දෙන කාමසෝභන නම් වෙති.

14. ලෝභ - සදෙරට ලැබෙන අරමුණුවල සැබෑ තතු මුවා කරන්නාවූ මෝහය නිසා අරමුණු නිත්‍ය සුඛ සුබ ආත්ම වශයෙන් ඉෂ්ට කාන්ත මනාප වශයෙන් සිතා එහි ඇලෙන බැඳෙන වෙලෙන පැටලෙන ග්‍රහණය කරන ලක්ෂණය ලෝභයයි.

15. දෝස - සදොරට ලැබෙන අරමුණු නුරුස්සන - ගැටෙන - සැඩ ඵරුෂ ස්වභාවය දෝසයයි.

16. මෝහ - අරමුණු ස්වභාවය මුවහ කරන- වසන - අඳුරු කරන වැටහීමට ඉඩ නොදෙන අනුවණ බව මෝහයයි.

17. දිට්ඨි - පිදුරු කොනක අස්වයාට නිල් කණ්නාඩියක් දැමූ විට වියලි දුඹුරු පිදුරු නිල්පාටින් දැක තණ කොළ හැඟීමෙන් පිදුරු කන්නා සේ, අරමුණක් සැබෑ තත්වයෙන් නොදැක විපරීතව දකින බව දිට්ඨියයි. මිච්ඡා - යන නිපාතය එකතුවෙන් එය මිච්ඡා දිට්ඨි නමින් හැඳින් වේ.

18. අසංඛාරික - අන්කෙනෙකුගේ නියමයක් - අණක් නොමැතිව - තමන්ගේද පසු බට වීමක් නොමැතිව - ස්වකීය ඡන්දයෙන්ම - උද්‍යෝගයෙන්ම සිදු කිරීම අසංඛාරික නම් වේ.

19. සසංඛාරික - අනෙකකුගේ නියමය නිසාද, තමන්ගේ පසුබට වීමක් නිසාද උත්සාහවත් කරවීමක් ඇතිවම සිදුකිරීම සසංකාරික නම්.

20. සම්ප්‍රයුක්ත - එකට ඉපදීම - එකට නිරුද්ධවීම - එක අරමුණක් ගැනීම එක වස්තුවක පැවතීම යන ලක්‍ෂණ සතරකින් මිශ්‍ර වූ බව සම්ප්‍රයුක්ත නම් වේ.

21. විප්‍රයුක්ත - ඉහත සඳහන් සතර සම්ප්‍රයෝග ලක්‍ෂණයෙන් යුක්ත නොවීම විප්‍රයුක්ත නම් වේ.

22. පටිඝ - නුරුස්සන ස්වභාවයෙන් අරමුණක් සමඟ ගැටෙන ද්වේෂයම පටිඝ නම් වේ.

23. උද්ධච්ච - කැටක් දැමූ ජලතලයක් සේද, කැටක් ගැසූ අළු ගොඩක් සේද, උස්තැනක තැංවූ කොඩියක් සේද සිතේ සැලෙන බව නොසන්සුන් බව - විසිරෙන බව උද්දච්චය නම් වේ.

24. විචිකිච්ඡා - තීරණයක් ගත නොහැකි බව, සැකය සාංකාව - දෙගිඩියාව විචිකිච්ජාවය.

25. සම්පටිච්ඡන - චක්ඛු විඤ්ඤාණාදී දෙපස් විඤ්ඤාණයෙන් ගත් රූපාදී අරමුණු පිළිගන්නා ආකාරයෙන් ලැබෙන සිත සම්පටිච්ඡනයයි.

26. සන්තීරණ - සම්පටිච්ඡනයෙන් ගත් රූපාදී අරමුණු තීරණ කරන ආකාරයෙන් ලැබෙන සිත සන්තීරණ සිතයි.

27. පඤ්චද්වාරාවර්ජන - පඤ්චද්වාරයට හැපෙන අරමුණු, සියල්ලට පළමුව ආවර්ජනා කරන ක්‍රියා චිත්තයකි.

28. මනෝද්වාරාවර්ජන - මනෝද්වාරයටම ලැබෙන අරමුණු ජවනයට පළමුව අරමුණු කරන ක්‍රියා සිතකි.

29. හසිතෝත්පාද - නික්ලේශී උතුමන්ට සිනා පහළ කරන ක්‍රියා සිතකි.

30. විපාක - කුසල අකුසල කර්මයන්ගේ ඵලය වශයෙන් ලැබෙන චිත්ත - චෛතසික සමූහයකි.

**රාජසේවා බෞද්ධ සංගමය,**
සංස්කෘතික අමාත්‍යාංශය, සෙත්සිරිපාය,
බත්තරමුල්ල.
2542 නවම්/ 1999 පෙබ. 10

නන්ද වැලිකල, සෝමා රණසිංහ, ප්‍රේමවතී දෙගම්බඩ යන මහත්මාවන් විසින් නුගේගොඩ ගංගොඩවිලවිල, 37 සෝරත මාවතේ පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස් හි මුද්‍රණය කරවා ධම්දානය වශයෙන් නිකුත් කරන ලදී.

**අභිධර්ම භාවනාව අංක 02.**

**අති පූජ්‍ය නා උයනේ අරිය ධම්ම නාහිමිපාණන් වහන්සේ විසින්**

අභිධම්මත්ථ සංගහ - චෛතසික සංග්‍රහ විභාගය

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!

1. **ඒකුප්පාද නිරෝධා ච - ඒකාලම්බන වත්ථුකා**
**චේතෝ යුත්තා ද්විපඤ්ඤාස - ධම්මා චේතසිකා මතා**

සිත සමග එකට උපදින්නාවූ ද, සිත සමග එකට නිරුද්ධ වන්නාවූ ද, සිත සමග එකම අරමුණක් ගන්නාවූ ද, සිත සමග එක වස්තු රූපයක පවතින්නා වූ ද, සිත සමග මිශ්‍ර වූ ධර්ම දෙපණස, චෛතසිකයෝ නම් වන්නාහ.

2. සිත සමග සතර සම්ප්‍රයෝග ලක්‍ෂණයෙන් මිශ්‍ර වූ චෛතසික දෙපණස වනාහි, සර්වචිත්ත සාධාරණ රාශිය, ප්‍රකීර්ණක රාශිය, අකුශල රාශිය සෝභන සාධාරණ රාශිය, විරති රාශිය, අප්‍රමාණ්‍ය රාශිය, පඤ්ඤින්ද්‍රිය නමින් රාශි සතක් වන්නාහ.

3. ඔවුනතුරෙන් සර්වචිත්ත සාධාරණ රාශිය නම් කෙසේද යත්, ඵස්සය, වේදනාවය, සඤ්ඤාවය, චේතනාවය, ඒකග්ගතාවය, ජීවිතින්ද්‍රිය මනසිකාරය යන මේ චෛතසික සත්දෙනා වනාහි සියලු එකුන් අනූ චිත්තයන්හි එක සේ යෙදෙන බැවින් සර්වචිත්ත සාධාරණ නම් වන්නාහ.

4. විතර්කය විචාරය අධිමෝක්‍ෂය වීර්යය ප්‍රීතිය ඡන්දය යන මේ සය දෙනා වනාහි එකුන් අනූ චිත්තයන් අතරෙහි සුදුසු පරිදි විසිරී පැතිරී යෙදෙන බැවින් ප්‍රකීර්ණක චෛතසික නම් වන්නාහ. සර්වචිත්ත සාධාරණ - ප්‍රකීර්ණක යන මේ චෛතසික තෙළෙස වනාහි කුශලයන් කෙරෙන් අන්‍ය වූ අකුශලයන්ට සාධාරණ බැවින්ද, අකුශලයන් කෙරෙන් අන්‍ය වූ කුශලයන්ට සාධාරණ වන බැවින්ද, අන්‍ය සමාන චෛතසිකයෝ නම් වන්නාහ.

5. සර්වාකුශල සාධාරණ නම්වූ මෝහය - අහිරිකය - අනොත්තප්පය- උද්දච්චය යන සතරද, ලෝභත්‍රිකය නම් වූ ලෝභය දිට්ඨිය මානය යන තුන ද, ද්වේෂ චතුෂ්කය නම් වූ ද්වේෂය ඊර්ෂ්‍යාවය - මච්ඡරිය - කුක්කුච්චය යන සතරද, ථීන මිද්ධ යුගලය ද, විචිකිච්ඡාව ද යන චෛතසිකයෝ දහතරදෙන වනාහි අකුශල සිත්හි පමණක්ම යෙදෙන බැවින් අකුශල චෛතසික නම් වන්නාහ.

6. ශ්‍රද්ධාව - සතිය - හිරිය - ඔත්තප්පය - අලෝභය - අද්වේසය - තත්‍ර මජ්ඣත්තතාවය - කායපස්සද්ධිය -චිත්තපස්සද්ධිය - කායලහුතාය චිත්ත ලහුතාය - කාය මුදුතාය - චිත්ත මුදුතාය - කාය කම්මඤ්ඤතාය -චිත්ත කම්මඤ්ඤතාය - කාය පාගුඤ්ඤතාය - චිත්ත පාගුඤ්ඤතාය - කායුජ්ජුකතාය චිත්තුජ්ජුකතාය - යන එකුන්විස්ස වනාහි සෝභන සිත් සියල්ලට සාධාරණ වන බැවින් සෝභන සාධාරණ චෛතසික නම් වන්නාහ.

7. සම්මාවාචා - සම්මාකම්මන්ත - සම්මා ආජීව යන චෛතසික තුන වනාහි සම්පත්ත විරති සමාදාන විරති සමුච්ඡේද විරති වශයෙන් වැළකිය යුතු පාපයන් කෙරෙන් වැළකෙන බැවින් විරති චෛතසික නම් වන්නාහ.

8. කරුණාවය - මුදිතාවය යන චෛතසික යුගල වනාහි අප්‍රමාණ සත්වයන් කෙරෙහි අප්‍රමාණව වැඩිය යුතු වන බැවින් අප්පමඤ්ඤ චෛතසික නම් වන්නාහ. පඤ්ඤින්ද්‍රිය වනාහි යථාස්වභාවය අවබෝධ කරවන අර්ථයෙන් පඤ්ඤින්ද්‍රිය නම් වන්නේය. මෙසේ

මේ චෛතසිකයෝ පස්විසි දෙන වනාහි සෝභන සිත්හි පමණක් යෙදෙන බැවින් සෝභන චෛතසිකයෝ නම් වන්නාහ.

9. තෙරසඤ්ඤ සමානා ච - චුද්දසා කුසලා තථා
සෝභනා පඤ්ච වීසාති - ද්විපඤ්ඤාස පවුච්චරේ

අන්‍ය සමාන චෛතසික තෙලෙසද, අකුශල චෛතසික තුදුසද, සෝභන චෛතසික පස්විස්ස ද යන මොවුන් දෙපණස් චෛතසික නම් වන්නාහ.

10. තෙසං චිත්තාවි යුත්තානං - යථායොග මිතො පරං
චිත්තුප්පාදෙසු පච්චෙකං - සම්පයෝගෝ පවුච්චති

සිතෙන් වෙන් නොවූ සිත සමඟම සම්ප්‍රයුක්ත වූ ඒ චෛතසිකයන්ගේ සම්ප්‍රයෝගය, මින් මතු චිත්තෝත්පාදයන්හි වෙන වෙනම යෙදෙන ආකාරයෙන් කියනු ලැබෙන්නේය.

11. සර්වචිත්ත සාධාරණ චෛතසික සත්දෙන වනාහි සියලු එකුන් අනූ චිත්තයන්හිම සම්ප්‍රයුත්ත වන්නාහ, ප්‍රකිර්ණක සය අතුරෙන් විතර්කය වනාහි දෙපස්විඤ්ඤාණ දසය හැර කාමාවචර සිත් සූසාලිසෙහි ද ප්‍රථමධ්‍යාන සිත් එකොළොසෙහිද යන පස් පණස් සිතෙහි සම්ප්‍රයෝග වන්නේය.

12. විචාරය, වනාහි විතර්කය යෙදෙන පස්පණස් සිතෙහිද ද්විතිය ධ්‍යාන එකොළොසෙහිද යන සසැට සිතෙහි යෙදෙන්නේය. අධිමෝක්‍ෂය වනාහි දෙපස්විඤ්ඤාණ දසයද විචිකිච්ඡා සහගත සිත ද හැර අවශේෂ වූ අට සැත්තෑ සිතෙහි සම්ප්‍රයුත්ත වන්නේය.

13. විර්ය වනාහි, දෙපස් විඤ්ඤාණ දසයද, මනෝධාතු ත්‍රිකය ද සන්තීරණ තුන ද යන සොළොස් වූ සිත් හැර ඉතිරි තෙසැත්තෑ චිත්තයෙහි සම්ප්‍රයෝග වන්නේය. ප්‍රීතිය වනාහි ද්වේසමූල දෙසිතද, කායවිඤ්ඤාණ දෙසිත ද, චතුර්ථධ්‍යාන සිත් එකොළසද උපෙක්‍ෂා සහගත සිත් පස්පණසද යන සම සැත්තෑවක් වූ චිත්තයන් හැර, ඉතිරි එක් පණස් චිත්තයෙහි යෙදෙන්නේය. ඡන්දය වනාහි අහේතුක සිත් අටළොසද මෝහ මූල දෙසිත ද හැර ඉතිරි එකුන් සැත්තෑ චිත්තයෙහි යෙදෙන්නේය.

14. මෝහය අහිරිකය අනොත්තප්පය උද්ධච්චය යන මෝහ චතුෂ්කය වනාහි අකුශල් සිත් දෙළොසෙහිම සම්ප්‍රයුක්ත වන්නේය. ලෝභය වනාහි ලෝභ මූල සිත් අටෙහි යෙදෙන්නේය. දිට්ඨිය - දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතරෙහිද මානය දිට්ඨිගත විප්පයුත්ත සිත් සතරෙහිද යෙදෙන්නේය. දෙස ඉස්සා - මච්ඡරිය කුක්කුච්ච යන දෙස චතුෂ්කය වනාහි ද්වේසමූල දෙසිතෙහිම යෙදෙන්නේය. ථීන මිද්ධ යුගලය ලෝභ මූල දෙස මූල සසංඛාරික සිත් පසෙහිද විචිකිච්ඡාව විචිකිච්ඡා සම්ප්‍රයුක්ත සිතෙහි ද සම්ප්‍රයෝග වන්නේය.

15. සෝභන සාධාරණ චෛතසික එකුන්විස්ස වනාහි සංක්ෂිප්ත සෝභන සිත් එකුන් සැටෙහිද සවිස්තර සෝභන සිත් එක්අනූ වෙහිද සම්ප්‍රයුක්ත වන්නාහ. විරති තුන වනාහි මහා කුශල් සිත් අටෙ ද ලෝකෝත්තර සිත් අට ද යන සොළසක් වූ සිත්හි යෙදෙන්නාහ. අප්පමඤ්ඤ යුගලයද වනාහි මහකුශල මහා ක්‍රියා සිත් සොළසද පඤ්චම ධ්‍යාන වර්ජිත රූපාවචර සිත් දෙළසහිද යන අටවිසි චිත්තයෙහි යෙදෙන්නේය. පඤ්ඤින්ද්‍රිය වනාහි මහාකුශල සිත් පන්තිසද යන සිත් සාලිස් චිත්තයෙහි සම්ප්‍රයුක්ත වන්නේය.

16. ඡයට්ඨ පඤ්ච පඤ්ඤාස - එකාදස ච සෝළස.
සත්තති විසති චේව - පකිණ්ණක විවජ්ජිතා.

ප්‍රකිර්ණක චෛතසිකයන් අතුරෙන් විතර්කය නොයෙදෙන සසැටක්ද විචාරය නොයෙද පස් පණසක්ද, අධිමෝක්‍ෂය නොයෙදෙන එකොළොසක්ද, විර්යය නොයෙදෙන සොළසක්

ද, ප්‍රීතිය නොයෙදෙන සැත්තෑවක්ද, ඡන්දය නොයෙදෙන සිත් විස්සක්ද වන්නාහ.

17. **පඤ්ච පඤ්ඤාස ජසට්ඨී - අට්ඨසත්තති තිසත්තති**
**එක පඤ්ඤාස චෙකූන - සත්තති සපකිණ්ණකා**

ප්‍රකීර්ණක අතුරෙන් විතර්කය සිත් පස් පණසෙහිද විචාරය සිත් සසැටෙහිද, අධිමෝක්ෂය සිත් අටසැත්තෑවෙහි ද, වීර්ය සිත් තෙසැත්තෑවෙහිද, ප්‍රීතිය සිත් එක් පණසෙහි ද, ඡන්දය සිත් එකුන් සැත්තෑවෙහිද සම්ප්‍රයෝග වන්නාහ.

18. **සබ්බාපුඤ්ඤේසු චත්තාරෝ - ලෝභමූලෙ තයෝ කතා**
**දෙස මූලෙසු චත්තරො - සසංඛාරෙ ද්වයං තථා**

අකුශල චෛසික තුදුස අතුරෙන් වනාහි මෝහ චතුෂ්කය සියලු අකුශල් සිත් දොළසෙහි ද, ලෝභ ත්‍රිකය ලෝභ මූල සිත් අටෙහි ද, ද්වේෂ චතුෂ්කය දෙසමූල දෙසිතෙහිද ථිනමිද්ධ යුගලය සසංඛාරික අකුශල් සිත් පසෙහිද සම්ප්‍රයුක්ත වන්නාහ.

19. **විචිකිච්ඡා විචිකිච්ඡා - චිත්තෙ චාති චතුද්දස**
**ද්විදසා කුසලෙස්වෙව - සම්පයුජ්ජන්ති පඤ්චධා**

විචිකිච්චාව වනාහි විචිකිච්ඡා සහගත සිතෙහි දැයි අකුශල චෛතසික තුදුස් දෙන අකුසල් සිත් දෙළොසෙහි පමණක්ම පස් ආකාරයකින් සම්ප්‍රයුක්ත වන්නාහ.

20. **එකූන විසති ධම්මා - ජායන්තෙකූන සට්ඨිසු**
**තයො සොළස චිත්තෙසු - අට්ඨවීසතිං ද්වයං**

සෝභන චෛතසික පස්විස දෙන අතුරෙන් සෝභන සාධාරණ එකුන්විසි චෛතසිකයෝ වනාහි සෝභන සිත් එකුන් සැටෙහි ද, විරති තුන සිත් සොළසෙහිද, අප්පමඤ්ඤා යුගලය සිත් අට විස්සෙහි ද සම්ප්‍රයෝග වන්නාහ.

21. **පඤ්ඤා පකාසිතා සත්ත - චත්තාලීස විධෙසුපි**
**සම්පයුත්තා චතුද්ධෙවං - සොභනෙස්වෙව සොභනා**

පඤ්ඤින්ද්‍රිය වනාහි සත් සාලිස් චිත්තයෙහිදැයි මෙසේ සොභන චෛතසිකයෝ සෝභන සිත්හි පමණක් සතරාකාරයකින් සම්ප්‍රයෝග වන්නාහ.

22. **ඉස්සා මච්ඡෙර කුක්කුච්ච - විරති කරුණාදයො**
**නානා කදාචි මානො ච - ථීන මිද්ධං තථා සහ**

ඉස්සා මච්ඡරිය කුක්කුච්ච - විරති තුන කරුණා මුදිතා යුගලය යන චෛතසික අටදෙන වනාහි ඇතැම් කලක වෙන වෙනම යෙදෙන බැවින් නානායෝගී කදාචි යෝගි නම් වන්නාහ. මානය ද ඇතැම් කලක පමණක් යෙදෙන බැවින් කදාචියෝගී නම් වන්නේය. ථීන මිද්ධ යුගලය වනාහි ඇතැම් කලෙක පමණක් දෙක එකවරම යෙදෙන බැවින් කදාචියෝගී සහයෝගී නම් වන්නේය. මෙසේ අනියතයෝගී චෛතසිකයෝ එකොළොස් දෙනෙක් ඇත්තාහ.

23. **යථා වුත්තානු සාරෙන - සෙසා නියත යෝගිනො**
**සංගහඤ්ච පවක්ඛාමි - තෙසං දානි යථාරහං**

ඉහත දක්වන ලද්දවූ අනියතයෝගී එකොළොස් දෙනා හැර ඉතිරි එක් සාලිස් චෛතසිකයෝ වනාහි නියතයෝගී නම් වන්නාහ. මින් මතු නියතයෝගී අනියත යෝගී සියලු චෛතසිකයන් ගේ සංග්‍රහනය තෙතිස වනාහි සුදුසු පරිද්දෙන් සංග්‍රහ කොට කියන්නෙමි.

24. **ඡත්තිංසා නුත්තරෙ ධම්මා - පඤ්ච තිංස මහග්ගතෙ**
**අට්ඨතිංසාපි ලබ්භන්ති - කාමාවචර සොභනෙ**

**සත්තවී සත්‍ය පුඤ්ඤම්හි - ද්වාදසා හෙතුකෙ තිච**
**යථා සම්භව යොගෙන - පඤ්චධා තත්ථ සංගහො**

ලෝකෝත්තර චිත්තයෙහි චෛතසික ධර්ම සතිසක් ද, මහග්ගත චිත්තයෙහි පන්තිසක් ද, කාමසෝභන චිත්තයෙහි අටතිසක් ද, අකුශල චිත්තයෙහි සත් විස්සක් ද අහේතුක චිත්තයෙහි දෙළසක් දැයි යෙදෙන පරිදි එහි සංග්‍රහය පස් වැදෑරුම් වන්නේය.

25. ලෝකෝත්තර සිත් සම සතලිස අතුරෙන් අටක්වූ ප්‍රථමධ්‍යානික ලෝකෝත්තර සිත්හි වනාහි, අන්‍ය සමාන චෛතසික තෙලෙසද, අප්‍රමාණ්‍ය චෛතසික දෙක හැර සෝභන චෛතසිකතෙවිස්ස ද, යන චෛතසික සතිය සංග්‍රහ වෙති. එසේම අටක් වූ ද්විතිය ධ්‍යානික සිත්හි විතර්ක වර්ජිත චෛතසික පන්තිසකි තෘතිය ධ්‍යානික සිත්හි විතර්ක විචාර වර්ජිත සූතිසක් චතුර්ථ ධ්‍යානික සිත්හි විතර්ක විචාර ප්‍රිති වර්ජිත තෙතිසකි පඤ්චධ්‍යානික සිත්හි උපෙක්ෂා සහගත වූ එම තෙතිස් චෛතසික සංග්‍රහ වන්නාහ. මෙසේ ලෝකෝත්තර සිත් අටෙහි ධ්‍යාන පඤ්චක වශයෙන් පස් ආකාරයෙකින් සංග්‍රහ වන්නේය.

26. **ඡත්තිංස පඤ්චතිංසො ච - චතුත්තිංස යථාක්කමං**
**තෙත්තිංස ද්වය මිච්චේවං - පඤ්චධා නුත්තරෙ ඨිතා**

ලෝකෝත්තර සිත්හි චෛතසික අනුපිළිවෙළින් සතිසක්ද, පන්තිසක්ද, සූතිසක් ද තෙතිස බැගින් දෙකක් දැයි පස් ආකාරයකින් සංග්‍රහ වන්නේය.

27. මහග්ගත සිත් සත්විසි දෙන අතුරෙන් තුනක් වූ ප්‍රථම ධ්‍යානික චිත්තයන්හි වනාහි, අන්‍ය සමාන චෛතසික තෙලෙසද, විරති තුන හැර ඉතිරි සෝභන චෛතසික දෙවිස්සදැයි චෛතසික පන්තිසක් සංග්‍රහ වන්නාහ. කරුණා මුදිතා අප්‍රමාණ්‍ය දෙක වනාහි වෙන වෙනම ගත යුතු වන්නාහ.

28. එසේම තුනක් වූ ද්විය‍ධ්‍යානික චිත්තයන්හි විතර්කය හැර ඉතිරි චෛතසික සූතිසද තෘතිය ධ්‍යානික චිත්තයන්හි විතර්ක විචාර දෙකම වර්ජිත චෛතසික තෙතිසද චතුර්ධ්‍යානික චිත්තයන්හි විතර්ක විචාර ප්‍රීති තුන හැර ඉතිරි චෛතසික දෙතිසද, පසළොසක් වූ පඤ්චමධ්‍යානික චිත්තයන්හි වනාහි විතර්ක විචාර ප්‍රීති අප්‍රමාණ්‍ය යන පස් දෙන හැර ඉතිරි චෛතසික සමතිස සංග්‍රහ වන්නාහ.

29. **පඤ්ච තිංස චතුත්තිංස - තෙත්තිංච යථාක්කමං**
**ද්වත්තිංස චෙව තිංසෙති - පඤ්චධාව මහග්ගතො**

මහග්ගත සිත්හි අනුපිළිවෙලින් චෛතසික පන්තිසක් ද, සූතිසක් ද, තෙතිසක් ද, දෙතිසක් ද, සමතිසක්දැයි පස් ආකාරයකින් සංග්‍රහ වන්නේය.

30. කාමාවචර මහකුශල චිත්තයන් අටදෙනා අතුරෙන් සොමනස්ස සහගත ඥාණ සම්ප්‍රයුක්ත අසංඛාරික - සසංඛාරික යුගලයෙහි වනාහි අන්‍ය සමාන චෛතසික තෙලෙස ද, සෝභන චෛතසික පස්විස්ස ද, යන අටතිසක් චෛතසික සංග්‍රහ වන්නේය. කරුණා මුදිතා යන අප්‍රමාණ්‍ය යුගලය ද විරති තුන ද යන පස් දෙන වෙන වෙනම යෙදෙන්නාහ.

31. එසේම දෙවැනි යුගලයෙහි පඤ්ඤින්ද්‍රිය හැර චෛතසික සත්තිසක් ද, තෙවැනි යුගලයෙහි පඤ්ඤින්ද්‍රිය සහිත වන අතර ප්‍රීතිය හැර චෛතසික සත්තිසක් ද, සතරවැනි යුගලයෙහි ඥාණ - ප්‍රීති දෙකම හැර චෛතසික සතිසක් ද සංග්‍රහ වන්නේය.

32. මහා ක්‍රියා සිත්හි විරති තුන හැර චෛතසික පන්තිසක් ද සූතිසක් ද, සූතිසක් ද, තෙතිසක් දැයි අනුපිළිවෙළින් යුගල සතරෙහි සංග්‍රහ වන්නේය. මහා විපාක සිත්හි වනාහි විරති තුන ද අප්‍රමාණ්‍ය දෙක ද හැර, චෛතසික තෙතිසක්ද, දෙතිසක්ද, දෙතිසක්ද, එක්තිසක් දැයි යුගල සතරෙහි අනුපිළිවෙළින් සංග්‍රහ වන්නේය. මෙසේ කාමසෝභන සූවිසි චිත්තයෙහි යුගල වශයෙන් සංග්‍රහ දෙළොස් වැදෑරුම් වන්නේය.

33. අට්ඨතිංස සත්තතිංසද් - වයං ඡත්තිංසකං සුභෙ
පඤ්චතිංස චතුත්තිංසද් - වයං තෙත්තිංසකං ක්‍රියෙ

තෙත්තිංස පාකෙ ද්වත්තිංසද් - වයෙක තිංසකං භවෙ
සහෙතු කාමාවචර - පුඤ්ඤ පාක ක්‍රියා මනෙ

කාමසෝභන කුශලයෙහි චෛතසික අටතිසක් ද, සත්තිස බැගින් දෙවරක් ද, සතිසක් ද මහා ක්‍රියා සිත්හි පන්තිසක් ද, සූතිස බැගින් දෙවරක් ද, තෙතිසක් ද, මහා විපාක සිත්හි තෙතිසක් ද, දෙතිස බැගින් දෙවරක් ද, එක්තිසක් දැයි, අනු පිළිවෙළින් සිත් යුගල වශයෙන් ගෙන දෙළොස් ආකාරයෙකින් සංග්‍රහ වන්නේය.

34. න විජ්ජන්තෙත්ථ විරති - ක්‍රියෙසු ච මහග්ගතෙ
අනුත්තරෙ අප්පමඤ්ඤා - කාමපාකෙ ද්වයං තථා

මහා ක්‍රියා සිත් අටෙහිද මහග්ගත සිත් සත්විස්සෙහිද විරති තුන නොයෙදෙන්නාහ. ලෝකෝත්තර සිත් අටෙහි අප්‍රමාණ්‍ය දෙකද කාමවිපාක සිත්හි විරති අප්‍රමාණ්‍ය දෙකද සංග්‍රහ නොවන්නාහ.

35. අනුත්තරෙ ඣාන ධම්මා - අප්පමඤ්ඤා ච මජ්ඣිමෙ
විරති ඤාණ පීති ච - පරිත්තෙසු විසෙසකා

ලෝකෝත්තර සිත්හි ධ්‍යානාංග ධර්මයෝද, මහග්ගතයෙහි අප්‍රමාණ්‍ය යුගලය ද, කාමසෝභනයෙහි විරති ඤාණ - ප්‍රීතිය ද විශේෂත්වයට පමුණු වන්නාහ.

36. අකුශල සිත් අතුරෙන්, ලෝභමූල පළමුවැනි අසංඛාරික සිත නම් වූ සොමනස්ස සහගත දිට්ඨිගත සම්ප්‍රයුක්ත අසංඛාරික සිතෙහි, වනාහි අන්‍ය සමාන චෛතසික තෙලෙස ද, අකුශල සාධාරණ සතර ද ලෝභ දිට්ඨි දෙකදැයි චෛතසික එකුන් විස්සක් සංග්‍රහ වන්නාහ.

37. එසේම ලෝභමූල ද්විතිය අසංඛාරික සිත නම් වූ සොමනස්ස සහගත දිට්ඨිගත විප්‍රයුක්ත අසංඛාරික සිතෙහි වනාහි දිට්ඨිය හැර මානය සමඟ එකුන් විස්සක් සංග්‍රහ වන්නාහ. තෙවැනි අසංඛාරික නම් වූ උපෙක්ෂා සහගත දිට්ඨිගත සම්ප්‍රයුක්ත අසංඛාරික සිතෙහි ප්‍රීතිය හැර දිට්ඨිය සමඟ අටළොසක් සංග්‍රහ වන්නාහ. සතරවැනි අසංඛාරිකය නම් වූ උපෙක්ෂා සහගත දිට්ඨිගත විප්‍රයුක්ත අසංඛාරික සිතෙහි දිට්ඨිය හැර මානය සමඟ අටළොසක් සංග්‍රහ වන්නාහ.

38. පස්වැනි අසංඛාරික නම් වූ දෙමනස්ස සහගත පටිඝසම්ප්‍රයුක්ත අසංඛාරික සිතෙහි වනාහි ප්‍රීතිය හැර අන්‍ය සමාන දොළස ද අකුශල සාධාරණ සතර ද දෙස ඉස්සා මච්ඡරිය කුක්කුච්ච යන දොසචතුෂ්කය ද, යන සමවිසි චෛතසිකයෝ සංග්‍රහ වන්නාහ. මෙහිදී ඉස්සා මච්ඡරිය- කුක්කුච්ච තිදෙන වෙන වෙනම යෙදෙන්නාහ. අසංඛාරික සිත් එක එකට අනතුරුව ලැබෙන සසංඛාරික සිත් පසෙහි වනාහි ථීන මිද්ධ දෙක සමඟ යෙදෙන බැවින් එක්විස්ස බැගින් දෙවරක් ද සමවිස්ස බැගින් දෙවරක්ද දෙවිස්සක් දැයි පස් ආකාරයකින් සංග්‍රහ වන්නාහ.

39. මෝහ මූල උද්ධච්ච සහගත සිතෙහි චනාහි ඡන්දයද ප්‍රීතිය ද හැර අන්‍යසමාන එකොළස ද, අකුශල සාධාරණ සතරදැයි යන චෛතසික ධර්ම පසළොස සංග්‍රහ වන්නාහ. විචිකිච්ඡා සහගත සිතෙහි ද අධිමෝක්ෂය හැර විචිකිච්ඡාව සමඟ චෛතසික ධර්ම පසළොසක් සංග්‍රහ වන්නාහ. මෙසේ සියලු ආකාරයෙන් දොළොස් අකුශල චිත්තයන්හි වෙන වෙන යොදතත් ගණන් වශයෙන් සංග්‍රහනය සත් වැදෑරුම් වන්නේය.

40. **එකූන වීසතිඨාරස - වීසෙක වීස වීසති**
**ද්වාවීස පණ්ණරසෙති - සත්තධා කුසලෙ ඨිතා**

අකුශල් සිත් දොළසෙහි එකූන් විස්සය, අටළොසය, විස්සය, එක්විස්සයය, විස්සය, දෙවිස්සයය, පසළොස යයි ගණන වශයෙන් සංග්‍රහ සත් වැදෑරුම් වන්නේය.

41. **සාධාරණා ච චත්තාරො - සමානා ච දසාපරෙ**
**චුද්දසෙ තෙ පවුච්චන්ති - සබ්බා කුසලා යෝගිනො**

අකුශල සාධාරණ චෛතසික සතර ද, ඡන්ද- ප්‍රීති- අධිමෝක්ෂ වර්ජිත අන්‍ය සමාන දශය ද යන චෛතසික තුදුස චනාහි සර්වාකුසල යෝගී චෛතසික නම් වන්නාහ.

42. අහේතුක සිත් අටළොස අතුරෙන් හසිතෝත්පාද චිත්තයෙහි චනාහි ඡන්දය වර්ජිත චෛතසික දොළසක් සංග්‍රහ වන්නාහ. එසේම මනෝද්වාරාවර්ජන නම් වූ ද වොත්ථපන චිත්තයෙහි ඡන්ද- ප්‍රීති වර්ජිත ධර්ම එකොළසක් සංග්‍රහ වන්නාහ. සෝමනස්ස සහගත සන්තීරණ, සිතෙහි ඡන්ද- විරිය වර්ජිත ධර්ම එකොළස සංග්‍රහ වන්නාහ

43. පඤ්චද්වාරාවර්ජනය හා සම්පටිච්ඡන යුගලය නම් වූ මනොධාතු ත්‍රිකයෙහි ද උපෙක්ෂා සහගත සන්තීරණය දෙසිත නම් වූ අහේතුක ප්‍රතිසන්ධි යුගලයෙහි ද, ඡන්ද - විරිය - ප්‍රීතිය වර්ජිත අන්‍යසමාන දශදෙන සංග්‍රහ වන්නාහ. දෙපස් විඤ්ඤාණ සිත් දශයෙහි ප්‍රකීර්ණක වර්ජිත සර්ව චිත්ත සාධාරණ සත්දෙන සංග්‍රහ වන්නාහ. මෙසේ සියලු ආකාරයෙන් අහේතුක සිත් අටළොසෙහි ගණන් වශයෙන් සංග්‍රහ නය සතරාකාර වන්නේය.

44. **ද්වාදසෙකා දස දස - සත්ත චාති චතුබ්බිධො**
**අට්ඨාරසා හෙතුකෙසු - චිතතුප්පාදෙසු සංගහො.**

අටළොස් වූ අහේතුක චිත්තෝත්තිපාදයන්හි චෛතසික දොළසක්ද, එකොළසක්ද, දසයක් ද සතක් දැයි සංග්‍රහය සතරාකාර වන්නේය.

45. **අහෙතුකෙසු සබ්බත්ථ - සත්ත සෙසා යථාරහං**
**ඉති විත්ථාරතො වුතෙතා - තෙත්තිංස විධ සංගහො**

සියලු අහේතුක සිත්හි සැමතැන චෛතසික සතරක් ද ඉතිරි චෛතසික සුදුසු පරිද්දෙන් ද සංග්‍රහ වන්නාහ. මෙසේ තෙතිසක් වූ සංග්‍රහ නය සවිස්තරව කියන ලද්දේ වේ.

46. **ඉත්ථං චිත්තාවියුත්තානං - සම්පයොගඤ්ච සංගහං**
**ඤත්වා භෙදං යථායොගං - චිත්තෙන සම මුද්දිසෙ**

මෙසේ සිතෙන් වෙන් නොවූ සිත සමඟ මිශ්‍රවූ චෛතසික ධර්මයන්ගේ සොළොස් වැදෑරුම් සම්ප්‍රයෝග නය ක්‍රමය ද, තෙතිස් වැදෑරුම් සංග්‍රහ නය ක්‍රමය ද නුවණින් දැන, චෛතසික සම්ප්‍රයුක්ත වන සිත් ගණනට සමව චෛතසික ගණනද කිය යුතු වන්නේය.

## ත්‍රිලක්ෂණ විදර්ශනාව

1. අභිධර්ම චෛතසික විදර්ශනා භාවනාවේදී පහළ වූ චිත්ත චෛතසික භූතරූප උපාදරූප යන නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්මයෝ ක්‍ෂණයක් ක්‍ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝය.

2. ඇතිවීම් නැතිවීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝය.

3. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝය.

4. අනිත්‍ය වූ දුක්ඛවූ අනාත්ම වූ චිත්ත චෛතසික භූතරූප උපාදරූප යන නාම රූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන සංඛත සන්තාප විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේය.

5. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්වභව තෘෂ්ණාව ආයූහණ නිදන සංයෝග පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේය.

6. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව නිස්සරණ විවේක අසංඛාරික අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේය.

7. ඒ නිරෝධ සත්‍යය සුව සේ අවබෝධවීම පිණිස, භාවනා වශයෙන් වැඩිය යුතු වූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය නියයාත හේතු දස්සන ආධිපතෙය්‍යාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේය.

8. මාගේ භාවනාමය කුසලානිසංස ධර්මය මෙම චතුරාර්ය සත්‍යය සුව සේ අවබෝධ වීම පිණිසම හේතු වේවා. වාසනා වේවා.

සාධු ! සාධු !! සාධු !!!

**පදවිවරණය:**

1. ඒකුප්පාද - සිතක් පාසා උපදින චෛතසිකයෝ පෙරපසු නොවී සිතත් සමග එකවරටම උපදින් බැවින් ඒකුප්පාද නම් වේ.

2. ඒකනිරෝධ - සිතක් පාසා උපදින චෛතසිකයෝ පෙරපසු නොවී සිතක් සමඟ එකවරම නිරුද්ධ වන බැවින් ඒකනිරෝධ නම් වේ.

3. ඒකාරම්මණ - සිත ගන්නා වූ අරමුණම ඒ සිතෙහි යෙදෙන චෛතසිකයන් ගන්නා බැවින් ඒකාරම්මණ නම් වේ.

4. ඒකවත්ථුක - චක්ඛු චක්‍ෂු ආදී වස්තු සය අතුරෙන් යම් ඒ වස්ථුරූපයක් ඇසුරු කොට සිත පවතී නම් ඒ වස්තුරූපයම ඇසුරු කොට ඒ සිතේ චෛතසිකයෝ ද පවතින බැවින් ඒකවත්ථුක නම් වෙති.

5. සර්වචිත්ත සාධාරණ - කුශලාකුශල විපාක ක්‍රියා වශයෙන් ඇත්තාවූ සියලුම සිත් එකුන් අනුවෙහි එකලෙස යෙදෙන චෛතසික සත්සෙන සර්වචිත්ත සාධාරණ නම්වෙති.

6. ප්‍රකිර්ණක - එකුන් අනූ සිත් අතරෙහි සුදුසු පරිදි විසිරී පවතින චෛතසික සදෙන ප්‍රකිර්ණක නම් වෙති.

7. සෝභන සාධාරණ - සෝභන සිත් එකුන් සැටෙහි ද එක් අනුවෙහි ද එකලෙස යෙදෙන චෛතසික දහනවය සෝභන සාධාරණ නම් වෙති.

8. විරති - සම්පත්ත විරති - සමාදන විරති - සමුච්ඡේද විරති නමින් අවස්ථා තුනක දී යෙදෙන කාය- වාක් දුශ්චරිතයෙන් හා මිථ්‍යාජීවයෙන් වැළකීමේ දී පහළ වන චෛතසික තිදෙන විරති නම් වේ.

9. අප්‍රමාණ්‍ය - මෙත්තා - කරුණා - මුදිතා - උපෙක්ඛා යන සතරම අප්‍රමාණ සත්වයන් අරමුණු කරන බැවින්ද, අප්‍රමාණ වූ අනන්ත ලෝක ධාතු වෙත පතුරුවන බැවින්ද, අප්‍රමාණව ධ්‍යාන වශයෙන් වඩනු ලැබෙන බැවින්ද අප්‍රමාණ නම ලබති. මෙත්තා අදෙස උපෙක්ඛා තත්‍රමජ්ඣත්තුපෙක්ඛා, නමින් සෝභන සාධාරණ රාශියට ඇතුලත් වන බැවින්, චෛතසික විභාගයේදී කරුණා මුදිතා දෙන පමණක් අප්‍රමාණ්‍ය නමින් ගැනෙති.

10. මෝහ චතුෂ්කය - මෝහ අහිරික අනොත්තප්ප උද්දච්ච යන සතර අකුශල් සිත් දෙළසෙහිම යෙදෙන සර්වාකුශල සාධාරණ සතරක් බැවින් මෝහ චතුෂ්කය නමින් හැඳින්වෙති.

11. ලෝභත්‍රිකය - ලෝභය ලෝභමූල සිත්හි යෙදෙන අතර, දිට්ඨි මාන දෙකද ලෝභදිට්ඨි - ලෝභමාන වශයෙන් එකතු වන බැවින් ඒ තුන ලෝභත්‍රිකය නම් වේ.

12. දෙස චතුෂ්කය - දෙස ඉස්සා මච්ජරිය කුක්කුච්ච යන සතර දෙස මූල දෙසිතෙහි පමණක්ම යෙදෙන බැවින් ඒ නම ලබති. ඉස්සා මච්ජරිය කුක්කුච්චය එකවර එක සිතක නොයෙදෙති.

13. ථිනමිද්ධ යුගලය - සසංඛාරික අකුශල් සිත් පසෙහි ඇතැම් කලෙක පමණක් එකටම යෙදෙන චෛතසික දෙකකි. එය ද කදාචියෝගී- සහයෝගී නම ලබයි.

14. ශ්‍රද්ධා, අධිමොක්ෂ - රත්නත්‍රයේ අනන්ත ගුණස්කන්ධය පිළිගැනීම පැහැදීම ශ්‍රද්ධාව යි. නොසැලෙන සේ ස්ථිරව පිහිටා සිටීම අධිමොක්ෂයයි.

15. අනියත යෝගී - ඉස්සා මච්ජරිය කුක්කුච්ච තුන ද විරති තුන ද, අප්‍රමාණ්‍ය දෙක ද මානය ද, ථිනමිද්ධ දෙක ද යන චෛතසික සිත එකොළස තම තමන් සම්ප්‍රයෝග වන සිත්හි ද සැමද සැමතැන නොලැබෙන බැවින් අනියතයෝගී නම ලබති.

16. නියත යෝගී - අනියත යෝගී චෛතසික එකොළස හැර ඉතිරි චෛතසික එක්සාලිස් දෙනා තමා තමාට නියමිත සිත්හි නියත වශයෙන්ම යෙදෙන බැවින් නියතයෝගී නම් වෙති.

17. සම්ප්‍රයෝග නය16 - චෛතසික ධර්මයක් මුල්කොට ගෙන මේ මේ චෛතසිකය මෙතෙක් මෙතෙක් චිත්තයන්හි යෙදෙන්නේ යයි නියම කොට දැන්වීම සම්ප්‍රයෝග නය නම් වේ. චෛතසික රාශි දහසයකට බෙද එම සම්ප්‍රයෝගය දැක්විය හැකි බැවින් සම්ප්‍රයෝග නය 16 කැයි කියන ලදී.

18. සංග්‍රහනය 33 - එක සිතක් ගෙන ඒ ඒ චිත්තයෙහි මෙතෙක් මෙතෙක් චෛතසික සංග්‍රහ වෙතැයි දැක්වෙන ක්‍රමය සංග්‍රහ නය නම් වේ. සිත් 89 - හෝ 121- හෝ රාශි තෙතිසකට බෙද චෛතසික සංග්‍රහය දැක්විය හැකි බැවින් සංග්‍රහ නය තෙතිසකැයි කියන ලදී.


රාජසේවා බෞද්ධ සංගමය,
සංස්කෘතික අමාත්‍යාංශය, සෙත්සිරිපාය,
බත්තරමුල්ල.
2542 නවම්/1999 පෙ.බ.10.

මහරගම පමුණුව පාරේ, සෝමා රණසිංහ මහත්මාව විසින් පරලෝ සැපත් දයාබර ස්වාමි පුරුෂා බී. එස්. රණසිංහ මහත්මාණන්ට හා දෙමාපියන්ට පිං පිණිස නුගේගොඩ ගංගොඩවිල අංක 37, සෝරත මාවත පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස් හි මුද්‍රණය කරවා ධම්දානය වශයෙන් බෙද හරින ලදී.

## අභිධර්ම භාවනා පාඩම 03

## අති පූජ්‍ය නා උයනේ අරිය ධම්ම නාහිමිපාණන් වහන්සේ විසින්

අභිධර්මාර්ථ සංග්‍රහය- ප්‍රකිර්ණක සංග්‍රහ විභාගය. 1

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස ! ! !

1. **සම්පයුත්තා යථා යෝගං - තේපඤ්ඤස සභාවතෝ**
   **චිත්ත චේතසිකා ධම්මා - තේසං දනි යථාරහං**

   යෙදෙන පරිද්දෙන් සතර සම්ප්‍රයෝග ලක්‍ෂණ වශයෙන් සම්ප්‍රයුක්ත වූ සිත් අසූනවය, චෛතසික දෙපණස් යන මේ ධර්මයන් අතුරෙන් වනාහි, සිත් සියල්ල එකක් කොට ගත් කල්හි චෛතසික දෙපණසද සිතදැයි ධර්ම ස්වභාව වශයෙන් පණස් තුන් වැදෑරුම් වන්නාහ.

2. **වේදනා හේතුතෝ කිච්ච - ද්වාරාරම්මණ වත්ථුතෝ**
   **චිත්තුප්පාද වසෙනේව - සංගහෝ නාම නියති**

   වේදනා සංග්‍රහය හේතු සංග්‍රහය කෘත්‍ය සංග්‍රහය ද්වාර සංග්‍රහය ආරම්මණ සංග්‍රහය වස්තු සංග්‍රහය නම් වූ සය වැදෑරුම් සංග්‍රහ වනාහි චිත්තෝත්පාදයන්ගේ වශයෙන් දක්වනු ලබන්නේය.

3. **1. වේදනා සංග්‍රහය**

   අරමුණ රස විඳීම් ලක්‍ෂණ ඇත්තා වූ වේදනාවන්ගේ සංග්‍රහයෙහි වේදනාව වනාහි අරමුණුරස විඳීම් නම් වූ අනුභවන භේදයෙන් තෙවැදෑරුම් වන්නේය. අරමුණු රස විඳීමේ ඉසුරුමත් බව නම් වූ ඉන්ද්‍රිය භේදයෙන් පස් වැදෑරුම් ද වන්නේය.

4. අනුභවන භේදයෙන් වේදනාව තෙවැදෑරුම් වනුයේ කෙසේද යත්, ඉටු අරමුණු රස විඳගැනීමේ ලක්‍ෂණ ඇත්තා වූ සුඛ වේදනාව ද, අනිටු අරමුණු රස විඳගැනීමේ ලක්‍ෂණ ඇත්තා වූ දුක්ඛ වේදනාව ද, ඉටු මැදහත් අරමුණු විඳගැනීමේ ලක්‍ෂණ ඇත්තා වූ අදුක්ඛමසුඛ වේදනාව දැයි මෙසේ තෙවැදෑරුම් වන්නේය.

5. ඉන්ද්‍රිය භේදයෙන් වේදනාව පස් වැදෑරුම් වනුයේ කෙසෙද යත්. කායික වූ ඉටු අරමුණු විඳීමේ ඉසුරුමත් වූ සුඛින්ද්‍රියද, කායික වූ අනිටු අරමුණු රස විඳීමෙ ඉසුරුමත් වූ දුක්ඛින්ද්‍රියද, මානසික ඉටු අරමුණු රස විඳීමේ ඉසුරුමත් වූ සෝමනස්සින්ද්‍රය ද, මානසික අනිටු අරමුණු රස විඳීමේ ඉසුරුමත් වූ දෝමනස්සින්ද්‍රිය ද, මානසික ඉටු මැදහත් අරමුණු රස විඳීමේ ඉසුරුමත් වූ උපෙක්ඛින්ද්‍රිය දැයි මෙසේ ඉන්ද්‍රිය භේදයෙන් වේදනාව පස් වැදෑරුම් වන්නේය.

6. කායික වූ ඉටු අරමුණු රස විඳීමෙ ඉසුරුමත් වූ සුඛින්ද්‍රිය සමඟ වනාහි එකම සුඛ සහගත කායවිඤ්ඤාණ සිත පමණක් යෙදෙන්නේය. එසේම කායික වූ අනිටු අරමුණු රසවිඳීමේ ඉසුරුමත් වූ දුක්ඛින්ද්‍රිය සමඟ එකම දුක්ඛසහගත කාය විඤ්ඤාණ සිත පමණක් යෙදෙන්නේය.

7. මානසික වූ ඉටු අරමුණු රස විඳගැනීමේ ඉසුරුමත් වූ සෝමනස්සින්ද්‍රිය සමඟ වනාහි, ලෝභ මූල සෝමනස්ස සිත් සතර ද, සෝමනස්ස සන්තීරණය ද, හසිතෝත්පාදය ද, කාමසෝභන සෝමනස්ස සහගත සිත් දෙළසද, යන කාමාවචර සෝමනස්ස සහගත සිත් අටලොසද, මහග්ගත ලෝකෝත්තර ප්‍රථමධ්‍යාන සිත් එකොළසද ද්විතියධ්‍යාන සිත්

එකොළසද තෘතිය ධ්‍යාන සිත් එකොළසද, චතුර්ථධ්‍යාන සිත් එකොළසද යන සූසාලිස සමඟ දෙසැට දෙන සෝමනස්ස වේදනාවෙහි සංග්‍රහ වන්නාහ.

8. මානසික අනිටු අරමුණු රස විඳගැනීමේ ඉසුරුමත් වූ දෝමනස්සින්ද්‍රිය සමඟ වනාහි, ද්වේෂමූල දෙසිත පමණක් දෝමනස්ස වේදනාවෙහි සංග්‍රහ වන්නාහ. මානසික වූ ඉටු මැදහත් අරමුණු රස විඳගැනීමේ ඉසුරුමත් වූ උපෙක්ඛින්ද්‍රිය සමඟ වනාහි, ලෝභමූල උපේක්ෂා සහගත සිත් සතර ද, අහේතුක උපෙක්සා සහගත සිත් තුදුසද, කාමසෝභන උපේක්ෂා සහගත සිත් දොළසද යන කාමාවචර සිත් දෙතිස් දෙනද, මහග්ගත ලෝකෝත්තර පඤ්චමධ්‍යාන සිත් තෙවිසි දෙනද යන පස්පණස් චිත්තයෝ උපෙක්ෂා වේදනාවෙහි සංග්‍රහ වන්නාහ.

9. **සුඛං දුක්ඛ මුපෙක්ඛාති - තිවිධා තත්ථ වේදනා**<br>
**සෝමනස්සං දෝමනස්ස - ඉ්‍ති භේදෙන පඤ්චධා**

**සුඛ මෙකත්ථ දුක්ඛඤ්ච - දෝමනස්සං ද්වයේ ඨිතං**<br>
**ද්විසට්ඨි සු සෝමනස්සං - පඤ්ච පඤ්ඤසකෙ තරා**

වේදනා සංග්‍රහයෙහි වනාහි සුඛ දුක්ඛ උපෙක්ඛා නමින් වේදනාව තුන් වැදෑරුම් වන්නේය. සෝමනස්ස දෝමනස්ස භේදයෙන් වනාහි වේදනාව පස් වැදෑරුම් ද වන්නේය. සුඛ වේදනාව එක් සිතකද, දුක්ඛ වේදනාව එක් සිතකද දෝමනස්ස වේදනාව දෙසිතක ද, සෝමනස්ස වේදනාව සිත් දෙසැටක ද, උපේක්ෂා වේදනාව සිත් පස් පණසෙක ද සංග්‍රහ වන්නේය.

2. **හේතු සංග්‍රහය**

10. හේතු සංග්‍රහයෙහි වනාහි, චිත්ත චෛතසික ධර්මයන් අරමුණු කෙරෙහි මුල් බැසගන්නා සේ ශක්තිමත්ව පිහිටුවාලන අර්ථයෙන් හේතු නම් වූ ධර්මයෝ සදෙනෙක් ඇත්තාහ. ඒ හේතු ධර්ම සදෙනා නම් කවරේද යත්, ඉටු අරමුණෙහි ඇලෙන සුළු ලෝභය ද, අනිටු අරමුණෙහි ගැටෙන සුළු ද්වේෂය ද, සියලු අරමුණෙහි මුළාවන සුළු මෝහය ද, ඉටු අරමුණක නොඇලෙන සුළු අලෝභය ද, අනිටු අරමුණක නොගැටෙන සුළු අද්වේෂය ද, සැම අරමුණක නොමුළාවන සුළු අමෝහය ද, යන සදෙනා වනාහි හේතු ධර්මයෝ නම් වන්නාහ.

11. හේතු ධර්මයන් නොයෙදෙන අහේතුක සිත් අටළොසද, ඒකහේතුක සිත් දෙක ද, ද්විහේතුක සිත් දෙවිස්සද ත්‍රිහේතුක සිත් සත්සාලිස දැයි එහි සංග්‍රහය සතර වැදෑරුම් වන්නේය. අහේතුක සිත් අටළොස නම් කවරේද යත්, පඤ්චද්වාරාවර්ජන සිතය, ද්විපඤ්චවිඤ්ඤාණසිත් දශය, සම්පටිච්ඡන සිත් දෙකය, සන්තීරණ සිත් තුනය, වොත්ථපන සිතය, හසිතෝත්පාද සිත යයි මෙසේ අහේතුක සිත් අටළොසක් වන්නාහ.

12. ඉතිරි එක් සැත්තෑවක් චිත්තයෝ සහේතුක නම් වන්නාහ. ඔවුනතුරෙන් දෙකක් වූ ඒකහේතුක සිත් නම් කවරේද යත්, මෝහ මූල අකුශල් සිත් දෙක පමණක් මෝහය නම් වූ එකම හේතුවක් සමඟ යෙදෙන බැවින් ඒකහේතුක සිත් නම් වන්නාහ. දෙවිස්සක් වූ ද්විහේතුක සිත් නම් කවරේද යත්, ලෝභ මූල අකුශල් සිත් අට දෙන ලෝභ මෝහ නම් වූ හේතුන් දෙක සමඟද, ද්වේෂ මූල අකුශල් සිත් දෙක ද්වේෂ- මෝහ නම් වූ හේතුන් දෙක සමඟ ද, ඥාණ විප්‍රයුක්ත කාමසෝභන සිත් දොළස අලෝභ- අද්වේෂ නම් වූ හේතුන් දෙක සමඟ යෙදෙන බැවින් ද්විහේතුක සිත් දෙවිස්ස නම් වන්නාහ.

13. සත් සාලිසක් වූ ත්‍රිහේතුක සිත් නම් කවරේද යත්, ඥාන සම්ප්‍රයුක්ත කාමසෝභන සිත් දොළසද, මහග්ගත සිත් සත් විස්ස ද ලෝකෝත්තර සිත් අට දෙන ද, අලෝභ - අද්වේෂ

- අමෝහ නම් වූ හේතූන් තුනක් සමග යෙදෙන බැවින් ත්‍රිහේතුක සිත් සත් සාලිස ද නම් වන්නාහ.

14. **ලෝභො දේසෝ ච මෝහෝ ච - හේතු අකුසලා තයෝ**
**අලෝභා දේසා - මෝහා ච - කුසලාබ්‍යා කතා තථා**

**අහේතුකට්ඨාරසේක - හේතුකා ද්වේ දුවිසති**
**දුහේතුකා මතා සත්ත - චත්තාලීස තිහෙතුකා**

ලෝභය ද ද්වේශය ද මෝහය දැයි අකුශල හේතු තිදෙනෙක් වන්නාහ. එසේම අලෝභය ද අද්වේසය ද අමෝහය දැයි කුශල හේතු අව්‍යාකෘත හේතු තිදෙනෙක් වන්නාහ. අහේතුක සිත් අටළොසක් ද ඒක හේතුක දෙකක් ද ද්විහේතුක දෙවිස්සක් ද ත්‍රිහේතුක සත් සාලිසක් ද වන්නාහ.

3. **කෘත්‍ය සංග්‍රහය**

15. සිතක් පාසා සිදුවන ක්‍රියා සම්පත්තිය දැක්වෙන කෘත්‍ය සංග්‍රහයෙහි වනාහි, චිත්තක්‍රියාවන් තුදුස් වැදෑරුම් වන්නාහ. ක්‍රියාකාරී ස්ථාන වනාහි දසයක් ද පස් විස්සක් ද වන්නාහ. තුදුස් වැදෑරුම් කෘත්‍යයෝ නම් කවරේද යත්, ප්‍රතිසන්ධි කෘත්‍යය, භවංග කෘත්‍යය, ආවර්ජන කෘත්‍යය, දර්ශන කෘත්‍යය, ශ්‍රවණ කෘත්‍යය, ඝ්‍රායන කෘත්‍යය, සායන කෘත්‍යය, ස්ප්‍රශන කෘත්‍යය, සම්පටිච්ඡන කෘත්‍යය, සන්තීරණ කෘත්‍යය, වොත්ථපන කෘත්‍යය, ජවන කෘත්‍යය, තදාරම්මණ කෘත්‍යය, චුති කෘත්‍යය දැයි කෘත්‍යය තුදුස් වැදෑරුම් වන්නේය.

16. කෘත්‍යස්ථාන දශය නම් කවරේද යත්, ප්‍රතිසන්ධි ස්ථානය, භවංගස්ථානය ආවර්ජන ස්ථානය පඤ්චවිඤ්ඤාණ ස්ථානය, සම්පටිච්ඡන ස්ථානය, සන්තීරණ ස්ථානය, වොත්ථපනස්ථානය, ජවන ස්ථානය, තදාරම්මණ ස්ථානය, චුති ස්ථානයයි කෘත්‍ය ස්ථාන දශ වැදෑරුම් වන්නාහ.

17. කෘත්‍යස්ථාන පස්විසි වැදෑරුම් වන්නාහු කෙසේද යත්, ප්‍රතිසන්ධි ස්ථාන එකක්ද, භවාංග ස්ථාන සයක්ද, ආවර්ජනා ස්ථාන දෙකක් ද, පඤ්චවිඤ්ඤාණ ස්ථාන එකක් ද, සම්පටිච්ඡන ස්ථාන එකක් ද, සන්තීරණ ස්ථාන එකක් ද, වොත්ථපන ස්ථාන දෙකක් ද, ජවන ස්ථාන සයක්ද, තදාරම්මණ ස්ථාන දෙකක්දැයි චුතිස්ථාන තුනක් දැයි මෙසේ කෘත්‍ය ස්ථාන ප්‍රභේද වශයෙන් පස්විසි වැදෑරුම් වන්නාහ.

18 එකක්ම ප්‍රතිසන්ධිස්ථානය වනාහි පූර්ව භවයෙහි චුතියත් වර්තමාන භවයෙහි භවංගයත් දෙක අතර වන්නේය. සය වැදෑරුම් භවංග ස්ථාන නම් වනාහි ප්‍රතිසන්ධියත් ආවර්ජනාවත් දෙක අතරේද, තදාරම්මණ ආවර්ජනා දෙක අතරේද, ජවන - ආවර්ජනා දෙක අතරේද, වොත්ථපන ආවර්ජනා දෙක අතරේද, තදාරම්මණ චුති අතරේද, ජවන චුති අතරේදැයි භවංග ස්ථාන සය වැදෑරුම් වන්නාහ.

19. ආවර්ජනා ස්ථාන දෙක නම් වනාහි, භවංග පඤ්චවිඤ්ඤාණ දෙක අතරේද භවංග ජවන දෙක අතරේද ආවර්ජනා ස්ථාන දෙක වන්නාහ. ආවර්ජන සම්පටිච්ඡන දෙක අතරහි පඤ්චවිඤ්ඤාණ ස්ථානය වන්නේය. පඤ්චවිඤ්ඤාණ සංතීරණ දෙක අතරෙහි එකම සම්පටිච්ඡන ස්ථානය ද, සම්පටිච්ඡන වොත්ථපන දෙක අතරෙහි එකම සංතීරණය ස්ථානයක් ද, සංතීරණ ජවන අතරෙහි ද සංතීරණ භවංග අතරෙහි දැයි දෙකක් වූ වොත්ථපන ස්ථාන වන්නාහ.

20. ජවන ස්ථාන සය නම් කවරේද යත්, ආවර්ජන තදාරම්මණ දෙක අතරෙහි ද, ආවර්ජනා භවංග දෙක අතරෙහි ද, ආවර්ජන චුති දෙක අතරෙහි ද, වොත්ථපන තදාරම්මණ දෙක

අතරෙහි ද වොත්ථපන භවංග දෙක අතරෙහි ද, වොත්ථපන චුති දෙක අතරෙහිදැයි ජවන ස්ථානය සය වැදෑරුම් වන්නේය.

21. තදරම්මණ ස්ථාන දෙක නම් කවරේද යත්, ජවන භවංග අතරෙහි ද ජවන චුති අතරෙහි දැයි තදරම්මණ ස්ථාන දෙක වන්නා හ. චුති ස්ථාන තුන නම් කවරේද යත්, තදරම්මණ ප්‍රතිසන්ධි දෙක අතර ද, ජවන ප්‍රතිසන්ධි අතරද, භවංග ප්‍රතිසන්ධි දෙක අතරදැයි චුති ස්ථානය තෙවැදෑරුම් වන්නේය. මෙසේ චිත්ත නියාමය අනුව කෘත්‍යස්ථාන සියල්ල විසිපස් වැදෑරුම් වන්නේය.

22. අනූන් අනූ චිත්තයන් අතුරෙන් ප්‍රතිසන්ධි කෘත්‍යවත් චිත්තයෝ එකුන් විස්සක් ඇත්තාහ. ඔවුන් කවරේද යත්, අහේතුක ප්‍රතිසන්ධි යුගලයද නම් වූ, උපෙක්ෂා සහගත සන්තීරණය දෙසිතද, මහාවිපාක සිත් අටදෙන ද මහග්ගත විපාක සිත් නව දෙනද යන එකුන් විස්ස ප්‍රතිසන්ධි කෘත්‍යවත් සිත් නම් වන්නාහ.

23. පඤ්චද්වාරාවර්ජන චිත්තයද මනෝද්වාරාවර්ජන චිත්තය දැයි ආවර්ජනා කෘත්‍යවත් චිත්තයෝ දෙදෙනෙක් වන්නාහ. දර්ශන කෘත්‍ය ශ්‍රමණ කෘත්‍ය ආඝ්‍රායන කෘත්‍යය සායන කෘත්‍යය ඵුසන කෘත්‍යය සම්පටිච්ඡන කෘත්‍යයවත් චිත්තයෝ ද දෙක බැගින් ම වන්නාහ. සංතීරණ කෘත්‍යවත් චිත්තයෝ වනාහි තිදෙනෙක් වන්නාහ. එකක්ම වූ මනෝද්වාරාවර්ජන චිත්තයම පඤ්චද්වාරයෙහි වොත්ථපන කෘත්‍යය සිදු කරන්නේය.

24. ජවන කෘත්‍යවත් චිත්තයෝ පස් පණස් දෙනෙක් වන්නාහ. ඔවුහු නම් කවරේද යත්, කුශල්සිත් එක් විස්ස ද, අකුශල් සිත් දෙළසද ලෝකෝත්තර ඵල සිත් සතරද, ආවර්ජනා සිත් දෙක හැර ඉතිරි සියලු ක්‍රියා සිත් අටළොසද යන පස් පණස් චිත්තයෝ ජවන කෘත්‍යයවත් චිත්තයෝ නම් වන්නාහ. මහා විපාක සිත් අට දෙන ද සංතීරන සිත තිදෙන දැයි එකොළස තදරම්මණ කෘත්‍යවත් සිත් නම් වන්නාහ.

25. ඔවුනතුරෙන් උපෙක්ෂා සහගත සංතීරණ දෙසිත වනාහි ප්‍රතිසන්ධි භවංග චුති සන්තීරණ තදරම්මණ වශයෙන් පඤ්චවිධ කෘත්‍යයන් ඇත්තාහු වන්නාහ. මහා විපාක සිත් අට දෙන වනාහි ප්‍රතිසන්ධි භවංග චුති තදරම්මණ වශයෙන් සතර වැදෑරුම් කෘත්‍යයක් ඇත්තාහ. මහග්ගත විපාක සිත් නවදෙන වනාහි ප්‍රතිසන්ධි භවාංග චුති වශයෙන් කෘත්‍ය තුනක් ඇත්තාහ.

26. සෝමනස්ස සහගත සංතීරණ චිත්තය වනාහි සන්තීරණ තදරම්මණ වශයෙන් කෘත්‍ය දෙකක්ම ඇත්තේය. එසේම වොත්ථපන සිත ද වොත්ථපන ආවර්ජන වශයෙන් කෘත්‍ය දෙකක්ම ඇත්තේය. ඉතිරි ජවන සිත් පස්පණසද මනෝධාතුත්‍රිකයද දෙපස්විඤ්ඤාණ සිත් දශයද යන අට සැටක් වූ චිත්තයෝ වනාහි එක එක කෘත්‍යයක්ම ඇත්තාහු නම් වන්නාහ.

27. **පටිසන්ධාදයෝ නාම - කිච්ච භේදෙන චුද්දස**
**දසධා ඨාන භේදෙන - චිත්තුප්පාද පකාසිතා**

**අට්ඨ සට්ඨි තථාද්වෙච - නවාට්ඨ ද්වෙ යථාක්කමං**
**ඒක ද්වෙ ති චතු පඤ්ච - කිච්ච ට්ඨානානි නිද්දිසෙ**

ප්‍රතිසන්ධි කෘත්‍යාදී කෘතය භේදයෙන් කෘත්‍යය තුදුසකි. දශවැදෑරුම් ස්ථාන භේදයෙන් වනාහි චිත්තෝත්පාදයෝ කියන ලද්දහ. එකම කෘත්‍යයක් ඇති සිත් අට සැටක් ද කෘත්‍යය දෙකක් ඇති සිත් දෙකක්ද කෘත්‍යය තුනක් ඇති සිත් නවයක් ද කෘත්‍ය සතරක් ඇති සිත් අටක් ද කෘත්‍ය පසක් ඇති සිත් දෙකක් ද දක්වන්නේය.

## ත්‍රිලක්ෂණ විදර්ශනාව

1. වේදනා හේතු කෘත්‍ය සංග්‍රහ විභාග භාවනාවේදී පහළ වූ චිත්ත චෛතසික භූතරූප උපාදා රූප යන මේ නාම රූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්මයෝ ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝය.

2. ඇති වීම් නැති වීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝය.

3. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝය.

4. අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ චිත්ත චෛතසික භූතරූප උපාදා රූප යන මේ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය පීළන සංඛත සන්තාප විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍ය නම් වන්නේය.

5. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නාවූ පූර්ව භව තෘෂ්ණාව, ආයූහණ නිදාන සංයෝග පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍ය නම් වන්නේය.

6. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ විවේක අසංඛත අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේය.

7. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතුවූ ආර්ය අෂ්ටාංගික මාර්ගය, නියයාණ හේතු දස්සන ආධිපතෙය්‍යාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේය.

8. මාගේ භාවනාමය කුසලානිසංස ධර්මය මෙම චතුරාර්ය සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිසම හේතු වේවා, වාසනා වේවා.

සාධු ! සාධු ! සාධු !

### පද විවරණය

1. වේදනා - සඳෙරින් ගන්නා වූ සැම අරමුණකම ඇත්තාවූ ඉෂ්ඨ රසයද අනිෂ්ඨ රසයද ඉෂ්ඨ මධ්‍යස්ථ රසයද විඳගන්නා වූ එකම චෛතසිකය වේදනාවය.

2. සුඛ වේදනා - ඉෂ්ඨාරම්මණයන් කාය ප්‍රසාදයෙහි හැපීමෙන් පහළවන කුශල විපාක කාය විඤ්ඤාණය සමග යෙදෙන වේදනාව සුඛ වේදනාවය.

3. දුක්ඛ වේදනා - අනිෂ්ඨාරම්මණයක් කාය ප්‍රසාදයෙහි හැපීමෙන් පහළ වන අකුශල විපාක කාය විඤ්ඤාණය සමග යෙදෙනුයේ දුක්ඛ වේදනාවය.

4. සෝමනස්ස වේදනාව - ඉෂ්ඨාරම්මණයක් මනෝද්වාරයට අරමුණු වීමේදී ලැබෙන මානසික මිහිරි වේදනාව සෝමනස්ස වේදනාවය.

5. දෙමනස්ස වේදනාව - අනිෂ්ඨාරම්මණයක් මනෝද්වාරයට අරමුණු වීමේදී ලැබෙන මානසික අමිහිරි වේදනාව දෝමනස්ස වේදනාවය.

6. උපේක්ෂා වේදනාව - කායද්වාරය හැර සෙසු ද්වාරයන්ට ඉෂ්ඨ මධ්‍යස්ථාරම්මණයක් අරමුණු වීමේදී ලැබෙන මැදහත් වේදනාව උපෙක්ෂා වේදනාවය.

7. අකුසල හේතු තිදෙන - ලෝභයෙන් පාපයක් කිරීමේදී ඒ අරමුණෙහි සිත තදින් පිහිටා සිටුවන ලෝභ මෝහ දෙක ද, නපුරු සිතකින් පාපයක් කිරීමේදී ඒ අරමුණෙහි සිත තදින් සිටුවන ද්වේෂ මෝහ දෙකද, සිතේ නොසන්සුන් විටද සැකයක් ඇති විට ද ඒ ඒ අරමුණෙහි මුලාවී යෙදෙන මෝහයද යන හේතු ධර්ම තුන අකුශල හේතු නම් වෙති.

8. කුසල හේතු - කුසල් සිත් එක් විස්සෙහිදී කුශල් අරමුණු කෙරෙහි සිත් තදින් පිහිටුවනු ලබන අලෝභ අදේස අමෝහ යන තිදෙන කුසල හේතු නම් වෙති.

## ත්‍රිලක්ෂණ විදර්ශනාව

1. වේදනා හේතු කෘත්‍ය සංග්‍රහ විභාග භාවනාවේදී පහළ වූ චිත්ත චෛතසික භූතරූප උපාද රූප යන මේ නාම රූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්මයෝ ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝය.

2. ඇති වීම් නැති වීම් දෙකින් නිරන්තරයෙන් පිඩා වින්ද බැවින් දුක්ඛයෝය.

3. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝය.

4. අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ චිත්ත චෛතසික භූතරූප උපාද රූප යන මේ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය පීළන සංඛත සන්තාප විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍ය නම් වන්නේය.

5. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නාවූ පූර්ව භව තෘෂ්ණාව, ආයූහණ නිදාන සංයෝග පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍ය නම් වන්නේය.

6. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ විවේක අසංඛත අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේය.

7. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතුවූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය, නියානණ හේතු දස්සන ආධිපතෙය්‍යාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේය.

8. මාගේ භාවනාමය කුසලානිසංස ධර්මය මෙම චතුරාර්ය සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිසම හේතු වේවා, වාසනා වේවා.

සාධු ! සාධු ! සාධු !

### පද විවරණය

1. වේදනා - සඳෙරින් ගන්නා වූ සෑම අරමුණකම ඇත්තාවූ ඉෂ්ඨ රසයද අනිෂ්ඨ රසයද ඉෂ්ඨ මධ්‍යස්ථ රසයද විඳගන්නා වූ එකම චෛතසිකය වේදනාවය.

2. සුඛ වේදනා - ඉෂ්ඨාරම්මණයන් කාය ප්‍රසාදයෙහි හැපීමෙන් පහළවන කුශල විපාක කාය විඤ්ඤාණය සමග යෙදෙන වේදනාව සුඛ වේදනාවය.

3. දුක්ඛ වේදනා - අනිෂ්ඨාරම්මණයක් කාය ප්‍රසාදයෙහි හැපීමෙන් පහළ වන අකුශල විපාක කාය විඤ්ඤාණය සමග යෙදෙනුයේ දුක්ඛ වේදනාවය.

4. සෝමනස්ස වේදනාව - ඉෂ්ඨාරම්මණයක් මනෝද්වාරයට අරමුණු වීමේදී ලැබෙන මානසික මිහිරි වේදනාව සෝමනස්ස වේදනාවය.

5. දෙමනස්ස වේදනාව - අනිෂ්ඨාරම්මණයක් මනෝද්වාරයට අරමුණු වීමේදී ලැබෙන මානසික අමිහිරි වේදනාව දෝමනස්ස වේදනාවය.

6. උපේක්ෂා වේදනාව - කායද්වාරය හැර සෙසු ද්වාරයන්ට ඉෂ්ඨ මධ්‍යස්ථාරම්මණයක් අරමුණු වීමේදී ලැබෙන මැදහත් වේදනාව උපෙක්ෂා වේදනාවය.

7. අකුසල හේතු තිදෙන - ලෝභයෙන් පාපයක් කිරීමේදී ඒ අරමුණෙහි සිත තදින් පිහිටා සිටුවන ලෝභ මෝහ දෙක ද, නපුරු සිතකින් පාපයක් කිරීමේදී ඒ අරමුණෙහි සිත තදින් සිටුවන ද්වේෂ මෝහ දෙකද, සිතේ නොසන්සුන් විටද සැකයක් ඇති විට ද ඒ ඒ අරමුණෙහි මුලාවී යෙදෙන මෝහයද යන හේතු ධර්ම තුන අකුශල හේතු නම් වෙති.

8. කුසල හේතු - කුසල් සිත් එක් විස්සෙහිදී කුශල් අරමුණු කෙරෙහි සිත් තදින් පිහිටුවනු ලබන අලෝභ අදෙස අමෝහ යන තිදෙන කුසල හේතු නම් වෙති.

9. අව්‍යාකෘත හේතු - සහේතුක විපාක සිත්හිද සහේතුක ක්‍රියා සිත්හිද ඒ සිත්වලින් ගනු ලැබෙන අරමුණු කෙරෙහි සිත තදින් පිහිටුවන අලෝභ අද්වේස අමෝහ තිදෙන අව්‍යාකෘත හේතු නම් වෙති.

10 කෘත්‍ය තුදුස - චිත්ත නියාමය අනුව සෑම සිතකින්ම නියමිත කෘත්‍යයක් සිදු වේ. එක් භවයකින් චුත වී ඊට අනතුරුවම තවත් භවයක ඉපදීම ප්‍රතිසන්ධි කෘත්‍යයයි. උපන් භවයේ ප්‍රතිසන්ධියේ සිට චුතිය දක්වාම, සදෙරින් අරමුණක් නොගන්නා වූ සෑම විටම, එම ආත්මභාවය රකින්නාවූ භවයේම අංගයක් වැනි වූ විපාක සිත් පේළිය භවංග කෘත්‍යය සිදු කෙරේ.

11. ආවර්ජනා - පඤ්චද්වාරයට ලැබෙන අරමුණ පඤ්චද්වාරාවර්ජන සිතෙන්ද මනෝද්වාරයට ලැබෙන අරමුණ මනෝද්වාවර්ජන සිතෙන්ද ආවර්ජන කෘත්‍යය සිදු කෙරේ.

12 පඤ්ච විඤ්ඤාන කෘත්‍යය - දෙපස් විඤ්ඤාණයට ලැබෙන අරමුණු පස දර්ශණ - ශ්‍රවණ -ආඝ්‍රාණ - සායන- ස්‍පර්ශන වශයෙන්ද සම්පටිච්ඡන පිළිගැනීම - සන්තීරණ - තීරණය කිරීම - වොත්ථපන - ව්‍යවස්ථාපන කිරීම සිදු කෙරේ.

13. ජවන- තදාරම්මණ -චුති - අරමුණක පූර්ණ රසය විඳිමින් වේගවත් ලෙස සිදු කෙරෙනුයේ ජවන කෘත්‍යයයි ජවනයෙන් ගත් අරමුණම ගෙන ශාන්ත බවකින් පැවතීම තදාරම්මණ කෘත්‍යයයි. එක භවයකින් ගිලිහී යන, ඒ භවයෙහි අන්තිම සිතින් සිදු කෙරෙනුයේ චුති කෘත්‍යයයි.

14. කෘත්‍ය ස්ථාන - එක් භවයක පළමුවැනිව ලැබෙන ප්‍රතිසන්ධි සිතේ සිට අන්තිමට ලැබෙන චුති සිත දක්වාම සිදුවන ක්‍රියාදාමය තුදුස් වැදෑරුම් වෙයි. සිත් පෙළේ ඒ ඒ ක්‍රියාවන් සිදු විය හැකි ස්ථාන කෙටියෙන් දශයකි. ප්‍රභේද වශයෙන් ගත් කල්හි පස් විස්සකි. වීථි කාණ්ඩයේදී ඒ පිළිබඳ විශේෂාවබෝධයක් ලැබෙන්නේය.


**රාජසේවා බෞද්ධ සංගමය,**
සංස්කෘතික අමාත්‍යාංශය, සෙත්සිරිපාය,
බත්තරමුල්ල.
2542 නවම්/1999 පෙ.බ.10

විජයරාම පටුමග ගංගොඩවිල නුගේගොඩ නන්ද වැලිකල මහත්මිය විසින් පරලෝ සැපත් දෙමාපියන් නෑදිමයිලන් ඇතුළු හැමට පිං පිණිස. නුගේගොඩ ගංගොඩවිල, 37, සෝරතමාවත. පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස් හි මුද්‍රණය කරවා ධර්ම දානය වශයෙන් බෙද හරින ලදි.

## අභිධර්ම භාවනා පාඩම 04.

## අති පූජ්‍ය නා උයනේ අරිය ධම්ම නාහිමිපාණන් වහන්සේ විසින්

අභිධර්මාර්ථ සංග්‍රහ ප්‍රකීර්ණක සංග්‍රහ විභාගය. 02

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!

4. **ද්වාර සංග්‍රහය :**

1. ද්වාර සංග්‍රහයෙහි ද්වාර නමින් සයක් ඇත්තාහ. චිත්ත චෛතසික නාම ධර්මයන් ඇතුල්වන පිටවෙන හැසිරෙන දොරටු වැනි බැවින් ඒ ද්වාර නම්වූ සය දෙන කවරහුද යත්, චක්ඛු ද්වාරය, සෝත ද්වාර, ඝ්‍රාණද්වාරය, ජිව්හාද්වාරය, කායද්වාරය, මනෝ ද්වාරය, යන සදෙන වන්නාහ.

2. ඔවුනතුරෙන් චක්ඛු ද්වාරය නම් කවරේද යත්, නෙතට ප්‍රිය මනාප රූප අරමුණු දැකීමේ කැමැත්ත ආශාව නිදහන් කොට ඇති කර්මයෙන් හටගත් සතර මහා භූත රූපයන් ගේ ප්‍රසාද බව ලක්‍ෂණ කොට ඇත්තාවූ චක්ඛු ප්‍රසාදයම චක්ඛු ද්වාරය නම් වන්නේය.

3. ශ්‍රෝත ද්වාරය නම් කවරේද යත්, කණට ප්‍රිය මනාප ශබ්ද අරමුණු ඇසීමේ කැමැත්ත ආශාව නිදහන් කොට ඇති කර්මයන් හටගත් සතර මහා භූත රූපයන්ගේ ප්‍රසාද බව ලක්‍ෂණ කොට ඇත්තාවූ සෝත ප්‍රසාද රූපයම සෝතද්වාරය නම් වන්නේය.

4. ඝාණ ද්වාරය නම් කවරේද යත්, නාසිකාවට ප්‍රිය මනාප සුවඳ අරමුණු විඳගැනීමේ කැමැත්ත ආශාව නිදහන් කොට ඇති කර්මයෙන් හටගත් සතර මහා භූත රූපයන්ගේ ප්‍රසාද බව ලක්‍ෂණ කොට ඇත්තාවූ ඝාණ ප්‍රසාද රූපයම ඝාණද්වාරය නම් වන්නේය.

5. ජිව්හා ද්වාරය නම් කවරේද යත්, දිවට ප්‍රිය මනාප රසමිහිරි අරමුණු විඳගැනීමේ කැමැත්ත ආශාව නිදහන් කොට, ඇත්තාවූ කර්මයෙන් හටගත් සතර මහා භූතරූපයන්ගේ ප්‍රසාද බව ලක්‍ෂණ කොට ඇත්තාවූ ජිව්හා ප්‍රසාද රූපයම ජිව්හා ද්වාරය නම් වන්නේය.

6. කායද්වාරය නම් කවරේද යත්, කයට ප්‍රිය මනාප සුව පහස අරමුණු රස විඳගැනීමේ කැමැත්ත ආශාව නිදහන් කොට ඇත්තාවූ කර්මයෙන් හටගත් සතර මහා භූතරූපයන්ගේ ප්‍රසාද බව ලක්‍ෂණ කොට ඇත්තාවූ කාය ප්‍රසාද රූපයම කායද්වාරය නම් වන්නේය.

7. මනෝද්වාරය නම් කවරේද යත්, රූපාදී පඤ්චාරම්මණය හැර ධර්ම අරමුණක් හමුවූ විටක දී මනෝද්වාරික චිත්ත වීථියක් සඳහා දොරටුවක් වන්නා වූ මනෝද්වාරාවර්ජන චිත්තයට සමීපාසන්න වූ භවාංග සිත වනාහි මනෝද්වාරය නම් වන්නේය.

8. ද්වාර සය අතුරෙන් චක්ඛුද්වාරයෙහි උපදින්නාවූ සිත් සියල්ල සසාලිසක් වන්නාහ. ඔවුහු නම් කවරේද යත්, පඤ්චද්වාරාවර්ජන චිත්තය ද, චක්ඛු විඤ්ඤාණ දෙසිත ද, සම්පටිච්ඡන දෙසිත ද, සන්තීරණ සිත් තුන ද, වොත්ථපන සිත ද, කාමාවචර ජවන් සිත් එකුන් තිසද, මහා විපාක තදලම්බණ සිත් අට ද. යන සිත් සසාලිස වනාහි චක්‍ෂු ද්වාරයෙහි සුදුසු පරිදි ලැබෙන්නාහ.

9. සොතද්වාරයෙහි සෝත විඤ්ඤාණ දෙසිත සමඟද ඝ්‍රාණද්වාරයෙහි ඝාණ විඤ්ඤාණ දෙසිත සමඟ ද, ජිව්හාද්වාරයෙහි ජිව්හා විඤ්ඤාණ දෙසිත සමඟ ද, කායද්වාරයෙහි කාය විඤ්ඤාණ දෙසිත සමඟද ඉහත දැක්වූ සසාලිස් චිත්තය සුදුසු පරිදි ලැබෙන්නාහ. පඤ්චද්වාරයෙහි වනාහි කාමාවචර සිත් සූපණස පමණක් සුදුසු පරිදි උපදින්නාහ.

10. මනෝද්වාරයෙහි වනාහි සිත් සත් සැට දෙනෙක් උපදින්නාහ. ඔවුහු නම් කවරහුද යත්, මනෝද්වාරාවර්ජන සිත ද, ජවන් සිත් පස්පණස ද, තදලම්බණ සිත් එකොළොසද යන සිත් සත් සැට දෙනා මනෝද්වාරයෙහි සුදුසු පරිදි උපදින්නාහ.

11. ද්වාර විමුක්ත චිත්තයෝ වනාහි එකුන්විසි දෙනෙක් වන්නාහ. ඔවුහු නම් කවරහුද යත් උපෙක්ෂා සහගත සන්තීරණ සිත් දෙකද, මහාවිපාක සිත් අට දෙනද, මහග්ගත විපාක සිත් නවදෙන ද යන එකුන්විසි චිත්තයෝ ප්‍රතිසන්ධි භවාංගචුති කෘත්‍ය සිදුකරන බැවින් ද්වාර විමුත්ත නම් වන්නාහ.

12. තවද දෙපස්විඤ්ඤාණ සිත් දසයද මහග්ගත ලෝකෝත්තර ජවන් සිත් සවිස්සද යන සතිස් දෙන වනාහි සුදුසු පරිදි යෙදෙන ලෙස ඒකද්වාරික චිත්තයෝ නම් වන්නාහ. පඤ්චද්වාරාවර්ජනයද සම්පටිච්ඡන යුගලයද යන මනෝධාතු ත්‍රිකය වනාහි, පඤ්චද්වාරයෙහි පමණක් යෙදෙන බැවින් පඤ්චද්වාරික චිත්තයෝ නම් වන්නාහ.

13. සෝමනස්ස සහගත සන්තීරණ සිතද වොත්ථපන සිතද කාමාවචර ජවන් සිත් එකුන්තිසද යන එක්තිස් දෙන වනාහි සදෙරෙහි ම සුදුසු පරිදි යෙදෙන බැවින් ඡද්වාරික චිත්තයෝ නම් වන්නාහ.

14. උපෙක්ෂා සහගත සන්තීරණ දෙසිත ද, මහාවිපාක සිත් අට දෙන ද යන දසදෙන වනාහි, සදෙරෙහි යෙදෙන බැවින් ද ප්‍රතිසන්ධි භවංග චුති වශයෙන් යෙදෙන බැවින්ද, ඡද්වාරික නම් ද ද්වාර විමුත්ත නම් ද වන්නාහ. මහග්ගත විපාකසිත් නව දෙන වනාහි සියලු ආකාරයෙන් ද්වාරවිමුත්ත නම් වන්නාහ.

15. **ඵකද්වාරික චිත්තානි - පඤ්ච ඡද්වාරිකානි ච**
**ඡදවාරික විමුත්තානි - විමුත්තානෙව සබ්බථා**

**ඡත්තිංසති තථා තිණි - ඵකතිංස යථාක්කමං**
**දසධා නවධා චෙති - පඤ්චධා පරිදීපයෙ**

ඒකද්වාරික චිත්තයෝ සතිසත් ඇත්නාහ. පඤ්චද්වාරික චිත්තයෝ තිදෙනෙක් වන්නාහ. ඡද්වාරික චිත්තයෝ එක්තිස් දෙනෙක් වන්නාහ. ඡද්වාරික වූද ද්වාරික විමුක්ත වූද චිත්තයෝ සද දෙනෙක් වන්නාහ. සියලු ආකාරයෙන් ද්වාර විමුක්ත චිත්තයෝ නවදෙනෙක් වන්නාහ. මෙසේ අනුපිළිවෙළින් පස් ආකාරයකින් ද්වාර සංග්‍රහය දක්වන්නේය.

5. **ආරම්මණ සංග්‍රහය :**

16. සදෙරෙහි උපදින චිත්ත චෛතසිකයන් හට ගොදුරු වන්නා වූ අරමුනු වනාහි සයවැදෑරුම් වන්නාහ. ඔවුහු කවරහුද යත්, වර්ණරූපය නම් වූ රූපාරම්මණයද, ශබ්දරූපය නම් වූ ශබ්දරම්මණයද, ගන්ධරූපය නම් වූ ගන්ධාරම්මණයද, රස රූපය නම්වූ රසාරම්මණය ද, පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය නම් වූ ඵොට්ඨබ්බාරම්මණය ද, මනෝද්වාරයට පමණක් ගොදුරු වන්නා වූ ධම්මාරම්මණයදැයි මෙසේ සය වැදෑරුම් වන්නාහ.

17. සය වැදෑරුම් අරමුණු අතුරෙන් රූප අරමුණු නම් කවරේද යත්, චතුසමුට්ඨානික වූ ආධ්‍යාත්මික වූද බාහිර වූද වර්ණ රූපය වනාහි චක්ඛුද්වාරික සසාලිස් චිත්තයන් හට අරමුනු වන බැවින් රූපාරම්මණය නම් වන්නේය. ශබ්දරම්මණය නම් කවරේද යත්, සෝතද්වාරික සසාලිස් චිත්තයන්හට අරමුණු වන්නාවූ චිත්තජ උතුජ යන ද්විසමුට්ඨානතික ශබ්දරූපය වනාහි සද්දරම්මණය නම් වන්නේය.

18. ගන්ධාරම්මණය නම් කවරේද යත්, ඝාණද්වාරික සසාලිස් චිත්තයන්හට අරමුනු වන්නාවූ චතුසමුට්ඨානික වූ ගන්ධරූපය වනාහි ගන්ධාරම්මණය නම් වන්නේය. ජිව්හා ද්වාරික සසාලිස් චිත්තයන්හට අරමුණු වන්නාවූ චතුසමුට්ඨානික රස රූපය වනාහි රසාරම්මණය නම් වන්නේය.

19. ඵොට්ඨබ්බාරම්මණය නම් කවරේද යත්, කායද්වාරික සසාලිස් චිත්තයන්හට අරමුණු වන්නාවූ චතුසමුට්ඨානික වූ පඨවි තේජෝ වායෝ නම් වූ මහාභූතරූප තුන වනාහි ඵොට්ඨබ්බාරම්මණය නම් වන්නේය. ධම්මාරම්මණය නම් කවරේද යත්, ප්‍රසාද රූප පසද, සුඛුමරූප සොළසද, එකුන් අනූ චිත්තයද චෛතසික දෙපණසද නිර්වාණයද ප්‍රඥප්තියද යන සවැදෑරුම් අරමුනු වනාහි මනෝද්වාරික චිත්තයන් සත්සැට දෙනාහට සුදුසු පරිදි අරමුණු වන බැවින් ධම්මාරම්මණය නම් වන්නේය.

20. සැවැදෑරුම් අරමුණු අතුරෙන් වනාහි වර්තමාන වූම රූපාරම්මණය චක්ඛු ද්වාරික සසාලිස් චිත්තයන් හට අරමුණු වන්නේය. එසේම වර්තමාන වූම ශබ්දරම්මණය සෝතද්වාරික සසාලිස් චිත්තයන්හට අරමුණු වන්නේය. වර්තමාන වූම ගන්ධාරම්මණය ඝාණද්වාරික සසාලිස් චිත්තයන්හට අරමුණු වන්නේය. වර්තමාන වූම රසාරම්මනය ජිව්හාද්වාරික සසාලිස් චිත්තයන්හට අරමුණු වන්නේය. වර්තමාන වූම ඵොට්ඨබ්බාරම්මණය කායද්වාරික සසාලිස් චිත්තයන් හට අරමුණු වන්නේය.

21. මනෝද්වාරික සත් සැට චිත්තයන්හට වනාහි අතීතවූද අනාගත වූද වර්තමාන වූද කාලවිමුක්ත වූද සවැදෑරුම් ධර්මාරම්මණය සුදුසු පරිද්දෙන් අරමුනු වන්නේය. ප්‍රතිසන්ධි භවංග චුති කිස සාධන්නා වූ ද්වාරවිමුක්ත එකුන්විසි චිත්තයන්හට වනාහි, පූර්ව භව යේදී සදෙරින් ගන්නා ලද අතීතවූද වර්තමාන වූද, ප්‍රඥප්ති වූද කර්මය-කර්ම නිමිත්තය-ගති නිමිත්තයයි සම්මත වූ සැවැදෑරුම් වූද ධර්මාරම්මණය අරමුණු වන්නේය.

22. චක්ෂුර් විඥාන යුගලයද වනාහි රූපාරම්මණය පමණක් අරමුනු කරන්නේය. ශ්‍රෝත විඥාන යුගලය ශබ්දරම්මණය පමණක් ද, ඝ්‍රාණ විඥාන යුගලය ගන්ධාරම්මණය පමණක්ද, ජිහ්වාවිඥාන යුගලය රසාරම්මණය පමණක් ද, කායවිඥාන යුගලය ඵොට්ඨබ්බාරම්මණය පමණක්දැයි මෙසේ දෙපස් විඤ්ඤාණයෝ රූපාදී එක එක අරමුණක්ම අරමුණු කරන්නාහ.

23. පඤ්ච විඤ්ඤාණ වීථියෙහි පමණක්ම යෙදෙන්නාවූ මනෝ ධාතුත්‍රිකය වනාහි රූපාදී පඤ්චාරම්මණයම අරමුනු කරන්නේය. මෙසේ දෙපස්විඤ්ඤාණ දශයද මනෝධාතු ත්‍රිකයද යන තෙළෙස් සිත් හැර අවශේෂ වූ කාමාවචර විපාක සිත් එකොළසද හසිතෝත්පාදය ද යන දෙළසක් වූ සිත් වනාහි කාමාවචර අරමුණු පමණක්ම අරමුණු කරන්නාහ.

24. අකුසල් සිත් දෙළසද, ඥාන විප්‍රයුක්ත කාමාවචර ජවන්සිත් අටද යන සමවිසි චිත්තයෝ ලෝකෝත්තර ධර්ම හැර ලෞකික ධර්ම සියල්ල අරමුනු කරන්නාහ. ඥනසම්ප්‍රයුක්ත කුසල් සිත් සතරද රූපාවචර පඤ්චමධ්‍යාන සංඛ්‍යාත පඤ්චාභිඥ කුසල් සිත ද යන පස්දෙන අර්හත් මාර්ගඵල ධර්මයන් හැර අවශේෂ ලෞකික ලෝකෝත්තර ධර්ම සියල්ල අරමුණු කරන්නාහ.

25. ඥන සම්ප්‍රයුත්ක කාමාවචර ක්‍රියා සිත් සතරද ක්‍රියාභිඥ සිතද වොත්ථපන සිතද යන සිත් සදෙන වනාහි ලෞකික ලෝකෝත්තර සියල්ල අරමුණු කරන්නාහ.

26. අරූපාවචර සිත් දෙළස අතුරෙන් විඤ්ඤාණඤ්චායතන නේවසඤ්ඤානාසඤ්ඤායතන සිත් සදෙන වනාහි මහග්ගත අරමුනු ඇත්තාහ. අවශේෂ මහග්ගත සිත් එක්විසිදෙනාම වනාහි

ප්‍රඥප්ති ධර්ම පමණක්ම අරමුණු කරන්නාහ. ලෝකෝත්තර සිත් අට දෙන වනාහි නිර්වාණ ධාතුව පමණක්ම අරමුණු කරන්නාහ.

27. **පඤ්චවීස පරිත්තම්හි - ඡ චිත්තානි මහග්ගතේ**
**ඒක වීසති වෝහාරෙ - අට්ඨ නිබ්බාණ ගොචරෙ**

**වීසානුත්තර මුත්තම්හි - අග්ග මග්ග ඵලුජ්ඣිතෙ**
**පඤ්ච සබ්බත්ථ ජායන්ති - සත්තධා තත්ථ සංගහො**

කාමාවචර අරමුණෙහි සිත් පස්විස්සක්ද මහග්ගත අරමුණෙහි සිත් සයක්ද, ප්‍රඥප්තත්ති අරමුණෙහි සිත් එක්විස්සක් ද, නිර්වාණ අරමුණෙහි සිත් අටක් ද, ලෞකික අරමුණෙහි සිත් විස්සක් ද, රහත් මගපල හැර සෙසු අරමුණෙහි සිත් පසක් ද සියලු අරමුණෙහි සිත් සයක් දැයි මෙසේ ආරම්මණ සංග්‍රහය සත් වැදෑරුම් වන්නේය.

6. **වත්ථු සංග්‍රහය :**

28. වස්තු සංග්‍රයෙහි වස්තු ධර්මයෝ සදෙනෙක් වන්නාහ. ඔවුහු නම් කවරේද යත්, චක්ඛු ප්‍රසාදය නම් වූ චක්ඛු වස්තුව ද, ශ්‍රෝත්‍ර ප්‍රසාදය නම් වූ සෝත වස්තුව ද, ඝාන ප්‍රසාදය නම් වූ ඝාන වස්තුව ද, ජිව්හා ප්‍රසාදය නම් වූ ජිව්හා වස්තුව ද, කාය ප්‍රසාදය නම් වූ කායවස්තුව ද, හදය රූපය නම් වූ හදය වස්තුවදැයි මෙසේ චිත්ත චෛතසිකයන් උපදින්නාවූ ස්ථාන බැවින් වස්තු ධර්මයෝ සදෙනෙක් වන්නාහ.

29. එකොළොස් කාමාවචර භූමියෙහි වනාහි මේ වස්තු ධර්මයෝ සදෙනම ලැබෙන්නාහි. රූපාවචර බඹලොව වනාහි ඝාණ-ජිව්හා-කාය වස්තූන් තිදෙන හැර ඉතිරි චක්ඛු සෝත හදය වස්තු තිදෙන ලැබෙන්නාහ. අරූපී බඹලොව වනාහි වස්තු ධර්ම කිසිවක්ම නොලැබෙන්නාහ.

30. ඔවුනතුරෙන් පඤ්ච ප්‍රසාද වස්තු ධර්මයෝ අනුපිළිවෙළින් දෙපස් විඤ්ඤාණ ධාතූන්ට පමණක් නිශ්‍රය වන්නාහ. පඤ්චද්වාවර්ජනය සම්පටිච්ඡන යුගලය නම් වූ මනෝ ධාතු ත්‍රිකය වනාහි හදය වස්තුව පමණක් අශ්‍රිත කොට ඇත්තාහ.

31. එසේම සන්තීරණ තුන ද මහා විපාක අට ද, පටිස සිත් දෙකද. සෝවාන් මාර්ග චිත්තය ද. හසිතෝත්පාදයද, රූපාවචර සිත් පසලොසද යන සමතිස් චිත්තයෝ ද හදය වස්තුව ආශ්‍රිතවම පවතින්නාහ.

32. අවශේෂ අකුශල් සිත් දශයද, කුසල් සිත් දෙළස ද, ක්‍රියා සිත් තෙළෙසද ලෝකෝත්තර සිත් සත ද යන දෙසාලිස් චිත්තයෝ වනාහි පඤ්චවෝකාර භූමියෙහිදී හදය වස්තුව ආශ්‍රිය තවද චතු වොකාර භූමියෙහිදී හදය වස්තුව ආශ්‍රය නොකොට ද පවතින්නාහ. අරූපාවචර විපාක සිත් සතර දෙන වනාහි හදය වස්තුව අනාශ්‍රිතවම පවතින්නාහ.

33. **ඡ වත්ථු නිස්සිතා කාමෙ - සත්ත රූපෙ චතුබ්බිධා**
**තිවත්ථු නිස්සිතාරුප්පෙ - ධාත්වෙකා නිස්සිතා මතා**

**තෙ චත්තාලීස නිස්සාය - ද්වෙ චත්තාලීස ජායරෙ**
**නිස්සාය ච අනිස්සාය - පාකාරුප්පා අනිස්සිතා**

කාම භූමියෙහි වස්තු රූප සදෙන ආශ්‍රිතව විඥනධාතු සත පවත්නාහ. රූප භූමියෙහි වස්තු රූප තුනක් ආශ්‍රිතව විඥාන ධාතු සතරක් පවත්නාහ. අරූප භූමියෙහි එකම විඥාන ධාතුවක් වස්තුරූප අනාශ්‍රිතව පවත්නේය. තෙතාලිසක් චිත්තයෝ වස්තුරූප ආශ්‍රිතව හටගන්නාහ. දෙසාලිසක් චිත්තයෝ වස්තු රූප ආශ්‍රිතවත් අනාශ්‍රිතවත් හටගන්නාහ. අරූප විපාක චිත්තයෝ වස්තු රූප අනාශ්‍රිතවම පවත්නාහ.

34. වේදනා හේතු කෘත්‍ය ද්වාර ආරම්මණ වස්තු වශයෙන් සය වැදෑරුම් සංග්‍රහයට ඇතුලත් වූ එකුන් අනූ චිත්තයද, දෙපණස් චෛතසිකද අටවිසි රූපයද නිර්වාණය ද යන සතර පරමාර්ථ ධර්මයෝ වනාහි ස්කන්ධ වශයෙන් පසකි, ආයතන වශයෙන් දොළසකි. ධාතු වශයෙන් අටළොසකි. ආර්ය සත්‍යය වශයෙන් සතරක් ද වන්නාහ.

## ත්‍රිලක්ෂණ විදර්ශනාව

1. ද්වාරම්මණ වස්තු සංග්‍රහ විභාග භාවනාවේදී පහල වූ චිත්ත චෛතසික භූතරූප උපාද රූප සංඛ්‍යාත නාම රූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්මයෝ ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝය.

2. ඇතිවීම් නැති වීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝය.

3. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝය.

4. මෙසේ අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ චිත්ත චෛතසික භූතරූප උපාද රූප සංඛ්‍යාත නාම රූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන සංඛත සන්තාප විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේය.

5. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව ආයූහණ නිදන සංයෝග පළිබෝධාර්තයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේය.

6. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ විවේක අසංඛත අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේය.

7. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතුවූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය, නියයාත හේතු දස්සන ආධිපතෙය්‍යාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සතත්‍යය නම් වන්නේය.

8. මාගේ භාවනාමය කුශලානිසංස ධර්මය මෙම චතුරාර්ය සත්‍යය සුව සේ අවබෝධ වීම පිණිසම හේතු වේවා. වාසනා වේවා.

සාධු. සාධු. සාධු.

## පදවිවරණය

1. ද්වාර- යම් කිසිවෙක් ඇතුල්වන පිටවන ස්ථානය ද්වාර නම් වේ. කායද්වාරය වාග්ද්වාරය මනෝද්වාරය නමින් කුශල්- අකුශල් සම්බන්ධ කර්මපථ සිදුවන ස්ථාන තුන කර්මද්වාර නමින් හැඳින් වෙති. ද්වාර සංග්‍රහයෙහි සයාකාර ද්වාර නමින් ගැනෙනුයේ චිත්ත චෛතසික උපදින පවතින හැසිරෙන ස්ථාන සයයි.

2. ආරම්මණ- ආගන්ත්වා රමන්ති එත්ථාති ආරම්මණං, චිත්ත චෛතසිකයෝ පැමිණ මෙහි රමණය කෙරෙත්නුය ආරම්මණ නම් වේ. චිත්ත චෛතසිකයන් විසින් යම් යම් දෙයක් අරමුනු කෙරේ නම් ඒ ඒ තැන ඇලෙන බැඳෙන රැඳෙන ආකාරය මෙහි රමණය කිරීම නම් වේ. මෙහි ඇලෙන බැඳෙන ගතිය ලෝභයම නොව, ගනු ලැබෙන අරමුණෙහි රස විඳින ආකාරය වශයෙන් ගත යුතු වේ.

3. ආලම්බණ- ආලම්බියන්තීති ආලම්බණං, චිත්ත චෛතසිකයන් විසින් එල්බ ගනු ලැබෙන බැවින් ආලම්බණ නම් වේ. ආරම්මණං- ආලම්බණ යයි වචන දෙකක් වුවද අර්ථ වශයෙන් එකකි.

4. ද්වාර විමුක්ත - චිත්ත වීථි වශයෙන් පහළ නොවන ප්‍රතිසන්ධි සිත ද භංග සිත් පෙළද චුති සිතද කිසිම දෙරටුවක නොහැසිරෙන බැවින් ද්වාරවිමුක්ත නමින් හැඳින් වෙති.

5. කාල විමුක්ත - චිත්ත චෛතසික භූතරූප උපාදරූප යන සංඛත ධර්ම සියල්ල උත්පාද ඊති භංග නම්වූ අවස්ථා තුනට පත්වන බැවින්, අතීත අනාගත වර්තමාන කාලත්‍රයට අයත් වෙති. ප්‍රඥප්ති ධර්ම සියල්ලත් නිර්වාණ ධාතුවත් එසේ උත්පාදදි ක්ෂණත්‍රයට පත් නොවන බැවින් කාලවිමුක්ත ධර්ම නමින් හැඳින් වෙති.

6. **කාමාරම්මණ** - කාමාවචර සිත් සිවු පණසද එහි යෙදෙන චෛතසික දෙපණසද අටවිසි රූපයද කාම ධර්මයෝය. ඒහා සම්බන්ධ සියලු අරමුණු කාමාරම්මණ නම් වේ.

7. **මහග්ගතාරම්මණ** - විඤ්ඤාණඤ්චායතනය කුශල -විපාක ක්‍රියා සිත් තුනටම අරමුණ වන්නේ ඊට පළමුව පැවති ආකාසානඤ්චායතන ධ්‍යාන චිත්තයයි. එය මහග්ගත අරමුණකි. එසේම නේවසඤ්ඤාසඤ්ඤායතන කුශල-විපාක- ක්‍රියා සිත් තුනටම අරමුනු වූයේ ආකිඤ්චාඤ්ඤායතන ධ්‍යාන චිත්තයයි. එය ද මහග්ගත අරමුණකි.

8. **ප්‍රඥප්ති ආරම්මණ** - පරමාර්ථ ධර්මයක් නොවන අරමුනු සියල්ල ප්‍රඥප්ති අරමුනු නම් වෙති. දසකසිණ දස අසුභාදී වූ රූපධ්‍යාන උපදවන අරමුණු සියල්ල ද ප්‍රඥප්ති අරමුණු නම් වෙති.

9. **වස්තු** - ආරාම වස්තුව විහාර වස්තුව ගෘහවස්තුව ආදී තැන්හි ඒ ඒ දේ පිහිටා ඇති තැන වස්තු නමින් කියැ වේ. එසේ පිහිටවීමට ආධාර වීම නිශ්‍රය නම්ද වේ. චිත්ත චෛතසිකයන් පිහිටීමට ආධාර වන ස්ථාන සයක් ඇත. ඒ ස්ථාන සය වස්තු නමින් ගැනෙති.

10. **පඤ්ඤවෝකාර භූමි** - ස්කන්ධ පස ඇත්තාවූ භූමිය පඤ්චවෝකාර නම් වේ. අසඤ්ඤතලයත් අරූප තල සතරත් හැර ඉතිරි ස්ථාන සවිස්සම පඤ්ඤවෝකාර භූමි නම් වෙති. අසඤ්ඤතලය එකම රූපස්කන්ධයක් බැවින් ඒකවෝකාර භව නම් වේ. අරූප තල සතර රූපස්කන්ධයෙන් සම්පූර්ණයෙන් තොර බැවින් නාමස්කන්ධ සතර පමණක් පවත්නා බැවින් චතු වෝකාර භූමිය නම් වෙති.


**රාජ්‍ය සේවා බෞද්ධ සංගමය.**
**සංස්කෘතික අමාත්‍යාංශය**
සෙත්සිරිපාය, බත්තරමුල්ල.
2542 බක් /1999 අප්‍රියෙල් 07

කොළඹ 07, බුලර්ස් පටුමග, 2 1/3 හි පදිංචි
වෛද්‍ය එන් සමරසේකර මහත්මාවගේ හා ඒ සම්රසේකර මහත්මාණන්ගේ පරලෝ සැපත් දෙමාපියන්ට
පිං පිණිස

නුගේගොඩ ගංගොඩවිල 37 සෝරත මාවතේ පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස්හි මුද්‍රණය කරවා ධර්ම දානය
පිණිස නිකුත් කරන ලදී.

# අභිධර්ම භාවනා පාඩම 05

## අති පූජ්‍ය නා උයනේ අරිය ධම්ම නාහිමිපාණන් වහන්සේ විසින්

අභිධර්මාර්ථ සංග්‍රහය - චිත්ත ප්‍රවෘත්ති වීථි ශංග්‍රහ විභාගය, 01

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!

1. **චිත්තුප්පාදන මිච්චේවං - කත්වා සංගහ මුත්තරං**
**භූමි පුග්ගල භෙදෙන - පුබ්බාපර නියාමිතං**

**පවත්ති සංගහං නාම - පටිසන්ධි ප්පවත්තියං**
**පවක්ඛාමි සමාසෙන - යථා සම්භවවතො කථං**

චිත්ත චෛතසික ප්‍රකීර්ණක සංග්‍රහ විභාග තුනකින් චිත්තෝත්පාදයන් පිළිබඳව දත යුතු වූ සියල්ල සංග්‍රහ කොට දක්වන ලද්දේය. ඉන් අනතුරුව ප්‍රතිසන්ධියේ සිට චුතිය දක්වා පවත්නා වූ ජීවිතයේ භූමිභේදය පුද්ගල භේදයද සහිතව පූර්ව අපර නියමය පරිදි වීථි චිත්ත ප්‍රවෘත්ති සංග්‍රහය ලැබෙන පරිදි සැකෙවින් සම්පිණ්ඩණය කොට දක්වන්නෙමි.

2. සිත පවතින වස්තු රූප සයද, සිත හැසිරෙන ද්වාර සයද, සිත් ගන්නා වූ අරමුණු සයද, ද්වාර අනුව සිත බෙදෙන විඤ්ඤාණ සයද, චිත්ත වීථි සයද සිතට අපාතගත වන විෂය ප්‍රවෘත්ති සයද පළමු කොට දත යුත්තාහ.

3. වස්තු සයද ද්වාර සයද ආරම්මණ සයද ප්‍රකීර්ණක සංග්‍රහයෙදී දැක්වූ පරිදිය දතයුත්තාහ. චක්ඛු විඤ්ඤාණය සෝත විඤ්ඤාණය, ඝාණ විඤ්ඤාණය, ජිව්හා විඤ්ඤාණය කාය විඤ්ඤාණය, මනෝ විඤ්ඤාණය යයි විඤ්ඤාණ සය දත යුත්තාය.

4. චිත්ත වීථි සය වනාහි ද්වාර වශයෙන් විඤ්ඤාණ වශයෙන්දැයි දෙවැදෑරුම් වන්නාහ. චක්ඛුද්වාර වීථිය, ශ්‍රෝත්‍ර ද්වාර වීථිය, ඝ්‍රාණ ද්වාර වීථිය, ජිව්හා ද්වාර වීථිය කාය ද්වාර වීථිය, මනෝ ද්වාර වීථිය, ද්වාර වශයෙන් වීථි සය දත යුත්තාහ. චක්ඛු විඤ්ඤාණ වීථිය, සෝත විඤ්ඤාණ වීථිය ඝාණ විඤ්ඤාණ වීථිය මනෝ විඤ්ඤාන වීථිය යයි විඤ්ඤාණ වශයෙන්ද වීථි සය දත යුත්තාහ. මෙසේ සදෙරට ලැබෙන ආපාගත වන අරමුණු අනුව චිත්ත විථීන්ගේ පැවැත්ම සවැදෑරුම් වන්නාහ.

5. විෂය ප්‍රවෘත්ති සය නම් කවරේද යත්, පඤ්චද්වාරයෙහි ආපාත ගතවන අරමුණු පස අනුව, අතිමහත්තාරම්මණ - මහත්තාරම්මණ පරිත්තාරම්මණ අතිපරිත්තාරම්මණ නමින් සතරක්ද, මනෝ ද්වාර යෙහි විභූතාරම්මණ අවිභූතාරම්ණ නමින් දෙකක් දැයි විෂය ප්‍රවෘත්ති සය දත යුත්තාහ.

6. චිත්තයාගේ උත්පාදක්ෂණය ඨිතික්ෂණය භංගක්ෂණයයි කුඩා ක්ෂණ තුනකගේ එකතුව එක් චිත්තක්ෂණයක් වන්නේය. එවැනි චිත්තක්ෂණ සතලොසක් පමණ කාලය එක් රූපකලාපයකගේ ආයුෂ් ප්‍රමාණය වන්නේය.

7. රූපාරම්මණ ශබ්දරම්මණ ගන්ධාරම්මණ රසාරම්මණ ස්පර්ශාරම්මණ යන අරමුණු අතුරෙන් යමක් ඉපදී එක චිත්තක්ෂණයක් ඉකුත් වි හෝ චිත්තක්ෂණ කීපයක් ඉකුත් වී හෝ පඤ්චද්වාරයගෙන් යම් කිසි දෙරටුවකට ආපාතගත වන්නේය.

8. චිත්තක්ෂණ සතළොසක් ආයු ඇත්තාවූ රූපාරම්මණයක් ඉපදී එක චිත්තක්ෂණයක් ඉකුත් වී චක්ඛු ද්වාරයට හමු වී ආපාතගත වූයේ වී නම්, ඉන් අනතුරුව භවංග සිත දෙවරක් චලනය වන්නේය. භවංග චලන භවංගුපච්ඡේද නමින් පහළවන්නාවූ එම

චිත්තක්ෂණ දෙකට අනතුරුව භවංගය සිඳී එම රූපාරම්මණය ආවර්ජනා කරන්නා වූ පඤ්චද්වාරාවර්ජන සිත ඉපිද නිරුද්ධ වන්නේය.

9. ඉන්පසු ඒ සිතට අනතුරුව ඒ රූපාරම්මණය දකින්නා වූ චක්ඛු විඤ්ඤාණ සිත ද ඒ රූප අරමුණ පිළිගන්නා වූ සම්පටිච්ඡන සිතද තීරණය කරන්නා වූ සන්තීරණය සිත ද ව්‍යවස්ථාපනය කරන්නා වූ වොත්ථපන සිත ද අනුපිළිවෙලින් ඉපිද නිරුද්ධ වන්නාහ.

10. ඉන් අනතුරුව වනාහි යෝනිසෝ මනසිකාරය- අයෝනිසෝ මනසිකාරයයි කියන ලද තම තමන්ගේ සිතේ පළපුරුද්ද - පෙළ ගැස්ම අනුව කාමාවචර ජවන් සිත් එකුන්තිස අතුරෙන් යම් කිසි ජවන් සිතක් සත්වරක් දිවයයි. ජවනයට අනතුරුවම එම අරමුණ ගෙන තදරම්මණ විපාක සිත් දෙකක් ඉපද නිරුද්ධ වූ පසු චිත්ත සන්තතිය භවංග ජනිත වෙයි.

11. ඇසට ලක්වූ එම රූපාරම්මණයට මෙතෙකින් චිත්තක්ෂණ සතලොසක් පරිපූර්ණ වී ඇත. අතීත භවංගය - භවංග චලනය- භවංගුපච්ඡේදයයි භවංග සිත් තුන ද, පඤ්චද්වාරාවර්ජනය- චක්ඛුවිඤ්ඤාණය- සම්පටිච්ඡනය- සන්තීරණය- වොත්ථපනය- ජවන් සිත සතය- තදරම්මණ දෙකයයි විථි සිත් තුදුසදැයි චිත්තක්ෂණ සතලොසක් ඇත්තාහ. මෙසේ තදරම්මණ සිත් දෙකක් ලැබෙන තෙක් පැවතුන එම රූපාරම්මණය වනාහි අතිමහන්තාරම්මණ නම් වන්නේය.

12. තදරම්මණ සිත් දෙකක් ඉපදීමට නොසෑහෙන සේ ඉපදී චිත්තක්ෂණ දෙකක් ඉක්ම ගියා වූද චිත්තක්ෂණ තුනක් ඉක්ම ගියා වූද රූපාරම්මණයක් චක්ඛු ප්‍රසාදයට ආපාත ගත වූයේ වී නම් එය ජවන් සිත් සතට සීමාවන බැවින් මහන්තාරම්මණ නම් වන්නේය. චිත්තක්ෂණ සොළසක් ද චිත්තක්ෂණ පසළොසක් ද ආයු ඇත්තාවූ රූපාරම්මණය මහන්තාරම්මණ නම් වන්නේය. ජවන් කෙළවරදී සිත භවංග පතිත වන්නේය. තදරම්මණ නොමැත්තේය.

13. රූපාරම්මණය ඉපදී චිත්තක්ෂණ සතරක්ද, පස්ක්ද, සයක්ද, සතක්ද, අටක්ද, නවයක්ද, ඉක්ම ගොස් චක්ඛු ද්වරයට ආපාත ගත වී නම්, ජවන් සිත් සතක් ඉපදීමට ආයු මඳ බැවින් දෙතුන් වරක් වොත්ථපන සිතම පැවතී භවංගාපතිත වන්නේය. ජවන් සිත් පහළ වීමට රූපාරම්මණයාගේ ආයු මඳ බැවින් එය පරිත්තාරම්මණය නම් වන්නේය.

14. රූපාරම්මණය ඉපදී චිත්ක්ෂණ දහයක් එකොළසක් දෙළසක් තෙළෙසක් තුදුසක් පසළොසක් ද ඉක්ම ගොස් චක්ඛු ද්වාරයට ආපාතගත වී නම්, වොත්ථපන සිත දෙතුන් වරක්ද ඉපදීමට නොහැකි බැවින් භවංග චලන මාත්‍රයක්ම වන්නේය. වීථි චිත්තෝත්පාදයන් නොලැබෙන්නේය. ඉපදී කාලය ඉකුත් වී නිරුද්ධ වීමට ආසන්න වූ එම රූප අරමුණ වනාහි අතිපරිත්තාරම්මණය නම් වන්නේය.

15. මෙසේ චක්ෂු ද්වාරයෙහි තදරම්මණ වාර එකක්ද ජවනාවාර දෙකක්ද වොත්ථපන වාර සයක් මෝඝ වාර සයක් දැයි වාර පසළොසක්ද වන්නාහ. චක්‍ෂුද්වාරයෙහි සේම සෝතද්වාර ඝාණද්වාර ජිව්හද්වාර කායද්වාරයන්හිද තදරම්මණ වාර එකක් ද ජවනවාර දෙකක් ද වොත්ථපනවාර සයක් ද මෝඝවාර සයක්දැයි වාර පසළොසක්ම වන්නාහ. අතිමහන්තාරම්මණ වාර එකක්ද මහන්තාරම්මණ වාර දෙකක් ද පරිත්තාරම්මණ වාර සයක්ද අතිපරිත්තාරම්මණ වාර සයක් දැයි පඤ්චද්වාරයට ආපාගත වන විෂය ප්‍රවෘත්ති නම් වූ ආරම්මණ ප්‍රභේදය මෙසේ සතර වැදැරුම් වන්නේය.

16. **වීථි චිත්තානි සත්තේව - චිත්තුප්පාද චතුද්දස**
**චතු පඤ්ඤස විත්ථාරා - පඤ්ච ද්වාරේ යථාරහං**

ආවර්ජන- පඤ්චවිඤ්ඤාණ- සම්පටිච්ඡන- සන්තීරණ වොත්ථපන- ජවන- තදාරම්මණ නමින් පඤ්චද්වාරයෙහිම වීථි චිත්තයෝ සතක්ම වන්නාහ. එසේම ආවර්ජනය- පඤ්ච විඤ්ඤාණය- සම්පටිච්ඡනය- සන්තීරණයය වොත්ථපනය- ජවන් සිත් සතය- තදාරම්මණ දෙකයයි පඤ්චද්වාරයෙහි චිත්තෝත්පාදයෝ තුදුසක් වන්නාහ. විස්තර වශයෙන් වනාහි කාමාවචර සිත් සිවුපණසම පඤ්ච ද්වාරික චිත්ත වීථීන්හි යෙදෙන්නාහ. මේ වනාහි පඤ්චද්වාරයෙහි වීථි චිත්ත ප්‍රවෘත්ති ක්‍රමය වන්නේය.

17. මනොද්වාරයෙහි වනාහි අතිශයින් පැහැදිලිවූ අරමුණ විභූතාරම්මණ නමින් ද එසේ පැහැදිලි නොවූ අප්‍රකට අරමුණ අවිභූතාරම්මණ නමින් දැයි විෂය ප්‍රවෘත්තිය දෙවැදෑරුම් වන්නේය.

18. අතිශයින් ප්‍රකට වූ විභූතාරම්මණයක් මනෝ ද්වාරයට ආපාතගත වූයේ වී නම් භවංග චලන භවංගුපච්ඡේදයට අනතුරුව මනෝද්වාරවර්ජන චිත්තය ද කාමාවචර ජවන් එකුන් තිස අතුරෙන් යමක් සත්වරක්ද තදාරම්මණ විපාක සිත් දෙකක් ද උපදින්නාහ. ඉන් අනතුරුව සිත භවංග පතිත වන්නේය. අප්‍රකට වූ අවිභූතාරම්මණයක් මනෝ ද්වාරයට ආපාත ගත වූයේ වී නම් තදාරම්මණ විපාක සිත් නොමැතිව ජවන් සිත් සතකට අනතුරුව භවංග පතිත වන්නේය.

19. **වීථි චිත්තානි තීණේව - චිත්තුප්පාද ද සේරිතා**
**විත්ථාරේන පනෙත්ථෙත - චත්තාලී විභාවයේ.**

විභූතාරම්මණ මනෝද්වාරික චිත්ත වීථියක වනාහි ආවර්ජනය- ජවනය- තදාරම්මණයයි වීථි චිත්තයෝ තිදෙනෙක් වන්නාහ. ආවර්ජනය- ජවන් සිත් සතය, තදාරම්මණ දෙකයයි චිත්තෝත්පාදයෝ වනාහි දශ දෙනෙක්ම වන්නාහ. කාමාවචර මනෝද්වාරික චිත්තවීථි යෙහි වනාහි විස්තර වශයෙන්ද, මනෝද්වාරවර්ජන චිත්තයද කාමාවචර ජවන එකුන් තිසද, තදාරම්මණ සිත් එකොළසදැයි එක් සාලිසක් චිත්තයෝ ලැබෙන්නාහ.

මේ වනාහි කාමාවචර ජවන වාරයයි.

20. අර්පණා ජවන වාරයෙහි වනාහි විභූත අවිභූත භේදයක් හෝ තදාරම්මණ හෝ නොමැත්තේය. එහිදී වනාහි ඤාණසම්ප්‍රයුක්ත මහාකුසල මහා ක්‍රියා ජවන් සිත් අට අතුරෙන් එක් ජවනයක් පරිකර්ම- උපචාර- අනුලෝම ගොත්‍රභූ නමින් සතර වරක් හෝ තෙවරක්ම හෝ අනුපිළිවෙලින් ඉපිද නිරුද්ධ වූ පසු ඉන් අනතුරුවම සතර වැනිව හෝ පස්වැනිව මහග්ගත ලෝකෝත්තර ජවන් සිත් සවිස්ස අතුරෙන් යමක් අධිෂ්ඨාන කළ පරිද්දෙන් අර්පණා වීථියට බැසගන්නේය. ඉන් පසු අර්පණා අවසානයේ දීම භවංග පතිත වන්නේය.

21 අර්පණා වීථියයෙහි කුසල් වූද ක්‍රියා වූද සෝමනස්ස සහගත පරිකර්ම උපචාර අනුලෝම ගෝත්‍රභූ ජවන් සිතට අනතුරුව මහග්ගත වූද ලෝකෝත්තර වූද සෝමනස්ස අර්පණාවෝම ලැබෙන්නාහ. උපේක්ෂා සහගත ජවයන්ට අනතුරුව උපේක්ෂා සහගත අර්පණාවෝම ලැබන්නාහ. එහිදීද කුසල ජවයන්ට අනතුරුව කුසල අර්පණාවෝද රහත් ඵලය හැර යට ඵලසමාපත්ති අර්පණා තුනද ලැබෙන්නාහ. එසේම ක්‍රියා ජවනයන්ට අනතුරුව ක්‍රියා අර්පණාවෝද රහත් පලසමවතද ලැබෙන්නාහ.

22. **ද්වාත්තිංස සුඛ පුඤ්ඤම්හා - ද්වාදසෝපෙක්ඛකා පරං**
**සුඛිත ක්‍රියාතෝ අට්ඨ - ජසම්භොන්ති උපෙක්ඛකා**

**පුථුජ්ජනාන සෙක්ඛානං - කාම පුඤ්ඤ තිහේතුකෝ**
**තිහේතු කාම ක්‍රියතෝ - වීතරාගාන මප්පනා**

සෝමනස්ස සහගත ඥානසම්ප්‍රයුක්ත කුසල ජවන් සිත් දෙකට අනතුරුව සෝමනස්ස අර්පණා ජවන් දෙතිසක්ද, උපෙක්ඛා සහගත ඤාණසම්ප්‍රයුක්ත කුසල ජවන් සිත් දෙකට අනතුරුව උපෙක්ෂා අර්පණා ජවන් දොළසක්ද, සෝමනස්ස සහගත ඤාණ සම්ප්‍රයුක්ත ක්‍රියා ජවන් සිත් දෙකට අනතුරුව සෝමනස්ස සහගත අර්පණා ජවන් අටක් ද උපෙක්ඛා සහගත ඤාන සම්ප්‍රයුක්ත ක්‍රියා ජවන් සිත් දෙකට අනතුරුව උපෙක්ඛා සහගත අර්පනා සයක්ද ලැබෙන්නාහ.

ශෛක්ෂයන්ට සහ පෘථග්ජනයන්ට ද ත්‍රිහේතුක කාමාවචර කුශල ජවන් සතරෙන් අනතුරුවද ක්ෂීණාශ්‍රවයන්ට ත්‍රිහේතුක කාම ක්‍රියා ජවන් සතරට අනතුරුව ද අර්පණා ලැබෙන්නාහ.

23. සෝමනස්ස අර්පණා දෙතිස කවරේද යත්, රහත් පල සිත හැර ලෝකෝත්තර ප්‍රථම ධ්‍යාන අර්පණා සතද ද්විතිය ධ්‍යාන අර්පණා සතද තෘතිය ධ්‍යාන, අර්පණා සතද චතුර්ථ ධ්‍යාන අර්පණා සතද - රූපාවචර පඤ්චමධ්‍යානය හැර කුශල අර්පණා ධ්‍යාන සතරද යන අර්පණා දෙතිස වන්නාහ. උපෙක්ෂා අර්පණා දොළස නම් කවරේද යත්, රහත් පල සිත හැර පඤ්චම ධ්‍යාන සම්ප්‍රයුක්ත වූ ලෝකෝත්තර අර්පණා සත් දෙන ද රූපාවචර පඤ්ම ධ්‍යාන කුශල අර්පණාවද අරූපාවචර කුශල අර්පණා සතර දැයි දෙළොස් දෙන වන්නාහ.

24. සෝමනස්ස ක්‍රියා ජවයන්යෙන් අනතුරුව ලැබෙන්නාවූ අර්පණ අටදෙන නම් කවරේද යත්. ප්‍රථම ධ්‍යාන- ද්විතිය ධ්‍යාන- තෘතිය ධ්‍යාන චතුර්ථ ධ්‍යාන සම්ප්‍රයුක්ත රහත් පල සමවත් අර්පණා සතර ද රූපාවචර සෝමනස්ස සහගත ක්‍රියා අර්පණා සතරදයන අර්පණ අට දෙන නම් වන්නාහ. උපෙක්ෂා සහගත ක්‍රියා ජවනයෙන් අනතුරුව ලැබෙන්නාවූ අර්පණා සය දෙන නම් කවරේද යත්, පඤ්චම ධ්‍යාන සම්ප්‍රයුක්ත රහත් පල සමවත් අර්පණාවද, රූපාවචර පඤ්මධ්‍යාන ක්‍රියා අර්පණාවද අරූපාවචර ක්‍රියා අර්පණා සතරද යන අපර්ණා සදෙන නම් වන්නාහ.

මේ වනාහි මනෝද්වාරික විථිචිත්ත ප්‍රවෘත්ති ක්‍රමයයි.

25. සියලු චිත්ත විථියන්හිදී අරමුණ අනිටු වී නම් අකුසල විපාක වූම පඤ්චවිඤ්ඤාණ- සම්පටිච්ඡන- සන්තීරණ තදරම්මණ සිත් ලැබෙන්නාහ. ඉටු අරමුනක් වී නම් කුසල විපාක වූම එම සිත් ලැබෙන්නාහ. අතිශයින්ම ඉටු අරමුනේදී වනාහි සෝමනස්ස සහගත වූම සන්තීරණ තදරම්මණ සිත් ලැබෙන්නාහ.

26. තවද සෝමනස්ස සහගත කාමාවචර ක්‍රියා ජවනයන්ට අනතුරුව සෝමනස්ස සහගත වූම තදරම්මණ සිත් ලැබෙන්නාහ. උපෙක්ෂා සහගත ක්‍රියා ජවනාවසානයේදී උපෙක්ඛා සහගත වූ තදරම්මන සිත් ලැබෙන්නාහ.

27. දෝමනස්ස සහගත ජවනයකට අනතුරුව වනාහි තදරම්මණ ද භවංග ද උපෙක්ෂා සහගතම වන්නාහ. එහෙයින් සෝමනස්ස සහගත පටිසන්ධි - භවංග ඇත්තකුට දෝමනස්ස සහගත ජවනයකට අනතුරුව සෝමනස්ස සහගත තදරම්මණ- භවංග පහළ නොවන්නාහ. එතැන දී යම්කිසි පළපුරුදු කාමාවචර අරමුණක් ගෙන උපෙක්සා සහගත සන්තීරණය සිත එක් වරක් උපදින්නේය. ඉන් අනතුරුව සෝමනස්ස සහගත භවංගයට පතිත වන්නේය. එය උපෙක්ෂා සන්තීරණ චිත්තය ආගන්තුක භවංගය නමින් හැඳීන්වෙන්නේය.

28. **කාමේ ජවන සත්තා - ලම්බනානං නියමේ සති**
**විභූතේති මහන්තෙ ච - තදරම්මණ මීරිතං**

කාමාවචර භූමියෙහි කාමාවචර සත්ත්වයන්ට කාමාවචර අරමුණෙහිදීම කාමාවචර ජවනයන් හටම අනතුරුව තදරම්මණ ලැබෙන්නාහ.

මේ වනාහි තදරම්මණ නියමයයි.

29. ජවන් චිත්ත වීථි අතුරෙන් වනාහි කාමාවචර ජවන් සිත් සත බැගින් ලැබෙන්නාහ. අධි මූර්ජා අවස්ථාවන්හිදී සයවරක් ද ජවන් සිත් ලැබෙන්නාහ. මරණාසන්නයේදී වනාහි හෘදය වස්තුව දුර්වල බැවින් ජවන් සිත් පහක් පමණක් ලැබෙන්නාහ. භාග්‍යවතුන් වහන්සේගේ යමාමහා පෙළහැර පෑම වැනි අවස්ථාවන්හිදී ඉතාමත් ශීඝ්‍රයෙන් සිත් වැඩ කරන බැවින් ප්‍රත්‍යවේක්ෂා ජවන වාර සතරක් හෝ පහක් ලැබෙන්නාහ.

30. ධ්‍යාන භාවනා වඩන ආදිකාර්මික යෝගීන්ගේ පළමුවැනි අර්පණා ජවනය ද, අභිඥා ජවනයෝද එක් වරක්ම පහළ වී ඉන් අනතුරුව භවංග පතිත වන්නේය. මාර්ග චිත්ත වීථියෙහිදී වනාහි සතර මාර්ග චිත්තයම එක් වර බැගින් පහළ වන්නාහ. ඉන් අනතුරුව ඵලසිත් දෙක තුනක් සුදුසු පරිදි ලැබෙන්නාහ. ඉන් පසු භවංග පතිත වන්නේය.

31. නිරෝධ සමාපත්ති කාලයේදී නේවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යාන චිත්තය දෙවරක් පහළ වී ඉන් අනතුරුව චිත්තසන්තතිය නිරුද්ධ වන්නේය. නිරෝධ සමාපත්තියෙන් නැගී සිටින කල්හි ද අනාගාමීන්හට අනාගාමි ඵල සිතද රහතුන් වහන්සේලාට රහත් පල සිතද එක්වරක්ම පහළ වී ඉන් අනතුරුව භවංග පතිත වන්නේය. සියලු සමාපත්ති වීථීන්හිදී වනාහි චිත්තවාර නියමයක් නොමැතිව අධිෂ්ඨාන කරන ලද කාලපරිච්ඡේදය තුල බොහෝ වාරයක් අර්පණා සිත් පෙළ පවත්නේය.

32. **සත්තක්ඛත්තුං පරිත්තානි - මග්ගාභිඤ්ඤ සකිං මතා**
**අවසේසානි ලබ්භන්ති - ජවනානි බහූනිපි**

කාමාවචර ජවනය සත්වර බැගින් ද මාර්ග ජවන් සිතත් අභිඥා ජවන් සිතක් එක් වර බැගින්ද සමාපත්ති ජවන් සිත බොහෝ වාර බැගින් ද ලැබෙන්නාහ.

මේ වනාහි ජවන නියමයයි.

33. අහේතුක - ද්විහේතුක පුද්ගලයන්ට වනාහි ක්‍රියා ජවනයෝ ද අර්පණා ජවනයෝද නොලැබෙන්නාහ. එසේම ඔහුනට සුගතියෙහිදී ඥාන සම්ප්‍රයුක්ත විපාක සිත්ද නොලැබෙන්නාහ. දුගති අහේතුකයන්හට වනාහි ඥන විප්‍රයුක්ත මහා විපාක සිත්ද නොලැබෙන්නාහ. රහතන් වහන්සේලාට ද කුශල අකුශල ජවන් සිත් නොලැබෙන්නාහ.

34. ශෛක්ෂයන්ට සහ පෘතග්ජනයන්හට එසේම ක්‍රියා ජවනයෝ නොලැබෙන්නාහ. ශෛක්ෂයන්හට දිට්ඨිගත සම්ප්‍රයුත්ත ජවන්ද විචිකිච්චා ජවන්ද නොලැබෙන්නාහ. අනාගාමීන්හට පටිඝ ජවනයෝද නොලැබෙන්නාහ. ලෝකෝත්තර ජවන යෝ වනාහි ආර්යයන්හටම ලැබෙන්නාහ.

35. **අසෙක්ඛානං චතු චත්තා - ලීස සෙක්ඛාන මුද්දිසේ**
**ඡප්පඤ්ඤාසාව සේසානං - චතු පඤ්ඤාය සම්භවා**

රහතන් වහන්සේලාට සිත් සිවු සාලිසක්ද ශෛක්ෂයන්හට සපණසක්ද, පෘථග්ජනයන්වහට සිවු පණසක් ද ලැබෙන්නාහ.

36. රහතුන් වහන්සේලට ලැබෙන සිත් සිවුසාලිස නම් කවරේද යත්, රහත් පල සිත ද, ක්‍රියා ජවන් සිත් දහ අටද මහාවිපාක සිත් අට ද ඉතිරි අහේතුක සිත් දහහතද යන සිවුසාලිස් චිත්තය රහතන් වහන්සේලාට ලැබෙන්නාහ. ශෛක්ෂයන්හට ලැබෙන සපණස් චිත්තය

නම් කවරේද යත්, රහත් පල සිත හැර ලෝකෝත්තර සිත් ද ලෞකික කුසල් සිත් දහතද, මහා විපාක සිත් අටද, හසිතෝත්පාදය හැරඅහේතුක සිත් දහතද, දිට්ඨි ගත සම්ප්‍රයුක්ත අකුසල් සිත් සතරත් විකිච්චා සහගත සිතත් හැර ඉතිරි අකුසල් සිත් සතද, යන සපණස් චිත්තය ශෛක්ෂයන්හට ලැබෙන්නාහ. පෘථුග්ජනයන්හට ලැබෙන සිවු පණස් චිත්තය නම් කවරේද යත්, ලෞකික කුසල් සිත් දහතද, අකුසල් සිත් දොළස මහාවිපාක සිත් අටද, හසිතෝත්පාදය හැර අහේතුක සිත් දහතද යන සිවුපණස් චිත්තය පෘථග්ජනයන්හට ලැබෙන්නාහ.

මේ වනාහි මෙහි පුද්ගල භේදයයි.

37. කාමාවචර භූමියෙහි වනාහි මේ සියලුම වීථි චිත්තයෝ සුදුසු පරිදි ලැබෙන්නාහ. රූපාවචර භූමියෙහි පටිසජවන් දෙකද තදරම්මණ ද හැර සෙසු වීථි සිත් ලැබෙන්නාහ. අරූපාවචර භූමියෙහිද සෝවාන් මාර්ග චිත්තයද, හසිතෝත්පාද සිතද, රූපාවචර සිත් පසළොසද යට යට අරූපාවචර සිත්ද හැර ඉතිරි විථි සිත් ලැබෙන්නාහ. සියලු තැන්හිද ඒ ඒ ප්‍රසාද නැත්තවුන් හට ඒ ඒ ද්වාරික වීථි චිත්තයෝ නොලැබෙන්නාහුමය. අසඤ්ඤ සත්වයෙහි වනාහි කිසි අයුරෙකින් වීථි සිත් පැවැත්මක් නැත්තේමය.

38. **අසීති වීථි චිත්තානි - කාමේ රූපේ යතාරහං**
**චතු සට්ඨි තථා රූප්පේ - ද්වේ චත්තාලීස ලබ්භරේ**

කාම භූමියෙහි වීථි සිත් අසූවක්ද, රූප භූමියෙහි සූසැටක්ද, අරූප භූමියෙහි දෙසාලිසක් ද සුදුසු පරිදි ලැබෙන්නාහ. කාම භූමියෙහි වීථි සිත් අසූව නම් කවරේද යත්, මහග්ගත විපාක සිත් නවය හැර ඉතිරි සිත් අසූව ලැබෙන්නාහ. රූප භූමියෙහි වීථි සිත් සූ හැට නම් කවරේද යත්, එම වීථි සිත් අසූවෙන් පටිඝ සිත් දෙකද, මහා විපාක සිත් අටද ඝාන ජිව්හා කාය විඤ්ඤාණ සයද හැර ඉතිරි සූසැට වීථි සිත් රූප භූමියෙහි ලැබෙන්නාහ. අරූප භූමියෙහි වීථි සිත් දෙසාලිස නම් කවරේද යත්, සෝවාන් මාර්ගය හැර ලෝකෝත්තර සිත් සතද, අරූපාවචර කුසල- ක්‍රියා සිත් අටද, කාමාවචර මහා කුසල මහාක්‍රියා සිත් දහසයද, පටිඝ සිත් හැර අකුසල් සිත් දහයද මනෝද්වාරා වර්ජනය ද යන දෙසාළිස් වීථි චිත්තයෝ අරූප භූමියෙහි ලැබෙන්නාහ.

මේ වනාහි මෙහි භූමි විභාගයයි.

මෙසේ මේ සදෙරෙහි ලැබෙන පරිදි වීථි සිත් පැවැත්ම භවංගයෙන් අතර තුර ජීවිතාන්තය තෙක් නොසිඳී පවතින්නේය.

**ත්‍රිලක්ෂණ විදර්ශනාව**

1. අභිධර්ම භාවනාවේදී පහළ වූ චිත්ත චෛතසික භූතරූප උපාදරූප යන මේ රූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්මයෝ ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝය.

2. ඇතිවීම නැතිවීම දෙකින් නිරන්තරයෙන් පිඩා වින්ද බැවින් දුක්ඛයෝය

3. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝය

4. අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම චිත්ත චෛතසික භූත රූප උපාදරූප යන මේ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන සංඛත සන්තාප විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේය.

5. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නාවූ පූර්ව භව තෘෂ්ණාව ආයුහණ නිදාන සංයෝග පළිබෝධාර්ථයෙක් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේය.

6. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ විවේක අසංඛත අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේය.

7. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතුවූ ආර්ය අෂ්ටාංගික මාර්ගය නියාාන හේතු දස්සන ආධිපතෙයාාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේය.

8. මාගේ භාවනා මය කුසලානිංස ධර්මය, මෙම චතුරාර්ය සත්‍යය සුව සේ අවබෝධ වීම පිණිසම හේතු වේවා. වාසනා වේවා.

සාධු, සාධු, සාධු

පද විවරණය :

1. ජවන් සිත් : අරමුණු රස ඉහලින්ම විඳගැනීමේ සමත් වූ ද කුසල් අකුසල් බවට පත්වන්නාවූද රහතුන් වහන්සේලාට නම් ක්‍රියා මාත්‍ර බවට පත්වන්නාවූද සිත් පස්පණයට නමකි.

2. අර්පණා : ධ්‍යාන- සමාපත්ති- අභිඥා- සහ මාර්ග ඵල බවට ද පත්වීම අර්පණා නම් වේ.

3. චිත්තවීථි : පටිසන්ධි සිතෙන් පසු දිගට පවතින භවංග සිත් අතරේදී සදොරට ලැබෙන අරමුණත් ගෙන චිත්ත නියාමයට අනුව පවතින සිත් පෙළ චිත්තවීථි නම් වේ.

4. ආදිකාර්මික : පළමුවෙන්ම සමථ භාවනා වඩන්නට ඉදිරිපත්වූ යෝගාවචරයාට නමකි.

5. ශෛක්ෂ : සෝවාන් මාර්ගස්ථයාද සමග අරහත් මාර්ගස්ථයා තෙක් ආර්යයන් සත් දෙනා ත්‍රිශික්ෂාවෙහි හික්මෙමින් සිටින බැවින් ශෛක්ෂ නම් වේ. රහතුන් වහන්සේ වනාහි නිමවූ ශික්ෂා ඇති බැවින් අශෛක්ෂ නම් වන්නාහ.

6. නිරෝධ සමාපත්තිය : අෂ්ට සමාපත්ති ලාභි අනාගාමීන්ට සහ එවැනිම රහතන් වහන්සේලාට පමණක් ලැබෙන්නාවූ, චිත්ත චෛතසික සහ චිත්තජ රූප සියල්ලද කැමති තාක් කාලයක් තුල නිරුද්ධ කොට පැවතිය හැකි වූ සමාපත්තිය නිරෝධ සමාපත්තිය නම් වන්නේය.

7. සමාපත්ති : ධ්‍යාන ලාභීන්ගේ ධ්‍යාන සමාපත්තිය ද, මාර්ග ඵල අධිගම ලාභීන්ගේ ඵල සමාපත්තියද, අෂ්ට සමාපත්ති ලාභී අනාගාමී- රහතුන් වහන්සේගේ නිරෝධ සමාපත්ති යයි සමාපත්ති තුනක් ඇත්තාහ.

අභිධර්ම පත්‍රිකා අංක 5 වෙසෙක් පෝය නිමිතිකරගෙන අප්‍රියෙල් මස 25 වෙන දින උපන් (7 වෙනි උපන් දිනය) ශකලා පියුමි පෙරේරා චූටි දියණියන්ට නිදුක් නිරෝගී සුවපත් භාවය හා දීර්ඝායු ශ්‍රී සම්පත් පතා දෙමාපියන් වන මහරගම පමුණුව පාරේ අංක 109/24 නිවසෙහි පදිංචි නිමල් රනරාජා පෙරේරා සහ චාන්දනි පෙරේරා විසින් ධර්ම දානය පිණිස.


**රාජ්‍ය සේවා බෞද්ධ සංගමය**
**සංස්කෘතික අමාත්‍යාංශය,**
සෙත්සිරිපාය, බත්තරමුල්ල.
2542 බක් /1999 අප්‍රියෙල්

නුගේගොඩ ගංගොඩවිල 37, සෝරත මාවතේ පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස්හි
මුද්‍රණය කරවා ධර්ම දානය පිණිස නිකුත් කරන ලදි.

## අභිධර්ම භාවනා පාඩම 06

## අති පූජ්‍ය නා උයනේ අරිය ධම්ම නාහිමිපාණන් වහන්සේ විසින්

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!

1. චක්ෂුද්වාරයෙහි චිත්ත වීථිය පසළොස් වැදෑරුම් වන්නේය. ඒ කෙසේ වේද යත්, අතිමහත්තාරම්මණ චිත්තවීථි එකක්ද, මහත්තාරම්මණ චිත්තවීථි දෙකක් ද, පරිත්තාරම්මණ චිත්ත වීථි සයක් ද, අතිපරිත්තාරම්මණ චිත්ත විථි සයක් දැයි මෙසේ පසළොස් වැදෑරුම් වන්නේය.

2. ඔවුනතුරෙන් අතිමහත්තාරම්මණ චිත්ත විථියෙහි විථි සිත් සතක් ද, චිත්තෝත්පාද තුදුසක්ද චක්ෂුද්වාරික වීථි සිත් සසාලිස් ද වන්නාහ. අතිමහත්තාරම්මණ, චිත්තවීථි යෙහි වීථි සිත් සත නම් කවරේද යත්, පඤ්චද්වාරාවර්ජනය ද, චක්ඛුවිඤ්ඤාණයද, සම්පටිච්ජනය ද සන්තීරණය ද වොත්ථපනය ද, ජවනයද, තදරම්මණය දැයි වීථිසිත් සත්දෙන නම් වන්නාහ.

3. චිත්තෝත්පාද තුදුස්දෙන නම් කවරේද යත්, පඤ්චද්වාරාවර්ජනයද. චක්ෂුවිඥනය ද, සම්පටිච්ජනය ද, සන්තිරණ යද, වොත්ථපනය ද, ජවන් සිත් සතද, තදරම්මණ සිත් දෙකදැයි මෙසේ අතිමහත්තාරම්මණ චක්ෂු විඥන චිත්ත වීථියෙහි චිත්තෝත්පාද තුදුසක් වන්නාහ.

4. චක්ෂු ද්වාරික වීථි චිත්තයෝ සසාලිස් වැදෑරුම් වන්නාහු කෙසේද යත් අකුසල් සිත් දොළසද, සොතවිඤ්ඤාණ දෙසිත, ඝාන විඤ්ඤාණ දෙසිත, ජිව්හා විඤ්ඤාණ දෙසිත කාය විඤ්ඤාණ දෙසිත යන සිත් අට දෙනා හැර ඉතිරි අහේතුක සිත් දශදෙනාද, කාමසෝභන සිත් සූවිසි දෙනද යන සසාලිස් දෙන චක්ෂුද්වාරික වීථි චිත්තයෝ නම් වන්නාහ. සෝත- ඝාන- –ජිව්හා - කාය ද්වාරික චිත්තයෝ ද මෙසේම සසාලිස් වැදෑරුම් වන්නාහ.

5. පඤ්චද්වාරික චිත්ත වීථි සියල්ල පන්සැත්තෑ වැදෑරුම් වන්නේ ය. ඒ කෙසේද යත් පඤ්චද්වාරයෙහිම අතිමහත්තාරම්ණ චිත්ත විථි පසක් ද, මහත්තාරම්මණ චිත්ත විථි දසයක් ද, පරිත්තාරම්මණ චිත්ත විථි සමතිසක්ද, අතිපරිත්තාරම්මණ චිත්ත වීථි සමතිසක් දැයි මෙසේ පඤ්චද්වාරික චිත්ත වීථි සියල්ල පන්සැත්තෑ වැදෑරුම් වන්නේ ය.

6. ඔවුනතුරෙන් චක්ෂුද්වාරික අතිමහත්තාරම්මණ චිත්ත වීථියේදී චක්ෂු ද්වාරයට ආපාත ගත වූ රූපාරම්මණය ඉපදි චිත්තක්ෂණ එකක් ගතවී ඉදිරියට චිත්තක්ෂණ සොළසකට සමාන ආයුෂ ඇත්තේ ය. අතිත භවංගය - භවංග චලනය- භවංගුපච්ඡේදය යන සිත් තුනකට අනතුරුව කවර නම් ද්වාරයකට අරමුණ හමුවීදැයි විමසීම් වශයෙන් පඤ්චද්වාරාවර්ජන සිත පහළ වන්නේ ය. එය වනාහි ක්‍රියාහේතුක මනෝධාතුව නම් වන්නේය.

7. ඉන් අනතුරුව එම රූපාරම්මණය දකින්නාවූ චක්ඛු විඤ්ඤාණ සිත පහළ වන්නේය, උපේක්ෂා සහගත වූ එම චක්ඛුවිඤ්ඤාණය වනාහි රූප අරමුණු ඉෂ්ඨාරම්මණයක් වී නම් කුසල විපාක අහේතුක චක්ඛු විඤ්ඤාණයක් වන්නේය, රූප අරමුණ අනිෂ්ඨාරම්මණයක් වූයේ වීනම් අකුශල විපාක උපේක්ෂා සහගත චක්ඛුවිඤ්ඤාණයක් වන්නේය.

8. චක්ඛු විඤ්ඤාණයට අනතුරුව එම රූප අරමුණ පිළිගන්නා ආකාරයෙන් සම්පටිච්ඡන සිතද රූප අරමුණ තීරණය කරන ආකාරයෙන් සන්තීරණ සිතද කුශල - අකුශල ක්‍රියා ජවන් තුන් වර්ගය අතුරෙන් සිතේ භාවිත පුරුද්ද අනුව ව්‍යවස්ථාපනය කරන වොත්ථපන

නම් වූ ක්‍රියාහේතුක මනෝ විඤ්ඤාණ ධාතුවද ඉන් අනතුරුව කාමාවචර ජවන් විසිනවය අතුරෙන් වොත්ථපන සිතෙන් නියම කරන ලද පරිදි ජවන් සිතක් සත් වරක්ද ඉන් පසු එම රූප අරමුණම ගෙන එකොළොස් තදරම්මණ විපාකයන් අතුරෙන් එක් සිතක් දෙවරක්ද පහළ වී නිරුද්ධ වන්නේය. නැවත චිත්ත වීථියක් පහළ වන තුරු භවංග ප්‍රවාහයම පවත්නේය.

9. රූප අරමුණ ඉෂ්ඨාරම්මණයක් වූයේ වී නම් සම්පටිච්ඡන සන්තීරණ තදරම්මණයෝ කුශල විපාක චිත්තයෝම වන්නාහ. අති ඉෂ්ඨාරම්මණයන් වී නම් සන්තීරණ තදරම්මණ දෙක සෝමනස්ස සහගතම වන්නාහ. ඉෂ්ඨ මධ්‍යස්ථ අරමුණක් වී නම් උපේක්ෂා සහගත වූම සන්තීරණ තදරම්මණ විපාක සිත් පහළ වන්නාහ

10. රූපාරම්මණය දකින්නාවූ චක්ඛුවිඤ්ඤාණ සිත චක්ඛු ප්‍රසාදයෙහිම උපදින්නේය. ඉතිරි විථි සිත් (13) තෙලෙස් දෙන වනාහි හෘදය වස්තුවෙහිම උපදින්නාහ. චිත්තක්ෂණ සතලොසකට ආයු ඇති රූපාරම්මණය උපදින අතීත භවංග චිත්තක්ෂණයේදීම පෙරපසු නොවී එක වර උපන් මධ්‍යමායුෂ්ක චක්ෂු ප්‍රසාදය ඇති විටම අතිමහන්තාරම්මණ නම් වූ තදරම්මණ වාර චිත්ත විථිය ලැබෙන්නේය.

11 මකුළු නූලේ උපමාවෙන් ද අතිමහන්තාරම්මණ චිත්ත වීථිය තේරුම් ගත යුත්තේය, පන්ථ මකුළුවෙක් පස් දිසාවට නූල් ඇද මකුළු දැලක් ගොතා ඒ මැදට වී නිද සිටියේය. ඉගිලෙන කුඩා සමනළයකු එක් දිශාවක මකුළු නූලෙහි බැඳී දැල සැලුන විට නූලදීගේ මකුළුවා පැමිණ සමනළයාගේ හිස විද යුෂ උරා බී නැවතත් දැල මැදට වී නිද ගත්තේය. අනෙකුත් දිශාවෙහි නූලක සතකු පැටලීමෙහිදී ද මෙසේම සිදුවන්නේ ය.

12. පස් දිශාවට විහිදී ගිය මකුළු නූල් පහ මෙන් පඤ්චප්‍රසාදය දත යුත්තේ ය. මකුළු දැල මැද නිදන්නාවූ මකුළුවා මෙන් චිත්ත සන්තානය දත යුත්තේ ය. ප්‍රාණියකු මකුළු නූලේ පැටලුන කාලය මෙන් ප්‍රසාද වස්තුවට අරමුණ හැපීම දත යුත්තේ ය. මැද නිදන මකුළුවාගේ චලනය මෙන් ප්‍රසාදයෙහි හැපුන අරමුණ ගෙන පඤ්චද්වාරාවර්ජන චිත්තය පහළ වීමෙන් සිත භවංගයෙන් නැගිටීම දත යුත්තේය. නූලදීගේ මකුළුවාගේ ගමන මෙන් වීථි සිත් පෙළ දත යුත්තේය, ප්‍රාණියාගේ හිසට විද යුෂ බීම මෙන් ජවන් සිත් පැවැත්ම දත යුත්තේ ය. නැවතත් මකුළුවාගේ නිදගැනීම මෙන් හෘදය වස්තුවට වී භවාංග සිත් පැවැත්ම දත යුත්තේය. මෙයින් වනාහි අරමුණක් ප්‍රසාදයෙක ගැටෙන විට දෙපස්විඤ්ඤාණයට පළමුව හෘදය වස්තුව ඇසුරුකරගත් සිතක් පහළ වන බව දත යුත්තේ ය. එක එක අරමුණක් දෙරටු දෙකකට ආපාත ගත වන බවද දත යුත්තේය.

13. දෝවාරිකෝපමාවෙන් ද චක්ෂුද්වාරික ජවන චිත්ත වීථිය දත යුත්තේ ය. එක්තරා රජ කෙනෙක් නිද සිටියි. අතවැසියෙක් රජුගේ පා මිරිකමින් සිටියි. බිහිරි දෙරටු පාලකයෙක් දෙරටුව ළඟ සිටියි. පුද පඬුරු පිළිගැනීමට තිදෙනෙක් පේළියට සිටිති. එක්තරා ගම් වැසියෙක් මිහිරි පළතුරක් වැනි තුටු පඬුරක් රැගෙන විත් දෙරට තට්ටු කෙළේය. දෙරටු පාලයාට නො ඇසුනේ ය. පා පිරිමදින අතවැසියාට ඇසී දෙර ඇර බැලීය. තුටු පඬුරු පිළිගන්නා වූ පළමුවැනියා තුටු පඬුරු අතින් ගෙන දෙවැන්නාටද දෙවැන්නා තුන් වැන්නාටද තුන්වැන්නා රජුට ද දුන්නේය. රජතුමා මියුරු රස වළඳ නැවතත් නිද ගත්තේ ය.

14. මේ උපමාවෙහි රජුමෙන් ජවනයද, පා පිරිමදින අතවැසියා ආවර්ජනාවද, බිහිරි දෙරටුපාලයා මෙන් චක්ඛු විඤ්ඤාණය ද, පඬුරු පිළිගන්නා වූ තිදෙනා මෙන් සම්පටිච්ඡන - සන්තීරණ වොත්ථපන සිත් තුන ද, ගම්වැසියෙකු තුටු පඬුරක් ගෙන දෙරට තට්ටු කිරීමක්

මෙන් අරමුණක් ප්‍රසාදයෙහි ගැටීම ද, පා පිරිමදින අතවැසියා සංඥක් දීම මෙන් ආවර්ජනා සිතින් භවංගය අවදි කිරීම ද, එම සංඥවෙන් බිහිරි දෙරටු පාලකයා දෙර ඇරීම මෙන් චක්ඛු විඤ්ඤණයෙන් රූපය දැකීමද, පඬුරු පිළිගන්නා වූ පළමුවැන්නා සේ සම්පටිච්ඡන සිතින් අරමුණ පිළිගැනීමද, දෙවැන්නාට භාරදීම මෙන් සන්තීරණ සිතින් අරමුණ තීරණය කිරීමද, දෙවැන්නා තුන්වැන්නාට භාරදීම මෙන් වොත්ථපන සිතින් අරමුණ ව්‍යවස්ථාපනය කිරීම ද, තුන් වැන්නා රජතුමාට භාරදීම මෙන් ජවනයට යොමු කිරීමද රජතුමා එය පරිභෝග කිරීම මෙන් ජවන් සිත අරමුණු රස විඳීමද, දත යුත්තේය.

15. මේ දෞවාරිකෝපමාවෙන් වනාහි ආරම්මණයාගේ කෘත්‍යය දෙරටුවෙහි හැපීම පමණකැයි ද, ආවර්ජන සිත භවංගයෙන් නැගිටීම පමණකැයි ද, චක්ඛු විඤ්ඤණ ආදී සිත් සතර දෙනා දැකීම - පිළිගැනීම - තීරණය කිරීම - ව්‍යවස්ථාපනය කිරීමත් පමණකැයි ද, ඒකාන්තයෙන් අරමුණේ රසය විඳිනුයේ ජවනය පමණකැයි ද, මේ බව දක්වන ලද්දේ වෙයි.

16. ග්‍රාම දරක උපමාවෙන්ද මේ චිත්ත විථිය දත යුත්තේ ය. කුඩා ගම්දරු පිරිසක් කුඩා විථියක ක්‍රීඩාකරමින් සිටිති. එක දරුවකුගේ අතට රන් කහවණුවක් හැපුණි. මා අතේ හැපුනේ කුමක්දැයි කීය. එය දිලිසෙන දෙයකැයි එකෙක් කීය. තව කෙනෙක් වැලිත් සමඟ එය තදින් අතට ගත්තේ ය. අනෙකෙක් එය පළල් එකක් යයිද හතරැස් එකක් යයි ද කීය. මෙය රන් පවුමකැයි අනෙකෙක් කීය. එය ගෙදරට ගෙනත් මවුතුමියට දුන්නේ ය. මවු තුමිය එයින් වැඩ ගත්තා ය.

17. මේ උපමාවෙහි කුඩා ගම් දරුවන් කුඩා වීථියක සෙල්ලමින් ගත කිරීම මෙන් භවංග පැවැත්මද, රන් පවුම අතේ හැපීම මෙන් අරමුණ ප්‍රසාදයෙහි හැපීමද, මේ මොකක්දැයි කීම මෙන් ආවර්ජන සිතින් භවංගය අවදි කිරීමද, මෙය දිළිසෙනවායයි කීම මෙන් චක්ඛු විඤ්ඤණයෙන් දැකීමද, වැලිත් පසුත් සමඟතදින් ගැනීම මෙන් සම්පටිච්ඡන සිත ද, පළලයි - හතරැස් යයි කීම මෙන් සන්තීරණ සිතින් තීරණය කිරීමද එක් රන් පවුමකැයි කීම මෙන් වොත්ථපන සිතින් ව්‍යවස්ථාපන කිරීමද මවුතුමිය විසින් රන් පවුම වැඩක් සඳහා යෙදීම මෙන් ජනවය විසින් අරමුණු රස විඳීමද, දත යුත්තේ ය.

18. මේ උපමාවෙන් වනාහි ආවර්ජන චිත්තය අරමුණ නොදැකම භවංගය අවදි කිරීම පමණකැයි ද, සම්පටිච්ඡනයත් අරමුණ නොදැකම පිළිගනී යයි ද, සන්තීරණයත් නොදැකම අරමුණ තීරණය කෙරේයයිද, වොත්ථපනය නොදැකම ව්‍යවස්ථාපනය කෙරේයයිද, ජවනයත් එය නොදැකම අරමුණ රස විඳින්නේ යයි ද, නියත වශයෙන් චක්ඛු විඤ්ඤණයම අරමුණ දැකීමට සමත් වන්නේ යයි ද දැක්වෙන්නේ ය.

19. අඹ උපමාවෙන්ද මේ චිත්ත විථිය තේරුම් ගත යුත්තේය. ඉදුනු ගෙඩි සහිත එක් අඹගසක් යට අඹ කැමේ ආශාවෙන් පුදගලයෙක් වැතිරී නිදගෙන සිටියේය. ඉදුනු අඹ ඵලයක් ඔහුගේ කණ ලගින්ම 'ටං' යන හඬින් නටුවෙන් ගිලිහි වැටුනේය. ඒ ශබ්දයෙන් අවදි වූ ඔහු ඇස ඇර බලා අත දිගු කොට අඹගෙඩිය ගෙන අතින් තද කොට සුවඳ සිඹ බලා පරිභෝග කළේය.

20. ඒ පුද්ගලයා අඹගස මුල නිද සිටි කාලය මෙන් භවංග සිත ද; අඹගෙඩිය නටුවෙන් ගැලවී කණ ළගින්ම බිම වැටීම මෙන් රූප අරමුණ චක්ෂු ප්‍රසාදයෙහි ගැටීම ද, ඒ හඬින් අවදි වීම මෙන් ආවර්ජනයෙන් භවංග සිත අවදිවීම ද, ඇහ ඇර බැලීම මෙන් චක්ඛු විඤ්ඤණයෙන් රූප අරමුණ දැකීම ද, අත දිගුකොට ගැනීම මෙන් සම්පටිච්ඡනය සිතින් ගැනීම ද, අතින් මැඩ බැලීම මෙන් සන්තීරණ සිතින් තීරණය කිරීම ද, සුවඳ සිඹ ඉදුනු

බව දැනගැනීම මෙන් වොත්ථපන සිතින් ව්‍යවස්ථාපන කිරීම ද, අඹ ගෙඩිය පරිභෝග කිරීම මෙන් ජවනය විසින් අරමුණු රස විඳගැනීම ද දත යුතු වේ.

21. මේ අඹ උපමාවෙන් වනාහි රූප අරමුණේ කෘත්‍යය ප්‍රසාදයෙහි හැපීම් පමණකැයි ද, අවර්ජනා සිතේ කෘත්‍යය භවංග සිත අවදි කිරීම් මාත්‍රයයි ද, චක්ඛු විඤ්ඤාණයේ කෘත්‍යය දැකීම් මාත්‍රයයි ද, සම්පටිච්ඡන සිතේ කෘත්‍යය පිළිගැනීම් මාත්‍රයමැයි ද සන්තීරණ සිතේ කෘත්‍යය අරමුණ තීරණය කිරීම් මාත්‍රයමැයි ද, වොත්ථපන සිතේ කෘත්‍යය අරමුණ ව්‍යවස්ථාපන මාත්‍රයයි ද, ඒකාන්තයෙන් නියත වශයෙන් ජවනය ම අරමුණු රස විඳින්නේ යයි දත යුතු වන්නේය.

22. චිත්ත වීථියකදී වනාහි, ඔබ භවංග කෘත්‍යය කරව, ඔබ ආවර්ජනා කරව, ඔබ දැකීම කරව, ඔබ සම්පටිච්ඡනය කෘත්‍යය කරව, ඔබ සන්තීරණ කෘත්‍යය කරව, ඔබ ව්‍යවස්ථාපනය කරව, ඔබ ජවන නම් කෘත්‍යය කරව යයි කරන්නෙක් හෝ කරවන්නෙක් නොමැත්තේමය. ඒ වනාහි චිත්ත නියාමය නම් වන්නේ ය.

23. නියාම ධර්මතා වනාහි පස් වැදෑරුම් වන්නේය. බීජ නියාමය - උතු නියාමය - කර්ම නියාමය - ධර්ම නියාමය - චිත්ත නියාමය යනුවෙනි. බීජ නියාමය නම් කවරේද යත්, කොල්ලු වැලේ අග උතුර බලා යාමත්, දක්ෂිණා වල්ලි වැල දකුණට ගසේ එතීමත්, සූරියකාන්තා මල ඉර දෙසට නැමීමත් පොල් ගෙඩියේ මුදුනෙහි සිදුරක් තිබීමත් යනාදිය වශයෙන් ඒ ඒ බීජයන්ට අනුව ඒ හා සමාන ඵලගෙන දීම වනාහි බීජ නියාමය නම් වන්නේය. උතු නියාමය නම් කවරේද යත්, ඒ ඒ කාලයට ඒ ඒ තුරුලිය ආදියෙහි එක වරට දළු දැමීම කොල වැටීම මල් පිපීම ගෙඩි හටගැනීමාදිය කාලගුණය අනුව සිදුවන බැවින් උතුනියාමය නම් වන්නේය.

24. කර්ම නියාමය නම් කවරේද යත්, අකුශල කර්මයට අනුව අනිෂ්ඨ දුක්ඛ විපාක විඳීම, කුශල කර්මයට අනුව ඉෂ්ඨ කාන්ත මනාප සැප විපාකද, ත්‍රිහේතුක කර්මයෙන් ත්‍රිහේතුක වූද ද්විහේතුක වූද අහේතුක වූද විපාක ගෙනදීම ද, දුහේතුක කර්මය දුහේතුක විපාක ද අහේතුක විපාක ද ගෙන දීමද, ත්‍රිහේතුක විපාකයක් නොදීමද මෙසේ ඒ ඒ කර්මයට අනුරූපවූ විපාක ගෙන දීම වනාහි කර්ම නියාමය නම් වන්නේය.

25. ධර්මය නියාමය නම් කවරේද යත්, මහා බෝධි සත්වයන් වහන්සේලාගේ පශ්චිම භවයෙ හි ප්‍රතිසන්ධිග්‍රහණය උත්පත්තිය - බුද්ධත්වයට පත්වීම - ධම්මචක්ක දේශනය - ආයුසංස්කාර අතහැරීම - පරිනිර්වාණය යන අවස්ථාවන්හිදී මහ පොළොව කම්පාවීම වනාහි ධර්ම නියාමය නම් වන්නේ ය.

26. චිත්ත නියාමය නම් කවරේද යත්, යම්කිසි අරමුණක් ප්‍රසාද වස්තුවෙහි ගැටුණු කල වනාහි නුඹ ආවර්ජනය කරනු, නුඹ දර්ශන කෘත්‍ය කරනු නුඹ පිළිගනු නුඹ තීරණය කරනු නුඹ ව්‍යවස්ථාපන කරනු, නුඹ ජවන කෘත්‍ය කරනු නුඹ තදාරම්මණ කෘත්‍ය කරනු, යනාදි වශයෙන් අණ කරන්නෙක් නැත්තේමය, අණ කරවන්නෙක් හෝ නැත්තේය. තම තමාගේ නියාම ධර්මතාව අනුව, අරමුණ ප්‍රසාද වස්තුවෙහි ගැටුණු විට ආවර්ජන සිත භවංගය අවදි කරන්නේය. චක්ඛුවිඤ්ඤාණය අරමුණ දකින්නේය, සම්පටිච්ඡනය චිත්තය අරමුණ පිළිගන්නේය. සන්තීරණ චිත්තය අරමුණ තීරණය කරන්නේ ය. වොත්ථපන චිත්තය අරමුණ ව්‍යස්ථාපනය කරන්නේ ය. ජවන් සිත අරමුණු රස විඳගන්නේය. තදාරම්මණය එම කෘත්‍ය කරන්නේ ය. මෙසේ කෙනෙකුගේ විධානයෙන් තොරව ධර්ම ස්වභාවයෙන්ම චිත්ත සන්තානය අතරක් නොමැතිව පැවැත්ම වනාහි චිත්ත නියාමය නම් වන්නේ ය.

27. අඳ පිලු උපමාවෙන් ද නාම රූප සම්බන්ධතාවය දත යුත්තේ ය. ඒ කෙසේද යත්, නුවර

දෙර අසළ අන්ධයෙක් හා පිලුවෙක් විසුහ. පිලුවා අන්ධයාට මෙසේ කීය. මිත්‍රය ! ඔබ මෙතැන වේලෙමින් හැසිරෙනුයේ මන්ද අසවල් පෙදෙස බොහෝ ආහාර පාන සුළභය එහි ගොස් සුවෙ ස් ජීවත්වීම වටිනවානේද, අන්ධයා ද කීයේ මෙසේය. මිත්‍රය ! ඔබ මට කියන්නේ මන්ද, ඔබට එහි ගොස් සුවසේ ජීවත්වීම නොවටීද! මිත්‍රය !මට එහි යාමට පාදයක් නැතැයි පිලුවා කීය, මටත් එහි යාමට ඇසක් නැතියි අන්ධයාද කීය. මගේ දෑස ඔබේ දෙපස නිසා අප දෙදෙනා එහි යමුයි පිලුවා කීය.

28. සතුටින් දෙදෙනාම තීරණය පිළිගෙන අන්ධයාගේ කරට පිලුවා නැගගත්තේ ය. ඔහු අන්ධයාගේ කොන්දේ වාඩිවී එක් අතකින් අන්ධයාගේ හිස වට අල්ලා ගෙන අනෙක් අතින් පාර පෙන්වා දෙමින් ගියහ. මෙසේ අන්ධයාගේ දෙපයද පිලුවාගේ දෑසද නිසා දෙදෙනාගේම සහයෝගයෙන් කැමති තැනට ගොස් සුවසේ ජීවත් වූහ.

29. මෙතැනදී ජාත්‍යන්ධයා මෙන් රූපකයද පිලුවා මෙන් නාමකයද පිලුවා නොමැතිව අන්ධයාට යා යුතු දිසා වට යාගත නොහැකි වූවාත් මෙන් නාමයෙන් වෙන්ව රූපකයට කිසිවක් කළ නොහැකි බවද, ජාත්‍යන්ධයාගෙන් වෙන්ව පිලුවාට යා යුතු දිසාවට යා ගත නොහැකි වූවා සේ පඤ්ච වෝකාර භවයෙහි රූපයෙන් වෙන්ව නාමය නොපවත්නා බවද, දෙදෙනාගේම සහයෝගයෙන් කැමති තැනට ගොස් සුවසේ ජීවත්වන කාලය මෙන් නාමරූප එකතුවෙන් කටයුතු සියල්ල සිදුවන්නේ යයි ද මෙයින් දත යුත්තේය.

**ත්‍රිලක්ෂණ විදර්ශනාව**

1. ද්වාරම්මණ වස්තු සංග්‍රහ විභාග භාවනාවේදී පහළ වූ චිත්ත චෛතසික භූතරූප උපාද රූප සංඛ්‍යාත නාම රූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්මයෝ ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝය.

2. ඇතිවීම නැති වීම දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝය.

3. තම තමන් කැමති ලෙස නොපැවතීම බැවින් අනාත්මයෝය.

4. මෙසේ අනිත්‍ය වූ දුක්ඛ අනාත්මක වූ චිත්ත චෛතසික භූතරූප උපාද රූප සංඛ්‍යාත නාම රූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන සංඛත සන්තාප විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේය.

5. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව ආයූහණ නිදාන සංයෝග පළිබෝධාර්තයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේය.

6. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ විවේක අසංඛත අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේය.

7. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතුවූ ආර්ය අෂ්ටාංගික මාර්ගය නියාානික හේතු දස්සන ආධිපත්‍යාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සතත්‍යය නම් වන්නේය.

8. මාගේ භාවනාමය කුශලානිසංස ධර්මය මෙම චතුරාර්ය සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිසම හේතු වේවා වාසනා වේවා

සාධු. සාධු. සාධු.

**ත්‍රිලක්ෂණ භාවනාව :(පළමු පාඩම අනුව පුරවා ගත මැනිවි)**

**පද විවරනය :**

1. පීඨසප්පි - පිලුවා - දෙපය නැති පුද්ගලයෙකි.

2. ජාත්‍යන්ධ - උපතින්ම ඇස් අන්ධ වූවෙකි.

3. නියාම ධර්මතා - කරන්නෙක් හෝ කරවන්නෙකු නොමැතිව හේතු ඵල අනුව සිදුවන ධර්මතාවන් පස දෙනා පස්ව නියාම ධර්මතා නම් වේ.

4. ඉෂ්ඨාරම්මණය : බුද්ධෝත්පාද කාලය - සත්විති රජ කාලය වැනි අවස්ථාවන්හි ශිෂ්ඨ සම්පන්න නැණවත් ලෝ වැසි මධ්‍යම ජනතාව විසින් තීරණය කරනලද 'හොඳයි ශුබයි සැපයි යහපතැයි යනාදිය වශයෙන් සිත සතුටුවන ප්‍රිය බව වඩන අරමුණු ඉෂ්ඨාරම්මණය නම් වන්නේය.

5. අනිෂ්ඨාරම්මණය : ලෝවැසි මැදුම් ජනතාව විසින් තීරනය කරන ලද 'අයහපත් - අසුබ' දේ අනිෂ්ඨාරම්මණ නම් වන්නේය.

1. බ්‍රියට්‍රිස් සුමනවීර හා ඩොරින් සුමනවීර මහත්මාවන් විසින් පරලෝ සැපත් දෙමාපිය ජී. සුමනවීර හා මැගී සුමනවීර යන මහත්ම මහත්මාවන්ට නිවන් සුව පතා

2. රත්නා නානායක්කාර මහත්මිය විසින් තම එකම කුමාරිට තුනුරුවන් පිට්ට හා මියගිය ඥාතීන්ට නිවන් සුව පතා

3. ගීතා රෝහිණී සමරවීර මහත්මිය විසින් මා පියන්ට පිං පිණිස

4. පී. ප්‍රේමතිලක මහත්මිය එච්. ජේ. ප්‍රේමතිලක මහතාට නිවන් සුව පතා

5. චන්ද්‍රිකා කොඩිකාර මහත්මිය වෛද්‍ය ප්‍රැන්සිස් කොඩිකාර මහත්මාට නිවන් සුව පතා

නුගේගොඩ ගංගොඩවිල 37, සෝරත මාවතේ
පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස්හි
මුද්‍රණය කරවා ධම් දනය පිණිස
නිකුත් කරන ලදී.

**රාජ්‍ය සේවා බෞද්ධ සංගමය**
**මහවැලි සංවර්ධන අමාත්‍යාංශය**
**500. ටී. බී. ජයා මාවත.**
**තුන්මුල්ල කොළඹ 10.**
**2452 ඇසළ / 1999 අගෝස්තු 04**

**අභිධර්ම විපස්සනා භාවනා පාඩම අංක - 07**

**අභිධර්මාර්ථ සංග්‍රහ - වීථිකාණ්ඩ විභාග සංග්‍රහ - 03**

**අති පූජ්‍ය නා උයනේ අරිය ධම්ම නා හිමිපාණන් වහන්සේ විසින්**

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!

1. චිත්ත චෛතසික පරමාර්ථ ධර්මයන් විපස්සනාවට නැගීම පිණිස චිත්තවීථි හෙවත් සදෙරෙහි පේලි පේලි සිත් පහළවන පිළිවෙළ පැහැදිළිව දැනගැනීම මහෝපකාරී වන්නේය.

2. පඤ්චද්වාරයෙහි පහළ වන්නාවූ චිත්තවීථි සියල්ලම කාමාවචර සිතක් වන්නේය. මනෝද්වාරයෙහි වනාහි කාමාවචර වූද, රූපාවචරවූද, අරූපාවචර වූද ලෝකෝත්තර වූද චාතුර්භූමික සිත්ම පහළ වන්නාහ.

3. ඔවුන්තුරෙන් පඤ්චද්වාරික චිත්තවීථි පන්සැතැවක් ඇත්තාහ. එක් ද්වාරයකට නියමිත චිත්තවීථි පසළොසක් වන බැවින් චක්ෂුද්වාරයෙහි පහළ වන්නාවූ චිත්තවීථි පසළොස පළමුකොට දැනගැනීමෙන් ඉතිරි දෙරටු සතරට නියමිත චිත්තවීථි සියල්ලද දැනගැනීමට පහසු වන්නේය.

4. සිතක් හඳුනාගැනීම පිණිස චිත්තවීථි ප්‍රස්ථාරයෙහි දක්වෙන්නාවූ සංකේත මෙසේ වන්නාහ. පඤ්චද්වාරික වීථියන්හි, භ - භවංගසිත. තී - අතීත භවංග, න - භවංගචලනය, ද - භවංගුපච්ඡේදය. ප - පඤ්චද්වාරාවර්ජනය, ච - චක්ඛුවිඤ්ඤාණ, සෝ - සෝත විඤ්ඤාණය, ඝා - ඝාන විඤ්ඤාණය, ජි - ජිව්හා විඤ්ඤාණය, කා- කායවිඤ්ඤාණය, සං - සම්පටිච්ඡනය, ණ - සන්තීරණය, වො - වොත්ථපනය, ජ - ජවනය. ත - තදාරම්මණය, යනුවෙන් දත යුතු වන්නාහ.

5. මනෝද්වාරික වීථි ප්‍රස්ථාරයෙහි වනාහි, නො - මනෝද්වාරා වර්ජනය, රි - පරිකර්මය, උ - උපචාරය, නු - අනුලෝමය ගො- ගොත්‍රභූය, වො - වෝදානය, මා - මාර්ගය. ඵ - ඵලය, ඣා - ධ්‍යානය, යනුවෙන් ද, මරණාසන්න වීථියෙහිදී වනාහි චු- චුතිය. ටි- පටිසන්ධි සිතදැයි මෙසේ සංකේත සටහන් සියල්ල අනුව ඒ ඒ චිත්තයන් දත යුත්තාහ.

6. චක්ෂුද්වාරික අතිමහන්තාරම්මණ චිත්තවීථි ප්‍රස්ථාරය මෙසේය.

| | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | භ | තී | න | ද | ප | ච | සං | ණ | වො | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | ත | ත | භ | භ |
| 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |

මෙහි මුලින් අගින් ඇත්තාවූ භවංග සිත් වනාහි වීථිමුක්ත වූ භවංග ප්‍රවාහය දක්වීම පිණිසයි. අතීත භවංගය භවංග චලනය භවංග උපච්ඡේදය සිත් තුන ද භවංගයෝම වන්නාහ. පඤ්චද්වාරාවර්ජනය සහ වොත්ථපනය ද අහේතුක ක්‍රියා චිත්තයෝය. චක්ඛු විඤ්ඤාණය සම්පටිච්ඡනය සන්තීරණය තදාරම්මණයෝ විපාක චිත්තයෝය. ජවනය වනාහි කාමාවචර ජවන් සිත් විසිනවයෙන් එකක් වන්නේය. සිතක් පාසා තුනක් බැගින් ඇත්තාවූ බිංදු සංකේතය වනාහි උත්පාද ක්ෂණ ඨිතික්ෂණ භවංගක්ෂණ නම් වූ කුඩා චිත්තක්ෂණ දක්වීම පිණිසය.

7. නම් වශයෙන් වීථි චිත්තයන් සතක් ද සංඛ්‍යා වශයෙන් වීථි සිත් දහතරක්ද ඇත්තා වූ අතිමහන්තාරම්මණ චිත්ත වීථිය වනාහි තදාරම්මණ වාරය නමින්ද හැඳින්වෙන්නේය චක්ඛු විඤ්ඤාණය චක්ෂු ප්‍රසාදයෙහිද ඉතිරි වීථි සිත් හා භවංගයෝද හෘදය වස්තු රූපය නිශ්‍රය කොට ද උපදින්නාහ.

8. අතීත භවංග චිත්තක්ෂණයේදී උපන්නාවූ වර්ණ රූපය චක්ෂුප්‍රසාදයෙහි ගැටුනු කල්හි හෘදය වස්තුව ඇසුරු කරන භවංග චලනයට හේතුවූයේ සියලු පඤ්චප්‍රසාද වස්තුරූපයෝ හෘදය වස්තු රූපයත් සමඟ එක සන්තානයකට සම්බන්ධ බැවිනි. පක්ෂියෙකු ගස් අත්තක වාඩිවීමේදී එම සෙවනැල්ල පෙර පසු නොවී පොළොවට වැටෙනාසේය.

9. වර්ණ රූපය චක්ෂු ප්‍රසාදයෙහි ආපාතගත වූ පසු භවංග චලන භවංගුච්ඡේද නමින් භවංග චිත්තවාර දෙකක් ඉකුත්වී වීථිචිත්තයක් පහළවීමට හේතුව වනාහි, වේගයෙන් දුවන කෙනෙකු නවතින විට අඩියක් දෙකක් ඉදිරියට තබා නවතින්නා සේ වේගයෙන් පවතින භවංග සන්තතිය වීථි චිත්තයක් සඳහා වෙනත් අරමුණක් ගැනීම පිණිස නැවතීමේදී භවංග චිත්තවාර දෙකක්ම ගතවන බැවිනි.

10. චිත්ත වීථියේ පෙර පසු සියලු භවංග චිත්තයන්ගේ අරමුණ වනාහි පූර්ව භවයේ මරණාසන්න ජවනයට අරමුණු වූ කර්මය- කර්ම නිමිත්තය - ගතිනිමිත්තය යන තුනෙන් එකක්ම වන්නේය. වර්තමාන ප්‍රතිසන්ධි සිතටද භවංග චිත්ත සන්තතියටද අන්තිම චුතිචිත්තයට ද එම කර්මාදී අරමුණු තුනෙන් එකක් අරමුණ වන්නේ ය. පඤ්චද්වාරාවර්ජනය සහිත තදරම්මණ තෙක් වීථි සිත් දහතරට අරමුණ වන්නේ වර්තමාන රූප අරමුණ ය.

11. රූපාරම්මණ ඉපදී චිතක්ෂණ දෙකක් ඉක්මගොස් චක්ෂුප්‍රසාදයටආපාත ගතවූයේ නම් තදරම්මණ සිත් දෙකක් ඉපදීමට ආයු මඳ බැවින් ජවනාවසානයේදී භවංගපතනය වන්නාවූ පළමුවැනි මහත්තාරම්මණ චිත්තවීථිය නම් මෙසේය :

| භ | භ | තී | තී | න | ද | ප | ච | සං | ණ | වො | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | භ | භ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |

ඉපදී චිත්තක්ෂණ දෙකක් ඉකුත් වූ රූප අරමුණට ජවනයෙන් අනතුරුව තවත් එක චිත්තක්ෂණයක් පමණ ආයු ඇත්තේ නමුත් තදරම්මණ නියමය අනුව තදරම්මණ දෙකක් ඉපදීමට ආයු මඳ බැවින් චිත්ත වීථිය භවංග පතිත වන්නේය. ජවන් සතක් ඉපදීමට ඉඩ ඇති බැවින් මේ වීථිය මහත්තාරම්මණ නම් වන්නේය.

12. දෙවැනි මහත්තාරම්මණ චිත්ත වීථිය රූපාරම්මණය ඉපදී චිත්තක්ෂණ තුනක් ඉකුත් වූයේ නම් ජවන් සතක් පහළවී භවංග පාතය වන්නේය. ඒ මෙසේය :

| භ | භ | තී | තී | තී | න | ද | ප | ච | සං | ණ | වො | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | භ | භ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |

සත්වැනි ජවනයාගේ භවංක්ෂණය සමඟම අරමුණු වූ වර්ණ රූපයද නිරුද්ධ වන නමුත් ජවන් සිත් පහළවීමට ආයුෂ පැවති බැවින් චිත්තක්ෂණ තුනක් ඉක්මගිය රූපය අරමුණු කොට ගත් චිත්තවීථිය දෙවැනි මහත්තාරම්මණ චිත්ත විථිය නම් වන්නේය.

13. රූපාරම්මණය ඉපදී චිත්තක්ෂණ සතරක් ඉකුත් ව චක්ෂු ප්‍රසාදයට හමුවී නම් ජවන් සිත් සතක් ඉපදීමට ආයු මඳ බැවින් දෙවරක් පමණ වොත්ථපන සිත පහළ වී භවංග පතනය වන්නේය. ඒ මෙසේය :

| භ | භ | තී | තී | තී | තී | න | ද | ප | ච | සං | ණ | වො | වො | භ | භ | භ | භ | භ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |

චිතක්ෂණ සතරක් ඉකුත් වූ රූප අරමුණ ජවන් සිත් සයකට ආයු ඇතත් ජවන නියමය අනුව සත්වරක් පහළවීමට ආයු මඳ බැවින් ජවන් සිත වෙනුවට දෙවරක් වොත්ථපන පහළ වී භවංග පතිත වන්නේය. මෙය පළමුවන, පරිත්තා රම්මණ විථියයි වොත්ථපනයෙන් පසු පස්වැනි භංගයාගේ භංගක්ෂණයේදී රූප අරමුණ නිරුද්ධවන්නේය.

14. රූපාරම්මණය ඉපදී චිත්තක්ෂණ පහක් ඉක්මගියේ වී නම් ඉදිරියට එහි ආයුෂ ඇත්තේ චිත්තක්ෂණ දෙළසක්ම බැවින් ජවන් වෙනුවට දෙවැනි වොත්ථපනය දෙවරක් ඉපදී භවංග පාතය වන්නේය.

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | භ | ති | ති | ති | ති | ති | න | ද | ප | ච | සං | ණ | වො | වො | භ | භ | භ | භ |
| 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |

දෙවැනි වොත්ථපනයෙන් පසු සතරවැනි භවංග චිත්තයාගේ භංගක්ෂණයේ දී රූප අරමුණ නිරුද්ධ වන්නාවූ මේ වීථිය දෙවැනි පරිත්තාරම්මණ චිත්තවීථියයි.

15. රූප අරමුණ ඉපදී චිත්තක්ෂණ සයක් ඉකුත් වී ආපාතගත වූයේ නම් වොත්තපනයෙන් පසු තුන්වැනි භවංග චිත්තයාගේ භංගක්ෂණයේදී නිරුද්ධ වන්නාවූ රූප අරමුණ තුන්වැනි පරිත්තාරම්මණයයි. ඒ මෙසේය.

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | භ | ති | ති | ති | ති | ති | ති | න | ද | ප | ච | සං | ණ | වො | වො | භ | භ | භ |
| 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |

16. රූප අරමුණ ඉපදී චිත්තක්ෂණ සතක් ඉකුත් වී ආපාතගත වූයේ වී නම් දෙවැනි වොත්ථපනයෙන් පසු දෙවැනි භවංග චිත්තයාගේ භංගක්ෂණයේදී නිරුද්ධ වන්නා වූ රූප අරමුණ වනාහි සතරවැනි පරිත්තාරම්මණයයි. ඒ මෙසේය:

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | භ | ති | ති | ති | ති | ති | ති | ති | න | ද | ප | ච | සං | ණ | වො | වො | භ | භ |
| 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |

17. රූප අරමුණ ඉපදී චිත්තක්ෂණ අටක් ඉකුත් වී ගියේ නම් ඉදිරියට රූපයාගේ ආයුෂ ඇත්තේ චිත්තක්ෂණ නවයක්ම බැවින් වොත්ථපනයෙන් පසු පළමුවැනි භවංග චිත්තයාගේ භංගක්ෂණයේදී නිරුද්ධ වනරූප අරමුණ වනාහි පස්වැනි පරිත්තාරම්මණයයි. ඒ මෙසේය,

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | භ | ති | ති | ති | ති | ති | ති | ති | ති | න | ද | ප | ච | සං | ණ | වො | වො | භ |
| 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |

18. රූප අරමුණ ඉපදී චිත්තක්ෂණ නවයක් ඉකුත්වී ඉදිරියට චිත්තක්ෂණ අටක් පමණක් ආයු ඇත්තාවූ රූප අරමුණ දෙවැනි වොත්ථපනයාගේ භංගක්ෂණයේදී නිරුද්ධ වන්නේය, එය වනාහි සයවැනි පරිත්තාරම්මණයයි. ඒ මෙසේය:

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | භ | ති | ති | ති | ති | ති | ති | ති | ති | ති | න | ද | ප | ච | සං | ණ | වො | වො |
| 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |

19. රූපාරම්මණය ඉපදී චිත්තක්ෂණ දසයක් ඉකුත් වී ඉදිරියට චිත්තක්ෂණ සතක් ආයු ඇති කල්හි වොත්ථපනය දෙවරක් ඉපදීමට ආයු මඳ බැවින් වීථි සිත් කිසිවක් පහළ නොවී දෙවරක් භවංග චලන මාත්‍රයක්ම වන්නේය. ඒ වනාහි පළමුවැනි අතිපරිත්තාරම්මණයයි ඒ මෙසේය:

| | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | භ | ති | ති | ති | ති | ති | ති | ති | ති | ති | ති | න | න | භ | භ | භ | භ | භ | භ | භ |
| 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |

20. දෙවැනි අතිපරිත්තාරම්මණයේදී චිත්තක්ෂන එකොළසක් ඉකුත් වී චිත්තක්ෂණ සයකට ආයු ඇති බැවින් භවංග චලනයෙන් පසු සතරවැනි භවංග චිත්තයාගේ භංගක්ෂණයේදී නිරුද්ධ වන්නේය. ඒ මෙසේය:

| | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | භ | ති | ති | ති | ති | ති | ති | ති | ති | ති | ති | ති | න | න | භ | භ | භ | භ | භ | භ |
| 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |

සිතෙන් පසු සතරවැනි භවංග සිත සමඟ නිරුද්ධ වන්නේය. මේ වනාහි පළමුවැනි විභූතාරම්මණ වීථියයි.

28. දෙවැනි විභූතාරම්මණ වීථිය

| | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ප | භ | තී | තී | න | ද | මනො | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | ත | ත | භ | භ | භ | භ | භ |
| 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |

පෙරසේම දෙවිසි රූපයන් අතුරෙන් යමක් ඉපදී චිත්තක්ෂණ දෙකක් ඉකුත් වී මනෝද්වාරයට අරමුණු වුයේ නම් දෙවැනි තදරම්මණයට අනතුරුව තුන්වැනි භවංග සිත සමඟ නිරුද්ධ වන්නේය. මෙය දෙවැනි විභූතාරම්මණ වීථියයි.

29. තුන්වැනි විභූතාරම්මණ වීථිය

| | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ප | ප | තී | තී | තී | න | ද | මනො | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | ත | ත | භ | භ | භ | භ |
| 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |

දෙවිසි රූප අතුරෙන් එකක් ඉපදී චිත්තක්ෂණ තුනක් ඉකුත්වී මනෝද්වාරයට හමුවී නම් දෙවැනි තදරම්මණයෙන් පසු දෙවැනි භවංග සිත සමඟ නිරුද්ධ වන්නේය. මෙය තුන්වැනි විභූතාරම්මණ වීථියයි.

30. සතරවැනි විභූතාරම්මණ වීථිය

| | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ප | ප | තී | තී | තී | තී | න | ද | මනො | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | ත | ත | භ | භ | භ |
| 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |

දෙවිසි රූපය අතුරෙන් එකක් ඉපදී අතීත චිත්තක්ෂණ සතරක් ඉකුත් වී නම් දෙවැනි තදරම්මණයෙන් පසු පළමුවැනි භවංග සිත සමඟ නිරුද්ධ වන්නේය. මෙය සතරවැනි විභූතාරම්මණ වීථියයි.

31. පස්වැනි විභූතාරම්මණ වීථිය.

| | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ප | ප | තී | තී | තී | තී | තී | න | ද | මනො | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | ත | ත | භ | භ |
| 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |

දෙවිසි රූප අතුරෙන් යමක් ඉපදී අතීත චිත්තක්ෂණ පහක් ඉකුත් වී මනෝද්වාරයට හමුවී නම් දෙවැනි තදරම්මණ සිත සමඟ නිරුද්ධ වන්නේය. මෙය පස්වැනි විභූතාරම්මණ වීථියයි.

32. පළමුවැනි මනෝද්වාරික අවිභූතාරම්මණ වීථිය

| | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ප | ප | තී | තී | තී | තී | තී | තී | න | ද | මනො | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | භ | භ | භ |
| 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |

සතලොස් චිත්තක්ෂණායුක දෙවිසි රූප අතුරෙන් යමක් අතීත චිත්තක්ෂණ සයක් ඉකුත්වී මනෝද්වාරයට හමුවී නම් සත්වැනි ජවනයෙන් පසු පළමුවැනි භවංග සිත සමඟ නිරුද්ධ වන්නේය. මෙය පළමුවැනි අවිභූතාරම්මණ වීථියයි.

33. දෙවැනි අවිභූතාරම්මණ වීථිය

| | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ප | ප | තී | තී | තී | තී | තී | තී | තී | න | ද | මනො | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | භ | භ |
| 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |

ඉහත කී දෙවිසි රූපයන් අතුරෙන් යමක් අතීත චිත්තක්ෂණ සතක් ඉකුත් වී මනෝද්වාරයට හමුවී නම් සත්වැනි ජවන් සිත සමඟ නිරුද්ධ වන්නේය, මේ වනාහි දෙවැනි අවිභූතාරම්මණ චිත්ත වීථියයි.

34. චිත්තක්ෂණ සතලොස බැගින් ආයු ඇත්තාවූ දෙවිසි රූපයෙහි අරමුණු සයක්ම ඇත්තේ වී නමුත් මනෝද්වාරයට අරමුණු වීමේදී ධර්මාරම්මණ නමින් හැඳින් වෙති. එම දෙවිසි රූප අරමුණෙහි මනෝද්වාරික විභූතාරම්මණ චිත්තවීථි පසක්ද අවිභූතාරම්මණ චිත්තවීථි දෙකක් දැයි කාමාවචර මනෝද්වාරික චිත්තවීථි මෙසේ සත්වැදෑරුම් වන්නාහ.

35. චිත්තක්ෂණ සතලොසක් ආයු නැත්තාවූද විඥප්ති රූප දෙකද ලක්ඛණ රූප සතරද තුන් කාලයට අයත් එකුන් අනූ චිත්තයද දෙපණස් චෛතසිකද කාලවිනිර්මුක්තවූ නිර්වාණයද ප්‍රඥප්තිද යන මේ ධර්මාරම්මණ අතුරෙන් අතිශයින් ප්‍රකට අරමුණෙහි විභූතාරම්මණ වීථියත් නොපැහැදිලි අරමුණෙහි අවිභූතාරම්මණ වීථියත් ලැබෙන්නේය.

36. **පළමුවැනි විභූතාරම්මණ වීථිය.**

| භ | භ | න | ද | නො | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | ත | ත | භ | භ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |

විභූතාරම්මණයක් වුවද තදරම්මණ ලැබෙන්නුයේ කාමාවචර ජවනයකදී කාමාවචර අරමුණකදී කාමාවචර පුද්ගලයෙකුට පමණය. රූපාවචර අරූපාවචර පුද්ගලයන් හට තදරම්මණ නොලැබෙන්නාහ. මහග්ගත ලෝකෝත්තර හා ප්‍රඥප්ති අරමුණකදී කිසිවෙකුට තදරම්මණ නොම ලැබෙන්නාහ.

37. **දෙවැනි අවිභූතාරම්මණ වීථිය**

| භ | භ | න | ද | නො | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | භ | භ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |

අප්‍රකට වූ ධර්මරම්මනයේදී කාමාවචර පුද්ගලයකුට වුවද තදරමණ නොලැබෙති. සිහින පෙනීමේදීද මනෝද්වාරික විභූත අවිභූත කුශලාකුශල ජවන් විථී පෙර සේම ලැබෙන්නාහ. පඤ්චද්වාරයෙහි වොත්ථපන වීථිවාරය මෙන් සිහිනේදීද ජවන් නොමැතිව මනෝද්වාරවර්ජන සිතම දෙතුන් වරක් ලැබෙන වීථීත් ඇත්තාහ.

**ත්‍රිලක්ෂණ විදර්ශනාව**

1. ද්වාරම්මණ වස්තු සංග්‍රහ විභාග භාවනාවේදී පහළ වූ චිත්ත චෛතසික භූතරූප උපාද රූප සංඛ්‍යාත නාම රූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්මයෝ ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝය.

2. ඇතිවීම නැති වීම දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝය.

3. තම තමන් නැමති ලෙස නොපැවතී බැවින් අනාත්මයෝය.

4. මෙසේ අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්මක වූ චිත්ත චෛතසික භූතරූප උපාද රූප සංඛ්‍යාත නාම රූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන සංඛත සන්තාප විපරිනාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේය.

5. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව ආයුහණ නිදන සංයෝග පළිබෝධාර්තයෙන් සමන්ගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේය.

6. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ විවේක අසංඛත අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකානත්යෙන් නිරෝධ සත්‍යය නම් වන්නේය.

7. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතුවූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය නියයාන හේතු දස්සන ආධිපතෙය්‍යාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේය.

8. මාගේ භාවනාමය කුශලානිසංස ධර්මය මෙම චතුරාර්ය සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිසම හේතු වේවා වාසනා වේවා

සාධු. සාධු. සාධු.

පදවිවරණය

1. වීථි ප්‍රස්ථාරය - චිත්ත වීථි සටහන් දක්වීම.

2. විඤ්ඤත්ති රූප - කාය විඤ්ඤත්ති - වචී විඤ්ඤත්ති රූප දෙක එකම චිත්තක්ෂණයක් සමාන ආයු ඇත්තාහ.

3. ලක්ඛණ රූප 4- උපචය, සන්තති, ජරතා අනිච්චතා යන සතරය. උපචය - සන්තති, දෙක චිත්තයාගේ උත්පාදක්ෂණය සමාන ආයුෂ ඇත්තාහ. අනිච්චතාව භංගක්ෂණය සමාන ආයු ඇත්තේය. ජරතාව වනාහි කුඩා චිත්තක්ෂණ 49 ක් පමණ ආයු ඇත්තේය.

4. ධර්මාරම්මණය - මනෝද්වාරයෙන් අරමුණු කෙරෙන සියල්ල ධර්මාරම්මණ නමින් හැඳින්වෙයි.


රා. සේ. බෞද්ධ සංගමය මගින් මහජන පුස්තකාලයේ
පැවැත්වෙන භාවනා පන්තියේ පින්වත් පිරිසක් විසින්
ධම්ඥානය ධම්මාවබෝධය හා
සුවසේ නිර්වාණාව බෝධය පිණිස

නුගේගොඩ ගංගොඩවිල 37 සෝරත මාවතේ
පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස්හි
මුද්‍රණය කරවා ධම් දානය පිණිස
නිකුත් කරන ලදී.

රාජ්‍ය සේවා බෞද්ධ සංගමය
මහවැලි සංවර්ධන අමාත්‍යාංශය
500 ටී. බී. ජයා මාවත
කුන්මුල්ල කොළඹ 10
2452 - නිනිණි 1999 සැප්තැම්බර 01

අභිධර්ම විපස්සනා භාවනා පාඨම 08

අභිධර්මාර්ථ සංග්‍රහ - විථි සංග්‍රහ විභාගය - 04

**අති පූජ්‍ය නා උයනේ අරිය ධම්ම නා හිමිපාණන් වහන්සේ විසින්**

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !

1. දස කසිණය - දස අශුභය - කායගතාසතිය - ආනා පාන සතිය - බ්‍රහ්මවිහාර සතරයයි රූපාවචර අර්පණා කර්මස්ථාන සවිස්සක් ඇත්තාහ. අරූපාවචර අර්පණා කර්මස්ථානයෝ සතරක්ම වන්නාහ.

2. ඔවුනතුරෙන් ප්‍රථමධ්‍යාන අර්පණා පස්විස්සක්ද ද්විතිය ධ්‍යාන අර්පණා තුදුසක්ද තෘතිය ධ්‍යාන අර්පණා තුදුසක්ද චතුර්ථ ධ්‍යාන අර්පණා සොළසක්ද වන්නාහ. තීක්ෂණ ප්‍රඥාවන්ත යෝගා වචරයන්ගේ වශයෙනි.

3. තීක්ෂණ ප්‍රඥාවන්ත නොවූ සෙසු යෝගාවචරයන්ට වනාහි ප්‍රථමධ්‍යාන අර්පණා පස්විස්සක්ද ද්විතිය ධ්‍යාන අර්පණා තුදුසක්ද තෘතිධ්‍යාන අර්පණා තුදුසක්ද චතුර්ථ ධ්‍යාන අර්පණා තුදුසක්ද පඤ්චමධ්‍යාන අර්පණා සොළසක්ද, ලැබෙන්නාහ. මෙසේ සංඛ්‍යා වශයෙන් ගනු ලැබෙන්නේ කර්මස්ථාන අරමුණු අනුව බව සැලකිය යුතු වන්නේය.

4. ලෝකෝත්තර අර්පණා ජවනයෝ සංක්ෂේපයෙන් අටක් වන්නාහ. විස්තාර වශයෙන් වනාහි සම සතලිසක්ම වන්නාහ. මන්ද පඤ්ඤ අර්පණා සහ තික්ඛපඤ්ඤ අර්පණා වශයෙන් මහග්ගත ලෝකෝත්තර අර්පණා ජවන වීථි දෙගුණයක් වන බව සැලකිය යුතු වන්නේය.

5. **මන්දපඤ්ඤ ප්‍රථම ධ්‍යාන රූපාවචර ජවන වීථිය :**

| භ | භ | න | ද | මා | ප | උ | අ | ගෝ | ධ්‍යා | භ | භ | භ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |

ආදිකම්මික යෝගාවචරයාගේ ධ්‍යාන වීථියේ දී මුලින් අගින් දැක්වෙන භවංග සිත් වනාහි කාමාවචර ත්‍රිහේතුක භවංග සතරට අයත් වන්නාහ. ම-මනෝද්වාරිරාවර්ජණ ප-පරිකර්ම, උ - උපචාර, අ - අනුලෝම, ගෝ - ගෝත්‍රභූ නම් වූ ජවන් සිත් සතර දෙන වනාහි මහා කුශල - මහාක්‍රියා සෝමනස්ස සහගත ඥානසම්ප්‍රයුක්ත ජවන් සිත් සතරෙන් එකක් වන්නේය. ධ්‍යා - ධ්‍යානය වනාහි කසිණ දසය අශුභ දශය - කායගතාසතිය - අනාපාන සතිය මෙත්තා - කරුණා - මුදිතා - නම් වූ කර්මස්ථාන පස්විස්සෙන් එක් කර්මස්ථාන අරමුණක් ගෙන පහළ වන්නා වූ විතර්ක - විචාර - ප්‍රීති - සුඛ - එකාග්‍රතා ධ්‍යානාංග පසකින් යුක්ත වූ ප්‍රථමධ්‍යාන අර්පණාව වන්නේය.

6. **තික්ඛ පඤ්ඤ ප්‍රථම ධ්‍යාන අර්පණා වීථිය :**

| භ | භ | න | ද | මා | උ | අ | ගෝ | ධ්‍යා | භ | භ | භ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |

තීක්ෂණ ප්‍රඥා ඇති යෝගාවචරයාට වනාහි මනෝද්වාරාවර්ජනයට අනතුරුව උපචාර - අනුලෝම - ගෝත්‍රභූ නමින් කාමාවචර අනුලෝම ජවන් සිත් තුනට අනතුරුවම සතර වැනිව, අර්පණා ධ්‍යානය පහළ වන්නේය. මන්දපඤ්ඤ තික්ඛ පඤ්ඤ දෙදෙනාගේම ආදිකම්මික ප්‍රථම ධ්‍යාන වීථියෙහි අර්පණාව ඒකචිත්තක්ෂණිකම වන්නේය. ඉන් අනතුරුව භවංග පතිත වන්නේ වේ.

7. ආදිකාර්මික යෝගාවචරයන්ගේ පළමුවැනි අර්පණාවද සියල්ලන්ගේම අභිඥා අර්පණාවද ලෝකෝත්තර සතර මාර්ග අර්පණාව ද ඒකචිත්තක්ෂණිකම වන්නේය. පඤ්චවිධ

වසීතාවෙන් ප්‍රගුණ වූ අර්පණා ධ්‍යාන සමාපත්ති ද ලෝකෝත්තර ඵලසමාපත්ති ද කැමතිතාක් වේලා ජවන වීථි පවත්නේය.

8. පඤ්චක නය ක්‍රමයෙන් රූපාවචර ද්විතීය ධ්‍යාන වීථියද තෘතීය ධ්‍යාන වීථිය ද චතුර්ථ ධ්‍යාන වීථියද අරමුණු වශයෙන් දශකසිණය ආනාපාන සතිය මෙත්තා කරුණා මුදිතා බ්‍රහ්මවිහාර තුනද යන කර්මස්ථාන තුදුසට නියමිත වූ ප්‍රතිභාග අරමුණු තුදුසෙහි අර්පණා ධ්‍යාන බවට යන්නාහ. පඤ්චම ධ්‍යානයට වනාහි දස කසිණය ආනාපාන සතිය උපෙක්ඛා බ්‍රහ්ම විහාරය යන කර්මස්ථාන දොළසට නියමිත ප්‍රතිභාග නිමිති නම් වූ ධර්මාරම්මණයෙන් අර්පණා ධ්‍යාන බවට යන්නේය.

9. අරූපධ්‍යාන සතර වනාහි අනුපිළිවෙළින්, ආකාශ කසිණය හැර ඉතිරි නව කසිණයන්ගේ කසිණ ඉගුළු අනන්තාකාශය පළමුවැනි අරූප ධ්‍යානයටද, මේ ආත්ම භාවයේදී හෝ පූර්ව භවයේදී හෝ තමන් ලත් ආකාසානඤ්චායතන ධ්‍යාන චිත්තය දෙවැනි අරූප ධ්‍යානයටද, එම ධ්‍යාන චිත්තයාගේ නැති බව නම් වූ නාස්තිභාව ප්‍රඥප්තිය තුන්වැනි අරූපධ්‍යානයටද, තුන්වැනි අරූප ධ්‍යාන චිත්තයම සතරවැනි අරූපධ්‍යානයටද අර්පණා වීම සඳහා අරමුණු වන්නේය.

10. රූපාවචර වූද අරූපාවචර වූද සියලුම අර්පණා ධ්‍යාන වීථි මන්ද ප්‍රාඥ තීක්ෂණ ප්‍රාඥ දෙදෙනාගේ වශයෙන් දෙවැදෑරුම් වන්නාහ. මන්ද ප්‍රාඥ අර්පණා වීථියේදී පරිකර්ම - උපචාර-අනුලෝම - ගෝත්‍රභූ නමින් අනුලෝම ජවන සතරට අනතුරුව පස්වැනිව අර්පණාව ලැබෙන්නේවේ. තීක්ෂණ ප්‍රාඥ අර්පණා වීථියේදී වනාහි උපචාර - අනුලෝම - ගෝත්‍රභූ නමින් අනුලෝම ජවන තුනකට අනතුරුව සතර වැනිව අර්පණාව ලැබෙන්නේ ය.

11. **සමාපත්ති අර්පණා වීථිය : (මන්ද පඤ්ඤ)**

| භ | භ | භ | න | ද | ම | ප | උ | අ | ගෝ | ධ්‍යා | ධ්‍යා | ධ්‍යා | ධ්‍යා | ධ්‍යා | ධ්‍යා | භ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |

**සමාපත්ති අර්පණා වීථිය (තික්ඛ පඤ්ඤ)**

| භ | භ | න | ද | ම | උ | අ | ගෝ | ධ්‍යා | ධ්‍යා | ධ්‍යා | ධ්‍යා | ධ්‍යා | ධ්‍යා | භ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |

සමාපත්ති වීථියේදී සනිටුහන් කළ වේලාව නිමවන තුරු භවංග පතිත නොවී අතරක් නොමැතිව අර්පණා ධ්‍යාන චිත්ත සන්තතිය පවත්නේය. අදිටන් කළ වේලාව නිම වූ විට භවංග පතිත වී ඉන් අනතුරුව ධ්‍යානාංග ප්‍රත්‍යවේක්‍ෂා වීථි වෙන වෙනම ලැබෙන්නාහ.

12. ධ්‍යානාංග ප්‍රත්‍යවේක්ෂාවේදී වනාහි ප්‍රථම ධ්‍යානයට අනතුරුව ප්‍රත්‍යවේක්ෂා වීථි පසක්ද, ද්විතීය ධ්‍යානයට අනතුරුව ප්‍රත්‍යාවේක්ෂා වීථි සතරක්ද, තෘතීය ධ්‍යානයට අනතුරුව ප්‍රත්‍යවේක්ෂා වීථි තුනක්ද, චතුර්ථ ධ්‍යානයට අනතුරුව ප්‍රත්‍යාවේක්ෂා වීථි දෙකක්ද, පඤ්චම ධ්‍යානයට අනතුරුව ප්‍රත්‍යාවේක්ෂා වීථි දෙකක් ද වෙන වෙනම ලැබෙන්නාහ. ධ්‍යානාංග වෙන වෙනමද ප්‍රත්‍යවේක්ෂා කොට ඒ ඒ ධ්‍යානයෙන් අනතුරුව සම්පිණ්ඩනය ද කොට ප්‍රත්‍යාවේක්‍ෂා කරනු ලබන්නේය.

13. ලෝකෝත්තර මාර්ග චිත්ත වීථි වාරයේ දී මන්දප්‍රාඥ මාර්ග වීථිය ද තීක්ෂණ ප්‍රාඥ මාර්ග වීථිය දැයි මාර්ග වීථිය දෙවැදෑරුම් වන්නේය. මන්දප්‍රාඥ මාර්ග වීථියේදී අනුලෝම ජවන් සිත් සතරකට අනතුරුව පස්වැනිව මාර්ග චිත්තයද අගින් ඵල සිත් දෙකක්ද පහළ වන්නාහ. තීක්ෂණ ප්‍රාඥ මාර්ග වීථියේදී වනාහි අනුලෝම ජවන තුනකට අනතුරුව සතර වැනිව මාර්ග චිත්තයද අගින් ඵලසිත් තුනක් ද පහළ වන්නාහ.

14. **මන්ද ප්‍රාඥ සෝතාපත්ති මාර්ග වීථිය :**

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | භ | න | ද | ආ | ප | උ | නු | ගෝ | මා | ඵ | ඵ | භ | භ | භ |
| 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |

සංඛාරුපෙක්ඛා විදර්ශනා ඥාන වීථියට අනතුරුව භවංග සිත් පැවතී ඉන් අනතුරුව, න - භවංග චලනයද, ද - භවංගුපච්ඡේදයද, ආ - මනෝද්වාරාවර්ජනයද, ප - පරිකර්ම සිතද, උ - උපචාර සිතද, නු - අනුලෝම සිතද, ගෝ - ගෝත්‍රභූ සිතද, මා මාර්ග සිතද, ඵ - ඵ ඵලසිත් දෙකද පහළ වී භවංග පතිත වන්නේය.

15. **තීක්ෂණ ප්‍රාඥ සෝතාපත්ති මාර්ග වීථිය :**

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | භ | න | ද | ආ | උ | නු | ගෝ | මා | ඵ | ඵ | ඵ | භ | භ | භ |
| 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |

තීක්ෂණ ප්‍රාඥ වීථියේදී වනාහි මනෝද්වාරාවර්ජනයට අනතුරුව උපචාර අනුලෝම ගෝත්‍රභූ සිත් තුනකින් පසු මාර්ග චිත්තය අර්පණාගත වන්නේය. එහෙයින්ම මාර්ගානන්තර ඵලසිත් තුනක්ම ලැබෙන්නාහ.

16. මාර්ග වීථියේ දී පිළිවෙලින් ලැබෙන්නාවූ පරිකර්ම - උපචාර - අනුලෝම යන ජවන් සිත් තුන වෙන වෙනම ඒ නමින් හඳුන්වනු ලබන්නාහ. එහෙත් ඒ කාමාවචර ජවන් සිත් තුනම ආසේවන - නමින්ද පරිකර්ම - උපචාර - අනුලෝම නමින් දැයි එකම නමකින්ද භාවිතා කළහැකි වන්නාහ.

17. සෝතාපත්ති මාර්ග වීථියේ පූර්ව - අපර භවංගයෝ පඤ්චවෝකාර ත්‍රිහේතුක භවංග නවයට අයත් වන්නාහ. පරිකර්ම ආදී සිත් සතර දෙන ත්‍රිහේතුක කාමාවචර කුශල ජවන් සතරට අයත් වන්නාහ. භවංග චිත්තයන්හට අතීත කර්ම - කර්මනිමිත්ත ගති නිමිත්ත අතුරෙන් යමක් අරමුණු වන්නාහ. ආවර්ජනය සහිත අනුලෝම ජවන් සිත් තුනට නාම රූප සංස්කාරයක් අරමුණු වන්නේය. ගෝත්‍රභූ -මාර්ග - ඵල චිත්තයන්හට වනාහි අසංඛත නිර්වාණ ධාතුව අරමුණු වන්නේය.

18. **සෝතාපත්ති මාර්ග ප්‍රත්‍යවේක්ෂා වීථිය**

සෝවාන් මාර්ග වීථියට අනතුරුව සිත භවංග පතිත වී සෝවාන් මාර්ගය ප්‍රත්‍යවේක්ෂා වීථිය පහළ වන්නේය. නැවත සෝවාන් ඵලයද, ප්‍රහීණ වූ ක්ලේශයන්ද, අවශේෂ වූ ක්ලේශයන්ද, අරමුණු වූ නිර්වාණයද, වෙන වෙනම ප්‍රත්‍යවේක්ෂා කෙරෙන ත්‍රිහේතුක කාමාවචර ජවන් වීථි පසක් අනුපිළිවෙළින්ම පහළ වන්නාහ.

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | න | ද | ආ | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | භ | භ | භ |
| 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |

මෙහි පූර්ව - අපර භවංගයෝ පඤ්ච වෝකාර ත්‍රිහේතුක භවංග නව දෙනා වන්නාහ. ජවන් සිත් සත්දෙනා වනහි ත්‍රිහේතුක කාමාවචර කුශල ජවන් සතරදෙනා වන්නාහ. සකදාගාමි - අනාගාමි මාර්ග - ප්‍රත්‍යවේක්ෂා වීථිද එසේම වන්නාහ. අර්හත් මාර්ග ප්‍රත්‍යවේක්ෂාවේදී වනාහි ත්‍රිහේතුක කාමක්‍රියා ජවන් සතර දෙනා දත යුතු වන්නාහ.

19. **සෝතාපත්ති ඵල ප්‍රත්‍යවේක්ෂා වීථිය**

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | න | ද | ආ | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | භ | භ | භ |
| 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |

සෙසු ආර්යයන්ගේ ඵල ප්‍රත්‍යාවේක්ෂා වීථීන්ද මීට සමානය. පූර්වාපර භවංගයෝ පෙරසේම, ජවනයය ත්‍රිහේතුක කාමකුශල ජවනයෝය, අරහත් ඵල ප්‍රත්‍යාවේක්ෂාවේදී ත්‍රිහේතුක කාමක්‍රියා ජවනයෝ සිවුදෙන ලැබෙන්නාහ.

20. **නිර්වාණ ප්‍රත්‍යවේක්ෂා වීථිය :**

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | ත | ද | ආ | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | භ | භ | භ |
| 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |

නිර්වාණ ප්‍රත්‍යවේක්ෂාවේ දී ශෛක්ෂයන්හට ත්‍රිහේතුක කාම කුශල ජවනයෝද රහතන් වහන්සේට ත්‍රිහේතුක කාම ක්‍රියා ජවනයෝද ලැබෙන්නාහ. නිර්වාණය අරමුණු කිරීමේදී වනාහි තමන් ලැබූ මාර්ග ඵල චිත්තයන්ට අරමුණු වූ ශූන්‍යතා - අනිමිත්ත අප්පණිහිත නම් වූ ලක්ෂණ තුන අතුරෙන් එක් ලක්ෂණයකින්ම අරමුණු වන්නේය.

21. **ප්‍රහීනක්ලේශ ප්‍රත්‍යවේක්ෂා වීථිය :**

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | ත | ද | ආ | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | භ | භ | භ |
| 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |

ප්‍රහීණ වූ කෙලෙස් අරමුණු කරන්නාවූ ජවන් සිතද ශෛක්ෂයන්හට ත්‍රිහේතුක මහා කුශල ජවනයෝමය. ක්ෂීණා ශ්‍රවයන්හට ත්‍රිහේතුක මහා ක්‍රියා ජවනයෝ වන්නාහ. භවංගයෝ පඤ්චවෝකාර ත්‍රිහේතුක භවංග නවය වන්නාහ.

22. **අවශේෂ ක්ලේශ ප්‍රත්‍යවේක්ෂා වීථිය :**

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | ත | ද | ආ | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | භ | භ | භ |
| 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |

ක්ෂිණාශ්‍රවයන්හට වනාහි අවශේෂ ක්ලේශ ප්‍රත්‍යවේක්ෂා වීථියක් නැත්තේමය. යට ඵලස්ථයන් තිදෙනාටම ඇත්තාහ. ත්‍රිහේතුක මහා කුශල ජවනයෙන්ම අවශේෂ ක්ලේශයන් අරමුණු වන්නාහ. මෙසේ හෙයින් යට ඵලස්ථයන් තිදෙනාට ප්‍රත්‍යවේක්ෂා විථි පස බැගින් ලැබෙන්නාහ. ක්ෂිණාශ්‍රවයන් වහන්සේට ප්‍රත්‍යවේක්ෂා විථි සතරක්ම ලැබෙන්නාහ.

23. **ඵලසමාපත්ති වීථිය :**

ආර්ය ඵලස්ථ සතර දෙනා වහන්සේ වනාහි තම තමා ලත් ආර්ය ඵලසමාපත්තියට සමවදින්නාහ. නිර්වාණ ධාතුවේ ලක්ෂණ තුන අතුරෙන් එක් ලක්ෂණයකින් නිර්වාණය අරමුණු කොට ඵල සමාපත්තිය අදිටන් කළ තාක් වේලා පවත්වන්නාහ.

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | ත | ද | ආ | නු | නු | නු | නු | ඵ | ඵ | ඵ | ඵ | භ | භ |
| 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |

මාර්ග වීථියේදී පරිකර්මාදී නම් සතරකින් යෙදුනු ජවන් සිත් සතර මෙහිදී අනුලෝම නමින්ම යෙදී ඇත්තාහ. සතරවැනි අනුලෝමය සමග ඵල ජවනයෝ නිර්වාණය අරමුණු කරන්නාහ. ආවර්ජනය සහිත අනුලෝම තුන සංස්කාර අරමුණු කරන්නාහ.

24. සෝතාපත්ති මාර්ග වීථියේදී වනාහි මාර්ග චිත්තයට ප්‍රථමයෙන් නිවන අරමුණු කෙරෙන ජවන් සිත ගෝත්‍රභූ නම් වන්නේය. මතු මාර්ග චිත්තයන්ට ප්‍රථමයෙන් ගෝත්‍රභූ ස්ථානය වෝදාන නමින් හැඳින්වෙන්නේය. ඵල සමාපත්ති විථියේදී වනාහි ඵල සිතට මුලින් ලැබෙන්නා වූ පරිකර්මාදී ජවන් සිත් සතර දෙනා අනුලෝම නමින්ම පට්ඨාන ප්‍රකරණයෙහි වදරණ ලද්දේය.

25. **නිරෝධ සමාපත්ති වීථිය :**

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | ත | ද | ආ | ප | උ | නු | ගෝ | ඣා | ඣා — | ඵ | භ |
| 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |

අෂ්ට සමාපත්ති ලාභී අනාගාමී සහ ක්ෂීණාශ්‍රවයන්ටම ආවේණික නිරෝධ සමාපත්තිය වනාහි අනු පිළිවෙලින් සමවදිනු ලබන්නේය. ප්‍රථම ධ්‍යානයට සමවැදී ඉන් නැගී එහි ධ්‍යාන නාම ධර්ම විදර්ශනා කොට දෙවැනි අරූප සමාපත්තිය තෙක්ම ඉහළට ධ්‍යානත් විදර්ශනා වත් පවත්වනේය.

26. නැවත නෙවැනි අරූප සමාපත්තියෙන් නැගී සිට කරුණු සතරක් අධිෂ්ඨාන කොට සතරවැනි අරූප සමාපත්තියට සමවදින්නේය. සතර වැනි අරූප සමාපත්තියේදී චිත්තක්‍ෂණ දෙකක් පහළ වී චිත්ත සන්තානය අදිටන් කළ වේලාව තෙක් නිරුද්ධ වන්නේය. නිරෝධයෙන් අවදි වන කල්හි ස්වකීය ආර්ය ඵල චිත්තය එක්වරක්ම පහළවී භවංග පතිත වන්නේය.

27. නිරෝධ සමපාත්ති වීථියෙහි පූර්වාපර භවංගයෝ පඤ්චවෝකාර ත්‍රිහේතුක භවංග නවය අතරෙන් යමක් වන්නාහ. ආවර්ජනය සහිත ගෝත්‍රභූ දක්වා කාමාවචර ජවන් සිත් සතරට ද අර්පණා දෙසිතට නෙවැනි අරූප ධ්‍යාන සිතම අරමුණු වන්නේය. නිරෝධ සමාපත්තියේදී වනාහි චිත්ත චෛතසික චිත්තජ රූප සියල්ල නිරුද්ධ වන්නේය. කර්මජ උතුජ ආහාරජ යන ත්‍රිජ රූප පරම්පරාවම පවත්නේය. මනුලොව වැඩිම කාලය සත්දිනක්ද බඹලොව කල්ප ගණන් ද නිරෝධය පවත්නේය.

**ත්‍රිලක්ෂණ විදර්ශනාව**

1. වීථි චිත්ත විදර්ශනා භාවනාවේදි පහළ වූ චිත්ත චෛතසික භූතරූප උපාද රූප සංඛ්‍යාත නාම රූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්මයෝ ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝය.

2. ඇතිවීම නැති වීම දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝය.

3. තම තමන් නැමති ලෙස නොපැවතී බැවින් අනාත්මයෝය.

4. මෙසේ අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්මක වූ චිත්ත චෛතසික භූතරූප උපාද රූප සංඛ්‍යාත නාම රූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන සංඛත සන්තාප විපරිනාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේය.

5. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව ආයූහණ නිදාන සංයෝග පළිබෝධාර්තයෙන් සමන්ගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේය.

6. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ විවේක අසංඛත අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකානත්යෙන් නිරෝධ සත්‍යය නම් වන්නේය.

7. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතුවූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය නියයාත හේතු දස්සන ආධිපතෙය්‍යාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේය.

8. මාගේ භාවනාමය කුශලානිසංස ධර්මය මෙම චතුරාර්ය සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිසම හේතු වේවා වාසනා වේවා

සාධු. සාධු. සාධු.

**පදවිවරණය :**

1. බ්‍රහ්ම විහාර-මෛත්‍රා කරුණා මුදිතා උපෙක්ඛා යන භාවනා සතරට නමකි. මෛත්‍රාවට සියලු සත්වයෝද, කරුණාවට දුක්ඛිතයෝද, මුදිතාවට සුඛිතයෝද, උපෙක්ඛාවට මධ්‍යස්ථයෝද අරමුණු වන්නාහ.

2. තීක්ෂන ප්‍රාඥ - උද්ඝටිතඥ විපඤ්චිතඥයන් මෙන් ක්ෂණික යමක් වටහා ගැනීමට සමත් අය තීක්ෂණ ප්‍රාඥයෝය.

3. මන්ද ප්‍රාඥ - ධ්‍යාන මාර්ගඵල අධිගම ලැබීමට සමත් බවක් ඇතත් ක්ෂණිකව ක්ෂණිකව යමක් වටහා ගැනීමට අසමත් අය මන්ද ප්‍රාඥයෝ වෙති.

4. පඤ්චවිද වශීතාව

ආවර්ජනා - සමාපජ්ජනා - අධිෂ්ඨාන - වුට්ඨානා - ප්‍රත්‍යාවේක්ෂණා නමින් පස් ආකාරයකට ධ්‍යානය ප්‍රගුණ කල යුතු බව පඤ්චවිධ වශීතාවයි.

5. ධ්‍යාන පඤ්චක ක්‍රමය - ප්‍රථම ධ්‍යානය ලබාගත් යෝගාවචරයා එය වශී බවට පමුණුවා දෙවැනි ධ්‍යානය සඳහා විතර්ක විචාර ධ්‍යානාංග දෙක එකවර ඉක්මවා යන නොහැකිව විතර්කය පමණක් ඉක්මවා දෙවැනි ධ්‍යානයට පමවදී විචාරය ඉක්මවා තෙවැනි ධ්‍යානයට ද, ප්‍රීතිය ඉක්මවා සතරවැනි ධ්‍යානයටද සුඛය ඉක්මවා පස්වැනි ධ්‍යානයටද යායුතු වන බැවින් රූපාවචර ධ්‍යාන පසක්ම වෙති.

6. චතුෂ්ක ධ්‍යාන ක්‍රමය - විතර්ක විචාර ධ්‍යානාංග දෙකම එකවර ඉක්මවන ප්‍රථම ධ්‍යාන ලාභියාට රූපධ්‍යාන සතරකින් සම්පූර්ණ වේ. එය චතුෂ්ක ධ්‍යාන ක්‍රමයයි.

7. ගෝත්‍රභූ - රූපාරූප ධ්‍යාන වීථීන්හිදි කාමාවචර ගෝත්‍රය ඉක්මවා මහග්ගත ගෝත්‍රයට පැමිණ වන සන්ධිස්ථානය බැවිනුත්, සෝවාන් මාර්ග වීථියේදි පෘථග්ජන ගෝත්‍රය ඉක්මවා ආර්ය ගෝත්‍රයට පැමිණ වන සන්ධිස්ථානය බැවිනුත් ගෝත්‍රභූ නම් වේ.

8. සුඤ්ඤත - අප්පණිහිත - අනිමිත්ත, - මාර්ග ඵල චිත්තයන්ට නිර්වාණ ධාතුව අරමුණු වන්නා වූ, ලක්ෂණ තුනකි. ප්‍රඥාඉන්ද්‍රිය අධික ආර්යන්හට සුඤ්ඤත ලක්ෂණයෙන්ද සමාධින්ද්‍රිය අධිකයනට අප්පණිහිත ලක්ෂණයෙන්ද, සද්ධින්ද්‍රිය අධිකයනට අනිමිත්ත ලක්ෂණයෙන් ද නිර්වාණ ධාතුව අරමුණු වන්නේය.

**අංක 07 සැප්තැම්බර් භාවනා පාඩම**

| | |
|---|---|
| 100 බැගින් 18 දෙනයි | 1800.00 |
| සුමේධා පනාගොඩ මයා | 1200.00 |
| රත්නා වැලිවත්ත මිය | 250.00 |
| ශම් ප්‍රිය තොටමුණ කුමරු | 200.00 |
| K. මුණාවීර මිය | 50.00 |
| | 3500.00 |

**රු. 100 බැගින් දයකවූ පින්වතුන්**

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | R. R. M. බුද්ධදාස | 2. | වෛද්‍ය හ සමරසේකර | 3. | විමලා ෆොන්සේකා |
| 4. | S. අබේවර්ධන | 5. | M.K. පෙරේරා | 6. | K. A. D. ප්‍රේමවති |
| 7. | ශ්‍රියා කරුණාධාර | 8. | G. තිලකරත්න | 9. | B. කල්‍යානරත්න |
| 10. | පත්මා කරුණාරත්න | 11. | අනුලා ද සිල්වා | 12. | රෝහිණි බියට්‍රිස් |
| 13. | N.P. විජේසිංහ | 14. | J.W. ප්‍රේමවති | 15. | R.P.K පීරිස් |
| 16. | W.D.C. ගුණතිලක | 17. | C. අතපත්තු | 18. | K.W.D. ගුණතිලක |

ඉහත සඳහන් පින්වතුන් පිරිස ධර්මාවබෝධය හා සුවසේ නිර්වාණාවබෝධය පිණිස
**අංක 08 ඔක්තෝබර් භාවනා පාඩම,**
මහරගම පමුණුව පදිංචිව සිට පරලොව සැපත්
**D. M. කදනාරච්චි මහත්මාණන්ට**
ඒ පිණිස පවුලේ අය විසින් ධර්ම දානය සඳහා.
නුගේගොඩ ගංගොඩවිල 37 යෝජනා මාවතේ
වැසියර ප්‍රින්ටින් සියාමිස් මුද්‍රණය කරවා ධර්මදානය සඳහා පරිත්‍යාග ලදී.


**රාජ්‍ය සේවා බෞද්ධ සංගමය**
**මහවැලි සංවර්ධන අමාත්‍යාංශය**
**500, ටී.බී. ජයාමාවත**
**කොළඹ 10 25 42 -**
**බිනර / 1999 ඔක්තෝම්බර් 06**

අභිධර්ම විපස්සනා භාවනා පාඩම අංක - 09

## අභිධර්මාර්ථ සංග්‍රහ - විථිකාණ්ඩ විභාග සංග්‍රහ - 05

## අති පූජ්‍ය නා උයනේ අරිය ධම්ම නා හිමිපාණන් වහන්සේ විසින්

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!

1. චක්ඛුද්වාරයට රූප අරමුණක් ආපාතගත වූ කල්හි ඒ සම්බන්ධව ඇලීම් ගැටීම් මුලාවීමාදියක් හෝ පැහැදීම් අනිත්‍යාදී අවබෝධයක් ලැබීම පිණිස චක්ඛු ද්වාරික චිත්ත විථියක් සහිත මනෝද්වාරික චිත්ත වීථි සතරක්ද අනුපිළිවෙළින් පහළවන්නාහ.

2. චක්ඛුද්වාරික චිත්ත් වීථිය වර්‍තමාන රූපාරම්මණය අරමුණු කොට කුශල හෝ අකුශල හෝ ජවන විථියක් වශයෙන් පවත්නේය. ඉන්පසු එම ඇසින් දුටු, ඉක්මගිය රූපය අරමුණු කොට අතීතාරම්මණ මනෝද්වාරික චිත්ත වීථිය පහළ වන්නේය.

3. තෙවනුව එම රූප අරමුණෙහි නීල පීතාදී ලක්ෂණ අරමුණු කෙරෙන සුද්ධ මනෝද්වාරික චිත්ත වීථිය පහළ වන්නේය. සතරවැනිව ස්ත්‍රී පුරුෂ සත්ව පුද්ගල අවිඤ්ඤාණක සවිඤ්ඤාණක වස්තු සම්මුති පරමාර්ථ අරමුණු කෙරෙන සුද්ධ මනෝද්වාරික චිත්ත වීථියක් පහළ වන්නේය.

4. පස්වැනිව සුද්ධ මනෝද්වාරික චිත්ත වීථියෙන් වනාහි අයෝනිසෝ මනසිකාරය අනුව ප්‍රිය අරමුණෙහි ඇලීමද අප්‍රිය අරමුණෙහි ගැටීම ද ක්‍රෝධය ඊර්ෂ්‍යාව මාත්ශර්යය විචිකිච්ඡාදිය ද, යෝනිසෝ මනසිකාරය අනුව ශ්‍රද්ධාව ප්‍රසාදය- කරුණාව- මෛත්‍රිය -දයාව- අනුකම්පාව- හිරිය - ඔත්තප්පය- සතිය- සංවරය - ඥානය - ගුණය- අනිත්‍යාදී මනසිකාරය යනාදිය පහළ වන්නේය.

5. **චක්ඛුද්වාරික අතිමහන්තාරම්මණ විථිය 1**

| තී | න | ද | ප | ච | සං | ණ | වො | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | ත | ත | ත |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |

මෙහි පූර්ව-අපර භවංගයෝ පඤ්චවෝකාර භවංග පසළොස වන්නාහ. විථි සිත් දොළසට වර්තමාන රූපය අරමුණ වන්නේය. රූපී බ්‍රහ්මයන්හට තදරම්මණ නොමැතිවද කාමාවචර සත්ත්වයන්හට තදරම්මණ සහිතවත් පහළ වන්නේය.

6. **තදනුවත්තක අතීතාරම්මණ මනෝද්වාරික විථිය 2**

| තී | න | ද | ම | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | ත | ත | ත |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |

පූර්වාපර භවංගයෝ පඤ්චවෝකාර පසළොස් භවංගයෝම වෙති. තදරම්මණ සහිතව ද රහිතවද ලැබෙන්නේය. වීථි චිත්තයන්හට වනාහි චක්ඛුද්වාරික චිත්තවීථියට අරමුණු වී ඉකුත්ව ගියා වූ අතීත රූපාරම්මණය අරමුණු වන්නේය.

7. **නාම ප්‍රඥප්තිය අරමුණු කෙරෙන මනෝද්වාරික විථිය. 3**

| තී | න | ද | ම | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | ත | ත | ත |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |

පෙරසේම තදරම්මණ නැතිව පහළවන්නේය. භවංගයෝද පෙර සේමය, මෙම ජවන විථියෙන් වනාහි තදනුවත්තක විථියෙන් අරමුණු කරන ලද අතීත රූප අරමුණ පිළිබඳ නිල්පාට කහපාට ලේපාට සුදු පාට ආදියද හැඩහුරු කම් ද පුරුදු සංඥ අනුව දැන ගැනීම සිදුවන්නේය.

8. **අර්තග්‍රහණ සුද්ධ මනෝද්වාර වීථිය 4**

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | න | ද | ම | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | භ | භ | භ |
| 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |

තදරම්මණ නැතිව පහළ වන මේ සතර වැනි මනෝද්වාරික වීථියෙන් වනාහි, පූර්ව ජවන වීථි තුනෙන් දක්නාලද දන්නාලද පිරිසිඳින ලද රූප අරමුණ අනුව, මේ ස්ත්‍රිය - පුරුෂයාය, යානය, වාහනය, ඇඳුමය ආභරණය, මුදලය යනාදි වශයෙන් තම තමන්ගේ සංඥව පදිරි දැන ගැනීම සිදුවන්නේය.

9. **රජ්ජනාදී සුද්ධ මනෝද්වාර වීථිය 5**

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | න | ද | ම | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | භ | භ | භ |
| 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |

පෙර සේ තදරම්මණ නැතිව පහළවන පස්වැනි වූ මේ වීථියෙන් වනාහි ප්‍රියමනාප වශයෙන් ගෙන තණ්හා දිට්ඨි මානාදියද, අප්‍රිය අමනාප වශයෙන් ගෙන ද්වේශ ඊර්ෂ්‍යා මාත්ශර්යාදියද, යෝනිසෝ මනසිකාර වශයෙන් ගෙන ශ්‍රද්ධා ප්‍රඥ කරුණා මෛත්‍රී ආදියද පහළවීම වන්නේය.

10. **අතිමහන්තාරම්මණ සෝතද්වාරික වීථිය 1**

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | න | ද | ප | සො | සං | ති | වො | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | ත | ත | භ | භ | භ |
| 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |

ඉපදී එක චිත්තක්ෂණයක් ඉකුත් වූ අරමුණෙහි අතිමහන්තාම්මණ සෝතද්වාරික චිත්ත වීථිය පහළවන්නේය. පූර්වාපර භවංගයෝ පඤ්චවෝකාර භවංග පසළොසට අයත් වන්නාහ. වීථි සිත් දහතරට වර්තමාන ශබ්දරූපය අරමුණු වන්නේය.

11. **තදනුවත්තක මනෝද්වාර වීථිය 2**

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | න | ද | ම | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | භ | භ | භ |
| 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |

පූර්වාපර භවංගයෝ පෙරසේමය, තදරම්මණ ඇතිවද නැතිවද පහළ වන්නේය. වීථි සිත් අට දෙනාට වනාහි පළමු සෝතද්වාර වීථියෙන් අසන ලද අතීත ශබ්දරම්මණය අරමුණු වන්නේය.

12. **ප්‍රඥප්ති ග්‍රහන සුද්ධ මනෝද්වාර වීථිය 3**

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | න | ද | ම | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | භ | භ | භ |
| 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |

ඉහත ජවන් වීථි දෙකින් අසන ලද දැනගන්නා ලද ශබ්ද අරමුණෙහි නම් ගම් ආදී ප්‍රඥප්තිය මේ තුන්වැනි වීථියෙන් අරමුණු කරනු ලබන්නේය, ප්‍රඥප්ති අරමුණක් ගන්නා බැවින් මේ වීථියට තදරම්මණ සිත් පහළ නොවන්නාහ.

13 **අර්ථග්‍රහණ සුද්ධ මනෝද්වාර වීථිය 4**

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | න | ද | ම | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | භ | භ | භ |
| 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |

පළමු ජවන් වීථි තුනෙන් ගන්නා ලද ශබ්ද අරමුණෙහි ලෝක සම්මුති අර්ථය ද නාම රූප ස්කන්ධ පඨවි ඵස්ස වේදනාදී පරමාර්ථය ද අරමුණු කෙරෙනුයේ මේ සතර වැනි ජවන වීථියෙති. මෙහිද තදරම්මණ නූපදිනුයේ පරමාර්ථ ධර්ම අරමුනු වන බැවිනි.

14. **රජ්ජනාදී සුද්ධ මනෝද්වාර වීථිය 5**

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | න | ද | ම | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | භ | භ | භ |
| 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |

පළමුව පේළියට පහළ වූ ජවන වීථි සතරෙන් ගන්නා ලද ශබ්ද - නාමසම්මුති - පරමාර්ථ අතුරෙන් යමක් අරමුණු කෙරෙන, මෙම පස්වෙනි ජවන වීථියෙන්ම වනාහි, අකුශල් වශයෙන් තණ්හා දිට්ඨි මාන ඇලීම් ගැටීම් මුළාවීම් ආදිය ද, කුශල් වශයෙන් ශ්‍රද්ධා ප්‍රඥා කරුණා මෛත්‍රී ක්ෂාන්ති සංවරාදිය ද පහළ වීම් සිදු වන්නේය.

15. පඤ්චද්වාරික ජවන වීථීන්හි දී වොත්ථපන චිත්තයද මනෝද්වාරික ජවන වීථීන්හි දී මනෝද්වාරාවර්ජන චිත්තයද යෝනිසෝ මනසිකාර-අයෝනිසෝ මනසිකාර වශයෙන් පවත්නේය. චක්ෂුද්වාරාදී පඤ්චද්වාරය අතුරෙන් එක් දොරටුවකට රූපාදී යම් යම් අරමුණක් ආපාත ගත වූ කල්හි චිත්තවීථි වාර පසක් බැගින් පහළ වී කුශල් හෝ අකුශල් සිදු වන්නේය.

16. යෝනිසෝ මනසිකාර වශයෙන් වොත්ථපන චිත්තය කුශල ජවන වීථියකට හරවන්නේය, අයොනිසෝ මනසිකාර වශයෙන් වොත්ථපන චිත්තය අකුශල ජවන වීථියකට හරවන්නේය. මනෝද්වාර වීථියේ දී වනාහි මනෝද්වාරාවර්ජන චිත්තය එසේම කුශල-අකුශල ජවන වීථියකට හරවන්නේය.

17. ඝානද්වාරික වීථි- ජිව්හාද්වාරික වීථි- කායද්වාරික වීථි සම්බන්ධයෙන් වනාහි සෝතද්වාරික- චක්ෂුද්වාරික චිත්ත වීථි අනුවම තේරුම් ගත යුතු වන්නේය. පළමු චිත්ත වීථියෙන් වර්තමාන අරමුණු ගන්නේය. දෙවැනිව මනෝද්වාර වීථියෙන් එම අතීත වූ අරමුණ ගන්නේය. තුන්වැනි වීථියෙන් නම් ගම් හැඩහුරුකම් ආදී ප්‍රඥප්තිය ගන්නේය. සතරවැනි වීථියෙන් සම්මුති අර්ථය ද පරමාර්ථය ද අරමුණු කෙරෙන්නේය. පස්වැනි වීථියෙන් ම ඇලීම් ගැටීම් ආදී අකුශල පාක්ෂික ධර්ම ද ශ්‍රද්ධා ප්‍රඥාදී කුශල පාක්ෂික ධර්ම ද ලැබෙන්නාහ.

18. **අභිඥා වීථි**

ලෞකික අභිඥා සියල්ල රූපාවචර චතුර්ථධ්‍යාන සම්ප්‍රයුක්ත වන්නාහ. පඤ්චකධ්‍යාන වශයෙන් වනාහි පඤ්චමධ්‍යාන සම්ප්‍රයුක්තද වන්නාහ. චතුෂ්ක නය ක්‍රමයෙන් අෂ්ට සමාපත්ති ලාභීවූද පඤ්චක නය ක්‍රමයෙන් සමාපත්ති නවයක් ලාභීවූද යමෙක් ලෞකික අභිඥා ප්‍රතිලාභය සඳහා චුද්දසාකාරයෙන් කසිණ-ධ්‍යාන වශිතාව පුරුදුකළ යුතු වන්නේය.

19. **ඉද්ධිවිධං දිබ්බසෝතං - පරචිත්ත විජානනා,**
**පුබ්බේ නිවාසානුස්සති - දිබ්බචක්ඛුති පඤ්චධා**
**(ධම්ම සංගණී අනුටීකා)**

ඍද්ධිවිද අභිඥාවය, දිව්‍යශ්‍රෝත්‍ර අභිඥාවය, චේතොපරිය අභිඥාවය, පූර්වේ නිවාසානුස්මෘති අභිඥාවය, දිව්‍ය චක්ෂු අභිඥාවයයි අභිඥාව පස්වැදෑරුම් වන්නේය.

20. ඔවුනතුරෙන් ඍද්ධිවිධ අභිඥාව වනාහි අධිෂ්ඨාන ඍද්ධිය විකුර්වණ ඍද්ධිය - මනෝමය ඍද්ධියයි තෙවැදෑරුම් වන්නේය. තමන් වෙනසක් නොවී අදිෂ්ඨාන බලයෙන යම් යම් දේ මවාපෑමේ ඍද්ධිය අෂ්ඨානා ඍද්ධියයි. තමන් නොයෙකුත් ආකාරයෙන් ඉරියව් පැවැත්වීම විකුර්වණ ඍද්ධියයි. තමන් හා සමාන ආත්මභාව මවා පෑම මනෝමය ඍද්ධිය නම් වන්නේය.

21. අධිෂ්ඨාන ඍද්ධිවිධ අභිඥ වීථිය

| භ | න | ද | ම | ප | උ | නු | ගෝ | ධ්‍යා | භ | භ | භ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |

මෙහි පූර්වාපර භවංගයෝ පඤ්චවෝකාර ත්‍රිහේතුක භවංග නවදෙනා වන්නාහ. වීථි සිත් සදෙනාට අරමුණ නම් මවා පෑ යුතු වන ඇත් අස් ආදී යම් කිසි රූප අරමුනක්ම වන්නේය.

22. අධිෂ්ඨාන ඍද්ධියෙන් යමක් මවා පෑමට වනාහි පඨවි කසිණ ආපෝකසිණ වායෝකසිණාදී පටිභාග නිමිත්ත අරමුණෙහි රූපාවචර චතුර්ථ ධ්‍යානයට සමවැදී ඉන් නැගී ධ්‍යානාංග ආවර්ජනා කොට ඉන් අනතුරුව නැවතත් එම චතුර්ථ ධ්‍යානයට සමවැදී ඉන් නැගී මවනු කැමති දේ අරමුණු කොට අධිෂ්ඨාන කළ යුත්තේය. තෙවැනිව ද එම චතුර්ථ ධ්‍යානයට සමවැදී ඉන් නැගී ධ්‍යානාංග බලා අධිෂ්ඨාන කොට සතරවැනිව අර්පනාව එකම චිත්තක්ෂණයක්මය. ඒ සමගම පෙරපසු නොවී මවා පෑ යුතු දේ මැවෙන්නේය. පළමුව අදිෂ්ඨාන කළ කාලය තුල මවා පෑදෙය පවත්නේය.

23. මෙහි දී පළමුවැනි දෙවැනි තුන්වැනි වරටත් සමවන් චතුර්ථ ධ්‍යාන තුනම පාදක ධ්‍යානය නම් වන්නාහ. සතරවැනි චතුර්ථ ධ්‍යානයම ඍද්ධිවිධ අභිඥව නම් වන්නේය. අදිෂ්ඨාන කිරීම වනාහි ක්ෂීණශ්‍රවයන් වහන්සේලාට ත්‍රිහේතුක කාම ක්‍රියා ජවනයෙන් ද ශෛක්ෂ්‍ය පෘථග්ජන යෝගාවචරයනට ත්‍රිහේතුක කාම කුශල ජවනයෙන් ද සිදුවන්නේය.

24. විකුර්වණ ඍද්ධියෙන් ද මනෝමය ඍද්ධියෙන්ද ඍද්ධිවිධ අභිඥවේදී පාදක ධ්‍යාන වාර තුනක්ද අධිෂ්ඨාන කාමාවචර කුශල - ක්‍රියා ජවනයද සතරවැනි අභිඥ අර්පණාවද පෙර සේම අනුපිලිවෙලින් කළ යුතු වන්නේය.

25. දිව්‍යශ්‍රෝත - චේතෝපරිය - පූර්වේනිවාස- දිව්‍යචක්ෂු අභිඥවන් පිණිස වනාහි තේජෝ කසිණ - ඕදාත කසිණ - ආලෝක කසිණ තුනෙන් ලත් පටිභාග නිමිත්ත අරමුණෙහි චතුර්ථ ධ්‍යාන ආලෝකය අත්‍යාවශ්‍ය වන්නේය.

26. පාදකධ්‍යාන තුන්වාරය අනු පිළිවෙළින් සමවැදී 'දුර වූද ළඟවූද ශබ්දය අසන්නෙමි' යි පරිකර්ම සිතින් අදිටන් කිරීමෙන් සතරවැනි අභිඥ අර්පණාවෙන් දිව්‍යශ්‍රෝත අභිඥව සඵල වන්නේය. 'අසවලාගේ සිත- මොහුගේ සිත දැනගන්නෙමි' යි පරිකර්ම සිතින් අදිටන් කොට සතර වැනි චතුර්ථ ධ්‍යාන අර්පනාවෙන් චේතොපරිය අභිඥව සමෘද්ධ වන්නේය.

27. 'පෙරවිසූ ආත්ම භාවය දැනගන්නෙමියි' පරිකර්ම කොට සතරවැනි චතුර්ථ ධ්‍යාන අර්පණාවෙන් පූර්වේනිවාසානුස්මෘති අභිඥව සමෘද්ධ වන්නේය. 'දුරවූද ළඟ වූද වැසුනාවූ ද රූප අරමුණ දකින්නෙමි'යි පරිකර්ම සිතින් අදිටන් කිරීමෙන් අනතුරුව සතරවැනිව ලැබෙන චතුර්ථ ධ්‍යාන අර්පනාවෙන් දිව්‍ය චක්ෂු අභිඥව සමෘද්ධවන්නේය.

28. මෙහිදී පාදකධ්‍යාන වීථිවාර සමාපත්ති වීථිවාරයට සමානය, පරිකර්ම නම් වූ අදිෂ්ඨාන වීථිය මනෝද්වාරික ත්‍රිහේතුක මහාකුශල මහා ක්‍රියා ජවනයට සමානය, අභිඥ, වීථිය වනාහි තීක්ෂණ ප්‍රාඥයනට මනෝද්වාරාවර්ජන- උපචාර අනුලෝම - ගෝත්‍රභූ ධ්‍යාන, නමින්ද, මන්දප්‍රාඥයනට මනෝද්වාරාවර්ජන - පරිකර්ම - උපචාර- අනුලෝම ගෝත්‍රභූ ධ්‍යාන නමින්ද පහළ වන්නේය.

29. තවද දිව්‍ය චක්ෂු අභිඥව වනාහි අනාගතංස ඥාන යථාකම්මූපග ඥාණ නමින් තවත් කොටස් දෙකකට බෙදෙන්නේය, එසේ කල්හි ලෞකික අභිඥ සත්දෙනෙක්ම වන්නාහ. ක්ෂීණශ්‍රවයන් වහන්සේලාට ක්‍රියාභිඥ සත් දෙනෙක් ද ශෛක්ෂ්‍ය පෘථග්ජන අභිඥ

ලාභීන්ට කුශලාභිඥ සත් දෙනෙක්දැයි දහතර වැදැරුම් ද වන්නාහ. නැවත මන්ද ප්‍රාඥ තීක්ෂණ ප්‍රාඥ දෙකෙන් වැඩි වී අටවිසි වැදැරුම් ද වන්නාහ.

30. ලෞකික අභිඥ ලාභීන් විසින් වනාහි උදයව්‍යායාදී විදර්ශනා ඥාන වඩා සංස්කාරයන් ගේ අනිත්‍යාදී ලක්ෂණ සර්වාකාරයෙන් අවබෝධ කොට ගෙනම අභිඥ පරිහරණය කළ යුතු වන්නේය.

**ත්‍රිලක්ෂණ විදර්ශනාව**

1. චිත්ත වීථි විදර්ශනා විභාග භාවනාවේදී පහළ වූ චිත්ත චෛතසික භූතරූප උපාද රූප සංඛ්‍යාත නාම රූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්මයෝ ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝය.
2. ඇතිවීම නැති වීම දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝය.
3. තම තමන් කැමති ලෙස නොපැවතී බැවින් අනාත්මයෝය.
4. මෙසේ අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්මක වූ චිත්ත චෛතසික භූතරූප උපාද රූප සංඛ්‍යාත නාම රූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන සංඛත සන්තාප විපරිනාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේය.
5. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව ආයූහණ නිදන සංයෝග පළිබෝධාර්තයෙන් සමන්ගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේය.
6. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ විවේක අසංඛත අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකානත්යෙන් නිරෝධ සත්‍යය නම් වන්නේය.
7. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතුවූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය නියයාත හේතු දස්සන ආධිපතෙය්‍යාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේය.
8. මාගේ භාවනාමය කුශලානිසංස ධර්මය මෙම චතුරාර්ය සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිසම හේතු වේවා වාසනා වේවා

සාධු. සාධු. සාධු.

**පදවිවරණය**

| | | | |
|---|---|---|---|
| 1. | තදනුවත්තක වීථිය | - | චක්ෂුරාදී ද්වාරයකට අරමුණු වූ රූපාදී අරමුණක් අනුව මනෝද්වාරයෙහි පහළවන චිත්ත වීථියයි. |
| 2. | නාම ප්‍රඥප්ති | - | සචේතනිකවූද අචේතනිකවූද සෑම වස්තුවකටම ලෝකවාසීන් විසින් ඒ ඒ භාෂාවෙන් සම්මත කරන ලද නම් ගම් ආදි සම්මුතියයි. |
| 3. | අර්ථග්‍රහන | - | ඒ ඒ නමින් භාවිතා කෙරෙන ද්‍රව්‍යයන්ගේත් පුද්ගලයන්ගේත් ප්‍රකටව පෙනෙන විශේෂත්වය වන සම්මුති අර්ථයත්. නාම රූප ස්කන්ධාදී වශයෙන් ගැනෙන පරමාර්ථයත් අරමුණු කිරීම අර්ථග්‍රහණයයි. |
| 4. | රජ්ජනාදී | - | ඇලීම් ගැටීම් මුළාවීම්, පැහැදීම් අවබෝධ වීම් සංවරවීම් මෙන් කරුණා මුදිතා උපෙක්ඛාදියත් පහළ වන වීථිය. |
| 5. | අභිඥ | - | මනුෂ්‍යමය ප්‍රඥව ඉක්මවා දිව්‍යමය-බ්‍රහ්මමය තත්වයෙන් පිහිටනා ප්‍රඥ විශේෂය අභිඥ නම් වේ. |

6. වුද්දසාකාර චිත්ත පරිදමනය නම් වූ වශිතාව -දශකසින චධා අෂ්ඨ සමාපත්ති ලාභී යෝගාවචර යන් විසින් ප්‍රගුණ කළ යුතු වශීතා තුදුසකි

| | | |
|---|---|---|
| 1-කසිණනුලෝම | 2. කසිණ ප්‍රතිලෝම | 3. කසිණානු ලෝම කසිණ ප්‍රතිලෝම, |
| 4. ධ්‍යානානුලෝම, | 5. ධ්‍යානප්‍රතිලෝම, | 6. ධ්‍යානානුලෝම ධ්‍යාන ප්‍රතිලෝම |
| 7. ධ්‍යානුක්කන්තික. | 8. කසිනුක්කන්තික. | 9. ධ්‍යාන කසිණුක්කන්තික. |
| 10. අංගසංකන්ති. | 11. ආරම්මණ සංකන්ති. | 12. අංගාරම්මණ සංකන්ති. |
| 13. අංගව්‍යවස්ථාපන | 14. ආරම්මණ ව්‍යවස්ථාපන. | |

යනු වුද්දසාකාර වශීතාවයි.

7. පාදක ධ්‍යාන - අභිඥවට පළමුවෙන් සමවදිනු ලබන චතුර්ථධ්‍යානයයි.

8. පරිකර්ම ජවනය - පාදක ධ්‍යානයට අනතුරුව ඒ ඒ අභිඥවට අනුරූපව ඒ ඒ දේ සමෘද්ධවීම පිණිස අධිෂ්ඨාන කෙරෙන ජවන චිත්ත විථියයි.


රා. සේ. බෞද්ධ සංගමය මගින් මහජන පුස්තකාලයේ
පැවැත් වෙන භාවනා පන්තියේ

| | |
|---|---|
| වෛද්‍ය රානි ප්‍රනාන්දු මිය | 1000.00 |
| ශීලා පෙරේරා මිය | 1000.00 |
| වෛද්‍ය එන් සමරසේකර මිය | 500.00 |
| B. අනුලාද සිල්වා මිය | 500.00 |
| B. පදුමාද සිල්වා මිය | 500.00 |

යන මහත්මාවන් විසින්

නුගේගොඩ ගංගොඩවිල 37 සෝරත මාවතේ
පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස්හි
මුද්‍රණය කරවා ධර්ම දානය පිණිස
නිකුත් කරන ලදී.

රාජ්‍ය සේවා බෞද්ධ සංගමය
මහවැලි සංවර්ධන අමාත්‍යාංශය
500 ටී. බී. ජයා මාවත කොළඹ 10
2452 - නිකිණි 1999 සැප්තැම්බර් 01

**අභිධර්ම විපස්සනා භාවනා පාඩම අංක - 10**

**අභිධර්මාර්ථ සංග්‍රහය - වීථිමුක්ත සංග්‍රහ විභාගය - 01**

**අති පූජ්‍ය නා උයනේ අරිය ධම්ම නා හිමිපාණන් වහන්සේ විසින්**

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!

01. සදොරෙහි වීථි චිත්තයන් ගේ පැවැත්ම සම්බන්ධ වූ ප්‍රවෘත්ති සංග්‍රහය නම් වූ වීථි සංග්‍රහ විභාගයට අනතුරුව භවයෙහි ප්‍රතිසන්ධිය සම්බන්ධ වූ වීථිමුක්ත සංග්‍රහයෙහි, භූමි සතර ද, ප්‍රතිසන්ධි සතර ද, කර්ම සතර ද මරණෝත්පත්ති සතර දැයි සතර වැදෑරුම් සංග්‍රහය දතයුතු වන්නේ ය.

02. ඔවුනතුරෙන් අපාය භූමිය - කාමසුගති භූමිය - රූපාවචර භූමිය - අරූපාවචර භූමිය නමින් භූමිය සතර වැදෑරුම් වන්නේ ය. භූමි සතර අතුරෙන් අපාය භූමිය ද නිරය- තිරිසන් අපාය- ප්‍රේත අපාය - අසුර අපාය නමින් සතර වැදෑරුම් වන්නේ ය.

03. භූමි සතර අතුරෙන් කාමසුගති භූමිය, මනුෂ්‍ය ලෝකය ද, චාතුර්මහාරාජිකය ද, තාවතිංසය ද, යාමය ද තුසිතය ද,නිර්මාණරතිය ද, පරනිර්මිත වසවර්තිය දැයි සත් වැදෑරුම් වන්නේ ය. අපාය භූමි සතර ද කාමසුගති භූමි සත ද යන එකොළොස් භූමිය කාමාවචර භූමි සංඛ්‍යාවට ම ගැණෙන්නේ ය.

04. රූපාවචර භූමිය, ප්‍රථමධ්‍යාන භූමිය, ද්විතියධ්‍යාන භූමිය, තෘතියධ්‍යාන භූමිය, චතුර්ථධ්‍යාන භූමිය දැයි සතරාකාර වන්නේ ය. ඔවුනතුරෙන් ප්‍රථමධ්‍යාන භූමිය ද, බ්‍රහ්මපාරිජ්ජය- බ්‍රහ්මපුරෝහිතය - මහාබ්‍රහ්ම යනුවෙන් තුන් වැදෑරුම් වන්නේය. ද්වියධ්‍යාන භූමිය ද, පරිත්තාභ - අප්පමාණාභ - ආභස්සර නමින් තුන් වැදෑරුම් වන්නේ ය. තෘතියධ්‍යාන භූමිය ද, පරිත්තසුභ - අප්පමාණසුභ - සුභකිණ්ණක නමින් තුන් වැදෑරුම් වන්නේ ය. චතුර්ථධ්‍යාන භූමිය ද, වේහප්ඵල - අසඤ්ඤසත්ත - පඤ්ච සුද්ධාවාස නමින් සත් වැදෑරුම් වන්නේ ය. අවිහ - අතප්ප - සුදස්ස - සුදස්සී - අකනිට්ඨ නමින් සුද්ධාවාස භූමිය ද පස් වැදෑරුම් වන්නේ ය. මෙසේ රූපාවචර භූමිය සොළොස් වැදෑරුම් වන්නේ ය.

05. අරූපාවචර භූමියද, ආකාසානඤ්චායතනය- විඤ්ඤාණඤ්චායතනය - ආකිඤ්චඤ්ඤායතනය -නේවසඤ්ඤානාසඤ්ඤායතනය නමින් සතර වැදෑරුම් වන්නේ ය. මෙසේ කාමාවචර භූමි එකොළොසය- රූපාවචර භූමි සොළොසය - අරූපාවචර භූමි සතර යැයි භූමි සියල්ල එක්තිසක් වන්නේ ය.

06. සතර අපාය අතුරෙන් නිරය භූමිය වනාහි, එකසිය සතිස් වැදෑරුම් වන්නේ ය. සංජීවය - කාලසූත්‍රය - සංඝාතය - රෞරවය - මහාරෞරවය - තාපය - ප්‍රතාපය - අවීචිය යනුවෙන් මහානිරය අට වැදෑරුම් වන්නේ ය. වේතරණී නරකය - අසිපත්‍ර නරකය - කුක්කුල නරකය - ගූථකූප නරකය නමින් එක් මහා නරකයක එක් දිශාවක ඔසුපත් නරක සතර බැගින් සතර දිශාවෙහිම ඔසුපත් නරක සොළසක් ඇත්තාහ. ඒ අනුව අට මහ නරකයන් ගේ සතර දිශාවෙහි ඔසුපත් නරක එකසිය අටවිස්සක්වන්නාහ.

07. මිහිතලයෙන් යොදුන් පසළොස් දහසකට යටින් සංජීව මහානිරය ද, එයින් යට පසළොස් දහසින් පසළොස් දහසින් යට අනුපිළිවෙලින් ඉතිරි මහානිරය සත ද පිහිටා ඇත්තාහ. එක් එක් මහානිරයක් දිගින් පළලින් උසින් යොදුන් සියය බැගින් ද එක එක ඔසුපත් නරකයක් දිගින් පළලින් උසින් යොදුන් පණස බැගින් ද ප්‍රමාණ වන්නාහ.

08. දශ අකුශල කර්මපථ - පඤ්චානන්තර්යකර්ම - නියත මිසිදිටු හේතුවෙන් ද නිරයෙහි ප්‍රතිසන්ධි ගන්නා වූ නිරිසතුන් ගේ කර්මයම ආයුෂ වන අතර, එක් එක් මහා නිරයකට ආයුෂ් ප්‍රමාණය ද එකිනෙකට අධිකව ඇත්තේ ය. ඒ කෙසේ ද යත්, චාතුර්මහාරාජිකයේ දිව්‍යවර්ෂ පන්සියය හෙවත් මිනිස්ලොව වර්ෂ අනූලක්ෂය සංජීව නිරයට එක් දිනකි. එවැනි දින තිසක් මාසයකි, එවැනි මාස දොළසක් වර්ෂයකි, එවැනි වර්ෂ පන්සියයක් සංජීව නිරයේ ආයුෂ වන්නේ ය. මනුෂ්‍ය වර්ෂ ප්‍රමාණයෙන් වනාහි වර්ෂ  එක්ලක්ෂ හැටදෙදාස් කෝටියක් පමණ වන්නේ ය.

09. තාවතිසංයෙහි දිව්‍යවර්ෂ දහස හෙවත් මනුෂ්‍ය වර්ෂ තුන්කෝටි සැටලක්ෂය කාලසූත්‍ර නිරයේ එක් දිනකි. එවැනි දින තිසක් මාසයකි, මාස දොළස අවුරුද්දකි, එවැනි වර්ෂ දහසක් එහි ආයුෂ වන්නේ ය. මිනිස් ගණනින් වර්ෂ දොළොස් ලක්ෂ අනූහයදහස් කෝටියකි.

10. යාම දෙව්ලොව දිව්‍ය වර්ෂ දෙදහස හෙවත් මනුෂය වර්ෂ දාහතර කෝටි සතලිස් ලක්ෂයක් සංඝාත නිරයට එක් දිනකි. එවැනි දින තිසක් මාසයකි, මාස දොළස වර්ෂයකි. එවැනි වර්ෂ දෙදහසක් එහි පරමායුෂ වන් නේය. මිනිස් ගණනින් වනාහි වර්ෂ එක්ප්‍රකෝටි තුන් ලක්ෂ අටසැට කෝටියකි.

11. තුසිත දෙව්ලොව දිව්‍ය වර්ෂ සාරදහස හෙවත් මනුෂය වර්ෂ සත් පණස්කෝටි සැට ලක්ෂය රෞවය නිරයේ එක් දිනකි. එවැනි දින තිසක් මාසයකි, එවැනි මාස දොළසක් වර්ෂයකි, එවැනි වර්ෂ සාරදහසක් රෞරව නිරයේ පරමායුෂ වන්නේ ය. මිනිස් ගණනින් වනාහි වර්ෂ ප්‍රකෝටි අටකුත් විසිනවලක්ෂ සූසාලිස්දහස් කෝටියකි.

12. නිර්මාණරති දෙව්ලොව දිව්‍ය වර්ෂ අටදහස හෙවත් මනුෂය වර්ෂ දෙසිය තිස්කෝටි සතලිස් ලක්ෂය මහා රෞරව නිරයට එක් දිනකි. එවැනි දින තිසක් මාසයකි, එවැනි මාස දොළස වර්ෂයකි, එවැනි වර්ෂ අටදහසක් මහාරෞරව නිරයේ පරමායුෂ වන්නේ ය. මිනිස් ගණනින් වනාහි ප්‍රකෝටි සසැටකුත් තිස්පන්ලක්ෂ දෙපණස් දහස්කෝටි වර්ෂයක් වන්නේ ය.

13. පරනිර්මිත වසවර්ති දෙව්ලොව දිව්‍ය වර්ෂ දහසය දාහක් හෙවත් මිනිස් ගණනින් වර්ෂ නවසිය විසිඑක් කෝටි සැට ලක්ෂයක් තාපන නිරයට එක් දිනකි. එවැනි දින තිසක් මාසයකි, එවැනි මාස දොළස වර්ෂයකි. එවැනි වර්ෂ දහසය දාහක් තාපන නිරයේ පරමායුෂ වන්නේ ය. මිනිස් ගණනින් වනාහි ප්‍රකෝටි පන්සිය තිසකුත් අසූ සාරලක්ෂ සොළොස් දහස් කෝටි වර්ෂයක් වන්නේය.

14. මහාතාපන නිරයේ පරමායුෂ වනාහි අන්තර කල්පයකින් අඩක් වන්නේ ය. අවීචි මහනිරයේ පරමායුෂ අන්තර කල්පයක් පමණ වන්නේ ය. අවීචි මහනිරය සතර දිග සිම්බලී වන නම් ඔසුපත් නිරයක් ද ඇත්තේ යයි දේව දූත සූත්‍රයේ සඳහන් වන්නේ ය. අටමහ නිරයෙහි ආයු නියමය වනාහි ධම්මහදය විභංග අනුටීකාවෙහි සඳහන් වන්නේ ය. නිරිසතුන් ගේ අකුශල කර්මාවසානයේදී වනාහි එයින් චූතවීම වන්නේය. ලෝක පඤ්ඤත්තිප්පකරණ පාලියෙහි ඇතැයි විපී බිම්බ ග්‍රන්ථයෙහි දැක් වූ පරිද්දෙන් නිරය අතර දූරප්‍රමාණය සඳහන් වන්නේ ය.

15. සතර දොරටුවෙහි සතර දෙනා බැගින් අටමහ නිරයෙහි යමදෙව් රජවරු දෙතිස් දෙනෙක් ඇත්තාහ. චාතුර්මහාරාජික දිව්‍ය සංඛ්‍යාවට ඇතුලත් වූ යමදෙව් රජවරු කුශලවිපාක අහේතුක- ද්විහේතුක - ත්‍රිහේතුක වශයෙන් ද පහළ වන්නාහ. තව්තිසා භවනයෙහි සිට අවීචිය දක්වා ඇත්තා වූ සියලු  සත්වයෝ වනාහි පෘථුවි නිශ්‍රිතයෝ නම් වන්නාහ.

යුගන්ධර පර්වත මත චාතුර්මහාරාජිකය ද, මහමෙර මත තාවතිංසය ද පිහිටා ඇති බැවිනි. තිරශ්චීන - ප්‍රේත - අසුරඅපාය යන තුන වනාහි පෘථුවි නිශ්‍රිතව පිහිටා ඇත්තාහ.

16. මහපොළොවේ සිට යොදුන් දෙසාලිස් දහසින් දෙසාලිස් දහසට මතු මත්තෙහි සදේව්ලොව පිහිටා ඇත්තාහ. ඔවුනතුරෙන් පළමු...නි චාතුර්මහාරාජික දෙව්ලොවට මිනිස් ගණනින් වසර පණසක් එක් දවසකි. එවැනි දින තිසක් මාසයකි. එවැනි මාස දොළසක් එක් වසරකි. දිව්‍ය වර්ෂ පන්සියයක් එහි පරමායුෂ වන්නේ ය. මිනිස් ගණනින් වර්ෂ අනූලක්ෂයක් වන්නේ ය.

17. තාවතිංස දෙව්ලොවට මිනිස් ගණනින් වර්ෂ සියයක් එක් දිනකි. එවැනි දින තිසක් මාසයකි. එවැනි මාස දොළසක් වර්ෂයකි, එවැනි දිව්‍ය වර්ෂ දහසක් එහි පරමායුෂ වන්නේ ය. මිනිස් ගණනින් වර්ෂ තුන් කෝටි සැට ලක්ෂයක් වන්නේ ය.

18. යාම දෙව්ලොවට මිනිස් ගණනින් වර්ෂ දෙසියයක් එක් දිනකි, එවැනි දින තිසක් මාසයකි, එවැනි මාස දොළසක් වර්ෂයකි දිව්‍ය වර්ෂ දෙදහසක් එහි පරමායුෂ වන්නේ ය. මිනිස් ගණනින් වර්ෂ දාහතර කෝටි සතලිස් ලක්ෂයකි.

19. තුසිත දෙව්ලොවට මිනිස් ගණනින් වර්ෂ සාරසියයක් එක දිනකි, එවැනි දින තිසක් මාසයකි. මාස දොළසක් වර්ෂයකි, එවැනි දිව්‍ය වර්ෂ සාරදහසක් එහි පරමායුෂ වන්නේ ය. මිනිස් ගණනින් සත්පණස් කෝටි සැට ලක්ෂ යක් වන්නේ ය.

20. නිර්මාණරති දෙව්ලොවට මිනිස් ගණනින් වර්ෂ අටසියයක් එක් දිනකි. එවැනි දින තිසක් මාසයකි, එවැනි මාස දොළසක් වර්ෂයකි, දිව්‍ය වර්ෂ අටදහසක් එහි පරමායුෂ වන්නේ ය. මිනිස් ගණනින් දෙසියතිස්කෝටි සතලිස් ලක්ෂයක් වන්නේ ය.

21. පරනිර්මිත වසවර්ති දෙව්ලොවට මිනිස් ගණනින් වර්ෂ එක්දහස් හයසියයක් එක් දිනකි, එවැනි දින තිසක් මාස යකි. එවැනි මාස දොළසක් වර්ෂයකි, එවැනි දිව්‍ය වර්ෂ දහසය දහසක් එහි පරමායුෂ වන්නේ ය. මිනිස් ගණනින් වර්ෂ නවසිය විසිඑක්කෝටි සැට ලක්ෂයක් වන්නේ ය.

22. මනුලොව සහ චාතුර්මහාරාජික දෙව්ලොව සුගති අහේතුක - ද්විහේතුක - ත්‍රිහේතුක - පුද්ගලයෝ ද, අෂ්ඨාර්ය පුද්ගලයෝ ද යන එකොළොස් පුද්ගලයෝ ඇත්තාහ. තාවතිංස - යාම - තුසිත - නිර්මාණරති - පරනිර්මිත වසවර්ති යන ඉතිරි දෙව්ලෝ පසෙහි අහේතුක පුද්ගලයා හැර අවශේෂ දශ පුද්ගලයෝ ලැබෙන්නාහ.

23. පරනිර්මිත වසවර්ති දෙව්ලොව සිට යොදුන් පණස්පන්ලක්ෂ අටදහසකින් මත්තෙහි ප්‍රථමධ්‍යාන බඹතල තුන පිහිටා ඇත්තාහ. එයින් මහාබ්‍රහ්ම තලය හාත්පසින් වටකොට බ්‍රහ්මපුරෝහිත බඹතලය ද, එය හාත්පසින් වට කොට බ්‍රහ්මපාරිසජ්ජ බඹතලය ද පිහිටා ඇත්තාහ. සරසින් යොදුන් පණස්පන්ලක්ෂ අටදහස බැගින්ම එකිනෙකට දුරින් පිහිටා ඇත්තාහ.

24. ඔවුනතුරෙන් පළමුවැනි බ්‍රහ්මපාරිසජ්ජ බඹතලයට ආයුෂ්ප්‍රමාණය වනාහි, අන්තර කල්ප විස්සක් පමණ වූ විවට්ටට්ඨායි අසංඛ්‍ය කල්පයෙන් තුනෙන් එකක් පමණ වන්නේ ය. දෙවැනි වූ බ්‍රහ්මපුරෝහිත බඹතලයට එම අසංඛ්‍ය කල්පයෙන් අඩක් පමණ ආයුෂ වන්නේ ය. තුන්වැනි වූ මහාබ්‍රහ්ම තලයට එක් අසංඛ්‍ය කල්පයක් පමණ ආයුෂ වන්නේ ය. එක් මහාකල්පයක සතරෙන් කොටස අසංඛ්‍ය කල්පය නමින් දත යුත්තේ ය. කල්ප විනාශවන වාරයක් පාසා මේ බඹතල තුන විනාශවන බැවින් මහාකල්ප ගණනින් ආයුෂ නොලැබෙන්නේ වේ.

25. ප්‍රථමධ්‍යාන බඹතලයෙන් යොදුන් පණස්පන්ලක්ෂ අටදහසකින් මත්තෙහි ද්විතීයධ්‍යාන බඹතල තුන පිහිටා ඇත්තාහ ඔවුනතුරෙන් පරිත්තාභ බඹතලයට මහාකල්ප දෙකක් ද, අප්පමාණාභ බඹතලයට මහාකල්ප සතරක් ද, ආභස්සර බඹතලයට මහාකල්ප අටක් ද ආයුෂ වන්නේ ය. ද්විතියධ්‍යාන භූමියෙහිම එක්නෙක වටකොට පිහිටීම ද, සරසින් එකිනෙකට දුරප්‍රමාණය ද ප්‍රථමධ්‍යාන භූමියෙහි මෙන් වන්නේ ය.

26. ද්විතියධ්‍යාන භූමියෙන් යොදුන් පණස්පන්ලක්ෂ අටදහසකින් මත්තෙහි තෘතියධ්‍යාන භූමිය පිහිටියේ ය. එහි ද පරිත්තසුභ බඹතලයට මහාකල්ප සොළසක් ද, අප්පමාණසුභ බඹතලයට මහාකල්ප දෙතිසක් ද, සුභකිණ්හක බඹතලයට මහාකල්ප සූසැටක් ද ආයුෂ වන්නේ ය. එකම භූමියෙහි පිහිටීම ද, සරසින් එකිනෙකට දුරප්‍රමාණය ද ප්‍රථමධ්‍යාන භූමියෙහි මෙන් වන්නේ ය.

27. තෘතියධ්‍යාන භූමියෙන් යොදුන් පණස්පන්ලක්ෂ අටදහසක් මත්තෙහි වේහප්ඵල බඹතලය ද, අසඤ්ඤසත්ත බඹතලය ද එකම භූමියක පිහිටා ඇත්තාහ. බඹතල දෙකටම මහාකල්ප පන්සියය බැගින් ආයුෂ වන්නේ ය. එකිනෙකට සරසින් දුරප්‍රමාණය ප්‍රථමධ්‍යාන භූමියෙහි මෙන් වන්නේ ය. අසඤ්ඤතලය හැර වේහප්ඵලය තෙක් බඹතල දහයෙහි ත්‍රිහේතුක පෘථුජ් ජන පුද්ගලයා ද, අෂ්ඨාර්ය පුද්ගලයෝ ද යන පුද්ගලයන් නව දෙනා ලැබෙන්නාහ. අසඤ්ඤතල යෙහි වනාහි එකම සුගති අහේතුක පුද්ගලයා ලැබෙන්නේ ය.

28. වේහප්ඵල බඹතලයෙන් මත්තෙහි අවිහය- අතප්පය - සුදස්සය -සුදස්සිය - අකනිට්ඨය නම් වූ පඤ්ච ශුද්ධාවාස භූමි පස, යොදුන් පණස්පන්ලක්ෂ අටදහස බැගින් එකිනෙකින් මතු මත්තෙහි පිහිටා ඇත්තාහ. ඔවුනතුරෙන් අවිහ බඹතලයට මහාකල්ප දහසක් ද, අතප්ප බඹතලයට මහාකල්ප දෙදහසක් ද, සුදද්ස බඹලයට මහාකල්ප සාරදහසක් ද, සුදස්සී බඹතලයට මහාකල්ප අටදහසක් ද, අකනිට්ඨ බඹතලයට මහා කල්ප සොළොස් දහසක් ද ආයුෂ වන්නේ ය. පඤ්ච සුද්ධාවාසයෙහි වනාහි අනාගාමි ඵලස්ථයාය අර්හත් මාර්ගස්ථ යාය ඵලස්ථයාය යන ආර්ය පුද්ගලයෝ තිදෙනා පමණක්ම ලැබෙන්නාහ.

29. අකනිටා බඹතලයෙන් මත්තෙහි සතරක් වූ අරූපී බඹතල වනාහි යොදුන් පණස්පන්ලක්ෂ අටදහසක් බැගින් එකිනෙකින් මත්තෙහි පිහිටා ඇත්තේ ය. ඔවුනතුරෙන් පළමුවැනි වූ ආකාසානඤ්චායතන භූමියට මහාකල්ප විසි දහසක් ද, විඤ්ඤාණඤ්චායතනය භූමියට මහාකල්ප සතලිස් දහසක් ද, ආකිඤ්චඤ්ඤායතන භූමියට මහාකල්ප සැට දහසක් ද, නේවසඤ්ඤානාසඤ්ඤායතන භූමියට මහා කල්පඅසූසාර දහසක් ද ආයුෂ වන්නේ ය. අරූප භූමි සතරෙහිම ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයා ද සෝවාන් මාර්ගස්ථයා හැර ආර්යයෝ සත් දෙන ද ලැබෙන්නාහ.

30. අනුරාධපුර ලෝහප්‍රාසාදය තරම් වූ ශෛලමය පර්වතයක් ප්‍රථමධ්‍යාන බඹතලයෙහි සිට මහපොළොවට හෙලන ලද්දේ වී නම් සාරමසකින් මිහිතලයට පතිත වන්නේ යයි ද, භවාග්‍රයෙහි සිට පාත් වන්නේ වී නම් වර්ෂ සතරකුත් එක්මාස සත්විසි දිනකින් මිහිතලයට පතිත වන්නේ යයි ද මහාසමය සූත්‍ර අර්ථකථාවෙහි සඳහන් වන්නේ ය. එම ශෛලමය පර්වතය පාත්වන වේගය වනාහි විනාඩියකදී යොදුන් දහතුනකින් තුනෙන් එකක් ද පැයකදී යොදුන් අටසියයක් ද, එක් දිනකදී යොදුන් අටසාලිස් දහසක් ද පමණ වන්නේ ය.

31. අවීචියෙහි සිට භවාග්‍රය තෙක් පැවති එක්තිස් භූමිතලයෙහි ද, ජාතික්ෂේත්‍ර දස දහසක් සක්වළ ද, ආඥාක්ෂේත්‍ර කෙළලක්ෂයක් සක්වළ ද, විෂයක්ෂේත්‍ර අනන්ත සක්වළ ද

විද්‍යමානවන්නා වූ නාමරූප - ස්කන්ධ - ආයතන- ධාතු පරමාර්ථ ධර්මයෝ ද ක්ෂණයක් ක්ෂණයක් පාසා සිදී සඳී බිඳී බිඳී යන්නා වූ නාමරූප පරම්පරාවක් හැර සත්ව පුද්ගල ආත්ම ස්වභාවයෙන් හිස් වූවෝ ය. නිත්‍ය සුභ සුඛාදී සාරගුණයෙන් තොර වූවෝය ගංගා ජලයක් මෙන් ද ප්‍රදීපාලෝකයක් මෙන් ද වැළ නොකැඩී පරම්පරා වශයෙන් සිටින්නෝ ය. හේතු ප්‍රත්‍යයන් නිසා පවත්නෝය. ඇතිව නැතිව යන බැවින් අනිත්‍යයෝ ය. ඇතිවීම් නැතිවීම් දෙකින් නිරතුරු පෙලෙන බැවින් දුක්ඛයෝ ය. තම තමන් කැමති සේ නොපවත්නා බැවින් අනාත්මයෝ යයි විදසුන් නුවන යොදා දත යුතු වන්නේ ය.

**ත්‍රිලක්ෂණ විදර්ශනාව**

1. භූමි සංග්‍රහ විභාග භාවනාවේදී පහළ වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්මයෝ ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝය.
2. ඇතිවීම නැති වීම දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝය.
3. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝය.
4. මෙසේ අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්මක වූ නාම රූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීලන සංඛත සන්තාප විපරිනාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේය.
5. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව ආයූහණ නිදන සංයෝග පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේය.
6. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ විවේක අසංඛත අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකානන්යෙන් නිරෝධ සත්‍යය නම් වන්නේය.
7. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතුවූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය නියයාන හේතු දස්සන ආධිපතෙයයාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේය.
8. මාගේ භාවනාමය කුශලානිසංස ධර්මය මෙම චතුරාර්ය සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිසම හේතු වේවා වාසනා වේවා

සාධු. සාධු. සාධු.

**පදවිවරණය**

01. යොදුන : ඉපැරණි දිග මිනුමකි. එහි චක්‍රය මෙසේය. -

පරමාණු 36, ක් අනු 1 යි, අනු 36, ක් තජ්ජාරි 1. යි, තජ්ජාරි 36, ක් රථ රේණු 1. යි, රථ රේණු 36. ක් ලික්ඛා 1. යි, ලික්ඛා 7. ක් ඌකා 1. යි, ඌකා 7.ක් ධඤ්ඤමාස 1. යි ධඤ්ඤමාස 7. ක් අඟුල් 1 යි. අඟුල් 12. ක් වියත් 1. යි වියත් 2. ක් රියන් 1. යි, රියන් 7. ක් යෂ්ඨි 1. යි, යෂ්ඨි 20. ක් ඉස්බ 1. යි ඉස්බ 80. ක් ගවු 1. යි, ගවු 4. ක් යොදුන් 1. යි.

මෙහි තජ්ජාරි යනු ඉර එළියෙන් පල සෙවෙනි ආදියෙහි විහිදෙන සියුම් දූවිල්ල යි, රථරේණු යනු රිය ගමනින් මං මාවත්හි නැගෙන දූවිල්ල යි, ලික්ඛායනු ලේඩි යයි ඌකා යනු උකුණා ය, ධඤ්ඤමාස යනු වී ඇට යයි.

02. අපාය භූමි : පුණ්‍ය සම්මත 'අය' 'කෙරෙන්' 'අපගත' ඉවත් වූයේ ය, යන අර්ථයෙන් අපාය නම් වේ. ඒ අපායම අපාය භූමි නම් වේ.

03. සුගති : අනේකවිධ සැපත් ඇතිවයා යුතු - ඉපදිය යුතු තැන සුගති යයි, කාමතණ්හාව හැසිරෙන සුගතිය කාමසුගති නම් වේ.

04. නිරය : 'අය' නම් වූ සැපයෙන් තොර වූ අපාය 'නිරය' නම් වේ.

05. තිරිසන් : හරහට යන බැවින් ද, සැපයට හරස්වූ තැන බැවින් ද, සැම ඉරියව්වක්ම හරහට පැවතෙන බැවින්ද තිරිසන් නම් වේ.

06. ප්‍රේත අපාය : හාත්පසින් සැපයෙන් ඉවත් වූ බැවින් ප්‍රේත අපාය නම්වේ.

| | | | |
|---|---|---|---|
| 07. | මනුෂ්‍ය | : | ස්මෘතිය - ශූරභාවය - බ්‍රහ්මචර්යාවට සුදුසු බව ආදී ගුණයෙන් උසස් මනසක් ඇති අය මනුෂ්‍ය භූමි යයි. |
| 08. | චාතුර්මහාරාජික | : | සතරවරම් දෙව් රජුන් ගේ වාසස්ථාන යයි. |
| 09. | තාවතිංස | : | මඝමානවක තුමා සමග එක්ව කුශල් රැස්කළ තෙතිස් දෙනා උපන් ස්ථානය තාවතිංස නම් වේ. ශක්‍ර භවන යි. |
| 10. | යාමා | : | දුකින් ඉවත් වූවෝ යන අර්ථයෙන් යාම නම් වේ. |
| 11. | තුසිත | : | ස්වකීය සැප සම්පතින් තුෂ්ඨිමත් වූ තැන තුසිත භවන යි. |
| 12. | නිර්මාණරති | : | තමන්මවාගත් සම්පත්තියෙන් සතුටු වන - ඇළුම් කරන අර්ථයෙන් නිර්මාණරති නම් වේ. |
| 13. | පරනිර්මිතවසවර්ති | : | අනුන් විසින් මවා දෙන සම්පත් විඳින අර්ථයෙන් ඒ නම යෙදී ඇත. |
| 14. | බ්‍රහ්මපාරිසජ්ජ | : | මහා බ්‍රහ්මයන් ගේ පිරිවර බැවින්ජ් නම යෙදේ. |
| 15. | බ්‍රහ්මපුරෝහිත | : | මහා බ්‍රහ්මයන් ගේ පුරෝහිත ස්ථානයට අයත් බැවින් ඒ නම යෙදේ. |
| 16. | මහාබ්‍රහ්ම | : | ප්‍රථමධ්‍යානාදී ගුණ විශේෂයෙන් හාත්පසින් මහත් සේ වැඩුනු බැවින් ඒ නම යෙදේ. |
| 17. | පරිත්තාභ | : | ආභස්වර වාසීන්ට අඩු ආලෝක ඇති බැවින් ඒ නම යෙදේ. |
| 18. | අප්පමානාභ | : | පරිත්තාභ බ්‍රහ්මයන්ට වඩා අප්‍රමාණ ආලෝක ඇති බැවිනි. |
| 19. | ආභස්වර | : | හාත්පස නිරතුරුව විහිදෙන ආලෝක ඇති බැවින් ඒ නම යෙදේ. |
| 20. | පරිත්තසුබ | : | ඒකඝන වූ නිශ්චල ආලෝක ඇති උපරිතල වාසීන්ට අඩුතරම් ආලෝක ඇති බැවින් ඒ නම යෙදේ. |
| 21. | අප්පමානසුභ | : | පරිත්තසුබ වාසීන්ට වඩා අප්‍රමාණ ඒකඝන ආලෝක ඇති බැවින් ඒ නම යෙදේ. |
| 22. | සුභකින්හක | : | ශරීරාලෝකයෙන් අතිශයෙන් ආකිර්ණ බැවින් ඒ නම යෙදේ. |
| 23. | වේහප්ඵල | : | විපුල වූ ධ්‍යානානිසංස ඇති බැවින් වේහප්ඵල නම් වේ. |
| 24. | අසඤ්ඤසත්ත | : | සඤ්ඤාවිරාග භාවනාවෙන් නිරුද්ධ වූ චිත්තසත්තාන ඇති අය අසඤ්ඤසත්ත නම් වේ. |
| 25. | සුද්ධාවාස | : | අනාගාමි ශුද්ධවන්තයන් ගේ වාසස්ථාන යයි. |
| 26. | අවිහ | : | සුළු කලකින් ස්ථාන අත් නොහරින අර්ථයෙන් අවිහ නමි. |
| 27. | අතප්ප | : | තැවීම් කිසිත් නැති බැවින් අතප්ප නමි. |
| 28. | සුදස්ස | : | පරම සුන්දර රූප ඇති බැවින් සුදස්ස නමි. |
| 29. | සුදස්සී | : | අතිශයින් පිරිසිදු දැකීම් ඇති බැවින් සුදස්සී නමි. |
| 30. | අකනිට්ඨක | : | කිසිවෙකුටත් කණිටු නොවන බැවින් අකනිට්ඨක නම් වෙති. |


**රා. සේ. බෞද්ධ සංගමය මගින් මහජන පුස්තකාලයේ**
**පැවැත් වෙන භාවනා පන්තියේ**
**T. W. ප්‍රේමවතී මහත්මාව ඇතුළු දායක පිරිසක් විසින්**

**නුගේගොඩ ගංගොඩවිල 37 සෝරත මාවතේ**
**පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස්හි**
**මුද්‍රණය කරවා ධම් දානය පිණිස**
**නිකුත් කරන ලදී.**

**රාජ්‍ය සේවා බෞද්ධ සංගමය**
**මහවැලි සංවර්ධන අමාත්‍යාංශය**
**500 ටී. බී. ජයා මාවත**
**කොළඹ 10**
**2543 ඉල් / 1999 දෙසැම්බර්01**

**අංක 09 පසුගිය භාවනා පාඩමේ 2452 නිකිණි/ 1999 සැප්තැම්බර් 01වශයෙන් සඳහන් වී ඇති දිනය 2543- වප් / 1999 ඔක්තෝම්බර් 07 යනුවෙන් නිවරදි කරගන්න.**

## අභිධර්ම විපස්සනා භාවනා පාඩම අංක - 11

## අභිධර්මාර්ථ සංග්‍රහය - විථිමුක්ත සංග්‍රහ විභාගය - 02 (ප්‍රතිසන්ධි චතුෂ්කය)

## අති පූජ්‍ය නා උයනේ අරිය ධම්ම නා හිමිපාණන් වහන්සේ විසින්

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!

01. භූමි චතුෂ්කයට අනතුරුව ප්‍රතිසන්ධි චතුෂ්කය විවරණය වන්නේ ය. එයද, අපාය ප්‍රතිසන්ධිය, කාමසුගති ප්‍රතිසන්ධිය, රූපාවචර ප්‍රතිසන්ධිය, අරූපාවචර ප්‍රතිසන්ධිය නමින් සතර වැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් ද අපාය ප්‍රතිසන්ධිය එක් වැදෑරුම් වන්නේ ය. ඒ කෙසේ ද යත්, අකුශල විපාක උපේක්ෂා සහගත සන්තීරණ චිත්තය සතර අපායභූමියෙහි උපදින කෙණෙහි ප්‍රතිසන්ධි බවට ද, ඉන් පසු භවංග සිත බවට ද, අවසානයෙහි චුති සිත බවට ද පත්වී සිදෙන්නේය. මේ වනාහි එකක් වූ අපාය ප්‍රතිසන්ධිය නම් වන්නේ ය.

02. කාමසුගති ප්‍රතිසන්ධිය වනාහි දස වැදෑරුම් වන්නේ ය. ඒ කෙසේ ද යත්, මිනිසුන් අතර ද, භූම්‍යස්ථ, විනිපාතික අසුරයන් අතර ද, අඳ - ගොළු - බිහිරි - උන්මත්තක - මන්දබුද්ධික - අංගවිකල ආදී අභව්‍යතාවන් සහිතව උපදින සුගති අහේතුක පුද්ගලයන් ගේ ප්‍රතිසන්ධි භවංග චුති වශයෙන් ලැබෙනුයේ කුශල විපාක උපේක්ෂා සහගත සන්තීරණ චිත්තයෙනි.

03. දිව්‍ය - මනුෂ්‍ය - වේමානික අසුරයන් ද අතර, මහා විපාක සිත් අටදෙන ප්‍රතිසන්ධි - භවංග - චුති වශයෙන් යෙදෙන්නාහ. ඔවුනතුරෙන් ද්‍විහේතුක ප්‍රතිසන්ධි සතරක් ද ත්‍රිහේතුක ප්‍රතිසන්ධි සතරක් ද ලැබෙන්නා හ. අපාය ප්‍රතිසන්ධිය ද සමඟ කාමාවචර ප්‍රතිසන්ධිය මෙසේ දස වැදෑරුම් වන්නේ ය. ඔවුනතුරෙන් මනුෂ්‍යයන් ගේ ද, විනිපාතික අසුරයන් ගේද ආයුෂ්ප්‍රමාණ ගණනක් නියම නැත්තේ ය. භූමි චතුෂ්කයෙහි දැක් වූ පදිරි සදෙව්ලෝ තලයෙහි මුළු ආයුෂ මිනිස් ගණනින් වර්ෂ එක්දහස් දෙසිය අටවිසි කෝටි පණස්ලක්ෂයක් වන්නේ ය.

04. රූපාවචර ප්‍රථමධ්‍යාන භූමියෙහි ප්‍රථමධ්‍යාන විපාක චිත්තය ප්‍රතිසන්ධි - භවංග - චුති වශයෙන් ලැබෙන්නේ ය. චතුෂ්ක නයෙහි ද්විතියධ්‍යාන විපාකය ද, පඤ්චක නයෙහි ද්විතියධ්‍යාන - තෘතියධ්‍යාන විපාකය ද ද්විතියධ්‍යාන භූමියෙහි ප්‍රතිසන්ධි - භවංග - චුති වශයෙන් ලැබෙන්නේය. චතුෂ්ක නයෙහි තෘතියධ්‍යාන විපාකය ද, පඤ්චකනයෙහි චතුර්ථධ්‍යාන විපාකය ද, පඤ්චක නයෙහි පඤ්චමධ්‍යාන විපාකය ද චතුර්ථධ්‍යාන භූමියෙහි ප්‍රතිසන්ධි - භවංග - චුති වශයෙන් ලැබෙන්නේ ය, අසඤ්ඤසත්ත තලයෙහි ජීවිතනවක රූප කලාපයම ප්‍රතිසන්ධි වශයෙන් ද ප්‍රවෘත්ති වශයෙන් ද පැවති චුති කාලයේදී රූපයම නිරුද්ධ වන්නේ ය. මෙසේ රූපාවචර ප්‍රතිසන්ධිය සවැදෑරුම් වන්නේ ය.

05. ආකාසානඤ්චායතන භූමියෙහි ආකාසානඤ්චායතන විපාක සිත ද, විඤ්ඤාණඤ්චායතන භූමියෙහි විඤ්ඤාණඤ්චායතන විපාක සිත ද, ආකිඤ්චඤ්ඤායතන භූමියෙහි ආකිඤ්චඤ්ඤායතන විපාක සිත ද, නේවසඤ්ඤානාසඤ්ඤායතන භූමියෙහි නේවසඤ්ඤානාසඤ්ඤායතන විපාක සිත ද ප්‍රතිසන්ධි - භවංග - චුති වශයෙන් ලැබෙන්නේ ය. මෙසේ අරූප ප්‍රතිසන්ධිය සතර වැදෑරුම් වන්නේ ය. සියලු එක්තිස් භූමියෙහි ප්‍රතිසන්ධි - භවංග - චුති වශයෙන් ලැබෙන්නා වූ සිත් එකුන්විස්සක් වන්නාහ. සියලු ප්‍රතිසන්ධි අතුරෙන් අහේතුක ප්‍රතිසන්ධි දෙකක් ද, ද්විහේතුක ප්‍රතිසන්ධි සතරක් ද, ත්‍රිහේතුක ප්‍රතිසන්ධි තෙළෙසක් ද වන්නාහ. රූප ප්‍රතිසන්ධි එකක් ද අරූප ප්‍රතිසන්ධි සතරක් ද

රූපා රූප ප්‍රතිසන්ධි පසළොසක් ද වන්නාහ. එක් භවයකදී ප්‍රතිසන්ධි චිත්ත පරම්පරාවම භවංග චුති වශයෙන් ලැබෙන්නේ ය.

**ප්‍රතිසන්ධි චතුෂ්ක යයි.**

**කර්ම චතුෂ්කය :**

06. කර්ම චතුෂ්කයෙහි කර්මය වනාහි, ජනක කර්මය - උපස්ථම්භක කර්මය - උපපීළක කර්මය - උපඝාතක කර්මය නමින් විපාක දීමේ කෘත්‍ය වශයෙන් සතරාකාර වන්නේ ය. ගරුක කර්මය - ආසන්න කර්මය - ආචිර්ණ කර්මය - කටත්තා කර්මය නමින් විපාක දීමේ අනුපිළිවෙළ වශයෙන් ද සතරාකාර වන්නේ ය. දිට්ඨධම්ම වේදනීය කර්මය - උපපජ්ජ වේදනීය කර්මය - අපරාපරිය වේදනීය කර්මය - අහෝසි කර්මය නමින් - විපාක දීමේ කාල වශයෙන් ද සතරාකාර වන්නේ ය. අකුශල කර්මය - කාමාවචර කුශල කර්මය - රූපා වචර කුශල කර්මය - අරූපාවචර කුශල කර්මය නමින් විපාක දෙන ස්ථාන වශයෙන් ද සතරාකාර වන්නේ ය.

07. ඔවුනතුරෙන් අකුශල කර්මය වනාහි, අකුශල කායකර්මය, අකුශල වචීකර්මය, අකුශල මනෝකර්මය නමින් කර්මද්වාර වශයෙන් තෙවැදෑරුම් වන්නේ ය. ඒ කෙසේ ද යත්, ප්‍රාණඝාතය - අදින්නාදානය සහ කාමමිථ්‍යාචාරය ද කාය විඥ්ඥප්තිය නම් වූ කායද්වාරයෙහි බහුලව පවත්නා බැවින් අකුශල කායකර්මය නම් වන්නේ ය.

08. මුසාවාදය - පිසුණාවාචා - පරුසාවාචා - සහ සම්ඵප්‍රලාපය ද වචීවිඥ්ඥප්තිය නම් වූ වාග්ද්වාරයෙහි බහුලව පැවතෙන බැවින් අකුශල වචීකර්මය නම් වන්නේ ය. අභිජ්ඣා - ව්‍යාපාද - මිථ්‍යාදෘෂ්ටිය විඥ්ඥප්තියෙන් තොරව ද මනසෙහි බහුලව පවත්නා බැවින් අකුශල මනෝකර්මය නම් වන්නේ ය.

09. ඔවුනතුරෙන් ප්‍රාණඝාතය - ඵරුසවචනය සහ ව්‍යාපාදය ද ද්වේශ මූලයෙන් හටගන්නේ ය. කාමමිථ්‍යාචාරය අභිජ්ඣාව සහ මිථ්‍යාදෘෂ්ටිය ද ලෝභ මූලයෙන් හටගන්නේ ය. අවශේෂ වූ අදින්නාදානය - මුසාවාදය පිසුණාවාචාව සහ සම්ඵප්‍රලාපයද ලෝභ - දෝෂ - මෝහ අකුශල මුල් තුනෙන් හටගන්නේ ය. මේ දස අකුශලය වනාහි චිත්තෝත්පාද වශයෙන් සියලු ආකාරයෙන් දොළොස් වැදෑරුම් වන්නේ ය.

10. කාමාවචර කුශල කර්මය ද වනාහි, කායද්වාරයෙහි පවත්නා වූ කුශල කායකර්මය, වාග්ද්වාරයෙහි පවත්නා වූ කුශල වචීකර්මය, මනෝද්වාරයෙහි පවත්නා වූ කුශල මනෝකර්මය නමින් කර්මද්වාර වශයෙන් තෙවැදෑරුම් වන්නේ ය. දානමය කුශල කර්මය - ශීලමය කුශල කර්මය - භාවනාමය කුශල කර්මය නමින් ද තෙවැදෑරුම් වන්නේ ය.

11. චිත්තෝත්පාද වශයෙන් වනාහි, අටවැදෑරුම් වූද කාමාවචර කුශල කර්මය, දානය - ශීලය - භාවනාව අපචායන නම් වූ වැඩිහිටි ගෞරවය - වෙය්‍යාවච්ච නම් වූ වතාවත - පත්තිදාන නම් වූ පින් දීම - පත්තානුමෝදන නම් වූ අනුමෝදන්වීම - ධම්මසවණ නම්වූ බණ ඇසීම - ධම්මදේශන නම් වූ බණ දෙසීම දිට්ඨිජුකම්ම නම් වූ සම්මාදිට්ඨිය වැඩීම යනුවෙන් දශ වැදෑරුම් වන්නේ ය. අකුශල චිත්තෝත්පාද දොළස ද, කාමාවචර කුශල චිත්තෝත්පාද අට දෙන ද කාමාවචර කර්ම සංඛ්‍යාවටම යන්නේ ය.

12. රූපාවචර කුශල කර්මය වනාහි ද්වාර වශයෙන් එකම මනෝකර්මයකි. ඒ ද වනාහි භාවනාමය වූයේම මහග්ගත අර්පණා බවට පත්ව ධ්‍යානාංග භේදයෙන් පස් වැදෑරුම් වන්නේ ය. අරූපාවචර කුශල කර්මය ද අර්පණා බවට පත් වූ භාවනාමය මනෝකර්මයම වන්නේය. ආරම්මණ භේදයෙන් වනාහි සතරාකාර වන්නේ ය.

13. දොළොස් අකුශල චිත්තෝත්පාදයන් අතුරෙන් උද්ධච්ච සම්ප්‍රයුක්ත මෝහමූල චිත්තය හැර අවශේෂ එකොළොසක් වූ අකුශල කර්මය සතර අපාය භූමියෙහි ප්‍රතිසන්ධිය ගෙන දෙන්නේ ය. ප්‍රවෘත්ති කාලයෙහි වනාහි සියලුම දොළොස් වැදෑරුම් අකුශල කර්මය කාමභූමියෙහිද, රූපභූමියෙහි ද සැම තැන්හි අකුශල විපාක සිත් සතක් වශයෙන් විපාක දෙන්නේ ය.

14. අටවැදෑරුම් වූ කාමාවචර කුශලය වනාහි කාමසුගතියෙහිම ප්‍රතිසන්ධි ගෙන දෙන්නේ ය. ප්‍රවෘත්ති කාලයේ ද මහා විපාක අට දෙන වශයෙන් විපාක දෙන්නේ ය. අහේතුක කුශල විපාක සිත් අට දෙනා වනාහි කාමලෝක - රූපලෝක සැම තැන්හි විපාක දෙන්නේ ය.

15. ඔවුනතුරෙන් සතර වැදෑරුම් වූ ත්‍රිහේතුක උත්කෘෂ්ඨ කුශලය ත්‍රිහේතුක ප්‍රතිසන්ධිය දී, ප්‍රවෘත්ති කාලයේ විපාක සොළසක් දෙන්නේ ය. ත්‍රිහේතුක ඕමක වූද ද්විහේතුක උත්කෘෂ්ඨ වූද කුශලය සතර වැදෑරුම් වූ ද්විහේතුක ප්‍රතිසන්ධිය දී, ප්‍රවෘත්ති කාලයේ ත්‍රිහේතුක විපාක සතර හැර දොළොස් වැදෑරුම් විපාකය දෙන්නේය. ද්විහේතුක ඕමක කුශල වනාහි අහේතුක වූම ප්‍රතිසන්ධිය දෙන්නේ ය. ප්‍රවෘත්ති කාලයේ දීද අහේතුක විපාකයම දෙන්නේ වේ.

16. රූපාවචර කුශල් සිත් පස අතුරෙන්, ප්‍රථමධ්‍යානය අල්ප වශයෙන් වඩා බ්‍රහ්මපාරිසජ්ජයේ ද, මධ්‍යම වශයෙන් වඩා බ්‍රහ්මපුරෝහිතයේ ද, ප්‍රණීත වශයෙන් වඩා මහාබ්‍රහ්ම තලයේ ද ප්‍රතිසන්ධි ලබන්නේ ය. එසේම ද්විතීය ධ්‍යානය ද පඤ්චකනයෙහි තෘතියධ්‍යානය ද අල්ප වශයෙන් වඩා පරිත්තාභයෙහි ද, මධ්‍යම වශයෙන් වඩා අප්පමාණාභයෙහි ද, ප්‍රණීත වශයෙන් වඩා ආභස්සරයෙහි ද ප්‍රතිසන්ධි ලබන්නේ ය.

17. පඤ්චක නයෙහි චතුර්ථධ්‍යානය අල්ප වශයෙන් වඩා පරිත්තසුභයෙහි ද, මධ්‍යම වශයෙන් වඩා අප්පමාන සුභයෙහි ද, ප්‍රණීත වශයෙන් වඩා සුභකිණ්හකයේ ද ප්‍රතිසන්ධි ලබන්නේ ය. පඤ්චමධ්‍යානය වඩා වේහප්ඵලයෙහි ද, එයම සඤ්ඤාවිරාග වශයෙන් වඩා අසඤ්ඤතලයෙහිද ප්‍රතිසන්ධි ලබන්නේ ය. අනාගාමීන් වහන්සේලා සුද්ධාවාසයෙහි ප්‍රතිසන්ධි ලබන්නාහ. අරූපාවචර කුශලය වඩා අනුපිළිවෙළින් අරූපභූමි සතරෙහි ප්‍රතිසන්ධි ලබන්නාහ.

18. **ඉත්ථං මහග්ගතං පුඤ්ඤං - යථා භූමි වවත්ථිතං.**
**ජනෙති සදිසං පාකං - පටිසන්ධි ප්පවත්තියං**

19. **පටිසන්ධි භවංගඤ්ච - තථා චවන මානසං.**
**එකමෙව තථෙවෙක - විසයඤ්චෙක ජාතියං**

මෙසේ මහග්ගත කුශලය නියමිත බඹතලයෙහි ප්‍රතිසන්ධි - ප්‍රවෘත්තියෙහි තම තමා සමාන විපාක දෙන්නේය. එක ආත්මභාවයකදී ප්‍රතිසන්ධිය ද භවංගය ද එසේම චුතිය ද එකක්ම ය, අරමුණ ද එකක්ම වන්නේ ය.

කර්ම චතුෂ්ක යයි.

**<u>මරණෝත්පත්ති චතුෂ්කය :</u>**

20. ආයුක්ෂය මරණය, කර්මක්ෂය මරණය, උභයක්ෂය මරණය, උපච්ඡේදක මරණ යයි මරණෝත්පත්තිය සතර වැදෑරුම් වන්නේ ය. එසේ සතරාකාරයෙන්ම මැරෙන සත්වයන්ට මරණාසන්නයේදී, මතු භවයෙහි ප්‍රතිසන්ධි ගෙන දෙන කර්මය හෝ, එම කර්මය රැස්කිරීමේදී ලැබූ උපකරණ වැනි කර්මනිමිත්ත හෝ, මතු උපදින භවයෙහි ලැබෙන

ගතිනිමිත්ත හෝ කර්ම බලයෙන්ම සදොර අතුරෙන් යම් ඒ දොරටුවකට එළඹ සිටින්නේ ය.

21. ඉන් අනතුරුව එසේ වැටහෙන අරමුණක සිත එල්බගෙන උපදින භවයට අනුරූප වූ.,පිරිසිදු වූ හෝ අපිරිසිදු වූ හෝ චිත්ත සන්තානය එයට නැඹුරුව නිරතුරුව බහුලව පවත්නේ ය. එම ප්‍රතිසන්ධි ජනක වූ කර්මයම හෝ අළුත් වෙමින් දොරටුවකට අරමුණු වන්නේ ය. මරණාසන්න චිත්ත විථියේ අවසානයේදී පස්වැනි ජවනයට අනතුරුව හෝ ජවන තදාරම්මණ දෙසිතට අනතුරුව හෝ භවංගයට අනතුරුව හෝ,වර්තමාන භවයේ අන්තිම සිත නම් වූ චුති චිත්තය ඉපිද නිරුද්ධ වන්නේ ය.

22. ඒ චුති චිත්තයා ගේ නිරෝධයට අනතුරුවම, මරණාසන්න ජවනයෙන් ගන්නා ලද අරමුණම ගෙන, අවිද්‍යානුසය හේතුවෙන් ද තෘෂ්ණානුසය මුල්කොට රැස්වූ ද කර්ම බලයෙන්. සම්ප්‍රයුක්ත චෛතසිකයන් ගේ සහයෝගයෙන් භවයෙන් භවය ගලපන බැවින් ප්‍රතිසන්ධි නම් වූ සිත පුනර්භවයෙහි පිහිටන්නේ ය.

23. මරණාසන්න විථියෙහි වනාහි හදයරූපය දුබල බැවින්ම ජවන් සිත් පසක්ම ලැබෙන්නාහ. මරණාසන්න ජවනයෙන් ගත් අරමුණ වර්තමාන රූපාදී අරමුණක්ම වූයේ වී නම් ප්‍රතිසන්ධි භවංගයන්ට ද වර්තමාන වූම අරමුණ ලැබෙන්නේ ය. එනිසාම කාමාවචර ප්‍රතිසන්ධියේදී සදොරින් ගනු ලබන්නා වූ කර්මනිමිත්ත - ගතිනිමිත්ත වනාහි වර්තමාන වූ හෝ අතීත වූ හෝ අරමුණක් වන්නේ ය. කර්ම අරමුණ වනාහි අතීත වූම මනෝද්වාරයෙන් ගන්නා ලද්දේම වන්නේ ය. ඒ සියලු අරමුණු වනාහි කාමාවචර අරමුණුම වන්නාහ.

24 රූපාවචර ප්‍රතිසන්ධියේදී වනාහි ප්‍රතිභාග නිමිත්ත නම් වූ කර්ම නිමිත්තක්ම අරමුණු වන්නේ ය. අරූපාවචර ප්‍රතිසන්ධියේදී වනාහි පළමුවැනි වූද තෙවැනිවූද ප්‍රතිසන්ධින්ට ප්‍රඥප්ති අරමුණ ද, දෙවැනි සිවුවැනි ප්‍රතිසන්ධින්හට මහග්ගත ධ්‍යාන චිත්තය නම්වූ අරමුණ ද ලැබෙන්නේ ය. අසඤ්ඤතලයෙහි වනාහි ජීවිත නවක රූපකලාපය පමණක් ප්‍රතිසන්ධි වශයෙන් පිහිටන්නේය. එසේ හෙයින් ඒ අසඤ්ඤසත්වයෝ රූප ප්‍රතිසන්ධික යෝය. අරූපී බ්‍රහ්මයෝ අරූප ප්‍රතිසන්ධිකයෝ ය. සෙස්සෝ රූපාරූප ප්‍රතිසන්ධිකයෝ නම් ද වන්නාහ.

25.

| | | |
|---|---|---|
| **ආරුප්ප චුතියා හොන්ති** | - | **හෙට්ඨිමාරුප්ප වජ්ජිතා.** |
| **පරමාරුප්ප සන්ධි ච** | - | **තථා කාමෙ තිහේතුකා.** |
| **රූපාවචර චුතියා** | - | **අහෙතු රහිතා සියුං.** |
| **සබ්බා කාම තිහෙතුම්හා** | - | **කාමෙස්වේව පනෙතරා.** |

අරූප භවයෙහි චුතියට අනතුරුව යට අරූප තලයන් හැර උඩ අරූප තලයන්හි ද කාමභූමියට පැමිණෙත් නම් ත්‍රිහේතුක වූම ප්‍රතිසන්ධියක් වන්නේ ය. රූපාවචර චුතියට අනතුරුව අහේතුක ප්‍රතිසන්ධියක් නොවන්නේ ය. ද්විහේතුක වූද ත්‍රිහේතුක වූද ප්‍රතිසන්ධියක් වන්නේ ය. කාමාවචර ත්‍රිහේතුක චුතියෙන් අනතුරුව වනාහි සියලුම ප්‍රතිසන්ධිය ලැබෙන්නේ ය. ද්විහේතුක අහේතුක චුතියට අනතුරුව කාමාවචර වූම ප්‍රතිසන්ධිය ලැබෙන්නේ වේ.

**චුති ප්‍රතිසන්ධික්‍රම යයි.**

26. මෙසේ ගන්නා ලද්දා වූ ප්‍රතිසන්ධිය ඇත්තා වූ සත්වයන්ට වනාහි ප්‍රතිසන්ධි සිත ඉපද නිරුද්ධ වූ තැන් සිට එම අරමුණේම විපාක චිත්තය, විථි චිත්තයක් නොමැති කල්හි, අවසාන චුතිය දක්වාම, උපන් භවයේ අංගයක් වැනි වූ භවාංග චිත්ත සන්තතිය වශයෙන්

ගංගා ජලයෙන් මෙන් නොසිඳී පරම්පරා වශයෙන් පවත්නේ ය. අවසානයේදී චුති චිත්තය බවට පත් වී නිරුද්ධ වන්නේ ය. ඉන් පසුව ද රිය සකක් සේ අනුපිළිවෙළින් භවයෙන් භවයට පෙරලෙමින් පවත්නේ ය.

27. **පටිසන්ධි භවංග වීථියො - චුති චෙග තථා භවන්තරෙ.**
**පුන සන්ධි භවංග මිච්චයං - පරිවත්තති චිත්ත සන්තති.**

**පටිසංඛාය පනෙක මද්ධුවං - අධිගන්ත්වා පද මච්චුතං බුධා.**
**සුසමුච්ඡින්න සිනෙහ බන්ධනා - සමමෙස්සන්ති චිරාය සුබ්බතා.**

මේ භවයෙහි ප්‍රතිසන්ධිය ද, භවංගය ද, විථි සිත්ද, චුතියද එසේම පුනර්භවයෙහි ප්‍රතිසන්ධි භවංග වීථි යනාදී වශයෙන් චිත්ත සන්තතිය පෙරලෙන්නේ ය. බොහෝ කාලයක් සීලාදී ප්‍රතිපත්ති පුරන්නාවූ ප්‍රඥාවන්තයෝ අස්ථිර වූ මේ ධර්ම ස්වභාවය විදසුන් කොට සියලු ආකාරයෙන් තෘෂ්ණා ස්නේහ බන්ධනයන් සිඳ දමා ශාන්ත පද නිර්වාණ ධාතුව අධිගමනයෙන් සදාකාලිකව සුවපත් වන්නාහ.

**අභිධර්මාර්ථ සංග්‍රහයෙහි විථිමුක්ත සංග්‍රහ විභාග භාවනා පාඨම සමාප්තය.**

**ත්‍රිලක්ෂණ විදර්ශනාව :**

01. විථිමුක්ත සංග්‍රහ විභාග විදර්ශනා භාවනාවේදී පහළ වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්මයෝ ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝ ය.

02. ඇතිවීම් නැතිවීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝ ය.

03. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝ ය.

04. අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන සංඛත සන්තාප විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේ ය

05. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්වභව තෘෂ්ණාව, ආයුහන නිදාන සංයෝග පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේ ය.

06. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ විවේක අසංඛත අමතාර්ථයෙන් සමන්නාගතවන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේ ය.

07. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයේ වැඩිය යුතු වූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය නිය්‍යාන හේතු දස්සන ආධිපතෙය්‍යාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේ ය.

08. මාගේ භාවනාමය කුශලානිසංස ධර්මය, මෙම චතුරාර්ය සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිසම හේතු වේවා වාසනා වේවා !!

**සාධු ! සාධු! ! සාධු ! ! !**

**පද විවරණය :**

01. කල්පය : - ආයුෂ්කල්ප- අන්තරකල්ප - අසංඛ්‍යකල්ප - මහාකල්ප නමින් කල්පය සතරාකාරය. ආයුෂ්කල්පය යනු මිනිස් ලොව පරමායුෂ යි, අන්තර කල්පය යනු මිනිස් ලොව අසංඛ්‍ය වර්ෂ ආයුෂ අනුපිළිවෙළින් පිරිහී දශවර්ෂයට ආයුෂ

බැස සත්ව විනාශ වන කාල පරිච්ඡේද යයි, අසංඛ්‍ය කල්පය යනු එවැනි අන්තර කල්ප විස්සකි, සංවට්ට - සංවට්ටට්ඨායි- විවට්ට - විවට්ටට්ඨායි නම් වූ අසංඛ්‍ය කල්ප සතරේ එකතුව මහාකල්පනම් වේ. මහා කල්පයකට අන්තර කල්ප 80 කි.

02. කර්මය : - සැප - දුක් විපාක ගෙන දීමට සමත් වන චේතනාව ය.

03. ජනක කර්මය - භවයක ප්‍රතිසන්ධිය දෙන්නේ ජනක කර්ම යයි.

04. උපස්ථම්භක : ජනක කර්මයෙන් උපන්නහුට, ප්‍රවෘත්ති විපාක වශයෙන් උපකාර වන කර්ම යයි.

05. උපපීළක කර්මය :- ජනක කර්මයේ උපන් සත්වයන්හට දුක් පීඩා ගෙන දෙන විරුද්ධ කර්ම යයි.

06. උපඝාතක කර්මය :- ජනක කර්මයේ ශක්තිය අතරකදී සිඳ දමන බලවත්වූ විරුද්ධ කර්ම යයි.

07. ගරු කර්මය :- කුශල් අතර ධ්‍යාන කුශල් හා මගඵල ලාභීන්ගේ විදර්ශනා කුශල් ද, අකුශල් අතර ආනන්තර්ය කර්ම සහ නියත මිථ්‍යාදෘෂ්ටිය ද ගරු කර්ම නම් වේ.

08. ආසන්න කර්ම : - මරණාසන්නයේදී සිදු කළ කර්ම යයි.

09. ආචීර්ණ කර්ම : - ජීවිත කාලයේදී වඩාත් පුහුණු කළ කර්ම යයි.

10. කටත්තා කර්ම : - මේ ජීවිතයේදී අමතක වූද පූර්ව භවයේදී රැස් කළා වූද කර්ම යයි.

11. දිට්ඨධම්ම වේදනීය: - මෙලොවම පල දෙන කර්මය යි.

12. උපපජ්ජ වේදනීය :- පුනර්භවයේදීම පල දෙන කර්ම යයි.

13. අපරාපරිය වේදනීය : සසර වෙසෙන තුරු මතු විපාක දෙන කර්ම යයි.

14. අහෝසි කර්ම :- විපාක දීමෙන් නිම වූ කර්මය සහ විපාක දෙන කාලය ඉකුත් වූ කර්මය ද රහත් මග නුවණින් සිඳුනු කර්මය ද අහෝසි කර්ම යයි.


රා. සේ. බෞද්ධ සංගමය මගින් මහජන පුස්තකාලයේ
පැවැත් වෙන භාවනා පන්තියේ
නන්ද ලියන ආරච්චි, ස්වර්ණා බමුණු සිංහ, ඒ. පී. රණසිංහ යන මහත්මාවන් විසින්
මිය ගිය දෙමාපියන්ට පිං පැමිණ වීම පිණිස

නුගේගොඩ ගංගොඩවිල 37 සෝරත මාවතේ
පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස්හි
මුද්‍රණය කරවා ධම් දනය පිණිස
නිකුත් කරන ලදී.

රාජ්‍ය සේවා බෞද්ධ සංගමය
මහවැලි සංවර්ධන අමාත්‍යාංශය
500 ටී. බී. ජයා මාවත.
කොළඹ 10.
2543 උදුවප්/ 2000 ජනවාරි 05

**අභිධර්ම විපස්සනා භාවනා පාඩම අංක - 12**

**අභිධර්මාර්ථ සංග්‍රහ රූප විභාග සංග්‍රහය - 01**

## අති පූජ්‍ය නා උයනේ අරිය ධම්ම නා හිමිපාණන් වහන්සේ විසින්

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!

01. **එත්තාවතා විභත්තාහි - සප්පභේදප්පවත්තිකා**
**චිත්ත චේතසිකා ධම්මා - රූපං දානි පවුච්චති**
**සමුද්දේසා විභාගා ච - සමුට්ඨානා කලාපතො**
**පවත්තික්කමතෝ චෙති - පඤ්චධා තත්ථ සංගහො**

02. සතර පරමාර්ථ ධර්ම අතුරෙන් ප්‍රභේද සහිත වූ චිත්ත - චෛතසික පරමාර්ථ ධර්ම දෙක වනාහි, චිත්තසංග්‍රහය - චෛතසික සංග්‍රහය ප්‍රකීර්ණක සංග්‍රහය - වීථි සංග්‍රහය - වීථිමුක්ත සංග්‍රහය ද නම් වූ පරිච්ඡේද පසකින් බෙද දක්වන ලද්දහ. මේ සයවෙනි පරිච්ඡේදයෙහි වනාහි රූපය - නිර්වාණය නම් වූ පරමාර්ථ ධර්ම දෙක කියනු ලබන්නාහ.

03. රූප - නිර්වාණ පරමාර්ථ දෙක අතුරෙන් පළමුකොට රූප පරමාර්ථය සමුද්දේස = නම් වශයෙන් සංක්ෂේපයෙන් ද, විභාග= ඒකවිධ ආදී ප්‍රභේද වශයෙන්ද, සමුට්ඨාන = රූප උපදින සමුට්ඨාන හේතු වශයෙන් ද, කලාප - චක්ඛුදසකාදී කලාප වශයෙන් ද, පවත්තික්කම = භවය - කාලය - සත්වකොට්ඨාශ භේදයෙන් රූපයන්ගේ උත්පත්ති ක්‍රම වශයෙන් ද යන පස් ආකාරයකින් මෙහි දැක්වෙන්නේය.

04. සතර මහා භූතරූපයෝ ය සතර මහාභූත රූපයන් ඇසුරුකොට පවත්නා වූ උපාදය රූපයෝ ය යන දෙයාකාර රූපය වනාහි මෙහි දී එකොළොස් ආකාරයකින් සංග්‍රහ වන්නේ ය. ඒ කෙසේ ද යත්, පඨවි ධාතුවය - ආපෝ ධාතුවය - තේජෝ ධාතුවය වායෝ ධාතුව යද යන සතර භූතරූප නම් වන්නාහ.

05. චක්ෂුප්‍රසාදය - ශ්‍රෝත්‍රප්‍රසාදය - ඝ්‍රාණ ප්‍රසාදය - ජිව්හා ප්‍රසාදය - කාය ප්‍රසාදය ද යන පස ප්‍රසාදරූප නම් වන්නාහ. වර්ණය - ශබ්දය - ගන්ධය - රසය සහ ආපෝධාතු වර්ජිත පඨවි තේජෝ වායෝ යන භූතත්‍රය සංඛ්‍යාත ස්පර්ශය ද ගෝචර රූපය නම් ද විෂය රූප නම් ද වන්නේය.

06. ස්ත්‍රී භාවය - පුරුෂ භාවය යනු භාවරූපය නම් වන්නේ ය. හෘදය වස්තුව වස්තුරූප නම් වන්නේය. ජීවිතේන්ද්‍රිය ජීවිත රූපය නම් වන්නේය. කබලිංකාරාහාරය ආහාර රූපය නම් වන්නේය. මෙසේ අටලොස් වැදෑරුම් රූපය වනාහි ස්වභාව රූපය - ස්වලක්ෂණ රූපය - නිෂ්පන්න රූපය රූප රූපය - සන්මර්ශන රූපය නම් ද වන්නේය.

07. ආකාශ ධාතුව පරිච්ඡේද රූපය නම් වන්නේය. කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති යුගලය විඤ්ඤත්ති රූපය නම් වන්නේය. රූපයාගේ ලහුතා - මුදුතා - කම්මඤ්ඤතා තුන සහ විඤ්ඤත්ති යුගලය ද විකාර රූපය නම් වන්නේය. රූපයාගේ උපචය - සන්තති - ජරතා - අනිච්චතා සතර වනාහි ලක්ෂණ රූපය නම් වන්නේය. මෙතැනදී උපචය නම් වූ ජාති රූපයම වනාහි සන්තති රූපය නම් ද වන්නේය. මෙසේ එකොළොස් වැදෑරුම් රූප කොට්ඨාශ වනාහි ස්වරූප වශයෙන් අටවිසි වැදෑරුම් වන්නේය.

08. **භූතප්පසාද විසයා - භාවො හදය මිච්චපි**
**ජීවිතාහාර රූපේහි - අට්ඨාරස විධං තථා**
**පරිච්ඡේදො ච විඤ්ඤත්ති - විකාරෝ ලක්ඛණන්ති ච.**
**අනිප්ඵන්නා දස චේති - අට්ඨවීස විධං භවේ**

09. මහාභූතරූප සතරද ප්‍රසාදරූප පසද විෂයරූප සතරද භාව රූප දෙක ද හෘදය රූපය ද ජීවිත රූපය ද ආහාර රූපය දැයි නිෂ්පන්න රූපය අටලොස් වැදෑරුම් වන්නේ ය.

එසේ ම පරිච්ඡේද රූපය ද විඤ්ඤත්ති රූප දෙකද විකාර රූප දෙකද ලක්ෂණ රූප සතර දැයි අනිෂ්ඵන්න රූපය දශ වැදෑරුම් වන්නේය. මෙසේ රූප සියල්ල අටවිසි වැදෑරුම් වන්නේය.

10. <u>භූත රූප සතර</u> :

පඨවි ආපෝ තේජෝ වායෝ නම් වූ සතරක් වූ මහාභූත රූපයෝ වනාහි, මහත්සේ පහළ වන හෙයින් ද, මායාකාර මහාභූතයන්ට සමාන හෙයින් ද, යක්ෂ මහාභූතයන්ට සමාන හෙයින් ද, යක්ෂණී මහාභූතයන්ට සමාන හෙයින් ද, මහත් උත්සාහයෙන් පරිහරණය කළමනා, හෙයින් ද, මහත් සේ විනාශ වන හෙයින් ද, මහත් ව්‍යායාමයකින් විදර්ශනා ඥානයෙන් අල්වාගත මනා හෙයින් ද, මහාභූත නම් වන්නාහ.

11. මහත් සේ පහළ වන - මහන්තපාතුභාවාර්ථයෙන් මහාභූත නම් වන්නේ කෙසේ ද යත්, සතර මහාභූත රූපයන්ගේ නිර්මාණයක් වූ මහා පෘථුවිය වනාහි දිගින් පළලින් දෙලොස් ලක්ෂ තුන්දහස් සාරසිය පණස් යොදුනක් පමණ වන්නේය. වටප්‍රමාණයෙන් වනාහි සතිස් ලක්ෂ දස දහස් තුන්සිය පණස් යොදුනක් පමණ වන්නේය. ගණ ප්‍රමාණයෙන් දෙලක්ෂ සතලිස් දහසක් යොදුන් පමණ වන්නේය.

12. පෘථුවිය දරා සිටින්නා වූ ජලපොලොව වනාහි සාරලක්ෂ අසූදහසක් යොදුන් පමණ වන්නේය. ජලපොළොව දරා සිටින්නා වූ වා පොළොව වනාහි නවලක්ෂ සැට දහසක් යොදුන් පමණ වන්නේය.

13. සිනේරු පර්වතය වනාහි යොදුන් අසූසාර දහසක් මුහුදු ජලයෙහි ගැලී සිටියේය. අසූසාර දහසක් යොදුන් උස ඇත්තේය. යුගන්ධර පර්වතය මුහුදෙන් යට ද උඩ ද යොදුන් දෙසාලිස් දහස බැගින් සිටියේය. ඊසධර පර්වතය මුහුදෙන් උඩ-යට යොදුන් එක්විසි දහස බැගින් වූයේය. කරවීක පර්වතය මුහුදෙන් උඩ-යට යොදුන් දස දහස් පන්සියය බැගින් වූයේය. සුදර්ශන පර්වතය ද උඩ-යට යොදුන් පන් දහස් දෙසිය පණහ බැගින් වූයේය. නේමින්ධර පර්වතය ද උඩ-යට යොදුන් දෙදහස් හයසිය පස්විස්සක් වූයේය. විනතක පර්වතය ද උඩ-යට යොදුන් එක් දහස් තුන්සිය දොළසකුත් දෙගව්වක් වූයේය. අශ්වකර්ණ පර්වත වනාහි උඩ-යට යොදුන් සයසිය සපණසක් ද එක් ගව්වක්ද වූයේය.

14. සිනේරු පර්වතය වටකොට, පිහිටියා වූ මේ සත් කුල පව් සත අතර ගාම්භීර සීදන්ත සාගර සතක් පිහිටා ඇත්තාහ. චාතුර්මහා රාජික දෙවියන්ගේ ද යක්ෂයන්ගේ ද වාසස්ථාන පිහිටා ඇති බැවින් මේ සත් කුලපව් ආදිය මනුෂ්‍යයන් විසින් දැකබලාගත නොහැක්කාහ.

15. තව ද, හිමාල පර්වතය යොදුන් පන්සියයක් උස ඇත්තේය. දිග පළලින් යොදුන් තුන් දහසක් වන්නේය. හිම කඳු මුදුන් අසූසාර දහසක් පිහිටා ඇත්තාහ. ජම්බුද්වීප නමින් ප්‍රසිද්ධියට කාරණ වූ ජම්බු වෘක්ෂය වනාහි යොදුන් සියයක් උස ඇත්තේය, එපමණ පැතිරගිය ශාඛා ඇත්තේය. පණස් යොදුනක් කඳ ඇත්තේය, පසළොස් යොදුනක් වට ඇත්තේය.

16. අසුර භවනයෙහි චිත්‍රපාටලී වෘක්ෂය ද, ගුරුළු භවනයේ සිම්බලී වෘක්ෂය ද, අපරගෝයානයේ කදම්බ වෘක්ෂයද පූර්ව විදේහයෙහි සිරීස වෘක්ෂය ද, උතුරු කුරු ජනපදයෙහි කල්ප වෘක්ෂය ද තාවතිංස භවනයෙහි පරසතු වෘක්ෂය ද, යන කල්පස්ථායී වෘක්ෂයෝ සත් දෙන ජම්බුද්වීපයෙහි ජම්බු වෘක්ෂය හා සමාන වූ ප්‍රමාණ ඇත්තාහ.

17. මේ ලෝකධාතුව වටකොට ඇත්තාවූ චක්‍රවාට පර්වතය වනාහි දෙඅසූ දහසක් යොදුන් මහා සාගරයෙහි බැස පිහිටා ඇත්තේය. දෙඅසූ දහසක් යොදුන් උස ඇත්තේය. මෙසේ අනුපාදින්නක නම් වූ අචේතනික වස්තූන් ද මහත් සේ පහළ කරවන අර්ථයෙන් පඨවි ආපෝ තේජෝ වායෝ සතර දෙනා මහා භූත නම් වන්නාහ.

18. උපාදින්නක සන්තාන නම් වූ සචේතනික වස්තූන් අතරෙහි ද, යොදුන් සියගණන්ද දහස් ගණන්ද විශාල වූ මත්ශ්‍යයෝ ද නාගයෝ ද අසුරයෝ ද දෙවියෝ ද බ්‍රහ්මයෝ ද විද්‍යමානව ඇත්තාහ. මෙසේ සචේතනික විශාල වස්තූන් පහළ කරවන බැවින්ද මහන්තපාතුභාවාර්ථයෙන් සතරක් වූ භූතරූපයෝ මහා භූතරූප නම් වන්නාහ.

19. මායාකාර මහා භූත සමාන බැවින් මහාභූත නම් වනුයේ කෙසේ ද යත්, යම් සේ, වනාහි මායාකාරයා මැණික් නොවූම ජලබින්දු මැණික් කොට දක්වන්නේය, රත්රන් නොවූම ගල්කැට රත්රන් කොට දක්වන්නේය. යක්ෂයෙක් නොවූම තමා යක්ෂයකු කොට දක්වන්නේය. පක්ෂියකු නොවූම තමා පක්ෂියකු කොට දක්වන්නේය.

20. එසේම මේ සතර මහා භූතරූපයෝ වනාහි තමා නීල වර්ණ නොවූයේම නීලවර්ණ මවා පාන්නාහ. තමා් පීත - ලෝහිත - ඕදතාදී වර්ණ නොවූයේම පීත- ලෝහිත - ඕදතා දී වර්ණ විශේෂ මවා පාන්නාහ. මෙසේ තමාගේ සැබෑ තත්වය සඟවා ලෝ වැසි අනුවණ ජනතාව රවටා ශුභ අරමුණු මවාපාන අර්ථයෙන් ද සතර ධාතු මායාකාර මහාභූත සමාන බැවින් මහා භූත නම් වන්නාහ.

21. යක්ෂ මහා භූත සමාන අර්ථයෙන් මහා භූත නම් වනුයේ කෙසේ ද යත්, යම් සේ වනාහි යක්ෂයන්ගේ ග්‍රහණයට ලක්වූ මිනිසුන්ගේ සිරුර ඇතුලත හෝ පිටත හෝ සිටින තැනක් දැක්විය නොහැක්කේද, එහෙත් ඒ මිනිස් සිරුරට ආවිෂ්ඨ ව ද සිටින්නාහ. එසේම මේ සතරක්වූ භූත රූපයෝ ද, එකිනෙක ඇතුලත හෝ පිටත හෝ පිහිටා සිටින තැන් දත නොහැක්කේය. එහෙත් ඔවුන්වුන් ඇසුරු කොට ම ඇත්තාහ. මෙසේ යක්ෂ මහා භූත සමාන බැවින්ද මහාභූත නම් වන්නාහ.

22. යක්ෂණී මහා භූත සමානතාවෙන් මහා භූත නම් වන්නේ කෙසේද යත්, යම් සේ වනාහි මිනී කන යක්ෂණියෝ තමාගේ භයානක විරූපී ආත්ම භාවය නොපෙනේවා දිව්‍යංගනාවන් මෙන් පෙනී මිනිසුන් මුලා කරන්නාහුද, එසේම මේ සතර මහා භූත රූපයෝ ද තමාගේ කර්කශතාව ආදී ලක්ෂණ සඟවා මනා හැඩ රුව ඇති සෝභමාන ස්ත්‍රී පුරුෂා දී සටහන් මවා පා අන්ධබාල ජනයා මුලා කරන්නාහ. මෙසේ යක්ෂණී මහා භූත සමාන අර්ථයෙන්ද මහා භූත නම් වන්නාහ.

23. මහා උත්සාහයෙන් පරිහරණය කළයුතු හේතුවෙන් මහා භූත නම් වන්නේ කෙසේ ද යත්, මේ සතර මහා භූතයෝ වනාහි උපන් ද සිටම නෑවීම කැවීම පෙවීම ඇඳීම පිරිසිදු කිරීම ඉරියව් පැවැත්වීම ලෙඩට පිළියම් කිරීමාදී අනේක විධ වැඩ කටයුතු සම්භාරයකින් පරිහරණ කළයුතු වන්නේය. මෙසේ මහා පරිහාරයෙන් පැවැත් විය යුතු වන බැවින් ද මහා භූත නම් වන්නාහ.

24. මහා විකාර ඇති බැවින් මහාභූත නම් වනුයේ කෙසේ ද යත්, සචේතනික වූ ද අචේතනික වූද මහා භූතයන්ගේ විකාරය හෙවත් විනාශය මහත් සේ සිදුවන්නේය. ගින්නෙන් - ජලයෙන් - සුළඟින් ද කල්ප විනාශ වීමේ දී කෝටිලක්ෂයක් සක්වළ අන්තර කල්ප විස්සක් තරම් දිගු කලක් තිස්සේ ගින්නෙන් දැවී දැවී, ජලයෙන් දිය වෙවී, සුළඟින් සුණු වෙවී විනාශ වන්නාහ.

25. සචේතනික සත්ත්ව සන්තාන ද පඨවි කෝපයෙන් කාෂ්ඨමුඛ සර්පයකු දෂ්ඨ කළා සේ දරදඬු වී නැසෙන්නාහ. ආපෝ ධාතු කෝපයෙන් පූතිමුඛ සර්පයකු දෂ්ඨ කරන ලද්ද සේ දිය වී විනාශ වන්නාහ. තේජෝ ධාතු කෝපයෙන් අග්නි මුඛ සර්පයකු විසින් දෂ්ඨ කරන ලද්දකු සේ දැවී නැසෙන්නාහ. වායෝ ධාතු කෝයෙන් ශස්ත්‍රමුඛ සර්පයකු විසින් දෂ්ඨ කරන ලද්දකු සේ කඩ කඩ වී නැසෙන්නාහ. මෙසේ මහත් විකාර ඇති බැවින් ද මහාභූත නම් වන්නාහ.

26. මහත් උත්සාහයෙන් පරිග්‍රහණය කළයුතු වන බැවින් ද මහා භූත නම් වනුයේ කෙසේ

ද යත්, මේ සතරක් වූ මහා භූතරූපයෝ පරමාර්ථ ධර්ම වන බැවින් විදර්ශනා ඥානයෙන් පරිග්‍රහණය කිරීම පිණිස, දීර්ඝ කාලයක් ශීල විශුද්ධිය පිණිසත් උපචාර අර්පණා ධ්‍යාන භාවනා වශයෙන් චිත්ත විසුද්ධිය පිණිසත් මහත් සේ වෑයම් කළ යුතු ද වන්නේය. සීලවිසුද්ධි- චිත්තවිසුද්ධි දෙක මහත් උත්සාහයෙන් සම්පූර්ණ කොට සතර ධාතු පරිග්‍රහණය කරමින් දිට්ඨි විශුද්ධිය පිණිස දීර්ඝ කාලයක් මහත් සේ උත්සාහ කළයුතු වන බැවින්ද මේ සතර මහාභූත නම් වන්නාහ.

27. සතර මහා භූත රූප අතුරෙන් පඨවි ධාතුව කර්කශ බව (ථද්ධ ලක්ඛණ) ලක්ෂණය කොට ඇත්තේය. සෙසු රූපයන්ට පිහිටාධාර වීම (පතිට්ඨාන රසා) කෘත්‍ය රසය කොට ඇත්තේය. සෙසු රූප ධාතූන් පිළිගැනීම (සම්පටිච්ඡන පච්චුපට්ඨානා) වැටහීම් කොට ඇත්තේය. අවසේස ආපෝ - තේජෝ - වායෝ යන ධාතූන් තිදෙනා (අවසේස ධාතුත්තය පදට්ඨානා) ආසන්න තම හේතුව කොට ඇත්තේය. තව ද තදබව මෘදුබව - බර බව සැහැල්ලු බව - රළුබව සිනිඳු බව වශයෙන් පඨවි ධාතුවෙහි ලක්‍ෂණය සය වැදෑරුම් ද වන්නේය.

28. සතර මහා භූත රූප අතුරෙන් ආපෝ ධාතුව වනාහි, වැගිරෙන සුළු බව (පග්ඝරණ ලක්ඛණ) ලක්ෂණ කොට ඇත්තේය. රූප කලාප වර්ධනය කරන බව (බ්‍රෑහණ රසා) කෘත්‍ය රසය කොට ඇත්තේය. රූපයන් සම්පිණ්ඩනය කරන බව (සංගහ පච්චුපට්ඨානා), වැටහීම් කොට ඇත්තේය. අවසේස ධාතූන් තිදෙන ආසන්න හේතුව කොට ඇත්තේය. තවද වැගිරෙන සුළු බව සහ ආබන්ධන බව දැයි ආපෝ ධාතු ලක්ෂණය ද දෙවැදෑරුම් වන්නේය.

29. සතර මහා භූත රූප අතුරෙන් තේජෝ ධාතුව වනාහි, උෂ්ණත්වය (උණ්හත්ත ලක්ඛණා) ලක්ෂණ කොට ඇත්තේය. රූපයන් පැසවන බව හෙවත් මුහුකරවන බව (පරිපාචන රසා) කෘත්‍ය රසය කොට ඇත්තේය. රූපයන් මෘදු මොළොක් බවට පත් කරවීම (මද්දවානුප්පදන පච්චුපට්ඨානා) වැටහීම් කොට ඇත්තේය. අවසේස ධාතූන් තිදෙන ආසන්න හේතුව කොට ඇත්තේය. තව ද උණුසුම් බව හා සීතල බව දැයි තේජෝ ධාතු ලක්ෂණය ද දෙවැදෑරුම් වන්නේය.

30. සතර මහා භූත රූපයන් අතුරෙන් වායෝ ධාතුව වනාහි, පිරෙන බව - පිම්බෙන බව (විත්ථම්භන ලක්ඛණා) ලක්ෂණ කොට ඇත්තේය. චංචල බව - සෙලවෙන බව (සමුදීරණ රසා) කෘත්‍ය රසය කොට ඇත්තේය. ඉදිරියට යැවීම ඉරියව් පැවැත්ම (අභිනීහාර පච්චුපට්ඨානා) වැටහීම් කොට ඇත්තේය. අවසේස ධාතූන් තිදෙන ආසන්නතම හේතුව කොට ඇත්තේය. තව ද රැකුල් දෙන බව - සැලෙන බව දැයි වායෝ ධාතු ලක්ෂණය ද දෙවැදෑරුම් වන්නේය.

31. චක්ෂුප්‍රසාදය ශ්‍රෝත්‍ර ප්‍රසාදය ඝ්‍රාණ ප්‍රසාදය ජිව්හා ප්‍රසාදය කාය ප්‍රසාදයැයි ප්‍රසාද රූපය වනාහි පස් වැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් චක්ෂු ප්‍රසාද රූපය නම් කවරේද යත්, ප්‍රිය මනාප වර්ණ රූපයන් දැකීමේ ආශාව හේතු කොට ගෙන පූර්ව භවයේදී රැසකළ කුශල කර්මයේ ආනුභාවයෙන් හටගත්තා වූ මහා භූතරූපයන්ගේ ප්‍රසාද බව නම් වූ රූප විශේෂයක් වන්නේය. සසම්භාර චක්ෂුව නම් වූ චක්ෂු ගෝලයෙහි, ඉදිරිපිට සිටියන්ගේ ඡායාව වැදගැනීමට සමත් වූ, කපු පුළුන් පෙද සතක පැතිරීගත් පිරිසිදු තල තෙල් බිඳක් මෙන්, සියුම් වූ සිව් පටල සතක පැතිරී පවතින පඨවි ආපෝ තේජෝ වායෝ යන සතර ධාතූන්ගේ උපකාර ලබමින් වර්ණ ගන්ධ රස ඕජා නමැති උපාද රූපයන් පිරිවරා ගත්තා වූ ජීවිතේන්ද්‍රිය මගින් අනුපාලිත වූ - ඍතු චිත්ත ආහාරයෙන් උපස්ථම්භිත වූ කැඩපත් ඔපය වැනි ඔපවත් රූප විශේෂය වනාහි චක්ෂු ප්‍රසාද රූපය නම් වන්නේය.

32. චක්ෂු ප්‍රසාදය වනාහි, වර්ණ රූප ඡායාව පහළ වීමට සුදුසු බව (රූපාභිඝාතාරහ භූතප්පසාද ලක්ඛණා) ලක්ෂණය කොට ඇත්තේය. එසේම, ප්‍රිය මනාප වර්ණ රූපයන්

දැකීමේ ආශාව හේතු කොටගෙන රැස්කළ කර්මයෙන් හටගත් මහාභූත රූපයන්ගේ ප්‍රසාද බව (දට්ඨුකාමතා නිදාන කම්මසමුට්ඨාන භූත පපසාදලක්ඛණං) ලක්ෂණය කොට ඇත්තේය, රූප අරමුණෙහි එල්බ ගැනීම - රූප අරමුණෙහි සේයාව වැදගැනීම (රූපෙසු ආවිඤ්ජන රසං) කෘත්‍ය රසය කොට ඇත්තේය. චක්ෂුර් විඥානයට නිශ්‍රය - ආධාර වීම (චක්ඛු විඤ්ඤාණස්ස ආධාරභාව පච්චුපට්ඨානං) වැටහීම් කොට ඇත්තේය. දැකීමේ කැමැත්ත නිදහන් කොට ගත් කර්මජ මහා භූත රූප සතර (දට්ඨුකාමතා නිදාන කම්මජ භූත පදට්ඨානං) ආසන්නතම හේතුව කොට ඇත්තේය.

33. චක්ෂු ප්‍රසාදය වනාහි රූප දර්ශනයෙහි නියමුවා බැවින් චක්ෂුව නම් ද වන්නේය. චක්ෂුර්විඥානාදී චිත්ත චෛතසිකයන් උපදින රැස්වන තැන බැවින් චක්ඛායතනය නම් ද වන්නේය. ආත්ම ස්වභාවයෙන් හිස්බැවින් චක්ෂු ධාතුව නම් ද වන්නේය. රූප දර්ශනයෙහි අධිපති බැවින් චක්ඛුන්ද්‍රිය නම් ද වන්නේය. ලුජ්ජන පලුජ්ජන - කැඩෙන බිඳෙන අර්ථයෙන් ලෝකය නම් ද වන්නේය. චිත්ත චෛතසික ඇතුල්වන පිටවන තැනක් බැවින් ද්වාර නම් ද වන්නේය. දැකීමේ ආශාව නොපිරෙන බැවින් සමුද්‍රය නම් ද වන්නේය. ප්‍රසන්න බැවින් පණ්ඩර නම් ද වන්නේය. චක්ඛුසම්ඵස්සාදිය ජනනය කරවන බැවින් ඛෙත්ත නම් ද වන්නේය. ඔවුන්ටම පිහිට වන බැවින් වස්තු නම් ද වන්නේය. සම විසම දක්වමින් තමා පමුණුවන බැවින් නේත්‍ර නම් ද-නයන නම් ද වන්නේය. ස්කන්ධ ලෝකයටම අයත් බැවින් ඕරිමතීර නම් ද වන්නේය. බහුසාධාරණ බැවින් ද අස්වාමික බැවින් ද සුන්‍යග්‍රාම නම් ද වන්නේය.

34. ශ්‍රෝත්‍ර ප්‍රසාද රූපය නම් කවරේද යත්, ශබ්ද අරමුණු වැදගන්නේනුයි ශබ්ද අසන්නේ නුයි සෝත්‍ර නම් වන්නේය. (සුණාතීති සොතං) සසම්භාර සෝත්‍රය නම් වූ කණෙහි කන් බිලයෙහි ඇතුලත තඹවන් සිහිඳු රෝමයන් ගැවසීගත් ඇඟිලි මුද්දක් වැනි තැන, සතර මහා භූත රූපයන්ගේ උපකාර ඇතිව වර්ණ ගන්ධ රස ඕජා රූපයන් පිරිවරාගත්තා වූ ජීවිතින්ද්‍රිය මගින් පාලනයවූ ඍතු - චිත්ත - ආහාරයෙන් රැකුල් ලබන්නා වූ සෝත්‍ර විඤ්ඤාණ - නාම ධර්මයන්ට නිශ්‍රය ආධාර- ද්වාර වශයෙන් පවත්නේ ශ්‍රෝත්‍ර ප්‍රසාද රූපය නම් වන්නේය.

35. ශ්‍රෝත්‍ර ප්‍රසාද රූපය වනාහි ශබ්ද අරමුණු වැදගැනීමට යෝග්‍ය වූ ඔපයක් බව (සද්දාභිඝාතාරහ භූතප්පසාද ලක්ඛණං) ලක්ෂණ කොට ඇත්තේය. තවද, මධුර නාදය ඇසීමේ ආශාව නිහඳන් කොට ගත් අතීත භවයෙහි රැස්කළ කර්මයෙන් හටගත් සතර ධාතූන්ගේ ප්‍රසාදයක් - ඔපයක් බව (සොතු කාමතා නිදාන කම්ම සමුට්ඨාන භූතප්පසාද ලක්ඛණං) ලක්ෂණය කොට ඇත්තේය. ශබ්ද අරමුණෙහි එල්බ ගැනීම - ශබ්ද අරමුණු වැදගැනීම (සද්දේසු ආවිඤ්ජන රසං) කෘත්‍ය රසය කොට ඇත්තේය. සෝත්‍රවිඤ්ඤාණයට නිශ්‍රය - ආධාරවීම (සොතවිඤ්ඤාණස්ස ආධාරභාව පච්චුපට්ඨානං) වැටහීම් කොට ඇත්තේය. ඇසීමේ කැමැත්ත - ආශාව නිදහන් කොටගත් කර්මයෙන් ජනිත මහාභූතයන් (සොතුකාමතා නිදාන කම්මජ භූත පදට්ඨානං) ආසන්නතම හේතුව කොට ඇත්තේය.

36. ඝ්‍රාණ ප්‍රසාද රූපය නම් කවරේ ද යත්, ගන්ධ අරමුණ ආඝ්‍රාණය කරන්නේනුයි ඝ්‍රාණ නම් වන්නේය. (ඝායතීති ඝාණං) සසම්භාර ඝ්‍රාණ නම් වූ නාසිකාවෙහි, නාසිකා බිලයෙහි එළු කුරයක හැඩය ඇති තැන්හි, සතර ධාතූන්ගෙන් උපකාර ලබන, වර්ණ ගන්ධ රස ඕජා රූප පිරිවර කොට ජීවිත ඉන්ද්‍රියයෙන් අනුපාලනය ලබන ඝ්‍රාණ විඤ්ඤාණ නාමයන්ට නිශ්‍රය-ආධාර - ද්වාරය වන ඍතු චිත්තාහාරයෙන් උපස්තම්භිත වූ ගන්ධ අරමුණ වැද ගන්නා වූ ප්‍රසාදය - ඔපය ඝ්‍රාණ ප්‍රසාද රූපය නම් වන්නේය.

37. ඝ්‍රාණ ප්‍රසාද රූපය වනාහි, ගන්ධ අරමුණ වැද ගැනීමට යෝග්‍ය වූ මහා භූත රූපයන්ගේ ප්‍රසාද - ඔපය බව (ගන්ධාභිඝාතාරහ භූතප්පසාද ලක්ඛණං) ලක්ෂණය කොට ඇත්තේය. තවද, මිහිරි සුවඳ ආඝ්‍රාණය කරනු කැමති ආසාව නිදහන් කොටගත් කර්මයෙන් ජනිත

මහාභූතයන්ගේ ප්‍රසාදය බව (සායිතු කාමතා නිදාන කම්ම සමුට්ඨාන භූතප්පසාද ලක්ඛණං) ලක්ෂණය කොට ඇත්තේය. ගන්ධ අරමුණ වැද ගැනීම (ගන්ධෙසු ආවිඤ්ජනරසං) කෘත්‍ය රසය කොට ඇත්තේය. ඝ්‍රාණ විඤ්ඤාණ නාමධර්මයන් හට නිශ්‍රය ආධාර වීම (ඝාණ විඤ්ඤාණස්ස ආධාර භාව පච්චුපට්ඨානං) වැටහීම් කොට ඇත්තේය. ආඝ්‍රාණය කිරීමේ ආශාව නිදහන් කොටගත් කර්මජ මහාභූතයන් (සායිතු කාමතා නිදාන කම්මජ භූත පදට්ඨානා) ආසන්නතම හේතුව කොට ඇත්තේය.

38. ජිව්හා ප්‍රසාද රූපය නම් කවරේද යත්, රසය සායනය කරන්නේ නුයි ජිව්හා නම් වන්නේය. (සායනට්ඨේන ජිව්හා) එය වනාහි සසම්භාර දිව මැද උඩුපැත්තෙහි මානෙල් මල්පෙති අගක් වැනි තැන සතර ධාතූන්ගේ උපකාර ලබමින්, වර්ණ ගන්ධ රස ඕජාවන් පිරිවරා ගෙන, ජීවිතේන්ද්‍රිය විසින් පාලනය වන ඍතුචිත්ත ආහාරයෙන් උපස්ථම්භිත වූ ජිව්හා විඤ්ඤාණ නාමධර්මයන් හට නිශ්‍රය - වස්තු ද්වාර වෙමින් පවත්නේය.

39. ජිව්හා ප්‍රසාද රූපය වනාහි, රසරූප - රස අරමුණු වැදගැනීම යෝග්‍ය වූ මහාභූතයන්ගේ ප්‍රසාදය - ඔපය (රසාභිඝාතාරහ භූතප්පසාද ලක්ඛණා) ලක්ෂණය කොට ඇත්තේය. තවද, රස විඳීමේ ආශාව නිදහන් කොට ගත් කර්මයෙන් ජනිත මහා භූත රූපයන්ගේ ප්‍රසාදය - ඔපය (සායිතු කාමතා නිදාන කම්ම සමුට්ඨාන භූත ප්පසාද ලක්ඛණා) ලක්ෂණය කොට ඇත්තේය. රස අරමුනෙහි එල්බ ගැනීම (රසේසු ආවිඤ්ඡන රසා) කෘත්‍ය රසය කොට ඇත්තේය. ජිව්හා විඤ්ඤාණ නාම ධර්මයන්ට නිශ්‍රය - ආධාර වීම (ජිව්හා විඤ්ඤාණස්ස ආධාර භාව පච්චුපට්ඨානා) වැටහීම් කොට ඇත්තේය. රස විඳීමේ ආසාව නිදහන් කොට ගත් කර්මජ මහා භූත (සායිතු කාමතා නිදාන කම්මජ භූතපදට්ඨානා) ආසන්නතම හේතුව කොට ඇත්තේය. තවද, ජිව්හා - ජිව්හායතන - ජිව්හාධාතු - ජිව්හින්ද්‍රිය - ලෝක-ජිව්හාද්වාර සමුද්‍රය - පණ්ඩර - ඛෙත්ත - වත්ථු - ඕරිමතීර - සුඤ්ඤගාම නමින් ද ජිව්හා ප්‍රසාදය හැඳින්වෙන්නේය.

40. කාය ප්‍රසාද රූපය නම් කවරේද යත්, ස්ප්‍රර්ශ අරමුණු වැදගැනීමට සමත්වූ කපු පුළුන් පෙදක් පැතිරීගත් තෙල් බින්දුවක් සේ සකල ශරීරයෙහි පැතිර පවත්නා වූ, සතර ධාතූන්ගේ උපකාර ලබමින් වර්ණ ගන්ධ රස ඕජා පිරිවැරූ ජීවිතේන්ද්‍රිය මගින් අනුපාලනය වන්නා වූ කායවිඤ්ඤාණ නාම ධර්මයන් හට නිශ්‍රය - ආධාර - ද්වාර වන්නා වූ ප්‍රසාද රූපය වනාහි කාය ප්‍රසාදය නම් වන්නේය.

41. කාය ප්‍රසාද රූපය වනාහ, ස්ප්‍රර්ශ අරමුණ වැදගැනීමට යෝග්‍ය වූ භූතරූපයන්ගේ ප්‍රසාද ඔපයක් බව (ඵොට්ඨබ්බාභි ඝාතාරහ භූතප්පසාද ලක්ඛණො) ලක්ෂණ කොට ඇත්තේය. තවද, ස්පර්ශ විඳීමේ ආශාව නිදහන් කොටගත් කර්මයෙන් ජනිත මහා භූතයන්ගේ ප්‍රසාද - ඔපය බව (ඵුසිතුකාමතා නිදාන කම්ම සමුට්ඨාන භූතප්පසාද ලක්ඛණො) ලක්ෂණ කොට ඇත්තේය. ස්ප්‍රර්ශ අරමුණෙහි එල්බ ගැනීම (ඵොට්ඨබ්බෙසු ආවිඤ්ජන රසො) කෘත්‍ය රසය කොට ඇත්තේය. කායවිඤ්ඤාණ නාමධර්මයන්ට නිශ්‍රය - ආධාර වන බව (කාය විඤ්ඤාණස්ස ආධාරභාව පච්චුපට්ඨානො) වැටහීම් කොට ඇත්තේය. ස්පර්ශය විඳීමේ ආශාව නිදහන් කොටගත් කර්මයෙන් ජනිත මහාභූත රූප (ඵුසිතුකාමතා නිදාන කම්මජ භූත පදට්ඨානා) ආසන්නතම හේතුව කොට ඇත්තේය. තවද, කාය - කායායතනය - කායධාතුය කායින්ද්‍රිය - ලෝකය - කායද්වාරය - සමුද්‍රය - පණ්ඩරය - ඛෙත්තය වත්ථුය- ඕරිමතීරය - සුඤ්ඤග්‍රාමය නමින්ද කාය ප්‍රසාදය හැඳින්වෙන්නේය.

ත්‍රිලක්ෂණ විදර්ශනාව : පසුගිය පාඩම්වල මෙනි - සාධු. සාධු. සාධු.

කොළඹ 09 කැටවල මුල්ල අංක 109 පදිංචි ශ්‍රියා කරුණාධාර මහත්මාව, ඔිය දයාබර පියාණන් වහන්සේ වන J. D. A. රණසිංහ මහත්මානන්ට පිං පිණිසත් - ඩිලන්ති ද සිල්වා මහත්මාව, ඊවී ද සිල්වා ලදරු පුතු නිරෝගි සුව පිණිසත් ධම්දානය වශයෙන් නුගේගොඩ ගංගොඩවිල 37 සෝරත මාවතේ පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස්හි මුද්‍රණය කරවන ලදි.

රාජ්‍ය සේවා බෞද්ධ සංගමය
මහවැලි සංවර්ධන අමාත්‍යාංශය 500 ටී. බී. ජයා මාවත, කොළඹ 10
25 43 දුරුතු / 2000 පෙබරවාරි 09

## අභිධර්ම විපස්සනා භාවනා පාඩම අංක - 13
## අභිධර්මාර්ථ සංග්‍රහ රූප විභාග සංග්‍රහය - 02
## අති පූජ්‍ය නා උයනේ අරිය ධම්ම නා හිමිපාණන් වහන්සේ විසින්

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!

<u>විසය රූප සතර</u>

01. අටවිසි රූපය අතුරෙන් වර්ණරූපය - ශබ්දරූපය ගන්ධ රූපය - රස රූපය නමින් විසය රූප හෙවත් ගෝචර රූපය සතර වැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් වර්ණ රූපය නම් කවරේද යත්, නිල්පාට - කහපාට සුදුපාට - රතුපාට- මදටිය පාට - අඹදළු පාට - රන්වන් පාට - අරුණුවන් පාට - ඉර එළිය - සඳ එළිය - තරු එළිය - ගිනි එළිය - දිග - කෙටි - උස - මිටි - ලොකු - කුඩා - වටකුරු හතරැස් - සයැස් - අටැස් - ස්ථූල - කෘශ - කැඩපත් එළිය ආදී ඇසට ලක්වන - ඇසින් දකින වර්ණය වනාහි වර්ණ රූපය නම් වන්නේය.

02. ඇසට ලක්වන වර්ණ රූපය වනාහි චක්ෂු ප්‍රසාදයට ආපාත ගත වන බව (චක්ඛු පටිහනන ලක්ඛණං) ලක්‍ෂණය කොට ඇත්තේය. චක්ඛු විඤ්ඤාණයට විසය වන බව - අරමුණු වන බව (චක්ඛු විඤ්ඤාණස්ස විසය භාව රසං) කෘත්‍ය රසය කොට ඇත්තේය. චක්ඛුවිඤ්ඤාණයටම ගොදුරුවන බව (තස්සේව ගොචරභාව පච්චුපට්ඨානං) වැටහීම් කොට ඇත්තේය. සතර මහාභූතරූප ආසන්නතම හේතුවකොට ඇත්තේය. (චතුමහා භූත පදට්ඨානං)

03. අටවිසි රූපය අතුරෙන් ශබ්ද රූපය නම් කවරේද යත්, බෙර - පණාබෙර - දවුල් - තම්මැට්ටන් - මගුල් බෙර - ගැටබෙර - ආදී ශබ්දය ද නළා - හොරණෑ - සක් ආදී ශබ්දය ද, හේවිසි ශබ්දය - ගීත - වාදිත ශබ්දය ද, රබාන් - තාලම් ආදී ශබ්දය ද, ජන සන්නිපාත - අත්පොලසන් සන්ධ්‍යාර - ගෙඩි - නාදය ද, ගසින් ගස ගැටීමේ ශබ්දය ද, වාත ශබ්දය ද, ජලඝෝෂාවද මනුෂ්‍ය ශබ්දයද අමුනුෂ්‍ය ශබ්දයද යනාදී වූ දෙසවනට හමුවන ප්‍රිය මනාප වූ හෝ අප්‍රිය අමනාප වූ හෝ යම්තාක් ශබ්ද වෙත් නම් ඒ සියල්ල ශබ්දරූපය නම් වන්නේය.

04. දෙසවනට ලක්වන ශබ්ද රූපය වනාහි, ශ්‍රෝත්‍ර ප්‍රසාදයට ආපාත ගතවන - හමුවන බව, (සෝත පටිහනන ලක්ඛණෝ) ලක්ෂණය කොට ඇත්තේය. සෝත විඤ්ඤාණයට විසය වන බව -අරමුණු වන බව (සෝත විඤ්ඤාණස්ස විසය භාව රසො) කෘත්‍ය රසය කොට ඇත්තේය. සෝත විඤ්ඤාණයටම ගෝචර වන බව (තස්සේව ගෝචර භාව පච්චුපට්ඨානෝ) වැටහීම් කොට ඇත්තේය. සතර මහාභූත රූප ආසන්නතම හේතුව කොට ඇත්තේය. (චතු මහා භූත පදට්ඨානෝ)

05. අටවිසි රූපය අතුරෙන් ගන්ධ රූපය නම් කවරේද යත්, ගස්වැල් ආදියෙහි මුලේ කඳේ අරටුවේ කොළේ මලේ පොත්තේ ගෙඩියේ කරලේ ගඳ සුවඳ, පිළිගඳ , මුඩු ගඳ, ආහාර පානයන්හි ගඳ සුවඳ මනොඥ සුගන්ධ, අමනෝඥ දුර්ගන්ධ ආදී වූ ඝාණ ප්‍රසාදයෙහි හැපෙන්නා වූ ඝාණ විඤ්ඤාණයට අරමුණු වන්නා වූ ගන්ධ අරමුණ වනාහි ගන්ධ රූපය නම් වන්නේය.

06. ගන්ධ රූපය වනාහි ඝ්‍රාණ ප්‍රසාදයෙහි ගැටෙන බව - ආපාතගත වන බව (ඝාණ පටිහනන ලක්ඛණෝ) ලක්ෂණය කොට ඇත්තේය. ඝාණ විඤ්ඤාණයට විසය වන බව- අරමුණු වන බව (ඝාණ විඤ්ඤානස්ස විසය භාව රසෝ) කෘත්‍ය රසය කොට ඇත්තේය. ඒ ඝාණ විඤ්ඤාණයටම ගෝචර බව - (තස්සේව ගෝචර භාව පච්චුපට්ඨානො) වැටහීම් කොට ඇත්තේය. සතර මහා භූතරූප ආසන්නතම හේතුව කොට ඇත්තේය. (චතුමහා භූත පදට්ඨානෝ)

07. අටවිසි රූපය අතුරෙන් රස රූපය නම් කවරේද යත්, ගස් වැල් ආදියෙහි මුලේ කඳේ අරටුවේ මලේ කොලේ පොත්තේ ගෙඩියේ රසයද, ඇඹුල් රසය - මධුර රසය - තිත්ත රසය කුළු රසය - ලුණු රසය- කර රසය - කහට රසය - පැණි රසය කිරි රසය - මිශ්‍ර රසය මිහිරි රසය - අමිහිර රසය යනාදී වූ ජිව්හා ප්‍රසාදයට ලක්වන - ආපාත ගත වන රස අරමුණු වනාහි රස රූපය නම් වන්නේය.

08. රස රූපය වනාහි ජිව්හා ප්‍රසාදයෙහි ගැටෙන බව - හමුවන බව (ජිව්හා පටිහනන ලක්ඛණෝ) ලක්ෂණය කොට ඇත්තේය. ජිව්හා විඤ්ඤාණයට විසය වන බව - අරමුණු වන බව (ජිව්හා විඤ්ඤාණස්ස විසය භාව රසෝ) කෘත්‍ය රසය කොට ඇත්තේය. ඒ ජිව්හා විඤ්ඤාණයටම ගෝචර වීම (තස්සේව ගෝචර භාව පච්චුපට්ඨානෝ) වැටහීම් කොට ඇත්තේය. සතර මහා භූත රූප ආසන්නතම හේතුව කොට ඇත්තේ (චතුමහා භූත පදට්ඨානෝ)

09. අටවිසි රූපය අතුරෙන් භාවරූපය වනාහි ස්ත්‍රී භාව රූපය පුරුෂ භාවරූපය නමින් දෙවැදෑරුම් වන්නේය. ප්‍රතිසන්ධි නාම - රූපයන් අතරෙහි භාවරූපය ද ඒකාන්ත කර්ම සමුට්ඨාන භාවදශක රූප කලාපය වශයෙන්ද පහළ වන්නේය. කායප්‍රසාදරූපය ඇතුලත් වූ කාය දශක රූප කලාපය මෙන් භාවදසක රූපයද සකල ශරීරයෙහි ව්‍යාප්ත වී පැතිරී පවත්නේය. සූඛුමරූප සොළසට අයත් වන්නා වූ මේ භාවරූපය වනාහි ඇසට නොපෙනෙන්නේය. මනෝ විඤ්ඤාණයට පමණක් අරමුණු වන්නේය.

10. වෘක්ෂ ලතාවන් හටගන්නා වූ බීජයක් මෙන් භාවරූපය ද, ප්‍රතිසන්ධියේ දීම ජනිත වන්නේය. බීජයෙන් හටගත්තාවූ වෘක්ෂ ලතාවන්ගේ අවයව මෙන්, ප්‍රවෘති කාලයෙහි ස්ත්‍රී භාවරූපයෙන් ස්ත්‍රී ශරීරයෙහි අවයවයෝද ඇවතුම් පැවතුම් ඉරියාපථයෝද පවත්නෝය. පුරුෂ භාවරූපයෙන් පුරුෂ ශරීරයෙහි අවයවයෝද ඇවතුම් පැවතුම් ඉරියාපථයෝද පුරුෂ ස්වභාවයෙන් විසදව පවත්නෝය. ශරීරාවයවයන් ඇසට ලක්වන්නේ නමුත් භාවරූපය මනෝ විඤ්ඤාණයෙන්ම දතහැකි වන්නේය.

11. ඉත්ථින්ද්‍රිය නම් වූ ස්ත්‍රීභාව රූපය වනාහි, ස්ත්‍රී ස්වභාවය නම් වූ අවිසද බව දුර්වල - සියුමැලි බව (ඉත්ථිභාව ලක්ඛණං ඉත්ථින්ද්‍රියං) ලක්ෂණය කොට ඇත්තේය. මෝ තොමෝ ස්ත්‍රියකැයි පැහැදිලිවන බව (ඉත්ථීති පකාසන රසං) කෘත්‍ය රසය කොට ඇත්තේය. අත්පාආදී ශරීරාවයව ස්ත්‍රී ලිංග සන්ඨානයන්ටද, සිනාසීම් කථාබහ ආදී ස්ත්‍රී නිමිතීන්ටද ස්ත්‍රී ක්‍රීඩාදී ඇවතුම් පැවතුම් වලටද අවිසදව යාම් ඊම් ඉරියව් පැවතුම් ආදී ස්ත්‍රී ආකල්පයන්ටද හේතුවන බව (ඉත්ථිලිංග නිමිත්ත කුත්තාකප්පානං කාරණභාව පච්චුපට්ඨානං) වැටහීම් කොට ඇත්තේය. කර්ම සමුට්ඨාන සතර මහා භූතරූප ආසන්නතම හේතුව කොට ඇත්තේය. (කම්මජ චතුමහා භූත පදට්ඨානං)

12. පුරිසින්ද්‍රිය නම්වූ පුරුෂ භාවරූපය වනාහි පුරුෂස්භාව නම් වූ විදස බව ශක්තිමත් බව - දැඩිබව (පුරිසභාව ලක්ඛණං පුරිසින්ද්‍රියං) ලක්ෂණය කොට ඇත්තේය. මේ තෙමේ පුරුෂයෙකැයි පැහැදිලිවන බව (පුරිසොති පකාසන රසං) කෘත්‍ය රසය කොට ඇත්තේය. අත් පා ආදී ශරීරාවයව පුරුෂ ලිංග සන්ඨානයන්ටද, සිනාසීම් කථාබහ ආදී පුරුෂ නිමිතීන්ටද, පුරුෂ ක්‍රීඩාදී ඇවතුම් පැවතුම් වලටද, විසදව යාම් ඊම් ඉරියව් පැවතුම් ආදී පුරුෂ ආකල්පයන්ටද හේතුවන බව (පුරිසලිංග නිමිත්ත කුත්තාකප්පානං කාරණභාව පච්චුපට්ඨානං) වැටහීම් කොට ඇතතේය. කර්ම සමුට්ඨාන සතරමහා භූත රූප ආසන්තම හේතුව කොට ඇත්තේය. (කම්මජ චතුමහා භූත පදට්ඨානං)

13. අටවිසි රූපය අතුරෙන් හෘදයරූපය නම් කවරේද යත්, හෘදය මාංශ පිණ්ඩයෙහි ප්‍රසන්න ලේ ධාතුව ඇසුරු කරගන්නා ලද්දවූ ද ප්‍රතිසන්ධියේ සිටම ඒකාන්ත කර්ම සමුට්ඨාන වශයෙන් පවත්නාවූද කර්මජ මහාභූත රූපයන්ගේ උපස්ථම්භනය ලබන්නා වූද ජීවිතේන්ද්‍රිය විසින් අනුපාලනය වන්නා වූද, වර්ණ ගන්ධ රස ඕජා පිරිවරන ලද්දවූ ද

උතු- චිත්ත - ආහාර සමුට්ඨාන රූපයන්ගේ සහාය ලබන්නාවූද මනෝධාතු - මනෝවිඤ්ඤාණ ධාතුන්ට නිශ්‍රය වන්නාවූද මනෝප්‍රසාදය නමින් හැඳින්විය හැකි වූද සුඛුම රූපගණයට අයත් වූ වස්තු රූපය වනාහි හදය රූපය නම් වන්නේය.

14. හදයරූපය වනාහි මනෝධාතු මනෝ විඤ්ඤාණ ධාතුන්හට නිශ්‍රයවන බව ලක්ෂණය කොට ඇත්තේය. (මනො ධාතු මනෝ විඤ්ඤාණ ධාතුනං නිස්සය ලක්ඛණං හදයවත්ථු) එම ධාතුන්ටම ආධාර වන බව කෘත්‍ය රසය කොට ඇත්තේය. (තේසඤ්ඤේව ධාතුනං ආධාරණ රසං) එම ධාතුන් දෙක දරා සිටින බව වැටහීම් කොට ඇත්තේය. (උබ්බහන පච්චුපට්ඨානං) කර්මජ සතර මහා භූතරූප ආසන්නතම හේතුව කොට ඇත්තේය. (කම්මජ මහා භූත පදට්ඨානං)

15. අටවිසි රූපය අතුරෙන් ජීවිතේන්ද්‍රිය රූපය නම් කවරේද යත්. ප්‍රතිසන්ධික්ෂණයේ සිට සෑම කර්මජ රූප කලාපයක් පාසාම උපදින්නාවූද, එකට උපදින රූපයන් ජීවත් කරවන්නා වූද, සන්තාන ගත සෙසුරූපයන්ටත් පැවැත්මට උපකාර වන්නාවූද, නෙළුම් මානෙල් ආදි ජලජ ශාඛයන් ජීවත් කරවන ජලයක් සේ රූපයන් ජීවත් කරවමින් අනුපාලනය කරන්නාවූද සුඛම රූපය ජීවිතේන්ද්‍රිය නම් වන්නේය.

16. ජීවිතේන්ද්‍රිය රූපය වනාහි එකට උපදනාවූ රූපයන් අනුපාලනය කිරීම ලක්‍ෂණය කොට ඇත්තේය. (සහජ රූපානුපාලන ලක්ඛණං ජීවිතින්ද්‍රියං) එකට උපදනා රූපයන් පවත්වන බව කෘත්‍ය රසය කොට ඇත්තේය. (තේසං පවත්තන රසං) ඒ රූපයන්ගේම පිහිටුවන බව වැටහීම් කොට ඇත්තේය. (තේසඤ්පවත්තන රසං) ඒ රූපයන්ගේම පිහිටුවන බව වැටහීම් කොට ඇත්තේය. (තේසඤ්ඤේව ඨපන පච්චුපට්ඨානං) පැවැත්විය යුතු භූත රූප ආසන්නතම හේතුව කොට ඇත්තේය. (පවත්තයිතබ්බ භූත පදට්ඨානං)

17. අටවිසි රූපය අතුරෙන් ආහාර රූපය නම් කවරේද යත්, කර්ම චිත්ත ඍතු සමුට්ඨාන සෑම රූප කලායක ඇත්තාවූ ඕජා රූපයද, අනුභව කරන ආහාර පාන බෙහෙත් ඖෂධ මගින් ශරීරයේ රූප උපදවන ඕජා රූපය ද ආහාර රූපය නම් වන්නේය. ප්‍රතිසන්ධික්ෂණයේ සිට කර්මජ ඕජාවද, ප්‍රතිසන්දි චිත්තයාගේ ඨිතික්ෂණයේ සිට උතුජ ඕජාවද ප්‍රථම භවංග චිත්තයේ සිට චිත්තජ ඕජාවද, අනුභව කෙරෙන ආහාරපාන මගින් ශරීරගත වන ඕජාවගේ ඨිතික්ෂණයේ සිට ආහාරජ ඕජාවද රූප කය පවත්වන්නේය.

18. ආහාර රූපය වනාහි, රූප උපදවන ඕජාව ලක්ෂණය කොට ඇත්තේය. (ඕජා ලක්ඛණො කබලිංකාරෝ ආහාරෝ) ඕජාෂ්ඨමක රූප ඉපදවීම කෘත්‍ය රසය කොට ඇත්තේය. (රූපාහරණ රසෝ) රූප කයට රුකුල් දීම වැටහීම් කොට ඇත්තේය. (උපත්ථම්භන පච්චුපට්ඨානෝ) අනුභව කළයුතු වන ආහාරපාන බෙහෙත් ඖෂධ ආදිය ආසන්නතම හේතුව කොට ඇත්තේය. (කබලං කත්වා ආහරිතබ්බ වත්ථු පදට්ඨානෝ)

19. මහා භූතරූප සතරද, ප්‍රසාදරූප පසද, විසය රූප සතරද., භාවරූප දෙකද, හදයරූපය - ජීවිත රූපය - ආහාර රූපය ද යන රූප අටළොස් දෙන වනාහි, රූප පරිච්ඡෙද - රූප විකාර - රූප ලක්ඛණ ස්වභාවයෙන් තොර බැවින් ද, ස්වභාවයෙන් චිත්තක්ෂණ සතලොසක් ආයු ඇති බැවින් ද, ඍජුවම විදර්ශනා ඥානයෙන් ගත හැකි වන බැවින් ද. නිශ්පන්න රූප අටළොස නම් වන්නාහ.

20. අටවිසි රූපය අතුරෙන් ආකාස රූපය නම් කවරේද යත්, අජටාකාශ - අනන්තාකාශ - ආකාශ කසිණ - ආකාශ කසින ධ්‍යාන - ආකාශ කසිණ ධ්‍යාන වඩා බඹලොව උපන් බ්‍රහ්මයෝද යනාදී ආකාශ සම්මුතියෙන් වෙන් වූද රූප කලාප අතරෙහි පවත්නාවූද රූප පරිච්ඡේද ආකාසය වනාහි ආකාස රූපය නම් වන්නේය. සතර මහා භූත රූපයන් සමඟ මිශ්‍ර නොවූද, සෑම රූප කලාපයක උඩ යට සරස වෙන් කොට දැක්වෙන ඉමක් වැනි වූද සිද්ද විවරබව ආකාශ රූපය නම් වන්නේය.

21. ආකාස රූපය වනාහි රූප කලාප වෙන්කරන බව ලක්ෂණය කොට ඇත්තේය. (රූප පරිච්ඡේද ලක්ඛණා ආකාසධාතු) රූප කලාපයන්ගේ උඩ යට සරස කෙළවර - ඉම දැක්වීම කෘත්‍ය රසය කොට ඇත්තේය. (රූප පරියන්තප්පකාසන රසා) රූප කලාපයන්ගේ සීමාව වැටහීම් කොට ඇත්තේය. (රූප මරියාද පච්චුපට්ඨානා) සතර ධාතූන් සමඟ අමිශ්‍ර බව ද සිදුරු බව විවර බවද වැටහීම් කොට ඇත්තේය. (අසම්ඵුට්ඨ භාව ඡිද්ද විවර භාව පච්චුපට්ඨානා වා) පිරිසිඳුනු රූප කලාප ආසන්නතම හේතුව කොට ඇත්තේය. (පරිච්ඡින්න රූප පදට්ඨානා)

22. අටවිසි රූපය අතුරෙන් විඤ්ඤත්ති රූපය වනාහි කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති නමින් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් කායවිඤ්ඤත්තිය නම් කවරේද යත්, ඉදිරියට යාම - ආපස්සට යාම - ඉදිරිය බැලීම - හැරී බැලීම ශරීරාවයව නැවීම - දිගහැරීම යනාදී කායික ක්‍රියාවක් පාසා, ඒ ඒ ක්‍රියාවන් දකින මිනිස් - තිරිසන් ආදී සෑම දෙනාට අදහස් හැඟවීමක් - අදහස් හඟවන ආකාරයක් - පිනවීමක් ඇති බව කාය විඤ්ඤත්තිය නම් වන්නේය. වචීවිඤ්ඤත්තිය නම් කවරේද, වචනයක් පාසා අසන්නවුන්හට, ඒ ඒ අදහස වටහා ගැනීමට හේතුවන ආකාරය වචීවිඤ්ඤත්තිය නම් වන්නේය.

23. කාය විඤ්ඤත්ති රූපය වනාහි, ඉදිරියට යාම් ආදීය පවත්වන චිත්ත සමුට්ඨාන වායෝ ධාතුව සමඟ උපදින්නාවූද, රූපකය දැඩිකරවන - පුම්බවන දරාගැනීම් - චලනාදියට ප්‍රත්‍ය වන්නාවූ ද ආකාර විකාර බව ලක්ෂණය කොට ඇත්තේය. (අභික්කමාදී පවත්තක චිත්ත සමුට්ඨාන වායෝ ධාතුයා සහජ රූපකාය සන්ථම්භන - සන්ධාරණ - චලනස්ස පච්චයෝ ආකාර විකාරෝ කාය විඤ්ඤත්ති) අදහස් ඇඟවීම කෘත්‍ය රසය කොට ඇත්තේය. (අධිප්පායප්පකාසන රසා) ශරීර චලනයට හේතුවන බව වැටහීම් කොට ඇත්තේය. (කාය විප්ඵන්දන හේතුභාව පච්චුපට්ඨානා) චිත්ත සමුට්ඨාන වායෝ ධාතුව ආසන්නතම හේතුව කොට ඇත්තේය. (චිත්තසමුට්ඨාන වායෝ ධාතු පදට්ඨානා)

24. වචීවිඤ්ඤත්ති රූපය වනාහි, වචන කථා කිරීමේදී චිත්ත සමුට්ඨාන පඨවි ධාතුවෙහි උපාදින්නක - කර්මජ පඨවි ධාතුව සමග ගැටීමට ප්‍රත්‍ය වන්නා වූ ආකාර විකාර බව ලක්ෂණය කොට ඇත්තේය. (වචීභේද පවත්තක චිත්ත සමුට්ඨාන පඨවි ධාතුයා උපාදින්න සංඝට්ටනස්ස පච්චයෝ ආකාර විකාරෝ වචී විඤ්ඤත්ති) අදහස් ඇඟවීම කෘත්‍ය රසය කොට ඇත්තේය (අධිප්පායප්පකා සන රසා) වචී ඝෝෂයට හේතු බව. වැටහීම් කොට ඇත්තේය. (වචීඝෝස හේතු භාව පච්චුපට්ඨානා) චිත්ත සමුට්ඨාන පඨවීධාතුව ආසන්නතම හේතුව කොට ඇත්තේය. (චිත්ත සමුට්ඨාන පඨවිධාතු පදට්ඨානා)

25. අටවිසි රූපය අතුරෙන් රූපස්ස ලහුතා - රූපස්ස මුදුතා - රූපස්ස කම්මඤ්ඤතා යනුවෙන් විකාර රූපය තෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් ලහුතා රූපය නම් කවරේද යත්, නිරෝගි කෙනෙකුගේ මෙන් සැහැල්ලු බව, ශරීරයේ බරගති ඇති කරවන ධාතුක්ෂෝභයට පටහැනි හේතූන්ගෙන් හටගත්තාවූ සන්සිඳුනු රූපස්වභාවය ලහුතා රූපය නම් වන්නේය. ඒ ලහුතා රූපය වනාහි රූපයන්ගේ සැහැල්ලු බව ලක්ෂන කොට ඇත්තේය. (අදන්ධතා ලක්ඛණ රූපස්ස ලහුතා) රූපයන්ගේ ගරුතාව දුරුකරවන බව කෘත්‍යය රසය කොට ඇත්තේය. (රූපානං ගරුභාව විනෝදන රසා) සැහැල්ලු ආකාරයෙන් හැරෙන පෙරළෙන බව වැටහීම් කොට ඇත්තේය. (ලහුපරිවත්තිතා පච්චුපට්ඨානා) සැහැල්ලු රූප ආසන්නතම හේතුව කොට ඇත්තේය. (ලහුරූප පදට්ඨානා)

26. මුදුතා රූපය නම් කවරේද යත්, මනාව පදම්කළ මෘදු මොළොක් වූ සමක් සේ රූපයන්ගේ මෘදු මොළොක් බව, සියලු ක්‍රියාවන්හි දී ස්වවසයෙහි නැවෙන සුළු මෘදු ආකාරය රූපයන්ගේ තදබව ඇති කරන ධාතුක්ෂෝභයන්ට පටහැනි හේතූන්ගෙන් හටගත්තාවූ රූපස්වභාවය වනාහි මුදුතා රූපය නම් වන්නේය. ඒ මුදුතා රූපය වනාහි. නොතද බව

ලක්ෂන කොට ඇත්තේය. (අථද්ධතා ලක්ඛණා රූපස්ස මුදුතා) රූපයන්ගේ තද බව දුරුකිරීම කෘත්‍ය රසය කොට ඇත්තේය. (රූපානං ථද්ධභාව විනෝදන රසා) සියලු ක්‍රියාවන්හි අවිරෝධීතාව - හෙවත් නිවැරදි බව වැටහීම් කොට ඇත්තේය. (සබ්බ කිරියාසු අවිරෝධිතා පච්චුපට්ඨානා) මෘදු රූප ආසන්නතම හේතුව කොට ඇත්තේය. (මුදුරූප පදට්ඨානා)

27. කම්මඤ්ඤතා රූපය නම් කවරේද යත්. මනාව සුද්ධ කළ පෙරාපු ස්වර්ණයක් සියම්වුද අලංකාර ආභරණයට සුදුසු වන්නා සේ. ශරීර ක්‍රියාවන්ට අනුකූල බව නම් වූ කර්මණ්‍ය ස්වභාවය, අනුකූල බවට බාධක ධාතුක්ෂෝභයන්හට පටහැනි වූ හේතුවෙන් හටගත් රූපස්වභාවය කම්මඤ්ඤතා රූපය නම් වන්නේය. ඒ කම්මඤ්ඤතා රූපය වනාහි. ශාරීරික ක්‍රියානුකූළ කර්මණ්‍ය බව ලක්ෂණ කොට ඇත්තේය. (සරීර කිරියානුකූල කම්මඤ්ඤභාව ලක්ඛණං රූපස්ස කම්මඤ්ඤතා) අකර්මණ්‍ය බව දුරුකිරීම කෘත්‍ය රසය කොට ඇත්තේය. (අකම්මඤ්ඤතා විනෝදන රසා) නොම දුර්වලබව වැටහීම් කොට ඇත්තේය. (අදුබ්බලතා පච්චුපට්ඨානා) කර්මණ්‍ය රූප ආසන්නතම හේතුව කොට ඇත්තේය. (කම්මඤ්ඤ රූප පදට්ඨානා)

28. රූපස්ස ලහුතා - මුදුතා - කම්මඤ්ඤතා - නම් වූ මේ විකාර රූපයෝ තිදෙනා වනාහි, චිත්තජ - ඍතුජ - ආහාරජ රූප කලාපයන්ගේම ආකාර විකාර මාත්‍රයෝය. සැහැල්ලු බව - මෘදුබව - කර්මණ්‍ය බව, චිත්තජ - උතුජ ආහාර කලාපයෝම ඇති කරන්නෝය. කෙසේද යත්. ඇතැම් යෝගාවචරයෙන් මෙසේ කියන්නාහ. "අද අපට ආහාර සත්ප්‍රාය ලැබුණේය. අපේ කය අද බොහෝ සැහැල්ලු මෘදු කර්මණ්‍ය බවට පත් වී යැයිද, අද අපට උතු සත්ප්‍රාය ලැබුනේය. අපේ කය අද මෘදු මොළොක් කර්මණ්‍ය සනීප බවට පත් වී යයිද, අද අපේ සිතද සුවසේ එකගත්වයට සමාධිමත් බවට, කයද මෘදු මොළොක් සැහැල්ලු කර්මණ්‍ය බවට පත්වූයේ යයිද කියන්නාහ. එසේ හෙයින් මෘදු මොළොක් සැහැල්ලු කර්මණ්‍ය බව ඇති කරනුයේ චිත්ත ඍතු ආහාරයෝමය. ලහුතා මුදුතා කම්මඤ්ඤතාවෝ වනාහි ආකාර මාත්‍රයෝම වන්නාහ.

29. අටවිසි රූපය අතුරෙන් ලක්ෂණ රූපය වනාහි. උපචය සන්තති ජරතා අනිච්චතා නමින් සතර වැදෑරුම් වන්නේය. ඒ සතර අතුරෙන් උපචය රූපය නම් කවරේද යත්, කර්ම - චිත්ත - ඍතු - ආහාර නම් වූ චතු සමුට්ඨානික රූපයන්ගේ පළමු හටගැනීම උපචය රූපය නම් වන්නේය. සන්තති රූපය නම් කවරේද යත්, පළමු හටගත් රූප කලාපයන්ගේ පරම්පරාව මතු මත්තෙහි නැවත නැවතත් හටගැනීම සන්තති රූපය නම් වන්නේය.

30. උපචය රූපය වනාහි, අටළොසක් වූ නිෂ්පන්න රූපයන්ගේ පළමු හටගැනීම ලක්ෂණ කොට ඇත්තේය. (ආචය ලක්ඛණෝ උපචයෝ) පූර්වාන්තයෙන් මතුකොට රූපයන් උපදවන බව කෘත්‍ය රසය කොට ඇත්තේය. (පුබ්බන්තතෝ රූපානං උම් මුජ්ජාපන රසෝ) රූපකලාපයන් ජරා මරණ තෙක් පමුණුවන බව හෝ පිරිපුන් බව හෝ වැටහීම් කොට ඇත්තේය. (නියානන පච්චුපට්ඨානෝ - පරිපුණ්ණභාව පච්චුපට්ඨානෝ වා) උපදවනු ලබන - රැස්කරන ලද, වැඩුණු රූප ආසන්නතම හේතුව කොට ඇත්තේය. (උපචිත රූප පදට්ඨානෝ )

31. සන්තති රූපය වනාහි අටළොස් නිෂ්පන්න රූපයන්ගේ පරම්පරාව පවතින බව ලක්ෂණ කොට ඇත්තේය. (පවත්ති ලක්ඛණා රූපස්ස සන්තති) රූපයන්ගේ සන්තති පරම්පරාව ගලපන බව කෘතය රසය කොට ඇත්තේය. (අනුප්පබන්ධන රසා) රූපසන්තති පරම්පරාව නොසිඳී පවතින බව වැටහීම් කොට ඇත්තේය. (අනුපච්ඡේද පච්චුපට්ඨානා) නොසිඳී පවත්නා වූ රූපයන්ගේ සන්තති පරම්පරාව ආසන්නතම හේතුව කොට ඇත්තේය. (අනුප්පබන්ධනා රූප පදට්ඨානා)

32. ජරතා රූපය නම් කවරේද යත්, උපචය - සන්තති වශයෙන් උපන්නා වූ අටළොසක් වූ නිෂ්පන්න රූපයන්ගේ ඨිතික්ෂණය හෙවත් මුහුකුරා යන බව ජරතා රූපය නම් වන්නේය. ප්‍රකට ජරාවය පටිච්චන්න. ජරාව යයි ජරතාව දෙවැදෑරුම් වන්නේය. සත්ව සන්තාන තුල හිසකේ පැසීම් - ඇඟ රැළි වැටීම් - දත්හැලීම් - දුබල වීම් - දුර්වර්ණ වීම් ආදිය ප්‍රකට ජරාව නම් වන්නේය. ඇසට ලක්වන බැවිනි. එහෙත් ඒ වනාහි ජරතා රූපය නොවන්නේය. ජරතා රූපය නම් මනෝ විඥ්ඥණයෙන් දත යුතු වූ සුඛුම රූපයක් වන්නේය. චිත්ත චෛතසිකයන්ගේ ඨිතික්ෂණය වනාහි පටිච්ඡන්න ජරාව නම් වන්නේය. අප්‍රකට බැවිනි. සවීචි ජරා අවීචි ජරා නමින්ද ජරාව දෙවැදෑරුම් වන්නේය. සත්ත්ව සන්තානයන්හි සහ වෘක්ෂ ලතාදියෙහි දිනෙන් දින වර්ණ සන්ඨාන වෙනස්වන බව සවීචි ජරා නම් වන්නේය. රන් රිදී මුතු මැණික් වෛඩූර්ය ආදී රත්නයන්ගේ ද පෘථුවි පර්වත චන්ද සූර්ය මණ්ඩල තාරකා දීන්ගේ වෙනස් වීමක් ඇතත් දීර්ඝ කාලයක් යන තුරු වෙනස් වීම නොපෙනෙන බැවින් ඒ වස්තූන්ගේ දිරීම අවීචි ජරා නම් වන්නේය.

33. ජරතා රූපය වනාහි, රූපයන්ගේ මේරීම - දිරීම ලක්ෂණ කොට ඇත්තේය. (රූප පරිපාක ලක්ඛණා ජරතා) අනිත්‍යතාව නම්වූ මරණය වෙත පැමිණවීම - ගෙනයාම කෘත්‍ය රසය කොට ඇත්තේය. (උපනයන රසා) වී ඇටරාශියෙහි ස්වභාව නොවෙනස් වෙතත් පැරණි වන්නා සේ, රූපයන්ගේ කර්කෂ ලක්ෂණාදිය නොවෙනස් වෙතත් අළුත් බව - නවීන බව වෙනස් වීම වැටහීම් කොට ඇත්තේය. (සභාවානපගමේපි නවභාවාපගම පච්චුපට්ඨානෝ වීහි පුරාණ භාවෝ විය) මේරීමට - දිරීමට පත්වූ රූපයෝම ආසන්නතම කාරණය කොට ඇත්තේය. (පරිපච්චමාන රූප පදට්ඨානා)

34. අනිච්චතා රූපය නම් කවරේද යත්, උපචය- සන්තති- ජරතා නම් වූ උත්පාද - ඨිතියට පත් අටළොස් රූපයන්ගේ භංගක්ෂණයට පත්වී බිඳී යාම අනිච්චතා රූපය නම් වන්නේය. ඒ අනිච්චතා රූපය වනාහි, රූපයන්ගේ බිඳීයාම ලක්ෂණ කොට ඇත්තේය. (පරිභේද ලක්ඛණා රූපස්ස අනිච්චතා) බිඳෙන රූපයන් නැවත නොපෙනෙන තත්වයටම පත්කිරීම කෘත්‍ය රසය කොට ඇත්තේය. (සංසීදන රසා) ගෙවී ගෙවී බිඳී බිඳී යාම වැටහීම් කොට ඇත්තේය (ඛය වය පච්චුපට්ඨානා) ගෙවෙන බිඳෙන රූපයන්ම ආසන්නතම හේතුව කොට ඇත්තේය. (පරිභිජ්ජමාන රූප පදට්ඨානා)

35. භූතප්පසාද විසයා - භාවෝ හදය මිච්චපි
ජීවිතාහාර රූපේහි - අට්ඨාරස විධං තථා
පරිච්ඡේදෝ වචීසඤ්ඤත්ති - විකාරෝ ලක්ඛණම්පි ච
අනිප්ඵන්නා දස චේති - අට්ඨවීස විධං භවේ

36. භූතරූප සතරද, ප්‍රසාදරූප පසද, විසය රූප සතර ද, භාවරූප දෙකද, හදය රූපයද, ජීවිත රූපයද, ආහාර රූපයදැයි නිෂ්පන්න රූප අටළොස් වැදෑරුම් වන්නේය. එසේම පරිච්ඡේද රූපය ද, විඥ්ඥප්ති රූප දෙකද, විකාරරූප තුන ද, ලක්ෂණ රූප සතරදැයි අනිෂ්පන්න දශය සමඟ අටවිසි වැදෑරුම් වන්නේය.

**ත්‍රිලක්ෂණ විදර්ශනාව**

1. රූප සමුද්දේශ විපර්සනා වේදී පහළ වූ චිත්ත චෛතසික භූතරූප උපාද රූප යන මේ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝය. (පසුගිය පාඩම්වල මෙනි)

හේරන්දර පාරේ, සලවතුගොඩ - අරලිය උයනේ අංක 269 /සී පදිංචිව සිටි ඇම්. බුද්ධදාස මහත්මාණන්ට පිං පිණිස, දයාබර බිරිඳ හා දරුපිරිස විසින් ධර්මදානය වශයෙන් මුද්‍රණය කරන ලදී.

නුගේගොඩ ගංගොඩවිල 37 සෝරත මාවතේ
පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස්

රාජ්‍ය සේවා බෞද්ධ සංගමය
මහවැලි සංවර්ධන අමාත්‍යාංශය 500 ටී. බී. ජයා මාවත, කොළඹ 10
2543 මැදින් / 2000 මාර්තු 01

## අභිධර්ම විපස්සනා භාවනා පාඩම අංක - 14

## අභිධර්මාර්ථ සංග්‍රහ රූප විභාග සංග්‍රහය - 02

### අති පූජ්‍ය නා උයනේ අරිය ධම්ම නා හිමිපාණන් වහන්සේ විසින්

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!

01. රූප සමුද්දේශයට අනතුරුව දැක්වෙන්නා වූ රූප විභාගය නම්. කවරේද යත්, අටවිසි රූපය වනාහි අහේතුකය - සප්‍රත්‍යය - සාශ්‍රවය - සංඛතය - ලෞකිය - කාමාවචරය - අනාරම්මණිකය - අප්‍රහාතව්‍ය නමින් ඒකවිධ වන්නේය, එසේ වුවද අජ්ඣත්තික රූප - බාහිර රූපාදි වශයෙන් බහුවිධ වන්නේය.

02. අටවිසි රූපය වනාහි ලෝභ ද්වේස මෝහ අලෝභ අදෙස අමෝහ නම් වූ හේතු ධර්මයන් සමඟ අසම්මිශ්‍ර බැවින් අහේතුක නම් වන්නේය. කර්ම - චිත්ත - උතු - ආහාර නම් වූ සතර වැදෑරුම් ප්‍රත්‍යයන්ගෙන් නිපදෙන බැවින් සප්‍රත්‍ය නම්ද වන්නේය. කාමාශ්‍රව - භවාශ්‍රව - දිට්ඨාශ්‍රව අවිද්‍යාශ්‍රවයන්ට අරමුණු වන බැවින් සාශ්‍රව නම් වන්නේය. හේතු ප්‍රත්‍යයන්ගෙන් සකස් වන බැවින් සංඛත නම් වන්නේය. ලෝකයට අයත් බැවින් ලෞකික නම් වන්නේය. කාමභූමියට අයත් වන බැවින් කාමාවචර නම් වන්නේය. අරමුණක් ගත නොහෙන අචේතනික බැවින් අනාරම්මණ නම් වන්නේය. සතර මාර්ගයෙන් ප්‍රහාණය කළ නොහෙන බැවින් අප්‍රහාතව්‍ය නම් වන්නේය.

03. චක්ඛුප්‍රසාදදී පඤ්චප්‍රසාද රූපය වනාහි මමයි මගේ යයි සලකනු ලැබෙන ආත්ම සන්තානයට අයත් වන බැවින් අජ්ඣත්තික රූපය නම් වන්නේය. අවශේෂ තෙවිසි රූපය වනාහි බාහිර රූප නම් වන්නේය. පඤ්ච ප්‍රසාදය ද හදය රූපය ද යන සවැදෑරුම් රූපය චිත්ත චෛතසික උපදින ස්ථාන බැවින් වස්තු රූපය නම් වන්නේය. අවශේෂ දෙවිසි රූපය අවස්තුරූපය නම් වන්නේය.

04. පඤ්ච ප්‍රසාදයද විඤ්ඤත්ති රූප දෙකද යන සත්වැදෑරුම් රූපය අතුරෙන් පඤ්චප්‍රසාදය චක්ඛු විඤ්ඤානාදියට දොරටු වන බැවින් ද දෙවැදෑරුම් විඤ්ඤත්ති රූපය කාය කර්ම - වචීකර්ම දෙකට දොරටු වන බැවින්ද ද්වාර රූපය නම් වන්නේය. අවශේෂ රූප එක්විස්ස වනාහි අද්වාර රූපය නම් වන්නේය.

05. පඤ්චප්‍රසාදය ද භාවරූපද ජීවිත රූපය ද යන අටවැදෑරුම් රූපය වනාහි ස්වකීය කෘත්‍යයෙහි ඉසුරුමත් වන බැවින් ඉන්ද්‍රිය රූපය නම් වන්නේය. අවශේෂ සමවිසි රූපය වනාහි අනින්ද්‍රිය රූපය නම් වන්නේය. පඤ්ච ප්‍රසාදය ද සතක් වූ විෂය රූපය ද යන දෙළොස් වැදෑරුම් රූපය වනාහි වස්තු රූප සහ විෂය රූපයද ඔවුනොවුන් විශේෂයෙන් පැහැදිලි වන බැවින් ඖදරික රූප නම්ද වන්නේය. සුවසේ දතහැකි වන බැවින් සන්තිකේ රූප නම්ද වන්නේය. වස්තුරූප සමඟ විෂය රූප හමුවීම් වශයෙන් ගැටෙන සුළු වන බැවින් සප්‍රතිඝ රූප නම් ද වන්නේය. අවශේෂ සොළොස් රූපය වනාහි සුඛුම රූප - දූරේරූප- අප්‍රතිඝ රූප නම් වන්නේය.

06. කර්ම සමුට්ඨානයෙන් හටගන්නා වූ සම විසි රූපය වනාහි තෘෂ්ණා දෘෂ්ටීන් විසින් මමය- මගේ යයි දැඩිව ගනු ලැබෙන බැවින් උපාදින්න රූපය නම් වන්නේය. අවශේෂ තිසමුට්ඨානික රූපය වනාහි අනුපාදින්න රූපය නම් වන්නේය. රූපායතනය වනාහි චක්ඛු විඤ්ඤාණයෙන් දකිනු ලැබෙන බැවින් සනිදස්සන රූපය නම් වන්නේය. අවශේෂ සත්විසි රූපය වනාහි අනිදස්සන රූපය නම් වන්නේය.

07. චක්ෂුප්‍රසාදය සහ ශ්‍රෝත්‍ර ප්‍රසාදය වනාහි දුර පිහිටියා වූද වර්ණ - ශබ්ද අරමුණු ගන්නා බැවින් අසම්ප්‍රාප්ත ග්‍රාහික රූපය නම් වන්නේය. ඝ්‍රාණ - ජිව්හා - කායප්‍රසාද රූපය

**අභිධර්ම විපස්සනා භාවනා පාඨම අංක - 14**

**අභිධර්මාර්ථ සංග්‍රහ රූප විභාග සංග්‍රහය - 02**

**අති පූජ්‍ය නා උයනේ අරිය ධම්ම නා හිමිපාණන් වහන්සේ විසින්**

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!

01. රූප සමුද්දේශයට අනතුරුව දැක්වෙන්නා වූ රූප විභාගය නම්. කවරේද යත්, අටවිසි රූපය වනාහි අහේතුකය - සප්‍රත්‍යය - සාශ්‍රවය - සංඛතය - ලෞකිය - කාමාවචරය - අනාරම්මණිකය - අප්‍රහාතව්‍ය නමින් ඒකවිධ වන්නේය, එසේ වුවද අජ්ත්තික රූප - බාහිර රූපාදි වශයෙන් බහුවිධ වන්නේය.

02. අටවිසි රූපය වනාහි ලෝභ ද්වේෂ මෝහ අලෝභ අද්වේෂ අමෝහ නම් වූ හේතු ධර්මයන් සමඟ අසම්මිශ්‍ර බැවින් අහේතුක නම් වන්නේය. කර්ම - චිත්ත - ඍතු - ආහාර නම් වූ සතර වැදෑරුම් ප්‍රත්‍යන්ගෙන් නිපදෙන බැවින් සප්‍රත්‍ය නම්ද වන්නේය. කාමාශ්‍රව - භවාශ්‍රව - දිට්ඨාශ්‍රව අවිද්‍යාශ්‍රවයන්ට අරමුණු වන බැවින් සාශ්‍රව නම් වන්නේය. හේතු ප්‍රත්‍යයන්ගෙන් සකස් වන බැවින් සංඛත නම් වන්නේය. ලෝකයට අයත් බැවින් ලෞකික නම් වන්නේය. කාමභූමියට අයත් වන බැවින් කාමාවචර නම් වන්නේය. අරමුණක් ගත නොහෙන අචේතනික බැවින් අනාරම්මණ නම් වන්නේය. සතර මාර්ගයෙන් ප්‍රහාණය කළ නොහෙන බැවින් අප්‍රහාතව්‍ය නම් වන්නේය.

03. චක්ඛුප්‍රසාදදී පඤ්චප්‍රසාද රූපය වනාහි මමයි මගේ යයි සලකනු ලැබෙන ආත්ම සන්තානයට අයත් වන බැවින් අජ්ත්තික රූපය නම් වන්නේය. අවශේෂ තෙවිසි රූපය වනාහි බාහිර රූප නම් වන්නේය. පඤ්ච ප්‍රසාදය ද හදය රූපය ද යන සවැදෑරුම් රූපය චිත්ත චෛතසික උපදින ස්ථාන බැවින් වස්තු රූපය නම් වන්නේය. අවශේෂ දෙවිසි රූපය අවස්තුරූපය නම් වන්නේය.

04. පඤ්ච ප්‍රසාදයද විඤ්ඤත්ති රූප දෙකද යන සත්වැදෑරුම් රූපය අතුරෙන් පඤ්චප්‍රසාදය චක්ඛු විඤ්ඤනාදියට දොරටු වන බැවින් ද දෙවැදෑරුම් විඤ්ඤත්ති රූපය කාය කර්ම - වචීකර්ම දෙකට දොරටු වන බැවින්ද ද්වාර රූපය නම් වන්නේය. අවශේෂ රූප එක්විස්ස වනාහි අද්වාර රූපය නම් වන්නේය.

05. පඤ්චප්‍රසාදය ද භාවරූපද ජීවිත රූපය ද යන අටවැදෑරුම් රූපය වනාහි ස්වකීය කෘත්‍යයෙහි ඉසුරුමත් වන බැවින් ඉන්ද්‍රිය රූපය නම් වන්නේය. අවශේෂ සමවිසි රූපය වනාහි අනින්ද්‍රිය රූපය නම් වන්නේය. පඤ්ච ප්‍රසාදය ද සතක් වූ විෂය රූපය ද යන දෙළොස් වැදෑරුම් රූපය වනාහි වස්තු රූප සහ විෂය රූපයද ඔවුනොවුන් විශේෂයෙන් පැහැදිලි වන බැවින් ඖදරික රූප නම්ද වන්නේය. සුවසේ දතහැකි වන බැවින් සන්තිකේ රූප නම්ද වන්නේය. වස්තුරූප සමඟ විෂය රූප හමුවීම් වශයෙන් ගැටෙන සුළු වන බැවින් සප්‍රතිඝ රූප නම් ද වන්නේය. අවශේෂ සොළොස් රූපය වනාහි සුඛුම රූප - දූරේරූප- අප්‍රතිඝ රූප නම් වන්නේය.

06. කර්ම සමුට්ඨානයෙන් හටගන්නා වූ සම විසි රූපය වනාහි තෘෂ්ණා දෘෂ්ටීන් විසින් මමය- මගේ යයි දැඩිව ගනු ලැබෙන බැවින් උපාදින්න රූපය නම් වන්නේය. අවශේෂ තිසමුට්ඨානික රූපය වනාහි අනුපාදින්න රූපය නම් වන්නේය. රූපායතනය වනාහි චක්ඛු විඤ්ඤණයෙන් දකිනු ලැබෙන බැවින් සනිදස්සන රූපය නම් වන්නේය. අවශේෂ සත්විසි රූපය වනාහි අනිදස්සන රූපය නම් වන්නේය.

07. චක්ඛුප්‍රසාදය සහ ශ්‍රෝත්‍ර ප්‍රසාදය වනාහි දුර පිහිටියා වූද වර්ණ - ශබ්ද අරමුණු ගන්නා බැවින් අසම්ප්‍රාප්ත ග්‍රාහික රූපය නම් වන්නේය. ඝ්‍රාණ - ජිව්හා - කායප්‍රසාද රූපය

වනාහි දුර පිහිටි අරමුණු නොගන්නා බැවින් සම්ප්‍රාප්ත ග්‍රහික රූපය නම් වන්නේය. පඤ්චප්‍රසාද රූපය වනාහි ගොදුරු ගන්නා සුළු වන බැවින් ගෝචර ග්‍රාහික රූපය නම් වන්නේය. අවශේෂ තෙවිසි රූපය වනාහි අගෝචරග්‍රාහික නම් වන්නේය.

08. පඨවි - ආපෝ - තේජෝ - වායෝ - වර්ණ - ගන්ධ - රස ඕජා නම් වූ අටවැදෑරුම් රූපය වනාහි ඔවුනොවුන් වෙන් නොවී එක්වම පවත්නා බැවින් අවිනිර්භෝග රූපය නම් වන්නේය. අවශේෂ සම විසි රූපය වනාහි විනිර්භෝග රූපය නම් වන්නේය.

09. **ඉච්චේවං මට්ඨ විසති - විධම්පි ච විචක්ඛණා**
**අජ්ඣත්තිකා දි හේදේන - විභජන්ති යථාරහං**

මෙසේ අටවිසි රූපය වනාහි - අජ්ඣත්තික බාහිර - වස්තු අවස්තු - ද්වාර අද්වාර - ඉන්ද්‍රිය අනිද්‍රිය - ඖදරික සුඛුම- දූරේ - සන්තික - සප්‍රතිඝ - අප්‍රතිඝ - උපාදින්න අනුපාදින්න සනිදස්සන අනිදස්සන - ගෝචරග්‍රාහික අගෝචරග්‍රාහික - විනිර්භෝග අවිනිර්භෝග යනාදී වශයෙන් ආචාර්යයන් වහන්සේලා බෙද දක්වන්නාහ. අභිධර්මාර්ථ සංග්‍රහයෙහි රූප විභාගය මෙතෙකින් නිමවෙන්නේය.

**<u>රූප සමුට්ඨානය</u>**

10. රූප විභාගයට අනතුරුව දැක්වෙන්නා වූ රූප සමුට්ඨානය නම් කවරේද යත්, කර්මය - චිත්තය - උතුය - ආහාරයයි රූප නිපදවන්නා වූ රූප සමුට්ඨානය සිවු වැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් කර්මය වනාහි කාමාවචර කුශලාකුශල චේතනා සමවිස්ස ද රූපාවචර කුශල චේතනා පස්දෙනද යන පස්විසි චේතනාව වනාහි, ආධ්‍යාත්මික සන්තානයෙහි කර්ම සමුට්ඨාන රූප සන්තතිය ප්‍රතිසන්ධියෙහි සිට කුඩා චිත්තක්ෂණයක් පාසා උපදවන්නේය.

11. අරූපාවචර විපාක සිත් සතරද දෙපස් විඤ්ඤාන සිත් දශ දෙනද යන තුදුස් චිත්තයන් හැර අවශේෂ පන්සැත්තෑ චිත්තය, ප්‍රථම භවංගයේ සිට චිත්තයාගේ උත්පාදක්ෂණයක් පාසා චිත්ත සමුට්ඨාන රූප සන්තතිය උපදවන්නේය. ඔවුනතුරෙන් අර්පණා ජවන්සිත ඉරියව් පැවැත්මද පිහිටුවන්නේය. වොත්ථපන චිත්තයද කාමාවචර ජවන් සිත් එකුන් තිසද අභිඥ දෙසිතද යන දෙතිස් චිත්තය විඤ්ඤත්ති රූපද උපදවන්නේය. සෝමනස්ස සහගත කාමාවචර ජවන් සිත් තෙළස වනාහි සිනහ ද පහළ කරන්නේය.

12. ආධ්‍යාත්මික වූද බාහිර වූද සීතෝෂ්ණ නම් වූ තේජෝ ධාතුව වනාහි ස්වකීය ඨිතික්ෂණයේදී ආධ්‍යාත්මික වූද බාහිර වූද සන්තානයෙහි සුදුසු ලෙස උතු සමුට්ඨාන රූප උපදවන්නේය. ඕජා සංඛ්‍යාත වූ ආහාරය වනාහි ස්වකීය ඨිතික්ෂණයේ දී ආහාරජ රූප උපදවන්නේය.

13. අටවිසි රූපය අතුරෙන් අටවැදෑරුම් ඉන්ද්‍රිය රූපය ද හදය රූපය ද ඒකාන්තයෙන් කර්ම සමුට්ඨාන නම් වන්නේය. දෙවැදෑරුම් වූ විඤ්ඤත්ති රූපය වනාහි ඒකාන්තයෙන් චිත්ත සමුට්ඨාන නම් වන්නේය. ශබ්ද රූපය වනාහි උතු - චිත්ත නමින් ද්විසමුට්ඨානික වන්නේය. ලහුතා - මුදුතා - කම්මඤ්ඤතා රූපය වනාහි උතු - චිත්ත - ආහාර නමින් තිසමුට්ඨානික නම් වන්නේය. අටවැදෑරුම් වූ අවිනිර්භෝග රූපයද ආකාශ ධාතුවද චතුසමුට්ඨානික නම් වන්නේය. සතර වැදෑරුම් වූ ලක්ෂණ රූපය වනාහි කිසිදු සමුට්ඨාන හේතුවකින් හට නොගන්නේය.

14. **අට්ඨාරස පණ්ණරස - තේරස ද්වාදසාති ච**
**ගම්ම චිත්තෝතුකාහාර - ජාති හොන්ති යථාක්කමං**

කර්මජ රූප අටළොස් දෙනෙක් ද චිත්තජරූප පසළොසක්ද උතුජ රූප තෙළෙසක් ද ආහාරජ රූප දොළසක් දැයි චතු සමුට්ඨාන රූපය අනුපිළිවෙළින් දතයුතු වන්නේය. එසේ

වූයේ ද උපචය - සන්තති නම් වූ ලක්‍ෂණණ රූප ද එකතු කිරීමෙන් කර්මජ රූප සම විස්සක් ද චිත්තජ රූප සතළොසක්ද උතුජ රූප පසළොසක්ද ආහාරජ රූප තුදුසක්ද වන්නේය.

15. ජායමානාදි රූපානං - සභාවත්තා හි කෙවලං
ලක්ඛණානි නජායන්ති - කෙහිචිති පකාසිතං

උපදින්නා වූ රූපයන්ගේම ස්වභාව මාත්‍රයක් බැවින් ලක්ෂණ රූපයන් කිසිදු හේතුවකින් හට නොගන්නා බවද කියන ලද්දේය. මෙතෙකින් රූප සමුට්ඨානය කියා නිමවන ලද්දේය.

රූප කලාප

16. අටවිසි රූපයන්ගේ රූප කලාප විභාගය නම් කෙසේද යත්, එක්ව උපදින්නා වූද එක්ව නිරුද්ධ වන්නා වූද සමාන නිශ්‍රය - ආධාර ඇත්තා වූද සමාන පැවැතුම් ඇත්තා වූද රූප කලාප වනාහි එක්විසි වැදෑරුම් වන්නේය.

17. එක්විසි රූප කලාපය අතුරෙන් අවිනිර්භෝග නම් වූ ශුද්ධාෂ්ඨකය ද ජීවිත රූපයද චක්ෂුප්‍රසාදයද සමඟ දශදෙන චක්ෂුදශකය නම් වන්නේය. එසේම ශ්‍රෝත්‍රප්‍රශාදය ආදී ප්‍රසාද රූප එක එකක් සමඟ සෝත දසකය, ඝාන දසකය - ජිව්හා දසකය කාය දසකයද, භාවරූප සමඟ ඉත්ථිභාව දසකය පුම්භාව දශකය ද, හදය රූපය සමඟ වත්ථු දසකය ද යන දශක කලාප අට දෙනද, ශුද්ධාෂ්ඨකය ජීවිත රූපය සමඟ ජීවිතනවක කලාපය දැයි කර්ම සමුට්ඨාන රූප කලාපය නව වැදෑරුම් වන්නේය.

18. චිත්ත සමුට්ඨාන රූප කලාපය වනාහි සවැදෑරුම් වන්නේය. කෙසේදයත්, ශුද්ධාෂ්ඨක කලාපය, කායවිඤ්ඤත්තිය සමඟ කාය විඤ්ඤත්ති නවකය වචීවිඤ්ඤත්ති ශබ්දය සමඟ වචීවිඤ්ඤත්ති දසකය, ලහුතාදී තුන සමඟ ලහුතාදේකා දසකය, කායවිඤ්ඤත්ති ලහුතාදි ද්වාදසකය, වචී විඤ්ඤත්ති ශබ්ද ලහුතාදි තේරසකයයි චිත්තජ රූප කලාපය සවැදෑරුම් වන්නේය.

19. උතුසමුට්ඨාන රූප කලාපය වනාහි සිවුවැදෑරුම් වන්නේය. ඒ කෙසේද යත්, ශුද්ධාෂ්ඨක කලාපය, ශබ්දනවක කලාපය ලහුතාදේකාදසක කලාපය, ශබ්ද ලහුතාදී ද්වාදසක කලාපයයි මෙසේ උතුසමුට්ඨාන රූප කලාපය සිවුවැදෑරුම් වන්නේය. ආහාර සමුට්ඨාන කලාපයද වනාහි දෙවැදෑරුම් වන්නේය. ඒ කෙසේද යත්, ශුද්ධාෂ්ඨක රූප කලාපය. ලහුතාදේකාදසක කලාපයයි. මෙසේ දෙවැදෑරුම් වන්නේය. එක්විසි රූප කලාප අතුරෙන් උතුසමුට්ඨානික වූ ශුද්ධාෂ්ඨකය - ශබ්දනවකය නම් වූ දෙවැදෑරුම් රූප කලාපය බාහිර අවිඤ්ඤාණක වස්තූන් කෙරෙහි ද පවත්නේය.

20. කම්ම චිත්තෝතුකාහාර - සමුට්ඨානා යථාක්කමං
නව ජ චතුරෝ ද්වෙති - කලාපා එකවීසති
කලාපානං පරිච්ඡේද - ලක්ඛණත්තා විචක්ඛණා
නකලාපංග මිච්චාහු - ආකාසං ලක්ඛණානි ච

කම්ම - චිත්ත - උතු - ආහාර සමුට්ඨාන රූප කලාප වනාහි අනුපිළිවෙළින් නවයක්ද සයක් ද සතරක්ද දෙකක් දැයි රූප කලාප එක් විස්සක් ඇත්තේය. රූප කලාපයන්ගේ ඉම දක්වන ආකාශ රූපයද රූපයන්ගේ උත්පාද ඨිති භංග අවස්ථාවන් දක්වන ස්වභාව ලක්ෂණ මාත්‍ර බැවින් ලක්‍ෂණ රූප සතරද කලාපාංග නොවන්නාහු යයි ආචාර්යන් වහන්සේලා කියන්නාහ. මෙතෙකෙන් රූප කලාප යෝජනාව නිමවන්නේය.

රූප ප්‍රවෘත්ති ක්‍රමය

21. සියලු අටවිසි රූපය වනාහි කාම භූමියෙහි ප්‍රවෘත්ති කාලපයෙහි දී නො අඩුව ලැබෙන්නේය.කාම භූමියෙහි සංසේදජ ඕපපාතික සත්වයන්ට වනාහි ප්‍රතිසන්ධික්ෂණයේදී

උත්කෘෂ්ට පරිච්ඡේදයෙන් චක්ඛු - සෝත - ඝාණ - ජිව්හා - කාය - භාව - වත්ථු දශක නම් වූ රූප කලාප සතක් ලැබෙන්නේය. ඇතැම් කලෙක වනාහි ඔවුනට චක්ඛු - සෝත ඝාණ - භාව දසක කලාපයන් නොමැතිද වන්නේය. එසේ නොලැබෙන කලාප අතහැර රූප කලාප සංඛ්‍යා කළයුතු වන්නේය.

22. ගර්භසෙය්‍යක සත්වයන්හට වනාහි ප්‍රතිසන්ධියේදී කායදසකය - භාවදසකය - වත්ථු දසකයයි රූපකලාප තිදෙනෙක් ලැබෙන්නේය. එසේ වුවද සමහර විටක භාවදසකය නොමැතිවද ලැබෙන්නේය. ප්‍රතිසන්ධියෙන් පසු අනුපිළිවෙළින් චක්ඛු - සෝත - ඝාණ - ජිව්හා දසක කලාප ලැබෙන්නේය.

23. මෙසේ මේ කාමභූමියෙහි වනාහි ප්‍රතිසන්ධික්ෂණ යේ සිට කර්ම සමුට්ඨාන රූපයෝද, දෙවැනි සිතෙහි සිට චිත්තමුට්ඨාන රූපයෝද, ප්‍රතිසන්ධි චිත්තයාගේ ඨිතියේ සිට උතුසමුට්ඨාන රූපයෝද, ආහාර ඕජාව පැතිරෙන තැන් සිට ආහාරජ රූපයෝදැයි මෙසේ චතුසමුට්ඨානික රූප කලාප සන්තතිය දැල්වෙන පහනක ප්‍රදීපාලෝකයක් මෙන්ද ගංගා ජලයක් මෙන්ද, ජීවිතාන්තය දක්වා වැළ නොකැඩී පරම්පරා වශයෙන්ද නොසිඳී පවත්නේය.

24. මරණාසන්නයේ දී වනාහි චුති චිත්තයට පෙර සතළොස්වන චිත්තයාගේ ඨිතික්ෂයේ සිට කර්මජ රූපයෝ නූපදින්නාහ. එයින් පෙර උපන්නාවූද කර්මජ රූපයෝ චුති චිත්තය සමහම නිරුද්ධ වන්නාහ. එයින් පසු චිත්තජ - උතුජ රූපද නිරුද්ධ වන්නාහ. එයින් මතු උතුසමුට්ඨාන රූප පරම්පරාව මෘතකලේබරය ඇතිනාක් පවත්නේය.

25. **ඉච්චේවං මත සත්තානං - පුන දෙව භවන්තරේ**
**පටිසන්ධි මුපාදය - තථාරූපං පවත්තති**

මෙසේ මිය පරලොව ගිය සත්වයන්ට වනාහි පුනර්භවයේ දීද ප්‍රතිසන්ධියේ සිට රූපයන්ගේ පැවැත්ම මෙසේම පවත්නේය.

26. රූපාවචර බඹතලයෙහි වනාහි ඝාණ ජිව්හා - කාය - භාව දසක කලාප සතරක් ද ආහාරජ රූප කලාපය ද නොලැබෙන්නාහ. එසේ හෙයින් රූපී බ්‍රහ්මයන් හට ප්‍රතිසන්ධියේදී චක්ඛු - සෝත - වත්ථු නම් වූ දසක තුනක් ද ජීවිත නවකය දැයි කර්මජ රූප කලාප සතරක් ලැබෙන්නාහ. ප්‍රවෘත්ති කාලයේ දී වනාහි චිත්ත සමුට්ඨාන - උතුසමුට්ඨාන රූප කලාපයෝ ද ලැබෙන්නාහ.

27. අසංඥතල වාසී බ්‍රහ්මයන්හට වනාහි චක්ඛු දසක සෝත දසක වත්ථු දශකයෝ ද ශබ්ද රූපයද නොලැබෙන්නාහ. සියලුම චිත්තජ රූපයෝද එසේම නොලැබෙන්නාහ. එසේ හෙයින් ඔවුන්හට ප්‍රතිසන්ධියේදී ජීවිත නවක කර්මජ රූපකලාපයද, ප්‍රවෘත්තිකාලයේදී ශබ්ද නවක රූපය නොමැතිව උතුසමුට්ඨාන රූපය ද ඉතිරි වන්නේය. මෙසේ වනාහි කාමභූමි - රූප භූමි අසංඥතලයද ස්ථාන තුනෙහි ප්‍රතිසන්ධි - ප්‍රවෘත්ති වශයෙන් රූපයන්ගෙ පැවැත්ම දෙයාකාරයෙන් දතයුතු වන්නේය.

28. **අට්ඨවීසති කාමෙසු - හොන්ති තේවීස රූපිසු**
**සත්තරසෙවා සඤ්ඤිනං - ආරුප්පේ නත්ථි කිඤ්චිති**
**සද්දෙ විකාරො ජරතා - මරණඤ්චෝප පත්තියං**
**නලබ්භන්ති පවත්තෙතු - නකිඤ්චපි නලබ්භති**

කාමභූමියෙහි අටවිසි වැදෑරුම් රූපයද, රූපී ඔබතලයෙහි තෙවිස්සක් රූපයෝ ද අසඤ්ඤ තලයෙහි සතළොසක්ද, රූප ලැබෙන්නාහ. අරූප භූමියෙහි වනාහි රූප කිසිවක් නොමැත්තේය. ප්‍රතිසන්ධික්ෂණ - උත්පත්ති කාලයෙහි, වනාහි ශබ්ද රූපයද ජරතා රූපය ද විකාර රූප පස් දෙනාද යන සත්දෙන නොලැබෙන්නාහ. ප්‍රවෘත්ති කාලයේදී වනාහි

නොලැබෙන රූපයක් නම් නොමැත්තේය. මෙතෙකින් රූප ප්‍රවෘත්ති විභාගය නිමවෙන්නේය.

29. සතර පරමාර්ථයන් අතුරෙන් නිර්වාණ පරමාර්ථය නම් කවරේද යත්, සිවු මග නුවණින් ප්‍රත්‍යක්ෂ වශයෙන් අවබෝධ කරගන්නා වූද, මාර්ගඵල චිත්තයන් හට අරමුණු වන්නාවූ, ද වාණ නම් වූ තෘෂ්ණාවට අරමුණු නොවන්නාවූද ලෝකෝත්තර භූමියට අයත්වූද අසංඛත ධාතුව - නිර්වාණ පරමාර්ථය නම් වන්නේය.

30. ඒ මේ නිර්වාණය වනාහි ශාන්ති ලක්ෂණ වශයෙන් එක් වැදෑරුම් වුයේද සවුපාදිශේෂ - අනුපාදිශේස දැයි දෙවැදෑරුම් ද වන්නේය. එසේම සුඤ්ඤත - අනිමිත්ත - අප්පණිහිතයැයි ආකාර වශයෙන් තෙවැදෑරුම් වන්නේය.

31. පද මච්චුත මච්චන්ත - මසංඛත මනුත්තරං
නිබ්බාන මිති භාසන්ති - වාණ මුත්තා මහේසයෝ
ඉති චිත්තං චේතසිකං - රූපං නිබ්බාන මිච්චපි
පරමත්ථං පකාසෙන්ති - චතුධාව තථාගතා

අච්චුත නම් වූද අත්‍යන්ත නම් වූද අසංඛත නම් වූද, අනුත්තර පදය නිර්වාණ ධාතුව නමැති තෘෂ්ණා වානයෙන් එතෙර වූ මහාර්ෂි වූ සර්වඥයන් වහන්සේලා දේශනා කරන සේක.

මෙසේ චිත්තය - චෛතසිකය - රූපය - නිර්වාණයැයි පරමාර්ථ ධර්මය සතර වැදෑරුම් කොට තථාගතයන් වහන්සේලා දේශනා කරන සේක. මෙතෙකින් නිර්වාණ පරමාර්ථය සැකෙවින් කියන ලද්දේය.

**ත්‍රිලක්‍ෂණ විදර්ශනාව**

1. රූප විභාග අභිධර්ම විදර්ශනා භාවනාවේදී පහළ වූ චිත්ත චෛතසික භූතරූප උපාද රූප යන මේ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝය.
2. ඇතිවීම නැති වීම දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝය.
3. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝය.
4. මෙසේ අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්මක වූ නාම රූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන සංඛත සන්තාප විපරිනාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේය.
5. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව ආයූහණ නිදන සංයෝග පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේය.
6. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ විවේක අසංඛත අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකානත්යෙන් නිරෝධ සත්‍යය නම් වන්නේය.
7. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතුවූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය නිය්‍යාන හේතු දස්සන ආධිපතෙය්‍යාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේය.
8. මාගේ භාවනාමය කුශලානිසංස ධර්මය මෙම චතුරාර්ය සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිසම හේතු වේවා වාසනා වේවා

සාධු. සාධු. සාධු.

**පදවිවරණය**

01. රූප කලාප - එකට එකවර උපදින බිඳෙන සුළු එකම සමුට්ඨානයකින් උපදින එක් තැන පිහිටි රූප මිටිය රූප කලාපය නම් වේ. මල් මිටියකට මල් කළඹ කියන්නාක් මෙනි.

02. සඋපාදිශේස - අනුපාදිශේස - පඤ්චස්කන්ධ නමැති උපදිය ජීවත්ව සිටිය දී රහත් මග ඵල නුවණින් දැකගන්නා නිවන

සඋපාදිශේෂ නිර්වාණ ධාතුවයි. ක්ෂිණාශ්‍රවයන් වහන්සේලාගේ ආයු කෙළවර පිරිනිවීම අනුපාදිශේෂ නිර්වාණ ධාතුවයි.

03. සුඤ්ඤත- අනිමිත්ත - අප්පණිහිත - ආත්ම වශයෙන් සම්මුතියෙන් ගතහැකි අරමුණක් නොමැති බව නිවනෙහි සුඤ්ඤත ලක්ෂනයයි. ස්ථිර වශයෙන් නිත්‍යයයි ගතහැකි අරමුණක් නොමැති බව නිවනෙහි අනිමිත්ත ලක්ෂණයයි. තෘෂ්ණා වශයෙන් ගත හැකි අරමුණක් නොමැති බව නිවණෙහි අප්පණිහිත ලක්‍ෂණයයි.

04. අච්චුත : චුතියක් - මිය යාමක් නොමැති බැවින් නිවන අච්චුත නම් වේ.

05. අසංඛත : හේතුවකින් හටනොගන්නා බැවින් නිවන අසංඛත නම් වේ.

06. අනුත්තර : තමන්ට වඩා උතුම් දෙයක් නොමැති බැවින් නිවන අනුත්තර නම් වේ.

## පදවිවරණය 13 (පසුගිය පාඩම)

01. විසය රූප - චක්ඛු - සෝත ඝාන - ජිව්හා ප්‍රසාදයන්ට හමුවන ඒ ඒ ප්‍රසාදයෙහි පහළවන විඤ්ඤාණයන්ට අරමුණු වන අර්ථයෙන් විසයරූප නම් වෙති. කාය ප්‍රසාදයට ලක්වන ස්ඵර්ශ අරමුණ පඨවි තේජෝ වායෝ යන භූත රූපම වන බැවින් ඒවා භූතරූප නමින් වෙන් කරන ලදහ.

02. භාව රූප : ස්ත්‍රී ස්වභාව පුරුෂ ස්වභාව ඇති කරවන බැවින් භාවරූප නමින් හැඳින් වේ.

03. හදය රූප : හදය යනු සිතට නියමිත තමකි. සිත උපදින පවතින - සිතට වස්තුවන - ආදර වන රූපය බැවින් හදය රූපය නමින් දැක්වේ. බුදුමැඳුර - දෙවි මැඳුර - රජ මැඳුර - කියන්නාක් මෙනි.

04. ජීවිත රූප - කර්මජ රූප කලාපයන්හිම ලැබෙන ජීවිතේන්ද්‍රිය රූපමය කර්මජ - චිත්තජ - උතුජ - ආහාරජ රූප කලාප සියල්ලම ජීවත් කරවන බැවින් ජීවිත රූපය නම් වේ. නාම ජීවිතේන්ද්‍රිය රූප ජීවිතේද්‍රිය නමින් ජීවිතන්ද්‍රිය දෙකක් ඇත. නාම ජීවිතේන්ද්‍රිය නාම දර්මයන් ජීවත් කරවන චෛතසික ධර්මයකි. රූප ජීවිතේන්ද්‍රිය වනාහි රූප ධර්මයන් ජීවත් කරවන රූපයකි.

05. ආහාර රූප : රූපාහාර - නාමහාර නමින් ආහාර දෙවර්ගයකි. පස්සාහාර මනෝසංචේතනා ආහාර විඤ්ඤානාහාර නමින් නාමධර්ම උපදවන නාමාහාර තුනකි. ආහාරජ රූප උපදවන ඕජාවම රූප ආහාර නම් වේ. මේ රූපාහාරය වනාහි චතුසමුට්ඨානිකවූම සෑම රූප කලාපයක ඇත්තේය.

06. ආකාස රූප : රූප කාලයකට අයත් නැතත් රූප කලාපයන් වෙන් කරනුයේ ආකාස රූපයෙනි. සෑම රූප කලාපයක් අතරට මේ ආකාසය ඇති බැවින් එය රූප පරිච්ඡේද ආකාශය නම් වේ.

07. විඤ්ඤත්ති රූප: ඉදිරියේ සිටින්නකුට මේ තෙමේ අගවන්නේ මෙනම් කරුණකැයි' ඇඟවීමක් සිදු වෙන බැවින් කායික චලනය අනුව කාය විඤ්ඤත්තියක්, වචනයේ පැවැත්ම අනුව වචී විඤ්ඤත්තියත් විඤ්ඤත්ති රූප නම් වේ.

08. විකාර රූප : චිත්ත - උතු - ආහාර සමුට්ඨාන රූප කලාපයන්ගේම හැල්ලු බව - මොලොක් බව - නැමෙන සුළුබව නම් වූ ආකාර මාත්‍රයට විකාර රූප නම් වේ. විඤ්ඤත්ති රූප දෙකක් විකාර රූප ගනණයට ඇතුලත් වෙන නමුත් විඤ්ඤත්ති නමින් වෙන් කරන ලද බැවින් විකාර රූප තුනක් වශයෙන් මෙහි දැක්වේ.

09. ලක්ෂණ රූප : අටලොස් නිප්ඵන්න රූපයන්ට අයත් වූ සෑම රූප කලායකට - උත්පාද - තිති - භංග අවස්ථා තුනම ඒ රූපයන්ගේ ලක්ෂණ මාත්‍රයක් බැවින් ලක්‍ෂණ රූප නිමිත හැඳින්වෙති. මෙහි උත්පාද ක්ෂණය උපචය - සන්තති නමින් දෙවැදෑරුම් වනුයේ අවස්ථා බේදයෙනි. යම් හේතුවකින් රූප පරම්පරාවක් පහලවීමට පටන් ගැනේද, ඒ මුලි පටන් ගන්නා අවස්ථාව උපචය නම් වේ. එම හේතුවෙන් ම මතු මත්තෙහි පේළි පේළි රූප සන්තිතියගේ උත්පාදය සන්තති නමින් හැඳින් වේ.

10 රූප සමුද්දෙසය : රූප අටවිස්ස නම් වශයෙන් සහ භූත රූප - ප්‍රසාද රූප යනාදී එකොලොස් ආකාරයකින් නම් කොට දැක්වීම රූප සමුද්දේශය නම් වේ. රූපයන් පිළිබඳ මාතෘකාව දැක්වීමකි.

පිලියන්දල සිද්දමුල්ලේ "සැනසුම" නිවසෙහි විසු කෝට්ටේ - ගල්කිස්ස ගම් සභාවේ හිටපු විශේෂ කොමසාරිස් සාමවිනිසුරු
වී.ගුණදස මහත්මාණන්ගේ
අභාවයෙන් තෙමස් සම්පූර්ණය නිමෙත්තෙන් ඒ මගතාට පිං පිණිස දයාබර බිරිඳ දූ දරු පිරිස විසින්
ධම්දනය වශයෙන් මුද්‍රණය කරන ලදී

නුගේගොඩ ගංගොඩවිල 37
සෝරත මාවතේ පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස්හි මුද්‍රණය කරවන ලදී.

රාජ්‍ය සේවා බෞද්ධ සංගමය
මහවැලි සංවර්ධන අමාත්‍යාංශය 500 ටී. බී. ජයා මාවත, කොළඹ 10
2543 බක්. /2000 අප්‍රියෙල් 05

## අභිධර්ම විපස්සනා භාවනා පාඩම අංක - 15

## අභිධර්මාර්ථ සංග්‍රහ රූප විභාග සංග්‍රහය - 03

## අති පූජ්‍ය නා උයනේ අරිය ධම්ම නා හිමිපාණන් වහන්සේ විසින්

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!

01. රූප සමුට්ඨාන- රූප විභාග - රූප කලාප - රූප සමුදය හා නිරෝධය පිළිබඳ අතිරික්ත විවරණයක් සඳහා මේ භාවනා පාඩම් හදරනු ලබන්නේය. කර්මය - චිත්තය - ඍතුය - ආහාරය යන සතර දෙන වනාහි රූප ජනක ප්‍රත්‍යයෝ නම් වන්නාහ.

02. ඔවුනතුරෙන් කර්මය නම් දෙළොස් අකුශල චිත්තය අටමහා කුශල චිත්තය පඤ්ච රූපාවචර කුශල චිත්තය යනු පස්විසි චිත්තයන් සමග සම්ප්‍රයුක්ත වූ චේතනා පස්විස්ස වන්නාහ.

03. චිත්තය යනු අරූපවිපාක සතරද දෙපස් විඤ්ඤාණය ද සියලු දෙනාගේ ප්‍රතිසන්ධි චිත්තය හා රහතුන් ගේ චුති චිත්තයද යන මොවුන් හැර පඤ්ච වෝකාර භවයෙහි හටගන්නා වූ අවශේෂ පන්සැත්තෑ චිත්තයෝ වන්නාහ. සියලු දෙනාගේ චුතිචිත්තයට පෙර සොළොස් වැනි චිත්තක්ෂණයේ සිට ආශ්වාස ප්‍රශ්වාස නිරුද්ධ වන බැවින් එතැන් සිට හටගන්නා සතලොස් චිත්තයෝ ද චිත්තජ රූප නූපදවන්නාහ.

04. ඍතුව නම් අවිඤ්ඤාණක වස්තූන්ගේද සවිඤ්ඤාණක සන්තානයේ ද යන ආධ්‍යාත්මක - බාහිර වස්තූන්ගේ රූප කලාපයන් තුල ස්ථිතියට පත් වූ තේජෝ ධාතුවය.

05. ආහාරය නම් අනුභව කරනු ලබන්නා වූ සියලු ඛාද්‍ය භෝජ්‍ය ලෙය්‍ය පෙය්‍ය ද්‍රව්‍යන්හි පිහිටියා වූ තෙතමනය නම් වූ බාහිර ඕජාව ද, ආධ්‍යාත්ම සන්තානයෙහි පිහිටියා වූ චතුසමුට්ඨානික ඕජාව ද රූප උපදවන ආහාරය නම් වන්නේය.

06. ආධ්‍යාත්ම සන්තානයෙහි කර්මජ රූප කලාපයන්හි ස්ථිතියට පත් වූ ඕජාව අනෙක් අෂ්ටක රූප කලාපයක් උපදවන්නේය. එය වනාහි කර්මප්‍රත්‍ය ආහාර සමුට්ඨාන නම් රූප කලාපයක් වන්නේය.

07. එම කර්ම ප්‍රත්‍ය ආහාර සමුට්ඨාන රූප කලාපයාගේ ස්ථිතියට පත්වූ ඕජාව නැවත අනෙක් ආහාරජ සුද්ධාෂ්ටක රූප කලාපයක් උපදවන්නේය. මෙසේ එම පරම්පරාව රූප කලාප පස් වරක් උපදවන්නේය. එසේම චිත්තජ රූපයන්ගේ ස්ථිතියට පත්වූ ඕජාව සුද්ධාෂ්ටක කලාපයක් උපදවන්නේය. එය චිත්තප්‍රත්‍ය ආහාර සමුට්ඨාන කලාපය නම් වන්නේය. මෙසේ නැවත නැවත එම කලාප වාර දෙතුන් වරක් උපදවනු ලබන්නේය.

08. කබලිංකාර ආහාරයෙන් උපන් රූප කලාපයේ ස්ථිතියට පත් ඕජාව තවත් ආහාරජ රූප කලාපයක් උපදවන්නේ ය. එය වනාහි ආහාර ප්‍රත්‍ය ආහාර සමුට්ඨාන කලාපය නම් වන්නේය. එහි ද පරම්පරාව වරක් දෙකක් ගලපන්නේය. ඍතුජ රූපයෙහි ස්ථිතියට පත් වූ ඕජාව වනාහි අනෙක් ආහාරජ රූපයක් උපද වන්නේය. එය ඍතු ප්‍රත්‍ය ආහාර සමුට්ඨාන රූපය නම් වන්නේය. එහි පරම්පරාව දශ දෙළොස් වරක් පවත්නේය.

09. කර්මජ රූපය වනාහි, පඤ්චප්‍රසාදය ද භාවරූප දෙකද හදය රූපයද ජීවිත රූපය ද යන මේ නව දෙන ඒකාන්ත කර්මජ රූපයෝය. සතර මහා භූතරූපයෝ ද වර්ණය - ගන්ධය - රසය - ඕජාවය - පරිච්ඡේදය යන නව දෙන අනේකාන්ත කර්මජ රූපයෝය. උපචය සන්තතිය සමග කර්මජ රූප සියල්ල සම විස්සක් වන්නාහ.

10. චිත්තජ රූපය වනාහි, කාය වචී විඤ්ඤත්ති දෙක ඒකාන්ත චිත්තජ රූපයෝය. ලහුතා - මුදුතා- කම්මඤ්ඤතා නම් වූ විකාර රූප තුනද - ශබ්ද රූපයද ඉහත දැක්වූ අනේකාන්ත නවය ද යන මේ පසලොස් දෙන, උපචය සන්තති දෙක සමග සතලොස් චිත්තජරූප නම් වන්නාහ.

11. ඍතුජ රූපය වනාහි ශබ්ද රූපය ද විකාර රූප තුනද අනේකාන්ත රූප නවය සමග ලැබෙන තෙළෙස්දෙන උපචය - සන්තති දෙකත් සමග සියල්ල පසලොසක් ඍතුජ රූප නම් වන්නාහ.

12. ආහාරජ රූපය වනාහි, විකාර රූප තුන ද අනේකාන්ත රූප නවයද උපචය - සන්තිති දෙක සමග තුදුස් දෙන ආහාරජ රූප නම් වන්නාහ.

| කර්ම සමුට්ඨාන රූප කලාප 9 | | | |
|---|---|---|---|
| 1. | චක්ඛු දසක කලාපය | 1-යි | 10. සුද්ධාෂ්ටකය - චක්ඛු - ජීවිත |
| 2. | සෝත දසක කලාප | 1-යි | 10 ,, සෝත - ,, |
| 3. | ඝාන දසක කලාප | 1-යි | 10 ,, ඝාන - ,, |
| 4. | ජිව්හා දසක කලාප | 1-යි | 10 ,, ජිව්හා - ,, |
| 5. | කාය දසක කලාප | 1-යි | 10 ,, කාය - ,, |
| 6. | ඉත්ථි භාව දසක කලාප | 1-යි | 10 ,, ඉත්ථින්ද්‍රිය - ,, |
| 7. | පුම්භාව දසක කලාප | 1-යි | 10 ,, පුරිසින්ද්‍රිය - ,, |
| 8. | වත්ථු දසක කලාප | 1-යි | 10 ,, හදය - ,, |
| 9. | ජීවිත නවක කලාප | 1-යි | 9 ,, - ජීවිත |

| චිත්ත සමුට්ඨාන රූප කලාප 6 | | | |
|---|---|---|---|
| 1. | සුද්ධාෂ්ටක කලාප | 1-යි | 8 සුද්ධාෂ්ටකය |
| 2. | කායවිඤ්ඤත්ති නවක කලාප | 1-යි | 9 සුද්ධාෂ්ටක සමග කායවිඤ්ඤත්ති |
| 3. | වචීවිඤ්ඤත්ති දසක කලාප | 1-යි | 10 ,, සමග වචීවිඤ්ඤත්ති-ශබ්ද, |
| 4. | ලහුතා දේකාදශක කලාප | 1-යි | 11 ,, සමග ලහුතා-මුදුතා කම්මඤ්ඤතා |
| 5. | කායවිඤ්ඤත්ති ලහුතාදී ද්වාදසක කලාපය | 1-යි | 12 ,, කායවිඤ්ඤත්ති-ලහුතා-මුදුතා-කම්මඤ්ඤතා |
| 6. | වචීවිඤ්ඤත්ති සද්ද ලහුතාදී තේරසක කලාප | 1-යි | 13 ,, වචීවිඤ්ඤත්ති-ශබ්ද-ලහුතා-මුදුතා-කම්මඤ්ඤතා |

| ඍතු සමුට්ඨාන රූප කලාප 4 | | | |
|---|---|---|---|
| 1. | සුද්ධාෂ්ටක කලාප | 1-යි | 8 සුද්ධාෂ්ටකය |
| 2. | ශබ්ද නවක කලාප | 1-යි | 9 ,, ශබ්දය |
| 3. | ලහුතාදේකාදශක කලාප | 1-යි | 11 ,, ලහුතා-මුදුතා-කම්මඤ්ඤතා |
| 4. | සද්දලහුතාදී ද්වාදසක කලාප | 1-යි | 12 ,, ශබ්ද-ලහුතා-මුදුතා කම්මඤ්ඤතා |

| ආහාර සමුට්ඨාන රූප කලාප 2 | | | |
|---|---|---|---|
| 1. | සුද්ධාෂ්ටක කලාප | 1-යි | 8 සුද්ධාෂ්ටකය |
| 2. | ලහුතාදේකාදසක කලාප | 1-යි | 11 ,, ලහුතා-මුදුතා-කම්මඤ්ඤතා |

| රූප කලාප සම්පිණ්ඩනය | | | |
|---|---|---|---|
| 1. | කර්මජ කලාප | 9 | 1- බැගින් 9-කි |
| 2. | චිත්තජ කලාප | 6 | 1- බැගින් 6-කි |
| 3. | ඍතුජ කලාප | 4 | 1- බැගින් 4-කි |
| 4. | ආහාරජ කලාප | 2 | 1- බැගින් 2-කි |

13. රූප සමුට්ඨාන සතර අතුරෙන් කර්මජ කලාපයෝ වනාහි ප්‍රතිසන්ධි චිත්තයාගේ උද්පාද ක්ෂණයේ සිට කුඩා චිත්තක්ෂණයක් පාසා, චුති චිත්තයෙන් පෙර සතලොස්වන චිත්තය දක්වාම උපදින්නාහ. පරිපූර්ණ ආයතන ඇතිව උපදින සංසේදජ ඕපපාතික සත්වයන්ට වනාහි ප්‍රතිසන්ධි චිත්තයාගේ උත්පාදක්ෂණයේ සිටම චක්ඛු-සෝත - ඝාන- ජිව්හා- කාය- භාව- වත්ථු වශයෙන් දශක කලාප සතක් පහළ වන්නාහ. සංසේදජ ඕපපාතික ගබ්භසෙය්‍යක සත්වයන්ට වනාහි ප්‍රවෘත්ති කාලයෙහිදී ආමාශයෙහි ආහාර පිහිටි තැන් සිට ආහාර පැසවන පාචක තේජෝ ධාතුව නම්වූ ජීවිත නවක රූප කලාපයද පහළ වන්නේය.

14. එම, ජීවිත නවක රූප කලාපය වනාහි සුවසේ අවබෝධ නොවන බැවින් චක්ඛුදසාතාදි කලාපයන්ටම ඇතුලත් කොට ගනු ලබන්නේය. ගබ්භසෙය්‍යක පිරිපුන් ආයතන ඇති සත්වයන්ට වනාහි ප්‍රතිසන්ධි චිත්තයාගේ උත්පාද ක්ෂණයේ දී කාය-භාව-වත්ථු දසක නම්වූ දශක කලාපයෝ තිදෙනෙක් පහළ වන්නාහ. ප්‍රතිසන්ධියෙන් එකොළොස්වන සතියේ දී වනාහි අවශේෂ වූ චක්ඛු-සෝත-ඝාන -ජිව්හා දශක කලාපයෝ සතර දෙන පහළ වන්නාහ.

15. ඍතුජ රූප කලාපයෝ වනාහි ප්‍රතිසන්ධි චිත්තයාගේ ඨිතික්ෂණයේ සිට සෑම කුඩා චිත්තක්ෂණයක් පාසා පහළ වන්නාහ. චිත්තජ රූප කලාපයෝ වනාහි ප්‍රතිසන්ධි චිත්තයට අනතුරුව පහළවන පළමුවැනි භවංග චිත්තයාගේ උත්පාදක්ෂණයේ සිටම රූප ජනක සෑම චිත්තයකගේ උත්පාදක්ෂණයක් පාසා උපදවන්නාහ. චිත්තයකගේ ඨිතික්ෂණ-භංගක්ෂණයේ දී වනාහි චිත්තජ රූප නූපදවන්නාහ.

16. ආහාරජ රූප කලාපයෝ වනාහි සංසේදජ ඕපපාතික සත්වයන්ට ආහාර පාන අනුභව කරන කාලයේ දී ද, ආහාරයක් නැතිව සා පිපාසිතව කෙළ ගිලීමේදී ද, එහි පිහිටි ආහාර ඕජාව රසහරණි අනුසාරයෙන් සිරුරෙහි පැතිරෙන කල්හි ආහාරජ රූප උපදින්නාහ. අණ්ඩජ ජලාබුජ සත්ත්වයන්ට වනාහි මව විසින් ගනු  ලබන ආහාර පාන ඕජාව කුසහොත් දරුවාගේ සිරුරෙහි පැතිරෙන කල්හි ආහාරජ රූප කලාපයෝ පහළ වන්නාහ.

17. කර්මජ ඍතුජ ආහාරජ රූපයෝ වනාහි චිත්තක්ෂණ සතලොසකට හෙවත් කුඩා චිත්තක්ෂණ එක්පණසකට සමාන ආයුෂ ඇත්තෝය. එහෙයින් නිරුද්ධ වීමේ දී ද චිත්තයාගේ උත්පාදක්ෂණ-ඨිතික්ෂණ- භංගක්ෂණ යන තුන් අවස්ථාවන්හිදීම ද නිරුද්ධ වන්නාහ. චිත්තජ රූපයෝ වනාහි සිතක උත්පාදක්ෂනයේදීම උපදින බැවින් සතලොස්වන චිත්තයාගේ භංගක්ෂණයේදීම නිරුද්ධ වන්නාහ.

18. ප්‍රතිසන්ධි චිත්තයාගේ උත්පාද ක්ෂණයේදී ගර්භසෙය්‍යක සත්වයාට කාය-භාව- වත්ථු දශක කලාප තුනක්ද, ඨිතික්ෂණ යේදී තුනක්ද භංගක්ෂනයේ දී තුනක්දැයි රූප කලාප නවයක් ලැබෙන්නාහ. මේ ආකාරයෙන් චිත්තක්ෂණ සතලොස කදී රූප කලාප 153-ක් ලැබෙන්නාහ. ප්‍රතිසන්ධියෙන් එකොලොස් වන සතියේ දී චක්ඛු-සෝත-ඝාන-ජිව්හා දසක කලාප ලැබෙන තුරු සෑම කුඩා චිත්තක්ෂණයක් පාසා රූප කලාප තුන බැගින් බිදෙන අතර රූප කලාප තුන බැගින් ස්ථිතිප්‍රාප්ත කලාප 153 බැගින් පවත්නාහ. චක්ඛු දසකාදි දසක සතර පහළ වූ තැන් සිට සෑම කුඩා චිත්තක්ෂණයකදී රූප කලාප සතක් බැගින් උපදින්නාහ. රූප කලාප සතක් බැගින් සතලොස් චිත්තක්ෂණ ආයු පිරී නිරුද්ධ වන්නාහ. රූප කලාප 357, බැගින් ස්ථිතියට පැමිණ සිටින්නාහ.

19. චිත්තජ රූප කලාප සය අතුරෙන් නිරතුරුවම ලැබෙනුයේ ශුද්ධාෂ්ඨක කලාපය පමණකි. එහෙයින් ප්‍රතිසන්ධි සිතට අනතුරුව ලැබෙන පළමුවන භවංග සිතේ උත්පාදක්ෂයේ සිට සෑම සිතක උත්පාදක්ෂණයේද රූප කලාප එක බැගින් උපදින්නේය. එසේ හෙයින් සතලොස් වන චිත්තයාගේ භංගක්ෂණයේදී බිදෙන රූප එකක්ද ස්ථිතිප්‍රාප්ත රූප සොළසක් ද බැගින් වන්නාහ.

20. ඍතුජ රූප කලාපයෝ වනාහි කර්මප්‍රත්‍ය ඍතුජ රූපයෝය චිත්තප්‍රත්‍ය ඍතුජ රූපයෝය ඍතුප්‍රත්‍ය ඍතුජ රූපයෝය ආහාර ප්‍රත්‍ය ඍතුජ රූපයෝ යයි සතර වැදෑරුම් වන්නාහ. ඔවුනතුරෙන් කර්ම ප්‍රත්‍ය ඍතුජ රූපයෝ ප්‍රතිසන්ධි චිත්තයාගේ ස්ථිති ක්ෂණයේ සිට කුඩා චිත්තක්ෂණයක් පාසා ඍතුජරූප ශුද්ධාෂ්ඨක කලාප තුන බැගින් උපදවන්නාහ. එහෙයින් චිත්තක්ෂණ සතලොසක් පිරෙන කල්හි රූප කලාප 357. බැගින් ලැබෙන්නාහ.

21. චිත්ත ප්‍රත්‍ය ඍතුජ රූපයෝ පළමුවන භවංගයාගේ ස්ථිතික්ෂණ සිට සෑම කුඩා චිත්තක්ෂණයක් පාසා එක එක කලාපය බැගින් උපදින්නාහ. ඍතුප්‍රත්‍ය ඍතුජ රූප කලාපයෝද ප්‍රතිසන්ධි චිත්තයාගේ ස්ථිතික්ෂණයෙන් පසු සෑම කුඩා ක්ෂණයක් පාසා රූප කලාප එක බැගින් උපදින්නාහ. ආහාර ප්‍රත්‍ය ඍතුජ රූපයෝද ආහාර ඕජාව උපන් තැන් සිට සෑම කුඩා ක්ෂණයක් පාසා එක බැගින් උපදින්නාහ.

පරිපූර්ණායතන ගර්භසෙය්‍යක සත්වයාගේ ප්‍රතිසන්ධි චිත්තයාගේ සිට භවනිකාන්තික ලෝභ ජවනාවසානය තෙක් ප්‍රතිසන්ධි නාමස්කන්ධ කටත්තා රූපාදීන්ගේ උත්පත්ති ක්‍රමය දැක්වෙන රූප විථි සටහන

| සිත් පෙළ | | වි | භ | භ | භ | භ | භ | භ | භ | භ | භ | භ | භ | භ | භ | ග | භ | භ | ම | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | භ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කුඩා චිත්තක්ෂණ | - | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |
| කර්මජ රූප | උත් | 3 | 12 | 21 | 30 | 39 | 48 | 57 | 66 | 75 | 84 | 93 | 102 | 111 | 120 | 129 | 138 | 147 | 153 | 153 | 153 | 153 | 153 | 153 | 153 | 153 | 153 |
| යන්ගේ ඉපදීම | ඨිති | 6 | 15 | 24 | 33 | 42 | 51 | 60 | 69 | 78 | 87 | 96 | 105 | 114 | 123 | 132 | 141 | 150 | 153 | 153 | 153 | 153 | 153 | 153 | 153 | 153 | 153 |
| සහ බිඳීම | භං: | 9 | 18 | 27 | 36 | 45 | 54 | 63 | 72 | 81 | 90 | 99 | 108 | 117 | 126 | 135 | 144 | 153 | 153 | 153 | 153 | 153 | 153 | 153 | 153 | 153 | 153 |
| චිත්තජ රූපයන් | උ: | 0 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 |
| ගේ ඉපදීම | ඨි: | 0 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 |
| හා බිඳීම | භං: | 0 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 |
| කර්ම ප්‍රත්‍ය | උ: | 0 | 9 | 18 | 27 | 36 | 45 | 54 | 63 | 72 | 81 | 90 | 99 | 108 | 117 | 126 | 135 | 144 | 153 | 153 | 153 | 153 | 153 | 153 | 153 | 153 | 153 |
| උතුජ රූපයන් ගේ ඉපදීම | ඨි: | 3 | 12 | 21 | 30 | 39 | 48 | 57 | 66 | 75 | 84 | 93 | 102 | 111 | 120 | 129 | 138 | 147 | 153 | 153 | 153 | 153 | 153 | 153 | 153 | 153 | 153 |
| බිඳීම | භං: | 6 | 15 | 24 | 33 | 42 | 51 | 60 | 69 | 78 | 87 | 96 | 105 | 114 | 123 | 132 | 141 | 150 | 153 | 153 | 153 | 153 | 153 | 153 | 153 | 153 | 153 |
| චිත්ත ප්‍රත්‍ය | උ: | 0 | 0 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 |
| උතුජ රූපයන් ගේ ඉපදීම | ඨි: | 0 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 |
| බිඳීම | භං: | 0 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 |
| බාහිර ඍතු | උ: | 0 | 3 | 6 | 9 | 12 | 15 | 18 | 21 | 24 | 27 | 30 | 33 | 36 | 39 | 42 | 45 | 48 | 50 | 50 | 50 | 50 | 50 | 50 | 50 | 50 | 50 |
| ප්‍රත්‍ය උතුජ | ඨි: | 1 | 4 | 7 | 10 | 13 | 16 | 19 | 22 | 25 | 28 | 31 | 34 | 37 | 40 | 43 | 46 | 49 | 50 | 50 | 50 | 50 | 50 | 50 | 50 | 50 | 50 |
| රූපයන්ගේ ඉපදීම, බිඳීම | භං: | 2 | 5 | 8 | 11 | 14 | 17 | 20 | 23 | 26 | 29 | 32 | 35 | 38 | 41 | 44 | 47 | 50 | 50 | 50 | 50 | 50 | 50 | 50 | 50 | 50 | 50 |
| අසංඥසත්ත්ව ප්‍රතිසන්ධිය | | | | | අසඥ්ඥසත්වලයෙහි සිත් කිසිවක් නැත. කුඩා ක්ෂණ ප්‍රමාණය පවතනට දැක්වූයේ තෙරෙයි. | | | | | | | | | | | | | | | | | | | | | | |
| කුඩා ක්ෂණ | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| ජීවිත නවක කර්මජ | උ: | 1 | 4 | 7 | 10 | 13 | 16 | 19 | 22 | 25 | 28 | 31 | 34 | 37 | 40 | 43 | 46 | 49 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 |
| රූපයන්ගේ ඉපදීම බිඳීම | ඨි: | 2 | 5 | 8 | 11 | 14 | 17 | 20 | 23 | 26 | 29 | 32 | 35 | 38 | 41 | 44 | 47 | 50 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 |
| | භං: | 3 | 6 | 9 | 12 | 15 | 18 | 21 | 24 | 27 | 30 | 33 | 36 | 39 | 42 | 45 | 48 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 |

පරිපූර්ණායතන ගර්භසෙය්‍යක සත්ත්වයන්ට එකොලොස් වැනි සතියේ දී චක්ඛු - සෝත - ඝාන - ජිව්හා කලාපයන් එනම ක්ෂණයේදී ලැබෙන ආකාරය ද - ඕජාහරණ කාලයේ සිට ආහාර සමුට්ඨාන රූපයන්ගේ පහළවීම ද දැක්වෙන රූපවීථි සටහන මනෝද්වාරික චිත්ත වීථියක් අනුසාරයෙනි.

| සිත් පෙළ | | භ | ති | න | ද | ම | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | ර | ර | භ | භ | භ | භ | භ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කුඩා චිත්තක්ෂණ | | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |
| කර්මජ රූපකලාප | උ: | 153 | 157 | 169 | 181 | 193 | 205 | 217 | 229 | 241 | 253 | 265 | 277 | 289 | 301 | 313 | 325 | 337 | 349 | 357 |
| වර්ධනය | ඨි: | 153 | 161 | 173 | 185 | 197 | 209 | 221 | 233 | 245 | 257 | 269 | 281 | 293 | 305 | 317 | 329 | 341 | 353 | 357 |
| | භං: | 153 | 165 | 177 | 189 | 201 | 213 | 225 | 237 | 249 | 261 | 273 | 285 | 297 | 309 | 321 | 333 | 345 | 357 | 357 |
| චිත්තජ රූපකලාප | උ: | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 |
| වර්ධනය | ඨි: | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 |
| | භං: | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 |
| කර්ම ප්‍රත්‍ය උතුජ | උ: | 153 | 153 | 165 | 177 | 189 | 201 | 213 | 225 | 237 | 249 | 261 | 273 | 285 | 297 | 309 | 321 | 333 | 345 | 357 |
| රූපකලාප වර්ධනය | ඨි: | 153 | 157 | 169 | 181 | 193 | 205 | 217 | 229 | 241 | 253 | 265 | 277 | 289 | 301 | 313 | 325 | 337 | 349 | 357 |
| | භං: | 153 | 161 | 173 | 185 | 197 | 209 | 221 | 233 | 245 | 257 | 269 | 281 | 293 | 305 | 317 | 329 | 341 | 353 | 357 |
| චිත්ත ප්‍රත්‍ය උතුජ | උ: | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 |
| රූපකලාප වර්ධනය | ඨි: | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 |
| | භං: | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 |
| බාහිර සෘතු ප්‍රත්‍ය | උ: | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 |
| උතුජ රූප කලාප | ඨි | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 |
| වර්ධනය | භං: | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 |
| ආහාර ප්‍රත්‍ය උතුජ | උ: | 0 | 0 | 3 | 6 | 9 | 12 | 15 | 18 | 21 | 24 | 27 | 30 | 33 | 36 | 39 | 42 | 45 | 48 | 51 |
| රූප කලාප වර්ධනය | ඨි: | 0 | 1 | 4 | 7 | 10 | 13 | 16 | 19 | 22 | 25 | 28 | 31 | 34 | 37 | 40 | 43 | 45 | 49 | 51 |
| | භං: | 0 | 17 | 38 | 59 | 80 | 101 | 122 | 143 | 164 | 185 | 206 | 227 | 448 | 669 | 290 | 311 | 332 | 353 | 357 |
| චිත්ත ප්‍රත්‍ය ආහාරජ | උ: | 0 | 0 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 |
| රූප කලාප වර්ධනය | ඨි: | 0 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 | 17 |
| | භං: | 0 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 | 17 |
| බාහිර ප්‍රත්‍ය ආහාරජ | උ: | 0 | 1 | 4 | 7 | 10 | 13 | 16 | 19 | 22 | 25 | 28 | 31 | 34 | 37 | 40 | 43 | 46 | 49 | 51 |
| ආහාරජ රූපකලාප | ඨි: | 0 | 2 | 5 | 8 | 11 | 14 | 17 | 20 | 23 | 26 | 29 | 32 | 35 | 38 | 41 | 44 | 47 | 50 | 51 |
| වර්ධනය | භං: | 0 | 3 | 6 | 9 | 12 | 15 | 18 | 21 | 24 | 27 | 30 | 33 | 36 | 39 | 42 | 45 | 48 | 51 | 51 |
| සෘතුප්‍රත්‍ය ආහාරජ | උ: | 0 | 0 | 3 | 6 | 9 | 12 | 15 | 18 | 21 | 24 | 27 | 30 | 33 | 36 | 39 | 42 | 45 | 48 | 51 |
| රූප කලාප වර්ධනය | ඨි: | 0 | 1 | 4 | 7 | 10 | 13 | 16 | 19 | 22 | 25 | 28 | 31 | 34 | 37 | 40 | 43 | 46 | 49 | 51 |
| | භං: | 0 | 2 | 5 | 8 | 11 | 14 | 17 | 20 | 23 | 26 | 29 | 32 | 35 | 38 | 41 | 44 | 47 | 50 | 51 |

පරිපූර්ණායතන සංසේදජ ඕපපාතික කාමාවචර පුද්ගලයන්ගේ ප්‍රතිසන්ධියේ සිට භවනිකාන්තික ලෝභ ජවනාවසානය තෙක් පවතින රූප වීථි සටහනයි.

| සිත්පෙළ | | වි | භ | භ | භ | භ | භ | භ | භ | භ | භ | භ | භ | භ | භ | භ | භ | භ | ම | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | භ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කුඩා චිත්තක්ෂණ | | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |
| කර්මජ රූප | උ: | 7 | 28 | 49 | 70 | 91 | 112 | 135 | 154 | 175 | 196 | 217 | 238 | 259 | 280 | 301 | 322 | 343 | 357 | 357 | 357 | 357 | 357 | 357 | 357 | 357 | 357 |
| කලාප | ඨි: | 14 | 35 | 56 | 77 | 98 | 119 | 140 | 161 | 182 | 203 | 224 | 245 | 266 | 287 | 308 | 329 | 350 | 357 | 357 | 357 | 357 | 357 | 357 | 357 | 357 | 357 |
| | භං: | 21 | 42 | 63 | 84 | 105 | 126 | 147 | 168 | 189 | 210 | 231 | 252 | 273 | 294 | 315 | 336 | 357 | 357 | 357 | 357 | 357 | 357 | 357 | 357 | 357 | 357 |
| චිත්තජ රූප | උ: | 0 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 |
| කලාප | ඨි: | 0 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 |
| | භං: | 0 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 |
| කර්ම ප්‍රත්‍යය | උ: | 0 | 21 | 42 | 63 | 84 | 105 | 126 | 147 | 168 | 189 | 210 | 231 | 252 | 273 | 294 | 315 | 336 | 357 | 357 | 357 | 357 | 357 | 357 | 357 | 357 | 357 |
| උතුජ රූප | ඨි: | 7 | 28 | 49 | 70 | 91 | 112 | 133 | 154 | 175 | 196 | 217 | 238 | 259 | 280 | 301 | 322 | 343 | 357 | 357 | 357 | 357 | 357 | 357 | 357 | 357 | 357 |
| කලාප | භං | 14 | 35 | 56 | 77 | 98 | 119 | 140 | 161 | 182 | 203 | 224 | 245 | 266 | 287 | 308 | 329 | 350 | 357 | 357 | 357 | 357 | 357 | 357 | 357 | 357 | 357 |
| චිත්ත ප්‍රත්‍යය | උ: | 0 | 0 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 |
| උතුජ රූප | ඨි: | 0 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 |
| කලාප | භං: | 0 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 |
| බාහිර සත්‍ව | උ: | 0 | 3 | 6 | 9 | 12 | 15 | 18 | 21 | 24 | 27 | 30 | 33 | 36 | 39 | 42 | 45 | 48 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 |
| ප්‍රත්‍යය උතුජ | ඨි: | 1 | 4 | 7 | 10 | 13 | 16 | 19 | 22 | 25 | 28 | 31 | 34 | 37 | 40 | 43 | 46 | 49 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 |
| රූප කලාප | භං: | 2 | 5 | 8 | 11 | 14 | 17 | 20 | 23 | 26 | 29 | 32 | 35 | 38 | 41 | 44 | 47 | 50 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 |

පිරිපුන් ආයතන ඇති කාමාවචර සත්වයකුගේ චක්ෂුද්වාරික මරණාසන්න වීථියකගේ අනුසාරයෙන් රූප කලාපයන්ගේ හානිය දැක්වෙන රූපවීථිය. බාහිර ඕජාවෙන් උපදින රූප කලාපද සෘතුජ ශුද්ධාෂ්ටකය මෙන් එක රූප කලාපයක් වශයෙන් ගනු ලැබේ. සෝත-ඝාන-ජිව්හා-කාය-මනෝද්වාරික වීථි අනුසාරයෙන් ද මරණාසන්න රූපවීථි මෙසේම ලැබෙන බව සැලකිය යුතුය-පඤ්ච විඥ්ඥාණයෙන් චිත්තජරූප නොලැබෙන බව වෙනසි.

| වීථි චිත්ත පරම්පරාව | | භ | ති | න | ද | ප | ච | සං | ණ | වො | ජ | ජ | ජ | ජ | ජ | - | ර· | ර· | චු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| තුඩාචිත්තක්ෂණ | උ: | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 | - | 000 | 000 | 000 |
| කර්මජ රූපකලාප හානිය | උ: | 357 | 336 | 315 | 294 | 273 | 252 | 231 | 210 | 199 | 168 | 147 | 126 | 105 | 84 | - | 63 | 42 | 21 |
| | ඨි: | 350 | 329 | 308 | 287 | 266 | 345 | 224 | 203 | 182 | 161 | 140 | 119 | 98 | 77 | - | 56 | 35 | 14 |
| | භං: | 343 | 322 | 301 | 280 | 259 | 238 | 217 | 196 | 175 | 154 | 133 | 112 | 91 | 70 | - | 49 | 28 | 7 |
| චිත්තජ රූප කලාප හානිය | උ: | 17 | 17 | 17 | 17 | 17 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | - | 16 | 16 | 16 |
| | ඨි: | 17 | 17 | 17 | 17 | 17 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | - | 16 | 16 | 16 |
| | භං: | 17 | 17 | 17 | 17 | 17 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | - | 16 | 16 | 16 |
| කර්ම ප්‍රත්‍ය උතුජ රූපකලාප හානිය | උ: | 357 | 343 | 322 | 301 | 280 | 259 | 238 | 217 | 196 | 175 | 154 | 133 | 112 | 91 | - | 70 | 49 | 28 |
| | ඨි: | 357 | 336 | 315 | 294 | 273 | 252 | 231 | 210 | 189 | 168 | 147 | 126 | 105 | 84 | - | 63 | 42 | 21 |
| | භං: | 350 | 329 | 308 | 287 | 266 | 245 | 224 | 203 | 182 | 161 | 140 | 119 | 98 | 77 | - | 56 | 35 | 14 |
| චිත්තප්‍රත්‍ය උතුජ රූප කලාප හානිය | උ: | 17 | 17 | 17 | 17 | 17 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | - | 16 | 16 | 16 |
| | ඨි: | 17 | 17 | 17 | 17 | 17 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | - | 16 | 16 | 16 |
| | භං: | 17 | 17 | 17 | 17 | 17 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | - | 16 | 16 | 16 |
| බාහිර සෘතු ප්‍රත්‍ය උතුජ රූප කලාප හානිය | උ: | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | - | 51 | 51 | 51 |
| | ඨි: | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | - | 51 | 51 | 51 |
| | භං: | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | - | 51 | 51 | 51 |
| ආහාර ප්‍රත්‍ය උතුජ රූපකලාප හානිය | උ: | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | - | 51 | 51 | 51 |
| | ඨි: | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | - | 51 | 51 | 51 |
| | භං: | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | - | 51 | 51 | 51 |
| කර්ම ප්‍රත්‍යආහාරජ රූප කලාප හානිය | උ: | 357 | 343 | 322 | 301 | 280 | 259 | 238 | 217 | 196 | 175 | 154 | 133 | 112 | 91 | - | 70 | 49 | 28 |
| | ඨි: | 357 | 336 | 315 | 294 | 273 | 252 | 231 | 210 | 189 | 168 | 147 | 126 | 105 | 84 | - | 63 | 42 | 21 |
| | භං: | 350 | 329 | 108 | 287 | 266 | 245 | 224 | 203 | 182 | 161 | 140 | 119 | 98 | 77 | - | 56 | 35 | 14 |
| චිත්ත ප්‍රත්‍ය ආහාරජ රූප කලාප හානිය | උ: | 17 | 17 | 17 | 17 | 17 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | - | 16 | 16 | 16 |
| | ඨි: | 17 | 17 | 17 | 17 | 17 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | - | 16 | 16 | 16 |
| | භං: | 17 | 17 | 17 | 17 | 17 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | - | 16 | 16 | 16 |
| බාහිර ඕජාප්‍රත්‍ය ආහාරජ රූපකලාප හානිය | උ: | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | - | 51 | 51 | 51 |
| | ඨි: | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | - | 51 | 51 | 51 |
| | භං: | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | - | 51 | 51 | 51 |
| සෘතු ප්‍රත්‍ය ආහාරජ රූප කලාප හානිය | උ: | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | - | 51 | 51 | 51 |
| | ඨි: | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | - | 51 | 51 | 51 |
| | භං: | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | - | 51 | 51 | 51 |

**ත්‍රිලක්ෂණ විදර්ශනාව**

1. රූප විභාග අභිධර්ම විදර්ශනා භාවනාවේදී පහළ වූ චිත්ත චෛතසික භූතරූප උපාදා රූප යන මේ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝය.
2. ඇතිවීම නැති වීම දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝය.
3. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝය.
4. මෙසේ අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ නාම රූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන සංඛත සන්තාප විපරිනාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේය.
5. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව ආයූහණ නිදාන සංයෝග පලිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේය.
6. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ විවේක අසංඛත අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේය.
7. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතු වූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය නියයාන හේතු දස්සන ආධිපතෙය්‍යාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේය.
8. මාගේ භාවනාමය කුශලානිසංස ධර්මය මෙම චතුරාර්ය සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිසම හේතු වේවා වාසනා වේවා

සාධු. සාධු. සාධු.

1. **අතිපූජ්‍ය නා උයනේ අරියධම්ම ස්වාමීන්වහන්සේට සම්මා සම්බුදු බව පතා**
2. **රාජ්‍යසේවා බෞද්ධ සංගමය හිටපු ප්‍රධාන ගරු ලේකම් යූ.එස්. මුදලිගේ මහත්මා ඇතුළු පරලෝ සැපත් සැමට පිං අනුමෝදනය සඳහා**
3. **භාවනා පන්තියට සහභාගිවන සැමට සෙත්පතා**
4. **චාමර සංජීව තරුණ මහතාණන්ට සියලු ග්‍රහ අපල දුරුවී නිරෝගි සුවය හා දීගාසිරි පතා**
5. **තමාට සුවසේ නිවන් අවබෝධය පතා**

**රාජගිරිය, බණ්ඩාරණායක පුර අංක 193 හි පදිංචි G.L. පෙරේරා මහත්මාව විසින් ධර්ම දානය පිණිස මුද්‍රණය කර බෙද දෙන ලදී.**

**නුගේගොඩ ගංගොඩවිල 37**
**සෝරත මාවතේ පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස්හි මුද්‍රණය කරවන ලදී.**

**රාජ්‍ය සේවා බෞද්ධ සංගමය**
**මහවැලි සංවර්ධන අමාත්‍යාංශය 500 ටී. බී. ජයා මාවත, කොළඹ 10**
**2543 වෙසක් / 2000 මැයි 03**

## අභිධර්ම විපස්සනා භාවනා පාඨම අංක - 16

## අභිධර්මාර්ථ සංග්‍රහ - සමුච්චය සංග්‍රහය විභාගය 01

## අති පූජ්‍ය නා උයනේ අරිය ධම්ම නා හිමිපාණන් වහන්සේ විසින්

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!

01. ද්වාසත්තති විධා වුත්තා - වත්ථු ධම්මා සලක්ඛණා
තේසං දානි යථා යෝගං - පවක්ඛාමි සමුච්චයං

අරමුණු දැනීම් ආදී තම තමන්ගේ ස්වභාව ලක්ෂණ සහිත වූ පරමාර්ථ ධර්මයෝ දෙසැත්තෑවක් මෙතෙකින් කියන ලද්දුහ. මින් ඉදිරියට ඒ පරමාර්ථ ධර්ම දෙසැත්තෑව සම්බන්ධ වූ සමුච්චය හෙවත් රාශිය, යෙදෙන ආකාරයෙන් කියන්නෙමි.

02. රූප සංග්‍රහ විභාගයට අනතුරුව සමුච්චය සංග්‍රහ විභාගය කියනු ලබන්නේ ය. එය ද අකුසල සංග්‍රහය - මිශ්‍රක සංග්‍රහය බෝධිපාක්ෂික සංග්‍රහය සර්ව සංග්‍රහය නමින් සතර වැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් පළමු කොට අකුශල සංග්‍රහය නම් කෙසේද යත්, ආශ්‍රව - ඕඝ - යෝග - ග්‍රන්ථ - උපාදාන - නීවරණ අනුශය - සංයෝජන - ක්ලේශ නමින් අකුශල සංග්‍රහය නව වැදෑරුම් වන්නේය.

03. ඔවුනතුරෙන්, කාමාශ්‍රවය - භවාශ්‍රවය - දිට්ඨාශ්‍රවය - අවිද්‍යාශ්‍රවය නමින් ආශ්‍රවයෝ සතර දෙනෙක් වන්නාහ. කාමඕඝ - භවඕඝ - දිට්ඨිඕඝ අවිජ්ජාඕඝ නමින් ඕඝයෝ ද සතර දෙනෙක් වන්නාහ. කාමයෝග භවයෝග - දිට්ඨියෝග - අවිජ්ජායෝග නමින් යෝගයෝද සතර දෙනෙක් ඇත්තාහ. අභිජ්ඣාකාය ග්‍රන්ථය - ව්‍යාපාද කායග්‍රන්ථය - සීලබ්බතපරාමාස කාය ග්‍රන්ථය - ඉදං සච්චාභිනිවේස කාය ග්‍රන්ථය නමින් ග්‍රන්ථයෝ ද සතර දෙනෙක් ඇත්තාහ.

04. කාමූපාදානය - දිට්ඨූපාදානය - සීලබ්බතුපාදානය - අත්තවාදුපාදානය නමින් උපාදානයෝ ද සතර දෙනෙක් ඇත්තාහ. කාමච්ඡන්ද නීවරණය - ව්‍යාපාද නිවරණය - ථීනමිද්ධ නීවරණය - උද්ධච්ච කුක්කුච්ච නීවරණය - විචිකිච්ඡා නීවරණය අවිජ්ජා නීවරණය නමින් නීවරණයෝ සය දෙනෙක් ඇත්තාහ. කාමරාගානු සය- භවරාගානුසය - පටිඝානු සය - මානානුසය - දිට්ඨානු සය - විචිකිච්චානුසය - අවිජ්ජානුසය නමින් අනුසයෝ ද සත්දෙනෙක් ඇත්තාහ.

05. කාමරාග සංයෝජනය - රූපරාග සංයෝජනය - අරූපරාග සංයෝජනය - පටිඝ සංයෝජනය - මාන සංයෝජනය - දිට්ටිසංයෝජනය - සීලබ්බත පරාමාස සංයෝජනය - විචිකිච්ඡා සංයෝජනය - උද්ධච්ච සංයෝජනය - අවිජ්ජා සංයෝජනය නමින් සූත්‍රාන්ත ක්‍රමයෙන් සංයෝජන දස දෙනෙක් ඇත්තාහ.

06. තවද, කාමරාග සංයෝජනය - භවරාග සංයෝජනය - පටිඝ සංයෝජනය - මාන සංයෝජනය - දිට්ඨිසංයෝජනය - සීලබ්බත පරාමාස සංයෝජනය - විචිකිච්ඡා සංයෝජනය - ඉස්සාසංයෝජනය - මච්ඡරිය සංයෝජනය - අවිජ්ජාසංයෝජනය නමින් අභිධර්ම ක්‍රමයෙන් ද සංයෝජනයෝ දස දෙනෙක් ඇත්තාහ. ලෝභය - ද්වේසය - මෝහය - මානය - දිට්ඨිය- විචිකිච්ඡාය - ථීනය - උද්ධච්චය - අහිරිකය - අනොත්තප්පය නමින් ක්ලේශ වස්තූන්ද දස දෙනෙක් ඇත්තාහ.

07. ඔවුනතුරෙන් ආශ්‍රවයෝ නම් කවරේද යත්? අනාදිමත් සසර පටන් දීර්ඝතම කාලාන්තරයෙහි සන්තානය පැසවමින් දුගඳ වහනය කරවමින් උඩ යට සරස හාත්පසින් වැගිරෙන සුළු ලෝභ - දිට්ඨි - මෝහ තිදෙන ආශ්‍රව නම් වන්නාහ. කාමාශ්‍රව - භවාශ්‍රව

යනු කාමවස්තු අරමුණුකොට ඇත්තා වූද රූපාරූප භව සම්පත් අරමුණු කොට ඇත්තාවූද ලෝභය නම් වූ තෘෂ්ණාවම වන්නේය.

08. සතරක් වූ ඕඝයෝ නම් කවරේද යත්? සංසාර සාගර පත්ලටම සත්වයන් ගසාගෙන යන අර්ථයෙන් වේගවත් සැඩපහරක් වැනි වූ ලෝභ - දිට්ඨි - මෝහ තිදෙනම වන්නාහ. සතරක් වූ යෝගයෝ නම් කවරේද යත්: සත්වයන් සසර කණුවෙහි බැඳලන අර්ථයෙන් යෝග නම් වූ ලෝභ - දිට්ඨි මෝහයෝ තිදෙනම වන්නාහ. කාමඕඝ භවඕඝ- කාමයෝග භවයෝග - දෙතැන්හිම ලෝභයම යෙදෙන බව දතයුතු වන්නේය.

09. සතරක් වූ කාය ග්‍රන්ථයෝ නම් කවරේද යත්? භවයෙන් භවයට සත්වයා ගැටලන අර්ථයෙන් ලෝභ-දෝස දිට්ඨි නම් වූ තිදෙන වන්නාහ. සතරක් වූ උපාදනයෝ නම් කවරේද යත්? කිඹුලකු කටින් ගන්නා ලද්ද දැඩිව ගනු ලබන්නා සේ, ගලවාගත නොහෙන සේ දැඩිව ගන්නා අර්ථයෙන් උපාදන නම් වූ ලෝභ- දිට්ඨි දෙදෙනා වන්නාහ. සීලබ්බත පරාමාස ඉදං සච්චාභිනිවේස කායග්‍රන්ථයෝ දෙදෙනො ද දිට්ඨුපාදන - අත්තවාදුපාදන දෙදෙනාද දිට්ඨි චෛතසික යම වන්නේය.

10. නීවරණ සය දෙන නම් කවරේද යත්, ධ්‍යාන - සමාධි සමාපත්ති- අභිඥා - මාර්ගඵල නිර්වාණ නම් වූ උත්තරිමනුෂ්‍ය ධර්මාධිගමයට බාධාගෙන දෙන අර්ථයෙන් ආවරණ නීවරණ - නම් වූ ලෝභ - දෝස - මෝහ - ථිනමිද්ධ - උද්ධච්ච කුක්කුච්ච - විචිකිච්චා නම් වූ සයදෙනා වන්නාහ.

11. අනුශය සත්දෙනා නම් කවරේද යත්, සුදුසු අරමුණක් ලැබුණු කෙණෙහි සැණෙකින් අවදිවී නැඟී සිටින සුළුවූද, නිදගත් නාගයකු මෙන් සැඟවීසිට අවස්ථාවට අනුව අවදිවන්නා වූද අනාදිමත් කාලයක් තිස්සේ සන්තානයෙහි ශක්තිමත් බවට පත්වූවද ථාමගත ක්ලේශයෝ සත් දෙනෙක් වූද ලෝභ - දේස - මෝහ - මාන - දිට්ඨි - විචිකිච්ඡා නම් වූ සයදෙනා අතුරෙන් ලෝභය තෙමේ කාම-භව නමින් දෙකක් බවට බෙදෙන හෙයින් අනුශය සත්දෙනා නම් වන්නාහ. ධර්මතා වශයෙන් වනාහි අනුශය සයක් වන්නාහ.

12. සූත්‍රාන්ත නය අභිධර්ම නය වශයෙන් දෙවැදෑරුම් වූ දශ සංයෝජනයෝ ධර්මතා වශයෙන් නවයක්ම වන්නාහ. නවවැදෑරුම් සංයෝජනයෝ නම් කවරේද යත්? ලෝභ- දේස - මෝහ- මාන - දිට්ඨි- ඉස්සා - මච්ඡරිය - උද්ධච්ච - විචිකිච්ඡා නම් වූ නවදෙනා වනාහි, සත්වයා උඩයට සරස දශ දිශාවේම සෑම අරමුණක් පාසා තදින් බැඳ තබන අර්ථයෙන් සංයෝජන නම් වන්නාහ.

13. ක්ලේශයෝ දශ දෙන නම් කවරේද යත්, සන්තානය තුල උපදින වාරයක් පාසා සන්තානය දවන- තවන-උපතාපනය කරන අර්ථයෙන් ක්ලේශ නම් වූ ලෝභ- දේස - මෝහ- මාන - දිට්ඨි - විචිකිච්චා - ථීන - උද්ධච්ච - අහිරික - අනොත්තප්ප නම් වූ දශදෙනා දශ ක්ලේශවස්තු නම් වන්නාහ. ඉස්සා - මච්ඡරිය - කුක්කුච්ච - මිද්ධ නම් වූ අවශේෂ අකුශල චෛතසිකයෝ සතර දෙනාද මෙහිලා ඇතුලත් වන්නාහ. ක්ලේශයෝ දශ දෙන වනාහි ප්‍රභේද වශයෙන් එක්දහස් පන්සියයක් බවට ද බෙදෙන්නාහ.

14. ආසවොඝා ච යොගාච - තයො ගන්ථා ච වත්ථුතො
උපාදනා දුවෙ වුත්තා - අට්ඨ නීවරණා සියුං
ඡළෙවානුසයා හොන්ති - නව සංයෝජනා මතා
කිලෙසා දස වුත්තොයං - නවධා පාප සංගහො

ආශ්‍රවයෝද ඕඝයෝ ද යෝගයෝද කායග්‍රන්ථයෝ ද පරමාර්ථ වස්තු ධර්මතා වශයෙන් තුනක් බැගින් කියන ලද්දහ. උපාදනයෝ දෙදෙනෙක්ද නීවරණයෝ අටදෙනෙක් ද

වන්නාහ. අනුශයෝ සයදෙනෙක් ඇත්තාහ. සංයෝජනයෝ නවයක් ද ක්ලේශයෝ දශ දෙනෙක් ද වන්නාහ.

**අකුශල සංග්‍රහය සමාප්තයි.**

## මිශ්‍රක සංග්‍රහය

15. අකුශල සංග්‍රහයට අනතුරුව මිශ්‍රක සංග්‍රහයෙහි වනාහි හේතුධර්ම සදෙනය, ධ්‍යානාංග ධර්ම සත්දෙනය, මාර්ගාංග ධර්ම දෙළොස් දෙනය, ඉන්ද්‍රිය ධර්ම දෙවිසි දෙනය, බලධර්ම නවදෙනය, අධිපති ධර්ම සතර දෙනය, ආහාර සතර දැයි සංග්‍රහය සත්වැදෑරුම් වන්නේය.

16. ඔවුනතුරෙන් හේතු ධර්ම සදෙන නම් කවරේද යත්, අරමුණෙහි ඇලීම ලක්‍ෂණ කොට ඇත්තාවූ ලෝභය ද, අරමුණෙහි ගැටීම ලක්‍ෂණ කොට ඇත්තා වූ ද්වේෂය ද, අරමුණෙහි මුලාවීම ලක්‍ෂණ කොට ඇත්තාවූ මෝහය ද අකුශල හේතු නම් වන්නාහ. අරමුණෙහි නොඇලීම ලක්‍ෂණ කොට ඇත්තාවූ අලෝභය ද, අරමුණෙහි නොගැටීම ලක්‍ෂණ කොට ඇත්තාවූ අද්වේෂයද, අරමුණෙහි මුලානොවීම ලක්‍ෂණ කොට ඇත්තාවූ අමෝහයද, කුශල - අව්‍යාකෘත හේතු නම් වන්නාහ. මෙසේ හේතු ධර්මයෝ සය දෙනෙක් වන්නාහ.

17. ධ්‍යානාංග ධර්ම සත්දෙන නම් කවරේද යත්, අරමුණට සිත නැංවීම ලක්‍ෂණ කොට ඇත්තාවූ, විතර්කයද, අරමුණේ සිත හැසිරවීම ලක්‍ෂණ කොට ඇත්තාවූ විචාරයද, අරමුණෙහි සිත පිනවීම ලක්‍ෂණ කොට ඇත්තාවූ ප්‍රීතියද, අරමුණෙහි සිත එකඟ කිරීම ලක්‍ෂණ කොට ඇත්තාවූ ඒකාග්‍රතාවද, මානසික සුවය නම් වූ සෝමනස්සයද මානසික අසාතය නම් වූ දෙමනස්සයද මැදහත් වින්දනය නම් වූ උපෙක්‍ෂාවද යන මේ ධර්මයෝ සත් දෙන ධ්‍යානාංග නම් වන්නාහ. මොවුනතුරෙන් දෝමනස්ස වනාහි පටිඝ සිත්හි පමණක් ලැබෙන්නේය. උපෙක්‍ෂාව උපෙක්ඛා සහගත සිත්හිද - ප්‍රීති සෝමනස්සයෝ දෙදෙන සෝමනස්ස සහගත සිත්හිද යෙදෙන්නාහ. විතක්ක - විචාර - එකග්ගතා තිදෙන ධයානාංග ලැබෙන සියලු චිත්තයන්හට සාධාරණ වන්නාහ.

18. මාර්ග්‍රංගයෝ දෙළොස් දෙන නම් කවරේද යත්, සම්මාදිට්ඨි - සම්මා සංකප්ප - සම්මා වාචා - සම්මා කම්මන්ත - සම්මා ආජීව - සම්මා වායාම - සම්මා සති - සම්මා සමාධි නම් වූ ලෞකික ලෝකෝත්තර සෝභන සිත්හි යෙදෙන්නා වූ මාර්ගාංග අට දෙනාද, මිච්ඡාදිට්ඨි මිච්ඡා සංකප්ප මිච්ඡා වායාම - මිච්ඡා සමාධි නම් වූ අකුශල සිත්හි යෙදෙන්නාවූ මාර්ගාංග සතර දෙනාද යන දෙළොස් දෙන වනාහි මාර්ගාංග දෙළොස නම් වන්නාහ.

19. දෙවිසි ඉන්ද්‍රිය ධර්මයෝ නම් කවරේදයත්, චක්ඛුන්ද්‍රිය - සෝතින්ද්‍රිය- ඝාණින්ද්‍රිය - ජිව්හින්ද්‍රිය - කායින්ද්‍රිය - ඉත්ථින්ද්‍රිය - පුරිසින්ද්‍රිය- ජීවිතින්ද්‍රිය - මනින්ද්‍රිය - සුඛින්ද්‍රිය - දුක්ඛින්ද්‍රිය - සෝමනස්සින්ද්‍රිය - දොමනස්සින්ද්‍රිය - උපෙක්ඛින්ද්‍රිය - සද්ධින්ද්‍රිය - විරියින්ද්‍රිය - සතින්ද්‍රිය - සමාධින්ද්‍රිය - පඤ්ඤින්ද්‍රිය - අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය - අඤ්ඤින්ද්‍රිය - අඤ්ඤාතාවින්ද්‍රිය ද නම් වූ දෙවිසිදෙන වනාහි ඉන්ද්‍රිය ධර්ම දෙවිසි දෙන නම් වන්නාහ.

20. ඉන්ද්‍රිය දෙවිසි දෙන අතුරෙන් සෝතාපත්ති මාර්ග ඥානය වනාහි අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය නම් වන්නේය. අරහත්තඵල ඥානය අඤ්ඤාතාවින්ද්‍රිය නම් ද වන්නේය. මැද ඥාන සය දෙන වනාහි අඤ්ඤින්ද්‍රිය නම් වන්නේය. ජීවිතින්ද්‍රිය ද රූප ජීවිතින්ද්‍රිය - අරූපජීවිතින්ද්‍රිය නමින් දෙවැදෑරුම් වන්නේය. දැකීම - ඇසීම ආදී තම තමාට නියමිත කෘත්‍යයන්හි ඉසුරුමත් බව නිමිති කොට ඉන්ද්‍රිය නම් වන්නාහ.

21. බලධර්මයෝ නව දෙන නම් කවරේදයත්? සද්ධා බලය - විරිය බලය - සතිබලය - සමාධි බලය පඤ්ඤාබලය - හිරිබලය - ඔත්තප්ප බලය - අහිරික බලය අනොත්තප්ප බලය ද නම් වූ නවදෙන වනාහි, තම තමාහට පටහැනි වූ විරුද්ධ ධර්මතාවන්ගෙන් කම්පා කළ නොහැකි බැවින් බලධර්ම නවදෙන නම් වන්නාහ.

22. අධිපති ධර්ම සතර දෙන නම් කවරේද යත්, ඡන්දාධිපති චිත්තාධිපති - විරියාධිපති - වීමංසාධිපති නම් වූ සතර දෙනා වනාහි සෑම කටයුත්තකදීම ප්‍රධානත්වය දරණ බැවින් අධිපති ධර්ම නම් වන්නාහ. ඉන්ද්‍රිය ධර්මයෝ වනාහි තමාගේ කෘත්‍යයෙහි පමණක් ප්‍රධානත්වය උසුලන බැවින් ප්‍රදේශාධිපති නම් වන්නාහ. ඡන්දාධිපති ආදී සතර දෙනා වනාහි සෑම තැනකදීම ප්‍රධානත්වය දරණ බැවින් සර්වත්‍රාධිපති නම් ද වන්නාහ.

23. සතර වැදෑරුම් ආහාරය නම් කවරේද යත්, කබලිංකාර ආහාරය ඵස්සාහාරය - මනෝසඤ්චේතනාහාරය - විඤ්ඤණාහාරය ද යන සතර දෙන වනාහි, කබලිංකාරාහාරය රූප උපදවන බැවින්ද, ඵස්සාහාරය - වේදනාව උපදවන බැවින්ද, මනෝසඤ්චේතනාහාරය ප්‍රතිසන්ධි උපදවන බැවින්ද, විඤ්ඤණාහාරය නාමරූප උපදවන බැවින්ද ආහාර නම් වන්නාහ.

24. අහේතුක සිත් අටළොසෙහි මාර්ගාංගයෝ නොලැබෙන්නාහ. විරිය නොයෙදෙන තෙලෙස් සිත්හි බලධර්මයෝද, දෙපස් විඤ්ඤණ සිත්හි ධ්‍යානාංගයෝද, විචිකිච්ඡා සහගත සිතෙහි ඒකග්ගතාව මාර්ග - ඉන්ද්‍රිය - බල ධර්ම වශයෙන් නොලැබෙන්නාහ. අධිපති ධර්මයෝ වනාහි ත්‍රිහේතුක ජවන්සිත් සූතිසෙහිද ද්විහේතුක ජවන් සිත් අටළොසෙහිද ලැබෙන්නාහ, සතරක් වූ අධිපති ධර්ම අතුරෙන් එකක්ම ප්‍රධාන වන අතර සෙසු අධිපති ධර්ම එයටම අනුවර්තනය වන්නාහ.

25. ඡහෙතු පඤ්ච ඣානංගා - මග්ගංගා නව වත්ථුතො
සොළසින්ද්‍රිය ධම්මා ච - බලධම්මා නවෙරිතා

චත්තාරො අධිපතී වුත්තා - තථාහාරාති සත්තධා
කුසලාදි සමාකිණ්ණො - වුත්තො මිස්සක සංගහො

පරමාර්ථ වස්තු ධර්ම වශයෙන් හේතු ධර්ම සදෙනෙකි. ධ්‍යානාංග පස් දෙනෙකි. මාර්ගාංග නව දෙනෙකි. ඉන්ද්‍රිය ධර්ම සොළසකි. බලධර්ම නවයකි. අධිපති සතර දෙනෙකි. ආහාර ද සතරකි. මෙසේ කුශල අකුශල විපාක ක්‍රියාවන්හි පැතිර පවත්නා වූ මිශ්‍රක සංග්‍රහය සත් වැදෑරුම් කොට කියන ලද්දේය.

26. ධ්‍යානාංග සත අතුරෙන් සොමනස්ස- දෙමනස්ස -උපෙක්ෂා තිදෙන වේදනා වශයෙන් එකක් කොට ගත් කල්හි ධ්‍යානාංග පස් දෙනෙකි. ඉන්ද්‍රිය ධර්ම දෙවිසි දෙන අතුරෙන් වේදනාඉන්ද්‍රිය පස් දෙන එකක් වශයෙන් ද, ප්‍රඥා ඉන්ද්‍රිය සතරදෙන එකක් වශයෙන් ද, ජීවිතේන්ද්‍රිය දෙකක් වශයෙන්ද ගත් කල්හි ඉන්ද්‍රිය ධර්මයෝද පරමාර්ථ වශයෙන් සොළොස් දෙනෙක් වන්නාහ. මාර්ගාංග දෙළස අතුරෙන් සංකප්ප දෙක එකක් වශයෙන් ද, වායාම දෙක එකක් වශයෙන්ද සමාධි දෙක එකක් වශයෙන්ද පරමාර්ථ වශයෙන් ලැබෙන බැවින් මාර්ගාංගයෝ නවදෙනෙක් වන්නාහ.

**මිශ්‍රක සංග්‍රහය සමාප්තයි.**

**ත්‍රිලක්ෂණ විදර්ශනාව**

1. අකුශල සංග්‍රහ මිශ්‍රක සංග්‍රහ විභාග විදර්ශනා භාවනාවේදී පහළ වූ චිත්ත චෛතසික භූතරූප උපාද රූප සංඛ්‍යාත නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහයෝ, ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝය.

2. ඇතිවීම් නැති වීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝය.

3. තම තමන් කැමති ලෙස නොපැවතී බැවින් අනාත්මයෝය.

4. මෙසේ අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ චිත්ත චෛතසික භූත රූප උපාදරූප යන මේ නාම රූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන සංඛත සන්තාප විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේය.

5. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව ආයූහන නිදාන සංයෝග පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේය.

6. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ විවේක අසංඛත අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකානත්යෙන් නිරෝධ සත්‍යය නම් වන්නේය.

7. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතුවූ ආර්ය අෂ්ටාංගික මාර්ගය නිය්‍යාන හේතු දස්සන ආධිපතෙය්‍යාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේය.

8. මාගේ භාවනාමය කුශලානිසංස ධර්මය මෙම චතුරාර්ය සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිසම හේතු වේවා වාසනා වේවා

සාධු. සාධු. සාධු.

පදවිවරණය

01. සමුච්චය - සම්පිණ්ඩනය කොට ගන්නා ලද රාශිය.

02. ආශ්‍රව - චිරකාලයක් පැසුණු අර්ථයෙන් අරිෂ්ඨ - ආසව වැනිනුයි ආශ්‍රව නම් වේ. අරමුණු වශයෙන් භවාග්‍රය තෙක්ද ධර්ම වශයෙන් ගෝත්‍රභූ චෝදන තෙක්ද ගලන බැවින් ආශ්‍රව නම් වන්නාහ.

03. ඕඝ - ගංගාවක වේගයෙන් ගසාගෙන යන සැඩ පහරට ඕඝ යයි කියනු ලැබේ. එවැනි ක්ලේහයෝ තිදෙනෙකි.

04. යෝග - කණුවක ගවයන් බඳින දැඩි වරපොටක් සේ, සත්වයන් සසර කණුවේ බැඳ තබන ක්ලේශධර්ම 3 කි.

05. ග්‍රන්ථ - නැවත නැවතත් ලිහිල් නොවන සේ දැඩිව බැඳ තබන ක්ලේශ ධර්ම තුනකි.

06. උපාදන - කිඹුලකු විසින් කටින් ගත් ගොදුරක් සේ අරමුණු කළ ගොදුර දැඩිව ගන්නා ක්ලේශ ධර්ම දෙකකි. :

07. නීවරණ - කුසල් සිත් වළක්වන සුගතිමග නිවන් මග අහුරන ක්ලේශ ධර්ම අට දෙනෙකි.

08. අනුශය - ලිං පතුලේ රැඳී තිබෙන රොල්මඩ, කැලතීමෙන් ලිදේ ජලය බොරවන්නා සේද, නිද සිටි නයකුට කැටයකින් ගැසූ විට වහා කිපී පෙණය පෙන්වන්නා සේද, අප්‍රහීන වශයෙන් සන්තානයෙහි පැවති සුදුසු අරමුණු ලැබුණ කෙණෙහි සමුදාචාර වශයෙන් සිතෙහි පහළවන්නාවූ ථාමගත ක්ලේශ සය දෙනෙකි.

9. සංයෝජන - සත්වයන් කාමභවයෙහි බැඳ තබන ඕරම්භාගිය නම්වූද රූප - අරූප භවයෙහි බැඳ තබන උද්ධම්භාගිය නම්වූද යදම් වැනි බැඳුම් සංයෝජන නම් වෙති. ක්ලේශයෝ නවදෙනෙකි.

10. ක්ලේශ වස්තු- එක්දහස් පන්සියයක් පමණ වූ. ප්‍රභේදගත ක්ලේශයන් සම්පිණ්ඩනය කොටගත් කල්හි ලැබෙනුයේ ක්ලේශ වස්තු දශයකි. ක්ලේශ යනු සන්තානය දවන තවන කෙලෙසන අර්ථයෙනි.

11. හේතු ධර්ම- අරමුණෙහි සිත තදින් බැසගන්නා මුදුන් මුල් සයකි.

12. ධ්‍යානාංග - අරමුණෙහි සිත කිදබස්වන ධර්මතා පසකි.

13. මාර්ගාංග - සුගතියට - දුගතියට - නිවනට පමුණුවන ධර්මතා නවයකි.

14. ඉන්ද්‍රිය - ස්වකීය කෘත්‍යයෙහි ඉසුරුමත් බව දරණ ධර්ම 16 කි.

15. බල - පටහැනි ධර්මයන් නිසා කම්පානොවෙන ධර්ම 9 කි.

16. අධිපති - චිත්ත චෛතසිකයන්ට නායකත්වය දරණ ධර්මතා සතරකි.

17. ආහාර - රූප - වේදනා - ප්‍රතිසන්ධිවිඤ්ඤාණ - නාමරූප උපදවන - ගෙනඑන ධර්මතා සතරකි.

**කොළඹ ශ්‍රී ලංකා ජාතික රෝහලේ වෛද්‍ය පුෂ්පා කරුණාසේකර මහත්මාව**

**අවිස්සාවේල්ල රෝහලේ වෛද්‍ය මහින්ද රත්න මහත්මා**

**පිළියන්දල මඩපාත පදිංචි එම්. ආර්. ඩී. පෙරේරා මෙනවිය**

යන මහත්ම මහත්මාවන් විසින්
සුවසේම ධර්මාවබෝධය
හා නිර්වාණාව බෝධය ලැබේවායි
උතුම් ප්‍රාර්ථනයෙන්
ධර්ම දානය පිණිස මුද්‍රණය කර බෙද දෙන ලදී.

නුගේගොඩ ගංගොඩවිල 37
සෝරත මාවතේ පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස්හි මුද්‍රණය කරවන ලදී.
රාජ්‍ය සේවා බෞද්ධ සංගමය
මහවැලි සංවර්ධන අමාත්‍යාංශය
500 ටී. බී. ජයා මාවත,
කොළඹ 10.
2544 පොසොන්. / 2000 ජුනි 04

# අභිධර්ම විපස්සනා භාවනා පාඩම අංක - 17

## අභිධර්මාර්ථ සංග්‍රහ - සමුච්චය සංග්‍රහය විභාගය 02

## අති පූජ්‍ය නා උයනේ අරිය ධම්ම නා හිමිපාණන් වහන්සේ විසින්

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!

01. මිශ්‍රක සංග්‍රහයට අනතුරුව ලැබෙන බෝධිපාක්ෂික සංග්‍රහය වනාහි සතිපට්ඨාන සතරය - සම්‍යප්‍රධාන සතරය - ඍද්ධිපාදධර්ම සතරය - ඉන්ද්‍රිය ධර්ම පස්දෙනය බලධර්ම පස්දෙනය - බෝජ්ඣංගධර්ම සත්දෙනය මාර්ගාංග ධර්ම අටදෙනායයි සත්වැදෑරුම් වන්නේය.

02. ඔවුනතුරෙන් සතිපට්ඨාන සතරදෙන නම් කවරේද යත්, කායානුපස්සනා සතිපට්ඨානය - වේදනානුපස්සනා සතිපට්ඨානය චිත්තානුපස්සනා සතිපට්ඨානය - ධම්මානුපස්සනා සතිපට්ඨානයයි සතර දෙනෙක් ඇත්තාහ. ඒ සතරදෙනා අතුරෙන් කායානුපස්සනා සතිපට්ඨානය ද, ආනාපාන සතිය - ඉරියපථ මනසිකාරය - චතුසම්පජඤ්ඤ මනසිකාරය - පටික්කූලමනසිකාරය - ධාතුමනසිකාරය සහ නවසීවථික මනසිකාර යයි තුදුස් වැදෑරුම් වන්නේය.

03. වේදනානුපස්සනාවද සුඛවේදනාවය - දුක්ඛ වේදනාවය - අදුක්ඛමසුඛ වේදනාවය - සාමිස සුඛ වේදනාවය - නිරාමිස සුඛ වේදනාවය - සාමිස දුක්ඛ වේදනාවය - නිරාමිස දුක්ඛ වේදනාවය - සාමිස අදුක්ඛමසුඛ වේදනාවය - නිරාමිස අදුක්ඛමසුඛ වේදනාව යයි වේදනාව අරමුණුවීම් වශයෙන් නවවැදෑරුම් වුවද අනුපස්සනා වශයෙන් එකම වේදනානුපස්සනාව නම් වන්නේය.

04. චිත්තානුපස්සනාවද සරාග චිත්තය - වීතරාග චිත්තය - සදෝස චිත්තය - වීතදෝස චිත්තය - සමෝහ චිත්තය - වීතමෝහ චිත්තය - සංඛිත්ත චිත්තය - වික්ඛිත්ත චිත්තය - මහග්ගත චිත්තය - අමහග්ගත චිත්තය - සමාහිත චිත්තය - අසමාහිත චිත්තය - සඋත්තර චිත්තය අනුත්තර චිත්තය - විමුත්ත චිත්තය - අවිමුත්ත චිත්තයයි චිත්තය අරමුණු වීම් වශයෙන් සොළොස් වැදෑරුම් වුවද අනුපස්සනා වශයෙන් වනාහි එකම චිත්තානුපස්සනාව නම් වන්නේය.

05. ධම්මානුපස්සනාවද නීවරණධර්ම විදර්ශනාවය පඤ්චස්කන්ධ විදර්ශනාවය - දෙළොස් ආයතන විදර්ශනාවය - සප්ත බොජ්ඣංග විදර්ශනාවය ආර්ය සත්‍ය විදර්ශනාවයයි පස්වැදෑරුම් වන්නේය.

06. පඤ්චස්කන්ධය සතරකට බෙද භාවනාවට අරමුණු කරගන්නා ආකාර වශයෙන් සතිපට්ඨානය සතරාකාර වන්නේය. රූපස්කන්ධය අරමුණු කිරීමේදී කායානුපස්සනාව ද, වේදනාස්කන්ධය අරමුණු කිරීමේදී වේදනානු පස්සනාව ද, විඤ්ඤාණස්කන්ධය අරමුණු කිරීමේදී චිත්තානුපස්සනාවද සඤ්ඤා - සංස්කාර ස්කන්ධ දෙක අරමුණු කිරීමේදී චිත්තානුපස්සනාවද සඤ්ඤා - සංස්කාර ස්කන්ධ දෙක අරමුණු කිරීමේදී ධම්මානුපස්සනාවද වැඩෙන්නේය.

07. තවද ශුභ වශයෙන් ගන්නාවූ රූප කයෙහි අශුභ ලක්ෂණය දැකීම පිණිස කායානුපස්සනාව ද, සැප වශයෙන් ගන්නා වූ වේදනාස්කන්ධයෙහි දුක්ඛ ලක්ෂණය දැකීම පිණිස වේදනානුපස්සනාව ද, නිත්‍ය වශයෙන් ගන්නා වූ විඤ්ඤාණයෙහි අනිත්‍ය ලක්ෂණය දැකීම පිණිස චිත්තානුපස්සනාවද, ආත්ම වශයෙන් ගන්නා වූ සඤ්ඤා- සංස්කාරයන්ගේ අනාත්ම ලක්ෂණය දැකීම පිණිස ධම්මානුපස්සනාව ද හේතු වන බැවින් එකක්ම වූ සම්මා සතිය සතිපට්ඨානය සතරක් කොට දේශනා කොට වදාරා ඇත්තේය.

08. සම්‍ය ප්‍රධාන වීර්යය සතර නම් කවරේද යත්, නුපන් පාපයන් නුපදවීමේ වීර්යද - උපන් පාපයන් ප්‍රහාණය කිරීමේ වීර්යයද - නුපන් කුශල් උපදවීමේ වීර්යයද - උපන් කුශල් වැඩි

දියුණු කිරීමේ වීර්යයදැයි ක්‍රියා කාරිත්වය අනුව එකක්ම වූ සම්මා ව්‍යායාමය සතරාකාර වන්නේය. වීර ස්වභාව ඇත්තා වූ වීර්යය වනාහි උත්සාහවන්ත බව ලක්‍ෂණ කොට ඇත්තේය. එකට උපදින චිත්ත චෛතසික ධර්මයන්හට රුකුල් දීම කෘත්‍ය රසය කොට ඇත්තේය. නොපසුබට බව වැටහීම් කොට ඇත්තේය. සංවේග වස්තු අට සහ විරියාරම්භ වස්තු ආසන්න කාරණය කොට ඇත්තේය. නුවණින් පටන් ගන්නා වීර්යය වනාහි ලෞකික ලෝකෝත්තර සියලු සම්පත් ගෙන දෙන්නේය.

09. ඍද්ධිපාද ධර්ම සතර නම් කවරේද යත්, ඡන්ද ඍද්ධිපාදය - විරිය ඍද්ධිපාදය - චිත්ත ඍද්ධිපාදය - වීමංසා ඍද්ධි පාදය දැයි ඍද්ධිපාදය සතර වැදෑරුම් වන්නේය. කත්තු කම්‍යතා ලක්‍ෂණ ඇත්තා වූ කුශලච්ඡන්දය ද, උත්සාහවන්තා ලක්ෂණ කුශල වීර්යයද, චිත්තනතා ලක්ෂණ, කුශල චිත්තයද අසම්මූළ්හතා ලක්ෂණ වීමංසාව ද, සිතූ පැතූ ලෞකික ලෝකෝත්තර ධාර්මික අභිමතාර්ථයන්, හෙවත් ධ්‍යාන - අභිඥ - සමාධි - සමාපත්ති - මාර්ග - ඵල නිර්වාණාවබෝධය තෙක් ප්‍රතිඵල නෙළාගැනීමට පාදක වන බැවින් පදනම් වන බැවින් ඍද්ධිපාද නම් වන්නාහ.

10. ඉන්ද්‍රිය ධර්ම පස නම් කවරේද යත්, සද්ධින්ද්‍රිය - විරියින්ද්‍රිය - සතින්ද්‍රිය සමාධින්ද්‍රිය - පඤ්ඤින්ද්‍රිය දැයි ඉන්ද්‍රිය ධර්ම පස්වැදෑරුම් වන්නේය. කුශල් අරමුණෙහි චිත්ත සන්තානය ප්‍රසාදයට පමුණුවන්නා වූ ඉසුරුමත් ශ්‍රද්ධාවද, කුශල් අරමුණෙහි චිත්ත සන්තානයට රුකුල් දීමේ ඉසුරුමත් වූ වීර්යය ද, කුශල් අරමුණෙහි සිහිපත් කිරීමේ ඉසුරුමත් වූ සතිය ද, කුශල් අරමුණෙහි චිත්ත සන්තානය එකඟ කිරීමේ ඉසුරුමත් වූ සමාධියද, කුශල් අරමුණෙහි අවබෝධය ගෙන දීමේ ඉසුරුමත් වූ ප්‍රඥව ද යන පස්දෙනා වනාහි තම තමාහට නියමිත කටයුත්තෙහි ප්‍රධානත්වය දරණ බැවින් - අධිපති බැවින් ඉන්ද්‍රිය ධර්ම නම් වන්නාහ. ඉහත නම් සඳහන් වූ ඍද්ධිපාද සතර දෙනා වනාහි සෑම කටයුත්තකදීම ප්‍රධාන වන බැවින් සබ්බත්ථාධිපති නම් වන්නාහ. මෙහි සඳහන් ඉන්ද්‍රිය ධර්ම පස්දෙනා තම තමාගේ කටයුත්තෙහි පමණක් අධිපති වන බැවින් ප්‍රදේශාධිපති නම් වන්නාහ.

11. බලධර්මයෝ පස් දෙනා නම් කවරහුද යත්, ශ්‍රද්ධා බලය - වීර්ය බලය සති බලය - සමාධි බලය - ප්‍රඥ බලය දැයි බලධර්මයෝ පස්වැදෑරුම් වන්නාහ. අශ්‍රද්ධාවෙන් හෙවත් කර්කශ ගතියකින් සෙලවිය නොහැකිවූ කම්පා නොවන්නා වූ බලවත් ශ්‍රද්ධාව ද - කුසීත ගතියෙන් යටනොවන බලවත් වීර්යයද - සිහිමුලා වීමෙකින් අමතක වීමක් නොවන්නා වූ බලවත් සතියද - උද්ධච්චයෙන් නො සන්සුන් නොවන්නා වූ බලවත් සමාධිය ද මෝහයෙන් අවිද්‍යාවෙන් යට නොවන ප්‍රඥාව ද, යන මේ පස්දෙනා වනාහි ප්‍රතිපක්ෂ උපක්ලේශයන්ගෙන් කම්පා නොවන අර්ථයෙන් බලධර්ම නම් වන්නාහ.

12. බොජ්ඣංග ධර්ම සත නම් කවරේද යත්, සතිසම්බොජ්ඣාංගය - ධම්මවිචය සම්බොජ්ඣාංය - විරිය සම්බොජ්ඣාංගය- ප්‍රීති සම්බොජ්ඣාංගය - පස්සද්ධි සම්බොජ්ඣාංගය - සමාධි සම්බොජ්ඣාංගය - උපෙක්ඛා සම්බොජ්ඣාංගය දැයි බොජ්ඣංග ධර්මය සත් වැදෑරුම් වන්නේය. ලෝකෝත්තර සතර මාර්ග ඥාන බෝධියට සහ - සතර ඵලඥාන බෝධියට පැමිණීම පිණිස ද - ශාන්ත නිර්වාණ ධාතු බෝධිය සාක්ෂාත් කරගැනීම පිණිසද - ත්‍රිවිද්‍යා - සවි අභිඥ - චතුපටිසම්භිද සර්වඥතා ඥාන ආදී, බෝධියට පැමිණීම පිණිසද අංග වශයෙන් උපකාර වන්නාවූ, සති-ධම්මවිචය- විරිය පීති පස්සද්ධි සමාධි - උපෙක්ඛා නම් වූ ධර්මතා සත වනාහි බොජ්ඣංග නම් වන්නාහ.

13. මාර්ගාංග ධර්ම අටදෙන නම් කවරේද යත්, සම්මාදිට්ඨි - සම්මා සංකප්ප - සම්මා වාචා - සම්මා කම්මන්ත - සම්මා ආජීව - සම්මා වායාම - සම්මා සති - සම්මා සමාධිය දැයි ආර්ය මාර්ගාංගයෝ අට වැදෑරුම් වන්නාහ. ලෞකික කුශල්සිත් සතලොසෙහි පහළ වන මාර්ගාංගයෝ අට දෙන සුගතිභූමි වෙත පමුණුවන බැවින් ද, ලෝකෝත්තර සිත් අටෙහි පහළවන මාර්ගාංගයෝ ලෝකෝත්තර නිවනට පමුණුවන බැවින් ද මාර්ගාංග නම් වන්නාහ.

ධර්මතා වශයෙන් වනාහි, ප්‍රඥව විතර්කය - සම්මා වාචා - සම්මා කම්මන්ත - සම්මා ආජීව නම් වූ විරතිත්‍රය - වීර්ය - සති - ඒකග්ගතාද නම් වූ ධර්මතා අට දෙන වනාහි මාර්ගාංග නම් වන්නාහ.

14. මාර්ගාංග අටදෙනා අතුරෙන් සම්මා සතිය වනාහි සතිපට්ඨාන නමින් යෙදෙන්නේය. සම්මා වායාමය ද සතර සම්‍යක් ප්‍රධාන නම් වන්නේය. තවද සම්මා දිට්ඨිය - සත්‍යතාව දැකීම, ලක්‍ෂණය කොට ඇත්තේය, සම්මා සංකප්පය - කුශල් අරමුණට නැංවීම ලක්ෂණ කොට ඇත්තේය. සම්මාවාචාව කුශල් අරමුණු එකතු කිරීම ලක්ෂණ කොට ඇත්තේය. සම්මා කම්මන්තය - කුශල් අරමුණු මතු කරවීම ලක්‍ෂණ කොට ඇත්තේය. සම්මා ආජීවය - පිරිසිදු බව ලක්‍ෂණ කොට ඇත්තේය. සම්මා වායාමය - කුශල් සිතට රුකුල් දීම ලක්‍ෂණ කොට ඇත්තේය. සම්මා සතිය - කුශල් අරමුණු සිහි ගැන්වීම ලක්‍ෂණ කොට ඇත්තේය. සම්මා සමාධිය - කුශල් අරමුණෙහි නොවිසිරෙන බව - එකඟ බව ලක්‍ෂණ කොට ඇත්තේය.

15. **ඡන්දෝ චිත්තමුපෙක්ඛා ච - සද්ධා පස්සද්ධි පීතියෝ**
**සම්මා දිට්ඨි ච සංකප්පෝ - වායාමෝ විරතිත්තයං**
**සම්මා සති සමාධීති - චුද්දසේ තේ සභාවතෝ**
**සත්තතිංසප්පභේදේන - සත්තධා තත්ථ සංගහෝ**

ඡන්දය - චිත්තය - තත්‍රමජ්ඣත්තුපෙක්ඛාය - සද්ධාය - පීතිය- පස්සද්ධිය සම්මාදිට්ඨිය - සම්මා සංකප්පය - සම්මා වායාමය - විරතිත්තය - සම්මාසති සම්මා සමාධිය - යන මේ පරමාර්ථ ධර්මයෝ තුදුස් දෙනෙකි. ප්‍රභේද වශයෙන් සත්තිසකි, එහි සංග්‍රහ සත් ආකාරයකි.

16. **සංකප්ප පස්සද්ධි ච පීතුපෙක්ඛා - ඡන්දෙව චිත්තං විරතිත්තයංච.**
**නවේකඨානා විරියං නවට්ඨ - සති සමාධී චතුපඤ්ච පඤ්ඤා**
**සද්ධා දුඨානුත්තම සත්තතිංස - ධම්මාන මේසෝ පවරෝ විභාගෝ.**
**සබ්බේ ලෝකුත්තරේ හොන්ති - නවා සංකප්ප පීතියෝ.**
**ලෝකියේපි යථා යෝගං - ඡබ්බිසුද්ධි ප්පවත්තියං**

17. සම්මා සංකප්පය ද පස්සද්ධි සම්බොජ්ඣාංගයද පීති සම්බොජ්ඣාංගයද උපෙක්ඛා සම්බොජ්ඣාංගයද ඡන්දිද්ධිපාදය ද චිත්තිද්ධිපාදය ද විරතිතුනද යන නවදෙන වනාහි කෘත්‍ය වශයෙන් එක එක ස්ථාන ඇත්තෝය. වීර්යය වනාහි කෘත්‍ය වශයෙන් ස්ථාන නවයක ඇත්තේය. සතියද ස්ථාන අටක ඇත්තේය, සමාධියද ස්ථාන සතරක ඇත්තේය. ප්‍රඥව ස්ථාන පසක ඇත්තේය. ශ්‍රද්ධාව ස්ථාන දෙකක ඇත්තේය. මේ වනාහි අත්‍යුත්තම සත්තිස් බෝධිපාක්ෂික ධර්මයන්ගේ සංග්‍රහයයි. ලෝකෝත්තර සිත්හි මේ සියලු ධර්මයෝ එකට යෙදෙන්නාහ. ධ්‍යාන වශයෙන් ලෝකෝත්තර ද්විතියධ්‍යානයේ සිට සම්මා සංකල්පයද චතුර්ථ- පඤ්චමධ්‍යානයන්හි ප්‍රීතියද නොලැබෙන්නේය. සීලවිසුද්ධි ආදී ලෞකික විසුද්ධි සයෙහිදීද මේ ධර්මයෝ සුදුසු පරිදි යෙදෙන්නාහ.

**බෝධිපාක්ෂික සංග්‍රහය සමාප්තයි.**

**සර්ව සංග්‍රහය**

18. බෝධිපාක්ෂික සංග්‍රහයට අනතුරුව සර්ව සංග්‍රහයෙහි වනාහි පඤ්චස්කන්ධය - පඤ්ච උපාදනස්කන්ධය - ද්වාදසායතනය - අට්ඨාරස ධාතුය - චතුරාර්ය සත්‍යය යනුවෙන් සංග්‍රය පස්වැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් පළමුවැනිවූ පඤ්චස්කන්ධය යනු රූපස්කන්ධය වේදනාස්කන්ධය - සංඥස්කන්ධය - සංස්කාරස්කන්ධය - විඥානස්කන්ධය යයි ස්කන්ධ සංග්‍රහය පස් වැදෑරුම් වන්නේය.

19. දෙවැනි වූ පඤ්ච උපාදනස්කන්ධය යනු රූපූපාදනස්කන්ධය වේදනූපාදනස්කන්ධය - සංඥ උපාදනස්කන්ධය - සංස්කාරූපාදනස් කන්ධය - විඥනූපාදනස්කන්ධය යයි පස් වැදෑරුම් වන්නේය.

20. තෙවැනි වූ දෙළොස් ආයතනයෝ කවරේද යත්, චක්ඛායතනය සෝතායතනය - ඝානායතනය - ජිව්හායතනය - කායායතනය - මනායතනය - රූපායතනය - සද්දයතනය - ගන්ධායතනය රසායතනය - ඵොට්ඨබ්බායතනය - ධම්මායතනයයි ආයතනයෝ දෙළොස් වැදෑරුම් වන්නාහ.

21. සතරවැනි වූ අෂ්ඨාරස ධාතුහු නම් කවරේද යත්, චක්ඛු ධාතු - සෝත ධාතු - ඝාන ධාතු - ජිව්හා ධාතු - කාය ධාතු - රූපධාතු - සද්ද ධාතු - ගන්ධ ධාතු - රසධාතු - ඵොට්ඨබ්බධාතු - චක්ඛුවිඤ්ඤාණ ධාතු - සෝතවිඤ්ඤාණධාතු - ඝාන විඤ්ඤාණ ධාතු - ජිව්හා විඤ්ඤාණ ධාතු - කාය විඤ්ඤාණ ධාතු මනෝධාතු - මනෝ විඤ්ඤාණ ධාතු - ධම්ම ධාතු යයි ධාතූන් අටළොස් වැදෑරුම් වන්නාහ.

22. පස්වැනි වූ චතුරාර්ය සත්‍යය නම් කවරේද යත්, දුක්ඛාර්ය සත්‍යය දුක්ඛ සමුදයාර්යසත්‍යය - දුක්ඛ නිරෝධාර්ය සත්‍යය - දුක්ඛනිරෝධ ගාමිණී ප්‍රතිපදර්ය සත්‍යය යයි ආර්ය සත්‍යය සතර වැදෑරුම් වන්නේය.

23. පඤ්ච ස්කන්ධය නම් කවරේද යත්, ආධ්‍යාත්මික වූද බාහිරවූද අතීතවූද අනාගත වූද වර්තමාන වූද ඖදරික වූද සූක්ෂමවූද හීනවූද ප්‍රණීතවූද දූරවූද සන්තිකවූ ද අටවිසි රූපය රාශි අර්ථයෙන් රූපස්කන්ධය නම් වන්නේය. එසේම එකොළොස් ආකාරයෙන් රාශීභූතවූ වේදනාව වේදනාස්කන්ධය නම් වන්නේය. එකොළොස් ආකාරයෙන් රාශි භූත වූ සංඥාව සංඥාස්කන්ධය නම් වන්නේය. එකොළොස් ආකාරයෙන් රාශි භූත වූ අවශේෂ සමපණස් චෛතසිකය සංස්කාරස්කන්ධය නම් වන්නේය. එකොළොස් ආකාරයෙන් රාශීභූත වූ එකූන් අනූ චිත්තය විඥානස්කන්ධය නම් වන්නේය. ලෝකෝත්තර නාමස්කන්ධත් ඇතුලත් කොට ගන්නා කල්හි පඤ්චස්කන්ධයයි ද, විදර්ශනාවට අරමුණු වශයෙන් ගන්නා කල්හි උපාදනයන්හට ගෝචර වන අර්ථයෙන් ලෞකිකධර්ම පඤ්ච උපාදනස්කන්ධයයි ද දෙයාකාරයෙන් බෙදන ලද්දේය.

24. දෙළොස් ආයතනයෝ නම් කවරේද යත්, ඒ ඒ ද්වාර - ආරම්මණයන්ට නියතවූ චිත්ත චෛතසිකයන් ගැටෙන - වෑයම් කරන ස්ථාන දෙළස ආයතන නම් වෙත්, තවද, ක්ෂණයක් පාසා උපදින සුළු වූ ඒ චිත්ත චෛතසිකයන් දිගුකල් පවත්වන - පතුරුවන ස්ථාන දෙළස ආයතන නම් වෙති. තවද, මතු මත්තෙහි සංසාර දුක්ඛයට පමුණුවන පවත්වන දෙළොස් දෙන ආයතන නම් වන්නාහ. තවද චිත්ත චෛතසිකයන් වාසය කරන ස්ථාන, මතුවන ආකර ස්ථාන, රැස්වෙන ස්ථාන, උපදින පහළවන ස්ථාන, හේතුව - කාරණය යන අර්ථයෙන්ද ආයතන නම් වන්නාහ.

25. අටළොස් ධාතූන් නම් කවරේද යත්, ස්වකීය ස්වභාවය දරණ බැවින්ද ධාතු නම් වෙති. අනේකප්‍රකාර සංසාර දුක්ඛය, බර උසුලන්නාන්සේ සත්වයන් ලවා උසුලාගෙන යනු ලබන බැවින්ද ධාතු නම් වෙති. ස්වකීය වසයෙහි නොපවත්නා බැවින් දුක්ඛ විධාන මාත්‍රයක්ම නුයි ද ධාතු නම් වෙති. සත්ත්වයන් විසින් සංසාර දුක්ඛය විඳුවන බැවින්ද ධාතු නම් වෙති. ලේ-මස් ආදී ශරීර අවයව මෙන්ද හිරියල් මනොසිලාදී ශෛල අවයව මෙන්ද සත්ව පුද්ගල නොවන බැවින් ද ධාතු නම් වන්නාහ.

26. චක්ඛායතනය - චක්ෂුප්‍රසාද රූපයයි, සෝතායතනය - සෝතප්‍රසාද රූපයයි, ඝානායතනය - ඝාන ප්‍රසාද රූපයයි, ජිව්හායතනය - ජිව්හාප්‍රසාද රූපයයි, කායායතනය - කායප්‍රසාද රූපයයි, මනායතනය - එකූන් අනූ චිත්තයයි. රූපායතනය - වර්ණ රූපයයි. සද්දයතනය - ශබ්ද රූපයයි, ගන්ධායතනය - ගන්ධරූපයයි, ඵොට්ඨබ්බායතනය - පඨවි තේජෝ වායෝ සංඛ්‍යාත ධාතුත්‍රයයි, ධම්මායතනය සූක්ෂම රූප සොළසද චෛතසික දෙපණසද නිර්වාණ ධාතුවද ධර්මායතනය නම් වන්නේය.

27. චක්ඛුධාතුව - චක්ෂුප්‍රසාද රූපයයි- සෝතධාතුව - සෝතප්‍රසාද රූපයයි. ඝාන ධාතුව ඝ්‍රාන ප්‍රසාද රූපයයි, ජිව්හා ධාතුව - ජිව්හාප්‍රසාද රූපයයි. කායධාතුව කාය ප්‍රසාද රූපයයි,

රූපධාතුව - වර්ණ රූපයයි, සද්දධාතුව - ශබ්දරූපයයි, ගන්ධ ධාතුව ගන්ධරූපයයි, රසධාතුව රස රූපයයි, ඵොට්ඨබ්බ ධාතුව - පඨවි තේජෝ වායෝ භූතරූපත්‍රයයි චක්ඛුවිඤ්ඤාණ ධාතුව චක්ඛුවිඤ්ඤාණ යුගලයයි, සෝත විඤ්ඤාණ ධාතුව - සෝත විඤ්ඤාණ යුගලයයි. ඝානවිඤ්ඤාණ ධාතුව - ඝානවිඤ්ඤාණ යුගලයයි, ජිව්හා විඤ්ඤාණ ධාතුව - ජිව්හා විඤ්ඤාණ යුගලයයි, කායවිඤ්ඤාණ ධාතුව - කායවිඤ්ඤාණ යුගලයයි. මනෝධාතුව - පඤ්චද්වාරවර්ජනය සහ සම්පටිච්ඡන යුගලයයි, මනෝවිඤ්ඤාණ ධාතුව - අවශේෂ සසැත්තෑ චිත්තයයි, ධම්මධාතුව - සොළොස් සුඛුම රූපය ද දෙපණස් චෛතසිකද නිර්වාණයද ධම්මධාතුව නම් වන්නේය.

28. චතුරාර්ය සත්‍යය නම් කවරේද යත්, නිර්දේශ වූ ආර්ය බවට පමුණුවන බැවින් ද ඒකාන්ත සත්‍ය බැවින් ද ආර්ය සත්‍ය නම් වන්නේය. මේ ආර්ය සත්‍ය සතර වනාහි මාර්ගස්ථ සතර දෙනාය - ඵලස්ථ සතරදෙනාය යන ආර්යයන් පහළ කරන්නාහ. සත්‍ය ප්‍රතිවේධයක් නොමැත්තේ නම්, ආර්යයන් ද නොමැත්තාහ. සත්‍ය ප්‍රතිවේධයක් ඇති කල්හිම ආර්යයන්ගේ පහළ වීමක් වන්නේය. දුක්ඛ සත්‍යයේ පීළන ලක්‍ෂණය ද, සමුදය සත්‍යයේ ආයූහන ලක්ෂණයද, නිරෝධ සත්‍යයේ නිස්සරණ ලක්ෂණයද මාර්ග සත්‍යයේ නිය්‍යාන ලක්ෂණය තථ-අවිතථ- අනඤ්ඤථ බැවින් ඒකාන්ත සත්‍ය නම් වන්නේය.

29. තවද, ආර්යයන් විසින්ම අවබෝධ කරනුලැබෙන බැවින් ද ආර්යසත්‍යය නම් වන්නේය. සම්මා සම්බුද්ධ නම් වූ ආර්යයන් වහන්සේ විසින් දේශනා කරන ලද හෙයින් ද ආර්ය සත්‍ය නම් වන්නේය. සංකිලිට්ඨ ඵලය - සංකිලිට්ඨ හේතුවය, අසංකිලිට්ඨ ඵලය - අසංකිලිට්ඨ හේතුවය යනුවෙන් දුක්ඛය සමුදය - නිරෝධය මාර්ගයයි ආර්ය සත්‍යය සතරවැදෑරුම් වන්නේය.

30. **රූපඤ්ච වේදනා සඤ්ඤා - සේසා චේතසිකා තථා,**
**විඤ්ඤාණ මිති පඤ්චේතේ - පඤ්චක්ඛන්ධාති භාසිතා**
**පඤ්චුපාදානක්ඛන්ධාති - තථා තේභූමකා මතා**
**භේදාභාවේන නිබ්බානං - ඛන්ධ සංගහ නිස්සටං**

රූපස්කන්ධයද වේදනාස්කන්ධයද සඤ්ඤාස්කන්ධයද අවශේෂ චෛතසික නම් වූ සංස්කාර ස්කන්ධයද විඤ්ඤාණස්කන්ධය දැයි මොවුහු පඤ්චස්කන්ධ යයි කියන ලද්දුහ. ඔවුනතුරෙන් ත්‍රෛභූමික පඤ්චස්කන්ධයම පඤ්චඋපාදානස්කන්ධයයි කියන ලද්දුහ. අතීතානාගත ආදී භේදයක් නොමැති බැවින් නිර්වාණ ධාතුව ස්කන්ධ සංග්‍රහයෙන් විනිර්මුක්ත නම් වන්නේය.

31. **ද්වාරාරම්මණ භේදේන - භවන්තායතනානිච**
**ද්වාරාලම්බ තදුප්පන්න - පරියායෙන ධාතුයෝ**
**දුක්ඛං තේභූමකං වට්ටං - තණ්හා සමුදයො භවේ**
**නිරෝධෝ නාම නිබ්බානං - මග්ගෝ ලෝකුත්තරෝ මතෝ**
**මග්ග යුත්තා ඵලං චේව - චතුසච්ච විනිස්සටා**
**ඉති පඤ්චප්පභේදේන - පවුත්තෝ සබ්බ සංගහෝ**

ද්වාර ආරම්මණ භේදයෙන් ආයතනයෝ දොළසක් වන්නාහ. ද්වාර ආලම්බණ සහ එයින් නිපන් චිත්තයන්ගේ වශයෙන් අටළොස් ධාතු කියන ලද්දුහ. ත්‍රෛභූමික වට්ටය දුක්ඛ සත්‍ය නම් වන්නේය. තෘෂ්ණාව  සමුදය සත්‍ය නම් වන්නේය. නිර්වාණය නිරෝධ සත්‍ය නම් වන්නේය, ලෝකෝත්තර මාර්ගය මාර්ග සත්‍ය නම් වන්නේය. සතර මාර්ග සිත්හි යෙදුනාවූ මාර්ගාංග හැර අවශේෂ සම්ප්‍රයුක්ත ධර්ම එකුන් තිසද, ඵලචිත්තෝත්පාද සත්තිසද සත්‍ය විනිර්මුක්ත නම් වන්නාහ. මෙතෙකින් සර්ව සංග්‍රහය ප්‍රභේද පසකින් කියන ලද්දේය.

**සර්ව සංග්‍රහය සමාප්තයි.**

**අභිධර්මාර්ථ සංග්‍රහයෙහි සමුච්චය සංග්‍රහ විභාගය නිමියේය.**

**ත්‍රිලක්ෂණ විදර්ශනාව**

1. බෝධිපාක්ෂික සංග්‍රහ - සර්වසංග්‍රහ විභාග භාවනාවේදී පහළ වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්මයෝ ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝය.
2. ඇතිවීම් නැති වීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝය.
3. තම තමන් කැමති ලෙස නොපැවතී බැවින් අනාත්මයෝය.
4. අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ නාම රූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන සංඛත සන්තාප විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේය.
5. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව ආයුහන නිදන සංයෝග පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේය.
6. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ විවේක අසංඛත අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකානත්යෙන් නිරෝධ සත්‍යය නම් වන්නේය.
7. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතුවූ ආර්ය අෂ්ටාංගික මාර්ගය නියාාන හේතු දස්සන ආධිපතෙය්‍යාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේය.
8. මාගේ භාවනාමය කුශලානිසංස ධර්මය මෙම චතුරාර්ය සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිසම හේතු වේවා වාසනා වේවා

සාධු. සාධු. සාධු.

පදවිවරණය

| | | |
|---|---|---|
| 01. | පඤ්චස්කන්ධය - | විදර්ශනා වඩන්නන් අතුරෙන් නාම සම්මුළ්හයන් සඳහා ස්කන්ධ පසක් දේශනා කරන ලදහ. නාම ධර්මය සතරක් කොට වදරණ ලද්දේ එහෙයිනි. අතීතාදී එකොළොස් ආකාරයෙන් සම්පිණ්ඩනය වන නාම - රූප ධර්ම රාශි අර්ථයෙන් ස්කන්ධ නමින් හැඳින් වෙති. නිර්වාණය එසේ අතීතාදී එකොළොස් ආකාරයෙන් නොබෙදෙන බැවින් ස්කන්ධ ගණයට නොවැටේ. |
| 02. | ද්වාදසායතන - | රූප සම්මුළ්හ යෝගාවචරයන් උදෙසා දෙළොස් ආයතන දේශනා කොට ඇත. රූපය එකොළොස් ආකාරයකින් වදරා ඇත්තේ එහෙයිනි. |
| 03. | අට්ඨාරස ධාතු - | නාමරූප දෙකම ගැන උභය සම්මුළ්හ යෝගාවචරයන් උදෙසා අටළොස් ධාතු දේශනා කරන ලද්දහ. රූපය ධාතු කොටස් දසයකුත් අඩක්ද, නාමය ධාතු කොටස් සතකුත් අඩක්ද කොට දේශනා කරනලද්දේ එහෙයිනි. |
| 04. | ආර්යසත්‍යය - | ආර්ය බවට පමණුවන සත්‍ය බැවින්ද, ආර්යයන් විසින්ම ප්‍රතිවේධ කෙරෙන බැවින්ද, සර්වඥ ආර්යයන් වහන්සේ විසින් දේශිත බැවින්ද ආර්ය සත්‍ය නම් වන්නේය. |
| 05. | තථ - | ඒකාන්තයෙන්ම සත්‍යයක්ය යන අර්ථය කියවේ. |
| 06. | අවිතථ - | මුසාවක් නොවන්නේමය යන අර්ථය කියවේ. : |
| 07. | අනඤ්ඤථ - | අන් සත්‍යයක්ද නොවන්නේමය යන අර්ථය කියවේ. |
| 08. | සංකිලිට්ඨඵල - | කෙලෙසුන්ට අරමුණු වන බැවින්ද තෘෂ්ණාවේ ප්‍රතිඵලයක් බැවින්ද දුක්ඛසත්‍යය සංකිලිට්ඨඵලයයි. |
| 9. | අසංකිලිට්ඨඵල- | කෙලෙසුන්ට අරමුණු නොවන බැවින් ද, සතරමාර්ගයට අරමුණුවන ඵලය බැවින්ද නිර්වාණය අසංකිලිට්ඨ ඵලය නම් වේ. |
| 10. | බෝධි පාක්ෂික - | සතරමාර්ගයද - සතරඵලයද - නිර්වාණයද සර්වඥතා ඥානයද බෝධි නම් වෙයි. මාර්ග ඵල ප්‍රතිලාභ කරන ආර්යයෝද බෝධි නම් වෙති. ඒ සියලු බෝධි අර්ථයන් සාක්‍ෂාත් කිරීමෙහි ලා විශේෂයෙන් උපකාරක ධර්ම රාශිය බෝධිපාක්‍ෂික නම් වන්නේය. |


**මහරගම පමුනුව පාරේ අංක 117 හි පදිංචි වී සිට**

**වර්ෂ එකොළසකට පෙර පරලෝ සැපත්**

**බී. එස් රණසිංහ මහත්මානන්ට පිං පිණිස**

**සෝමා රණසිංහ මහත්මාව විසින් ධර්ම දානය සඳහා මුද්‍රණය කර බෙද දෙන ලදී.**

**නුගේගොඩ ගංගොඩවිල 37**
**සෝරත මාවතේ පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස්හි මුද්‍රණය කරවන ලදී.**

**රාජ්‍ය සේවා බෞද්ධ සංගමය**
**මහවැලි සංවර්ධන අමාත්‍යාංශය**
**500 ටී. බී. ජයා මාවත, කොළඹ 10.**
**2544 ඇසළ / 2000 ජූලි 05**

## අභිධර්ම විපස්සනා භාවනා පාඩම අංක - 18

## අභිධර්මාර්ථ සංග්‍රහ - ප්‍රත්‍ය සංග්‍රහය විභාගය 01

## අති පූජ්‍ය නා උයනේ අරිය ධම්ම නා හිමිපාණන් වහන්සේ විසින්

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!

01. යේසං සංඛත ධම්මානං - යේ ධම්මා පච්චයා යථා
    තං විභාග මිහේදනි - පවක්ඛාමි යථාරහං

    සංඛත නම් වූ හේතුවෙන් හටගැනෙන යම් යම් සංස්කාරයකට යමක් යමක් හේතුවෙත්ද, දැන් මෙතැන් සිට ඒ හේතු නම් වූ ප්‍රත්‍යයන්ගේ විභාගය සුදුසු පරිදි කියන්නෙමි.

02. ප්‍රත්‍ය සංග්‍රහ විභාගය වනාහි පටිච්චසමුප්පාදනය, පට්ඨානනය නමින් දෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් පටිච්ච සමුප්පාද නය වනාහි මේ හේතුව ඇති කල්හි මේ ඵලය වන්නේයයි හේතුඵල සම්බන්ධ මාත්‍රය අනුව ලැබෙන්නේය. පට්ඨාන නය වනාහි ක්‍ෂණයක් පාසා ඒ ඒ ඵලධර්මයන්ට ප්‍රත්‍ය වන්නා වූ ප්‍රත්‍ය ශක්තිය අනුව ලැබෙන්නේය. මේ දෙයාකාර වූම ප්‍රත්‍ය විභාගය සම්බන්ධ කොට ආචාර්යයන් වහන්සේලා විස්තර කරන්නාහ.

03. ප්‍රත්‍ය සංග්‍රහ විභාග දෙක අතුරෙන් පටිච්චසමුප්පාද නය කෙසේද යත්, අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාරයෝ හටගන්නාහ. සංස්කාර ප්‍රත්‍යයෙන් විඤ්ඤාණය හටගන්නේය. විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් නාමරූපය හටගන්නේය. නාමරූප ප්‍රත්‍යයෙන් සළායතනය හටගන්නේය. සළායතන ප්‍රත්‍යයෙන් ඵස්සය හටගන්නේය. ඵස්ස ප්‍රත්‍යයෙන් වේදනාව හටගන්නේය, වේදනා ප්‍රත්‍යයෙන් තණ්හාව හටගන්නේය. තණ්හා ප්‍රත්‍යයෙන් උපාදනය හටගන්නේය. උපාදන ප්‍රත්‍යයෙන් භවය හටගන්නේය. භව ප්‍රත්‍යයෙන් ජාතිය වන්නේය. ජාති ප්‍රත්‍යයෙන් ජරාමරණයද සෝකය- පරිදේවය -දුක්ඛය - දෝමනස්සය උපායාසයද හටගන්නාහ. මෙසේ මේ දුක්ඛ රාශියගේ හටගැනීම සිදුවන්නේය, යනු මේ වනාහි පටිච්ච සමුප්පාද නය නම් වන්නේය.

04. ඒ පටිච්චසමුප්පාද නය ක්‍රමයෙහි වනාහි, (තයෝ අද්ධා) කාලතුනද, (ද්වාදසංගානි) අංග දෙළසද, (වීසතාකාරා) ආකාර විස්සද, (තිසන්ධි) සන්ධි තුනද, (චතුසංඛෙපා) කොටස් සතරද, (තීණි වට්ටානි) වට්ටතුනද, (ද්වේමූලානි) මුල් දෙකද, යන මේ සත් ආකාර විභාගය දත යුතු වන්නේය.

05. ඔවුනතුරෙන් (තයෝ අද්ධා) කාල තුන නම් කවරේද යත්, අවිජ්ජා-සංඛාර දෙක අතීත කාලයට අයත් වන්නාහ. ජාති - ජරාමරණ දෙක අනාගත කාලයට අයත් වන්නාහ. ඒ දෙක අතරමැද වූ විඤ්ඤාණ නාමරූප- සළායතන-ඵස්ස-වේදනා-තණ්හා-උපාදන- භව නම් වූ අට දෙනා වර්තමාන කාලයට අයත් වන්නාහ. මෙසේ කාලතුන දත යුතු වන්නේය.

06. (ද්වාදසංගානි) අංග දෙළස නම් කවරේද යත්, 1. අවිජ්ජා, 2. සංඛාර, 3. විඤ්ඤාණ, 4. නාමරූප, 5. සළායතන, 6. ඵස්ස, 7. වේදනා, 8. තණ්හා, 9, උපාදන, 10. භව, 11. ජාති, 12. ජරා මරණ යනු අංග දෙළස නම් වන්නාහ. සෝක පරිදේව දුක්ඛ දෝමනස්ස උපායාසයෝ වනාහි ජාති හේතුවෙන් ජරාමරණ අනුව ගලාගෙන එන නිස්සන්ද ඵල දැක්වීම පිණිස කියන ලද්දහ.

07. (වීසතාකාරා- තිසන්ධි- චතුසංඛේපා) ආකාර විස්සද සන්ධි තුනද කොටස් සතරද කෙසේ වන්නාහුද යත්, අතීත කාලයට අයත් වන්නා වූ අවිජ්ජා- සංඛාර දෙකට සම්ප්‍රයුක්ත වන බැවින් තණ්හා - උපාදන කර්ම භව තුනද එක් වන්නාහ. ඒ වනාහි අතීත හේතු පස් දෙනා බව දත යුතු වන්නාහ.

08. වර්තමාන කාලයට අයත් වන්නා වූ තණ්හා - උපාදාන කර්මභව තුනට, සම්ප්‍රයුක්ත වන්නා වූ අවිජා-සංඛාර දෙක ද සමඟ වර්තමාන හේතු පස් දෙනා දතයුතු වන්නාහ. එසේම අනාගත කාලයට අයත් වන්නාවූ ජාති- ජරාමරණ දෙක විඤ්ඤාණ- නාමරූප- සළායතන - ඵස්ස- වේදනා නම් වූ ඵල පඤ්චකයම වන්නේය.

09. අතීතේ හේතවෝ පඤ්ච - ඉදනි ඵල පඤ්චකං
ඉදනි හේතවෝ පඤ්ච - ආයතිං ඵල පඤ්චකං

අවිජ්ජා- සංඛාර - තණ්හා-උපාදාන- කර්මභව යන පස්දෙනා අතීත හේතු පඤ්චකය නම් වන්නේය. විඤ්ඤාණ - නාමරූප සළායතන- ඵස්ස- වේදනා පස්දෙන වර්තමාන ඵලපඤ්චකය නම් වන්නේය. තණ්හා - උපාදාන- කර්මභව අවිජ්ජා - සංඛාර පස් දෙන වර්තමාන හේතු පඤ්චකය නම් වන්නේය. විඤ්ඤාණ - නාමරූප- සළායතන- ඵස්ස- වේදනා පස් දෙන අනාගත ඵල පඤ්චකය නම් වන්නේය. වර්තමාන වූද අනාගත වූද ඵල පඤ්චකයටම උප්පත්තිභව ජාති- ජරාමරණ ඇතුලත් වන්නාහ.

10. අතීත හේතු පඤ්චකය ද, වර්තමාන ඵල පඤ්චකයද, වර්තමාන හේතු පඤ්චකයද, අනාගත ඵල පඤ්චකයද එකතුවෙන් ආකාර විස්ස සපිරෙන්නේය. අතීත සංඛාර හේතුවත් වර්තමාන විඤ්ඤාණ ඵලයත් අතර හේතුඵල එක් සන්ධියකි. වර්තමාන වේදනා ඵලයත් වර්තමාන තණ්හා හේතුවත් අතර එක් ඵලහේතු සන්ධියකි වර්තමාන කර්ම භව හේතුවත් අනාගත ජාති විඤ්ඤාණ ඵලයත් අතර එක් හේතුඵල සන්ධියකි. මෙසේ සන්ධි තුන සපිරෙන්නේය. අතීත හේතු පඤ්චකය වර්තමාන ඵල- හේතු පඤ්චක දෙකය. අනාගත ඵල පඤ්චකයද නමින් කොටස් සතරද සපිරෙන්නේය.

11. වට්ට තුන නම් කවරේද යත්, කිලේස වට්ටය- කර්ම වට්ටය විපාක වට්ටයයි වට්ටය තෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් අවිජ්ජා- තණ්හා - උපාදාන තුන වනාහි කිලේස වට්ටය නම් වන්නේය. සංඛාර -කර්මභව දෙක වනාහි කර්ම වට්ටය නම් වන්නේය. විඤ්ඤාණ - නාමරූප - සළායතන- ඵස්ස- වේදනා - උපපත්ති භව - ජාති - ජරාමරණාදිය විපාකවට්ට නම් වන්නේය. (ද්වේ මූලානි) මුල් දෙක නම් කවරේද යත්, අතීත හේතු අතරෙන් අවිජ්ජාවත්, වර්තමාන හේතු අතරෙන් තණ්හාවත්, අපාගාමී කර්මයන්ට අවිජ්ජාවත් සුගති ගාමී කර්මයන්ට තණ්හාවත් මුල්වන බැවින් අවිජ්ජා තණ්හා දෙක පටිච්චසමුප්පාදයේ මුල් දෙක නම් විනාහ.

12. තේසමේව ච මූලානං - නිරෝධේන නිරුජ්ඣති
ජරාමරණ මුච්ඡාය - පීළිතාන මභිණ්හ සෝ,
ආසවානං සමුප්පාද - අවිජ්ජා ච පවත්තති

වට්ට මාබන්ධ මිච්චේවං - තේ භූමක මනාදිකං
පටිච්ච සමුප්පාදෝති - පට්ඨපේසි මහා මුනි

ඒ අවිජ්ජා- තණ්හා මූලයන් නිරුද්ධ වීමෙන්ම හේතුඵල සියල්ල නිරුද්ධ වෙන්නේය. නිරන්තරයෙන් ජරා මරණාදි මූර්ජාවෙන් පීඩිත වූවන්ට, ආශ්‍රව හීටගැනීමෙන් අවිජ්ජාවද නැවත නැවත පවත්නේය. මෙසේ අනාදිමත් කාලයක් තිස්සේ කාම-රූප-අරූප නම් වූ භවත්‍රයෙහි බැඳී පවත්නා වූ ක්ලේශ වට්ට- කර්ම වට්ට- විපාක වට්ට නම් වූ ත්‍රිවිධ වට්ටය වනාහි පටිච්චසමුප්පාදය නමැයි මහා මුනිද්‍රයන් වහන්සේ දේශනා කල සේක.

13. අවිජ්ජාව නම් කවරේද යත්, දුක නොදැනීම - සමුදය නොදනීම නිරෝධය නොදනීම - මාර්ගය නොදනීම- අතීතය නොදනීම අනාගතය නොදනීම - අතීතානාගත උභයාන්තය නොදනීම පටිච්ච සමුප්පාදය නොදනීම කුශල් අකුශල් නොදනීම - මෙලොව පරලොව නොදනීම - කර්මය - විපාකය නොදනීම - කළයුතු නොකළයුතු දේ නොදනීම - තෙරුවන් නොදනීම- කළ ගුණ නොදනීම, කරණීය අකරණීය ධර්ම නොදනීම. මංගල

පරාභව ධර්ම නොදනීම, නාමරූප - ස්කන්ධ- ආයතන - ධාතු - ඉන්ද්‍රිය - සත්‍ය - ප්‍රත්‍ය ධර්මයන් නොදනීමද අවිද්‍යාව නම් වන්නේය.

14. (අඤ්ඤාණ ලක්ඛණා අවිජ්ජා) අවිද්‍යාව වනාහි අඥානබව- නොදැනීම ලක්ෂණය කොට ඇත්තීය. (සම්මෝහන රසා) අතිශයින් මුළා වන බව කෘත්‍ය රසය කොට ඇත්තීය. (ඡාදන පච්චුපට්ඨානා) අරමුණෙහි යථා ස්වභාවය වසන බව - මුවහ කරන බව වැටහීම් කොට ඇත්තීය. (ආසව පදට්ඨානා) කාමාශ්‍රව භවාශ්‍රව- දිට්ඨාශ්‍රව - අවිද්‍යාශ්‍රව ආසන්න කාරණය කොට ඇත්තීය. පරමාර්ථ වශයෙන් මෝහ චෛතසිකය වන්නේය.

15. සංඛාර නම් කවරේද යත්, ලෝභමූල අකුශල චේතනා අටද දෝසමූල අකුශල චේතනා දෙකද, මෝහ මූල අකුශලචේතනා දෙකද, කාමාවචර මහාකුශල චේතනා අටද, රූපාවචර ධ්‍යානකුශල චේතනා පසද අරූපාවචර ධ්‍යාන කුශල චේතනා සතරද, යන චේතනා එකුන් තිස් දෙන සංඛාර නම් වන්නාහ. පුඤ්ඤාභි සංඛාර 13, තෙළෙසද අපුඤ්ඤාභි සංඛාර 12 දෙළසද ආනෙඤ්ජාභි සංඛාර 4 සතරද මේ එකුන් තිස් චේතනාවෝම වන්නාහ.

16. (අභිසංඛරණ ලක්ඛණා සංඛාරා) සංස්කාරයෝ කුශලා කුශල චිත්ත චෛතසිකයන් සකස් කරවීම ලක්ෂණ කොට ඇත්තෝය. (ආයූහන රසා) කර්ම රැස්කිරීම කෘත්‍ය රසය කොට ඇත්තෝය. (චේතනා පච්චුපට්ඨානා) චේතනාව වැටහීම් කොට ඇත්තෝය. (අවිජ්ජා පදට්ඨානා) අවිද්‍යාව ආසන්න හේතුව කොට ඇත්තෝය. පරමාර්ථ වශයෙන් චේතනා චෛතසිකයම වන්නේය.

17. විඤ්ඤාණය නම් කවරේද යත්, සුගති - දුගති අහේතුක ප්‍රතිසන්ධි සිත් දෙකද, සහේතුක කාම ප්‍රතිසන්ධි සිත් අටද මහග්ගත ප්‍රතිසන්ධි විපාක සිත් නවයද, සංස්කාර ප්‍රත්‍යයෙන් ලැබෙන්නා වූ එකුන්විසි ප්‍රතිසන්ධි විපාක සිත විඤ්ඤාණය නම් වන්නේය.

18. (විජානන ලක්ඛණං විඤ්ඤාණං) විඤ්ඤාණය වනාහි කර්ම- කර්මනිමිත්ත ගතිනිමිත්ත නම් වූ අරමුණ දැනගැනීම ලක්ෂණ කොට ඇත්තේය. (පුබ්බංගම රසං) චෛතසික නම් වූ නාම ධර්මයන්ට පූර්වාංගම වීම කෘත්‍ය රසය කොට ඇත්තේය. (පටිසන්ධි පච්චුපට්ඨානං) අතීත භවය සහ වර්තමාන භවය ගැලපීමේ ප්‍රතිසන්ධිය වැටහීම් කොට ඇත්තේය. (සංඛාර - පදට්ඨානං - වත්ථාරම්මණ පදට්ඨානං වා) සංස්කාර හෝ සහජාත හෘදය වස්තුව සහ කර්ම - කර්මනිමිති - ගතිනිමිති අරමුණ හෝ ආසන්නතම හේතුව කොට ඇත්තේය.

19. නාමය නම් කවරේද යත්, ප්‍රතිසන්ධි විපාක සිත් එකුන් විස්සෙහි සම්ප්‍රයුක්ත වන්නා වූ විපාක චෛතසික ධර්ම සියල්ල නාමය නම් වන්නේය. අහේතුක ප්‍රතිසන්ධි යුගලෙහි නාම ධර්ම 10 බැගින් ද, සහේතුක කාමප්‍රතිසන්ධි අතුරෙන් පළමු යුගලයෙහි 33 බැගින්ද, දෙවැනි යුගලෙහි 32 - බැගින්ද, තෙවැනි යුගලෙහි 32 බැගින්ද, සතරවැනි යුගලෙහි 31 බැගින්ද, රූපාවචර ප්‍රථම ධ්‍යානවිපාකයෙහි 33-34-35- බැගින්ද ද්විතිය ධ්‍යානවිපාකයෙහි 32-33-34- බැගින්ද, තෘතිය ධ්‍යාන විපාකයෙහි 31-32-33 බැගින්ද, චතුර්ථ ධ්‍යාන විපාකයෙහි - 30-31-32- බැගින් ද, පඤ්චම ධ්‍යාන විපාකයෙහි ද අරූප විපාක සතරෙහිද 30, බැගින් ද යෙදෙන චෛතසික ධර්ම සියල්ල නාමය නම් වන්නේය.

20. (නාමං නමන ලක්ඛණං) නාමය සිතට හා අරමුණට නැමෙන බව ලක්ෂණ කොට ඇත්තේය. (සම්පයෝග රසං) සිත සමඟ සම්ප්‍රයුක්ත වීම කෘත්‍ය රසය කොට ඇත්තේය. (අවිනිබ්භෝග පච්චුපට්ඨානං) චිත්තයෙන් සහ ඔවුනොවුන්ගෙන් ඉවත් නොවන බව නම් වූ අවිනිර්භෝගය වැටිහීම් කොට ඇත්තේය. (විඤ්ඤාණ පදට්ඨානං) ප්‍රතිසන්ධි විඥානය ආසන්න හේතුව කොට ඇත්තේය.

21. රූපය නම් කවරේද යත්, ශීතෝෂ්ණාදි විවිධ විරුද්ධ ප්‍රත්‍යයන් නිසා විකාර වන-

වෙනස්වන සුළු පරමාර්ථ ධර්මය රූප නම් වන්නේය. ප්‍රතිසන්ධ ක්ෂණයේ දී අණ්ඩජ- ජලාබුජ සත්වයන්හට ලැබෙන්නාවූ රූප කලාප දශක තුනද, සංසේදජ- ඕපපාතිකයන්ට ලැබෙන්නා වූ සියලු කර්මජ රූපද ප්‍රතිසන්ධි රූප නම් වන්නේය.

22. (රුප්පන ලක්ඛණං රූපං) රූපය, ශීතෝෂ්ණාදියෙන් රුප්පනය වෙනස්වීම ලක්ෂණ කොට ඇත්තේය. (විකිරණ රසං - සම්පයෝගා භාවතො) චිත්ත චෛතසිකයන් සමඟමිශ්‍රවීමක් නොවීම කෘත්‍ය රසය කොට ඇත්තේය. (අබ්‍යාකත පච්චුපට්ඨානං- අනාරම්මණත්තා වා) අරමුණු නොගන්නා බැවින් අව්‍යාකෘත බව වැටහීම් කොට ඇත්තේය. (විඤ්ඤාණ පදට්ඨානං) ප්‍රතිසන්ධි විඥනය ආසන්න හේතුව කොට ඇත්තේය.

23. සළායතනය නම් කවරේද යත්, චක්ෂු ප්‍රසාදය- සෝත ප්‍රසාදය ඝාන ප්‍රසාදය -ජිව්හා ප්‍රසාදය - කාය ප්‍රසාදය - ප්‍රතිසන්ධි - ප්‍රවෘත්ති විඥනයද චිත්ත චෛතසිකයන් උපදින වස්තු ද්වාර වන බැවින් සළායතනය නම් වන්නේය. (ආයතන ලක්ඛණං සළායතනං) සළායතනය වනාහි ආයතන බව ලක්ෂණ කොට ඇත්තේය. (දස්සනාදී රසං) දැකීම - ඇසීම ආදිය කෘත්‍ය රසය කොට ඇත්තේය. (වත්ථුද්වාරභාව පච්චුපට්ඨානං) සඩ් වස්තු සඩ්ද්වාර බව වැටහීම් කොට ඇත්තේය. (නාම රූප පදට්ඨානං) නාම රූපය ආසන්න හේතුව කොට ඇත්තේය.

24. ඵස්සය නම් කවරේද යත්, චක්ඛු සම්ඵස්ස- සෝතසම්ඵස්ස ඝාණ සම්ඵස්ස- ජිව්හා සම්ඵස්ස - කායසම්ඵස්ස- මනෝ සම්ඵස්ස යනුවෙන් දෙරටු අනුව සවැදෑරුම් වන ඵස්ස චෛතසිකය ඵස්සය නම් වන්නේය. (ඵුසන ලක්ඛණො ඵසෙසා) ඵස්සය පුසන ලක්ෂණය ඇත්තේය. (සංඝට්ඨන රසො) වස්තු-ආරම්මණයන් විඤ්ඤාණයට හමුකරවීම කෘත්‍ය රසය කොට ඇත්තේය. (සංඝති පච්චුපට්ඨානො) අරමුණත් චිත්ත චෛතසිකත් එකතු කරවන බව වැටහීම් කොට ඇත්තේය. (සළායතන පදට්ඨානො) සළායතනය ආසන්න කාරණය කොට ඇත්තේය.

25. වේදනාව නම් කවරේද යත්, චක්ඛුසම්ඵස්සජා වේදනා - සෝතසම්ඵස්සජා වේදනා - ඝාන සම්ඵස්සජා වේදනා- ජිව්හාසම්ඵස්සජා වේදනා කායසම්ඵස්සජා වේදනා - මනෝසම්ඵස්සජා වේදනා නම් වූ සදෙරෙහි ලැබෙන්නා වූ සුඛ-දුක්ඛ- උපෙක්ඛාව වේදනාව නම් වන්නේය. (අනුභවන ලක්ඛණා වේදනා) වේදනාව අරමුණු රස අනුභවය ලක්ෂණ කොට ඇත්තිය. (විසය රස සම්භෝග රසා) විසය රස විදීම කෘත්‍යරසය කොට ඇත්තීය. (සුඛ දුක්ඛ පච්චුපට්ඨානා) සැප හා දුක වැටහීම් කොට ඇත්තීය. (ඵස්ස පදට්ඨානා) ස්පර්ශය ආසන්න හේතුව කොට ඇත්තිය.

26. තණ්හාව නම් කවරීද යත්, රූප තණ්හා - සද්ද තණ්හා - ගන්ධ තණ්හා - රසතණ්හා - පොට්ඨබ්බ තණ්හා - ධම්ම තණ්හා නමින් සදෙරින් ගන්නා වූ අරමුණු අනුව සවැදෑරුම් වූද කාම තණ්හා භවතණ්හා - විභව තණ්හා නම්වූද ලෝභය තණ්හාව නම් වන්නීය. (හේතු ලක්ඛණා තණ්හා) තණ්හාව වනාහි දුකට හේතු බව ලක්ෂණ කොට ඇත්තීය. (අභිනන්දන රසා) අරමුණු කෙරෙහි ආශාවෙන් සතුටුවීම කෘත්‍ය රසය කොට ඇත්තිය. (අතිත්තාභාව පච්චුපට්ඨානා) තෘප්තිමත් නොවීම වැටහීම් කොට ඇත්තීය. (වේදනා පදට්ඨානා) වේදනාව ආසන්න හේතුව කොට ඇත්තිය.

27. උපාදනය නම් කවරේද යත්, කාමුපාදන - දිට්ඨුපාදන- සීලබ්බතුපාදන - අත්තවාදුපදන නමින් සතරක් වූද, අරමුණු දැඩිව ගන්නා වූ තණ්හා - දිට්ඨී දෙක උපාදන නම් වන්නේය. (ගහණා ලක්ඛණං උපාදනං) උපාදනය වනාහි දැඩිව ගැනීම ලක්ෂණ කොට ඇත්තේය. (අමුඤ්චන රසං) ගත් දේ අත් නොහැරීම කෘත්‍ය රසය කොට ඇත්තේය. (තණ්හා දළ්හත්ථ දිට්ඨී පච්චුපට්ඨානං) තණ්හාවේ දැඩි බව ද මිථ්‍යාදෘෂ්ඨියද වැටහීම් කොට ඇත්තේය. (තණ්හා පදට්ඨානං) තණ්හාව ආසන්න හේතුව කොට ඇත්තේය.

28. භවයනම් කවරේද යත්, කර්‍මභවය- උප්පත්ති භවය නමින් භවය දෙවැදෑරුම් වන්නේය. උපාදාන ප්‍රත්‍යයෙන් ලැබෙන කර්ම භවය නම් ලෞකික කුසලාකුසල චිත්තෝත්පාද එකුන්තිස වන්නේය. උප්පත්ති භවය නම් එකුන්විසි ප්‍රතිසන්ධියට අනුව ලැබෙන විපාකස්කන්ධ නම් වන්නේය. (කම්ම කම්ම ඵල ලක්ඛණො භවො) භවය වනාහි කර්ම බවද කර්මඵල බවද ලක්ෂණ කොට ඇත්තේය. (භාවන භවන රසො) උපදවන බවද උපදින බවද කෘත්‍ය රසය කොට ඇත්තේය. (කුසලාකුසලාබ්‍යාකත පච්චුපට්ඨානො) කුශල-අකුශල බවද අව්‍යාකෘත බවද වැටහීම් කොට ඇත්තේය. (උපාදාන පදට්ඨානො) උපාදානය ආසන්න හේතුව කොට ඇත්තේය.

29. ජාතිය නම් කවරේද යත්, අණ්ඩජ-ජලාබුජ- සංසේදජ- ඕපපාතික වශයෙන් උපදින ප්‍රතිසන්ධි නාමරූපයන්ගේ පළමු හටගැනීම ජාති නම් වන්නේය. (තත්ථ තත්ථ භවෙ පඨමාභිනිබ්බත්ති ලක්ඛණා ජාති) ජාතිය වනාහි ඒ ඒ භවයෙහි ප්‍රථම හටගැනීම ලක්ෂණ කොට ඇත්තීය. (නීය්‍යාතන රසා) ජරා මරණය වෙත පවරාදීම කෘත්‍ය රසය කොට ඇත්තීය. (අතීත භවතො ඉධ උම්මුජ්ජන පච්චුපට්ඨානා) අතීත භවයෙන් මේ භවයට මතුකරවීම වැටහීම් කොට ඇත්තීය. (කම්මභව පදට්ඨානා) කර්මභවය ආසන්න හේතුව කොට ඇත්තීය.

30. (ඛන්ද පරිපාක ලක්ඛණා ජරා) ජරාව වනාහි ස්කන්ධයන්ගේ මේරීම ලක්ෂන කොට ඇත්තීය. (මරණූපනයන රසා) මරණයට ගෙනයාම කෘත්‍ය රසය කොට ඇත්තීය. (යොබ්බන විනාස පච්චුපට්ඨානා) යෞවන බව නැසීම වැටහීම් කොට ඇත්තීය. (ජාති පදට්ඨානා) ජාතිය ආසන්න හේතුව කොට ඇත්තීය.

31. (චුති ලක්ඛණං මරණං) මරණය වනාහි වර්තමාන භවයෙන් චුතවීම ලක්ෂණ කොට ඇත්තේය. (වියොග රසං) විශේෂයෙන් වෙන්වීයාම කෘත්‍ය රසය කොට ඇත්තේය. (විප්පවාස පච්චුපට්ඨානං) වත්මන් ගතියෙන් අන් ගතියකට පැමිණීම වැටහීම් කොට ඇත්තේය. (ජරා පදට්ඨානං) ජරාව ආසන්න හේතුව කොට ඇත්තේය.

32. (නිජ්ඣාන ලක්ඛණෝ සෝකෝ) සෝකය වනාහි හදතුල තැවෙන බව ලක්ෂණ කොට ඇත්තේය. (චෙතසෝ පරිජ්ඣායන රසෝ- පරිජ්ඣාපන රසො) සිත තුල හාත්පසින් තවන බව හෝ හාත්පසින් තැවීම කෘත්‍ය රසය කොට ඇත්තේය. (අනුසෝචන පච්චුපට්ඨානෝ) නැවත නැවත තැවෙන බව වැටහීම් කොට ඇත්තේය. (ඤති ව්‍යසනාදි පදට්ඨානෝ) ඤති ව්‍යසනාදිය ආසන්න හේතුව කොට ඇත්තේය.

33. (ලාලප්පන ලක්ඛණො පරිදේවෝ) පරිදේවය වනාහි වැළපීම ලක්ෂණ කොට ඇත්තේය. (ගුණදෝස කිත්තන රසෝ) ගුණ දෙස් කියවීම කෘත්‍ය රසය කොට ඇත්තේය. (සම්භව පච්චුපට්ඨානෝ) කම්පාව- වෙව්ලීම වැටහීම් කොට ඇත්තේය. (ඤති ව්‍යසනාදි පදට්ඨානෝ) ඥාති ව්‍යසනාදිය ආසන්න හේතුව කොට ඇත්තේය.

34. (කාය පීළන ලක්ඛණං දුක්ඛං) කායික දුක වනාහි කායික පීඩාව ලක්ෂණ කොට ඇත්තේය. (දුප්පඤ්ඤණං දෙමනස්ස කරන රසං) අනුවණයින්ට දෙම්නස් ඇතිකිරීම කෘත්‍ය රසය කොට ඇත්තේය. (කායික ආබාධ පච්චුපට්ඨානං) කායික ආබාධ බව වැටහීම් කොට ඇත්තේය. (කායින්ද්‍රිය පදට්ඨානං) කාය ප්‍රසාදය ආසන්න හේතුව කොට ඇත්තේය.

35. (චිත්ත පීළන ලක්ඛණං දෙමනස්සං) දෙම්නස වනාහි චිත්තපීඩාව ලක්ෂණ කොට ඇත්තේය. (මනෝ විඝාත රසං) චිත්ත සුඛය නැසීම කෘත්‍ය රසය කොට ඇත්තේය. (මානසව්‍යාධි පච්චුපට්ඨානං) මානසික ව්‍යාධියක් බව වැටහීම් කොට ඇත්තේය. (හදය වත්ථු පදට්ඨානං) හෘදය වස්තුව ආසන්න හේතුව කොට ඇත්තේය.

36. (චිත්ත පරිදහන ලක්ඛණො උපායාසො - බ්‍යාසත්ති ලක්ඛණො වා) උපායාසය වනාහි සිත තුල හාත්පසින් දැවෙන බව හෝ, දැඩිසේ හිතසුව විනාශය හෝ ලක්ෂණ කොට ඇත්තේය. (නිත්ථුනන රසො) දාහයෙන් දැඩිසේ තතනන බව කෘත්‍ය රසය කොට ඇත්තේය. (විසාද පච්චුපට්ඨානො) මනෝ දුක්ඛයෙන්ම බැගෑපත් බව වැටහීම් කොට ඇත්තේය. (ඤාති ව්‍යසනාදි පදට්ඨානො) ඤාති ව්‍යසනාදිය ආසන්න හේතුව කොට ඇත්තේය.

**ත්‍රිලක්‍ෂණ විදර්ශනාව**

1. පටිච්ච සමුප්පාද විදර්ශනා භාවනාවේදී පහළ වූ චිත්ත චෛතසික භූතරූප උපාද රූප යන මේ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්මයෝ, ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝය.
2. ඇතිවීම් නැති වීම් දෙකින් නිරන්තරයෙන් පීඩා විත්ද බැවින් දුක්ඛයෝය.
3. තම තමන් කැමති ලෙස නොපැවතී බැවින් අනාත්මයෝය.
4. අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ නාම රූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන සංඛත සන්තාප විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේය.
5. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව ආයූහන නිදන සංයෝග පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේය.
6. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ විවේක අසංඛත අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේය.
7. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතුවූ ආර්ය අෂ්ටාංගික මාර්ගය නියයාන හේතු දස්සන ආධිපතෙය්‍යාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේය.
8. මාගේ සකල කුශලාසම්භාර ධර්මය මෙම චතුරාර්ය සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිසම හේතු වේවා වාසනා වේවා

සාධු. සාධු. සාධු.

පදවිවරණය

| | | | |
|---|---|---|---|
| 01. | අවිජ්ජාව | - | (අවින්දියං වින්දතීති අවිජ්ජා) - නොකළ යුතු කායදුශ්චරිතාදිය විඳීනුයිද, (වින්දියං න වින්දතීති අවිජ්ජා) - කළ යුතු කාය සුචරිතාදිය නොවිඳිනුයිද, (අවිදිතං කරොතීති අවිජ්ජා) - ස්කන්ධ ආයතනාදිය නොදනීනුයිද, (ජවාපෙතීති අවිජ්ජා) භව සංසාරයෙහි දුවවන්නේ නුයිද, (න ජවතීති අවිජ්ජා) විද්‍යමාන ස්කන්ධ ආයතනාදියෙහි නොදුවන්නේනුයිද (ජාදනහොපි අවිජ්ජා) හේතුඵල සම්බන්ධය වසන්නේ නුයිද, අවිජ්ජා නම් වේ. |
| 02. | සංඛාරා | - | අවිද්‍යා ප්‍රත්‍යයෙන් ලැබෙන සංස්කාරයෝ නම් ත්‍රෛභූමික කුශල අකුශල චේතනා එකුන් තිස 29 වෙති. තවද සංඛත සංඛාර - අභිසංඛත සංඛාර- අභිසංඛරණ සංඛාර - පයෝගාභි සංඛාර නමින්ද, කායසංඛාර - වචී සංඛාර - චිත්ත සංඛාර නමින්ද සංස්කාරස් ඛන්ධ නමින්ද සංඛාර ධර්ම බෙදෙති. |
| 03. | විඤ්ඤාණ | - | ප්‍රතිසන්ධි - ප්‍රවෘත්ති විපාක විඤ්ඤාණ 32 සංස්කාර ප්‍රත්‍යයෙන් ලැබෙයි. එහෙත් එකුන් අනූ 89 චිත්තයම විඤ්ඤාණයට ගැනේ. |
| 04. | නාම | - | චිත්තය සමග සම්ප්‍රයුක්ත චෛතසික සියල්ල විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් ලැබෙන නාමයයි. ඒ හැර චිත්ත චෛතසික නිර්වාණ ධර්මයද නාම සංඛ්‍යාවට ගැනේ. |
| 05. | සෝකය | - | චිත්ත සන්තාප ඇතිකරන දෙම්නස් වේදනාවමය. |
| 06. | උපායාසය | - | අධික තාපයෙන් ජීවිතය නිරුද්ධකරවන තරම් දැඩිවූ ද්වේශ ගින්නකි. සෝක පරිදේව දුක්ඛ දෙමනස්ස උපායාසයෝ පටිච්ච සමුප්පාදයේ නිස්සන්ද ඵලයයි. |

සුමේධ පනාගොඩ මයා රු. 2000.00. ශෂී ප්‍රිය තොටමුණ පුතා රු. 600.00

වෛද්‍ය එන්. සමරසේකර මය රු. 500.00. රූප තලගල බී. කල්‍යාණි. පියරත්න මය 300.00

නිර්මලා හා සුමණ රණසිංහ මය රු. 100.00

රාජ්‍ය සේවා බෞද්ධ සංගමය මගින් මහජන පුස්තකාලයේ පැවැත්වෙන

භාවනා පන්තියේ ඉහත සඳහන් පින්වතුන් පිරිස විසින්

ධම්මාවබෝධය හා නිර්වාණ බෝධය සුවසේ ලැබේවායි උතුම් පැතුමින් ධර්ම දානය සඳහා

නුගේගොඩ ගංගොඩවිල 37
සෝරත මාවතේ පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස්හි මුද්‍රණය කරවන ලදී.

රාජ්‍ය සේවා බෞද්ධ සංගමය
මහවැලි සංවර්ධන අමාත්‍යාංශය
500 ටී. බී. ජයා මාවත, කොළඹ 10.
2544 / ඇසළ / 2000 අගෝස්තු 02

## අභිධර්ම විපස්සනා භාවනා පාඩම අංක - 19

## අභිධර්මාර්ථ සංග්‍රහ - ප්‍රත්‍ය සංග්‍රහ විභාගය 02

## අති පූජ්‍ය නා උයනේ අරිය ධම්ම නා හිමිපාණන් වහන්සේ විසින්

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!

01 පට්ඨානනය, හේතුපච්චයෝ - ආරම්මණ පච්චයෝ - අධිපති පච්චයෝ -අනන්තර පච්චයෝ - සමනන්තර පච්චයෝ - සහජාත පච්චයෝ - අඤ්ඤමඤ්ඤ පච්චයෝ-නිස්සය පච්චයෝ - උපනිස්සය පච්චයෝ - පුරේජාත පච්චයෝ-පච්ඡාජාත පච්චයෝ - ආසේවන පච්චයෝ - කම්ම පච්චයෝ- විපාක පච්චයෝ- ආහාර පච්චයෝ - ඉන්ද්‍රිය පච්චයෝ - ඣාන පච්චයෝ - මග්ග පච්චයෝ - සම්පයුත්ත පච්චයෝ - විප්පයුත්ත පච්චයෝ - අත්ථි පච්චයෝ - නත්ථි පච්චයෝ - විගත පච්චයෝ - අවිගත පච්චයෝති පට්ඨාන නයෝ.

02. හේතුප්‍රත්‍යය - ආරම්මණ ප්‍රත්‍යය - අධිපති ප්‍රත්‍යය - අනන්තර ප්‍රත්‍යය - සමනන්තර ප්‍රත්‍යය, සහජාත ප්‍රත්‍යය - අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය - නිශ්‍රය ප්‍රත්‍යය - උපනිශ්‍රය ප්‍රත්‍යය - පුරේජාත ප්‍රත්‍යය - පශ්චා ජාත ප්‍රත්‍යය- ආසේවන ප්‍රත්‍යය - කර්ම ප්‍රත්‍යය - විපාක ප්‍රත්‍යය - ආහාර ප්‍රත්‍යය - ඉන්ද්‍රිය ප්‍රත්‍යය - ධ්‍යාන ප්‍රත්‍යය - මාර්ග ප්‍රත්‍යය - සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය - විප්‍රයුක්ත ප්‍රත්‍යය - අස්ති ප්‍රත්‍යය - නාස්ති ප්‍රත්‍යය - විගත ප්‍රත්‍යය - අවිගත ප්‍රත්‍යය යනු පට්ඨාන නය ක්‍රමයයි.

03. හේතුපච්චයෝති - හේතු හේතු සම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානඤ්ච රූපානං හේතු පච්චයේන පච්චයෝ - හේතු ප්‍රත්‍යය නම් කවරේද යත්, හේතු ධර්මයෝ සය දෙන හේතු සම්ප්‍රයුක්ත චිත්ත චෛතසික ධර්මයන්ට ද සහේතුක චිත්ත සමුට්ඨාන රූපයන්ට ද හේතු ප්‍රත්‍යයෙන් උපකාර වන්නාහ. ලෝභ දෝස මෝහ නම් වූ අකුශල හේතු තුන්දෙනාද අලෝභ අදෝස අමෝහ නම් වූ කුශල- අව්‍යාකෘත හේතුන් තුන් දෙනාද, සහේතුක සිත් එක් සැත්තෑවටද මෝහමූල දෙසිතෙහි මෝහය හැර චෛතසික දෙපණසට ද සහේතුක චිත්තජ රූපයන්ටද සහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූපයන්ටද, හේතු නම් වූ මූලාර්ථයෙන් උපකාර වීමේ ශක්ති විශේෂය හේතු ප්‍රත්‍යය නම් වන්නේය.

04. ආරම්මණ පච්චයෝති - රූපායතනං චක්ඛුවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණ පච්චයේන පච්චයෝ - රූප අරමුණ චක්ඛුවිඤ්ඤාණ ධාතුවට ද ඒ සමඟ සම්ප්‍රයුක්ත වූ චෛතසික සත්දෙනාටද ආරම්මණ ප්‍රත්‍යයෙන් උපකාර වන්නේය. එසේම ශබ්ද අරමුණ සෝත විඤ්ඤාණයට හා තත් සම්ප්‍රයුක්ත චෛතසික සත් දෙනාටද, ගන්ධ අරමුණ ඝාන විඤ්ඤාණයට හා තත් සම්ප්‍රයුක්ත චෛතසික සත් දෙනාටද, රස අරමුණ ජිව්හා විඤ්ඤාණයට හා තත් සම්ප්‍රයුක්ත චෛතසික සත් දෙනාටද, පඨවි-තේජෝ - වායෝ - යන භූතත්‍රය නම් වූ ඵොට්ඨබ්බ අරමුණ කායවිඤ්ඤාණයට හා තත් සම්ප්‍රයුක්ත චෛතසික සත්දෙනාටද, රූප ශබ්ද ගන්ධ රස ඵොට්ඨබ්බ යන අරමුණු පස් දෙනා පඤ්චද්වාරාවර්ජනය සහ සම්පටිච්ඡන යුගලය නම් වූ මනෝ ධාතුවට හා තත් සම්ප්‍රයුක්ත චෛතසික දශදෙනාටද සියලුම අරමුණු මනොවිඤ්ඤාණ ධාතුවට හා තත් සම්ප්‍රයුක්ත චෛතසික ධර්මයන්ට ද ආරම්මණ ප්‍රත්‍ය නම්වූ ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ.

05. යම් යම් ආරම්මණයක් අරමුණු කොට යම් යම් චිත්ත චෛතසික ධර්මයක් උපදින්නාහු වෙත්ද, ඒ ඒ ආරම්මණ ධර්මයෝ ඒ ඒ චිත්ත චෛතසික ධර්මයන්හට ආරම්මණ ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ. ළදරුවකු හෝ වයෝවෘද්ධ දුර්වලයකු හෝ ආධාරයක් ඇතිවම නැගිටින්නා සේ චිත්ත චෛතසිකයෝ අරමුණක එල්බගෙනම උපදින්නාහ. අරමුණක් නොගෙන උපදින චිත්ත චෛතසික ධර්මයක්ම නැත්තේය.

06. අධිපති පච්චයෝති - ඡන්දධිපති ඡන්ද සම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානඤ්ච රූපානං අධිපති පච්චයේන පච්චයෝ, අධිපති ප්‍රත්‍යය නම් කවරේද යත්, ඡන්දධිපතිය ඡන්ද සම්ප්‍රයුක්ත චිත්ත චෛතසික ධර්මයන්ට ද එයින් හටගන්නාවූ රූපයන්ටද අධිපති වීම්

වශයෙන් උපකාර වන්නේය. එසේම විරියාධිපතිය වීර්ය සම්ප්‍රයුක්ත ධර්මයන්හට ද, එයින් හටගන්නා රූපයන්ටද, චිත්තාධිපතිය චිත්ත සම්ප්‍රයුක්ත ධර්මයන්ටද එයින් හටගන්නාවූ රූපයන්ට ද, වීමංසාධිපතිය වීමංසා සම්ප්‍රයුක්ත ධර්මයන්ට ද එයින් හටගන්නා රූපයන්ට ද අධිපති වීම් වශයෙන් උපකාර වන්නේය.

07. යම් යම් අරමුණක් දැඩිව ගෙන යම් යම් චිත්ත චෛතසික කෙනෙක් උපදිත් ද ඒ ඒ දැඩිව ගනු ලබන්නා වූ අරමුණු ඒ ඒ චිත්ත චෛතසික ධර්මයන් හට ආරම්මණාධි ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ. ඡන්ද චිත්ත විරිය වීමංසයෝ සහජාතාධිපති නම් වන්නාහ. දැඩිව ගනුලබන අරමුණ වනාහි, ආරම්මණාධිපති නම් වන්නේය. සහජාතාධිපති ධර්මයන් එක සිතක උපදින කල්හි එකක්ම අධිපති වන්නේය. අවශේෂ අධිපති ධර්මයෝ එයට අනුවර්තනය වන්නාහ.

08. අනන්තර පච්චයෝති - චක්ඛු විඤ්ඤාණ ධාතු තං සම්පයුත්තකාච ධම්මා මනෝධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අනන්තර පච්චයේන පච්චයෝ - මනෝධාතු තං සම්පයුත්තකාච ධම්මා මනෝවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අනන්තර පච්චයේන පච්චයෝ - අනන්තර ප්‍රත්‍යය නම් කවරේද යත්, චක්ඛු විඤ්ඤාණ ධාතුව ද ඒ හා සම්ප්‍රයුක්ත වූ චෛතසික ධර්ම සත්දෙනාද මනෝධාතු නම් වූ සම්පටිච්ඡන චිත්තයට ද ඒ හා සම්ප්‍රයුක්ත වූ චෛතසික ධර්ම දශ දෙනාට ද අනන්තර ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ. මනෝධාතු නම් වූ සම්පටිච්ඡන චිත්තයද ඒ හා සම්ප්‍රයුක්තවූ චෛතසික ධර්ම දශ දෙනා ද මනෝ විඤ්ඤාණ ධාතු නම් වූ සන්තීරණ සිතටද ඒ හා සම්ප්‍රයුක්ත වූ චෛතසික ධර්ම එකොළොස් දෙනාටද අනන්තර ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ.

09. එසේම සෝත විඤ්ඤාණය - ඝාන විඤ්ඤාණය - ජිව්හා විඤ්ඤාණය - කාය විඤ්ඤාණයද - තත් සම්ප්‍රයුක්ත සත් දෙනා බැගින් වූ චෛතසිකයෝද මනෝධාතු නම් වූ සම්පටිච්ඡන චිත්තයටද තත් සම්ප්‍රයුක්ත චෛතසික දශයටද, අනන්තර ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ. මනෝධාතු නම් වූ සම්පටිච්ඡන චිත්තයද තත් සම්ප්‍රයුක්ත චෛතසික දශ දෙනා ද මනෝවිඤ්ඤාණ ධාතු නම් වූ සන්තිරණ චිත්තයට ද තත් සම්ප්‍රයුක්ත චෛතසික එකොළසට ද අනන්තර ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ.

10. එක් එක් කුශල චිත්ත වීථියක පූර්ව-පූර්ව කුශල ජවනයෝ පසු පසු කුශල ජවනයන්හට අනන්තර ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ. කුශල ජවන් වීථියක පූර්ව-පූර්ව අන්තිම කුශල ජවනය පසු පසු තදරම්මණ - භවංග - චුති නම් වූ අව්‍යාකෘත ධර්මයන්හට අනන්තර ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ. එසේම පූර්ව පූර්ව අකුශල ධර්මයෝ පසු පසු අකුශල ධර්මයන්ටද, පූර්ව පූර්ව අකුශල ධර්මයෝ පසු පසු අව්‍යාකෘත ධර්මයන්ටද අනන්තර ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ. පූර්ව පූර්ව අව්‍යාකෘත ධර්මයෝ පසු පසු අව්‍යාකෘත ධර්මයන්ටද, කුශල ධර්මයන්ටද, අකුශල ධර්මයන්ටද අනන්තර ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ.

11. කුශල වූද අකුශල වූද අව්‍යාකෘත වූද යම් යම් චිත්ත චෛතසික ධර්මයකට අනතුරුව යම් යම් චිත්ත චෛතසික ධර්ම කෙනෙක් උපදිත්ද, ඒ ඒ පූර්ව චිත්ත චෛතසික ධර්මයෝ පසු පසු චිත්ත චෛතසික ධර්මයන්හට අනන්තර ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ. සමනන්තර ප්‍රත්‍යයද වනාහි අනන්තර ප්‍රත්‍යයට සියලු ආකාරයෙන් සමාන වන්නේය. දේශනා විලාශ වශයෙන් හා වේනෙය්‍ය අධ්‍යාශ වශයෙන් දෙසන ලද අනන්තර - සමනන්තර යන වචන වශයෙන් පමණක් වෙනස ඇත්තේය. ප්‍රත්‍ය වශයෙන් එක හා සමානය.

12. සහජාත පච්චයෝති - චත්තාරෝ ඛන්ධා අරූපිනෝ අඤ්ඤමඤ්ඤං සහජාත පච්චයේන පච්චයෝ - සහජාත ප්‍රත්‍යය නම් කවරේද යත්, අරූපී නාමස්කන්ධයෝ සතර දෙනා ඔවුනොවුන්හට එක්ව ඉපදීම් වශයෙන් සහජාත ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ. එසේම එක්ව උපදින සතර මහා භූත රූපයෝ ඔවුනොවුන්හට සහජාත ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර

වන්නාහ. ප්‍රතිසන්ධි ක්ෂණයෙහි එක්ව උපදින ප්‍රතිසන්ධි නාමරූපයෝ ඔවුනොවුන්හට සහජාත ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ.

13. චිත්ත චෛතසික ධර්මයෝ චිත්ත සමුට්ඨාන රූපයන්හට සහජාත ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ. සතර මහා භූත රූපයෝ එක්ව උපදින උපාද රූපයන් හට සහජාත ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ. ප්‍රතිසන්ධි ක්ෂණයෙහි හදය වස්තු රූපය ප්‍රතිසන්ධි නාමධර්මයන්හට සහජාත ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ. ප්‍රතිසන්ධි ක්ෂණයෙන් පසු හදය වස්තු රූපය එසේ නාම ධර්මයන්හට සහජාත ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර නොවන්නේය.

14. අඤ්ඤමඤ්ඤ පච්චයෝති- චත්තාරෝ ඛන්ධා අරූපිනෝ අඤ්ඤමඤ්ඤ පච්චයේන පච්චයෝ - අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය නම් කවරේද යත් අරූපී නාමස්කන්ධයෝ සතර දෙනා ඔවුනොවුන් හට අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ. එසේම එකට උපදින සතර මහා භූතරූපයෝ ඔවුනොවුන්හට අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ. ප්‍රතිසන්ධික්ෂණයෙහි එකට උපදින ප්‍රතිසන්ධි නාමරූපයෝ ඔවුනොවුන්හට අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ.

15. නිස්සය පච්චයෝති - චත්තාරෝ ඛන්ධා අරූපිනෝ අඤ්ඤමඤ්ඤං නිස්සය පච්චයේන පච්චයෝ- නිශ්‍රය ප්‍රත්‍යය නම් කවරේද යත්, අරූපී නාමස්කන්ධයෝ සතර දෙනා ඔවුනොවුන්හට නිශ්‍රය ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ. එසේම එකට උපදින සතරමහා භූතරූපයෝ ඔවුනොවුන්හට නිශ්‍රය ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ. ප්‍රතිසන්ධි ක්ෂණයෙහි එකට උපදින ප්‍රතිසන්ධි නාමරූපයෝ ඔවුනොවුන්හට නිශ්‍රය ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ.

16. චිත්ත චෛතසික ධර්මයෝ චිත්තජ රූපයන්හට නිශ්‍රය ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ. මහාභූත රූපයෝ උපාද රූපයන්හට නිශ්‍රය ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ. චක්ඛායතනය චක්ඛු විඤ්ඤාණ ධාතුවටද තත් සම්ප්‍රයුක්ත චෛතසික ධර්මයන්හටද නිශ්‍රය ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නේය. එසේම සෝතායතනය - ඝානායතනය - ජිහ්වායතනය - කායායතනයද සෝත විඤ්ඤාණ - ඝාන විඤ්ඤාණ - ජිව්හා විඤ්ඤාණ - කාය විඤ්ඤාණයන්ටද තත් සම්ප්‍රයුක්ත චෛතසික ධර්මයන්ටද නිශ්‍රය ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නේය. හදය වස්තු රූපය මනෝධාතු- මනෝ විඤ්ඤාණ ධාතූන්ටද තත් සම්ප්‍රයුක්ත චෛතසික ධර්මයන්ටද නිශ්‍රය ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නේය.

17. උපනිස්සය පච්චයෝති - පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං උපනිස්සය පච්චයේන පච්චයෝ - උපනිශ්‍රය ප්‍රත්‍යය නම් කවරේද යත්, පූර්ව පූර්ව කුශල ධර්මයෝ පසු පසු කුශල ධර්මයන්හට අනන්තරූපනිශ්‍රය ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ. එසේම පූර්ව පූර්ව කුශල ධර්මයෝ පශ්චිම පශ්චිම ඇතැම් අකුශල ධර්මයන්හට ආරම්මණ උපනිශ්‍රය ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ. පූර්ව පූර්ව කුශල ධර්මයෝ පශ්චිම පශ්චිම අව්‍යාකෘත ධර්මයන්හට අනන්තරූපනිශ්‍රය ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ.

18. පූර්ව පූර්ව අකුශල ධර්මයෝ පශ්චිම පශ්චිම අකුශල ධර්මයන් හට අනන්තරූපනිශ්‍රය ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ. පූර්ව පූර්ව අකුශල ධර්මයෝ පශ්චිම පශ්චිම ඇතැම් කුශල ධර්මයන්හට ආරම්මණූපනිශ්‍රය ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ. පූර්ව පූර්ව අකුශල ධර්මයෝ පශ්චිම පශ්චිම අව්‍යාකෘත ධර්මයන්හට අනන්තරූපනිශ්‍රය ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ.

19. පූර්ව පූර්ව අව්‍යාකෘත නාමධර්මයෝ පශ්චිම පශ්චිම අව්‍යාකෘත නාම ධර්මයන්හට අනන්තරූපනිශ්‍රය ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ. පූර්ව පූර්ව අව්‍යාකෘත නාම ධර්මයෝ පශ්චිම පශ්චිම කුශල ධර්මයන්ටද පශ්චිම පශ්චිම අකුශල ධර්මයන්ටද අනන්තරූපනිශ්‍රය ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ. සෘතුවද භෝජනයද පුද්ගලයාද සේනාසනයද ප්‍රකෘතෝපනිශ්‍රය ප්‍රත්‍ය ශක්තියෙන් නාම ධර්මයන් හට උපකාර වන්නාහ.

20. පුරේජාත පච්චයෝති - චක්ඛායතනං චක්ඛුවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං පුරේජාත පච්චයේන පච්චයෝ - පුරේජාත ප්‍රත්‍යය නම් කවරේද යත්, චක්ඛායතනය චක්ඛු විඤ්ඤාණ ධාතුවට හා තත් සම්ප්‍රයුක්ත චෛතසික ධර්මයන්හටද පුරේජාත ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නේය, එසේම සෝතායතනයද ඝානායතනයද ජිව්හායතනය ද කායායතනයද - සෝත විඤ්ඤාණ- ඝාන විඤ්ඤාණ - ජිව්හා විඤ්ඤාණ - කායවිඤ්ඤාණ ධාතුන්ටද තත් සම්ප්‍රයුක්ත චෛතසික ධර්මයන්ට ද අනු පිළිවෙළින් පුරේජාත ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නේය.

21. රූපායතනය චක්ඛු විඤ්ඤාණයටද ශබ්දයතනය සෝත විඤ්ඤාණයටද ගන්ධායතනය ඝාන විඤ්ඤාණයටද රසායතනය ජිව්හා විඤ්ඤාණයටද ඵොට්ඨබ්බායතනය කාය විඤ්ඤාණයටද ඒ ඒ විඤ්ඤාණයන් හා සමග සම්ප්‍රයුක්ත චෛතසික ධර්මයන්ට ද පුරේජාත ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නේය. රූපායතන ශබ්දයතන ගන්ධායතන රසායතන ඵොට්ඨබ්බායතනය ද මනෝධාතුවට හා තත් සම්ප්‍රයුක්ත චෛතසික ධර්මයන්ටද පුරේජාත ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නේය. හදය වස්තු රූපය මනෝධාතුවටද තත් සම්ප්‍රයුක්ත චෛතසික ධර්මයන්ටද පුරේජාත ප්‍රත්‍ය ශක්තියෙන් ප්‍රත්‍ය වන්නේය. මනෝවිඤ්ඤාණ ධාතුවට හා තත් සම්ප්‍රයුක්ත චෛතසික ධර්මයන් හට ප්‍රවෘත්ති කාලයේදී පුරේජාත ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නේය. ප්‍රතිසන්ධික්ෂණයේදී වනාහි පුරේජාත ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර නොවන්නේය.

22. පච්ඡාජාත පච්චයෝති- පච්ඡාජාතා චිත්ත චෛතසිකා ධම්මා පුරේ ජාතස්ස ඉමස්ස කායස්ස පච්ඡාජාත පච්චයෙන පච්චයෝ - පච්ඡාජාත ප්‍රත්‍යය නම් කවරේද යත්, පසුව උපන්නාවූ චිත්ත චෛතසික ධර්මයෝ පූර්වයේ උපන්නා වූ මේ රූප කයට පසුව ඉපදීම් වශයෙන් පච්ඡාජාත ප්‍රත්‍යයෙන් උපකාර වන්නාහ.

23. ආසේවන පච්චයෝති - පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං ආසේවන පච්චයේන පච්චයෝ - ආසේවන ප්‍රත්‍යය නම් කවරේද යත්, පූර්ව පූර්ව කුශල ධර්මයෝ පශ්චිම පශ්චිම කුශල ධර්මයන්හට ආසේවන ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ. එසේම පූර්ව පූර්ව අකුශල ධර්මයෝ පශ්චිම පශ්චිම අකුශල ධර්මයන්හට ආසේවන ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ. පූර්ව පූර්ව ක්‍රියාව්‍යාකෘත ධර්මයෝ පශ්චිම පශ්චිම ක්‍රියාව්‍යාකෘත ධර්මයන්හට ආසේවන ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ.

24. කම්ම පච්චයෝති - කුසලා කුසලං කම්මං විපාකානං ඛන්ධානං කටත්තා ච රූපානං කම්ම පච්චයේන පච්චයෝ - කර්ම ප්‍රත්‍යය නම් කවරේද යත් කුශලාකුශල කර්මය විපාක නාමස්කන්ධයන් හට ද කර්මජ රූපයන්ටද කර්ම ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නේය. එසේම සහජාත චේතනාව තමා හා සමහ සම්ප්‍රයුක්ත ධර්මයන්ට ද චිත්තජ රූපයන්ටද කර්ම ප්‍රත්‍යයෙන් උපකාර වන්නේය.

25. විපාක පච්චයෝති - විපාකා චත්තාරෝ ඛන්ධා අරූපිනෝ අඤ්ඤ මඤ්ඤං විපාක පච්චයේන පච්චයෝ - විපාක ප්‍රත්‍යය නම් කවරේද යත්, අරූපී විපාක නාමස්කන්ධයෝ සතර දෙනා ඔවුනොවුන්ටද විපාක චිත්තජ රූපයන්ටද විපාක ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ.

26. ආහාර පච්චයෝති - කබලිංකාරෝ ආහාරෝ ඉමස්ස කායස්ස ආහාරපච්චයේන පච්චයෝ අරූපිනෝ ආහාරා සම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානඤ්ච රූපානං ආහාර පච්චයේන පච්චයෝ - ආහාර ප්‍රත්‍යය නම් කවරේද යත්, කබලිංකාරාහාරය මේ රූපකයට ආහාර ප්‍රත්‍යයෙන් උපකාර වන්නේය. අරූපී ආහාරයෝ තිදෙනා තත් සම්ප්‍රයුක්ත ධර්මයන්ට ද චිත්තජ රූපයන්ට ද ආහාර ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ.

27. ඉන්ද්‍රිය පච්චයෝති - චක්ඛුන්ද්‍රියං චක්ඛු විඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං ඉන්ද්‍රිය පච්චයේන පච්චයෝ - ඉන්ද්‍රිය ප්‍රත්‍යය නම් කවරේද යත්, චක්ඛුන්ද්‍රිය චක්ඛුවිඤ්ඤාණ ධාතුවටද තත් සම්ප්‍රයුක්ත චෛතසික ධර්මයන්ටද ඉන්ද්‍රිය ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නේය. එසේම සෝත - ඝාන - ජිව්හා - කාය ඉන්ද්‍රියයෝ සෝත විඤ්ඤාණ - ඝාන විඤ්ඤාණ - ජිව්හා විඤ්ඤාණ - කාය විඤ්ඤාණ ධාතුන්ටද තත් සම්ප්‍රයුක්ත චෛතසිකයන්හට ද ඉන්ද්‍රිය

ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ. රූප ජීවිතේන්ද්‍රිය කර්මජ රූපයන්හට ඉන්ද්‍රිය ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නේය. අරූපී ඉන්ද්‍රියයෝ සම්ප්‍රයුක්ත ධර්මයන්ටද තත් සමුට්ඨාන රූපයන්ටද ඉන්ද්‍රිය ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ.

28. ඣාන පච්චයෝති - ඣානංගානි ඣාන සම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානඤ්ච රූපානං ඣාන පච්චයේන පච්චයෝ - ධ්‍යාන ප්‍රත්‍යය නම් කවරේද යත්, ධ්‍යානාංගයෝ ධ්‍යාන සම්ප්‍රයුක්ත ධර්මයන්ටද තත් සමුට්ඨාන රූපයන්ටද ධ්‍යාන ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ.

29. මග්ග පච්චයෝති - මග්ගංගානි මග්ග සම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානඤ්ච රූපානං මග්ග පච්චයේන පච්චයෝ - මාර්ග ප්‍රත්‍යය නම් කවරේද යත්, මාර්ගාංගයෝ මාර්ග සම්ප්‍රයුක්ත ධර්මයන්ට ද තත් සමුට්ඨාන රූපයන්ටද මාර්ග ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ.

30. සම්පයුත්ත පච්චයෝති - චත්තාරෝ ඛන්ධා අරූපිනෝ අඤ්ඤමඤ්ඤං සම්පයුත්ත පච්චයේන පච්චයෝ. සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය නම් කවරේද යත්, අරූපී නාමස්කන්ධයෝ සතර දෙන ඔවුනොවුන්හට මිශ්‍රවීම් වශයෙන් සම්ප්‍රයුක්ත ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ.

31. විප්පයුත්ත පච්චයෝති - රූපිනෝ ධම්මා අරූපීනං ධම්මානං විප්පයුත්ත පච්චයේන පච්චයෝ - අරූපිනෝ ධම්මා රූපීනං ධම්මානං විප්පයුත්ත පච්චයේන පච්චයෝ - විප්‍රයුක්ත ප්‍රත්‍යය නම් කවරේද යත්, රූපී ධර්මයෝ අරූපී ධර්මයන්හට මිශ්‍රනොවීම් වශයෙන් විප්‍රයුක්ත ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ. එසේම අරූපී ධර්මයෝ රූපී ධර්මයන්හට විප්‍රයුක්ත ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ.

32. අත්ථි පච්චයෝති - චත්තාරෝ ඛන්ධා අරූපිනෝ අඤ්ඤමඤ්ඤං අත්ථිප්පච්චයේන පච්චයෝ - අත්ථි ප්‍රත්‍යය නම් කවරේද යත්, අරූපී නාමස්කන්ධයෝ සතර දෙනා ඔවුනොවුන්හට අස්ති ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ. එසේම සතර මහා භූතරූපයෝ ඔවුනොවුන්හට අස්ති ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ. ප්‍රතිසන්ධි නාම රූපයෝ ඔවුනොවුන්හට අස්ති ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ. චිත්තචෛතසික ධර්මයෝ චිත්තජ රූපයන්හට අස්ති ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ. මහා භූත රූපයෝ උපාද රූපයන්හට අස්ති ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ.

33. චක්ඛායතනය චක්ඛු විඤ්ඤාණ ධාතුවටද තත් සම්ප්‍රයුක්ත ධර්මයන්ටද අස්ති ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නේය. එසේම සෝතායතනය- ඝානායතනය - ජිව්හායතනය - කායායතනයද සෝතවිඤ්ඤාණාදියට අස්ති ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ. රූපායතන - ශබ්දයතන- ගන්ධායතන - රසායතන - ඵොට්ඨබ්බායතනයෝ චක්ඛුවිඤ්ඤාණාදී පඤ්ච විඤ්ඤාණයන්ටද තත් සම්ප්‍රයුක්ත ධර්මයන්ටද අස්ති ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ.

34. රූප - ශබ්ද - ගන්ධ - රස - ඵොට්ඨබ්බ ආයතන පස්දෙනා මනෝධාතුවට ද තත් සම්ප්‍රයුක්ත ධර්මයන්ටද අස්ති ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ. හදය වස්තු රූපය මනෝධාතු මනෝවිඤ්ඤාණධාතුන්ටද තත් සම්ප්‍රයුක්ත ධර්මයන්ට ද අස්ති ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ.

35. නත්ථි පච්චයෝති - සමනන්තර නිරුද්ධා චිත්ත චේතසිකා ධම්මා පටුප්පන්නානං චිත්ත චේතසිකානං ධම්මානං නත්ථි පච්චයෙන පච්චයෝ - නාස්ති ප්‍රත්‍යය නම් කවරේද යත්, සමීපාසන්නයේ නිරුද්ධ වූ චිත්ත චෛතසික ධර්මයෝ ඉන් අනතුරුවම උපන්නාවූ චිත්ත චෛතසික ධර්මයන්ට නාස්ති ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ.

36. විගත පච්චයෝති - සමනන්තර විගතා චිත්තචේතසිකා ධම්මා පටුප්පන්නානං චිත්ත චේතසිකානං ධම්මානං විගත පච්චයේන පච්චයෝ - විගත ප්‍රත්‍යය නම් කවරේද යත්, සමීපාසන්නයේ ඉපිද නිරුද්ධ වූ චිත්ත චෛතසික ධර්මයෝ ඉන් අනතුරුවම උපන්නාවූ චිත්ත චෛතසික ධර්මයන්හට විගත ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ. නාස්ති ප්‍රත්‍යය

සහ විගත ප්‍රත්‍යයද අර්ථ වශයෙන් එක සමාන වන්නාහ. එසේම අත්ථි ප්‍රත්‍යය සහ අවිගත ප්‍රත්‍යයද එක හා සමානම වන්නාහ. වචන වශයෙන් පමණක් වෙනස් වන්නාහ. දේශනා විලාශ වශයෙන් සහ වේනෙය්‍යාධ්‍යාශ වශයෙන් වෙන වෙනම දේශනා කරන ලද්දහ.

**ත්‍රිලක්ෂණ විදර්ශනාව**

1. සුවිසි ප්‍රත්‍ය නිර්දේශ භාවනාවේදී පහළ වූ චිත්ත චෛතසික භූතරූප උපාද රූප නම් වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්මයෝ, ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝය.
2. ඇතිවීම් නැති වීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝය.
3. තමන් කැමති ලෙස නොපැවතී බැවින් අනාත්මයෝය.
4. අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ චිත්ත චෛතසික භූතරූප උපාද රූප නම් වූ නාම රූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන සංඛත සන්තාප විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේය.
5. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව ආයූහන නිදන සංයෝග පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේය.
6. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ විවේක අසංඛත අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේය.
7. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස. භාවනා වශයෙන් වැඩිය යුතුවූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය නියයාන හේතු දස්සන ආධිපතෙය්‍යාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේය.
8. මාගේ භාවනාමය කුසලානිසංස ධර්මය මෙම චතුරාර්ය සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිසම හේතු වේවා වාසනා වේවා

සාධු. සාධු. සාධු.

පදවිවරණය

| | | | |
|---|---|---|---|
| 01. | හේතු ප්‍රත්‍යය | - | 'හේතු යන වචනයෙහි තේරුම් කුනක් ඇත. පටිසද්ද හේතු පොරොන්දුව නිසා - යනු වචන ව්‍යවහාර අර්ථයයි. යේ ධම්මා හේතුප්පභවා - යන තැන ඵලයට හේතුවන කාරණය යන අර්ථයි. 'කුසලහේතු අකුසල හේතු අව්‍යාකත හේතු' යන තැන ලෝභාදී හේතු ධම් සදෙනා යනුයි. ප්‍රත්‍යය යනු යම් දෙයක් ඉපදීමට සහ පැවතීමට උපකාර වීමයි. |
| 02. | ආරම්මණ | - | චිත්ත චෛතසිකයන් විසින් එල්බ ගනු ලබන අරමුණකි. |
| 03. | අධිපති | - | ඉසුරුමත් ධර්මයකි. සහජාතාධිපති - ආරම්මණාධිපති නමින් දෙයාකාරයි. |
| 04. | අනන්තර | - | සමනන්තර - පූර්ව පූර්ව චිත්ත චෛතසිකයන් ගැනෙති. |
| 05. | සහජාත | - | එක් වර පෙරපසු නොවී එකට උපදින ධර්මයෝය. |
| 06. | අඤ්ඤමඤ්ඤ | - | එකක් අනෙකට බැගින් ඔවුනොවුනට උපකාර වීමකි. |
| 07. | නිස්සය | - | යමක් ඊදෙන්නට පිහිටවන ආධාරයයි. |
| 08. | උපනිස්සය | - | චිත්ත චෛතසිකයන්ට ලැබෙන බලවත්ම උපකාරයයි. අනන්තරූපනිශ්‍රය - ආරම්මණූපනිශ්‍රය- ප්‍රකෘතෝපනිශ්‍රය නමින් එය තෙවැදෑරුම් වේ. |
| 09. | පුරේජාත | - | තමන් පළමුකොට ඉපද සිට දෙවනුව උපදින අයට උපකාර වීමය. |
| 10. | පච්ඡාජාත | - | තමන් පසුව ඉපදී මුලින් උපන් ධර්මයට පිහිටවීමයි. |
| 11. | ආසේවන | - | තමන්ගේ ශක්තිය තමන් ළහම උපදින ධර්මයට දීමයි. |
| 12. | කර්මය | - | චේතනාවයි, 13- විපාක - චේතනාවේ ඵලයයි. |
| 14. | ආහාර | - | කබලිංකාර, ඵස්ස, මනෝසංචේතනා, විඤ්ඤාණ නමින් රූප- නාම උපදවන උපකාරක ධර්මයි. |
| 15. | ඉන්ද්‍රිය | - | ඉසුරුමත් ධම්යෝය. 16- ධ්‍යාන - ධ්‍යානාංග 5 කි. |
| 17. | මග්ග | - | මාර්ගාංග 12 කි. 18. සම්පයුත්ත - සතර සම්ප්‍රයෝග ලක්ෂණයෙන් මිශ්‍ර වූ ධර්මයෝය. |
| 19. | විප්පයුත්ත | - | එසේ මිශ්‍ර නොවූවෝය - 20 . අත්ථි - වර්තමානයේ ඇති බවයි. |
| 21. | නත්ථි | - | විගත- නිරුද්ධ වූ වගයි. |
| 22. | අවිගත | - | වර්තමානයේ විද්‍යමානව ඇති ධර්මයෝය. |


**අතිපූජ්‍ය නාඋයනේ අරියධම්ම මාහිමිපාණන් වහන්සේගේ**

අභිසම්බෝධි ප්‍රාර්ථනාව ඒකාන්තයෙන් මුදුන්පත් වේවා යන මෙත් සිතින්ද, අපවත් වී වදාළ **අතිපූජ්‍ය මහෝපාධ්‍යාය මාතර සිරි ඤාණාරාම සංඝ පිතෘන්වහන්සේ** අභාවප්‍රාප්ත නුගේගොඩ රුක්විමන භාවනා මධ්‍යස්ථානයේ **ලීනා රූපසිංහ මාතාව**, නුගේගොඩ බුද්ධදාස ධර්මායතනයේ **ඒ.ඩී. එම්. බුද්ධදාස මහත්මා** සහ **සීලවතී පීරිස් මාතාව** ඇතුළු අපගේ මව්පිය, ගුරුවර, ඤාති මිත්‍ර සමූහයාට උපකාර වශයෙන්ද, කෘතගුණ සැලකීම් වශයෙන්ද, සුවසේ මොක් සුව අවබෝධ වේවා යන මෙත් පැතුමෙන්ද යුක්තව රුක්විමන භාවනා මධ්‍යස්ථානයේ ශ්‍රියන්ති මුතුතන්ත්‍රි, සමරා රණවීර, වයි හරදස, ඩී. තාලූ සහ කාන්ති හරදස මහත්මීහු ධර්ම දානය පිරි නමති.

නුගේගොඩ ගංගොඩවිල 37, සෝරත මාවතේ පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස්හි මුද්‍රණය කරවන ලදී

රාජ්‍ය සේවා බෞද්ධ සංගමය
මහවැලි සංවර්ධන අමාත්‍යාංශය, 500 ටී. බී. ජයා මාවත, කොළඹ 10
2544 බිනර/ 2000 සැප්තැම්බර් 06

**අභිධර්ම විපස්සනා භාවනා පාඩම අංක - 20**

**අභිධර්මාර්ථ සංග්‍රහ - ප්‍රත්‍ය සංග්‍රහ විභාගය 03**

**අති පූජ්‍ය නා උයනේ අරිය ධම්ම නා හිමිපාණන් වහන්සේ විසින්**

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!

01 **ඡධා නාමන්තු නාමස්ස - පඤ්චධා නාම රූපිනං**
**එකධා පුන රූපස්ස - රූපං නාමස්ස චේකධා**

**පඤ්ඤත්ති නාමරූපානි - නාමස්ස දුවිධා ද්වයං**
**ද්වයස්ස නවධා චේති - ඡබ්බිධා පච්චයා කථං**

නාමය වනාහි නාමයට සයාකාරයෙන් ප්‍රත්‍ය වන්නේය. නැවතත්, නාමය නාමරූප දෙකට පස් ආකාරයකින් ප්‍රත්‍යය වන්නේය, නැවත නාමය රූපයට පමණක් එක් ආකාරයකින් ප්‍රත්‍යය වන්නේය. රූපය ද නාමයට එක් ආකාරයකින් ප්‍රත්‍යය වන්නේය. ප්‍රඥප්තිය හා නාමරූපයෝ නාමයට දෙයාකාරයෙන් ප්‍රත්‍යය වන්නාහ. නාමරූප දෙක වනාහි නාමරූප දෙකට නවාකාරයකින් ප්‍රත්‍යය වන්නාහ. මෙසේ ප්‍රත්‍යය වන ආකාරය සය - වැදෑරුම් වන්නේය.

02. නාමය නාමයට සයාකාරයකින් ප්‍රත්‍ය වන්නේ කෙසේද යත්, අනන්තරයෙහි නිරුද්ධ වූ චිත්ත චෛතසික ධර්මයෝ පසුව උපදනා වූ චිත්ත චෛතසික ධර්මයන්හට අනන්තර - සමනන්තර - නාස්ති විගත නම් වූ සතරාකාරයකින් උපකාර වන්නාහ. පූර්ව ජවනයෝ පශ්චිම ජවනයන්හට ආසේවන ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ. එක්ව උපදනා වූ සහජාත චිත්ත චෛතසික ධර්මයෝ ඔවුනොවුන් හට සම්ප්‍රයුක්ත ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ. මෙසේ නාමය නාමයට සයාකාරයෙන් ප්‍රත්‍යය වන්නේය.

03. නාමය නාමරූපයට පස් ආකාරයකින් ප්‍රත්‍ය වන්නේ කෙසේද යත්, එකට උපදනාවූ සහජාත හේතු - ධ්‍යානාංග - මාර්ගාංගයෝ එකට උපදනාවූ සහජාත නාමරූපයන්හට හේතු - ධ්‍යාන - මාර්ග ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ. එකට උපදනා සහජාත චේතනාව සහජාත නාමරූපයන්හට ද, නානාක්ෂණික කුශලා කුශල චේතනා නම්වූකර්මයෝ කර්මයෙන් හටගන්නාවූ නාමරූපයන්ට ද කර්ම ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ. විපාක නාමස්කන්ධයෝ ඔවුනොවුන්ට හා සහජාත රූපයන්ට ද විපාක ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ. මෙසේ නාමය නාමරූපයන්හට හේතු - ධ්‍යාන - මාර්ග - කර්ම - විපාක නම් වූ පස් ආකාරයකින් ප්‍රත්‍ය වන්නේය.

04. නාමය රූපයට එක් ආකාරයකින් පමණක් ප්‍රත්‍ය වන්නේ කෙසේද යත්, පසුව උපදනා චිත්ත චෛතසික ධර්මයෝ, පූර්වයෙහි උපන්නාවූ මේ රූප කයට පශ්චාජාත ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ. මෙසේ නාමය රූපයට එක් ආකාරයකින් පමණක් ප්‍රත්‍ය වන්නේය.

05. රූපය නාමයට එක් ආකාරයකින් පමණක් ප්‍රත්‍යය වන්නේ කෙසේද යත්, චක්ඛු - සෝත - ඝාන - ජිව්හා - කාය - හදය නම් වූ වස්තුරූප සදෙනා චක්ඛුවිඤ්ඤාණ ධාතු - සෝත විඤ්ඤාණ ධාතු - ඝානවිඤ්ඤාණ ධාතු -ජිව්හාවිඤ්ඤාණ ධාතු - කාය විඤ්ඤාණ ධාතු මනෝ ධාතු - මනෝ විඤ්ඤාණ ධාතු නම් වූ විඤ්ඤාණ ධාතු සතට පුරේජාත ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ. එසේම රූප - ශබ්ද - ගන්ධ - රස - ස්පර්ශ නම් වූ අරමුණු පස්දෙනා, චක්ඛුවිඤ්ඤාණ වීථිය - සෝතවිඤ්ඤාණ වීථිය ඝාන විඤ්ඤාණ වීථිය

-ජිව්හා විඤ්ඤාණ වීථිය - කාය විඤ්ඤාණ වීථිය නම් වූ පඤ්ච විඤ්ඤාණ වීථියට ද පුරේජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන්නාහ. මෙසේ රූපය නාමයට එක් ආකාරයකින් ප්‍රත්‍යය වන්නේය.

06. ප්‍රඥප්තිය හා නාමරූපයෝ නාමයට දෙයාකාරයකින් ප්‍රත්‍යවන්නේ කෙසේද යත්, ප්‍රඥප්ති ධර්මයෝ ද, රූප - ශබ්ද - ගන්ධ - රස ස්පර්ශ - ධර්ම නම් වූ නාමරූපයෝ ද, ආරම්මණ - උපනිශ්‍රය නම් වූ ප්‍රත්‍යය ශක්ති දෙකකින් නාමයට උපකාර වන්නාහ.

07. උපනිශ්‍රය ප්‍රත්‍යය වනාහි ආරම්මණෝපනිශ්‍රය - අනන්තරෝපනිශ්‍රය ප්‍රකෘතෝපනිශ්‍රය නමින් තෙවැදෑරුම් වන්නේය. ඔවුනතුරෙන් දැඩිකොට ගනුලබන්නා වූ ගරුකතමාලම්බණය ආරම්මණෝපනිශ්‍රය නම් වන්නේය. අනන්තර නිරුද්ධ වූ චිත්ත චෛතසික ධර්මයෝ අනන්තරෝපනිශ්‍රය නම් වන්නේය. රාගාදී ක්ලේශයෝ ද ශ්‍රද්ධාදී සෝභන ධර්මයෝද සුඛ දුක්ඛයෝද පුද්ගලයෝද ආහාර පානාදී ඍතු කාලගුණයෝද සෙනසුන්ද, ආධ්‍යාත්මිකවූද බාහිර වූද කුශලාකුශල ධර්මයන්හට ද, කර්මය - විපාකයන්ට ද යනාදී වශයෙන් ප්‍රකෘතෝපනිශ්‍රය බොහෝ ආකාරයෙන් ප්‍රභේද වන්නේය.

08. නාමරූපයෝ නාමරූපයන්හට නවාකාරයකින් ප්‍රත්‍යය වන්නාහු කෙසේ ද යත්, අධිපති - සහජාත - අඤ්ඤමඤ්ඤ - නිශ්‍රය - ආහාර- ඉන්ද්‍රිය - විප්පයුත්ත - අත්ථි - අවිගත නම් වූ ප්‍රත්‍යය ශක්ති නවයකින් නාමරූපයෝ නාමරූපයන් හට උපකාර වන්නාහ.

09. ඔවුනතුරෙන් ගරුකතමාලම්බණ නම් වූ දැඩිව ගනු ලබන අරමුණ නාමධර්මයන්හට ආරම්මණාධිපති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන්නේය. ඡන්ද-විරිය - චිත්ත - විමංසා නම් වූ සහජාතාධිපති සතර දෙන වනාහි සහජාත නාමරූපයන්හට සහජාතාධිපති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන්නාහ. මෙසේ අධිපති ප්‍රත්‍යය දෙවැදෑරුම් වන්නේය.

10. සහජාත ප්‍රත්‍යය වනාහි තෙවැදෑරුම් වන්නේය. ඒ කෙසේද යත්, චිත්ත චෛතසික ධර්මයෝ ඔවුනොවුන්හටද, සහජාත රූපයන්ට ද සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන්නාහ. සතර මහා භූත රූපයෝ ඔවුනොවුන්ට ද, උපාදා රූපයන්හට ද සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන්නාහ. ප්‍රතිසන්ධික්ෂණයේ දී විපාක නාමස්කන්ධයෝ සහ හෘදය වස්තුරූපයද ඔවුනොවුන්හට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන්නාහ. මෙසේ සහජාත ප්‍රත්‍යය තෙවැදෑරුම් වන්නේය.

11. අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය ද තෙවැදෑරුම් වන්නේය. ඒ කෙසේද යත්, චිත්ත චෛතසික ධර්මයෝ ඔවුනොවුන්හට අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන්නාහ. සතර මහා භූත රූපයෝ ඔවුනොවුන්හට අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන්නාහ. ප්‍රතිසන්ධික්ෂණයේ දී විපාක නාමස්කන්ධයෝ ද, හෘදය වස්තුරූපයද ඔවුනොවුන්හට අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන්නාහ. මෙසේ අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය තෙවැදෑරුම් වන්නේය.

12. නිශ්‍රය ප්‍රත්‍යය ද තෙවැදෑරුම් වන්නේය, ඒ කෙසේ ද යත්, චිත්ත චෛතසික ධර්මයෝ ඔවුනොවුන්හට ද සහජාත රූපයන්හට ද නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන්නාහ. සතර මහා භූත රූපයෝ ඔවුනොවුන්හට සහ උපාදා රූපයන්හට ද නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන්නාහ. සවැදෑරුම් වූ වස්තුරූපයෝ විඤ්ඤාණ ධාතු සතටද නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවන්නාහ. මෙසේ නිශ්‍රය ප්‍රත්‍යය ද තෙවැදෑරුම් වන්නේය.

13. ආහාර ප්‍රත්‍යය වනාහි දෙවැදෑරුම් වන්නේය. ඒ කෙසේද යත්, කබලිංකාර ආහාරය මේ රූප කයට ආහාර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන්නේය. ඵස්සාහාර - මනෝසඤ්චේතනා

ආහාර - විඤ්ඤණාහාර නම් වූ අරූපී ආහාරයෝ තිදෙන සහජාත නාමරූපයන්හට ද ආහාර ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ. මෙසේ ආහාර ප්‍රත්‍යය දෙවැදෑරුම් වන්නේය.

14. ඉන්ද්‍රිය ප්‍රත්‍යය වනාහි තෙවැදෑරුම් වන්නේය. ඒ කෙසේද යත්, ප්‍රසාද වස්තු රූපයෝ පස්දෙනා පඤ්ච විඤ්ඤණයට ඉන්ද්‍රිය ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ. රූප ජීවිතේන්ද්‍රියය උපාදින්න රූප නම් වූ කර්මජ රූපයන්හට ඉන්ද්‍රිය ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නේය. අරූපී ඉන්ද්‍රියයෝ අටදෙනා වනාහි සහජාත නාමරූපයන්හට ඉන්ද්‍රිය ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ. මෙසේ ඉන්ද්‍රිය ප්‍රත්‍යය ද තෙවැදෑරුම් වන්නේය.

15. විප්‍රයුක්ත ප්‍රත්‍යයද තෙවැදෑරුම් වන්නේය. ඒ කෙසේද යත්, ප්‍රතිසන්ධික්ෂණයේදී හෘදය වස්තු රූපය විපාක නාමස්කන්ධයන් හටද, චිත්ත චෛතසික ධර්මයෝ සහජාත රූපයන්ටද සහජාත විප්‍රයුක්ත ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ. පශ්චාජාත චිත්ත චෛතසික ධර්මයෝ පුරේජාත මේ රූපකයට පශ්චා ජාත විප්‍රයුක්ත ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ. සයක් වූ වස්තුරූපයෝ ප්‍රවෘත්ති කාලයේදී සප්ත විඤ්ඤණ ධාතූන්හටද පුරේජාත විප්‍රයුක්ත ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නාහ. මෙසේ විප්‍රයුක්ත ප්‍රත්‍යද තෙවැදෑරුම් වන්නේය.

16. **සහජාතං පුරේ ජාතං - පච්ඡාජාතඤ්ච සබ්බථා**
**කබලීකාරෝ ආහාරෝ - රූපජීවිත මිච්චයං**

අත්ථි ප්‍රත්‍යය සහ අවිගත ප්‍රත්‍යයද පස් පස් වැදෑරුම් වන්නාහ. ඒ කෙසේ ද යත්, සහජාත අත්ථිය - සහජාත අවිගතය. පුරේජාත අත්ථිය - පුරේජාත අවිගතය, පච්ඡාජාත අත්ථිය - පච්ඡා ජාත අවිගතය, ආහාර අත්ථිය - ආහාර අවිගතය, ඉන්ද්‍රිය අත්ථිය ඉන්ද්‍රිය අවිගතය යි, මෙසේ අත්ථි - අවිගත උභය ප්‍රත්‍යය පස් වැදෑරුම් වන්නේය.

17. සූවිස්සක් වූ සියලුම ප්‍රත්‍යයෝ ප්‍රත්‍ය ශක්ති සතරකට සම්පිණ්ඩනය වන්නාහ. ඒ කෙසේද යත්, ආරම්මණප්‍රත්‍යය - උපනිශ්‍රය ප්‍රත්‍යය - කර්මප්‍රත්‍යය - අත්ථි ප්‍රත්‍යය නම් වූ ප්‍රත්‍ය ශක්ති සතරට සියලුම සූවිසි පට්ඨාන ප්‍රත්‍යයෝ සම්පිණ්ඩනය වන්නාහ.

18. සහජාත රූපය වනාහි දෙවැදෑරුම් වන්නේය. ඒ කෙසේද යත්, ප්‍රවෘත්ති කාලයෙහි සියලුම චිත්ත සමුට්ඨාන රූපය සහජාත රූපය නම් වන්නේය. ප්‍රතිසන්ධික්ෂණයේ දී සියලුම කර්මජ රූපය සහජාත රූපය නම් වන්නේය. මෙසේ සහජාත රූපය දෙවැදෑරුම් වන්නේය.

19. **ඉති තේ කාලිකා ධම්මා - කාලමුත්තා ච සම්භවා.**
**අජ්ඣත්තඤ්ච බහිද්ධාච - සංඛතා සංඛතා තථා**

**පඤ්ඤත්ති නාම රූපානං - වසේන තිවිධා ඨිතා**
**පච්චයා නාම පට්ඨානෙ - චතු වීසති සබ්බථා**

මෙසේ ලැබෙන පරිද්දෙන් ත්‍රෛකාලික වූද කාලවිනිර්මුක්ත වූද ආධ්‍යාත්මික වූද බාහිර වූද සංඛත වූද අසංඛත වූද ප්‍රඥප්තිය - නාමය - රූපයයි තුන් ආකාරයෙන් සිටියා වූ අනන්ත නය සමන්ත පට්ඨානයේ ප්‍රත්‍යයෝ සියලු ආකාරයෙන් සූවිස්සක් වන්නාහ.

20. ප්‍රඥප්ති - නාම - රූප අතුරෙන් අටවිසි වැදෑරුම් රූපස්කන්ධය රූපධර්ම නම් වන්නේය. චිත්ත චෛතසික තෙපණස නම් වූ අරූපස්කන්ධ සතරද නිර්වාණය ද යන පස් වැදෑරුම් ධර්මය නාමය නම් වන්නේය. එයින් අවශේෂ වූ ප්‍රඥප්තිය වනාහි දෙවැදෑරුම් වන්නේය. ඒ කෙසේද යත්, ඈත අතීතයේ සිට පණවනලද ප්‍රඥප්තියය, එදිනෙද පණවාගනු ලබන ප්‍රඥප්තිය දැයි මෙසේ ප්‍රඥප්තිය දෙවැදෑරුම් වන්නේය.

21. ඈත අතීතයේ සිට ලෝකවාසීන් විසින් පණවාගන්නාලද ප්‍රඥප්තිය වනාහි, පරමාර්ථ වශයෙන් විද්‍යමාන නොවන්නාවූ පරමාර්ථයන්ගේ සේයාවක් මෙන් වූ සිතින් අරමුණු කරවාගත හැකි වූ ඒ ඒ දෙය හේතුකොට - කාරණ කොට සිතා මතාගත් විවිධාකාරයෙන් පැණවූ සියල්ල පණවාගත් බැවින් ප්‍රඥප්තියයි කියනු ලබන්නේය. ඒ කෙසේද යත්, ඒ ඒ වස්තූන් පිහිටි ආකාරය අනුව සාගර - භූමි - පර්වත - ගංගා - වැව් - පොකොණු ආදියද, අවයව එකතුවෙන් සැදුනු රැස්වුණු ආකාර අනුව ගේ - දෙර - රථ වාහන යනාදියද, රූපාදී ස්කන්ධ පිහිටි ආකාර අනුව ස්ත්‍රී පුරුෂාදි ව්‍යවහාරද, සඳහිරු තාරකාදී ගමන අනුව දිශා - කාල යනාදියද යමකින් වටවූ අවකාශ අනුව ලෙන් - ගුහා - ළිං - සොරොව් ආදියද, ඒ ඒ ද්‍රව්‍යයන් හා භාවනා විශේෂ අනුව කසිණ නිමිත්තාදියද එසේ පණවාගත් බැවින් භාවිතා වන ප්‍රඥප්තිය නම් වන්නේය.

22. එදිනෙද පණවාගනු ලබන ප්‍රඥප්තිය වනාහි නම් තැබීම් ආදී වශයෙන් සවැදෑරුම් වන්නේය. ඒ කෙසේද යත්, 1. විද්‍යමාන ප්‍රඥප්ති 2. අවිද්‍යමාන ප්‍රඥප්ති - 3. විද්‍යමානයෙන් අවිද්‍යමාන ප්‍රඥප්ති, 4. අවිදමානයෙන් විද්‍යමාන ප්‍රඥප්ති, 5. විද්‍යමානයෙන් විද්‍යමාන ප්‍රඥප්ති, 6. අවිද්‍යමානයෙන් අවිද්‍යමාන ප්‍රඥප්ති යනුවෙන් සවැදෑරුම් වන්නේය.

23. ඔවුනතුරෙන් - 1. පරමාර්ථ වශයෙන් විද්‍යමානව ඇත්තාවූ රූප වේදනා - චිත්ත - චෛතසික යනාදිය හඳුන්වන වචනය විද්‍යමාන ප්‍රඥප්තිය නම් වන්නේය. 2. පරමාර්ථ වශයෙන් නැත්තා වූ ගස් - ගල් - පර්වතාදිය හඳුන් වන වචනය අවිද්‍යමාන ප්‍රඥප්තිය නම් වන්නේය. 3. ත්‍රිවිද්‍යාලාභියා - ෂට් අභිඥ ලාභියා යනාදිය වනාහි විද්‍යමානයෙන් අවිද්‍යාමාන ප්‍රඥප්තියයි, 4. ස්ත්‍රී ශබ්දය ශරීරයේ වේදනාව යනාදිය අවිද්‍යමානයෙන් විද්‍යමාන ප්‍රඥප්තියයි, 5. චක්ඛු විඤ්ඤාණය - සෝත විඤ්ඤාණය යනාදිය විද්‍යමානයෙන් විද්‍යමාන ප්‍රඥප්තියයි. 6. රාජ පුත්‍රයා - බ්‍රාහ්මණ මානවකයා - ධනපාල - සිරිවර්ධන යනාදිය වනාහි අවිද්‍යමානයෙන් අවිද්‍යමාන ප්‍රඥප්තිය නම් වේ. මෙසේ පණවනු ලබන ප්‍රඥප්තිය සවැදෑරුම් වන්නේය.

24.

| | | |
|---|---|---|
| **වචී සොසානු සාරෙන** | - | **සෝත විඤ්ඤාණ වීථියා** |
| **පවත්තානන්තරුප්පන්න** | - | **මනෝ ද්වාරස්ස ගොචරා** |
| **අත්ථා යස්සානු සාරෙන** | - | **විඤ්ඤායන්ති තතෝපරං** |
| **සායං පඤ්ඤත්ති විඤ්ඤෙය්‍යා** | - | **ලෝක සංකෙත නිම්මිතා** |

වචී ඝෝෂානු සාරයෙන් සෝතවිඤ්ඤාණ වීථියට අනතුරුව පහළවන මනෝ ද්වාරයට ගෝචර වූ අර්ථයෝ, යම් ව්‍යවහාර වචනයකට අනුව තේරුම් ගත හැකි වෙත්ද, ඒ මේ වචන ව්‍යවහාරය වනාහි ලෝක සංකේතයෙන් නිර්මිත වූ ප්‍රඥප්තියයි දතයුතු වන්නේය.

**ත්‍රිලක්ෂණ විදර්ශනාව**

1. සුවිසි පට්ඨාන සංග්‍රහ විභාග භාවනාවේදී පහළ වූ චිත්ත චෛතසික භූතරූප උපාද රූප නම් වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්මයෝ, ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝය.

2. ඇතිවීම් නැති වීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝය.

3. තම තමන් කැමති ලෙස නොපැවතී බැවින් අනාත්මයෝය.

4. අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ නාම රූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන සංඛත සන්තාප විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේය.

5. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව ආයූහණ නිදාන සංයෝග පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේය.

6. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිශ්ශරණ විවේක අසංඛත අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේය.

7. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතුවූ ආර්ය අෂ්ටාංගික මාර්ගය නියයාන හේතු දස්සන ආධිපතෙය්‍යාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේය.

8. මාගේ භාවනාමය කුශලානිසංස ධර්මය මෙම චතුරාර්ය සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිසම හේතු වේවා වාසනා වේවා

සාධු. සාධු. සාධු.

පදවිවරණය

01. නාමය නාමයට ප්‍රත්‍ය වීම :

වීථි මුක්ත නම් වූ භාවංග සිත් පෙළේ ද සදෙරෙහි වීථිසිත් පෙළේ ද සිතක් ඉපද නිරුද්ධ වනුයේ චිත්ත නියාමයට අනුව ඊ ළඟටම උපදින සිතට අනන්තර - සමනන්තර නාස්ති - විගත නම් වූ ප්‍රත්‍ය ශක්ති සතරකින් උපකාර වෙමිනි.

02. නාමය නාමයට ආසේවන වශයෙන් :

සදෙරිහිම පහළවන සියලුම කුශල ජවන් - අකුශල ජවන් ක්‍රියා ජවන් අතුරෙන් පළමු පළමු ජවනය නම් වූ නාමය, ඊළඟට උපදින ජවන් සිතට අනන්තර - සමනන්තර - ආසේවන - නාස්ති - විගත නම් වූප්‍රත්‍ය ශක්ති පසකින් උපකාර වන්නේය.

03. චිත්ත චෛතසික නාම ධර්මයෝ ඔවුනොවුන්හට :

එකට උපදින චිත්ත චෛතසික ධර්මයෝ ඔවුනොවුන්හට සහජාත - අඤ්ඤමඤ්ඤ - නිශ්‍රය සම්ප්‍රයුක්ත - අස්ති-අවිගත නම් වූ ප්‍රත්‍ය ශක්ති සයකින් ප්‍රත්‍ය උපකාර වන්නේය.

04. නානාක්ෂණික කර්මප්‍රත්‍යය :

සර්වචිත්ත සාධාරණ නම් වූ චේතනාව වනාහි සම්ප්‍රයුක්තවූ චිත්ත චෛතසිකයන්ටත් චිත්තජ රූපයන්ටත් සහජාත චේතනා නමින් කර්මප්‍රත්‍යයෙන් උපකාර වන්නේය. ලෞකික කුශල චේතනා සතලොසත් අකුශල චේතනා දෙළොසත් යන චේතනා එකුන් තිස් දෙනා මතුභවයන්හි ප්‍රතිසන්ධි ප්‍රවෘති විපාක දීමට සමත් බව නානාක්ෂණික කර්ම ප්‍රත්‍යය නම් වේ.

05. පච්ඡාජාත :

මලක් පිපීමට පළමුව මල්ගස් - මල්වැල් වැවී තිබෙන්නා සේ ද, දරුවාට පළමුව මවුපියන්ජීවත්වසිටින්නාසේද චිත්ත චෛතසිකයන්ට පළමුව රූප කය ජීවත්ව සිට උපකාර වීම පුරේජාත ප්‍රත්‍යයයි, එසේම දරුවන් විසින් දෙමාවුපියන්හට උපකාර වන්නා සේ පසුව උපදනා චිත්ත චෛතසික ධර්මයන් පළමුව ඉපද සිටින රූප කයට පිහිට වීම පච්චාජාත ප්‍රත්‍යය නම් වේ.

06. මනෝධාතු :

සිත් අසූ නවය අතුරෙන් පඤ්ච ද්වාරික චිත්තවීථි වලදීම ලැබෙන අරමුණ මැනගැනීම් මාත්‍රයක්ම ඇත්තාවූ පඤ්චද්වාරාවර්ජන - සම්පටිච්ඡන යුගලය නම් වූ සිත්තුන මනෝධාතුව නම් වේ.

07. ගරුකතමාලම්බණය :

දැඩි සේ සිතේ ඇඳෙන අරමුණ ගරුකත මාලම්බණයයි සැදැහැවතෙකුට දර්ශනීය බුදුරුවක් හෝ සම්පසාදනීය බුදු බණක් හෝ දකින්නට - අහන්නට ලැබුනු විට ඒ අරමුණ තදින්ම සිතට කාවැදී පවතියි,

5. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව ආයූහණ නිදාන සංයෝග පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේය.

6. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිශ්ශරණ විවේක අසංඛත අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේය.

7. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතුවූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය නියයාන හේතු දස්සන ආධිපතෙය්‍යාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේය.

8. මාගේ භාවනාමය කුශලානිසංස ධර්මය මෙම චතුරාර්ය සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිසම හේතු වේවා වාසනා වේවා

සාධු. සාධු. සාධු.

පදවිවරණය

01. නාමය නාමයට ප්‍රත්‍ය වීම :

වීථි මුක්ත නම් වූ භාවංග සිත් පෙළේ ද සදෙරෙහි වීථිසිත් පෙළේ ද සිතක් ඉපද නිරුද්ධ වනුයේ චිත්ත නියාමයට අනුව ඊ ළඟටම උපදින සිතට අනන්තර - සමනන්තර නාස්ති - විගත නම් වූ ප්‍රත්‍ය ශක්ති සතරකින් උපකාර වෙමිනි.

02. නාමය නාමයට ආසේවන වශයෙන් :

සදෙරිහිම පහළවන සියලුම කුශල ජවන් - අකුශල ජවන් ක්‍රියා ජවන් අතුරෙන් පළමු පළමු ජවනය නම් වූ නාමය, ඊළඟට උපදින ජවන් සිතට අනන්තර - සමනන්තර - ආසේවන - නාස්ති - විගත නම් වූප්‍රත්‍ය ශක්ති පසකින් උපකාර වන්නේය.

03. චිත්ත චෛතසික නාම ධර්මයෝ ඔවුනොවුන්හට :

එකට උපදින චිත්ත චෛතසික ධර්මයෝ ඔවුනොවුන්හට සහජාත - අඤ්ඤමඤ්ඤ - නිශ්‍රය සම්ප්‍රයුක්ත - අස්ති-අවිගත නම් වූ ප්‍රත්‍ය ශක්ති සයකින් ප්‍රත්‍ය උපකාර වන්නේය.

04. නානාක්ෂණික කර්මප්‍රත්‍යය :

සර්වචිත්ත සාධාරණ නම් වූ චේතනාව වනාහි සම්ප්‍රයුක්තවූ චිත්ත චෛතසිකයන්ටත් චිත්තජ රූපයන්ටත් සහජාත චේතනා නමින් කර්මප්‍රත්‍යයෙන් උපකාර වන්නේය. ලෞකික කුශල චේතනා සතලොසත් අකුශල චේතනා දෙළොසත් යන චේතනා එකුන් තිස් දෙනා මතුභවයන්හි ප්‍රතිසන්ධි ප්‍රවෘති විපාක දීමට සමත් බව නානාක්ෂණික කර්ම ප්‍රත්‍යය නම් වේ.

05. පච්ඡාජාත :

මලක් පිපීමට පළමුව මල්ගස් - මල්වැල් වැවී තිබෙන්නා සේ ද, දරුවාට පළමුව මවුපියන්ජීවත්වසිටින්නාසේද චිත්ත චෛතසිකයන්ට පළමුව රූප කය ජීවත්ව සිට උපකාර වීම පුරේජාත ප්‍රත්‍යයයි, එසේම දරුවන් විසින් දෙමාවුපියන්හට උපකාර වන්නා සේ පසුව උපදනා චිත්ත චෛතසික ධර්මයන් පළමුව ඉපද සිටින රූප කයට පිහිට වීම පච්චාජාත ප්‍රත්‍යය නම් වේ.

06. මනෝධාතු :

සිත් අසූ නවය අතුරෙන් පඤ්ච ද්වාරික චිත්තවීථි වලදීම ලැබෙන අරමුණ මැනගැනීම් මාත්‍රයක්ම ඇත්තාවූ පඤ්චද්වාරාවර්ජන - සම්පටිච්ඡන යුගලය නම් වූ සිත්තුන මනෝධාතුව නම් වේ.

07. ගරුකතමාලම්බණය :

දැඩි සේ සිතේ ඇඳෙන අරමුණ ගරුකත මාලම්බණයයි සැදැහැවතෙකුට දර්ශනීය බුදුරුවක් හෝ සම්පසාදනීය බුදු බණක් හෝ දකින්නට - අහන්නට ලැබුනු විට ඒ අරමුණ තදින්ම සිතට කාවැදී පවතීයි,

අලංකාරයට කැමැති කෙනෙකුට දැකුම්කළු පළඳනාවක්, රූමත් කාන්තාවක්, හැඩරුව ඇති පුරුෂයෙක්, යානාවක්. මාළිගාවක් පෙරහැරක් වැනි දේ දැකීමට ලැබීමෙන් ඒ අරමුණු දැඩි සේ ගනුලැබේ. එවැනි අරමුණු ගරුකතමාලම්බණ නම් වේ.

08. ආරම්මණාධිපති

ඉහත සඳහන් ගරුකතමාලම්බණයම චිත්තචෛතසික ධර්මයන්හට ආරම්මණාධිපති ප්‍රත්‍යයෙන් උපකාර වේ.

09. ආහාර :

ආහරතීති - ආහාරෝ, යමක් ගෙන එන්නා ආහාර නම් වේ. රූප කලාප ගෙන එන්නා රූප ආහාරයයි, වේදනාවක් ගෙන එන්නා ඵස්සාහාරයයි, ප්‍රතිසන්ධි විඤ්ඤාණය ගෙන එන්නා මනෝසංචේතනාහාරයයි, නාමරූප දෙක ගෙන එන්නා විඤ්ඤාණාහාරයයි. යමකට යමක් හේතු වේ නම් එයටද ආහාරයයි කියනු ලැබේ.

10. ඉන්ද්‍රිය :

ස්වකීය කාර්යයෙහි ඉසුරුමත් බව දරණ අර්ථයෙන් ඉන්ද්‍රීය නම ලැබේ. ඉන්ද්‍රීය ධර්ම දෙවිසි දෙන අතුරෙන් චක්ඛු- සෝත- ඝාන- ජිව්හා - කාය නම් වූ ප්‍රසාද ඉන්ද්‍රීය පසත් රූප ජීවිතින්ද්‍රියත් යන සය දෙන ඉන්ද්‍රිය ප්‍රත්‍යයෙන් උපකාර වෙති. නාම ජීවිතින්ද්‍රිය - මනින්ද්‍රිය - වේදනින්ද්‍රීය - ශ්‍රද්ධා - විරිය- සති- සමාධි ප්‍රඥා නම් වූ නාමේන්ද්‍රීය අට දෙන ඉන්ද්‍රිය ප්‍රත්‍යයෙන් උපකාර වෙති.

11. ප්‍රඥප්ති -

ලෝක සම්මුතිය ප්‍රඥප්තිය නම් වේ, ආවත්ථික-නේමිත්තික-ලිංගික-අධිච්ච සමුප්පන්න නමින් ලෝක සම්මුතිය සතරාකාර වේ. ඒ ඒ අවස්ථාවට අනුව තබන සම්මුතිය ආවත්ථිකයයි, ඒ මෙසේය, ළදරුවා-දරුවා-ළමයා තරුණයා-මහල්ලා යනාදිය එකම මිනිසාගේ අවස්ථා අනුව සම්මුති භාවිතා වේ. එය ආවත්ථිකයයි.

රන් -රිදී-මුතු- මැණික්-ගස-ගල ජලය - මුහුද - සඳ - හිරු - ස්ත්‍රිය -පුරුෂයා -නපුංසා - පැවිද්ද- රහත් - පසේබුදු -සම්මා සම්බුදු -ආදී යම් කිසි ගුණ විශේෂයක් අනුව භාවිතා කරනුයේ නේමිත්තික සම්මුතියයි.

ශාරීරිකව පරිහරණය කරන දෙයක් අනුව භාවිතා වන සම්මුතිය ලිංගික සම්මුතියයි. ගොවියා-රියදුරා- වැද්ද-හිඟන්නා යනාදියත් එයට ඇතුලත් වේ.

අර්ථයක් නොසලකා භාවිතා කරනුයේ අධිච්චසමුප්පන්න සම්මුතියයි. සිරිවර්ධන-ධනපාල- පියදස යනාදියයි. මෙසේ ලෝක සම්මුති ව්‍යවාහාරය ප්‍රඥප්තිය නම් වේ.

**නො : 64. සිරිපුර, තලවතුගොඩ, දයා තෙන්නකෝන්**
**ටෙරන්ස් හෙට්ටි ආරච්චි**
**වයලට් දහනත්ගම යන මහත්ම මහත්මීන්ගේ**
**පරලෝ සැපත් දෙමාපිය ගුරුවර ඥාති මිත්‍ර සමූහයාට සුවසේ නිවන් මග අවබෝධ වේවායි**
**මෙත් පැතුමින් ධර්මදානය ලෙස පිරිනැමේ.**

**නුගේගොඩ ගංගොඩවිල 37, සෝරත මාවතේ පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස්හි මුද්‍රණය කරවන ලදී.**

**රාජ්‍ය සේවා බෞද්ධ සංගමය**
**මහවැලි සංවර්ධන අමාත්‍යාංශය,**
**500 ටී. බී. ජයා මාවත,**
**කොළඹ 10.**
**2544 / වප් / 2000 ඔක්තෝම්බර් 04**

**අභිධර්ම විපස්සනා භාවනා පාඩම අංක - 23**

## අභිධර්මාර්ථ සංග්‍රහ - කර්මස්ථාන සංග්‍රහ විභාගය 02

## අති පූජ්‍ය නා උයනේ අරිය ධම්ම නාහිමිපාණන් වහන්සේ විසින්

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!

01 සමථ විදර්ශනා කර්මස්ථාන භාවනා දෙක අතුරෙන් විදර්ශනා භාවනාව උගෙනීම පිණිස, සප්ත විශුද්ධිය ද ත්‍රිලක්ෂණය ද ත්‍රිවිධ අනුපස්සනාව ද දශවිධ විදර්ශනා ඥානය ද ත්‍රිවිධ විමෝක්ෂය ද ත්‍රිවිධ විමෝක්ෂ මුඛය ද යන සියල්ල දතයුතු වන්නේය.

02. ඔවුනතුරෙන් සප්තවිශුද්ධිය නම් කවරේද යත්, ශීලවිශුද්ධිය චිත්ත විශුද්ධිය - දෘෂ්ටිවිශුද්ධිය - කංඛාවිතරණ විශුද්ධිය - මග්ගා මග්ග ඥානදර්ශන විශුද්ධිය - ප්‍රතිපද ඥානදර්ශන විශුද්ධිය - ඥානදර්ශන විශුද්ධිය යයි විශුද්ධි භාවනාව සත් වැදෑරුම් වන්නේය.

03. අනිත්‍ය ලක්ෂණය - දුක්ඛලක්ෂණය - අනාත්ම ලක්ෂණයයි සංස්කාරයන්ගේ පොදු ලක්ෂණය තෙවැදෑරුම් වන්නේය, අනිත්‍යානුපස්සනාව - දුක්ඛානුපස්සනාව - අනත්තානුපස්සනාව යයි අනුපස්සනාවද තෙවැදෑරුම් වන්නේය.

04. සන්මර්ශන ඥානය - උදයව්‍යය ඥානය - භංගානුපස්සනා ඥානය භයතුපට්ඨාන ඥානය - ආදීනවානුපස්සනා ඥානය - නිබ්බිද ඥානය - මුඤ්චිතුකම්‍යතා ඥානය - පටිසංඛානුපස්සනා ඥානය - සංඛාරුපෙක්ඛා ඥානය - අනුලෝම ඥානයයි විදර්ශනා ඥානය දශ වැදෑරුම් වන්නේය.

05. සුඤ්ඤත විමෝක්ෂය - අනිමිත්ත විමෝක්ෂය - අප්පණිහිත විමෝක්ෂයයි විමෝක්ෂය ද තෙවැදෑරුම් වන්නේය. සුඤ්ඤතානුපස්සනාවය - අනිමිත්තානුපස්සනාවය - අප්පණිහිතානු පස්සනාව යයි විමෝක්ෂ මුඛය ද තෙවැදෑරුම් වන්නේය.

06. සප්ත විශුද්ධිය අතුරෙන් සීලවිශුද්ධිය වනාහි ප්‍රාතිමෝක්ෂ සංවර සීලය - ඉන්ද්‍රිය සංවර සීලය - ආජීව පාරිශුද්ධි සීලය - ප්‍රත්‍ය සන්නිශ්‍රිත සීලයයි සීලවිශුද්දිය සිවු වැදෑරුම් වන්නේය. සමාදන්ව ගන්නාලද සික පද අතුරෙන් මුලින් හෝ අගින් නොබිඳ රක්නා ලද බැවින් අඛණ්ඩ නම් වූද, මැදින් නොබිඳ රක්නා ලද බැවින් අච්ජිද්‍ර නම් වූද, පේලියට සිකපද නොබිඳ රක්නා ලද බැවින් අසබල නම් වූද, තැනින්තැන නොබිඳ රක්නා ලද බැවින් අකල්මාස නම් වූද, තෘෂ්ණාවට වහල් නොවී රක්නා ලද බැවින් භුජිස්ස නම් වූද, බුදුපසේබුදු මහරහතන් බෝධිසත්වයන් විසින් සාධුකියා සතුටු විය හැකි වන සේ රක්නා ලද බැවින් විඤ්ඤූප්පසත්ථ නම් වූද, තෘෂ්ණා දෘෂ්ටි දෙකින් නොගෙන රක්නා ලද බැවින් අපරාමට්ඨ නම් වූද උපචාර සමාධි අර්පණා සමාධි ප්‍රතිලාභයට සමත් බැවින් සමාධි සංවත්තනික නම් වූද සික්ෂා පද ශීලය ප්‍රාතිමෝක්ෂ සීලය නම් වන්නේය.

07. චක්ෂු - ශ්‍රෝත - ඝාන - ජිව්හා - කාය - මනෝ නම් වූ සදෙරට හමුවන රූප - ශබ්ද - ගන්ධ - රස - ස්පර්ශ - ධර්ම නම් වූ අරමුණු හේතුවෙන් තෘෂ්ණා - දෘෂ්ටි - මාන - ද්වේශ - ඊර්ෂ්‍යා - මාත්ශර්යාදී පාප ක්ලේශයන් නූපදනා සේ අවදි වූ සතියෙන් යුක්තව රක්නා ලද සංවරය ඉන්ද්‍රිය සංවර සීලය නම් වන්නේය.

08. ප්‍රාණඝාත - අදත්තාදන - කාමමිථ්‍යාචාර - මුසාවාද - පිසුණා වාච ඵරුසාවාච සම්ඵප්‍රලාප නම් වූ - අකුශල කර්මපථ සතෙන් ද, ප්‍රාණඝාතනය සඳහා නියමිත ආවුධ වෙළඳම - වහල් වෙළඳම - මස් පිණිස සතුන් වෙළඳම - මත් ද්‍රව්‍ය වෙළඳම - වස විෂ

වෙළඳම - ජීව නෝපාය සඳහා ඉහත සඳහන් ද්‍රව්‍ය නිෂ්පාදනය ද, අනාගාරික පැවිද්දන් විසින් අෂ්ඨ කුලදූෂණ - එක්විසි අන්වේෂණ - කුහනා - ලපනා - නේමිත්තිකතා - නිප්පේසිකතා - ලාභෙන ලාභං නිජිගිංසනතා යනාදී වූ සියලු ආකාර අධාර්මික ආජිවිකාවෙන්ද සම්පූර්ණයෙන් වැළකී ධාර්මික ජීවනෝපාය අනුගමනය කිරීම ආජීවපාරිසුද්ධි ශීලය නම් වන්නේය.

09. අනාගාරික බුද්ධ පුත්‍රයන් වහන්සේලාගේ ජීවිත පරිෂ්කාර වශයෙන් තථාගතයන් වහන්සේ අනුදැන වදළා වූ චීවර - පිණ්ඩපාත - සේනාසන - ගිලන්පස නම් වූ සිවුපසය ථෙය්‍ය පරිභෝගයට හෝ ඉණ පරිභෝගයට නොවැටී දායජ්ජ පරිභෝගයට අනුකූලවන සේ පිළිගැනීමේදී ද පරිභෝගයේදී ද තෘෂ්ණා - දෘෂ්ඨි- මානාදී උපක්ලේශයන් නූපදනා පිණිස, බෝධිපාක්ෂක ධර්මයන් වැඩෙනු පිණිස ප්‍රයෝජන වශයෙන් ද - ධාතුවශයෙන්ද - පිළිකුල් වශයෙන් ද ප්‍රත්‍යවේක්ෂා ඥානය පැවැත්වීම ප්‍රත්‍යසන්නිශ්‍රිත ශීලය නම් වන්නේය. මෙසේ චතුපාරිශුද්ධි සීලය චිත්ත විශුද්ධි ආදී විශුද්ධි භාවනා ප්‍රතිලාභයට පාදක වන බැවින් සීලවිසුද්ධිය නම් වන්නේය.

10. දශවිධ උපචාර කර්මස්ථානයෙන් ද අර්පණා කර්මස්ථාන සමතිසෙන් ද ලැබෙන්නාවූ උපචාර සමාධිය ද, අෂ්ඨ සමාපත්තිය ද පඤ්චනීවරණාදී උපක්ලේශයන් විෂ්කම්භනය කරවා විදර්ශනා ඥාන මාර්ග ඵලඥාන අධිගමයට පාදක වන බැවින් චිත්ත විශුද්ධිය නම් වන්නේය.

11. අටවිසි රූපය ද දෙපණස් චෛතසිකද, කෘත්‍ය වශයෙන් තුදුස් වැදෑරුම් චිත්තය ද, පටිච්චසමුප්පාද අංග දෙළස ද යනාදී නාමරූප ධර්මයන්ගේ එකක් පාසා ඇත්තාවූ, ලක්ඛණ රස - පච්චුපට්ඨාන - පදට්ඨාන නම් වූ සතරාකාරයෙන් හාත්පසින් පරිග්‍රහණය කිරීමේ ප්‍රඥව දිට්ඨි විශුද්ධිය නම් වන්නේය. පටිච්ච සමුප්පාද අනුසාරයෙන් ඒ සියලු නාමරූපයන්ගේ හේතුඵල සම්බන්ධතාව හාත්පසින් දක්නා ඥානය කංඛාවිතරණ විශුද්ධිය නම් වන්නේය.

12. එතැන් සිට එසේ නාමරූප පරිච්ඡේද ඥානයෙන් සහ ප්‍රත්‍ය පරිග්‍රහ ඥානයෙන් පිරිසිඳ ගන්නා ලද්දවූ ප්‍රත්‍ය සහිත වූ තුන්ලොවටම අයත් වූ ත්‍රෛභූමිකවූද අතීත වූද වර්තමාන වූද අනාගත වූද සියලු සංස්කාරයන් ස්කන්ධ - ආයතන - ධාතු යනාදී වශයෙන් පිඩුකොට කලාප සන්මර්ශනය කරනු ලබන්නේය. 'අනිච්චං ඛයට්ඨෙන දුක්ඛං භයට්ඨෙන - අනත්තා අසාරකට්ඨෙන' ගෙවී ගෙවී නැසී නැසී යන අර්ථයෙන් අනිත්‍යයි ද, භය ජනක අර්ථයෙන් දුක්ඛයයි ද, අසාර නිස්සාර අර්ථයෙන් අනාත්ම යයි ද විදර්ශනා කරනු ලබන්නේය.

13. අතීතාදී අද්ධාන කාල වශයෙන් ද ඉරියාපථාදී සන්තති වශයෙන් ද චිත්ත වීථි ආදී ක්ෂණ වශයෙන් ද අනිත්‍ය දුක්ඛ අනාත්ම නම් වූ ත්‍රිලක්ෂණය සන්මර්ශනය කරනු ලබන කල්හි, ප්‍රත්‍ය වශයෙන් සහ ක්ෂණ වශයෙන් උදයව්‍යය ඥානයෙන් උදය - වය දැකීමේදී දශ විධ විදර්ශනා උපක්ලේශයන් ද විදර්ශනා කළමනා වන්නේය.

14. ඕභාසො පීති පස්සද්ධි - අධිමොක්ඛො ච පග්ගහො
සුඛං ඤණං මුපට්ඨාන - මුපෙක්ඛා ච නිකන්තිච

දශවිධ විදර්ශනා උපක්ලේශයෝ නම් කවරේද යත්, ආලෝකය - ප්‍රීතිය - පස්සද්ධිය - අධිමෝක්ෂය - වීර්යය සුඛය - ඥානය - සතිය - උපේක්ෂාවය - විදර්ශනා නිකාන්තිය යන මේ දශ දෙනා නොලද අධිගම ලබන ලදැයි මුලාකරවන බැවින්, ඔවුනට නොරැවටී විදර්ශනා කළයුතු වූ උපක්ලේශයෝ නම් වන්නාහ.

15. දශවිධ විදර්ශනා උපක්ලේශයන්ද ත්‍රිලක්ෂණයට නංවා ඔවුන් අභිභවා ජයගෙන ඉදිරියට යායුතු වූ විදර්ශනා මාර්ගය පැහැදිළිව තෝරාගෙන මාර්ග - අමාර්ග දෙක වෙන් කොට ගන්නා ලද්දවූ විදර්ශනා ඥානය මග්ගාමග්ග ඥාන දර්ශන විසුද්ධිය නම් වන්නේය.

16. විදර්ශනා උපක්ලේශයන්ගෙන් ජයගත් තැන් සිට උදයව්‍යය ඥානය - භංගානුපස්සනා ඥානය - භයතුපට්ඨාන ඥානය - ආදීනවානු පස්සනාඥානය. නිබ්බිදනුපස්සනා ඥානය - මුඤ්චිතුකම්‍යතා ඥානය පටිසංඛානුපස්සනා ඥානය - සංඛාරුපෙක්කා ඥානය - අනුලෝම ඥානය තෙක් ඇත්තා වූ නවමහා විදර්ශනා ඥානය වනාහි පටිපද ඥානදර්ශන විශුද්ධිය නම් වන්නේය.

17. නවමහා විදර්ශනා ඥාන අතුරෙන් උදයව්‍යය ඥාන භාවනාවේදී රූප සප්තක අරූප සප්තක වශයෙන් ද ප්‍රත්‍ය වශයෙන් හා ක්ෂණ වශයෙන් විදර්ශනා වැඩිය යුතු වන්නේය. ඔවුන් අතුරෙන් රූප සප්තකය වනාහි මේ ආත්මභාවය සම්බන්ධ වූ ප්‍රතිසන්ධි - චුති අතර නාමරූප විදර්ශනාව නම් වූ ආදාන නික්ඛේපයද, සියක් වසර දශක දහයට, පඤ්චක විස්සට, තික තෙතිසට, දෙවසර බැගින් පණහට, වසර බැගින් සියයට, මාස සතර බැගින් තුන් ඍතුවට, මාස දෙක බැගින් ඍතු සයට, එක මාසයට, අට මාසයට, එක් දිනට, රාත්‍රියට, දවාලට, යාම සයට, යාම - ඒම - නැමීම - දිග හැරීම - ඇදීම - පෙරවීම - ආහාරපාන ගැනීමාදියට, පියවර ඔසවීම - යැවීම දිගහැරීම - පහත් කිරීම - තැබීම - පැගීම යනාදී කොටස් සයට බෙද බෙද වඩන විදර්ශනාව නම් වූ වයෝවුද්ධත්ථගාමී වශයෙන්ද, ආහාර වශයෙන් - ඍතු වශයෙන් - චිත්ත වශයෙන් - කර්ම වශයෙන් සහ ධර්මතාරූප වශයෙන් ද යන රූප සප්තක විදර්ශනාව පැවැත්විය යුතු වන්නේය.

18. අරූප සප්තක විදර්ශනාව වනාහි, ඉහත සඳහන් කළ සප්තාකාර රූප විදර්ශනාව වඩා ඉන් අනතුරුව එම විදර්ශනා කළ සිත වෙනත් සිතකින් විදර්ශනා කිරීම නම් වූ කලාප වශයෙන්, එම දෙවැනි සිත තුන්වැනි සිතකින් විදර්ශනා කිරීම නම් වූ යමක වශයෙන් ද, සිත් පරම්පරා සතරක් ම විදර්ශනා කිරීම නම් වූ ක්ෂණ වශයෙන්ද, සිත් පරම්පරා දහය තෙක් විදර්ශනා කිරීම නම් වූ පටිපාටි වශයෙන්ද විදර්ශනා වඩන්නතු නොමැති බවත්, පරමාර්ථ ධර්ම මාත්‍රයක්ම විදර්ශනා කරන බවක් අවබෝධ වීමෙන් දිට්ඨිඋග්ඝාටන වශයෙන් ද, ස්වකීය විදර්ශනාවේ උසස් - පහත් බවක් නොසලකන්නා වූ මානසමුග්ඝාතන වශයෙන් ද, විදර්ශනාවෙන් ලැබෙන ප්‍රීති සුඛ සාත ලක්ෂණයන් ආස්වාද නොකිරීම නම් වූ නිකාන්ති පරියාදන වශයෙන්ද යන ආකාර සතකින් අරූප සප්තක විදර්ශනාව පැවැත්වියයුතු වන්නේය.

19. ප්‍රත්‍ය වශයෙන් සහ ක්ෂණ වශයෙන් උදයව්‍යය දැකීමේදී සියලු නාමරූපයන් ස්කන්ධ වශයෙන් පසකට බෙදගනු ලබන්නේය. රූපස්කන්ධයට, ප්‍රත්‍ය වශයෙන් අවිද්‍යා - තෘෂ්ණා - කර්ම - ආහාර නම් වූ සමුදය සතරද, ක්ෂණ වශයෙන් උත්පාදය ද විදර්ශනා කළමනා වන්නේය. වේදනා - සඤ්ඤා - සංස්කාර ස්කන්ධ තුනට ප්‍රත්‍ය වශයෙන් අවිද්‍යා - තෘෂ්ණා - කර්ම - ස්පර්ශ නම් වූ සමුදය සතරද, ක්ෂණ වශයෙන් උත්පාදයද විදර්ශනා කළ මනා වන්නේය. විඤ්ඤාණස්කන්ධයට වනාහි ප්‍රත්‍ය වශයෙන් අවිද්‍යා - තෘෂ්ණා - කර්ම - නාමරූප නම් වූ සමුදය සතරද ක්ෂණ වශයෙන් උත්පාදය ද විදර්ශනා කළමනා වන්නේය. මෙසේ ස්කන්ධ පඤ්චකයට ප්‍රත්‍ය වශයෙන් සමුදයවාර සම විස්සක්ද ක්ෂණ වශයෙන් සමුදයවාර පසක් දැයි සමුදය පස්විස්සක් වන්නාහ. නිරෝධ වාරයෝද එසේම පස් විස්සක්ම වන්නාහ. මෙසේ හෙයින් ස්කන්ධපඤ්චකයාගේ වශයෙන් උදයව්‍යය ඥානය සම පණස් වැදෑරුම් වන්නේය.

26. සංකාරුපෙක්ඛා ඥානය නම්කවරේද යත්, අනන්ත සසර පටන් මම - මාගේ යයි දැඩිව ගෙන පැවැත් වූ පඤ්චස්කන්ධය පිලිබඳව උදය-වය - භංගය - භය - ආදීනව - නිබ්බිද- සියල්ල දැක මුඤ්චිතුකම්‍යතා - පටිසංඛා ඥානයෙන් දැඩි සේ ත්‍රිලක්‍ෂවිදර්ශනාව වැඩීමේ දී, මග-පල-නිවනට ඉතාමත් සමීප ආසන්න බවට පත් වන බැවින් බිය ජනක සංස්කාරයන් කෙරෙහි එතෙර වීමේ උපාය සලකා ඒ මත පිහිටා ලබන මධ්‍යස්ථ වූ විදර්ශනා ඥානය සංඛාරුපෙක්ඛා ඥානය නම් වන්නේය. සිඛාප්පත්ත විදර්ශනාවය - උට්ඨානගාමිනී විදර්ශනාවය යනුවෙන් ද සංඛාරුපෙක්ඛා ඥානය හැඳින්වෙන්නේය.

27. අනුලෝම ඥානය නම් කවරේද යත්, යම් කලෙක සංඛාරුපෙක්ඛා ඥානය මුදුන්පත් වී මාර්ග චිත්ත වීථියට බැසගනු ලැබේද එකල්හි භවංගයෙන් නැගී මනෝද්වාරාවර්ජනය - පරිකර්ම උපචාර - අනුලෝම - ගෝත්‍රභූ - මාර්ග චිත්තයට අනතුරුව ඵල සිත් දෙකකින් පසු භවංග පතිත වන්නේය. එහි දී ආවර්ජන සිතට අනතුරුව පහළ වූ පරිකර්ම- උපචාර- අනුලෝම- නම් වූ ජවන් සිත්තුනෙහි වූ ඥානය වනාහි, උදයව්‍යය ඥානය ආදිකොට ඇත්තා වූ විදර්ශනා ඥාන අට දෙනාහට අනුලෝම වන බැවින් ද මාගීඵල චිත්තයන්හි ලැබෙන්නා වූබෝධිපාක්ෂික ධර්මයන්හට අනුලෝම වන බැවින්ද අනුලෝම ඥානය නම් වන්නේය. මෙතෙක් පැවති නවමහා විදර්ශනාඥානය වනාහි පටිපද ඥානදර්ශන විශුද්ධිය නම් වන්නේය.

28. ඥාන දර්ශන විශුද්ධිය නම් කවරේද යත්, ඉහත සඳහන් වූ අනුලෝම ඥානයට අනතුරුව, පෘථග්ජන ගෝත්‍රය අවසන් කරමින් ආර්ය ගෝත්‍රයට යොමුවෙමින් නිවන අරමුණු කොට ගෝත්‍රභූ සිත පහළ වන්නේය. ඉන්අනතුරුවම දුක්ඛ සත්‍යය පිරිසිඳිමින් - සමුදය සත්‍යය ප්‍රහානය කරමින් - නිරෝධ සත්‍යය සාක්‍ෂාත් කරමින් මාර්ග සත්‍යය භාවනා වශයෙන් අර්පණා වීථියට බැස ගන්නේය. ඉන් අනතුරුව ඵල සිත් දෙක තුනක් පැවතී භවංග පතිත වන්නේය. නැවතත් භවංගය සිඳී මාර්ගය - ඵලය - නිර්වාණය - ප්‍රහීන ක්ලේශ අවශේෂ ක්ලේශයන් ද ප්‍රත්‍යවෙක්ෂා කෙරෙන ප්‍රත්‍යවෙක්ෂා ඥාන වීථි පහළ වන්නාහ.

29. **මග්ගං ඵලඤ්ච නිබ්බානං -** **පච්චවෙක්ඛති පණ්ඩිතො**
**හීනෙ කිලෙසෙ සෙසෙ ච -** **පච්චවෙක්ඛති වා නවා**
**ඡබ්බිසුද්ධිකමෙනෙවං -** **භාවෙතබ්බො චතුබ්බිධො.**
**ඤාණ දස්සන විසුද්ධි -** **නාම මග්ගො පවුච්චති**

මාර්ගඵලාධිගම ලාභී තෙමේ මාර්ගයද ඵලයද නිර්වාණයද ප්‍රත්‍යවේක්ෂා කරන්නේය. ප්‍රහීණ ක්ලේශයන් ද අවශේෂ ක්ලේශයන්ද ප්‍රත්‍යවේක්ෂා කරන්නේද ඇතැම් විට නොකරන්නේද වේ. සවැදෑරුම් විශුද්ධි අනුපිළිවෙලින් මෙසේ භාවනා වශයෙන් වැඩිය යුතුවූ මාර්ගඥාන සතර දෙනා වනාහි ඥානදර්ශන විශුද්ධිය නම් වන්නේය.

සප්ත විශුද්ධි ප්‍රභේදය සමාප්තයි.

**ත්‍රිලක්‍ෂණ විදර්ශනාව**

1. පටිච්ච සමුප්පාද - පට්ඨාන ප්‍රත්‍යය විදර්ශනා භාවනාවේදී පහළ වූ චිත්ත - චෛතසික - භූතරූප - උපාදරූප නම් වූ නාම රූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්මයෝ ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝය.
2. ඇතිවීම් නැති වීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝය.
3. තම තමන් කැමති ලෙස නොපැවතී බැවින් අනාත්මයෝය.
4. අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ චිත්ත චෛතසික භූතරූප උපාදු රූප නම් වූ නාම රූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන සංඛත සන්තාප විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේය.

5. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව ආයූහන නිදාන සංයෝග පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේය.

6. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ විවේක අසංඛත අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේය.

7. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතුවූ ආර්ය අෂ්ටාංගික මාර්ගය නියාණ හේතු දස්සන ආධිපතෙය්‍යාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේය.

8. මාගේ භාවනාමය කුසලානිසංස ධර්මය මෙම චතුරාර්ය සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිසම හේතු වේවා වාසනා වේවා

සාධු. සාධු. සාධු.

**පදවිවරණය**

01. විමොක්ඛ මුඛ - මාර්ග චිත්ත වීථියේදී අනුලෝම සිත් තුනට නමකි.

02. විමොක්ඛ - මාර්ග චිත්තයට නමකි. සුඤ්ඤත - අනිමිත්ත අප්පණිහිත නමින් විමෝක්ෂය තෙවැදෑරුම් වන්නේය.

03. කුහනා - ලාභ සත්කාර අපේක්ෂාවෙන්, සිවුපසය ප්‍රතික්ෂේපකිරීම අධිගම ලාභීයයි පර්යායෙන් ඇඟවීම - ඉරියව් පැවැත්විම යන තුන් ආකාරයෙන් මිනිසුන් විශ්මයට පත්කිරීමය.

04. ලපනා - තමන් ද දයකයන් ද උසස් කොට කථා කිරීම.

05. නෙමිත්තිකතා - පහදවා ගැනීම පිණිසම වචන පෙරළා කථාකිරීම.

06. නිප්පෙසිකතා - සිවුපසය සඳහාම දෙස් නගා කථා කිරීම.

07. ලාභේන ලාභං නිජිගිංසනතා - තමා ලත් දෙය දයකයන්ට දී දයකයන්ගෙන් ප්‍රණීත දෙය ලබාගැනීම.

08. ලක්ඛණ - රස - පච්චුපට්ඨාන - පදට්ඨාන

නාම රූප සංස්කාරයන්ගේ එකක් පාසා පිහිටා ඇත්තාවූපෞද්ගලික ස්වභාවය ලක්ඛණ නම් වේ. ඒ ඒ නාම රූපයන්ගේ ක්‍රියා කාරිත්වය හා ප්‍රතිඵලය රසය නම් වේ. සිතට අරමුණුවන ආකාරය පච්චුපට්ඨාන නම් වේ. ඒ ඒ නාම රූප ධර්මයට ආසන්නතම ප්‍රධාන හේතුව පදට්ඨාන නම් වේ.

09. සප්ත විශුද්ධි : චතුපාරිශුද්ධි ශීලයෙන් වීතික්කම කෙලෙසුන් කෙරෙන්ද, චිත්ත විශුද්ධියෙන් පරියුට්ඨාන කෙලෙසුන් කෙරෙන්ද ඉතිරි ලෞකික විශුද්ධි සතර පදනම් කොටගෙන ඥානදර්ශන විශුද්ධියෙන් අනුශය කෙලෙසුන් ගෙන්ද සිත පිරිසුදු වන බැවින් විශුද්ධිනම් වෙති.

1. **රාජකීය පණ්ඩිත කඩවැද්දුවේ ජිනවංශ මහ නාහිමි පාණන්වහන්සේ අතිපූජ්‍ය නාළයනේ අරියධම්ම මහා හිමිපාණන්වහන්සේ** ඇතුළු ආරණ්‍යවාසි සියලුම ස්වාමීන් වහන්සේලාට දීර්ගායු ශ්‍රී සම්පත්තිය පිණිසත්

2. අපවත්වී වදළ අප **ගුරුදේව කෝට්ටේ ශ්‍රී දේවානන්ද මහා ස්වාමීන්වහන්සේට** දැනට වැඩවසන **නන්ද ස්වාමීන්වහන්සේ** ඇතුළු කල්‍යාණි ධර්ම යෝගාශ්‍රම වාසි සියලු භික්ෂූන් වහන්සේලාට නිවන්සුව පිණිසත්

3. **මා මිත්‍ර වයි. වයි. ද සිල්වා මහත්ම මහත්මාවන් ඇතුළු සියලු ඥාති හිත මිත්‍රාදීන්ටත් ලෝකපාලක ශාසන රක්ෂක උතුම් දිව්‍යරාජ සමූහයාටත් මේ උතුම් පිණ උතුම් නිවන් සැප පිණිසම වේවා!**

365 ගාලුපාර, පානගර පී. ජී. පෙරේරා හා වයි වයි ද සිල්වා යන මහත්මාවන් විසින් ධර්මදානය වශයෙන් පිරිනැමේ.

**රාජ්‍ය සේවා බෞද්ධ සංගමය**
**සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය**
**අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,**
**කොළඹ 10.**
**2544 දුරුතු/ 2001 ජනවාරි 03**

**නුගේගොඩ ගංගොඩවිල 37 සෝරත මාවතේ පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස්හි මුද්‍රණය කරවන ලදී.**

## අභිධර්ම විපස්සනා භාවනා පාඩම අංක - 22

## අභිධර්මාර්ථ සංග්‍රහ - කර්මස්ථාන සංග්‍රහ විභාගය 01

## අති පූජ්‍ය නා උයනේ අරිය ධම්ම නාහිමිපාණන් වහන්සේ විසින්

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!

01 සමථ විපස්සනානං - භාවනාන මිතෝ පරං
කම්මට්ඨානං පවක්ඛාමි - දුවිධම්පි යථාරහං

චිත්තය චෛතසිකය රූපය නිර්වාණය නම් වූ සතර පරමාර්ථ ධර්මයන් සම්පිණ්ඩනය කරමින් චිත්ත සංග්‍රහ විභාගයේ සිට ප්‍රත්‍ය සංග්‍රහ විභාගය තෙක් පරිච්ඡේද අටකින් අභිධර්මාර්ථ සංග්‍රහය සපුරා මෙතැන් සිට, සමථ විපස්සනා භාවනා ක්‍රම දෙක පිළිබඳ දෙයාකාරවූ කර්මස්ථානය සුදුසු පරිද්දෙන් සංග්‍රහ කොට දක්වන්නෙමි.

02. සමථ විපස්සනා දෙක අතුරෙන් සමථ සංග්‍රහය සත් වැදෑරුම් වන්නේය. ඒ කෙසේද යත්, දස කසිණය - දස අසුභය - දස අනුස්සතිය - සතර අප්පමඤ්ඤය - සඤ්ඤ එකය - ව්‍යවස්ථාන එකය ආරූප්‍ය සතර යයි මෙසේ සමථ සංග්‍රහය සත් වැදෑරුම් වන්නේය.

03. සමථ විපස්සනා වඩන්නාවූ යෝගාවචරයන්ගේ චරිත සංග්‍රහය සය වැදෑරුම් වන්නේය. ඒ කෙසේද යත්, රාග චරිතයාය - දෝස චරිතයාය - මෝහ චරිත යාය - ශ්‍රද්ධා චරිතයාය - බුද්ධි චරිතයාය - විතර්ක චරිතයා යයි මෙසේ චරිත සංග්‍රහ සයවැදෑරුම් වන්නේය.

04. සමථ භාවනාවේ කර්මස්ථාන නිමිත්තද - භාවනාවද තුන් - තුන් වැදෑරුම් වන්නේය. ඒ කෙසේද යත්, පරිකර්ම නිමිත්තය- උද්ග්‍රහ නිමිත්තය - ප්‍රතිභාග නිමිත්ත යයි නිමිත්ත තුන්වැදෑරුම් වන්නේය. පරිකර්ම භාවනා උපචාර භාවනා - අර්පණා භාවනා යයි භාවනාවද තුන් වැදෑරුම් වන්නේය.

05. දස කසිණය නම් කවරේද යත්, පඨවි කසිණය - අපෝ කසිණය - තේජෝ කසිණය - වායෝ කසිණය - නීල කසිණය - පීත කසිණය - ලෝහිත කසිණය - ඕදත කසිණය - ආලෝක කසිණය - ආකාස කසිණයයි කසිණය දස වැදෑරුම් වන්නේය.

06. දස අසුභය නම් කවරේද යත්, උද්ධුමාතක අසුභය, විනීලක අසුභය - විපුබ්බක අසුභය - විච්ඡිද්දක අසුභය, වික්ඛායිතක අසුභය - වික්ඛිත්තක අසුභය - හතවික්ඛිත්තක අසුභය - ලෝහිතක අසුභය - පුලවක අසුභය අට්ඨික අසුභයයි අසුභය දස වැදෑරුම් වන්නේය.

07. දස අනුස්සතිය නම් කවරේද යත්, බුද්ධානුස්සතිය - ධම්මානුස්සතිය - සංඝානුස්සතිය - සීලානුස්සතිය - චාගානුස්සතිය - දේවතානුස්සතිය - උපසමානුස්සතිය - මරණානුස්සතිය - කායගතාසතිය - ආනාපාන සතියයි අනුස්සතිය - දස වැදෑරුම් වන්නේය.

08. අප්පමඤ්ඤ සතර නම් කවරේද යත්, මෛත්‍රිය - කරුණාව - මුදිතාව - උපේක්ෂාව යයි අප්පමඤ්ඤව සතර වැදෑරුම් වන්නේය. ආහාරේ පටික්කුල සඤ්ඤව එකම සඤ්ඤව නම් වන්නේය. චතුධාතු ව්‍යවස්ථානය හෙවත් ධාතුමනසිකාරය එකම ව්‍යවස්ථානය නම්

වන්නේය. ආකාසානඤ්චායතනය - විඤ්ඤාණඤ්චායතනය - ආකිඤ්චඤ්ඤායතනය නේවසඤ්ඤානාසඤ්ඤායතන යයි ආරුප්‍යය සතර වැදෑරුම් වන්නේය. සර්වප්‍රකාරයෙන් සමථ භාවනා නිර්දේශයෙහි කර්මස්ථාන සම සතලිසක් වන්නාහ.

09. සවැදෑරුම් චරිතයන් අතුරෙන් රාගචරිතයාට දශ අශුභයද කායගතාසතිය ද යන කමටහන් එකොළස සත්ප්‍රාය වන්නාහ. පිළිකුල් අරමුණු එකොළසක් වන බැවින් ඇලුම් කටයුතු කිසිවක්ම නොමැති හෙයින් රාගචරිතයාට උපචාර සමාධිය ද ප්‍රථමධ්‍යාන අර්පණා සමාධියද උපදවා ගැනීමට අශුභ කර්මස්ථානය සත්ප්‍රාය වන්නේමය.

10. ද්වේශ චරිතයාට වනාහි මෙත්තා - කරුණා - මුදිතා - උපෙක්ඛා නම් වූ බ්‍රහ්මවිහාර සතරත්, නීලකසිණ - පීතකසිණ - ලෝහිත කසිණ - ඕදත කසිණ නම් වූ වර්ණ කසිණ සතරත් සත්ප්‍රාය වන්නාහ. සත්වයන් කෙරෙහි මෛත්‍රී කරුණා මුදිතා උපෙක්ෂා ගුණ පැවැත්වීමෙන් සිත මෘදු මොළොක් බවට පත්වන බැවින් ද නීලකසිණ ආදී වර්ණ කසිණ අරමුණෙහි සිත ශාන්ත වන බැවින්ද ද්වේශ චරිතයාට උපචාර අර්පණා ධ්‍යාන උපදවා ගැනීමට එම අටවැදෑරුම් කමටහන සත්ප්‍රාය වන්නේය.

11. මෝහචරිත - විතර්ක චරිත දෙදෙනොටම එකම ආනාපාන සතිය සත්ප්‍රාය වන්නේය. ආශ්වාස - ප්‍රශ්වාස අරමුණ නිතරම අභිනව වෙමින් පවත්නා බැවින් ද අතරක් නොමැතිව සිත සිහියෙන් අවදිව තබාගැනීමට සිදුවන බැවින්ද මෝහ චරිත - විතර්ක චරිත දෙදෙනාට ආනාපාන සතිය උපචාර - අර්පණා සමාධි ප්‍රතිලාභය පිණිස සත්ප්‍රාය වන්නේය.

12. ශ්‍රද්ධා චරිතයාට වනාහි බුද්ධානුස්සති - ධම්මානුස්සති සංඝානුස්සති - සීලානුස්සති - චාගානුස්සති - දේවතානුස්සති නම් වූ සයාකාර අනුස්සතිය සත්ප්‍රාය වන්නේය. ශ්‍රද්ධාඉන්ද්‍රිය - ශ්‍රද්ධාබලය අවදිවීමට හේතු වන බැවින්, එමගින් උපචාර ධ්‍යාන උපදවා ගැනීමට පහසු වන බැවින් බුද්ධානුස්සතිය ආදී සවැදෑරුම් අනුස්සතිය ශ්‍රද්ධා චරිතයාට සත්ප්‍රාය වන්නේය.

13. බුද්ධි චරිතයාට වනාහි මරණානුස්සතිය - උපසමානුස්සතිය ආහාරෙ පටික්කූල සඤ්ඤාව - සහ චතුධාතු ව්‍යවස්ථානය නම් වූ කර්මස්ථාන සතර උපචාරධ්‍යාන ප්‍රතිලාභයට සත්ප්‍රාය වන්නාහ. යථෝක්ත කර්මස්ථාන සතරම විශේෂයෙන් ගාම්භීරත්වයෙන් බුද්ධි ගෝචර වන බැවින් බුද්ධි චරිතයාහටම සත්ප්‍රාය වන්නේය.

14. සම සතලිස් කර්මස්ථානයන් අතුරෙන්, සමතිසක් වූ කර්මස්ථානයන් සයාකාර චරිතයන්හට වෙන වෙනම සත්ප්‍රාය වන අතර, අවශේෂ වූ පඨවිකසිණය - ආපෝ කසිණය - තේජෝකසිණය - වායෝකසිණය - ආලෝක කසිණය ආකාස කසිණය ද අරූප කර්මස්ථාන සතරද යන කර්මස්ථාන දශය වනාහි සියලු චරිතයන්හට සාධාරණව සත්ප්‍රාය වන්නේය.

15. තවද දශකසිණ අතුරෙන් මහත්වූ කසිණ මණ්ඩලය මෝහචරිතයාට ද කුඩා වූ කසිණ මණ්ඩලය විතර්ක චරිතයාට ද සත්ප්‍රාය වන්නේය. කුඩා වූ කසිණමණ්ඩලය වනාහි එක්වියත් සතරඟුලක් හෙවත් කෝදුඅඟල් දෙළසක් විෂ්කම්භය සහිත කසිණ මණ්ඩලය

වන්නේය. මහත් වූ කසිණමණ්ඩලය එයින් සතර පසඟුලක් හෙවත් කෝදු අගල් සොළසක් පමණ විෂ්කම්භය සහිත කසිණ මණ්ඩලයක් විය යුතු වන්නේය.

16. පරිකර්ම භාවනා - උපචාරභාවනා - අර්පණා භාවනා නම් වූ භාවනා අතුරෙන් පරිකර්ම භාවනාව වනාහි කර්මස්ථාන සතලිසෙහිම ලැබෙන්නේය. බුද්ධානුස්සති - ධම්මානුස්සති - සංඝානුස්සති - සීලානුස්සති - චාගානුස්සති - දෙවතානුස්සති - උපසමානුස්සති - මරණානුස්සති නම් වූ අනුස්සති කර්මස්ථාන අටද, ආහාරේ පටික්කුලසඤ්ඤ - චතුධාතු ව්‍යවස්ථාන දෙකද සමඟ කර්මස්ථාන දශයෙන් උපචාර භාවනාව පමණක් සම්පූර්ණ වන්නේය. අර්පණා නොලැබෙන්නේය. අවසේස කර්මස්ථාන සමතිසෙහි අර්පණා භාවනාව ලැබෙන්නේය.

17. අර්පණා කර්මස්ථාන සමතිස අතුරෙන් දශකසිණය ආනාපානසතිය නම් වූ කර්මස්ථාන එකොළසෙන් රූපාවචර චතුෂ්ක - පඤ්චක ධ්‍යාන සියල්ල ලැබෙන්නේය. දශ අශුභය - කායගතාසතිය නම් වූ කර්මස්ථාන එකොළසෙන් ප්‍රථමධ්‍යානය පමණක් ලැබෙන්නේය. මෙත්තා - කරුණා - මුදිතා නම් වූ බ්‍රහ්මවිහාර කර්මස්ථාන තුනෙන් චතුෂ්ක නයින් අර්පණා තුනක් ද පඤ්චක නයින් අර්පණා සතරක්ද ලැබෙන්නේය. උපෙක්ඛා බ්‍රහ්ම විහාරයෙන් වනාහි චතුෂ්ක නයින් සතරවැනි ධ්‍යානය ද පඤ්චක නයින් පස්වැනි ධ්‍යානයද අර්පණා වන්නේය. මෙසේ රූපාවචර අර්පණා කර්මස්ථානයෝ සවිසි වැදෑරුම් වන්නාහ.

18. පරිකර්ම නිමිත්ත - උග්ගහ නිමිත්ත - ප්‍රතිභාග නිමිත්ත නම් වූ තෙවැදෑරුම් නිමිති අතුරෙන් පරිකර්ම නිමිත්ත සහ උග්ගහනිමිත්ත වනාහි සුදුසු පරිදි කර්මස්ථාන සියල්ලෙහි ලැබෙන්නේය. ප්‍රතිභාග නිමිත්ත වනාහි දශකසිණය - දශ අශුභය කායගතා සතිය - ආනාපාන සතිය නම් වූ දෙවිසි කර්මස්ථානයෙහි පමණක් ලැබෙන්නේය. එසේ වූ දෙවිසි කර්මස්ථානයෙහි වනාහි ප්‍රතිභාග නිමිත්ත අරමුණු කොට උපචාර සමාධි - අර්පණා සමාධියද පවත්නේය.

19. ආදිකාර්මික යෝගාවචරයා විසින් පඨවිකසිණ මණ්ඩලාදියෙහි කසිණ නිමිත්ත අරමුණු කොට භාවනා වැඩීමේ දී ඒ අරමුණ පරිකර්ම නිමිත්ත යයි කියනු ලබන්නේය. එම භාවනාවද පරිකර්ම භාවනාව නම් වන්නේය.

20. කසිණ මණ්ඩලය ඇසින් බලමින් පරිකර්ම භාවනාව වැඩීමේ දී යම් කලෙක ඒ පරිකර්ම නිමිත්ත ඇසින් දකින්නා සේ මනෝද්වාරයට ආපාතගත වන්නේ ද එකල එම අරමුණ උද්ග්‍රහනිමිත්ත නම් වන්නේය. එම පරිකර්ම භාවනාවද පරිකර්ම සමාධියෙන් සමාධිගත වන්නේය.

21. එසේ උද්ග්‍රහ නිමිත්ත අරමුණෙහි පරිකර්ම සමාධියෙන් භාවනා වඩන යෝගාවචරයාට ඒ උද්ග්‍රහ නිමිත්ත වැනි වූ පරමාර්ථ ධර්මයෙන් තොරවූ උද්ග්‍රහ නිමිත්තටත් වඩා අතිශයින් ප්‍රභාශ්වර වූ භාවනාමය අරමුණක් සිතේ තැන්පත් වී පිහිටවන්නේය. එකල්හි ඒ අරමුණ ප්‍රතිභාග නිමිත්ත යයි කියනු ලබන්නේය.

22. ප්‍රතිභාග නිමිත්ත පහළ වූතැන් සිට පඤ්ච නීවරණයන් යටපත් වන්නේය. කාමාවචර සමාධි නම් වූ උපචාර භාවනාව සපිරෙන්නේය. එතැන් සිට උපචාර සමාධියෙන් එම

ප්‍රතිභාග නිමිත්ත අරමුණු කොට භාවනා වඩන්නාට උපචාර සමාධියට අනතුරුව රූපාවචර ප්‍රථමධ්‍යාන අර්පණා සමාධිය ලැබෙන්නේය.

23. ප්‍රථමධ්‍යාන අර්පණා සමාධි චිත්තවීථිය වනාහි, ප්‍රතිභාග නිමිත්ත අරමුණු කොට මනෝද්වාරාවර්ජන චිත්තයට අනතුරුව පරිකර්ම - උපචාර - අනුලෝම - ගෝත්‍රභූ නමින් කාමාවචර සෝමනස්ස සහගත ත්‍රිහේතුක ජවන් සිත් සතරකින් පසු පස්වැනිව විතර්ක විචාර - ප්‍රීති - සුඛ ඒකාග්‍රතා සහිත ප්‍රථමධ්‍යාන චිත්තය අර්පණා බවට පත්වන්නේය. තීක්ෂණ ප්‍රාඥයන්ට වනාහි කාමාවචර ජවන් සිත් තුනකට අනතුරුව සතරවැනිව ප්‍රථමධ්‍යාන අර්පණාව ලැබෙන්නේය.

24. පළමුවරට එකචිත්තක්ෂණ මාත්‍රයක් පමණකින් ලැබෙන්නාවූ ප්‍රථමධ්‍යානය එම ප්‍රතිභාග නිමිත්ත අරමුණෙහි නැවත නැවතත් අර්පණා බවට පමුණුවා ගෙන ආවර්ජණා - සමාපජ්ජනා - අධිට්ඨානා - වුට්ඨානා - පච්ච වෙක්ඛණා නම් වූ පඤ්ච වසීතාවෙන් වසී බවට පමුණුවා, ඖදරික ධ්‍යානාංගයන් ඉක්වමින් ශාන්ත ධ්‍යානාංගයන් සහිත වූ ද්විතිය ධ්‍යානාදිය සඳහා භාවනා වැඩීමෙන් ද්විතිය ධ්‍යානාදියට අනුපිළිවෙළින් පැමිණිය හැකි වන්නේය.

25. මෙසේ මේ දශ කසිණාදී කර්මස්ථාන දෙවිස්සෙහි ප්‍රතිභාග නිමිත්තාරම්මණය ලැබෙන්නේය. අවශේෂ කර්මස්ථාන අතුරෙන් මෛත්‍රී බ්‍රහ්ම විහාරයට හිත සත්වයෝද, කරුණා බ්‍රහ්මවිහාරයට දුක්ඛිත සත්වයෝද, මුදිතා බ්‍රහ්ම විහාරයට සුඛිත සත්වයෝද උපෙක්ඛා බ්‍රහ්ම විහාරයට මධ්‍යස්ථ සත්වයෝද අරමුණු වන්නාහ.

26. දශවිධ කසිණයන් අතුරෙන් ආකාශ කසිණය හැර අවශේෂ කසිණ නවයෙන් එක් කසිණයක ප්‍රතිභාග නිමිත්ත උගුළුවා ලැබෙන අනන්ත ආකාශ නිමිත්ත අරමුණු කොට, "අනන්තං ආකාසං" යනාදී වශයෙන් භාවනා වැඩීමේදී උපෙක්ෂා - ඒකාග්‍රතා සහිත ආකාසානඤ්චායතන අර්පණා සමාපත්තිය ලැබෙන්නේය.

27. යථෝක්ත ආකාසානඤ්චායතන සමාපත්තිය පඤ්චවසීතාවෙන් වසී බවට පමුණුවා, එම ධ්‍යාන චිත්තයම අරමුණු කොට "විඤ්ඤාණං අනන්තං" යනාදී වශයෙන් භාවනා වැඩීමේ දී විඤ්ඤාණඤ්චායතන සමාපත්තිය අර්පණාගත වන්නේය.

28. විඤ්ඤාණඤ්චායතන සමාපත්තිය ද පඤ්ච වසීතාවෙන් වසී බවට පමුණුවා, පළමුවැනි වූ ආකාසානඤ්චායතන විඤ්ඤාණයාගේ උත්පාදක්ෂණ - ඨිතික්ෂණ - භංගක්ෂණ යන ක්ෂණත්‍රයෙන් කිසිවක් නොමැති බව නම් වූ නාස්තිභාව ප්‍රඥප්තිය අරමුණු කොට "නත්ථි කිඤ්චි" යනාදී වශයෙන් භාවනා වැඩීමේදී ආකිඤ්චඤ්ඤායතන අර්පණා සමාපත්තිය ලැබෙන්නේය.

29. ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියද වසීබවට පමුණුවා, නාස්තිභාව ප්‍රඥප්ති අරමුණෙහි ද අර්පණා බවට පත්වූ එම ආකිඤ්චඤ්ඤායතන චිත්තය ශාන්ත වශයෙන් ගෙන "සන්තමේතං පණීතමේතං" යනුවෙන් භාවනා වැඩීමේ දී සතරවැනි වූ නේවසඤ්ඤා නාසඤ්ඤායතන අර්පණා සමාපත්තිය සමාධිගත වන්නේය.

**පදවිවරණය**

01. සමථ - නීවරණාදී උපක්ලේශයන් සංසිඳුවන බැවින් සමු - උපසමේ - සන්සිඳීම් අර්ථයෙහි සමු ධාතුවෙන් නිපන් වචනයකි.

02. විපස්සනා - සම්මුති ව්‍යවහාරය ඉක්මවා පරමාර්ථ නාමරූපාදියත්, අනිත්‍යාදී ලක්ෂණත්, සියල්ල විවිධාකාරයෙන් - විශේෂාකාරයෙන් - දක්නා නුවණ විපස්සනා නම් වන්නේය.

03. ආදිකාර්මික යෝගාවචරයා - මේ ජීවිතයේ දී මීට පෙර භාවනාවක් පුරුදු නොකළ භාවනාභිලාෂියාට නමකි.

04. චරිත - පූර්ව ජාතියේ දී පුරුදු කළ ගති පැවතුම් අනුව ඒ ඒ පුද්ගලයාගේ පැවැත්ම චරිත නම් වේ.

05. අප්පමඤ්ඤ - අප්‍රමාණ සත්වයන් අරමුණු කරන බැවින්ද අප්‍රමාණව දසත පවත්වන බැවින්ද, මෙත්තා කරුණා මුදිතා උපෙක්ඛා බ්‍රහ්ම විහාර සතර අප්පමඤ්ඤ නම් වෙති.

06. සත්ප්‍රාය - නීවරණ යටපත් කිරීම්, පරිකර්ම - උද්ග්‍රහ ප්‍රතිභාග නිමිති ලැබීම්, උපචාර අර්පණ ධ්‍යාන ප්‍රතිලාභයට ගැලපෙන බව සුදුසු බව සත්ප්‍රාය නම්.

07. අර්පණා - පටිභාග නිමිත්ත ආදී අරමුණට බැසගෙන ධ්‍යාන බවට පත්වීම අර්පණා නම් වේ.

08. ඉද්ධිවිධ - අධිෂ්ඨාන ඍද්ධිය - විකුර්වණ ඍද්ධිය නමින් ඉද්ධිවිධ අභිඥව දෙවදැරුම් වේ. ප්‍රාතිහාර්ය පෑම මින් කියැවේ.

09. දිබ්බසෝත - ළඟ වූද දුරවූද සියම්වූ ද ඖදරික වූද සියලු ශබ්ද අරමුණු ආවර්ජනා කළ පමණින් ඇසීමේ සමත් අභිඥවකි.

10. පරචිත්ත විජානනා - අනුන්ගේ සිත් පැවැත්ම දන්නා අභිඥවය.

11. පුබ්බේ නිවාසානුස්සති - පෙර විසූ ආත්මභාව පරම්පරාව දක්නා අභිඥවකි.

12. දිබ්බ චක්ඛු - අතීතයේ සතියක්ද අනාගතයේ සතියක්දැයි දෙසතියක් තුල සිත ඇති සිතනැති සෑම දේ දක්නා දිව්‍යස් නුවණ දිබ්බ චක්ඛු නම් වේ.

නුගේගොඩ, ගංගොඩවිල එදිරිසිංහ පාරේ අංක 3A/ 476 හි
**සී. අබේසිංහ මහත්මාව විසින්, පරලෝ සැපත්**
**දයාබර ස්වාමි පුරුෂයාණන්වූ පර්සි අබේසිංහල මහත්මාණන්**
**ඇතුළු දෙමාපියන් සහිත සියළු ඥතීන්ට**
නිවන් මග අවබෝධ වේවායි මෙත් පතමින්
ධර්ම දනය ලෙස පිරිනැමේ

**රාජ්‍ය සේවා බෞද්ධ සංගමය**
**සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය**
**අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,**
**කොළඹ 10.**
**25 44 උදුවප් / 2000 දෙසැම්බර් 06**

**නුගේගොඩ ගංගොඩවිල 37 සෝරත මාවතේ පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස්හි මුද්‍රණය කරවන ලදී.**

## අභිධර්ම විපස්සනා භාවනා පාඩම අංක - 23

## අභිධර්මාර්ථ සංග්‍රහ - කර්මස්ථාන සංග්‍රහ විභාගය 02

## අති පූජ්‍ය නා උයනේ අරිය ධම්ම නාහිමිපාණන් වහන්සේ විසින්

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!

01 සමථ විදර්ශනා කර්මස්ථාන භාවනා දෙක අතුරෙන් විදර්ශනා භාවනාව උගෙනීම පිණිස, සප්ත විශුද්ධිය ද ත්‍රිලක්ෂණය ද ත්‍රිවිධ අනුපස්සනාව ද දශවිධ විදර්ශනා ඥානය ද ත්‍රිවිධ විමෝක්ෂය ද ත්‍රිවිධ විමෝක්ෂ මුඛය ද යන සියල්ල දතයුතු වන්නේය.

02. ඔවුනතුරෙන් සප්තවිශුද්ධිය නම් කවරේද යත්, ශීලවිශුද්ධිය චිත්ත විශුද්ධිය - දෘෂ්ටිවිශුද්ධිය - කංඛාවිතරණ විශුද්ධිය - මග්ගා මග්ග ඥනදර්ශන විශුද්ධිය - ප්‍රතිපද ඥනදර්ශන විශුද්ධිය - ඥනදර්ශන විශුද්ධිය යයි විශුද්ධි භාවනාව සත් වැදෑරුම් වන්නේය.

03. අනිත්‍ය ලක්ෂණය - දුක්ඛලක්ෂණය - අනාත්ම ලක්ෂණයයි සංස්කාරයන්ගේ පොදු ලක්ෂණය තෙවැදෑරුම් වන්නේය, අනිත්‍යානුපස්සනාව - දුක්ඛානුපස්සනාව - අනත්තානුපස්සනාව යයි අනුපස්සනාවද තෙවැදෑරුම් වන්නේය.

04. සන්මර්ශන ඥනය - උදයව්‍යය ඥනය - භංගානුපස්සනා ඥනය භයතුපට්ඨාන ඥනය - ආදීනවානුපස්සනා ඥනය - නිබ්බිද ඥනය - මුඤ්චිතුකම්‍යතා ඥනය - පටිසංඛානුපස්සනා ඥනය - සංඛාරුපෙක්ඛා ඥනය - අනුලෝම ඥනයයි විදර්ශනා ඥනය දශ වැදෑරුම් වන්නේය.

05. සුඤ්ඤත විමෝක්ෂය - අනිමිත්ත විමෝක්ෂය - අප්පණිහිත විමෝක්ෂයයි විමෝක්ෂය ද තෙවැදෑරුම් වන්නේය. සුඤ්ඤතානුපස්සනාවය - අනිමිත්තානුපස්සනාවය - අප්පණිහිතානු පස්සනාව යයි විමෝක්ෂ මුඛය ද තෙවැදෑරුම් වන්නේය.

06. සප්ත විශුද්ධිය අතුරෙන් සීලවිශුද්ධිය වනාහි ප්‍රාතිමෝක්ෂ සංවර සීලය - ඉන්ද්‍රිය සංවර සීලය - ආජීව පාරිශුද්ධි සීලය - ප්‍රත්‍ය සන්නිශ්‍රිත සීලයයි සීලවිශුද්දිය සිවු වැදෑරුම් වන්නේය. සමාදන්ව ගන්නාලද සික පද අතුරෙන් මුලින් හෝ අගින් නොබිඳ රක්නා ලද බැවින් අඛණ්ඩ නම් වූද, මැදින් නොබිඳ රක්නා ලද බැවින් අච්ඡිද්‍ර නම් වූද, පේලියට සිකපද නොබිඳ රක්නා ලද බැවින් අසබල නම් වූද, තැනින්තැන නොබිඳ රක්නා ලද බැවින් අකල්මාස නම් වූද, තෘෂ්ණාවට වහල් නොවී රක්නා ලද බැවින් භුජිස්ස නම් වූද, බුදුපසේබුදු මහරහතන් බෝධිසත්වයන් විසින් සාධුකියා සතුටු විය හැකි වන සේ රක්නා ලද බැවින් විඤ්ඤුප්පසත්ථ නම් වූද, තෘෂ්ණා දෘෂ්ටි දෙකින් නොගෙන රක්නා ලද බැවින් අපරාමට්ඨ නම් වූද උපචාර සමාධි අර්පණා සමාධි ප්‍රතිලාභයට සමත් බැවින් සමාධි සංවත්තනික නම් වූද සික්ෂා පද ශීලය ප්‍රාතිමෝක්ෂ සීලය නම් වන්නේය.

07. චක්ෂු - ශ්‍රෝත - ඝාන - ජිව්හා - කාය - මනෝ නම් වූ සදෙරට හමුවන රූප - ශබ්ද - ගන්ධ - රස - ස්ථර්ශ - ධර්ම නම් වූ අරමුණු හේතුවෙන් තෘෂ්ණා - දෘෂ්ටි - මාන - ද්වේශ - ඊර්ෂ්‍යා - මාත්ශර්යාදී පාප ක්ලේශයන් නූපදනා සේ අවදි වූ සතියෙන් යුක්තව රක්නා ලද සංවරය ඉන්ද්‍රිය සංවර සීලය නම් වන්නේය.

08. ප්‍රාණඝාත - අදත්තාදන - කාමමිථ්‍යාචාර - මුසාවාද - පිසුණා වාච ඵරුසාවාච සම්ඵප්‍රලාප නම් වූ - අකුශල කර්මපථ සතෙන් ද, ප්‍රාණඝාතනය සඳහා නියමිත ආවුධ වෙළඳම - වහල් වෙළඳම - මස් පිණිස සතුන් වෙළඳම - මත් ද්‍රව්‍ය වෙළඳම - වස විෂ

වෙළඳම - ජීව නෝපාය සඳහා ඉහත සඳහන් ද්‍රව්‍ය නිෂ්පාදනය ද, අනාගාරික පැවිද්දන් විසින් අෂ්ඨ කුලදූෂණ - එක්විසි අන්වේෂණ - කුහනා - ලපනා - නේමිත්තිකතා - නිප්පේසිකතා - ලාභෙන ලාභං නිජිගිංසනතා යනාදී වූ සියලු ආකාර අධාර්මික ආජීවිකාවෙන්ද සම්පූර්ණයෙන් වැළකී ධාර්මික ජීවනෝපාය අනුගමනය කිරීම ආජීවපාරිසුද්ධි ශීලය නම් වන්නේය.

09. අනාගාරික බුද්ධ පුත්‍රයන් වහන්සේලාගේ ජීවිත පරිෂ්කාර වශයෙන් තථාගතයන් වහන්සේ අනුදැන වදළා වූ චීවර - පිණ්ඩපාත - සේනාසන - ගිලන්පස නම් වූ සිවුපසය ථෙය්‍ය පරිභෝගයට හෝ ඉණ පරිභෝගයට නොවැටී දයජ්ජ පරිභෝගයට අනුකූලවන සේ පිළිගැනීමේදී ද පරිභෝගයේදී ද තෘෂ්ණා - දෘෂ්ඨි- මානාදී උපක්ලේශයන් නූපදනා පිණිස, බෝධිපාක්ෂක ධර්මයන් වැඩෙනු පිණිස ප්‍රයෝජන වශයෙන් ද - ධාතුවශයෙන්ද - පිළිකුල් වශයෙන් ද ප්‍රත්‍යවේක්ෂා ඥනය පැවැත්වීම ප්‍රත්‍යසන්නිශ්‍රිත ශීලය නම් වන්නේය. මෙසේ චතුපාරිශුද්ධි සීලය චිත්ත විශුද්ධි ආදී විශුද්ධි භාවනා ප්‍රතිලාභයට පාදක වන බැවින් සීලවිසුද්ධිය නම් වන්නේය.

10. දශවිධ උපචාර කර්මස්ථානයෙන් ද අර්පණා කර්මස්ථාන සමතිසෙන් ද ලැබෙන්නාවූ උපචාර සමාධිය ද, අෂ්ඨ සමාපත්තිය ද පඤ්චනීවරණාදී උපක්ලේශයන් විෂ්ඛම්භනය කරවා විදශීනා ඥන මාර්ග ඵලඥන අධිගමයට පාදක වන බැවින් චිත්ත විශුද්ධිය නම් වන්නේය.

11. අටවිසි රූපය ද දෙපණස් චෛතසිකද, කෘත්‍ය වශයෙන් තුදුස් වැදෑරුම් චිත්තය ද, පටිච්චසමුප්පාද අංග දෙළස ද යනාදී නාමරූප ධර්මයන්ගේ එකක් පාසා ඇත්තාවූ, ලක්ඛණ රස - පච්චුපට්ඨාන - පදට්ඨාන නම් වූ සතරාකාරයෙන් හාත්පසින් පරිග්‍රහණය කිරීමේ ප්‍රඥව දිට්ඨි විශුද්ධිය නම් වන්නේය. පටිච්ච සමුප්පාද අනුසාරයෙන් ඒ සියලු නාමරූපයන්ගේ හේතුඵල සම්බන්ධතාව හාත්පසින් දක්නා ඥනය කංඛාවිතරණ විශුද්ධිය නම් වන්නේය.

12. එතැන් සිට එසේ නාමරූප පරිච්ඡේද ඥනයෙන් සහ ප්‍රත්‍ය පරිග්‍රහ ඥනයෙන් පිරිසිඳ ගන්නා ලද්දවූ ප්‍රත්‍ය සහිත වූ තුන්ලොවටම අයත් වූ ත්‍රෛභූමිකවූද අතීත වූද වර්තමාන වූද අනාගත වූද සියලු සංස්කාරයන් ස්කන්ධ - ආයතන - ධාතු යනාදී වශයෙන් පිඩුකොට කලාප සන්මර්ශනය කරනු ලබන්නේය. "අනිච්චං ඛයට්ඨෙන දුක්ඛං භයට්ඨෙන - අනත්තා අසාරකට්ඨෙන" ගෙවි ගෙවී නැසි නැසී යන අර්ථයෙන් අනිත්‍යයි ද, භය ජනක අර්ථයෙන් දුක්ඛයයි ද, අසාර නිස්සාර අර්ථයෙන් අනාත්ම යයි ද විදර්ශනා කරනු ලබන්නේය.

13. අතීතාදී අද්ධාන කාල වශයෙන් ද ඉරියාපථාදී සන්තති වශයෙන් ද චිත්ත වීථි ආදී ක්ෂණ වශයෙන් ද අනිත්‍ය දුක්ඛ අනාත්ම නම් වූ ත්‍රිලක්ෂණය සන්මර්ශනය කරනු ලබන කල්හි, ප්‍රත්‍ය වශයෙන් සහ ක්ෂණ වශයෙන් උදයව්‍යය ඥනයෙන් උදය - වය දැකීමේදී දශ විධ විදර්ශනා උපක්ලේශයන් ද විදර්ශනා කළමනා වන්නේය.

14. **ඕභාසො පීති පස්සද්ධි - අධිමොක්ඛො ච පග්ගහො**
**සුඛං ඤණ මුපට්ඨාන - මුපෙක්ඛා ච නිකන්තිච**

දශවිධ විදර්ශනා උපක්ලේශයෝ නම් කවරේද යත්, ආලෝකය - ප්‍රීතිය - පස්සද්ධිය - අධිමෝක්ෂය - වීර්යය සුඛය - ඥනය - සතිය - උපේක්ෂාවය - විදර්ශනා නිකාන්තිය යන මේ දශ දෙනා නොලද අධිගම ලබන ලදැයි මුලාකරවන බැවින්, ඔවුනට නොරැ වටී විදර්ශනා කළයුතු වූ උපක්ලේශයෝ නම් වන්නාහ.

15. දශවිධ විදර්ශනා උපක්ලේශයන්ද ත්‍රිලක්ෂණයට නංවා ඔවුන් අභිභවා ජයගෙන ඉදිරියට යායුතු වූ විදර්ශනා මාර්ගය පැහැදිළිව තෝරාගෙන මාර්ග - අමාර්ග දෙක වෙන් කොට ගන්නා ලද්දවූ විදර්ශනා ඥානය මග්ගාමග්ග ඥාන දර්ශන විසුද්ධිය නම් වන්නේය.

16. විදර්ශනා උපක්ලේශයන්ගෙන් ජයගත් තැන් සිට උදයව්‍යය ඥානය - භංගානුපස්සනා ඥානය - භයතුපට්ඨාන ඥානය - ආදීනවානු පස්සනාඥානය. නිබ්බිදනුපස්සනා ඥානය - මුඤ්චිතුකම්‍යතා ඥානය පටිසංඛානුපස්සනා ඥානය - සංඛාරුපෙක්කා ඥානය - අනුලෝම ඥානය තෙක් ඇත්තා වූ නවමහා විදර්ශනා ඥානය වනාහි පටිපද ඥානදර්ශන විශුද්ධිය නම් වන්නේය.

17. නවමහා විදර්ශනා ඥාන අතුරෙන් උදයව්‍යය ඥාන භාවනාවේදී රූප සප්තක අරූප සප්තක වශයෙන් ද ප්‍රත්‍ය වශයෙන් හා ක්ෂණ වශයෙන් විදර්ශනා වැඩිය යුතු වන්නේය. ඔවුන් අතුරෙන් රූප සප්තකය වනාහි මේ ආත්මභාවය සම්බන්ධ වූ ප්‍රතිසන්ධි - චුති අතර නාමරූප විදර්ශනාව නම් වූ ආදාන නික්ඛේපයද, සියක් වසර දශක දහයට, පඤ්චක විස්සට, තික තෙතිසට, දෙවසර බැගින් පණහට, වසර බැගින් සියයට, මාස සතර බැගින් තුන් ඍතුවට, මාස දෙක බැගින් ඍතු සයට, එක මාසයට, අට මාසයට, එක් දිනට, රාත්‍රියට, දවාලට, යාම සයට, යාම - ඒම - නැමීම - දිග හැරීම - ඇදීම - පෙරවීම - ආහාරපාන ගැනීමාදියට, පියවර ඔසවීම - යැවීම දිගහැරීම - පහත් කිරීම - තැබීම - පැගීම යනාදී කොටස් සයට බෙද බෙද වඩන විදර්ශනාව නම් වූ වයෝවුද්ධත්ථගාමී වශයෙන්ද, ආහාර වශයෙන් - ඍතු වශයෙන් - චිත්ත වශයෙන් - කර්ම වශයෙන් සහ ධර්මතාරූප වශයෙන් ද යන රූප සප්තක විදර්ශනාව පැවැත්විය යුතු වන්නේය.

18. අරූප සප්තක විදර්ශනාව වනාහි, ඉහත සඳහන් කළ සප්තාකාර රූප විදර්ශනාව වඩා ඉන් අනතුරුව එම විදර්ශනා කළ සිත වෙනත් සිතකින් විදශිනා කිරීම නම් වූ කලාප වශයෙන්, එම දෙවැනි සිත තුන්වැනි සිතකින් විදර්ශනා කිරීම නම් වූ යමක වශයෙන් ද, සිත් පරම්පරා සතරක් ම විදර්ශනා කිරීම නම් වූ ක්ෂණ වශයෙන්ද, සිත් පරම්පරා දහය තෙක් විදර්ශනා කිරීම නම් වූ පටිපාටි වශයෙන්ද විදර්ශනා වඩන්නතු නොමැති බවත්, පරමාර්ථ ධර්ම මාත්‍රයක්ම විදර්ශනා කරන බවක් අවබෝධ වීමෙන් දිට්ඨිඋග්ඝාටන වශයෙන් ද, ස්වකීය විදර්ශනාවේ උසස් - පහත් බවක් නොසලකන්නා වූ මානසමුග්ඝාතන වශයෙන් ද, විදර්ශනාවෙන් ලැබෙන ප්‍රීති සුඛ සාත ලක්ෂණයන් ආස්වාද නොකිරීම නම් වූ නිකාන්ති පරියාදන වශයෙන්ද යන ආකාර සතකින් අරූප සප්තක විදර්ශනාව පැවැත්වියයුතු වන්නේය.

19. ප්‍රත්‍ය වශයෙන් සහ ක්ෂණ වශයෙන් උදයව්‍යය දැකීමේදී සියලු නාමරූපයන් ස්කන්ධ වශයෙන් පසකට බෙදගනු ලබන්නේය. රූපස්කන්ධයට, ප්‍රත්‍ය වශයෙන් අවිද්‍යා - තෘෂ්ණා - කර්ම - ආහාර නම් වූ සමුදය සතරද, ක්ෂණ වශයෙන් උත්පාදය ද විදර්ශනා කළමනා වන්නේය. වේදනා - සඤ්ඥා - සංස්කාර ස්කන්ධ තුනට ප්‍රත්‍ය වශයෙන් අවිද්‍යා - තෘෂ්ණා - කර්ම - ස්පර්ශ නම් වූ සමුදය සතරද, ක්ෂණ වශයෙන් උත්පාදයද විදර්ශනා කළ මනා වන්නේය. විඤ්ඤාණස්කන්ධයට වනාහි ප්‍රත්‍ය වශයෙන් අවිද්‍යා - තෘෂ්ණා - කර්ම - නාමරූප නම් වූ සමුදය සතරද ක්ෂණ වශයෙන් උත්පාදය ද විදර්ශනා කළමනා වන්නේය. මෙසේ ස්කන්ධ පඤ්චකයට ප්‍රත්‍ය වශයෙන් සමුදයවාර සම විස්සක්ද ක්ෂණ වශයෙන් සමුදයවාර පසක් දැයි සමුදය පස්විස්සක් වන්නාහ. නිරෝධ වාරයෝද එසේම පස් විස්සක්ම වන්නාහ. මෙසේ හෙයින් ස්කන්ධපඤ්චකයාගේ වශයෙන් උදයව්‍යය ඥානය සම පණස් වැදෑරුම් වන්නේය.

20. නව මහා විදර්ශනා ඥාන අතුරෙන් භංගානුපස්සනා ඥානය නම් කවරේද යත්, උදයව්‍යයඥානයෙන් දක්නා ලද නාමරූප ධර්මයන්ගේ අනිත්‍ය ලක්ෂණය ද දුක්ඛ ලක්ෂණය ද අනාත්ම ලක්ෂණය ද විදර්ශනා කොට පහළ වූ විදර්ශනා ඥානයත් නැවත ත්‍රිලක්ෂණයට නංවන ඥානය භංගානුපස්සනා ඥානය නම් වන්නේය.

21. භයතුපට්ඨාන ඥානය නම් කවරේද යත්, සියලු නාමරූප සංස්කාරයන්ගේ ගෙවී ගෙවී යාම - නැසී නැසී යාම නිරුද්වීම විනිවිද දක්නා වූ භංගානුපස්සනාව වඩන්නාහට, සුවසේ ජීවත්වනු කැමති බියගුළු කෙනෙකු, බියකරු සිංහ ව්‍යාඝ්‍රාදී නපුරු සතුන් ද, යක්ෂ රාක්ෂයාදී නපුරු අමනුෂ්‍යයන් ද නානා උපද්‍රවයන්ද සහිත වූ තැනක් සේ, තුන් ලෝකයේ කොතැනකවත් සැනසුමක් නොමැති බව දක්නා වූ ඥානය භයතුපට්ඨාන ඥානය නම් වන්නේය.

22. ආදීනවානුපස්සනා ඥානය නම් කවරේද යත්, භයතුපට්ඨාන ඥානය භාවනා වඩන්නාට වනාහි තුන් ලෝකයම ගිනි මැලයක් මෙන් ද, විෂඝෝර සර්ප ගුහාවක් මෙන්ද, මරණ පිණිස කඩු ගත් වධකයන් මෙන්ද හිස් ගෙවල් මෙන්ද එකොලොස් මහා ගින්නක් ඇවිලගත් තැන් මෙන්ද කිසි තැනක් ගැන ආශාවක් - අස්වැසිල්ලක් ප්‍රාර්ථනාවක් අල්වාගැනීමක් නොකරනු කැමැති ප්‍රඥාව ආදීනවානුපස්සනා ඥානය නම් වන්නේය.

23. නිබ්බිද ඥානය නම් කවරේද යත්, සියලු සංස්කාරයන් ආදීනව වශයෙන් දැකීම් හේතුවෙන්, සියලු භව - ගති -යෝනි විඤ්ඤාණට්ඨිති - සත්තාවාසයන්ට ඇතුලත් වූ සියලු සංස්කාර ධර්මයන් වෙත කලකිරීමට ද - උකටලී බවටද - නො ඇලීමටද පැමිණීම නිබ්බිද ඥානය නම්වන්නේය. චිත්‍රකුට පර්වත පාදයේ රන් ගුහාවෙහි වෙසෙන රණහංස රාජයා සැඩොල්ගම් දෙර කසලගොඩෙහි විසීමට නොකැමැති වන්නා සේද, තුන්දහස් යොදුන් පමණ හිමවතෙහි වෙසෙන කේසර සිංහරාජයා රනෙන් නිමවුවද කුඩුවක නොවෙසෙන්නා සේද, අහසින් යන ඡද්දන්ත ඇත් රජයා ඡද්දන්ත විල ඇසුරෙහි විනා නගර මැද සිත් අලවා නොවෙසෙන්නා සේද, නිබ්බිද ඥානය පහළ වූ යෝගීවරයා සංස්කාරයන්හි කලකිරී නිවනෙහිම සිත් අලවා සිටිනු කැමැති වන්නේය.

24. මුඤ්චිතුකම්‍යතා ඥානය නම් කවරේද යත්, භයතුපට්ඨාන ආදීනව - නිබ්බිද නම් වූ තෙවැදෑරුම් ඥානයෙන් සංස්කාරයන් කෙරෙහි බියෙන් - ආදීනවයෙන් - කලකිරීමෙන් යුතුව සියලු භව - ගති - යෝනි - විඤ්ඤාණට්ඨිති - සත්තාවාසයන්ට ඇතුලත් වූ කිසිදු සංස්කාරයක් කෙරෙහි නොබැඳී සියලුම සංස්කාරයන් කෙරෙන් මිදීයනු කැමැති - නික්මෙනු කැමැති ඥානය මුඤ්චිතුකම්‍යතා ඥානය නම් වන්නේය. දැලේ බැඳුන මාලුවකු මෙන්ද, නයා විසින් කටටගත් මැඩියකුසේද කුඩුකළ වලි කුකුලා මෙන්ද, මන්දක බැඳුනු මුවකු මෙන්ද ගුරුළාට අසුවූ නාගයා මෙන්ද, රාහුගත් සඳ හිරු මෙන්ද සතුරන්ට අසුවූ පුරුෂයකු මෙන් ද ඒ ඒ අන්තරාවෙන් මියාමට කැමති වන්නා සේ පහළවන ඥානය මුඤ්චිතුකම්‍යතා ඥානය නම් වන්නේය.

25. පටිසංඛානුපස්සනා ඥානය නම් කවරේද යත්, ජලාසයකදී මසුන් අල්ලන්නකු කෙමනකට අසුවූ මහානායකු මත්‍යයෙකැයි ග්‍රීවයෙන් දැඩිව ගෙන ඔසවා ගත් කල්හි විෂඝෝර නාගරාජයෙකැයි දැන බියෙන් තැති ගෙන අනතුරක් නොවනසේ මිදීයාම පිණිස උපාය සලකා වේගයෙන් අත ඔසවා හිසවට කරකවා දුබල කොට ඈතට දමා මිදී යන්නා සේ, සියලු සංස්කාරයන්ගෙන් මිදී යාමේ උපාය සලකා දැඩිසේ ත්‍රිලක්ෂණයට නංවා විදර්ශනා කිරීමේ ඥානය පටිසංඛානුපස්සනා ඥානය නම් වන්නේය.

26. සංකාරුපෙක්ඛා ඥනය නම්කවරේද යත්, අනන්ත සසර පටන් මම - මාගේ යයි දැඩිව ගෙන පැවැත් වූ පඤ්චස්කන්ධය පිලිබඳව උදය-වය - භංගය - භය - ආදීනව - නිබ්බිද- සියල්ල දැක මුඤ්චිතුකම්‍යතා - පටිසංඛා ඥනයෙන් දැඩි සේ ත්‍රිලක්‍ෂවිදර්ශනාව වැඩීමේ දී, මග-පල-නිවනට ඉතාමත් සමීප ආසන්න බවට පත් වන බැවින් බිය ජනක සංස්කාරයන් කෙරෙහි එතෙර වීමේ උපාය සලකා ඒ මත පිහිටා ලබන මධ්‍යස්ථ වූ විදර්ශනා ඥනය සංඛාරුපෙක්ඛා ඥනය නම් වන්නේය. සිඛාප්පත්ත විදර්ශනාවය - උට්ඨානගාමිනී විදර්ශනාවය යනුවෙන් ද සංඛාරුපෙක්ඛා ඥනය හැඳින්වෙන්නේය.

27. අනුලෝම ඥනය නම් කවරේද යත්, යම් කලෙක සංඛාරුපෙක්ඛා ඥනය මුදුන්පත් වී මාර්ග චිත්ත වීථියට බැසගනු ලැබේද එකල්හි භවංගයෙන් නැගී මනෝද්වාරාවර්ජනය - පරිකර්ම උපචාර - අනුලෝම - ගෝත්‍රභූ - මාර්ග චිත්තයට අනතුරුව ඵල සිත් දෙකකින් පසු භවංග පතිත වන්නේය. එහි දී ආවර්ජන සිතට අනතුරුව පහළ වූ පරිකර්ම- උපචාර- අනුලෝම- නම් වූ ජවන් සිත්තුනෙහි වූ ඥනය වනාහි, උදයව්‍යය ඥනය ආදිකොට ඇත්තා වූ විදර්ශනා ඥන අට දෙනාහට අනුලෝම වන බැවින් ද මාගීඵල චිත්තයන්හි ලැබෙන්නා වූබෝධිපාක්ෂික ධර්මයන්හට අනුලෝම වන බැවින්ද අනුලෝම ඥනය නම් වන්නේය. මෙතෙක් පැවති නවමහා විදර්ශනාඥනය වනාහි පටිපද ඥනදර්ශන විශුද්ධිය නම් වන්නේය.

28. ඥන දර්ශන විශුද්ධිය නම් කවරේද යත්, ඉහත සඳහන් වූ අනුලෝම ඥනයට අනතුරුව, පෘථග්ජන ගෝත්‍රය අවසන් කරමින් ආර්ය ගෝත්‍රයට යොමුවෙමින් නිවන අරමුණු කොට ගෝත්‍රභූ සිත පහළ වන්නේය. ඉන්අනතුරුවම දුක්ඛ සත්‍යය පිරිසිඳිමින් - සමුදය සත්‍යය ප්‍රහානය කරමින් - නිරෝධ සත්‍යය සාක්‍ෂාත් කරමින් මාර්ග සත්‍යය භාවනා වශයෙන් අර්පණා වීථියට බැස ගන්නේය. ඉන් අනතුරුව ඵල සිත් දෙක තුනක් පැවතී භවංග පතිත වන්නේය. නැවතත් භවංගය සිඳී මාර්ගය - ඵලය - නිර්වාණය - ප්‍රහීන ක්ලේශ අවශේෂ ක්ලේශයන් ද ප්‍රත්‍යවෙක්ෂා කෙරෙන ප්‍රත්‍යවෙක්ෂා ඥන වීථි පහළ වන්නාහ.

29. මග්ගං ඵලඤ්ච නිබ්බානං - පච්චවෙක්ඛති පණ්ඩිතො
හීනෙ කිලෙසෙ සෙසෙ ච - පච්චවෙක්ඛති වා නවා
ඡබ්බිසුද්ධිකමෙනෙවං - භාවෙතබ්බො චතුබ්බිධො.
ඤණ දස්සන විසුද්ධි - නාම මග්ගො පවුච්චති

මාර්ගඵලාධිගම ලාභී තෙමේ මාර්ගයද ඵලයද නිර්වාණයද ප්‍රත්‍යවේක්ෂා කරන්නේය. ප්‍රහීණ ක්ලේශයන් ද අවශේෂ ක්ලේශයන්ද ප්‍රත්‍යවේක්ෂා කරන්නේද ඇතැම් විට නොකරන්නේද වේ. සවැදෑරුම් විශුද්ධි අනුපිළිවෙලින් මෙසේ භාවනා වශයෙන් වැඩිය යුතුවූ මාර්ගඥන සතර දෙනා වනාහි ඥනදර්ශන විශුද්ධිය නම් වන්නේය.

සප්ත විශුද්ධි ප්‍රභේදය සමාප්තයි.

**ත්‍රිලක්‍ෂණ විදර්ශනාව**

1. පටිච්ච සමුප්පාද - පට්ඨාන ප්‍රත්‍යය විදර්ශනා භාවනාවේදී පහළ වූ චිත්ත - චෛතසික - භූතරූප - උපාදරූප නම් වූ නාම රූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්මයෝ ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝය.
2. ඇතිවීම් නැති වීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝය.
3. තම තමන් කැමති ලෙස නොපැවති බැවින් අනාත්මයෝය.
4. අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ චිත්ත චෛතසික භූතරූප උපාද රූප නම් වූ නාම රූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන සංඛත සන්තාප විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේය.

5. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්ව භව තෘෂ්ණාව ආයූහන නිදන සංයෝග පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේය.

6. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ විවේක අසංඛත අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේය.

7. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතුවූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය නියාණ හේතු දස්සන ආධිපතෙය්‍යාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේය.

8. මාගේ භාවනාමය කුසලානිසංස ධර්මය මෙම චතුරාර්ය සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිසම හේතු වේවා වාසනා වේවා

සාධු. සාධු. සාධු.

**පදවිවරණය**

01. විමොක්ඛ මුඛ - මාර්ග චිත්ත වීථියේදී අනුලෝම සිත් තුනට නමකි.

02. විමොක්ඛ - මාර්ග චිත්තයට නමකි. සුඤ්ඤත - අනිමිත්ත අප්පණිහිත නමින් විමෝක්ෂය තෙවැදෑරුම් වන්නේය.

03. කුහනා - ලාභ සත්කාර අපේක්ෂාවෙන්, සිවුපසය ප්‍රතික්ෂේපකිරීම අධිගම ලාභීයයි පර්යායෙන් ඇඟවීම - ඉරියව් පැවැත්වීම යන තුන් ආකාරයෙන් මිනිසුන් විශ්මයට පත්කිරීමය.

04. ලපනා - තමන් ද දායකයන් ද උසස් කොට කථා කිරීම.

05. නෙමිත්තිකතා - පහදවා ගැනීම පිණිසම වචන පෙරළා කථාකිරීම.

06. නිප්පෙසිකතා - සිවුපසය සඳහාම දෙස් නගා කථා කිරීම.

07. ලාභේන ලාභං නිජිගිංසනතා - තමා ලත් දෙය දායකයන්ට දී දායකයන්ගෙන් ප්‍රණීත දෙය ලබාගැනීම.

08. ලක්ඛණ - රස - පච්චුපට්ඨාන - පදට්ඨාන

නාම රූප සංස්කාරයන්ගේ එකක් පාසා පිහිටා ඇත්තාවූපෞද්ගලික ස්වභාවය ලක්ඛණ නම් වේ. ඒ ඒ නාම රූපයන්ගේ ක්‍රියා කාරිත්වය හා ප්‍රතිඵලය රසය නම් වේ. සිතට අරමුණුවන ආකාරය පච්චුපට්ඨාන නම් වේ. ඒ ඒ නාම රූප ධර්මයට ආසන්නතම ප්‍රධාන හේතුව පදට්ඨාන නම් වේ.

09. සප්ත විශුද්ධි : චතුපාරිශුද්ධි ශීලයෙන් වීතික්කම කෙලෙසුන් කෙරෙන්ද, චිත්ත විශුද්ධියෙන් පරියුට්ඨාන කෙලෙසුන් කෙරෙන්ද ඉතිරි ලෞකික විශුද්ධි සතර පදනම් කොටගෙන ඥානදර්ශන විශුද්ධියෙන් අනුශය කෙලෙසුන් ගෙන්ද සිත පිරිසුදු වන බැවින් විශුද්ධිනම් වෙති.

1. **රාජකීය පණ්ඩිත කඩවැද්දුවේ ජිනවංශ මහ නාහිමි පාණන්වහන්සේ අතිපූජ්‍ය නාඋයනේ අරියධම්ම මහා හිමිපාණන්වහන්සේ** ඇතුළු ආරණ්‍යවාසී සියලුම ස්වාමින් වහන්සේලාට දීර්ගායු ශ්‍රී සම්පත්තිය පිණිසත්

2. අපවත්වී වදළ අප **ගුරුදේව කෝට්ටේ ශ්‍රී දේවානන්ද මහා ස්වාමින්වහන්සේට** දැනට වැඩවසන **නන්ද ස්වාමින්වහන්සේ** ඇතුළු කල්‍යාණී ධර්ම යෝගාශ්‍රම වාසී සියලු භික්ෂූන් වහන්සේලාට නිවන්සුව පිණිසත්

3. මා මිත්‍ර වයි. වයි. ද සිල්වා මහත්ම මහත්මාවන් ඇතුළු සියලු ඥාති හිත මිත්‍රාදීන්ටත් ලෝකපාලක ශාසන රක්ෂක උතුම් දිව්‍යරාජ සමූහයාටත් මේ උතුම් පින උතුම් නිවන් සැප පිණිසම වේවා!

365 ගාලුපාර, පානදුර පී. ජී. පෙරේරා හා වයි වයි ද සිල්වා යන මහත්මාවන් විසින් ධර්මදානය වශයෙන් පිරිනැමේ.

**රාජ්‍ය සේවා බෞද්ධ සංගමය**
**සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය**
**අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,**
**කොළඹ 10.**
**2544 දුරුතු/ 2001 ජනවාරි 03**

**නුගේගොඩ ගංගොඩවිල 37 සෝරත මාවතේ පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස්හි මුද්‍රණය කරවන ලදී.**

## අභිධර්ම විපස්සනා භාවනා පාඩම අංක - 24

## අභිධර්මාර්ථ සංග්‍රහ - කර්මස්ථාන සංග්‍රහ විභාගය 03

## අති පූජ්‍ය නා උයනේ අරිය ධම්ම නාහිමිපාණන් වහන්සේ විසින්

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!

01 සතර මාර්ග චිත්ත වීථිය වනාහි දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් තීක්ෂණ ප්‍රඥාවන්තයාගේ මාර්ග චිත්තවීථිය මනෝද්වාරාවර්ජන චිත්තයට අනතුරුව උපචාර-අනුලෝම-ගෝත්‍රභූ නම් වූ ජවන්සිත් තුනකින් පසු සතර වැනිව මාර්ග චිත්තයද ඵලසිත් තුනක් ද ලැබෙන්නාහ. නාතිතීක්ෂණ ප්‍රඥාවන්තයාගේ මාර්ග චිත්ත වීථිය වනාහි මනෝද්වාරාවර්ජනයට අනතුරුව පරිකර්ම-උපචාර-අනුලෝම-ගෝත්‍රභූ නම් වූ ජවන් සිත් සතරකින් පසුව පස්වැනිව මාර්ග චිත්තයද ඵල සිත් දෙකක් ද ලැබෙන්නාහ. මෙසේ මාර්ගවීථිය දෙවැදෑරුම් වන්නේය.

02. සතර මාර්ග චිත්ත වීථියේදී විමෝක්ෂමුඛ තෙවැදෑරුම් වන්නේ කෙසේ ද යත්, මාර්ග චිත්ත වීථියේදී පරිකර්ම උපචාර අනුලෝම නම් ජවන් සිත් තුනටම ප්‍රඥා ඉන්ද්‍රිය අධික යෝගාවචරයාහට සංස්කාරයන් අනාත්ම ලක්ෂණයෙන් අරමුණු වන්නේය. අනත්තානුපස්සනාවෙන් ආත්ම දෘෂ්ඨිය අතහරින බැවින් එය සුඤ්ඤතානුපස්සනා විමෝක්ෂමුඛය නම් වන්නේය.

03. ශ්‍රද්ධාඉන්ද්‍රිය අධික වූ යෝගාවචරයාට වනාහි එසේම අනුලෝම ජවන් තුනෙහි දී සංස්කාරයන් අනිත්‍ය ලක්ෂණයෙන් අරමුණු වන බැවින් නිත්‍ය සංඥාවිපල්ලාසයෙන් මිදෙන බැවින් අනිමිත්තානුපස්සනා විමෝක්ෂමුඛය නම් වන්නේය. සමාධි ඉන්ද්‍රිය අධික යෝගාවචරයාට වනාහි සංස්කාරයන් දුක්ඛ ලක්ෂණයෙන් අරමුණු වන හෙයින් තෘෂ්ණා ප්‍රාර්ථනා ප්‍රණිධියෙක් මිදෙන බැවින් අප්පණිහිතානුපස්සනා විමෝක්ෂ මුඛය නම් වන්නේය. මෙසේ විමෝක්ෂ මුඛය තෙවැදෑරුම් වන්නේය.

04. සතර මාර්ගය ද විමෝක්ෂ නමින් තෙවැදෑරුම් වන්නේ කෙසේ ද යත් ඉහත සඳහන් වූ අනුලෝම ඥාන සහිත වූ වුට්ඨාන ගාමිනී විපස්සනාව අනාත්මානුපස්සනා වශයෙන් සුඤ්ඤත විමෝක්ෂ මුඛය වූයේ වී නම් මාර්ග චිත්තයද සුඤ්ඤත විමෝක්ෂය නම් වන්නේය.

05. වුට්ඨාන ගාමිනී අනුලෝම ඥානය අනිත්‍යානුපස්සාවෙන් විදර්ශනා කරන්නේ වී නම් මාර්ගය අනිමිත්ත විමෝක්ෂය නම් වන්නේය. දුක්ඛානුපස්සනාවෙන් විදර්ශනා කරන ලද්දේ වී නම් මාර්ග චිත්තය අප්පණිහිත විමෝක්ෂය නම් වන්නේය.

06. සතර මාර්ගය වනාහි පූර්වභාග විදර්ශනාගමන වශයෙන් මෙසේ විමෝක්ෂ නාමය ලබන්නේය. මාර්ග චිත්ත වීථියෙහිම ලැබෙන්නා වූ මාර්ගානන්තර ඵල චිත්තයෝ ද මාර්ගාගමන වශයෙන් එම විමෝක්ෂ නාමයම ලබන්නාහ.

07. ඵල සමාපත්ති වීථියේ දී වනාහි ඵලචිත්තයට පූර්වභාගයේ දී ලැබෙන්නා වූ විදර්ශනාගමන වශයෙන් විමෝක්ෂ නාමය ලැබෙන්නේය. අනත්තානුපස්සනාවෙන් සුඤ්ඤත විමෝක්ෂය ද අනිත්‍යානුපස්සනාවෙන් අනිමිත්ත විමෝක්ෂයද දුක්ඛානුපස්සනාවෙන් අප්පණිහිත විමෝක්ෂය ද ලැබෙන බැවින් අරමුණු වශයෙන් ද කෘත්‍යරසය හා ඵලය වශයෙන් ද මේ නම් තුන මාර්ග-ඵල චිත්තයන්හට සැමතැනකදීම සමසම වන්නාහ.

(මෙතෙකින් විමෝක්ෂ භේදය සමාප්තය.)

08. මාර්ගඵලාධිගම ලාභී ආර්යයන් වහන්සේලා වනාහි යුගල වශයෙන් සතර නමක් ද පුද්ගල වශයෙන් අටනමක් ද ප්‍රභේද වශයෙන් එකසිය අට වැදෑරුම් ද වන්නාහ. ඔවුනතුරෙන් ශ්‍රෝතාපත්ති මාර්ගය වඩා සක්කායදිට්ඨි-විචිකිච්ඡා-සීලබ්බත පරාමාස නම් වූ සංයෝජන තුන ද, දිට්ඨි-විචිකිච්ඡා නම් වූ අනුශය දෙකද සතර අපාගාමී අකුශල් කර්ම සියල්ල ද සිඳී යාමෙන් ඒකබීජී-කෝලංකෝල-සත්තක්ඛත්තු පරම ද නමින් සෝ්තාපත්ති ඵලලාභය වන්නේය.

09. මතු එක් භවයකදීම අර්හත්වයට පත්වන්නා වූ සෝතාපත්ති ඵලස්ථයා ඒකබීජී නම් වන්නේය. සත්වැනි ආත්ම භාවයට නොපැමිණ අර්හත්වයට පත්වන්නේ කෝලංකෝල නම් වන්නේය. සත්වැනි ආත්මභාවයේදීම අර්හත්වයට පත්වන්නා සත්තක් ඛත්තුපරම නම් වන්නේය.

10. කාමරාග-පටිඝ නම් වූ සංයෝජන දෙකද-එම අනුශය දෙක ද අවිද්‍යාදී සෙසු ක්ලේශයන් ද තුනී බවට පත් කරමින් දෙවැනි මාර්ග ඵලයට පැමිණෙන්නා වනාහි නැවත එක් වරක්ම උත්පත්ති වශයෙන් මනුලොවට එන අර්ථයෙන් සකදාගාමී නම් වන්නේය. කාමාවචර සකදාගාමීය-රූපාවචර සකදාගාමීය. අරූපාවචර සකදාගාමී නමින් සකදාගාමී ඵලස්ථයා ද තෙවැදෑරුම් වන්නේය.

11. අනාගාමී මාර්ගය වඩා කාමරාග-පටිඝ සංයෝජන දෙකද එම අනුශය දෙකද නැවත කාමභවයෙහි ප්‍රතිසන්ධි ගෙන දෙන සියලු කුශල කර්ම ද නිරවශේෂයෙන් ප්‍රහාණය කොට බඹ තලයේම ඉපද අර්හත්වයට පත්වන බැවින් අනාගාමී නම් වන්නේය.

12. අර්හත් මාර්ගය වඩා අනවශේෂ වශයෙන් සකලක්ලේශයන් ප්‍රහාණය කොට පූජාවනට සුදුසු අර්ථයෙන් අග්‍රදක්ෂිණාර්හ බවට පත් වී ක්ෂීණාශ්‍ර නම් වන්නේය.

13. ආර්යයන් වහන්සේලා ප්‍රභේද වශයෙන් එකසිය අට වැදෑරුම් වනසේක් කෙසේද යත්, සෝතාපන්න තුන්නමත් සකදාගාමී තුන් නමත් ප්‍රතිපදා සතරෙන් වැඩි වීමෙන් විසිහතර නමක් වන්නාහ. ප්‍රතිපදා සතර නම් මෙසේය. දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤ-දුක්ඛා පටිපදා ඛිප්පභිඤ්ඤ-සුඛා පටිපද දන් ධාභිඤ්ඤ- සුඛා පටිපද ඛිප්පාභිඤ්ඤ යනුවෙන් ප්‍රතිපද සතරක් වන්නාහ.

14. පඤ්ච ශුද්ධාවාසයෙහි උපදින්නා වූ අනාගාමීන් වහන්සේලා විසි හතර නමක් ඇත්තාහ. අන්තරාපරිනිබ්බායි උපහච්චපරිනිබ්බායි-අසංඛාර පරිනිබ්බායි-සසංඛාර පරිනිබ්බායි- උද්ධංසෝත අකනිට්ඨගාමී යනුවෙන් අවිහ-අතප්ප-සුදස්ස-සුදස්සි ශුද්ධාවාස සතරෙහි සම විසි නමක් ද, අකනිට්ඨයෙහි උද්ධංසෝත අකනිට්ඨගාමී නොමැතිව සතර නමක්දයි පඤ්ච ශුද්ධාවාසයෙහි අනාගාමීන් වහන්සේලා සූවිසි නමක් වන්නාහ.

15. අෂ්ඨ සමාපත්තිලාභි උභතොභාගවිමුත්ත නම් වූද අෂ්ඨ සමාපත්ති නොලැබූ පඤ්ඤවිමුත්ත නම් වූද රහතන් වහන්සේ දෙනම සමඟ ඵලස්ථ ආර්යයෝ සමපණස් දෙනෙකි. මාර්ගස්ථ සතර නම සමඟ සිවු පණසකි. ශ්‍රද්ධාධුර අධිගමලාභි සිවුපණස් දෙනාය ප්‍රඥාධුර අධිගමලාභී සිවුපණස් දෙනායයි ප්‍රභේද වශයෙන් ආර්යයන් වහන්සේලා, එකසිය අට වැදැරුම් වන්නාහ.

පුද්ගල භේදය මෙතෙකින් සමාප්තය.

16. ධ්‍යාන සමාපත්තිය-ඵල සමාපත්තිය-නිරෝධසමාපත්තියයි සමාපත්තිය ද තෙවැදෑරුම් වන්නේය. ධ්‍යාන ලාභීන් විසින් තම තමන් ලත් වසීබවට පත්කළ ලෞකික ධ්‍යානයන්ට සමවැදී පැවතීම ධ්‍යාන සමාපත්තිය නම් වන්නේය. ආර්යයන් වහන්සේලා තම තමන් ලබා සිටින ලෝකෝත්තර ඵලසමවතට සමවැදී නිවන අරමුණු කොටගෙන කැමති වේලාවක් පැවැත්වීම ඵලසමාපත්තිය නම් වන්නේය.

17. අෂ්ඨ සමාපත්තිලාභී රහතන් වහන්සේලා සහ අනාගාමීන් වහන්සේලා පමණක් නිරෝධ සමාපත්ති සමව දින්නාහ. අෂ්ඨසමාපත්ති නොමැතිව නිරෝධ සමාපත්තියට සමවැදිය නොහැකි බැවිනි. මනුලොවදී වැඩිම කාලය දින හතක් ද ශුද්ධාවාස වාසී බ්‍රහ්මයන්හට කල්ප ගණන් ද නිරෝධ සමාපත්තියෙන් ගතකළ හැකි වන්නේය.

18. නිරෝධ සමාපත්තියට සමවැදීමේ අනුපිළිවෙළ කෙසේදයත් සුදුසු තැනක පළඟ බැඳ හිඳ ප්‍රථම ධ්‍යානයේ සිට විඤ්ඤාණඤ්චායතනය තෙක් ධ්‍යාන සමාපත්ති සමවදිමින් එකක් පාසා ධ්‍යානධර්ම විදර්ශනා කරනු ලැබේ. ඉන් අනතුරුව ආකිඤ්චඤ්ඤායතනයට සමවැදී ඉන් නැගී කරුණු සතරක් ආවර්ජනා කළයුතු වන්නේය.

19. නානාබද්ධ අවිකෝපන-සත්ථුපක්කොසන-සංඝපතිමානන අද්ධාන පරිච්ඡේද යනුවෙනි. ඔවුනතුරෙන් නානාබද්ධ අවිකෝපනනම් ශරීරගත නොවූ තමන් සතු පිරිකර භාණ්ඩ නොනැසෙනු පිණිස අධිෂ්ඨාන කළයුතු වන්නේය, සත්ථුපක්කෝසන නම් ශාස්තෲන් වහන්සේගේ කැඳවීමක් ඇතොත් පණිවුඩකරු ළහට පැමිණීමට පෙර සමවතින් නැගිටීමට අධිෂ්ඨාන කළ යුතු වන්නේය. සංඝපතිමානනය නම් සංඝයාගේ කැඳවීමක් ඇතොත් පණිවුඩකරු ළහට පැමිණීමට පෙර සමවතින් නැගිටීමට අධිෂ්ඨාන කළයුතු වන්නේය. අද්ධාන පරිච්ඡේදය නම් සමවතින් නැගී සිටීමට වේලාව අධිෂ්ඨාන කිරීම සහ එතෙක් ආයුසංස්කාර පවතීදැයි විමසා බැලීම කළයුතුවේ.

20. ඉහත සඳහන් කරුණු අධිෂ්ඨාන කොට නිමවා ඉන් අනතුරුව නේවසඤ්ඤානාසඤ්ඤයතන සමවතට සමවැදී චිත්තක්ෂණ දෙකක් ඉක්මගිය තැන දී සඤ්ඤ-සඤ්ඤවේදයිත නිරෝධය නම් වූ නිරෝධ සමාපත්තියට පත්වන්නේය. ද්විතියධ්‍යානයේදී විතර්ක විචාර නම් වූ වචීසංස්කාරයද චතුර්ථ ධ්‍යානයේදී ආශ්වාස-ප්‍රශ්වාස නම් වූ කායසංස්කාරය ද නිරෝධ සමාපත්තියේ දී වේදනා සඤ්ඤනම් වූ චිත්ත සංස්කාරයද නිරොධ වන්නේය, නිරෝධ සමාපත්තිය තුලදී චිත්ත චෛතසිකයෝද චිත්තජ රූපයෝද නිරුද්ධ වන්නාහ. කර්මජ-ඍතුජ-ආහාරජ රූප පරම්පරාව පමණක් පවතින්නේය. නිරෝධ සමාපත්තියෙන් නැගිටීමේදී අනාගාමි හෝ රහත් හෝ ස්වකීය ඵල චිත්තය එක් වරක් ඉපදී නිරුද්ධ වූ පසු භවංග සිත හා ප්‍රත්‍යවෙක්‍ෂා විථි සිත් පෙර සේ පවත්නාහ.

21. සමථබල-විපස්සනා බලදෙකකින්ද ඥාණ චරියා සොළසකින්ද සමාධි චරියා නවයකින් ද වසී බවට පත් වූ අනාගාමි ක්ෂීණාශ්‍රව දෙදෙනාට පමණක් නිරෝධ සමාපත්තිය ලැබෙන්නේය. අෂ්ඨ සමාපත්ති ලාභී වුව ද පෘථග්ජන-සෝතාපන්න-සකදාගාමීන්ට සහ සුස්ක විදර්ශක අනාගාමි ක්ෂීණාශ්‍රවයන්හට ද නිරෝධ සමාපත්තිය නොලැබෙන්නේය. පඤ්චවෝකාර සුගති භවයෙහි පමණක් නිරෝධ සමාපත්තිය ලැබෙන්නේය. ඒකවෝකාර-චතුවෝකාර භවයන්හි නිරෝධ සමාපත්තිය නොලැබෙන්නේය.

22. නිරෝධ සමාපත්තිය පිණිස වඩන්නාවූ විදර්ශනාවෙහිද වෙනසක් ඇත්තේය. විදර්ශනාවේ අවස්ථා තුනක් ඇත්තේය, ඒ කෙසේද යත්, සංස්කාර පරිග්‍රාහක විදර්ශනාවය ඵලසමාපත්ති පාදක විදර්ශනාවය-නිරෝධ සමාපත්ති පාදක විදර්ශනාව යනුවෙනි. ඔවුනතුරෙන් සංස්කාර පරිග්‍රාහක විදර්ශනාව යෝගාවචරයාගේ ශක්ති පමණින් තීක්ෂණ ලෙසද මන්දගාමී ලෙස ද පැවැත්වෙන්නේය. ඵල සමාපත්ති පාදක විදර්ශනාව වනාහි මාර්ගභාවනාවේදී මෙන් තීක්ෂණ ලෙස පැවතිය යුතු වන්නේය. නිරෝධ සමාපත්ති පාදක විදර්ශනාව ධ්‍යාන සමාපත්ති අනුපිළිවෙළින් ඉහළට යා යුතු වන බැවින් නොමතික්ෂණව පැවැත්විය යුතු වන්නේය.

23. අනාගාමීන් වහන්සේ සහ ක්ෂීණාශ්‍රවයන් වහන්සේ ද කාමරාග-ව්‍යාපාද-අනුශය නිරවශේෂයෙන් ප්‍රහාණ කළ බැවින්ද අෂ්ඨ සමාපත්ති ලාභී වීමෙන් ද සමථබල-විදර්ශනා බල දෙකින් සමන්නාගත වන්නාහ. අනිච්චානුපස්සනා-දුක්ඛානුපස්සනා-අනත්තානුපස්සනා-නිබ්බිදානුපස්සනා-විරාගානුපස්සනා-නිරෝධානුපස්සනා-පටිනිස්සග්ගානුපස්සනා-විවට්ටානු පස්සනා නම් වූ විදර්ශනා ඥාන චර්යා අටකින් ද සතරමාර්ග-සතර ඵල සම්ප්‍රයුක්ත ඥාන චර්යා අටකින්ද යන ඥානචර්යා සොළසකින් ද පරිපූර්ණ වන්නාහ.

24. සමාධි චර්යා නවය නම් කවරේද යත්, ආවජ්ජනා-සමාපජ්ජනා අධිට්ඨානා වුට්ඨානා-පච්චවෙක්ඛණා නම් වූ පඤ්ච වසිතාවෙන් වසී බවට පමුණුවන ලද්දා වූ අෂ්ඨ සමාපත්ති නම් වූ සමාධි චරියා අටකින් ද අෂ්ඨ සමාපත්ති වීථියෙහි ලැබෙන්නා වූ පූර්වභාග උපචාර ධ්‍යානය නම් වූ සමාධි චර්යාවදැයි සමාධි චරියා නවයකින් ද පරිපූර්ණ වීමෙන් වචීසංඛාර-කාය සංඛාර-චිත්තසංඛාර නිරෝධයෙන් නිරෝධ සමාපත්ති ප්‍රතිලාභය සිද්ධ වන්නේය.

සමාපත්ති ප්‍රභේදය
සහ
විපස්සනා කර්මස්ථාන නයක්‍රමය සමාප්තයි.

25. භාවේතබ්බං පනිච්චේවං - භාවනා ද්වය මුත්තමං
පටිපත්ති රසස්සා දං - පත්ථයන්තෙන සාසනෙ

සම්බුද්ධ ශාසනයෙහි ප්‍රතිපත්තිමය ශාන්ත නිරාමිස රසාස්වාදනය ප්‍රාර්ථනා කරන්නා වූ ඥානවන්තයා විසින් අත්‍යුත්තම මේ භාවනා කර්මස්ථාන ක්‍රම දෙක අනුපිළිවෙළින් භාවනා වශයෙන් වැඩිය යුතු වන්නේය.

අභිධර්මාර්ථ සංග්‍රහයෙහි කර්මස්ථාන සංග්‍රහ
විභාගය මෙතෙකින් සමාප්තය.

**ත්‍රිලක්ෂණ විදර්ශනාව**

1. අභිධර්ම භාවනා පාඩමේදී පහළ වූ චිත්ත චෛතසික භූතරූප උපාදාරූප නම් වූ නාමරූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්මයෝ ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව ගිය බැවින් අනිත්‍යයෝය.
2. ඇතිවීම් නැතිවීම් දෙකින් නිරන්තරයෙන් පීඩා වින්ද බැවින් දුක්ඛයෝය.
3. තම තමන් කැමති ලෙස නොපැවතී බැවින් අනාත්මයෝය.
4. අනිත්‍ය වූ දුක්ඛ වූ අනාත්ම වූ චිත්ත චෛතසික භූතරූප උපාද රූප නම් වූ නාම රූප ස්කන්ධ ආයතන ධාතු පරමාර්ථ ධර්ම සමූහය, පීළන-සංඛත-සන්තාප විපරිණාමාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් දුක්ඛ සත්‍යය නම් වන්නේය.
5. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්වභව තෘෂ්ණාව ආයූහන-නිදාන-සංයෝග-පළිබෝධාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් සමුදය සත්‍යය නම් වන්නේය.
6. ඒ දෙකෙහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණ ධාතුව, නිස්සරණ විවේක-අසංඛත-අමතාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේය.
7. ඒ නිරෝධ සත්‍යය සුවසේ අවබෝධ වීම පිණිස භාවනා වශයෙන් වැඩිය යුතු වූ ආර්ය අෂ්ටාංගික මාර්ගය, නිය්‍යාන හේතු-දස්සන-ආධිපතෙය්‍යාර්ථයෙන් සමන්නාගත වන බැවින් ඒකාන්තයෙන් මාර්ග සත්‍යය නම් වන්නේය.
8. මාගේ සකල කුසල සම්භාර ධර්මය මෙම චතුරාර්ය සත්‍යය සුව සේ අවබෝධ වීම පිණිසම හේතුවේවා. වාසනා වේවා.

සාධු. සාධු. සාධු.

**පදවිවරණය**

01. විමොක්ඛ මුඛය - ලෝකෝත්තර මාර්ග චිත්තවීථියේ දී ගෝත්‍රභූසිතට පළමුවෙන් ලැබෙන අනුලෝම ඥාණය මාර්ග සිතට දොරටුවක් වැනි බැවින් විමෝක්ෂ මුඛය නම් වේ.

02. විමෝක්ෂය - ඒ ඒ මාර්ගක්ෂණයේ දී නියමිත කෙලෙසුන් කෙරෙන් මිදෙන බැවින් මාර්ග සිත ද කෙලෙසුන්ගෙන් මිදුන බැවින් ඵල සිත ද විමෝක්ෂ නම් වේ.

03. සුඤ්ඤත - ලෞකික මහජනයා විසින් ආත්ම වශයෙන් ගනු ලැබෙන අරමුණක් නොමැති බව සුඤ්ඤත නම් වේ.

| | | |
|---|---|---|
| 04. අනිමිත්ත | - | ඇතිවන-නැතිවන-උත්පාද-ඨිති-භංග අවස්ථාවන්ට පත්වන සටහනක් නැති බව අනිමිත්ත නම් වේ. |
| 05. අප්පණිහිත | - | තෘෂ්ණාවෙන් ගත හැකි ප්‍රාර්ථනා කළයුතු අරමුණක් නැති බව අප්පණිහිත නම් වේ. |
| 06. ඒකබීජී | - | ඉන්ද්‍රිය ධර්ම තියුණු බැවින් එක් ආත්ම භාවයකදීම රහත්වන්නේය. |
| 07. කෝලංකෝල | - | ඉන්ද්‍රිය ධර්ම මධ්‍යම බැවින් ආත්ම හතකට පෙර රහත්වන්නේය. |
| 08. සත්තක්ඛත්තුපරම | - | ඉන්ද්‍රිය ධර්ම නොවැඩුන බැවින්ද ප්‍රාර්ථනා අනුවද ආත්ම භාව හතකින් රහත් වන සෝතාපන්නයාය. |
| 09. අන්තරා පරිනිබ්බායි | - | ඉපදසිටින ශුද්ධාවාසයෙහි ආයුෂයෙන් අඩක් ගතවීමට මත්තෙන් රහත්වන්නේය. |
| 10. උපහච්ච පරිනිබ්බායි | - | බඹතලයෙහි ආයුෂයෙන් අඩක් ගත වූ පසු රහත්වන්නේය. |
| 11. අසංඛාර පරිනිබ්බායි | - | අනුත්සාහයෙන් රහත් වන්නේය. |
| 12. සසංඛාර පරිනිබ්බායි | - | උත්සාහ කොට රහත් වන්නේය. |
| 13. උද්ධංසෝත අකනිට්ඨගාමී | - | අකනිටාව තෙක් ඉහළටම යන්නේය. |
| 14. දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා | - | පිළිවෙත් පිරීම දුකසේය. අධිගමයත් ප්‍රමාදය. |
| 15. දුක්ඛා පටිපද ඛිප්පාභිඤ්ඤා | - | පිළිවෙත් දුකසේය -අධිගමය ශීඝ්‍රය. |
| 16. සුඛා පටිපදා දන්ධාභිඤ්ඤා | - | පිළිවෙත සැපෙනි-අධිගමය ප්‍රමාදය. |
| 17. සුඛා පටිපද ඛිප්පාභිඤ්ඤා | - | පිළිවෙතත් සැපෙනි- අධිගමයත් ශීඝ්‍රයෙනි. |

**ගුරු දේවෝත්තම අති පූජ්‍ය නා උයනේ අරියධම්ම මාහිමිපාණන්වහන්සේගේ දෙලෝ වැඩ පිණිස සියලුම සම්‍යක් ප්‍රාර්ථනයන් ඉෂ්ට සිද්ධ වේවායි පතන අතර,**

**පරලෝ සැපත් මැණියන්වහන්සේ වූ එච්. පෙසෝනා පෙරේරා මැණියන් වහන්සේ, සොයුරිය එම්. ජී. පෙරේරා හා ඇගේ ස්වාමි පුරුෂ ජී. ඩී. කේ. පෙරේරා මැතිතුමන් ඇතුළු මිය ගිය ගුරුවර හිත මිත්‍ර ඥාති සමූහයාට සසර ගමන කෙළවර කොට නිවන් සුව අවබෝධ කරවීමට උපකාරයක් වශයෙන් ද,**

**ජීවත්වන පියාණන්වහන්සේ ඇතුළු ඥාතින්ට හා සියලු සත්වයන්ට දහම් නැණස පැදී නිවන් අවබෝධයට පහසුවීම පිණිස ද මෙත් සිත් පෙරදැරිව**

අංක. 11, විජය පුර රුක්මලේ පදිංචි එම්. කේ. පෙරේරා මෙනවිය විසින්
**ධර්මදානය ලෙස පිරිනැමේ.**

**රාජ්‍ය සේවා බෞද්ධ සංගමය**
**සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය**
**අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,**
**කොළඹ 10.**
**2544 නවම් / 2001 පෙබරවාරි 14**

**නුගේගොඩ ගංගොඩවිල 37 සෝරත මාවතේ පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස්හි මුද්‍රණය කරවන ලදී.**